අපිදු. තදනුයායි හෙයින් අපගේ බුදුන්ගේ සධම්ය අද්භූතවූ අචින්තාය්වූ අසදෘශවූ අතිගම්භීරවූ දුරවගාහය්වූ නානා නය නිපුණවූ කණ්ණරසායනවූ ලොකාභිනීයවූ ප්‍රේමණීයවූ ධම් යක් බැව් සැලකීමෙන්ද **"මඛලසුත්තෙන මහාසමයසුත්තෙන චූලරාහුලොවාදසුත්තෙන සම්චින්තනපවිජදෘඝාති ඉමෙසු චතූසු ඨානෙසු අභිසමයපත්තානං සත්තානං ගණනපරිවෙජදෙ නඤ්ඤි හි"** යි යනුයෙන් මඛල සූත්‍රය දෙසනා කළකල්හිද අභි සමයප්‍රාප්ත සත්වයන්ගේ ගණන පරිවෙජදයක් නැත යන අර්ථ කථනය සැලකීමෙන්ද නාදෘශවූ උත්තමවූ ශ්‍රෙෂ්ඨවූ මහානුභාව සම්පන්නවූ සතරාමරසම්සම්බුදුයන්ගේ සභාලෙහිදොපදුව විඛවං ශනොපායවූ සම්සම්බ භිතසුඛසවගීමොක්ෂසාධනොපායවූ සූත්‍රාභි ධම්විනය යන පිටකත්‍රයෙන් සූත්‍රාන්තපිටකයට අන්තගීනවූ බුදුකනිකාය පිළිබඳ බුදුකපාඨාදී පසළොස්ග්‍රන්ථයන් අතුරෙන් සූත්‍රකිපාතයෙහි දෙවනවගැලා සංග්‍රහකරනලද මඛලසූත්‍රයට බොහෝ අටුවාටිකාදිය විද්‍යමානවුවද තදර්ථපරිඥණනය ආයාස සිඛහෙයින් අනායාසසිඛියට හෙතුවූ විවිධාර්ථවණීනාවක් සාවැටිවූ මඛලාර්ථයන්අපෙක්ෂාකරන ලොකයාගේ අර්ථනිපුණතාය කැමති වන්නාවූ ත්‍රිපිටකධාරිවූ ශ්‍රුඛාබුඛිවිශ්‍යාදිගුණගෙණෙන් හෙබියාවූ ධම්ශාස්ත්‍රපාරාවාරපාරදර්ශිවූ පණ්ඩිතවූ ශ්‍රීමත්වූ සිරිමඛලාභි ඛානස්ථවිරවරොත්තමයාණන් විසින් බොහෝ පෙළඅටුවාටිකා අනුටිකාදීන්හි දැන්නාලද නොඑක් නිදසුන් වස්තූන්ද අර්ථ වණීනාප්‍රභෙදයන්ද දක්වමින් මීට නවසියතෙසැටහව්රුද්ද කින් පමණ පෙර සංග්‍රහකරණලද අබාහුල්‍යවූ දුර්ලභ්‍යවූ මඛල ලක්ඛදීපනී නම් ප්‍රකරණය මාගධීභාෂාකුසලීන්ගේ ඓහලෞ කිකපාරලෞකිකාර්ථසංසිඛියට ප්‍රමාණවුවද මාගධීභාෂායෙහි අනිපුණවූ ගෘහස්ථප්‍රව්‍රජිතයන් තදවලොකනයෙන් ධම්පරිඥන යට අපොහොසත් හෙයින්ද යථොක්ත සූත්‍රවණීනාව හෙලු බසින් ලෙව්හි ප්‍රකටකොට හැරීමෙන් ඔවුන්ටද එය කියවා

බලා ධම්පරිඥානයෙන් ඵෙනිකප්‍රයොජන හා පාරත්‍රිකප්‍රයොජනද සාක්කරගහගැකිබැව් මුඛ්‍යප්‍රයොජනකොට සැලකීමෙන්ද එම වණීනාව හෙලුබසින් ලියා තැබීමෙහි අපසිත්තුළ අභිලාෂා උපන...

මාගධිභාෂායෙන් සංක්ෂෙපයෙන් සැහවි තුබූ සඞ්ගීය සවභා ෂායෙන් අර්ථකථාව්‍යාඛ්‍යාන ඉපැදවීමෙහි ලෝවැඩ අටෙක් වන් නේය. ඒ කෙසේවූද යත්? ධර්මයන් අටදෙනෙකුගෙන් අලඞ්කා රවූ ලොකයසේ අෂ්ටාඞ්ගශීලයෙන් අලඞ්කෘතවූ උපොසථයසේ අෂ්ටාඞ්ගමාර්ගයෙන් අලඞ්කෘතවූ නිර්වාණයසේ අෂ්ටගරුධර්මයෙන් අලඞ්කෘතවූ ශ්‍රාවිකාවන්සේ අෂ්ටමහාදිගන්තරයකින් අලඞ්කෘතවූ චක්‍රවාටයසේ අෂ්ටාඞ්ගලක්ෂණයෙන් අලඞ්කෘතවූ දූතයන්සේ අෂ්ටප්‍රකාරරසයෙන් අලඞ්කෘතවූ පානීයවර්ගීයන්සේ අෂ්ටප්‍රකාර වරයෙකින් අලඞ්කෘතවූ බුඩොපසථායිකයන්සේ සඞ්ගීතාරූඪිත ධර්මව්‍යාඛ්‍යානකථාවෝද අටමහලෝවැඩක් කරන්නාහුයැයි දන් නේයැ. කෙසේවූ ලෝවැඩ අටෙක්ද යත්?

නොඑක් රාජ්‍යක්‍රියායෙහි යෙදී ශ්‍රීසම්පත්තීන් මත්ව අවකාශ යක් නොලබන්නාවූ දැහැමි රජදරුවන්ට වූකලි බුදුන්ගේ මහ මුහුදසේ අතිගම්භීරවූ ආකාශයසේ අප්‍රමාණවූ ධර්මය දැන බුදුන් ගේ මහිම දැන්ම උගහටවන බැවින් ලදලද අවකාශයෙහි රහෝ ගතව හිඳ මෙසේ මෙසේවූ සඞ්ගීතාරූඪිත ධර්මකථාපුස්තකයන් ගෙන්වා තමන් තමන් අතුරේ බලා බුදුන්ගේ ආගමයෙහි ඒ ඒ තන්හි එන විසිතුරු ධර්මකථා හා සූක්ෂ්මනය හා සිතට නගා නුවණවඩාගන ලොකශාසන රක්ෂායෙහි අප්‍රමාදවැ ආත්මාභි පරාභිසැදීමෙන් රජුන්ට වන්නාවූ වැඩ පළමුවන ලෝවැඩයයි කියමි.

තවද ධර්මිෂ්ඨරාජමහිෂ්‍යාදී ශ්‍රීමතීවූ ගෙන් දෙර නොහදු නන තරම් උත්තමස්ත්‍රීන් වූකලි ඒ ඒ තන්හි සිත්සේ ඇවිද බණ අසඅසාද මිහබෝ වැඳ පින් රැස් කොට නුවණ වඩා මෙලොව පරලොව දැන ගැන්ම ඉතා උගහටවන හෙයිනුත් නුවකැතියන් හා සිතුසිතුවිට ධර්මාන්විතකථාකොට දැනුම් එව ගැන්ම බැරිවන හෙයිනුත් එසේවූ කුලස්ත්‍රීන් අක්ෂරමාත්‍රාවක් දැන මෙබදු ධර්ම කථාලී පුස්තකයන් ගෙන්වා තමන් තමන් අතුරෙහිම සිත්සේ බලා දහම් දැන නුවණ වඩාගන දැනාදී පින්කම් කිරීමෙන් එසේ එසේවූ ස්ත්‍රීලොකයාට වන්නාවූ මෙසේ මෙස්වූ නිරාකුලාති ශයම දෙවිනවූ ලෝවැඩකැයි කියමි.

තවද දැහැමියුවරජමහඇමතියන් ආදී ශ්‍රීමත්වූ ප්‍රධානයන් වූකලි හැම වේලෙහිම රජදරුවන්ගේ නොඑක් කායඊයෙහි ව්‍යාපෘතවන බැවින් බුදුන්ගේ සඩමීය සකසා දැන්ම ඔවුන්වද බරෙක්මය. එසේ හෙයින් කල්‍යාණපෘථඟජනවූ ඒ ශ්‍රීමත්හුද ලදලද අවකාශයෙක්හි මෙසේ මෙසේවූ නොඑක් ධම්කථා සිත් සේ බලා රාජනීති ලොකනීති ධම්නීති ලොකව්‍යවහාර ධම්ම ව්‍යවහාර දෙශව්‍යවහාර මෙලෝ පරලෝ විශෙෂයෙන් දැන රජුන්වද ලොවටද වැඩබැඳී අමාඊයෙහි නොගොස් ආතමාර්ථ පරාර්ථ සාධා තමන් ලද සැපත පරලෝ නිධාන කොරෙම්න් වැඩ සාධාගැන්ම තුන්වනවූ ලෝවැඩකැයි කියම්.

තවද ශාසනරක්ෂායෙහි අප්‍රමාදවූ මහාසථවිරවරයන් ගරුවූ සථානානතරලදින් වසන හෙයිනුත් ශාසනයට ගරුවූ සථානානතර ලදහෙයිනුත් ඔවුන් කෙරෙහි මහත්වූ ආදර බහුමාන කළමනා හෙයිනුත් නොඑක් නය දැන දහම් සිතතබා හිදිනා ධම්මකථිකයෝ ඔවුන්ව බණකීමෙහි උපෙක්ෂකවන්නාහ. එහෙයින් එම මහපොළොවසේ නුවණැති මහාසථවිරයන්ට බණ ඇසීම් සුලභ නොවෙයි. ඔවුනුදු ලදලද අවකාශයෙහි එබදුවූ ධම්මව්‍යාඛ්‍යානකථා ගෙන්වා සිත්සේ බලා තමන් තමන් දත් ආගමයෙහි ඒ ඒ තන්හි එන විසිතුරුවූ ධම්මකථා හා අසාධාරණ වූ ධම්කථා හා පූජිකථිකයන්ගේ ව්‍යවහාරවාක්ප්‍රබඩ අසා මහාසථවිරයන්ගේදප්‍රඥාඥයන් නිම්මලවනු සතරවනවූ ලෝවැඩෙකැයි කියම්.

තවද අතිශ්‍රඩාවෙන් සසුන්වැද අක්ෂරාභ්‍යාසකොටගත නොහී විදශීනායෙහි යෙදී ශීලශුඩියෙන් යෙදී වසන්නාවූ බොහෝ ශ්‍රඩාචරිතධම්ලොභොබී සබ්‍රහමචාරීන් මෙසේ මෙසේවූ අර්ථ කථාවන් සිත්සේ බලා ධම්මවිභාගය ශීලවිභාගය දැන ප්‍රඥා වඩා ප්‍රතිපත්ති ප්‍රතිවෙධයට ආදර උපදවා ශ්‍රඩා නමැති ප්‍රදීපයන් බබුලුවාගැන්ම පස්වනවූ ලෝවැඩෙකැයි කියම්.

තවද නොඑක් සූත්‍රානතයන් ඉගෙන බණකීමෙහි දක්ෂවූ මහපඬිවරයන් පූජිකථිකයන්ගේ වාක්ප්‍රබඩ බලා නොඑක් අර්ථ ව්‍යාඛ්‍යාන ඉපදවීමට මුඛදැන පූජිකථිකයන් කෙරෙහි අතිප්‍රසන්නවැ රන්මල්හි සුවඳ කවන්නාසේ ඥතාභිවෘඩිය කොටගෙන තමන් තමන්ගේ වාක්පථනමැති ගඟාවන්ගේ නීවරණයන් දුරු කොට නිම්ල කරනුයේ සවනවූ ලෝවැඩෙකැයි කියම්.

තවද කල්‍යාණපෘථග්ජනවූ ශ්‍රද්ධාවන්තවූ අක්ෂරාභ්‍යාසය ඇති සත්පුරුෂයන් සාවද්‍යවූ කම්මාන්තයන් හැර නිරවද්‍යවූ ධර්මයෙන් ආත්මාර්ථයෝ සාධා ගනුම්හයි සිතා නිරවද්‍යජීවිකාවෙන් ඒ ඒ තන්හි ධර්මදානාදී ලෝවැඩකරනුයේ සත්වනවූ ලෝවැඩ කැයි කියමි.

තවද නොඑක් ප්‍රත්‍යන්තවල සත්පුරුෂදර්ශනයන් නොලබන්නාවූ සත්පුරුෂයන්ට බණඅසා මෙලෝ පරලෝ දැන්ම ඉතා දුර්ලභවන බැවින් ඔවුනුදු ධර්මකථාලි පුස්තකයන් සොයා ගන අක්ෂරාභ්‍යාසය ඇතියන් ලවා කියවා අසා සවභාෂාවෙන් නිර්ව්‍යාකුලවූ දහම් දැන මෙලෝ පරලෝ දෙකින් ගැලවෙනුයේ අටවැනිවූලෝවැඩෙකැයි කියමි. **පූජාවලිය** බැලියයුතු.

මේ ආදී කාරණයෙන් සවභාෂාලිඛිතවූ අර්ථකථාවන් ඉපද වීමෙහි මෙසේ අටවැදෑරුම්වූ ලෝවැඩෙක් ඇතිවේමය එහෙයින් මෙහි අපවිසින් **''මඞ්ගලත්ථදීපනී''** නම් වූ මඞ්ගල සූත්‍රාර්ථ වර්ණනාවට හෙලදිව් බසින් ලියනලද ව්‍යාඛ්‍යානයද සත්පුරුෂයන් විසින් සාවධානව ශ්‍රවණය කිරීමෙන් මඞ්ගලාර්ථයන්හි කවිඳුයද කවිඳුයෙන් වක්තෘත්වයද වක්තෘත්වයෙන් යසසය සත්කාරය ලාභය යන්නාදී ඓහිකප්‍රයොජනවිශෙෂ හා මෙය පරිශීලනයෙන් ධර්මඥානයද ධර්මඥානයෙන් සුචරිතප්‍රතිපත්තියද සුචරිතප්‍රාප්තියෙන් සවර්‍ගාපවර්ගසම්පත්තීහුද යන පාරත්‍රිකප්‍රයොජනවිශෙෂද සාත් සාත් කිරීමෙහි තත්පර වියයුත්තේය.

M. Dhammarakkitha
P. Dhammaloka.

මඞ්ගලාශයකෞමුදී

නම් වූ

මඞ්ගලත්‍ථදීපනීසිංහලභාවාත්‍ථවණ්ණනාව.

නමෝ තස්ස
භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස.

"අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්සතීති=බුද්ධෝ"යි නිර්වචන හෙයින් අතීතඒතාමාන අනාගත යන කාලත්‍රයවර්තීවූ නිරවශෙෂ ලෞකිකලෝකොත්තරාර්‍ථයන් අනාඛ්‍යුලක්සේ තත්ත්වාකාර යෙන් සවඥත්වඥානයෙන් අවබොධකළාවූ යම් කිසි සත්ත්වෝත්තම කෙනෙක් තෙමේ මඞ්ගලර්ථීන්ට හෙවත් සියලුසම්පත්තීන්ගේ අභිවෘද්ධිප්‍රාප්තියට හෙතුන් ප්‍රයෝජනකොටඇති සියලුදිව්‍ය මනුෂ්‍යාදීන්ට සකලලෞකිකලෝකොත්තරාර්‍ථසංඛ්‍යාතඅර්‍ථ සම්පත්තිප්‍රදානයකරණ පුෂ්පඵලපල්ලවාදීන්සමෘද්ධකල්පවෘක්ෂාය මාණ හෙයින් මඞ්ගලයයි ප්‍රසිද්ධවූසේක්ද, පූර්ෂොත්තමවූම මඞ්ග ලාර්‍ථයන් තුන්ලෝවාසීන්ට දෙශනාකරණ කතෘවරයෙක් වූසේක්ද, තුන්ලෝවැස්සාහට මඞ්ගලවූ ඒ තථාගතසම්මාසම්බුදු රජාණන් වහන්සේ-මඞ්ගලත්‍ථදීපනී නම්වූ මඞ්ගලසූත්‍රාර්‍ථවර්ණිත නාවක් කරණු කැමතිවූ ආචාර්‍යශ්‍රීඋපාධ්‍යාඝවරප්‍රදත්ත මඞ්ගල යන නාමොපලක්ෂිතවූ මම අතිශය භක්තිප්‍රමභාරාවනතත්ව යෙන් කායවාඞ්මනඃ යන චාරත්‍රයෙන් වඳිමි.

"අපායෙසු පතමානෙ සත්තෙ අපතමානෙ කත්වා ධාරෙතීති=ධම්මෝ"යි නිර්වචන හෙයින් නිරයාදී අපායගන්හි වැටෙන්ට යන සත්ත්වයන් නොවැටෙන්නවුන් කොට ධරාකුයි ධම්ම නම් ලද පූර්ෂොත්තවූම මඞ්ගලාර්‍ථයන් බුදුවූවන්කාවූ සූත්‍ර යෙයෙවයාකරණාදී යම් නවලෝකොත්තරධර්මයක් තෙමේ යථොක්තවූම මඞ්ගලර්ථීන්ට මඞ්ගලයෙකැයි ප්‍රකටවීද, ඒ නව ලොවුතුරාදහම් සංඛ්‍යාත මඞ්ගලය මම වඳිමි.

"සංහනති සමඥං කම්මං සමුපගච්ඡති සම්මදෙව කිලෙස දරථෙ හනතීති වා=සඞ්ඝෝ"යි නිර්වචන හෙයින් මනාකොට කෙ ලෙසුන් නසාකුයි හෝ පෙරහෝ පවුරුණුආදී සම්ගිකර්මයන්ට

මනාසේ පැමිණෙන්නුයි හෝ මනාකොට රාගාදිකෙලෙස්දුරලීලී නිවාගනුයිකෝ සඞ්ඝ නම් ලද පූජෝකතාවූම මඞ්ගලාඛ්‍යාන් කරන්නාවූ යම් අෂ්ටාර්‍යපුද්ගලමහාසඞ්ඝරත්නයක් යථෝක්තවූම මඞ්ගලාර්ථීන්ට මඞ්ගලයකැයි ප්‍රකටවීද, ඒ සඞ්ඝසඞ්ඛ්‍යාත මඞ්ගලය මම වඳිමි.

මෙසේ මවිසින් බුඩාදී මඞ්ගලයන්ට යහපත්කොට ප්‍රණාමයකරනලද්දේවීද ඒ අනුභාවයින් මම ග්‍රන්ථරචනායෙන් පැමිණියහැකි යම් කිසි අන්තරායක් ඇතහොත් එම අන්තරාය වන්සන්නෙක් වීමි.

ලොවට මඞ්ගලවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ විසින් මනාකොට දෙශනාකරණලද්දාවූ අතිශය ආඥාඇති අටතිසක් මඞ්ගලකාරණයන් අන්තර්ගතකොට ඇත්තාවූ යම් සූත්‍රයක් මඞ්ගලසූත්‍ර යන නාමයෙන් ලොකයෙහි ප්‍රකටවීද,

මේ ලොකයෙහි යම් කිසි සම්මාසම්බුදුකෙනෙකුන් විසින් දිව්‍යමනුෂ්‍යාදීන්ට මඞ්ගලය පිණිස වදාරණලද යම්බඳු මඞ්ගල සූත්‍රයක්හුගේ ආඥාව කෙළලක්ෂයක් සක්වළ පතළවීද,

ඒ මේ මඞ්ගල සූත්‍රය සම්බන්ධවූ අර්ථය පෙළඅට්ඨාඨිකා ආනුටීකා සංඛ්‍යාත නානාවිධ ග්‍රන්ථයන්හි අවලෝකනය කොටැ ඒ සාරාර්ථයන්ද ග්‍රහණය කොටැ දක්වන්නෙම්. එකඟසිත් ඇත්තෝ ඒ මඞ්ගලසූත්‍රය සමාදරයෙන් ශ්‍රවණය කෙරෙත්වා.

සූත්‍රය වර්ණනා කරන්නහු විසින් මනාකි පළමුවැ සූත්‍රොත්පත්තිවිෂයස්ථානය කියා තදනන්තරවැ සූත්‍රාර්ථය වර්ණනා කරණු ලැබේ. එසේ කෙයින් පළමුකොට සූත්‍රොත්පත්තිය කියනු ලැබේ.

සියලුම සූත්‍රයන්ගේ උත්පත්තිය ආත්මාඛ්‍යානය පරාඛ්‍යානය අපෝහාත්පත්තිකත්වය පුච්ඡාවසිකත්වයයි සිව්වැදෑරුම් වන්නීය ඔවුනතුරෙන් වඤ්ඤානුපස්සනාදීසූත්‍රයන්ගේ උත්පත්තිය තමන් වහන්සේගේ අදහසවශයෙන්ද මෙත්තසූත්‍රාදීන්ගේ උත්පත්තිය අන්‍යයන්වහන්සේගේ අදහස්වශයෙන්ද උරගසූත්‍රාදීන්ගේ උත්පත්තිය අපෝහාත්පත්තිකත්වශයෙන්ද ධම්මිකසූත්‍රාදීන්ගේ උත්පත්තිය පුච්ඡාවසිකත්වශයෙන්ද වන්නීය. ඔවුනතුරෙන් පුච්ඡාවසිකත්වාත්පත්තිය මේ මඞ්ගලසූත්‍රයෙහිලා දත්යුත්තිය.

එහි මේ මතු කියනුලබන්නී අනුපිළිවෙළකථාව වන්නීය, දැඩිවැ පවක්නාවූ,

"බාරාණසී ච සාවත්ථී වෙසාලී මිථිලාලවී,
කොසම්බූජෙජයිනියොතඤ්ඤිලා චම්පා ච සාගලං,
සුංසුමාරගිරං රාජගහං කපිලවත්ථුව,
සාකෙතමිඳුපත්ථතවොණකඬ්ඪා පාටලිපුත්තකං,
ජෙතුත්තරන්තු සංකස්සං කුසිණාරාදයො පුරී"ති.

දක්වනලද බාරාණසී නම් නුවරය ශ්‍රාවස්ති නම් නුවරය වෛශාලී නම් නුවරය මිථිලා නම් නුවරය අලවී නම් නුවරය කොසඹැ නම් නුවරය උදේනී නම් නුවරය තක්ෂලා නම් නුවරය චම්පා නම් නුවරය මධුරට සාගල නම් නුවරය සුංසුමාරගිරි නම් නුවරය රාජගෘහ නම් නුවරය ශාක්‍යරජදරුවන්ගේ කපිලවස්තු නම් නුවරය සාකෙත නම් නුවරය කුරුරට ඉඳුපත් නම් නුවරය උකකඩා නම් නුවරය පාටලී නම් නුවරය ජයතුරා නම් නුවරය සැකස්ස නම් නුවරය මල්ලරජදරුවන්ගේ කුසිණාරා නම් නුවරය යනාදී රාජධානීන්හිද සෙසුගම්නියම්ගම් ආදීන්හිද මනුෂ්‍යයෝ නගර වාරමන්ත්‍රණශාලායුකතිනාලාආදී ඒ ඒ තන්හි රැස්ව හිඳ රන් රුවන් ආදිය දී රාමායනසීතාහරණාදී සවගීමොක්ෂබාධක නිරර්ථක කථා කියවති. එසින් එකද කථාවක් කියවන්ට පවන් ගත්තු පවත් සාරමසකින් නිමාවව යෙයි. එක්දිනක් රැස්ව හුන්නවුන් අතුරෙන් එකෙක් මහුලට යම්හයි කී හෙයින් මුතුමු මහුලට යම්හයි කියති කුමක් වනාහි මහුල්ද? කිම දුටුදේ මහුල්ද? කිම ඇසුදේ මහුල්ද? කිම මුතදේ මහුල්ද? කවරෙක් මහුල් දනීදැයි කියා වාදඋපදවාගෙණ කියන කියන කථාඅතුරට මේ මඞ්ගලකථාවෝ ප්‍රාදුර්භූත වූහ.

එක්බිනි එසි රැස්ව හුන්නවුන් අතුරෙන් එක්තරා දිඨමඞ්ගලික නම් පුරුෂයෙක් තෙමේ උදුරඅයුරින් මෙසේ කියයි, "අපි මහුල් දනුමු ලොකයෙහිදක්තාලදෙය මහුල්ය, දක්තාලද්දනම් අභිමඞ්ගලසම්මතවූ රූපයයි, හේ කෙසේද යත්? මේ ලොකයෙහි යම් කිසිවෙක් තෙමේ නිදා හිමිදුරියෙන් පිබිද කථාකරණපක්ෂියෙකු හෝ දකීද හුණකිළිළක් හෝ ගැබිනියක් හෝ අබරණින් සැරසී සිටි කුමාරයෙකු හෝ පුන්කළසක් හෝ තෙත් හෙවත් අලුත් රෙහෙමසෙකු හෝ ආජානීය අසෙකුහෝ ආජානීයඅසුන් යෙදූ රථයක් හෝ වෘෂභයෙකු හෝ දෙනක් හෝ කිඹුල්වන් දෙනක් හෝ දකීද මෙබදු අනිකුත් අභිමඞ්ගලසම්මතවූ මොන යම් වසතුවක්නමුදු දකීද මේ දිඨමඞ්ගලයයි කියනුලැබෙ"යි කීහයි.

ඔවුන්ගේ ඒ වචනය ඇසූ සමහරකෙනෙක් තමන් දන්නා මහලුත් එපමණක්ම හෙයින් ඒ සැබවයි ගිවිසගන්ඟ, සමහරෙක් නොගිවිසුඟ විවාදකොට ගත්ඟ, යම්කෙනෙක් නොගිවිස්සෝ නම් ඔවුනතුරෙන් සුතමඞ්ගලික නම් පුරුෂතෙමේ දුටුදේ මහලැයි කීවුන් හා විවාදකොට ගෙන මෙසේ කියයි "පින්වත්නි! මේ ඇස පිරිසුදු දෙයද අපිරිසුදු දෙයද සොඳුරු දෙයද නොසොඳුරු දෙයද මනාපදෙයද අපනාපදෙයද දක්නේය, ඉදින් ඇසින් දුටුවක්ම මහුල්වේ නම් දුටුදුටු සියල්ලම මහුල්වන්නේය එසේ මෙසින් දක්නාලද්ද මහුල් නොවන්නේය, තොප මහුල් නොදතුව අපි මහුල් දනුම්ඟ.

වැලි එකෙක් ඇති කණින් අසනලද්ද මහුලි, අසනලද්ද නම් අභිමඞ්ගලසම්මතවූ හෙවත් ලෝවැස්සා විසින් විසිඅටමඞ්ගලයයි සම්මතකරණලද ශබ්දයයි. හේ කෙසේද යත්? මේලොකයෙහි යමෙක් තෙමේ නිදා හිමිදිරියෙන් පිබිද වඩිස ගන බසක් හෝ වඩිසමාන ගන බසක් හෝ පුණණ ගන බසක් හෝ ථුසස ගන බසක් හෝ සුමන ගන බසක් හෝ සිරි ගන බසක් හෝ සිරිවඩ්ඪ ගන බසක් හෝ අද සුභනැකත් සුභමොහොත් ඇති සුභදිනයකැයි ගන බසක් හෝ සුමඞ්ගල ගන බසක් හෝ අසාද මෙයින් අනිකුදු අභිමඞ්ගලසම්මතවූ මෙබදු මොනයම් ශබ්දයක් නමුදු අසාද, මේ සුතමඞ්ගලය නමැයි කියනු ලැබේයයි කියාඅි.

එබස් ඇසූ සමහරෙක් තමන් දන්නා මහලුත් එපමණක්ම හෙයින් ඒ සැබවයි ගිවිසුඟ සමහරක් නොගිවිසුඟ, යමෙක් නොගිවිස්සෝ නම් ඔවුනතුරෙන් මුතමඞ්ගලිකනම් පුරුෂයෙක් තෙමේ ඇසූ දෙය මහුලැයි කීවුන් හා විවාද කොට ගෙන මෙසේ කියයි, "පින්වත්නි! මේ කණ නම් යාපත්දෙයත් අයාපත්දෙයත් මනාපදෙයත් අමනාපදෙයත් අසයි, ඉදින් කණින් ඇසුවක්ම මහුල්වන්නේනම් ඇසුඇසූ සියල්ලක්ම මහුල්වන්නේය එසේ නෙයින් අසනලද්ද මහුල් නොවන්නේය තොප මහුල් නොදතුව අපි මහුල් දනුම්ඟ, වැලි එකෙක් ඇති මුතය මහුලි මුත නම් අභිමඞ්ගලසම්මතවූ ගන්ධරසඵසශීයයි, හේ කෙසේදයත්? මේ ලෝකයෙහි යම්කිසිවෙක් තෙමේ නිදා අවුයමැ පිබිද පියුම්සුවඳආදීවූ මල්සුවඳක් හෝ නාසයෙන් ආඝ්‍රාණය කෙරේනම් ඉදින් ඒ ගන්ධයත් මහුලි, ඔලිත් අවුත් දැහැටිදණඩක් හෝ කැවූනම් එයින් දිවට දනුනු රසයත් මහුලි, පොළොව අල්වා හෝ නිලඟත් ගොයම් අල්වා හෝ අවුත හළ ගොමක්

අල්වා හෝ කැස්බකු අල්වා නෝ තලගොබක් අල්වා හෝ නා මල් ආදියක් අල්වා නෝ දෙසිදෙඩම්අන්නාසිඅඹදඹඇටඹවැල වරකාආදී ඵලයක් අල්වා හෝ අමු හෙවත් තෙතමැටි තවරා හෝ අලුත් සලුවක් ඇඳ හෝ අලුත් ජටාවක් බැඳ හෝ යම්කිසි පහසක් ලද්දහු නම් ඒ මඟුල, මෙයින් අනිකුදු අභිමඞ්ගලසම්ම තවූ මෙබදු මොනයම් ගණ්ඨියක් නමුත් ආශ්‍රාණය කෙරේද රස යක් විඳිද පහසක් ලබාද මේ තුන මූතමඞ්ගල නමැති කියතුලැ බෙසි" කියායි.

උන්ගේ කථාවන් සමහරු ගිවිස්සාහ සමහරු නොගිවිස් සාහ. ඒ කිම්ද? නාසයෙන් සුවදෙක්ම ආඝ්‍රාණය කෙරේ නම් දිවින් මනාරසයෙක්ම ආස්වාදනය කෙරේනම් කයින් මනාපස සක්ම සපශීකෙරේ නම් ඒත් යුකතියෙක, එසේ නොව නාස යෙන් ඉටුනිටු දෙහදව ආඝ්‍රාණය කෙරෙයි දිවින් ඉටුනිටු දෙ රසම ආස්වාදනය කෙරෙයි කයින් ඉටුනිටු දෙපහසම ස්පශී කෙරෙයි, ඒ කාරණයෙනුත් මේ මඟුල් කොට නොගතයුතුගයි කියා නොගිවිස්සාහ.

මෙලෙසින් දෘෂ්ටමඞ්ගලිකය ශ්‍රැතමඞ්ගලිකය මූතමඞ්ගලි කය යන ඒ තිදෙන ඔවුනොවුන් අවබොධකරවන්ට නොහැකි වූහ. ඔහුද ඔවුනොවුන් හා විවාදකරන්නාහු දුටුදෙය මඟුලැයි කිවොත් ඇසූදෙය මඟුලැයි කිවොත් මූතදෙය මඟුලැයිකිවොත් පිළිවන්ව පෙණෙන හෙයින් ඔවුනොවුන් හා විවාදකරණපම ණක්මුත් තමන් කියකියා ලූදැහ කාරණා කියා සිටුවාලිය හෙන්නා නැත.

ඔවුන් කෙරෙන් සෙසුමිනිසුන් අතුරෙන් සමහරු උන්ගේ වචනය ගත්හ සමහරු නොගත්හ. යමෙක් නොගත්හු නම් උහුතුමූ ඔවුන් සමග විවාද කළහ. යමෙක් දිඝනිකායාගේ වචනය ගත්හු නම් උහුතුමූ දක්නාලද්දම මඟුලැයි කියා ගියහ. යමෙක් සුතමඞ්ගලික මූතමඞ්ගලිකයන්ගේ වචනය ගත්හු නම් උහුතුමූ අඝනලද්දම මඟුල ගණ්ඩාඝස්ථශීඝම මඟුලැයි කියා ගියහ. මෙසේ මේ මඟලකථාව මූළුදඹදිවිතෙලෙහි පතළවිය.

එක්බිනි දඹදිවිවැසිමිනිස්සු මූළුල්ලම මූළුවූළුවපියා වැලි මේ හැම මඟුල් නොවනකලට මඟුල්නම් කවරේදෝයි සිතන්ට වන්හ. උන්ගේ වසයෙන් උන්ට රැකවලසිටිනා දෙවියෝත් මඟුල් නම් කවරේදෝයි සිතන්ට වන්හ. උන්ගේ වසයෙන් උන්ටම්තව භිදිනා වෘක්ෂලතාදීන්හි වසනා දෙවියොත් මඟුල්ම

සිතන්ට වන්හ. උන්ගේ වයසෙන් උන්ට මිත්‍රව හිඳිනා වාතුම්හාරාජිකයෙන් පහත අහස වසන දෙවිසොත් මඟුල් සිතන්ට වන්හ. උන්ගේ වයසෙන් උන්ට මිත්‍රව හිඳිනා වාතුම්හාරාජිකයෙහි දෙවියොත් මඟුල්සිතන්ටවන්හ. උන්ගේවයසෙන් උන්ට මිත්‍රව හිඳිනා තව්තිසාවැසිදෙවියෝය උන්ට මිත්‍රව හිඳිනා යාම දෙව්ලෝවැසි දෙවියෝය යාමදෙවියන්ට මිත්‍රවූ තුසිපුරේ වැසි දෙවියෝය උන්ට මිත්‍රව හිඳිනා නිම්මාණරතී දෙවිලොවැ දෙවියෝය උන්ට මිත්‍රවූ පරනිර්මිත වසවර්තී දෙව්ලොවැ දෙවියෝය සුදසසී නම් බඹලොවැ වැසි දෙවියෝය සුදයසි නම් බඹලොවැ වැසි දෙවියන්කෙරෙන් අනාණීවාබඹ ලොවැ වැසි දෙවියෝය යන මොවිහුද ඔවුනොවුන් කෙරෙන් ඒ කථාව අසා කාටිකැවිවපියා මඟුල්නම් කවරේදෝහෝසි සිතන්ට පටන් ගත්හ. සිතන්ට සිත්නැති හෙයින් හා අසන්ට කන් නැති හෙයින් අසඟයන් හා ඔතන්ට සිත් ඇතත් අසන්ට කන් නැති හෙයින් අරූපිබ්‍රහ්මයන් හැර සෙසු බඹ දෙවියෝත් මඟුල් සිතන්ට පටන් ගත්හ. මේ මඟුල්කථාව මේ දඹදිව්තෙලෙහි ශ්‍රාවස්තී නුවර දෙව්බඹුන්ගේ වසයෙන් දසදහසක්වළලුඑල්ලෙහිත් එසේම පැවැත්තීය, හෙවත් මඞ්ගලවිතනා තොමෝ උපන. උපන්නීවූද ඕතොමෝ මේ මඟුලැයි විනිශ්චයව නොපැමිණියාම දෙලොස්හවිරුද්දක් පැවැත්තීය.

මඟුල් නම් කවරේදෝහෝසි ඝනවිලිපමණක්මුත් මේ මඟුලැයි යන ලබ්ධිය නැති හෙයින් නිවන් දුටුවවුන් හැර සියලුම දිව්‍යමනුෂ්‍යයෝ ඇසින් දුටු දෙය මඟුලැයි ලබ්ධිගත් එක් පක්ෂයෙක කණින් ඇසූ දෙය මඟුලැයි ගත් එක් පක්ෂයෙකා, ගන්ධරස යපශී මඟුලැයි ගත් එක් පක්ෂයෙකැයි තුන් පක්ෂයක් වූහ. මෙසේ පක්ෂවූ පමණක්මුත් ඔවුනතුරෙන් එකෙක්වත් මෙයම මඟුලැයි තත්ත්වාකාරයෙන් හෙවත් සැබෑලෙස නිෂ්ඨාවට නොගියේය. ඉක්බිති සුඛාවාසවැසි දෙවියෝ මිනිසුන්ගේ සිත දැන දෙලොස් හවිරුද්දක්හුගේ ඇවෑමෙන් සම්මාසම්බුදුරජ තෙමෙ මඞ්ගලවද රණසේක්ශයි මනුෂ්‍යපථයෙහි හැසිර ආරොවනා කෙරෙත්. ඉක්බිති මඟුල්සිතන්ට පටන්ගත්දුපටන් දෙලොස්හවිරුද්දක්හුගේ ඇවෑමෙන් හෙවත් තව්තිසාදෙව්ලෝ ගණනායෙන් දින වසයෙන් සත්පැදෙලොස්විකාඩියක් පමණ ගියකලට තව්තිසා වැසිදෙවියෝ රැස්ව "නිදුකාණෙනි! ශ්‍රාවස්තී නුවර මිහිමියෙක් හෙති මිනිසුන්ට මුදලිද ගම්මුදලියෙක් ගම්වැස්සනට මුදලිද රජකෙ

නෙක් රටවැස්සනට නාඝකද එපරිද්දෙන්ම සක්දෙවිඳුහුත් අපදෙවිලොා දෙවිඝනට නාඝකසේක, උන්වහන්සේට මෙපවත් නිවමනාසේක් වේදැයි" ශක්‍රඝනුත් එඇසිල්ලට නිසිවූ සළ හැඳ අබරණලා අඞතුන්කෙළක් දෙවඟනන් පිරිවරනලදුවැ පර සතුරුක්මුලැ පඬුඇඟිල්සලස්නෙහි විජම් දෙසුමට පෙරාතු හෙ ගින් හුන්නවුන් කරාගොසින් වැඳ එකත්පස්ව සිට "සවාමිනි! දැන් වන දෙඝක, මඞ්ගලප්‍රඥාඝක් ලොවැ ඉපිද දැන් මහාකොලාහලඝ, සමහරු ඇඹින් දුටුදෙඝ මහුලැයි කියති සමහරු පියවිකනින් ඇසුදෙඝ මහුලැයි කියති සමහරු ගන්ධරඝශ්‍ප්‍රඥවඝ මහුලැයි කියති එහි අපිදු අනික් අඝද නිඝවාවට නොගියෝ වමු, පින්වත්නි! නුඹවහන්සේ ඉන් යමක් මහුල් වීනම් තත්ත්වාකාරයෙන් වදුළමැනව ඒ පිණිස අඝදිමිසි"කිවිඝ. සක්දෙවිරජ වූකලී මහනුවණැතිහෙයින් මේ මඞ්ගලකථාව තෙපිම සිතා ඝතුද ඝමක්හු කෙරෙන් ඇසුවහුදැයි විතාලෝ. උඹ තමන් සවිමහාරජෙහි දෙවිඝන් කෙරෙන් ඇසූ නිඝාව කිවිඝ. උන්ගෙන් විතාළතැන උන් ආඝාඝසඨදෙවිඝන්ගෙන් ඇසූ නිඝාව කිවිඝ. උන්ගෙන් විතාළතැන මිනිසුන්ව රැක වලසිටි දෙවිඝන්ගෙන් තමන් ඇසූ නිඝාව කිවිඝ උන් විතාළ තැන උඹ මිනිස්ලොවැ පහළවූ නිඝාව කිවිඝ.

ඉක්බිත්තෙන් සක්දෙවිඳු කරාදිඝ තිබැද්දී අතින් කිරන් නාසේ ආඝාඝ ගන්නේ කිම්ද බුදුහු දැන් කොඟි වඝතසේක් දැයි විවාලොඝ. අනික් කොඟි වඝතසේද මිනිස්ලොවැ වඝත සේකැයි කීකල්හි ඔබකරා ගොසින් ඔබගෙන් විවාළකෙනෙක් ඇද්දැයි කිවිඝ. ඔබ විතාළකෙනෙක් නැතැයි කීකල්හි "කිමෙඝ තොපි හැම ගිනි තිබිඝදී ඛිනිඝයි සිතා කනමැදිරිඝන් තබාලා පිඹිනා නිඝාද මහුල් වදුරන්ට නිසිවූ ඝලිත් දුකිම් වැදිම් පිදීම් ආදිඝ තබා තමන් වඝන්සේගේ ගුණසඳඝන්කළපමණ කින්ම එසේ කළවුන්ට ලොවීලොව්තුරාසැපත් සාඛාදීලත හෙයින් තමන් වඝන්සේත් මහුල්වූ බුදුන් අතින් නොවිවාරා මා කුමක් දන්නා හෙයින් මා විවාරන්ට තබාඝතයුතුද මහුල් දුනඝන්ව වුවමනා වී නම් නිදුකාණෙනි! එවි තෙපිත් අපිත් ඒ භාඝ්‍යවත් බුදුහුකරා ගොස් ඔබ විවාරා මහුල් මේඝයි දැන ඝනුම්ඝ අප හැමදෙන එකවම විවාරන්ට බැරිබැවින් තෙපි විවාරවයි" එක් දෙවතාවෙකුට විඛාන කළඝ. ඒ දෙවිපුත්ද ඒ වේලාවට නිසිවූ අබරණලා සැරහීගෙන වීදුලිඝක්සේ බබලමින් දසදඝසක් ඇක්වළ දෙව්බඹුන් ඝා සමඝ ඛඞ්ගමරාත්‍රි ඉඤ්ඤ විඤ්ඤූඤ්ඤාබ්ඛඤඤමේනේ පූජුදෙව්රම එකලුකෙරෙමින්

බුදුන්වෙතින් මේ මඞ්ගලප්‍රශ්නය විචාරනු පිණිස දෙව්රමට අවුස. ඉක්බිති ඒ දෙවිපුත්තෙමෙ භාග්‍යවත්වූ බුදුන් වැඳ ෂඩ්දෙෂවිනිර්මුක්තවූ එකාන්තයෙක්හි සිට මේ මඞ්ගලප්‍රශ්නය විවාළේය. භාග්‍යවත්වූ සම්මාසම්බුද්ධතෙමේ ඒ දෙවිපුත්හුගේ මඞ්ගලප්‍රශ්නය විසඳනසේක් මේ මඞ්ගලසූත්‍රය දෙසනා කොට වදාළසේක.

මෙහි පළමුකොට මේ කියනලද්දී උත්පත්තිකථාව වන්නීය.

ඒ මහුල්සුතුරෙහි වූකලි "එවං මේ සුතං" යනාදී නිදානවච නය ප්‍රථමසංගායනාකාලයෙහි ධම්මසංගායනාකරන්නාවූ මහ කස්සප්තෙරපාණන් විසින් මංගලසූත්‍රය පිළිබඳවැ විචාරණලදුව අනදමතෙරනුවන් විසින් එකුන්පන්සියක් මහරහතන් වහන් සේලාහමුයෙහි කියනලදී. "බහූදෙවා මනුස්සා ච" යනාදීවූ එකම ගාථාව මෙය පිළිවිස්නට පැමිණි දෙවිපුත්හු විසින් කියන ලදී. "අසෙවනා ච බාලානං" යනාදී එකොළොස් ගාථා කෙ තෙක් ධම්මරාජන්වූ ධම්මප්‍රභවවූ ධම්මාකරවූ ලොව්තුරාබුදුරජ තුමාණන් විසින් වදාරණලදහ. "ඉදම්වොච භගවා අත්තමනාසා දෙවතා භගවතො භාසිතං අභිනන්දිත්වා භගවන්තං අභිවාදෙත්වා තත්ථෙවන්තරධායි" යන නිගමනවචනය ධම්මඛුගැරි අනදමහ තෙරණුවන් විසින් ප්‍රකාශකරණලද්දකී. ඒ මේ සියල්ලම සඞ්ගා ඛානය කොටැ "මංගලසූත්‍රය"යි කියන ලද්දෙය.

නිදාන නිගමනවචනවය කුමටය යත්? සූත්‍රයාගේ ත්‍රිවිධ කල්‍යාණත්වය පරිපූරණය කිරීම්පිණිසයැ. මංගලසූත්‍රයද වනාහි නිදානයෙන් ආදිකල්‍යාණය නිගමනයෙන් පරියොසානකල්‍යා ණය තදුභයෙන් මධ්‍යයෙහි කල්‍යාණයැ. මේ මෙහි සූත්‍රව්‍යවස්ථා නය වන්නේයැ.

දැන් මංගලසූත්‍රයාගේ පුච්ඡාවසිකවශයෙන් උත්පත්තිය වණීණනාකරන්නහු විසින් යම් ඒ නිදානයක් කියන ලදද ඒ සම්බන්ධවූ අර්ථය මෙසේ දතයුත්තේයැ.

හේ කෙසේය යත්?

නානානයනිපුණවූ ධම්මාර්ථදෙසනා ප්‍රතිවෙධගම්භීරවූ සියලු සත්ත්වයන් විසින් සවකීය සවකීයභාෂානුරූපයෙන් උපලක්ෂ ණීය සවභාව ඇති ශාස්තෘන්වහන්සේගේ වචනය සම්ප්‍රකාර යෙන් අවබොධකරන්නට ලොකයෙහි කවරජනයෙක් සමර්ථවන් නේද නොවන්නේමැයි. ධම්මභාණ්ඩාගාරික අනදතෙරවූ මෙද සවඥබුදු නොවෙමි මෙය මවිසින් සාක්කරණලද්දේත් නොවෙයි එතකුදවුවත්,

ප්‍රවරවීසුඛමධ්‍යුරතරඝඩ්මිඃඝාඛ්කාමරීවිඝඨ්රණයෙන් සඵිසුරු
සුරමනුජභූජඝගරුඬගඤ්ඡිවිබුධජනමතකුමුදුවනවිකාඝනඅසම
සමසොමිගුණගඝිබිම්බප්‍රතිභාග අනන්‍යසාධාරණාතන්‍ය දෙහශ්‍රී
මංගලලක්ෂණසමපූණීවූ තෙලොකෙකතිලකඅපතථාගතස
මාසම්බුදුරජාණන් වහන්සේ පිරිනිවි සත්වතදවස්හි සුභද්‍ර
නම් මහලු පැවිද්දහු විසින් කියනලද දුභාෂිතවචනය මෙනෙහි
කරමින් ප්‍රවරතරකීර්තිභාරායුෂ්මත්වූ මහාකාශ්‍යපසථවිරයන්
වහන්සේ ධම්මය සඞ්ගායනා කරම්හයි වෙහාරපර්වතපාශ්ව
යෙහි සපතපණ්ණිගුහාවාරයෙහි අජාසත්රජඅණින් පණවන
ලද උතුම් මණ්ඩපමධ්‍යයෙහි නවාඞ්ගශාසනාභාජනධාරී සාර
සියනවානුනමක් මහාරහතන් වහන්සේලා මධ්‍යයෙහි වැඩහිඳ
මඞ්ගලසූත්‍රය පිළිබඳව ධම්භාණ්ඩාගාරිකආයුෂ්මත් අනදමහ
තෙරනුවන් අතින් විචාරනලදුව බාලජනසංග්‍රහිවරහිතඅඛ
ණ්ඩිතාචාරමණ්ඩිතපණ්ඩිතජනසෙවන භජනපඤ්ඩිතාසනසමහාඝ
නාදී අලොතතරනිඃශත් ප්‍රභෙද මඞ්ගලකථාවෙන් සමූපල
ක්ෂිත ශ්‍රවණජනමනකණීරසායනවූ මේ මහාමඞ්ගලසූත්‍රානන
ධම්දෙසනාව මවිසින් ශ්‍රොතාවිඥනය පූජිඞ්ගමවූ ශ්‍රොතාවිඥන
විථියෙන් සලකනලදී. නොහොත් මේ ආකාරයෙන් අඝනලදී
මෙසේ අඝනලද මෙසේම අඝනලදී එනම්:—

කරුණාකාත්‍යඝමයඝඞ්ඛ්‍යාත එක්ධම්දෙසනාකාලයෙක්හි
පෙර සවස් නම් යාමිඝට නිවාඝස්ථානවූ ඝෙසින් ශ්‍රාවස්තියයි
ලබනලද නම් ඇති නගරවරාඝන්නයෙහි ජෙත නම් රජකුම
රුවා විසින් රොපිතසංවර්ඩිත ඝෙසින් ජෙතවනයයි ලබනලද
නම් ඇති "අනාථඝන්ට පිණ්ඩය මොහුකෙරෙහි ඇත්ඝෙය්ය"
යන අදිඨයෙන් අනාථ පිණ්ඩිකයයි ප්‍රඝිඩවූ මහධනගැහැවියා
විසින් සුපණස්කෙළක් අමුරන් විඝදම්න්ත්මවනලද මහවෙහෙ
රෙහි ආඝර්ඨ්යාපථයෙන් සුඝාත වැඩවාඝය කරනසේක.
එහි නිබඳ වාඝය ඇතිකල සත්‍රීපුරුෂසාධාරණ දෙවතා නාම
යෙන් කියනලද නාමගොත්‍රයෙන් අප්‍රකටවූ දෙව්පුත් කෙනෙක්
තෙමේ රැයපිළිබඳ පළමුයම ගෙවුනුකලැ අතිරූපවූ ඡ්ඵවණ්ණ
යෙන් මුලුදෙව්රම්වෙහෙර සඳහිරුමෙන් එකලුකාට භාග්‍ය
වත්බුදුරජතුමන් යම් තැනෙක්හි වැඩහුන්සේක්ද එතනට
පැමිණිසේය. ඝෙවත් යම් බදුවූ නානාවිධගුණවිශෙඝාධි
ගමාධිප්‍රාඝසංඛ්‍යානකාරණයකින් භාග්‍යවත් තෙමේ දෙව්
මිනිසුන් විසින් එළඹියයුත්තේද එකරුණින් එළඹිසේය.

එසේ ශාස්තෘන්වහන්සේගේ සමීපයයි කියනලද තැනට පැමිණෙද භාග්‍යවත් බුදුරජතුමන් වැඳ ඉතා පසුබාගය ඉතා අභිමුඛය ඉතාළඟය ඉතා දුරය උඩුසුලඟය උස්පෙදෙසය යන සඳෙස් වූ සතැන හැර එකත් පසෙක සිටියේය. මෙදෙව්පුත් කිහෙනි නුහුන්නේද යත්? වැඩිවෙලාවක් නොනවතිනු කැමති නෙයිනි. දෙවියෝ වනාහී කිසියම් කරුණක් පිණිසම අසුවි පිරුණු වැසි කිළියකට මෙන් මිනිස් ලොවට පැමිණෙති පියෙවින් වනාහී ඔවුන්ට සියක්යොත්නෙක පවන් මනුලොදුගඳ බැවින් පිළිකුල් වෙයි. එහෙයින් ඔව්හු මෙහි නොමැලෙත්. එසේ හෙයින් මේ දෙව්පුත් පැමිණි කිසට පමණක් මඳක් නවතිනු කැමැත්තෙන් නුහුන. මෙසේ එකත්පසෙක සිටි දෙව්පුත්තෙමේ දසදහසක් සක්වළ දෙව්බඹුන් මඞ්ගලප්‍රශ්නය අසනු කැමති බැවින් මෙසක් වළැ රැස්ව එහ අස්වල්ගාලොම්කොණක් බහාලන පමණ තැන දසදෙනෙක්ද විසිදෙනෙක්ද තිස්දෙනෙක්ද සතළිස්දෙනෙක්ද පණස්දෙනෙක්ද සැටදෙනෙක්ද සැත්තෑදෙනෙක්ද අසූදෙනෙක්ද සියුම් අත්බැව් මවා ඒ සියල්ලන් ඉක්මවා බබලමින් පණවනලද උතුම් බුද්ධාසනමතුයෙහි වැඩවුන් බුදුන් පිරිවරා සිටියවුන් දැක එසමයෙහි නොපැමිණියාවූද මුලුදඹදිව්වැසි මිනිසුන්ගේ චිත්තය සමඟකිවූ පරිවිතර්ක දැන සියලු දෙව් මිනිසුන්ගේ විවිකිච්ඡාසල්ලසමුබ්බරණඤ්ඤ භාග්‍යවතුන් වහන්සේ අතින් ගාථාවකින් මෙසේ විවාළේය යනුයි.....

මේ එහි අනදමතෙරනුවන් විසින් ප්‍රකාශකළ අදහස වන්නේය.....

දෙව්පුත්හු විසින් විවාළ එකමගාථාවගේ අදහස කිසේය යත්? ලොවට මඞ්ගලවූ ලොකොත්තමවූ ලොකෙකඝිවංකරවූ සවාමීනි! බුදුරජාණන්වහන්ස! බොහෝවූ චාතුම්මහාරාජිකාදි උත්පත්ති දෙවියෝද සවසථභාවය හෙවත් ශාශනවූ බොහෝ දිඝඛම්මිකසමපරාසීකධම්මයන් ප්‍රයෝජනකොට ඇත්තාවූ ජම්බු විපවාසි බොහෝ මනුෂ්‍යයෝද සියලුසම්පත්තීන්ගේ වෘද්ධිප්‍රාප්තියට හෙතුවූ මඞ්ගලකාරණයන් සිතුවාහුය. ඔවුන්ට තදනීසාධකවූ විශිෂ්ටවූ ප්‍රවරවූ සියලුලොවැස්සාහට හිතසුව ඵල වන්නාවූ මඞ්ගලකාරණයක් වදාරණසේක්වා යනුයි.....

මෙතෙකින් ඛුද්දජනමහානන්දනවූ පුබ්බාගාථාවගේ වණ්ණනාව නිමවනලදී.

මෙසේ ඒ දෙවිපුත්හු විසින් විවාරණලද භාග්‍යවත්තෙමේ අප්‍රතිහතඅනාවරණඥානයෙන් ඒ ප්‍රශ්නය විසඳනසේක් මද දෙයක් ඉල්වූවක්හට බෝහෝ දෑ දෙන මහධනපුරුෂයක්හු සෙයින් එකමගුලක් විවාළහුට අවතිසක් මඞ්ගලකාරණයන් දක්වනලද "අසෙවනා ච බාලානං" යනාදිවූ දශගාථාකෙනෙක් වදළසේක. දැන් ඔවුනතුරෙන් පළවූ කොට ප්‍රථමගාථාවසහිතවූ ව නිදානකාව කියනුලැබේ.

එඛා දෙවතාව! බාලයන් සෙවනය නොකිරීමය, පණ්ඩිත ජනයන් සෙවනය කිරීමය, පිදිය යුත්තන්ට පිදීමය, යනමේ ත්‍රිවිධවූ කර්මය උතුම්වූ මඟුලැයි කියා සලකා ගනුවයි වදළසේක. මෙකියනලද්දේ එහි සංක්ෂේප අදහස වන්නේය.

මේ මතු කියනු ලබන්නේ එහි විස්තරය වන්නේය. හේ කිසේය යත්? අසෙවනා යන්නෙන් ප්‍රකාශකරනලද සෙවනය නොකිරීම නම් කිමයත්? භජනය නොකිරීමය සහයොගතා වර්ජනය හෙවත් දුරලීමය අන්‍යම්ප්‍රවංකභාවය යනුයි.

බාලයෝ නම් කවරහු යත්? යම්කිසිවෙක් තුමූ ප්‍රාණඝාතාදී දසඅකුසලකර්මපථයන්ගෙන් යුක්තවූවානුනම් ඔවුහුද පූරණ කාශ්‍යපය මක්ඛලිගොසාලය නිගණ්ඨනාථපුත්‍රය සඤ්ඤයබෙල්ලඨි පුත්‍රය පකුධකාත්‍යායනය අජිතකෙසකම්බලිය යන සාශාස්තෘ හුද එයින් අනිකුදු දෙවදත්තකොකාලිකාදි පාපපුද්ගලයෝද බාලයෝ නමැයි දතයුත්නාහ. මේ සියල්ලෝම ප්‍රඥජීවිතයෙන් නොව අනුභවය පමණකින් ආසවාසප්‍රසවාසකරනපමණකින් ජීවත්වන හෙයින් බාලයෝ නමැයි අර්ථකථාවෙහි කියනලදහ.

බාලලක්ෂණයෝ නපුරුවෙතකා සිතීම් ආදීවසයෙන් දත යුත්තාහ. බාලයා වනාහි සිතන්නේද අභිධ්‍යාව්‍යාපාදමිථ්‍යා දෘෂ්ටිසහගතවූ ත්‍රිවිධමනොදුශ්චරිතයක්ම වෙයි. කියන්නේද මුසාවාද පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්‍රලාප යන නිවි වැදූරුම්වූ දුර්භාෂිතයක්ම වෙයි. කරන්නේද ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ දුශ්චරිතයක්ම වෙයි. ඒ කියනලද නපුරුසිතිවිලිසිතීම්ආදීවූ දසඅකුසලකර්මපථයන් කරණකොට ගත බාලයා ලකුණුවනු ලබන හෙයින් ඒ අකුසලකර්මපථයෝම බාලලක්ෂණයෝයයිද බාලයා හැඳිනීමට ඔවිහුම කරුණු වනහෙයින් බාලනිමිත්තුයයිද ඔවිහුම බාල යාගේ චරිතාපදානය වනහෙයින් බාලාපදානයයිද කියනු ලැබෙත්. එහෙයින් උපරිපණ්ණාසකයෙහි බාලලක්ෂණසූත්‍ර

යෙහි "තීණිමානි භික්ඛවෙ! බාලස්ස බාලලක්ඛණානි බාලනිමිත්තානි බාලාපදානානි, කතමානි තීණි? ඉධ භික්ඛවෙ! බාලො දුච්චින්තිතචින්තී ච හොති දුබ්භාසිතභාසී ච දුක්කතකම්මකාරී ච" යි වදරණලදී.

පණ්ඩිතයෝ නම් කවරහුයත්? යම්කිසිවෙක්තුමු පණීවා යෙන් දුරුවිම් ආදි දසකුසලකර්මපථයන්ගෙන් යුක්තවූවාහු නම් ඔහුතුමුද තවත් බුදුපසේබුදු අසුමහසව්වන්වහන්සේලා හා අනිකුදු තථාගතශ්‍රාවකයන් වහන්සේලා වන්නාහුය. ඉකුත්වූ කල සූත්‍රශාස්ත්‍රාවරයාද අනිත්‍යතාපඤ්ඤාදීහුද පණ්ඩිතයෝයයි දතයුත්නාහුය. ඒසියලෙල්ලාම දිඨ්ඨම්මිකසාම්පරායික අර්ථයන්හි ප්‍රඥාගතියෙන් යන හෙයින් පණ්ඩිතයෝයයි අටුවාවෙහි කියන ලදහ. සියුම්වූවද අර්ථයන්හි ඤාණගතියෙන් ගමනය කෙරෙයි දූනබෑදීන්ගේ පිළිතෑදී ආකාරයන් දනිනුයිද ඤාණගතිය පිණිස මෙයින් ගමනය කෙළේ ඤාණගතියම පවත්වානුයිද නොහොත් ප්‍රකටවූ ඤාණගතිය මොහුට ඇත්තේනුයිද ඤාණගතියෙන් ගමනය කෙරෙනුයිද පණ්ඩිතනමැයි ශබ්දනීතියෙහි කියන ලද්දේය.

පණ්ඩිතලක්ෂණයෝ වනාහි "තීණිමානි භික්ඛවෙ! පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානි කතමානි තීණි? ඉධ භික්ඛවෙ! පණ්ඩිතො සුචින්තිතචින්තී ච හොති සුභාසිතභාසී ච සුකතකම්මකාරී ච" යි බාලපණ්ඩිතසූත්‍රයෙහි වදාළ ක්‍රමයෙන් දතයුත්තේය.

තවත් ක්‍රමයක් නම්,

> දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යො චම්පරාභිකො,
> අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චතීති

යනුයෙන් දිට්ඨධම්මිකවූ හෙවත් ඉහතම්හාවසංඛ්‍යාත මේ ලොකයෙහි වන්නාවූ ඥාතසඵයන් පිළිබඳ වස්තූපකරණ ආඥාකුලකම්මාන්තාදී අර්ථයද පැවිද්දන් පිළිබඳ චීවරාදිවතුප්‍රත්‍යයප්‍රතිලාභාදී අර්ථයද සාම්පරායිකවූ හෙවත් පාරලෞකිකඵල නිපදවන්නාවූ ධම්මචරියා හා සද්ධම්මශ්‍රවණ යෝනිසොමනසිකාරාදී අර්ථයද යන මෙකී විවිධාර්ථය හා පරමාර්ථනිර්වාණයත් ලබන හෙයින් ධෘතිසම්පන්නාදයතෙමෙ පණ්ඩිතයා නමැයි කොසලසංයුත්තකයෙහි උභොඅත්ථසූත්‍රයෙහි කියනලද්දේය.

යමෙක් තුමූ පූර්වෝක්තයන් උභයාර්ථයම පිළිලබන්නම් තදනී ප්‍රතිලාභය පිණිස පිළිපදින්නම් ඔහුතුමූ පණ්ඩිතතම. යමෙක් තුමූ යථොක්තයන් උභයාර්ථයන් සිඳින්ද උභයානර්ථයන් ගනිත්ද ඔහුතුමූ බාලතම. ඔහුතුමූ වනාහි දෙවදූරුම්වූ අනර්ථයන් ගනිත් දෙවදූරුම් අර්ථයන් සිඳින්නුයි හෝ බාල යන නාමය කියනු ලබත්. ඔවුනතුරෙන් පූර්වපක්ෂයෙහි බාලශබ්දය භූවාදි ගණයෙහිවූ විසද්දූපපද ලා ආදතෙ යන ධාතුයෙන් සිඩය. අපරපක්ෂයෙහි වූකලි කියාදිගණයෙහි වූ ලුවෙජ්දතෙ යන ධාතුයෙන් සිඩය. ඔවුනතුරෙන් පණ්ඩිතයොම සෙවනය කට යුත්තාහුය බාලයෝ සෙවනය නොකටයුත්තාහුය. බාලතෙමෙ කුණුමස් වැනිය ඔහුසේවනය කරනතැනැත්තේ වනාහි කුණු මස් එතු පත්‍රවැනිය නුවණැත්තන් විසින් බැහැරලිය යුතු බවට පිළිකුල් කටයුතුබවට පැමිණෙයි. පණ්ඩිතතෙමේ තුවරලාමාලාදි සුවඳබඩු සමානය ඔහුසේවනය කරනතැනැත්තේ වනාහි තුවරලාමාලාදී සුවඳබඩු දූවටු පත්‍ර හා සමානය නුවණැත්තන් විසින් සම්භාවනීය බවට හා මනොඥබවටත් පැමිණියේ වෙයි. යම් පුද්ගලයෙක් තෙමේ වනාහි බාලපණ්ඩිතයන් අතුරෙන් කවරෙකුනමුත් සෙවනය කෙරේද තෙතෙමේත් ඔහුගේ සවභාව ඇත්තෙක් වෙයි. මේ අර්ථය දැක්වීමට වනාහි සුවපොතකාදීන්ගේ කථාවසතුව කියනුලැබේ.

ඉකුත්වූකලැ සාත්‍ර නම් පව්වෙක හිඟුල්වෙනෙකැ දෙබෑ සුවපොව්කෙනෙක් වූහ. ඒ පණ්ඩිතයසම්බන්ධිවූ උඩුසුළංපෙදෙසෙහි වනාහි පන්සියයක් සොරු වාසයකරන ගමෙක් විය. යටිසුළංපෙදෙසෙහි පන්සියයක් සෘෂිහු වැසයකරන අසපුවක් විය. සුවපොව්වන්ගේ පියාපත් ඉදෙනකල පවන්මඩුල්ලක් ඉපිද ඒ දෙදෙන එසින් පහරණලදුව එකෙක් සොරුන් වසන ගමැ සොරුන්ගේ ආවුධඅතුරෙහිද එකෙක් සෘෂීන්ගේ අසපුවෙහි වැලිතෙලෙහි මල්අතුරෙහිද වෙන්ව වැටුනාහ. ඔවුනතුරෙන්. සොරුන්ගේ ආවුධඅතරෙහි වැටුනහු ආවුධඅතරෙහි වැටුන බැවින් සතහිගුඹය, සි සොරුන් විසින් කරනලද නම් ඇතිව සොරුන්ගේ සමීපයෙහි වැඩින. අනිකා මල්අතරෙහි වැටුන බැවින් පුපඵකය සි තපසුන් විසින් තබනලද නම් ඇතිව තපසුන්ගේ සමීපයෙහි වැඩින. එසමයෙහි උත්තරපංචාල නුවර පංචාල නම් රජ්ජුරුවෝ සෘෂිභරණයෙන් සැරසී සපිරිවරින් මුවදඩයම් පිණිස වල්වැද යමෙකුගේ පාර්ශ්වයෙන් මුවෙක් පැන ගියේනම් ඔහුව රජඅණකොරමැයි කියා

රියෙන් බැස දුන්න ගෙන එක්තැනෙක සැඟවී සිටියහ එකල එණීමෘගජාතියෙහිවූ එක්තරා මුවෙක් මිනිසුන්හඬනහා වනලැබැ තළතකල නැගිට පැනයන දෙස බලනුයේ රජු සිටින තැනම අවකාශබැව් දැන රජුහමුකොටම දුවගොස් පලාගියේය. පිරිවර ජනයාද රජුරුවන්ට සරදම් කළහ. රජුරුවෝද මන් නැඟ දුන් ඌ අල්වා ගන්නෙම්මයයි රියතැ ග වේගයෙන් මුවා ලුහුබැන්දහ. පිරිවර සෙනඟද රජුලුහුබඳ නව නොඇකි වී. රජුරුවෝ රියැදුරුදෙවැනි කොට දිවන් නේ මුවා නොදැක නැවතී සොරු වසනගමසමීපයෙහි සිත් කලුව සිහිල් නිමල් දිය ඇති සොඳුරු කඳුරැලියෙකැ නහා පැන් පානය කොටැ ගණරුක්සෙවනකැ මඳපවන් පහස් විඳැ විඳැ හොන්නාහ. ඒ වනාහි සොරුමුළු වල්වන් කල් වියැ. ඇතුළගම බත්කරන එකෙක් සමඟ සතුගුඹතෙමේ නැවැත්තේය. සතුගුඹතෙමෙ ගමින් නික්මවුත් එසේ නොත්නාවූ රජු දැක ගමට වැද රජු මරා වස්ත්‍රාභරණ ගෙන රජුපය අල්වා ඇද දමා අතු කැබලිවලින් වසා දමමුයයි අරක්කැමියා සමඟ මනුෂ්‍යභාෂා යෙන් කථාකෙළේය. රජතෙමෙ පිබිද ඒ අසා හටගත් ලොමුඩැ හැගැනුම් ඇතිව මෙතැන ප්‍රතිඥය සහිතයයි බිය පත්ව රියතැග එතැනින් පලාගොස් තවුසන්ගේ අසපුවට පැමිණියේය. එකල තවුසෝ පලවැල පිණිස වල්වන් කල් වියැ. පුපඵකයා පමණක් අසපුවෙහි නැවැත්තේය. හෙතෙම රජු දැක පින්වත! මහරජ! නුඹවහන්සේගේ මෙහි පැමිණීම ඉතා යහපත අපගේ සවාමිවූ ඒ ඍෂිවරයන් වහන්සේලා පලවැල පිණිස මේ ළඟ කට හියහ" යනාදී වසයෙන් ප්‍රියවූ පිළිසඳරකථා කෙළේය. රජුරුවෝ ඔහුගේ පිළිසඳරෙහි පැහැද "ඒකාන්තයෙන් මේ හිරාපක්ෂිතෙමේ පරමධාර්මිකයෙක එතකුදුවුවත් අනික් හිරා පක්ෂිතෙමේ රළුබස් දෙඩයි" කියා පුපඵකයාට පසසා සතුගුඹයාව අවමන් කොට කථා කෙළේය. ඕනට කියන්නලද අව මන් බස් අසා පුපඵකතෙමේ කියනුයේ 'පින්වත මහරජ! මම ඔහු හා එකම්වුකුසැ උපන්මි ඔහු වනාහි අසත්පුරුෂයන්ගේ සමීපයෙහි වැඩුනේ ඔවුන් විසින් වෛරධර්මියෙන් නික්මවන ලද්දේය. මම වූකලී සාධූන්ගේ සමීපයෙහි වැඩුනේ ඒසාධූන් විසින් ඍෂිධර්මියෙන් නික්මවනලද්දේ වෙමි. එහෙයින් අපි දෙදෙන ධර්මියෙන් වෙනස් වමුහ" යි කියා රජුහට දම්දෙසනුයේ

"යං යං හි රාජ! භජති සතං වා යදි වා'සතං,
සීලවන්තං විසීලං වා වසං තසෙසව ගච්ඡති.

යාදිසං කුරුතෙ මිත්තං යාදිසඤ්චූපසෙවති,
සොඃපි තාදිසතො හොති සහවාසොඃපි තාදිසො.

සෙවමානො සෙවමානං සමඵුඨො සඵුඨං පරං,
සරො ඵුඵො කලාපංව ආලිත්තමුපලිපති,
උපලෙපභයා ධීරො නෙව පාපසඛා සියා.

පූතිමච්ඡං කුසගෙහන යො නරො උපනය්හති,
කුඣඃපි පූති වායතති එවං බාලූපසෙවනා.

තගරඤ්ච පලාසෙන යො නරො උපනය්හති,
පත්තා'පි සුරභි වායතති එවං ධීරූපසෙවනා.

තසමා පත්තපුටසෙසව ඤත්වා සම්පාකමත්තනො,
අසන්තෙන නොපසෙවෙය්‍ය සන්තෙන සෙවෙය්‍ය පණ්ඩිතො,
අසන්තො නිරයං නෙන්ති සන්තො පාපෙනති සුග්ගති" න්ති.

පින්වත! පංචාලනම් මහරජ්ජුරුවන් වහන්ස! යම් ජනයෙක් තෙමෙ සත්පුරුෂවූ හෝ අසත්පුරුෂවූ හෝ සිල්වත්වූ හෝ දුස්සීලවූ හෝ යම් යම් කෙනෙක් යම්හෙයකින් භජනය කෙරේද ඒ ජනතෙමේත් ඔහුගේ වශයට යන්නේය. එසේම සත්පුරුෂවූ හෝ අසත්පුරුෂවූ හෝ සිල්වත්වූ හෝ දුස්සීලවූ හෝ යම්බදු මිත්‍රයෙක් කෙරේද එබදුවූම යමෙක් වෙත නිතර නිතර එළඹ සේවනය කෙරේද ඒ ජනතෙමේත් එබන්දෙක්ම වන්නේමය. එබදුවූම යමෙක් සමඟ සහවාසය කෙරේද ඒ ජනතෙමේත් එබන්දෙක්ම වන්නේය.

යම්කිසි අතවැසියෙකු විසින් සපශීකරනලද යම්කිසි ආවාහ්‍යයක් තෙමෙ අනික් ආවාහ්‍යයෙකු සපශීකරන්නාවූ පාපධම්මයෙන් තැවරුනාවූ අතදැසියා තවරාගනීද ඒ ආවාහ්‍යය තෙමෙත් විෂපෙවී හී සපශීකරනලද හිමවුරක් මෙන් බාලයන් සෙවනය කරනසුලුයයි කියා අපකීර්තිය ලබන්නේය. එහෙයින් "එවං බාලූපසෙවනා"යි වදරන ලද්දේය. ප්‍රාඥයන් සෙවනය කරන සුදුවූ පුද්ගලතෙමෙ පණ්ඩිතවන්ව නොහැකිවූවද කල්‍යාණමිත්‍රයන් සෙවනය කරන සුලුයයි කියා ගුණ

කිත්තිය ලබන්නේය. එහෙයින් ''එවං ධිරූපසෙවනා''යි වදාරණලද්දේය. ප්‍රාඥතෙමේ පාපයෙන් හා අපකීර්තියෙන් තැවෙයි යන බියෙන් පාපයහලුවන් ඇත්තෙක් නොවන්නේය.

යම්කිසි මිනිසෙක් තෙමේ කුණුවූ මාංසයක් කුසහාණින් වෙළා තබාද එහෙයින් ඒකුසහාණත් දුගීඛයම වහනය වන්නේය නින්දිතවූ අසත්පුරුෂවූ අසාරවූ පාපීවූ අකෘතඥවූ බාලයන් සසවතයෙන්ද එසේම අපකීර්තිසංඛ්‍යාතදුගීඛයම වහනය වන්නේය.

යම්කිසි මිනිසෙක් තෙමේ තුවරලා තුරුක් ආදීවූ යම් කිසි සුගන්ධද්‍රව්‍යයක් යම්කිසි පත්‍රජාතියකින් වෙළා තබාද ඒ පත්‍රපවා සුරභිගන්ධවහනය වන්නාහුද එපරිද්දෙන්ම පණ්ඩිත සෙවනයෙන්ද ගුණකීර්ත්‍යංඛ්‍යාතවූ සුරභිගන්ධය වහනය වන්නේය. එසේ හෙයින් තුවරලාතුරුක්ආදීවූ සුවඳදෑ ඔහාතලද පත්‍රයාගේ මෙන් කල්‍යාණමිත්‍රසංසර්ගීවසයෙන් තමන්ගේ ගුණ පරිපාකත්වය වන්නේයයි දැන ඤාණසම්පන්නවූ සානසින් ඇති සත්පුරුෂයන් සෙවනය කරන්නේය අඥතවූ අසානතවූ අසත්පුරුෂයන් සෙවනය නොකරන්නේය අසානතවූ අඥතවූ අසත්පුරුෂවූ මිථ්‍යාදෘෂ්ටිකපුද්ගලයෝ තමන් ඇසුරුකරන්නවුන්තරකාදී සතරඅපායට පමුණුවන්නාහ. සානතවූ සත්පුරුෂවූ පණ්ඩිතවූ සම්‍යක්දෘෂ්ටිඇති පුද්ගලයෝතුමූ තමන් ඇසුරුකරන්නවුන් සවර්ගලොකයට පමුණුවන්නාහුයයි දෙසනා කෙළේය.

රජ්ජුරුවෝ ඒ පුපඵකයාගේ ධර්මකථායෙහි අතිප්‍රසන්නවැ මනාබෝවේලාවකින් එතනට පැමිණි තපස්වීන් වැඳ සවාමීනී! මට අනුකම්පා පිණිස මාගේ නුවරෙහි වාසය කරනු මැනවැයි ආරාධනා කොට නුවරට පැමිණ හිරවුන්ට අහය දුනය කොට එහි පැමිණියාවූ සෘෂිසමූහයා උයනෙහි වාසය කරවා දිවිඇතිතාක් උපස්ථානකොට සවර්ගපදය පිරවූයේය. පුපඵක නම් හිරුතෙමේද වෙනෙහි වැස කම්වූ පරිද්දෙන් මිනිස පරලොව හිඳියේය.

විසිවන නිපාතයෙහි සතතිගුඹජාතකවර්ණනායෙහි

සුවවසතුවහි.

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුවනෙ
කුත් රාජ්‍යය කරනකල අපමහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට
අමාත්‍යවුහ. එකල රජ්ජුරුවන්ගේ මහිලාමුඛ නම් මහුලැනෙක්
විය. ඒතෙමේ සිල්වත්ය ආචාරසම්පන්නය කිසිකෙනෙකුන්ට
හිංසාවක් පීඩාවක් නොකරන්නේය. ඉක්බිත්තෙන් එක්දවසක්
ඒ ඇතු සිටිනා ඇත්හලසමීපයෙහි රාත්‍රිභාගයෙහි සොරු අවුත්
ඔහට නුදුරු තැන හිඳ සොරකම් මන්ත්‍රණය කළාහුය. "මෙසේ
උමංබිදියයුත්තේය මෙසේ මංපැහැරිය යුත්තේය උමිංබිදිව
හා මංපැහැරීම් මඟක් නොවක්සේ තිරවුල්කොට ඉගෙණගෙන
බඩු සොරබාම් කරන්ට වටනේය සොරකම් කරන්නහු විසින්
දසතුභිම්යන් මරාම සොරකම් කටයුත්තේය එසේ කළකල
ධනයෙන් නැගි සිටින්ට සමර්ථ තම් වන්නේය වසතු සොරකම්
කරන්නහු විසින් වනාහි ශීලාචාරගුණයෙන් යුකත නොවිය
යුත්තේය, කර්කශවූ ඵරුසවූ සාහසිකවූවෙක් විය යුත්තේය"යි
මෙසේ කථා නොට ඔවුනොවුන් උගන්වාගන ගියාහුය.
මෙම ක්‍රමයෙන් දෙවැනිදවස තෙවැනිදවසයයි කියා බොහෝ
දවසක්ම එහනට අවුත් මන්ත්‍රණය කළාහුය. ඒ මහිලාමුඛනම්
හස්සියා සොරුන්ගේ බස් අසා මා උගන්වනී යන සංඥයෙන්
දැන් මා විසින් වණ්ඩඵරුසව රෞද්‍රක්‍රියා ඇතිව පැවතිය යුත්
තේයයි සිතා එබඳුවූ වණ්ඩගුණ ඇතිවිය. ඉක්බිත්තෙන් උදෑ
සනම ආවාවූ ඇත්ගොව්වා සෝඬින් බදා අල්වාගන බිමගසා
මැරුවේය. මෙසේම අනිකකුත් අනිකකුත්දෑයි ආ ආවුන් මැරු
වේවය. මහිලාමුඛ නම් හස්සියාට මදහැංනේය, එතැන්හිටින්
දුටුදුටුවන් මරන්නේයයි මින්මුත්තු රජ්ජුරුවන්ට ක්වුය. එබස්
ඇසූ රජ්ජුරුවෝ බොධිසත්වයන්ට කියන්නෝ පණ්ඩිතයෙනි!
යව කවර කාරණයකින් ඒ ඇතා දුෂ්ටවිදේශාරයි දැනගතහුමයි
කිවුය. බෝධිසත්වයෝ ගොස් ඔහුගේ ශරීරයෙහි රොනකැති
නියාව දැන කවර කාරණයකින් මෙතෙම දුෂ්ටවිදේශාරයි.
පරීක්ෂා කරන්නේ ඒකාන්තයෙන් නුදුරු තැනෙක කිසිකෙනෙක
කුන්ගේ කපුරුවවකයක් අසා මොහු මා බස්කම් උගන්වනියන
සංඥයෙන් දුෂ්ටවීයයි සැලවුනන් කොට ඇත්ගොව්වන් අතින්
විවාරන්නේ ඇත්හලසමීපයේ රාත්‍රිභාගයෙහි කිසිකෙනෙකුන්
විසින් කථාවක්කළ නියාවක් දනුදැයි විවාළෝය. 'සවාමීනි!
සොරු අවුත් කථාකළෝන'යි කිවුය, බෝධිසත්වයෝ ගොස්
රජ්ජුරුවන්ට කියන්නෝ දෙවඟන්වහන්ස! ඇතුව කිසි පරිග
පීඩාවක් නැත සොරුන්ගේ බස්අසා දුෂ්ටවීයයි කිවුය. දැන්

කුමක් කළයුතුදැයි කිකල්හි සිල්වත් මහණබමුණන් ඇත්හළ සමීපයෙහි හිඳුවා ශීලාචාරකථා කියවන්ට සුදුසුවන්නේයයි කිවුය. රජ්ජුරුවන් විසින් එසේ කරවයි කිකල්හි බොධිසත්ව යෝ සිල්වත්වූ මහණබමුණන් ඇත්හලසමීපයෙහි හිඳුවා සවාමීනි! ශීලනිශ්‍රිතවූ කථා කිවමැනවැයි කිවුය. එබස් ඇසූ මහණබමුණෝ ඇතුට නුදුරු තෙනෙක හිඳ කියන්නෝ කිසිවෙක් නොඇල්විය යුත්තේය කිසිවෙක් නොමැරිය යුත්තේය ශීලාචාරයෙන් ක්ෂාන්තිමෛත්‍රීකරුණාවෙන් යුතුනවිඳුවුය"යි ශීලනිශ්‍රිතකථා කළාහුය. ඒ හස්තියා එබස් අසා "මොහු මා බස්කම් උගන්වති එසේ හෙයින් දැන් මෙතැන් පටන් සිල්වත් විය යුතුය"යි සිතා සිල්වත්ව ක්ෂාන්තිමෛත්‍රීකරුණාවෙන් යුකත විය. රජ්ජුරුවෝ බොධිසත්වයන් අතින් විචාරන්නෝ කිමෙක්ද දරුව! හස්තියා සිල්වත් වීදැයි විචාළෝය. බොධිසත්වයෝ එසේය රජ්ජුරුවන් වහන්සැයි කිය. එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නෝ බෙදුවූ දුෂ්ටවූහස්තියා නුමණැත්තන් නිසා පොරාණික ධර්මයෙහි පිහිටියේ වේදැයි කියා බොධිසත්වයන්ට ප්‍රශංසා කළෝය.

එකකනිපාතයෙහි මඝිලාවුඛජාතකවර්ණනායෙහි මඝිලාමුඛමඟුලැන්වයනුවයි.

යවහියදවස බරණැස්නුවර සාම නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණසමයෙහි බොධිසත්වයෝ අමාත්‍යකුලයහ ඉපිද වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට හිඳිනසේක. එසමයෙහි රජුහට පාණ්ඩව නම් මඟුලසෙක් විය. රජුහට ඒ අසූ බලන්නාවූ සිහිනතකට පාකොරවූ ගිරිදන්තනම්වූ අස්සලයෙක් ඇත. ඒ කොරවූ අස්සලයා අසූ ගෙන කඩියාලම අල්වා කොරපය බිම ඇන ඇන ඉදිරියෙහි යන්නා දැක මෙය මෙතෙමේ මා උගන්වන දෙයකැයි සිතා ඒ ඕනව හොසින් පය කොර කොටම් ඔබඔබා යන්නේය රජ්ජුරුවෝ අසූ කොරබැව් අසා මෙදුන් සැවූහ. ඔව්හු හොස් දනනා පමණින් විමඳා බලා අසූගේ ශරීරයෙහි කිසිම රොගයක් නොදක්නාහු පෙරලා අවුත් දෙවයන්වහන්ස අසූගේ ශරීරයෙහි කිසිම රෝගයක් නොදක්නෝ වම්හයි කිහ. රජ්ජුරුවෝ ඒ අසා බොධිසත්වයන්ට කියන්නා මඟුලසා පය කොර කොට ඔබත් කියන්නා ඇසීම්. උන්ට කවර දිට්ඨියෙක්

දෝභෝති ගොසින් බලා එවති කිව. බොධිසත්වයෝ ගොසින් අසා බලා ව්‍යාධියක් නොදැන සිතන්නහු අස්ගොව් වාගේ පය කොර කොට ඔබන නිසාවමුත් ඒ නිසාම උඹ පම් ණක් විනා ව්‍යාධියෙක් නැතැයි රජ්ජුරුවන්ට කියන්නාහු සාමනම් රජ්ජුරුවන් වහන්සැ තුඹවහන්සේගේ පාණ්ඩවනම් අශ්වයා ගිරිදන්ත නම් අස්සලයාගේ දෝෂයෙන් පය තොර කොට ඔබන පමණක් මිසක් අසාගේ ව්‍යාධියෙක් නැත එසේ හෙයින් යහපත් නිව්‍යාධි අස්සලයෙකු අසා බලන්ට සලස් සන්නා අසාගේ පය කොර ඇරෙයි කියන්නා ඒ නිසාවට නිව්‍යාධි අස්සලයෙකු සැලැස්සූ හමනේ අසුගේ පය කොර පලා ගියේයයි වදාරා මේ ගිරිදත්තජාතකය වදාළසේක.

දුඝනිපානසයිගිරිදන්න ජානකවණ්ණසෙති
පාණ්ඩවමඟුලස්වසතුවසි.

යටගියදවස බරණැස්නුවර දඩිවාහනනම් රජ්ජුරුවෙන කුන් රාජ්‍යය කරන සමයෙහි අපමඟබෝසතාණෝ ඒ රජුනව අවවාදයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේ විය. ඉක්බිති එක්දවසක් ඒ රජ තෙමේ මහඟහෙකැ උඩුවට දෙක්හි ලෝදැල් හෙලාතබා දිය කෙළෑකෙළෑ සනාතය කරමින් සිටියාහ. එකල හිමාලවනයෙන් කණ්ණිමුණ්ඩනම් විලින් දෙවතා වන් අනුභවකරන්නාවූ අඹඟසින් අඹයෙක් අවුත් ඒ ලෝ දැලෙහා බැඳින. දැලඹවන්නාවූ කෙවුළෝ ඒ දැක ගෙන ගොස් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝත් වැද්දන් අතින් විවාරා අඹරසය අනුභවකොට ඒ අඹඇටය උයනේ රෝපණය කරවා ඒ ගසවට බොහෝ සුවඳගස් ඇතිකරවා දවස්පතා සුවඳපැන් කිරිපැන් සදුන්පැන් වත්කරවා ගස කොළුක්මල්දම් එල්වා සුවඳදුම් හා සුවඳපැන් හා ලවා වට කොට පටකඹ තිර ජව නිකා බන්දවා මේ නියාමයන් බොහෝ පෙරහර අඹගසට කරවූහ. අඹගස තුන්අවුරුද්දකින් රන්වන්ව මිඅඹ ඵලගෙන මී හා සමාන රස ඇතිවිය. රජ්ජුරුවෝ ඒ ගසඵල අනුභව කොට මේ ඵල ඒ ඒ රජදරුවන්ට පඬුරුකොට යවමිහි සිතා නැවත සිතන්නාහු මේ ඵල රජදරුවෝ කා ඒ ඇට ඉදුවා ඇතිකලෝ නම් මේ ගස නිසාසාර වෙයි සිතා අඹගඹියේ පැලවෙනා තැන මඩුකටු ගසා යවූහ. ඒ ඒ රජදරුවෝත් අඹ කා අඹඇට ඉදුවා නැස්පෙන ගෙයින් මීට කාරණා කිම්දෝ නෝහි සිතා පරීක්ෂා කොට මඩුකටු ගසා යවනලද නිසාව දැන

ඉන් එක් රජ්ජුරුකෙනෙක් පින්වත! ඔව දඩිවාහන රජුගේ අඹ ඵලරසය නසා තිත්තරස කරවයි, දහසක්දී එක්උගන්පල්ලෙක් ඇවිත්, උගන්ගොව්වාත් මැනවැයි බරණැස්නුවරට ගොස් දඩිවාහන රජ්ජුරුවන්ට තමන් ආ පවත් කිහා ගමා රජ්ජුරුවන් විසින් ගෙන්වා තෝ උගන්ගොව්වෙක්දැයි විචාරන්නා එසේය රජ්ජුරුවන්වහන්ස! අකාලඵට ඵලඇතිකිරීම් මල්ඇතිකිරීම් ආදීවූ දෙය දනිමියි කීය. එබස් අසා රජ්ජුරුවෝ තමන් උගන් ගොව්වා හා කැවිව උගන් බලන ලෙස සැලැස්සුහ. එතැන් පවත් උගන්පල්ලෝ දෙදෙනම උගත පිළිදගුම් කරන්නාහ. එකියනලද අලුතපැමිණි උගන්ගොව්වාත් තොකලට මල්හා ඵලදැතිකොට උගන ඉතා සිත්කලු කොට රජ්ජුරුවන්ට පැහ. රජ්ජුරුවෝ සතුටුව පැරණි උගන්ගොව්වා බැහැරලා අලුත පැමිණි උගන්ගොව්වාටම උගත භාරකොට දුන්නාහ. එවිට උගන්ගොව්වා උගත තමාතතුවූ පසු අඹගස තිත්තකෙරෙමිසි සිතා අඹගසවට කොසඹගස් හා හබුලුවැල් ඉදුවිහ. එසේ කළකල දිළිඳෙළින් වැඩෙන්නාවූ ඒ කොසඹවෘක්ෂයන්ගේ මුල් හා සාඛාවෝ අඹමුල් හා සාඛාවන් සමඟ එක්වැ බැඳී හබුවැල්ද ගසවැළඳ කල්යාමකින් අඹගස කොසඹනසමෙන් තිත්තව ගියේය. උගන්පල්තෙමේත් අඹඵලතමා තිත්තවූ බැව් දැන තමා ආකාරිය එපමණක්ම බැවින් පලාගියේය. එකල රජ්ජුරුවෝ එක්දවසක් මිහුලුගනට ගොස් අඹඵල අනුභවකරන්නේ අඹ රසය කොසඹරසය මෙන් වී ගිලින්ට නොහැකිව කාරා කෙල ගසා දමා පැහිතය! මේ අඹගසට පෙර කළමනාප්‍රතිකාරයෙන් දැනුදු අඩුවක් නැත මෙසේ ඇති කල්හිදු මේ දෘෂ්ඨයාගේ ඵල තිත්තවිය. ඒටකරුණු කවරේදෝහෝයි බෝසතාණන් වහන්සේ අනින් විවාළේය. ඒ බෝසත් තෙම රජුට කාරණය කියන සේක්—

"පුබ්බණ්හපරිවාරෝ අම්බො තෙ දඩිවාහන,
මූලං මූලෙන සංසන්දං සාඛා සාඛා නිසෙවරෙ,
අසාතසනතිවාසෙන තෙනම්බො කට්ඨකපඵලෝ"ති.

පින්වත! දඩිවාහනමහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේගේ අඹරුක කොහඹින් වවකරනාලද්දේය. අඹමුල් කොසඹ මුලින් වළඳනාලද්දහ. අඹඅතු කොසඹඅතු සෙවනය කරන්නා හුය. ඒ අඹබිරිවූ අසාතවූ ඝනතාවූ කොසඹාදීන්ගේ ආශ්‍රය හෙතුකොටගෙන නුඹවහන්සේගේ අඹරුක කොසඹබවෙන් තිත්තඵල ඇත්තේ වියයි කීවේහ.

ඒඅහා අජ්ජුරැවෝ සිහලුව කොඅඹඉන්ද හතුවැල්ද සින් දවා මුල් උදුරවා නිකතවූ පස් කරවා මධුරවූ පස් බහවා කිරිදිය සකුරුදිය ගඳදිය යන මෙයින් අඹරුක ඉස්සවා පැරණී උයන් ගොව්වාටම උයන පාවාදුන්නාහ. අඹහස මධුරසංඝයෙන් පෙරසේම නැවතත් මධුරත්‍වය.

දුකනිපාතයෙහි සිහුවනැවගැ දධිවාහන ජාතක වර්ණනායෙහි අඹවස්තුවයි.

මෙසේ සත්‍වපුද්ගල නොවන්නාවූ නිර්ජීවක අවෙතනික විසතුහු පවා අනිෂ්ටවස්තූන් හා එක්වූ කල්හි අනිෂ්ටඵලවද ඉෂ්ටවිසතුන් හා එක්වූ කල්හි ඉෂ්ටඵලවටද පැමිණෙන්නාහ. සවෙතනිකවූ සත්‍වයන් වූකලි කියතුම කවරෙද? එකෙයින් දධිවාහනජාතකඅට්ඨොතපත්තියෙහි "මහණෙනි! අසත්පුරුෂ සෙවනය නම් ලාමකය අනර්ථකාරීය එකරුණෙහිලා මිනිසත්බැව්හි වූවන්ට පමණක් වන්නාවූ පාපසහායිවාසයාගේ අනර්ථකාරිභාවය ගැණ කුමක් නම් කියයුතු වන්නේද?. පෙරවනාහි අසාතවූ අමධුරවූ කොඅඹරුක හා එක්වීමට පැමිණ දිව්‍යරස හා සමවූ මධුරරසඇති අවෙතනිකවූ අඹරුක පවා නොමිහිරිවූ තික්තරසඇති බවට පැමිණියේය" යි වදළසේක.

තවද බාලයෝනම් දිලියෙන කඩුගත් සතුරන් වැනියහ. පණ්ඩිතයෝ නම් ප්‍රියඥාතීන් වැනියහ. ඒ එසේමය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසල්පුරී දකුණුපසැ නුදුරු තන්හි පිහිටියාවූ වෙළුව නම් ගම ගොදුරුගම කොට වැඩ වාසය කරනසේක් හටගත් ලොහිතපක්ඛන්දිකාබාධ ඇති සේක් වීය. ඒ දැන සක්දෙවිරජ තෙමේ එහි පැමිණ දෙවියන් සහිතලොකයාහට අනුශාසනාකරන්නාවූ භාග්‍යවතුන් වහන්සේව උවටැන් කරණුයේ බුදුරජතුමාණන් වහන්සේගේ ශරීරමලහාජනය අන්කිසිවෙකහටත් අතින්අල්වන්නවත් කොදි සුවඳබඳුනක් සෙයින් හිස නබාගත හොස් බැහැර ලැසි. ඒ සක්දෙවිරජතෙමේ මේ ආදී නොයෙක් ලෙසින් උපස්ථාන කොට බුදුන්ලෙඩ සුවවූ කල්හිම දෙව්ලෝ ගියේය. භික්ෂූන් වහන්සේලා අනෝ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශක්‍රයාගේ ඇති සෙනහය පුදුමය දෙව්නැපත පවා හැර දමා අවුත් බුදුන්ව උපස්ථාන කෙළේයයි බුදුන් මහත් බැව් කියා

කියා උන්හ. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි! බුඩාදී ආශ්චර්යයන් වහන්සේලා දැකිමද ඒ ආශ්චර්යයන් සමඟ එකතැන භිදීම්ආදීසවභාවයද ඒ ආශ්චර්යයන්ට වනාවක් කරන්ට ලැබෙන බවද මැනවැයි කියා අවුත් ශක්‍රදෙවේන්ද්‍රයා මට උපස්ථාන කෙළේය"යි දක්වා වදුරණසේක් දම්පියාගෙහි සුඛවග්ගයෙහි සක්දෙවිඳුකථාවසතුවෙහි

"බාලසඞ්ගතචාරී හි දීඝමඞ්ධානසොචති,
දුක්ඛෝ බාලෙහි සංවාසෝ අමිත්තෙනෙව සබ්බදා,
ධීරෝ ච සුඛසංවාසෝ ඤාතීනංව සමාගමෝ.

"තසමා හි ධීරං ච පඤ්ඤඤ්ච බහුසුතඤ්ච
ධොරයහසීලං වතවන්තමාරියං.

තං තාදිසං සප්පුරිසං සුමේධසං
භජේථ නක්ඛත්තපථංව චන්දිමා"ති

ප්‍රාණඝාතාදී දසඅකුසලකර්මපථයන් කරන්නාවූ බාලයන් සමඟ නිතර හැසිරෙනසුලුවූ පුද්ගලතෙමේ ඒ බාලයන් විසින් 'එව ඝරඤ්ඤිඛිදීඒඒආදිය කරමු,යි කියනු ලබන්නේ ඔවුන් හා එක්සිත්ව එසේ කරනුයේ අත්පාකැපීම්ආදී දුකට පැමිණ බොහෝකල් මසාක කරන්නේය. කඩුගත් සතුරන් සමඟ වාසයමෙන්ද සොරවූ දරුණුවූ විෂඇති සර්පයන් සමඟ වාසය මෙන්ද බාලජනසෙවනය දුක්වන්නේය, ඤාණගතිඇති පණ්ඩිතයන් සමඟ එකතන්හි විසීම ප්‍රියඤාතීන්ගේ සමාගමයවෙන් සැපවන්නේය.....එසේ හෙයින්, ධෘතිසම්පදාන හෙයින් ධීරවූද ලෞකිකලෝකොත්තරඤාණසම්පදාන හෙයින් ප්‍රාඥවූද ආගම අධිගමසම්පදාන හෙයින් බහුශ්‍රැතවූද අභිඥයට පැමිණීම්හයි කියනලද ධුරය උසුලන හෙයින් ධොරයහසීලවූද ශීලව්‍රතයෙන් හා ධුතඞ්ගව්‍රතයෙන් යුක්ත හෙයින් වතවන්තවූද කෙලෙසුන් කෙරෙන් දුරවූ බැවින් ආරියවූද ශොභනප්‍රඥඇති සත්පුරුෂය, නක්ඛත්තපථයහි කියනලද නිර්මලවූ ආකාශය භජනය කරන්නාවූ චන්ද්‍රවිම්බයක්සේ භජනය කරවි පැවිදිපාසනය කරවියයි වදුළහ.....

අපමණබෝසත්තෙමේද හිමවත්පෙදෙසෙහි තවුස්වෙස් ධරා වාසය කරණුයේ කලකිරුනු බැවින් වනයෙන් නික්ම මනුෂ්‍යපථයට ගොස් වාසය කරනු කැමති තමන්ගේ පුත්වූ තවුස්කුමරහට අවවාද කරන්නේ තවතිපාතයෙහි හළිද්දිරාග ජාතකයයි

"යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කටං,
උරසීව පහිස්සාය තං භජේහි ඉතෝ ගතෝ.

යෝ ව ධම්මෙන වරති වරන්තොපි න මඤ්ඤති,
විසුද්ධකාරී සපඤ්ඤෝ තං භජේහි ඉතෝ ගතෝ.

හලිද්දිරාගං කපිචිත්තං පුරිසං රාගවිරාගිනං,
තාදිසං තාත! මාසෙව නිම්මනුස්සම්පි වෙ සියා.

ආසිවිසංව කුද්ධං මිළහලිත්තං මහාපථං,
ආරකා පරිවජ්ජේහි යානීව විසමං පථං.

අනත්ථා තාත! වඩ්ඪන්ති බාලං අච්චුපසෙවතෝ,
මාසූ බාලෙන සංගඤ්ජි අමිත්තෙනෙව සබ්බදා.

තං තාහං තාත! යාචාමි කරස්සු වචනං මම,
මාසූ බාලෙන සංගඤ්ජි දුක්ඛා බාලෙහි සඞ්ගමෝ"ති.

එඹල මපුත්කුමර! මේ ලෝකයෙහි යමෙක්හට කයින් හිඬිවන්නාවූ ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාරයයි කියන ලද ත්‍රිවිධ අකුසලයෝත් වචනයෙන් සිඬවන්නාවූ මුසාවාද පිසුනාවාචා ඵරුෂාවාචා සම්ඵප්‍රලාපයයි කියනලද චතුර්විධ අකුසලයොත් මනසින් සිඬවන්නාවූ අභිද්‍යාය ව්‍යාපාදය මිථ්‍යා දෘෂ්ටියයි කියනලද ත්‍රිවිධ අකුසලයෝත් සිඬනොවෙද්ද හෙවත් නැත්නාහුද එබදුවූ සත්‍වයා මවගේ ලෙහි වැනිර මව භජනය කරන්නාවූ ප්‍රියපුත්‍රයෙකුමෙන් මෙයින් ගමගියාවූ තෝ භජනයකරන්නැවත යමෙක්තෙමේත් ත්‍රිවිධ සුචරිතධම්මයෙන් හැසිරේද එසේ ධම්මයෙන් හැසිරෙන්නේත් "මම ධම්මයෙහි හැසිරෙමි මානය නොකෙරෙමි අන්‍යයෝ ධම්මයෙහි නොහැසිරෙත් මානයද කෙරෙත්ය"යි කියා අනුන්ට නිදු නොකෙරේද පිරිසිදුවූ දසකුසලකම්පථධම්මයන් කරන්නාවූ නැණැත්තාවූ ඒ පුරුෂයා මෙයින් ගමගියාවූ තෝ භජනයකරන්නෙහිමැ එඹා මපුත්වූ තාපසකුමාරය! සියලු දසදහසක් යොදුන් ඇති දඹදිව සියලු මනුෂ්‍යයෝම නැසී එකපුරුෂයෙක් පමණක් සිවිලේවීනමුත් ඒ පුරුෂයාත් කෂායෙන්වූ පැහැය අවුඇදියෙන් නැසී බොහෝ කලක් නොපවත්නේද එමෙන් වහා නැසෙන්නාවූ සෙනඟය ඇත්තේද වඳුරන්සේ වංචලවූ ප්‍රවෘත්තිය ඇත්තේද එකඅරමුණක පවත්නා සිත් නැත්තේද පංචකාමගුණකොළොඹයෙහි ඇවිල එකණෙහි විරකතවීම් සවභාවය නෙවැ ඇත්තේද ඒබඳුවූ පුරුෂයා භජනය නොකරන්

යම්සේ ගැල්ආදීවූ යානාවෙන් යන්නාවූ සත්ථෝ වළගොබ්
කණ්ඩපඛණ්ඩාදියෙන් සමතොවන්නාවූ මාගීයද අපච්ඡාගෙන්
ගැවසී ගත්තාවූ මාගීයද හැර තමන්ව සැපවූ මාගීයෙහි
යෙද්ද එපරිද්දෙන් දණ්ඩින් ගැසූ කල කිපෙන්නාවූ සඵි
යෙකුමෙන් කාරණාකාරණා නොදැන මඳකින් කිපෙන අසත්
පුරුෂයා භජනය නොකර කෙවත් දුරින්ම දුරුකරව.....

තවද මපුත්වූ තවුස්කුමර! අනිතය අනාගතය වර්තමානය
යන කාලත්‍රය සඞ්ඛ්‍යාත හැමකල්හි නැණැත්තන් විසින් භජ
නය නොකටයුතු අමිත්‍රවූ අඤ්ඤතයා සෙවනය කිරීමෙන්
මෙලෝපරලෝ දෙක්හි අනල්පවූ අනර්ථයෝ වැඩෙන්නාහුය.
එසේ හෙයින් ඔහු හා සමඟ භජනය සමාගමය යි කියන
ලද විශ්වාසය නොකර. එඹා පුතණුඩ! තවුස්කුමර! එසේ
හෙයින් මාගේ එක වචනයක් කරව මම ඒ ප්‍රණිධි තා අහැද
ඔවිමි. එනම් මේ යථොක්තකාරණයන්ගෙන් යුක්තවූ අඤ්
ඤතයා භජනය නොකර ඔවුන් භජනය කරන්නාහට බොහෝ
දුක්වන්නාහ යනාදීන් මෙසේ අවවාදකොට මේ මාගේ අව
සානවූ අවවාදයපරිද්දෙන් පිළිපදුව මාගේ වචනයෙහි පිහිටා
වැඩ වඩා ගනුවයි කීයේය.

මෙසේ පියාණන් විසින් අවවාද කරනලද්දාවූ ඒ කුමාර
තෙමේ කියනුයේ 'සවාමීනි පියාණන් වහන්ස! මම මනුෂ්‍යා
පථයට ගියෙම් වී නම් නුඹවහන්සේ වැනි පණ්ඩිතතෙතෙ
කුන් ලැබගත නොහැක්කෙමි එසේ හෙයින් එතන්හි යාමට
හය ඇත්තෙමි නුඹවහන්සේ සමීපයෙහිම වාසය කෙරෙමි'යි
කීයේය. ඔහු එසේ කීකල්හි නැවතත් අවවාද දෙන්නාවූ
තාපසතෙමේ කිසුණුපිරියම් ඉනැන්වූයේය. ඒ කුමාරතෙමේ
ඒ ඉඟෙන තොඛෝකලකින් පවාභිඥඅෂ්ටසමාපත්තීන් උප
දවා තමන්ගේ පියතාපසයාණන් හා සමඟ බ්‍රහ්මලොකයට
ගියේයයි මෙසේ දෙවාතිදෙවවූ අපතිලෝගුරු සම්මාසම්බුදු
රජාණන් වහන්සේ මේ දෙශනාව ගෙණහැරදක්වා චතුස්සත්‍යය
ප්‍රකාශකොට ජාතකය නිමවා වදාළසේක.....

යලිත් භය යයි කියනලද යම්කිසි චිත්තුත්‍රාසයක්
හෙවත් චිත්තය සම්බන්ධවූ බියක් වේද උපද්‍රව යයි කියන
ලද යම්කිසි අනෙකාශ්‍රිතාකාරයක් හෙවත් අනන්තරයක් වේද
උපඝාත යයි කියන ලද ඒ ඒ තන්හි ලග්නාකාරවූ යම්කිසි
උපසර්ගාකාරයකුත් හෙවත් දෙවියන්ගේ උපසිලිතාදිය

ඛෙසින් පිළිගැම්මොහොතට හැනි භාවයට පැමිණිවෙත් පිළිගැම් නොලදින් කිසිවක් කර ගන්නට අසමර්ථවූවහුගේ කිදීවට කාරණයක් වේද යන මේ සියල්ලම බාලයා නිසාම උපදනාහ. අඥන බාලතෙමේ වනාහි රජය හෝ උපරජය හෝ අතික් යම්කිසි මහත් තනතුරක් හෝ බලාපොරොත්තු වන්නේ තමන් වැනිවූ මහාධුතීයන් කිහිපදෙනෙක් ගෙන මෙහි එව්ම තොප ඉසුරුවතුන් කරන්නෙම්' සි කියා කදුපළිතහණාදියක් ඇසුරුගොට පසල්ගම් පහරමින් පිළිවෙළින් අවුත් නිගම්ගම්ද දනව්ද පහරන්නාහුය. එකල එහි මනුෂ්‍යයෝ බියපත්වැ ගෙවල් හැර තිගියසපටාකයන් සොයා පැන යන්නාහුය. ඒ මිනිසුන් නිසා වසන්නාවූ භික්ෂුභික්ෂුනීහුද තම තමන්ගේ සෙනසුන් ආදිය හැරදමා පැන යන්නාහුය. ඒ භික්ෂුභික්ෂුනීන්ට ඒ ගිහිගිය තන්හි භික්ෂා හා සෙනාසනද දුලබ වන්නාහ. පැවිද්දන් අතුරෙහිද අඥන බාලභික්ෂූන් දෙනමක් එකතැන්වූ කලද ඔවුනොවුන් අතරෙහි විවාද පටන්ගෙන වොදනා අරබන්නාහ. එසේ ඇතිකල කොසඹැ භික්ෂූන්ගේමෙන් මහත් කලහ උපදනේය. මෙසේ බාලවූ අඥනයන් නිසා භික්ෂුභික්ෂුනී උපාසකඋපාසිකා යන සියු වණක් පිරිසටම භයාදී විපත් පැමිණෙන්නාහ. එහෙයින් නිකඛහුනාතරසෙයි සියල්ලට පළමුව තැබූ ලක්ඛණසුත්‍රයෙහි "සෙය්‍යථාපි භික්ඛවෙ! නළාගාරා වා" යනාදිය වදුළසේක. එහි විස්තර එහින් බලා දන්නේය.

එහෙයින් බාලයෝ තුමූ ගින්නෙන් දිලිසෙන අඟුරු හා සමානය සි දනයුත්තාහුය. ඔවුහු වනාහි තමන්ගේ වචනයට කීකරුවූවන්ට සියලු භයාදීන් එළවීමෙහි සමර්ථ වන්නාහුය.

පණ්ඩිතයා වූකලි බියක් එළඹ සිටිකල එහින් රක්නෙකු මෙන්ද අදුර ඇතිකල පහනක් මෙන්ද සා පිපාසාදී දුකින් පෙළෙනකල ආහාරපානාදීන්ගේ පිළිලැබීමක් මෙන්ද වන්නේය. ඔහුතුමූ වනාහි තමාගේ වචනයට කීකරුවූවන්ගේ සියලු භයාදීන් නැසීමෙහි පොහොසත් වන්නාහුය.

මෙසේ බාලයන්ගේ කුණුමස් හා සම් බවද පණ්ඩිතයන්ගේ සුගන්ධද්‍රව්‍යාදිය හා සම බවද බාලයන්ට හා පණ්ඩිතයන්ම සංග්‍රහ කරන්නවුන්ම සිදුවිය හැකි සැපදුක් භාවයද දැන පණ්ඩිතයෝම සෙවනය කටයුත්තාහ බාලයෝ සෙවනය නොකටයුත්තාහ.

රාගය භග්ගකළ හෙයින්ද වෙෂය භග්ගකළ හෙයින්ද මෝහය භග්ගකළ හෙයින්ද භගවා නම් ලද අප නිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඡිනාසවථිරයන් වහන්සේව අවවාද කරණමේක දම්පියා යෙහි පණ්ඩිතවගීයෙහි

"න භජේ පාපකෙ මිත්තෙ න භජේ පුරිසාධමෙම,
භජේථ මිත්තෙ කල්‍යාණෙ භජේථ පුරිසුත්තමෙ"ති.

කායදුච්චරිතාදීන්හි අභිරමනය කරන්නාවූ පාපමිත්‍රයෝ සෙවනය භජනය පඨ්‍යුපාසනය නොකට යුතුනාහුය. ඝරසඤ්ඤිබිදීම් ආදියෙහි හෝ එක්විසි අනෙසනාදී ප්‍රභෙදවූ අසථාන යෙහි හෝ යොදවන්නාවූ පුරුෂාධමයෝද සෙවනය භජනය පඨ්‍යුපාසනය නොකොව යුත්තාහුය.

එසින් අනික් පක්ෂයෙහිවූ කල්‍යාණමිත්‍රයෝද පුරුෂොත්තමයෝද යන මොවුන් සෙවනය භජනය පඨ්‍යුපාසනය කරව. එක් වරක් නමුදු පණ්ඩිතජනසෙවනය ආත්මරක්ෂාවක් වන්නීය. බොහෝකල් නමුදු බාලජනසෙවනය ආත්මරක්ෂාවක් නොවන්නීය.—ඒ එසේමැයි.

නන්දබ්‍රාහ්මණ තෙමේ තක්සලානුවරසිට එක්සියවිසියොත්නකින් මත්තෙහි ඉදුපත් නම් නුවරට පැමිණ මහාසුතසොම නම් රජුහට දහම් දෙසනුයේ සුතසොමදෑනි

"සකිදෙව සුතසොම! සඛි හොති සමාගමෙ,
සා තං සඛතති පාලෙති නාසඛි බහු සඛගමෙ"ති.

පින්වත! සුතසොම මහරජුරුවන්වහන්ස! එක්වරක් නමුදු සාධූන් හා සමඟ පවත්වනලද සමාගමයක් වේද ඒ සාධු සමාගමය තෙමේ ඒ පුහුලා රක්නේ නම් වෙයි අසාධූන් හා සමඟ වනාහි බොහෝ කල්නමුදු කරනලද සමාගමය එකතැන වාසය තෙමේ ඒ පුහුලා නොරක්නේය තඹවුරුද නොවන්නේයයි දෙශනා කෙළේය.

එසේ හෙයින් පණ්ඩිතයන්ම සේවනය කරන්නේය බාලයන් සෙවනය නොකරන්නේය බාලජනසෙවකය නොකිරීම පමණක් නොවෙයි බාලජනසෙවනය නොකරනතැනැත්තේ පණ්ඩිතයන් සෙවනය කරන්නේය වැලිදු යම්කිසි පිනක් කොව "මම සෑරිසරනකලැ මේ පුණ්‍යානුභාවයෙන් පණ්ඩිතයන්ම සෙවනය කරන්නෙම්වා බාලයන් සෙවනය නොකරන්නෙම්වා"යි කියා අනිත්‍යතාපසඟාමෙන් ප්‍රාර්ථනා කරන්නේය,

ඒ මහබෝසත් තෙමේ වනාහි බරණැස්නුවර අසූකෝටි ධනය ඇති බමුණුමහසල්කුලයෙහි ඉපිද මව්පියන්ගේ ඇවැමෙන් සියලු සම්පත් හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පිළිවෙළින් දෙමළුරටට පැමිණ කාවීර නම් පට්ටන සමීපයෙහි උයනෙක්හි වෙසෙමින් ධ්‍යානඅභිඥ උපදවා අහසින් අවුත් නාගදිවයින සමීපයෙහි කාවීර දිවයිනෙහි බැස එහි මහත් කරනයක් ආශ්‍රය කොට පන්සලක් මවා වාසය කළහ. එසමයෙහි කාවීරදිවයින අභිදීප නම් වීය. හෙතෙම අපිස් ගුණ ඇති බැවින් කොහිවත් නොගොස් ඒ වෘක්ෂයාගේ ඵලකලෑ ඵලද පත්කලෑ පත්ද දිවසපමණක් ලා උයා අනුභව කෙරෙයි. එසේ කල් යන කල ඒ බෝධිසත්ත්වයන්ගේ ශීලතේජයින් සක්දෙව් රජහුගේ පඬුවුල්සලස්න උණු අසුරක් වීය. සක්දෙව් රජ තෙමේ ඒ කාරණය විමසනුයේ ඒ තවුසාණන් සිල්තෙදිකැයි දැන 'කුමක් නිසා මේ තපස්වී උග්‍රතපස් කෙරෙද්ද? ශක්‍ර සම්පත් පතත්දෝයි නොහොත් අනිකක් පතත්දෝයි පරීක්ෂා කෙරෙමියි සිතා තැවත සිතන්නාහු මූතුමූ දුකසස් ජීවත් වෙති පැන් පමණක් වත්කොට ඉවූ කරපත් අනුභව කෙරෙති ඉදින් ශක්‍රසම්පත් පතන්නම් නවන්ට ඉවූ කරපත් මට දෙති නැතකොත් නොදෙති'යි සිතා, බමුණුවෙස කින් එහි පැමිණ පඬුසිඟන්නෙක්මෙන් සිටියහ. එතල තවුස් තෙමේ කරපත් සුඛ කොට දිය ලා උයා තබා නිවී ගිය කලෑ අනුභව කෙරෙමිසි සිතමින් පන්සල්දොරකඩ සිටියේ උහු දැකැ හටගත් සොම්නස් ඇතිමයේ එකාන්තයෙන් මෙතල යාචකයක්හු දුටු හෙයින් මට වූයේ මහත් ලාභයෙක අද මාගේ මනදෙළ මුදුන් පමුණුවා දන් දෙමියි කරකොළ ඉවූ බදනින්ම ඇරගත ගොස් මාගේ මේ දානය සර්ව්ඥතාඥානයට කාරණා වේවායි තමකට ඉකිරි නොකොවම උහුගේ හිස්සා හාජනයෙහි බත නැවත නොමුහා ප්‍රීතිඇපයෙන් වේලා ඉක්මවූහ. සක්දෙව් රජතෙමේද එය හෙත මද තැනක් ගොස් අතුරුදන් වීය. මේ උපායෙන් සක්දෙව් රජතෙමේ තෙදිනක්ම එහි පැමිණියහ. නවුස්තෙමේද උහුව තෙදිනම සියලු අහර දී නිරාහාරවම සිට ප්‍රීතිඇපයන් දවස් යවා සිතන්නාහු 'ආශ්චර්‍යයි මට වූයේ මහත් ලාභයෙක කරපත් නිසා මහත් කුසලයෙක් මවිසින් රැස්කරනලද්දේය'යි සොම්නසට පැමිණ සතදිනක් මුළුල්ලෙහි නිරාහාරයෙන් දුර්බලවූ තැනැත්තෝ මහදවල් පන්සලින් නික්ම තමන් දුන් දන් සලකමින් පන්සල්දොර හුන්හ, තෙවන දිනෙහි ශක්‍රභවන

සිතන්නාහු 'මේ තවුස්තෙම තුන්දිනක් මුළුල්ලෙහි නිරා හාරව සිට දන් දෙනතැනැත්තෝ සතුටුසිත්ව දන් දෙති විතතෙහි අන්‍යථාත්වයෙක් නම් නැත්තේය මම මුත් මෙතම් දෙයක් පතා දන් දෙතියි නොදනිමි විචාරා අදහස් දැන ගනිමි'යි සිතා මහදවල් ඉකුත්වූ කලැ මහත්වූ ශ්‍රීසම්පත්තියෙන් ලක්ෂිරුම්බලක්මෙන් බබලමින් අවුත් මහබෝසතාණන් ඉදිරි යෙහි සිට පින්වත්වූ තාපසයාණනි! මෙබදු හුණුවූ සුළඟ පහරන තන්හි මෙබදුලවණජලයෙන් වට කරනලද වෙනෙහි හිඳ මනුෂ්‍යසම්පත්ආදීවූ කවර සම්පතක් පාර්‍ථනා කොට හුදකලාව හිඳ තපස් කරව්දැයි විචාළාහ. එබස් අසා මහ බෝසතාණෝ උන් ශක්‍රනියාව දැන "මම මේ ශක්‍රසම්පත් ආදිය පතන්නෙමි නොවෙමි සම්භාවනාඥානය ප්‍රාර්‍ථනා කෙරෙමින් තපස් රක්ෂා නෙරෙමි"යි ප්‍රකාශකරන්නාහු "ශක්‍රදෙවේන්ද්‍රයෙනි! ධම්හෙයකින් නැවත නැවත ඉපදීමද පඤ්චස්කන්ධයන්ගේ නැසීමද සමෙමානමරණයද යන මේ තුන සම්පත්ති ඒකාන්තයෙන් දුක් වෙද්ද එසේ කෙයින් යම් තැනක හෝ තුන නැත්නම් එබදු නිර්‍වාණය ප්‍රාර්‍ථනා නෙරෙමින් මේ වෙනෙහි තපස් රක්ෂා කෙරෙමි"යි තමන් නිර්‍වාණයෙහි අදහස් ඇති නියාව ප්‍රකාශ කොට කිහ. එබස් අසා ශක්‍රයෝ සතුටු සිත් ඇතිව තුමූ සියලු භවයෙහි කලකිරුනාහුය. "නිවන් පතා මේ වලැ හිඳ තපස් නෙරෙති එසේ නෙයින් උන්ට වර දෙමි"යි සිතා වරයෙන් ආරාධනා කරන්නාහු **මනරඝ නිපාතයෙහි අකිතතිජාතකයෙහි** කාශ්‍යපගොත්‍රයෙහි උපන් අකිත්තීතාපසයෙනි! තොප විසින් මහාකොට කියනලද්දාවූ මේ සුභාෂිතවචනය හෙතුදෘෂ්ටාන්තයෙන් තොපට වර දෙමියි සිතා ඇම් තොපසිසින් යම් වරයක් ගන්නා කැමැත්තා නම් වර දෙමි ඒ හේතුවයි කිහ...එබස් අසා මහබෝසතාණෝ වර ගන්නාහු ශක්‍රදෙවෙන්ද්‍රයෙනි! ඉදින් තෙපි මට වර දෙනු කැමැත්තා නම් යම් ලොභයක් හෙතුකොටගෙන දුදරුවෝය භාර්‍යාවෝය ඔතඩාත්‍යය අන්‍යවූ ප්‍රියවස්තුය යන මේ සියල්ල ලදින් සම්‍යක් නාපත්‍යතාව තොපැමිණෙද්ද කැවත පුත්‍රාදීන් ප්‍රාර්‍ථනා කෙරෙද්ද එබදුවූ ලොභයක් මාගේ සන්තානයෙහි කොමැසේමැයි නූපදීවාත මෙසේ ලොභය නූපදිනා වරගන්නා කැමැත්තෙහෙමියි කිහ...එබස් අසා ශක්‍රයෝ සතුටුව කැවතත් මත්තෙහි වරදෙනුකැමැතිව කියන්නාහු ශක්‍රයෙනි! ඉදින් තෙපි මට කැවතත් වර දෙනුකැමැත්තා නම් අනතානතයෙහි

අවගත්තාවූ යම් ක්‍රොධචිත්තයකින් කිපියාවූ සත්ත්වයෝ ප්‍රාණවධආදිකොට රජ්ජුරුවන්ගෙන් ඉස්කන්නාසා කැපීම් ආදී වශයෙන් දණ්ඩකර්මයට පැමිණ හෝ විෂ අනුභවකිරීම් සෙලින් හෙලීම් සර්ප වැල් ලීම් ආදීවශයෙන් තමා මැරීම හෝ කෙත් වත්රන්රුවන්ඇතුන්අසුන්ගෙරිමිවුන්කෙල්ලන්කොල්ලන් ආදීවූ සියලු සම්පත්තීන් පිරිහී ගියෙද්ද ඒ සියලු වසතු නසා පියද්ද එබඳු කොපයෙක් මාසත්තානාගයෙහි නූපදීවාසිනමවද ශක්‍රයෙනි! ඉදින් තෙපි මට නැවතත් වර දෙනු කැමැත්හා නම්

"බාලං හි පසෙස භ සුණෙ න ව බාලෙන සංවසෙ,
බාලෙන අල්ලාපසල්ලාපං න කරෙ න ව රොචයෙ"නි.

අඥතවූ අසත්පුරුෂවූ සහිතයා මඇසින් නොදකිම්වාසි අසවල්තැන වෙසෙනි යන්නක් මානිහුත් නොමසම්වසි එබඳු නුවණැති අසත්පුරුෂබාලයා හා සමඟ එකතැන නොවසෙම්වාසි පසුපෙරත්තු කථාවක්හුත් නොකෙරෙම්වසි උහුබස් කිසිකලෙකත් මට ප්‍රිය නොවේවයි කිය.

එබස් අසා ශක්‍රයෝ කියන්නාහු

"කිනනු තෙ අකරං බාලා වද කසසප! කාරණං,
කෙන සාසසප! බාලස්ස දස්සනං නාභිකඞ්ඛසී"නි.

පින්වත කාශ්‍යපගොත්‍රඇති බොධිසත්වයෙනි! අඥතවූ සත්වයා තොපගේ මැරියන් පියාණන් මරාපීද? නොපව අන්‍යවූ කවර අනර්ථයක් අවැඩක් කරපීද? කවර වසනුවක් පැහැරගනීද? කුමක් හිසා අඥතවූ සත්වයා දක්නා නොනැමැත්තාද? ඒට කාරණා කියව්සි කිය.

එබස් අසා බොධිසත්වයෝ කියන්නාහු

"අනයං නයති දුම්මෙධො අධුරාය නියුජති,
දුන්නයෝ සෙය්‍යසෝ හොති සම්මා වුත්තො'පි කුපපති,
විනයං සෝ න ජානාති සාධු තස්ස අදස්සන"නති.

ශක්‍රයෙනි! නුවණ නැත්තාවූ සත්වතෙමේ අකාරණය කාරණයයි ගන්නේය ප්‍රාණඝාතාදිය කොට ජීවත් වන්නෙමැයි මෙසේ අවැඩට සුදුසු කාරිය සිතන්නේය ශ්‍රද්ධාධුරප්‍රඥාධුරයෙහි නොයෙදෙ, අකාරියෙහි මයාදන්නේය ප්‍රාණඝාතාදීවූ දුශ්ශීල කර්මයමාදන්ව පැවැත්ම යහපතැයි ගන්නේය හිතකරපිරිවෙතෙහි පමුණුවන්ට නොහැකිවන්නේය මනාඉතුහසින්

කියතලද්දේත් කිපෙයි තොකියතලද්දේත් කිපෙයි මෙසේ ඉදිරියෙහි යාසුතුය මෙසේ පසුතැරී යාසුතුය යනාදීවූ ආවාර විනයසංඛ්‍යාත අවවාද නොපිළිගන්නේය මේ කාරණයන් කරණකොටගෙන බාලයාගේ නොදැකීම මැනවැයි කිහ එබස් අසා සතුටුව නැවතත් ශක්‍රයෝ වර දෙමිගි කිකල්හි තවුස් තෙමේ නැවතත් අතික් වරයක් ගන්නාහු

"ධීරං පසෙස සුණො ධීරෙ ධීරෙන සහ සංවසෙ,
ධීරෙන අලුාපසලුාපං තං කරෙ තං ව රොවයෙ"ති.

ශක්‍රයෙනි! තෙපි මට නැවතත් වරදෙනු කැමැත්තා නම් මෙලොව පරලොව දන්නා කාරණාකාරණා දන්නා හුවණැති සත්පුරුෂයා ඇමවෙලෙහි දකිම්වයි අසවල්තැන හුන්නේයයි මාසියකනින් අසම්වයි ඒ සත්පුරුෂයා හා සමඟ එකතැන වෙසෙම්වයි පසුපෙරත්තු කථා කෙරෙම්වයි උහු කියන්නාවූ බස් මට ප්‍රිය වේවයි කිහ එබස් අසා ශක්‍රයෝ කියන්නාහු

"කිනනු තෙ අකරං ධීරො වද කසසප! කාරණං,
කෙන කසසප! ධීරසස දසසනං අභිනඛසි?"ති.

පින්වත කාශ්‍යපගොත්‍රයෙහිවූ අකිර්නිපණ්ඩිතයෙනි! ඒ හුවණැති සත්පුරුෂයා තොපට ගමක් බිමක් කෙල්ලකු කොල්ලකු දීපිද නොහොත් තොප මහත් ඉසුරකට පමුණුවාපිද එඹා කාශ්‍යපය! කවර කාරණයකින් නොපි හුවණැති සත්පුරුෂයාගේ දැකීම කැමැත්තාදැයි විවාළහ.

එසද බොධිසත්වයෝ කියන්නාහු

"නානථං නථති ධීරො අධුරාය න යුඤ්ජති,
සුතයො සෙය්‍යසො හොති සම්මාවුත්තො න කුපපති,
විනයං සසා පජානාති සාධුතෙන සමාගමො"ති.

ශක්‍රයෙනි! හුවණැති සත්පුරුෂතෙමේ කාරණය කිනල එසේකීයේ කාරණයයි ගන්නේය අකාරියෙහි නොයොදා කාරියෙහිම යොදන්නේය දැනසීලාදී සුචරිතයෙහි යහපතැයි ගන්නේය මෙරමාත් මෙබඳුවූ කුසලකර්මයෙහි යොදන්නේය කරණයක් කිකල ඊට නොකිපෙන්නේය මෙසේ ඉඳුව සිටුව යනාදීන් ආචාරවිනයසඞ්ඛ්‍යාත අවවාදකලකල ඒ කී ඒ අවවාද පිළිගන්නේය එසේ හෙයින් එබඳුසත්පුරුෂයා හා එක්වීම මේ කාරණයෙන් යහපත් වන්නේයයි කිහ.

එහි විත්‍ථාර තෙරඝනිපාතයෙහි අකිත්තිජාතකය බලා දන්නේය.

පණ්ඩිතයන්ගේම දුකීම සැපවන්නේය බාලයන්ගේ දුකීම දුක් වන්නේය. එහෙයින් භාග්‍යවත්තෙම ශක්‍රදේවේන්ද්‍ර වසතුවෙහි

"සාහු දස්සනමරියානං සන්නිවාසෝ සදා සුඛෝ,
අදස්ස නෙන බාලානං නිච්චමෙව සුඛී සියා"ති.

මහණෙනි! සත්පුරුෂවූ බුඩාදී පණ්ඩිතයන්ගේ දුකීම සැපවන්නේය. හුදෙක් ඒ උත්තමයන්ගේ දුකීම පමණක් නොවෙයි, වැලි එනෙක් ඇති ඒ සත්පුරුෂයන් හා සමඟ එකතැන හිඳීම් ආදීහාවයද සැපවන්නේමය බාල අඥාන අසත්පුරුෂයන්ගේ නොදුකීම කෙතුකොටගෙන සැපඇත්තෙක් වන්නේ ඝයි වදළසේක.

බාලයන් දක්නාසුලුවූයේ බාලයන්ගේ වචනය කරන්නේ දුකට පැමිණෙයි පණ්ඩිතයන් දක්නාසුලුවූයේ වනාහි පණ්ඩිතයන්ගේ වචනය කරමින් විඛ්‍යාතක භික්ෂුවමෙන් සැපට පැමිණෙන්නේය.

හෙතෙමේ වනාහි මහාකස්සපස්ථෙරපාණන්ගේ සඩ්විහාරිකවූ චතුර්ථ්‍යානලාභී කෙනෙක. තම්බන්මයිලතුවන්ගේ ගෙයි විශාල අරමුණක් දැක එහි පිළිබඳ සිත්ඇතිව ගිහි වී අලස බැවින් කර්මාන්ත නොකොට සිටියේ ගෙයින් බැහැර කරණලද්දේ පාපමිත්‍රයන්ගේ වචනය පිළිගෙණ සොරකමින් ජීවත්වන්නේ එක්දවසක් රාජපුරුෂයන් විසින් අල්වාගත පිටිහයතලා දඬි කොට බැඳ සතරමංසන්ධියෙක් සතරමංසන්ධියෙක්හි කසවලින් තළනු ලබනුයේ රජගහනුවර දකුණුවිශාල්දොරින් වධභූමියට පමුණුවනු ලැබෙයි. ඒ දැක මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේද පිඬු පිණිස නුවරට වදනාසේක් ඒ දැක බැම්ම ලිහිල්කරවා පෙරනාවිසින් පුරුදුකරණලද කර්මස්ථානය නැවතත් ආවර්ජනා කරවයි කිහ. ඒ විඛ්‍යාතකතෙමේ මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේගේ වචනය පිළිගෙන නැවතත් චතුර්ථ්‍යාන උපදවා ගත්තැනැත්තේ ඒ රාජපුරුෂයන් විසින් වධභූමියට ගෙන ගොස් දිවස්උලෙහි හිඳුවනලද්දේත් ආවුධවලින් කැපීගන්වන ලද්දේත් බිය නොවෙයි රාජපුරුෂයෝ උහු බියකොවනබැව් නිමිසරමඟරජුහට සැලකළාහුය. රජතෙමේ ඔහු හැරදමමයි කියා වෙළුවනාරාමයට ගොස් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේව ඒ බැව් සැලකෙළේය. තුන්ලෝවැසීන්ට අනුශාසනා කරන්නාවූ ඒ සම්මාසම්බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාම

යෙහි වැඩසිටි සේක්ම ආලෝකයක් පහළවා ඔහුට ධර්මදේශනා කළසේක. හෙතෙම ඒ දම්දෙසුම් අසා හුලඟෙහි හුන්නේම සෝවාන් වී ශාසනයාන් වහන්සේගේ සමීපයට අහසින් ගොස් පැවිදිව අරාජිකපිරිස්මැදුම රහත් විය. මෙහි විසාර දම්පියා යෙහි තණ්හාවගීයෙහි විබහන්නකවසතුව බලා දන්නේය.

තවද බාලයෝ තුමූ තුමූම වරදවා ගන්නාලද දෘෂ්ටියෙන් තමන්ද තමහට කීකරුවූ අන්‍යයන්ද දෙවිදත් තෙරආදීහුමෙන් වනසන්නාහුය.

හේ කෙසේද යත්?

දෙවිදත් තෙරතෙමේ වනාහි ශාසනයාන් වහන්සේ අනුව පැවිදිව බුහුදුන් විසින් ලැබිය හැකි සෘද්ධ්‍යාදේශතෙක් ම මැතභාග යෙහි අජාසත්රජු විසින් කරණලද ලාභසත්කාරඇත්තෙක්වීය හෙතෙමේ ලාභසත්කාරයෙන් මඩන්නාලද සිත් ඇත්තේ "මම භික්ෂාහත පරිහරණය කරන්නෙමි"යි පාපවෙතනාවක් උපදවා එම විතෙකාතපාදය හා සමහම සෘද්ධියෙන් පිරිහි එක්දවසක් මවළුවනාරාමයටගොස් බුදුන්වැඳ "සවාමීනි! භාග්‍යවත්තෙම දැන් ජරාවෙන් දිරාසේක වයසින් වෘද්ධසේක ජාතියෙන් මහලුසේක අල්පොත්සාහීසේක එසේ හෙයින් දිෂ්ඨධම්මසුඛවිහරණයෙහි යෙදෙනසේක්වා මම භික්ෂාහාර පරිහරණය කරන්නෙම් මට භාරදුන මැනවැ"යි කීය. එකල ශාසනාවූ බුදුරජාණන් වහන්සේ විසින් කෙලකොලු වාදයෙන් ගරහා පිළිකෙවුන් කරන ලදින් නොඅතුටුසිත්ඇත්තේ තථාගතයන් වහන්සේ කෙරෙහි මෙම ප්‍රථම වෛරය බැඳ බැහැර ගියේය. හේ තෙමේ මැතභාග යෙහි අජාසත් රජු හා සමහ කුමන්ත්‍රණයකොට බුදුන්මරනට දුනුවාගන් යොදවා ඔවුන් සෝවාන් ඵලයෙහි පිහිටා නැවතුනු කල තෙමේ ගිජ්ඣකූට නැග "මම මහණ ගොයුම්හු දිවිහරවන්නෙමි"යි සිතා බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගලක් පෙරලා ලොහිතුප්පාදකර්ම ආනන්තරිය කර්මය කොට මේ උපායෙන්ද බුදුන් මරණට නොහැකිව නැවත නාලාගිරිඇතු රහමදින් මත්කරවා බුදුන් මරනට යැවීය. ඔහු බුදුන් හමුවන කල්හි අනඳමහතෙරතුවෝ බුදුනව නමදිවි පුදා ඉඳිරියෙහි සිටිසේක. ශාසනාවූ බුදුරජාණන් වහන්සේ එම ඇතු දමා නුවරින් නික්ම විහාරයට වැඩ නොයෙක් දහස්ගණන් උවසුවන් විසින් එලවනලද මහදන් වළඳ එදින එකී රැස්වූ අවලොස්කෙළක් රජගහනුවරවාසීන්ව දැන කථා ආදීවූ අනුපිළිවෙලකථා වදාරා සුවාසූදහසක් ප්‍රාණීන්ට

භාග්‍යවතුන් වහන්ස! භික්ෂූහු දිවිහිමිකොටම වත්වාසිහු වේත්වා පිඬුසිහා යැපෙන්නෝම වේත්වා සොහොනෙන් ලත් පිළියෙන් කළ පවුල්සිවුරු දරන්නෝම වේත්වා රුක්මූලම වහන්නෝ වේත්වා මස්මාංශ නොවළඳන්නෝම වේත්වා ඒ පිණිස අග දිමි"යි කියා පංචවසතුවක් ඉල්වීය. භාග්‍යවත් බුදුරජතෙමේ "දෙවදතනය! එසින් කම් නැත කැමති අයෙක් වනවාසී වේවා නොකැමති අයෙක් එසේ නොවේවා"යි යනාදීවශයෙන් වදාරා එයද පිළිකෙවුන් කළසේක. එකල දෙවිදත්තෙමේ "ඇවැත්නි! තථාගතයන් වහන්සේගේ වචනය හොබනේද නැතහොත් මාගේ වචනය හොබනේද මම වනාහි උත්කෘෂ්ටවශයෙන් මෙසේ කියමි දැකින් මිදෙනු කැමැත්තෙක් මාසමග ඒවා'යි කියා ගියේය. යමෙක් ඔහුගේ වචනය පිළිගත්හු නම් ඔවුන් ගෙන පංචවසතුවෙන් රුක්ෂබවට පහන් ජනයා හඟවමින් කුලයන්හි විනවිනවා අනුභව කරමින් සංඝභේදය පිණිස උත්සාහකරමින් පොහෝ දිනෙහි තමන්ගේ පිරිස සමග එකත් පසෙක හිඳ යමෙක්හට මේ පංචවසතුහු රුචිමෙත් නම් හෙතෙමේ ලහඟනුවයි ධර්මවිනයෙහි අදක්ෂවූ නවකවූ වජ්ජිපුත්‍රකවූ පන්සියයක් භික්ෂූන් ලහඟන්නාලදකල් හි සංඝයා බිඳුවා ඒ භික්ෂූන් ගෙන ගයාශීර්ෂයට ගියේය. උහු එතැන් පටන් නවමසක් ගිලන්ව හිඳ බුදුන්දකිනු කැමැත්තේ උහුසව්වන් විසින් ඇදකින් ගෙන සැවැත් නුවරට පමුණුවන ලද්දේ දෙවුරමින් පිට පොකුණු තෙරට පැමිණ එහිම දෙලක්ෂ සතලිස්දහසක් ගොදුන් සහකඩමහාසඞ්ඝපොළෝ පලා ගොස් අවීචියෙහි උපන.

දෙවිදත්වසතුවයි.

අජාතසත්තු රජතෙමේද එම අත්බැව්හි සොවාන්මාර්ගඵල ලැබියහැකිව තුබූ හෙතුසම්පත් දෙවිදත්හු නිසා පිතෘඝාතන කර්මය කිරීමෙන් තයා මහත් විනාශයට පැමිණියේය.

හේ කෙසේද යත්?

අජාසත් රජතෙමේ වනාහි යුවරජකල්හි දෙවිදත්හුගේ ඍද්ධ්‍යානුභාවයෙහි පැහැද දිනපතා උදයසවස දෙවිදත්හට උපස්ථානය පිණිස ගියේය. එක්දිනක් දෙවිදත්තෙමේ ඒ අජාසත් රජුවෙත එළඹ "පින්වත කුමාරය, පෙරවනාහි මනු ෂ්‍යයෝ බොහෝ ආයු ඇතිසඟ දැන් වූකලි මද ආයු ඇත්තාහ

කුමාරය! නුඹ කුමරෙක්වූයේම රජ නොව කලුරිය කරන්නේය යන යමක් වේද එකාරණය වන්ට බැරිනැත. එසේ හෙයින් කුමරුව! නුඹ පියා මරා රජ වන්නෙහිය මම බුදුන් මරා බුදු වන්නෙමි"යි කියා. හේ තෙමේ ඔහුගේ වචනය පිළිගෙන මහදවල් සැනක් ගෙන ඇතුළුනුවරට පිවිසියේය. ඇමතියෝ ඔහු අල්වාගන ලුහුබැඳ කරුණු පිළිවිස ඒ කාරණය රජුහට සැලකළාහුය. රජතෙමේ "පුතණුඩ කුමාරය! නුඹ කුමක් හෙයින් මා මරනු කැමැත්තෙහිදැ"යි විවාළාහ. "පියරජවූ දෙවියන් වහන්ස! රාජ්යය පිණිසය"යි කියේය. බිම්සර රජතෙමේ ඕහට රාජ්යය භාරදුන්නේය. අජාසත්රජතෙමේ "මාගේ මනදෙළ මුදුන්පත්විය"යි දෙව්දත්හට කියේය. ඉක්බිති දෙව්දත්තෙමේ "නුඹ මියෙඳු ඇතුළු කොට බෙරය බැඳි පුරුෂයක්හු මෙන් යස වැඩක් කෙළෙම්යි හහනෙහිද?

කිහිපදිනකින්ම නුඹගේ පියතෙමේ නුඹ විසින් කළ අවමානයහිනා තෙමේම රජවන්නාහ"යි කීය. සවාමිනි දැන් ඊට කුමක් කරමොදැයි විචාළේය. "ඔහු මරවාලව"යි දෙව්දත් තෙමේ කීයේය. "සවාමිනි. මාගේ පියතෙමේ සසත්රුගෙන් කොතැයිය යුත්තේ නොවේදැ"යි කියේය. "අහර වලකාලීමෙන් මරව"යි දෙව්දත් කියේය. ඒ අජාසත් රජතෙමේ පියාහට කම්කටුලු පිණිස කළ ධුම්සර සංඛ්යාත තාපනගෘහයෙහි බහවා "මාගේ මවට හැර අනිකෙකුට දකින්ට නොදෙවිය"යි රාජපුරුෂයන්ට නියෝය. මව් බිසවතොමෝ රන්බඳුනෙහි බත් බෙදා ඔබොක් කුවෙහි සඟවා ගෙනවුත් රජ්ජුරුවන්ට දුන්නීය. බිම්සර රජතෙමේත් එය අනුභවකොට එයින් සැපෙන්නේය. අජාසත් රජතෙමේත් මාගේ පියා කෙසේ සැපෙන්නේවේදැයි විචාරා එපුවත් දැන "මාගේ මවට ඔබොක්කුබැඳ පිවිසෙන්ට නොදෙවිය"යි කියා. මව්බිසවතොමෝ' හොණඩයෙහි ආහාරතබාගෙන හොණඩය බැඳ රජුහිඳිනා තාපනගෘහයට පිවිසෙන්නීය. එයද අසා "හොණඩිය බැඳ පිවිසෙන්ට නොදෙවිය"යි කියා. දෙවී තොමෝ රන්මිරිවැඩියෙහි බත් බහාපියා එම්මිරිවැඩිතැග පිවිසෙන්නීය. එයද අසා "මිරිවැඩිතැග පිවිසෙන්ට නොදෙවිය"යි කියා. දෙවී තොමෝ සුවඳදියෙන් තහා ශරීරය වතු මිධුරයෙන් තවරා පිළි පොරවා රජු හිඳිනා තැනට පිවිසෙන්නීය. බිම්සර රජතෙමේ අනුපිළිවෙලින් හෙවත් තමන්ගේ උපක්රමයෙන් මියයෑම නුසුදුසුය ආගන්තුකයෝ තමදිවි නමුදු

තොර නොකරන්නාහුය" යන අදහසින් දේවියගේ සිරුර ළලවපියා එසින් යැපෙන්නේය. අජාසත් රජතෙමේ කැවත විචාරා එපුවතද අසා "මෙතැන් පටන් මාගේ මවට පිවි සෙන්ට නොදෙව්ත"යි කියා. දෙවී තොමෝ වාරමූලයෙහි සිට "මාගේ සවාමීනි බිම්සර රජ්ජුරුවන් වහන්ස. දැන් මේ නුඹ වහන්සේගේ අන්තිම දැකීම වන්නේය අනේ මින් මතු නුඹවහන්සේගේ දැකීමක් මට නොලැබෙන්නේය පින්වත මාගේ දෙවයන් වහන්ස! ඉදින් නුඹවහන්සේට මාගෙන් යම් කිසි අපරාධයෙක් ඇතහොත් ඊට මට ක්ෂමා වතු මැනවැ"යි කියා ළය තලා හඬා වැලප නැවැත්තීය. එතැන් පටන් රජ තෙමේ නිරාහාරව මහපලසුවෙන් යුත් සක්මනින් යැපෙන් නේය. එසඳ රජහුගේ ආත්මභාවය පහන්වූයේ අතිශයින් බබලන්නක් වීය. අජාසත් රජතෙමේ මාගේ පියරජු කෙසේ යැපේදැයි විචාරා සක්මනිතැයි අසා "මපියාණන්පා තියුණු මුවහත් ඇති කරකැත්තෙන් පලා ලුණුතෙලින් ගල්වා කිහි රහුරෙහි පිසව"යි කියා කරතැවැමියන් යැවීය. ඌහු ගොස් ඒ පනිවුඩය බිම්සර රජ්ජුරුවන්ට කීහ. බිම්සර රජ්ජුරු වෝ 'තොපරජඅණ කරවිත"යි කියා හිඳගත්තාහ. එවිට කරතැවැ මියෝද "පින්වත දෙවයන් වහන්ස! අපි රජඅණ කරමු අපට උදහස් නොවත සේක්වා මේ දෙය නම් නුඹවහන්සේවැනි ධර්මිෂ්ඨරජවරුන්ට නුසුදුසුය"යි කියා එසේ රජඅණ කළහ. බිම්සරරජතෙමේ වහාහි "පෙර කලෙක ගඳමල් ආදියෙන් පූජ න්ට සැමිලුවෙක්හි වහනින් ගියේල, බික්ඛඟනට හිඳිනා පිණිස අතුලාවූ කළාලක් නොදෙවුන් පියෙන් ඇක්මුයේල මේ ඒ පාපකර්මයත් පිලිබඳ විපාකය"යිද කියත්. බිම්සර රජතෙමේ උපන් බලවත් වෙදනා ඇත්තේ "අහෝ!! බුඩ්ධා අහෝ!! ධම්මා අහෝ!! සංඝා"යි කියා තුනුරුවන් සිහිකරන්නේම ඉන් සැව වාතුම්මහාරාජික දෙව්ලොවැ පෙර බහුලවශයෙන් උපන්විරූ බැවින් බොහෝ කල් පුරුදුකරනලද ආත්මවශයෙන් වෛශ්‍ර වණ නම් දෙව්රජනට අතැවැසිව ජනවසභ නම් යක්ෂයෙක් වී උපන්නේය. මෙසේ ඒ අජාසත්රජතෙමේ පියා මරවා පසුව ඔටහත් පිනාසෙනන ඇත්තේ අඩා වැලප පියරජහුගේ ශරී රය ආදහන කෙළේය. ඉන්කැවත දෙව්දත්තෙමේ ඔහු සමඟ කුමන්ත්‍රණය කොටැ පෙරකීනයින් බුදුන් මරනට දුනුවායන් යෙදවීමෙහි පටන් සංඝභෙදය අභිවිධිකොට මහාපව්රැජ් කොට පෘතොව පලා අවීචියට පිවිසියේය. ඒ අත්‍ය අජාසත්

රජතෙමෙ කිමෙක මාත් පොළොව ගිලනේද"යි බිය වූයේ රජසැප නොලබනේය සඟනගෙහි සුඛාදස්වානයක් නොවිදිනේය කම්කටුලෙන් පෙළෙනලද ප්‍රේතයෙක්මෙන් සැලෙමින් හැසිරෙයි. ඒ අජා සත් රජතෙමෙ වනාහි පොළොහි ලිහු ලබන්නාක්මෙන්ද අවීචියෙන් ගිනිදැල් නික්මෙන්නාක් මෙන්ද උඩුකුරුව හොවවා ඇහුලින් නොටහු ලබන්නාක් මෙන්ද තමන් දක්නේය. එහෙයින් පහට කුකුළෙකුමෙන් එකෙණෙහි සැලෙන ඕනට අස්වැසීමක් නුවූයේය. හෙතෙමෙ බුදුන් දැක ප්‍රශ්නවිචාරූ ක්ෂමාකරවනු කැමැත්තේ නමුදු තම දෙස් මහත් බැවින් එළඹෙන්ට නොහැකි විය. මෙසේ කල් යන කල එක් පුණුපොහෝදිනකැ ඒ රජතෙමෙ දැන් බුදුහු කොහි වැඩ වෙසෙත්ද"යි ජීවකයා අතින් විවාළේය. ජීවකතෙමෙද බිම්සරරජු විසින් පෙර තමහට දුන් අඹලුයන රාත්‍රිස්ථාන දිවාස්ථාන ලෙණ කුටිමණ්ඩපාදිය සපයා බුදුනට හඳ කිළියක්ද කරවා විහාරයක් කොට පාවාදුන් හෙයින් "අපේ අඹලුයනෙහි වැඩවාසය කරන සේකැ"යි කියේය. ඉක්බිති රජතෙමෙ එදිනම රාත්‍රිකාලයෙහි ජීවකයා මාගීනායකයා කොට ජීවකයාගේ අම්බවනාරාමයට ගොස් බුදුන් හා බික්ඛු සඟන වැද එකත්පසෙක හුන්නේ **සාමඤ්ඤඵලසූත්‍රයෙහි** කියනසින් පැණ පිළිවිස්සේය. ඉක්බිති භාග්‍යවත්තෙමෙ වනාහි "මෙරජතෙමෙ පියරජු මැරවූතැන් පටන් රෑදිවාදෙක්හිම නිදි නොලබයි හෙතෙමෙ 'නිදන්නෙම්' යි සිතා ඇස් පියවූ කෙණෙහිම සියක් සැනින් අනිත්‍ය ලදුයෙක් මෙන් මහත් භයින් හඬමින් පුබුදිහි අද වනාහි මෙතෙමේ මවෙහා එළඹ වෙදම්දසුම් ඇසූකලතැන් පටන් නිදන්නේය තුනුරුවන්ටද මහත් සත්කාර කරන්නේය මෙරජු හා සමවූ අනික් පාථග්ජනික ශ්‍රද්ධාසම්පන්නයෙක් නම් නොවන්නේය දෙශනාවසානයෙහි තිසරණයෙහි පිහිටන්නේය මොහු, තිසරණගතවූයේ කෙසෙනි? යත් මසස්තගුණමහත්හෙයිනි, යම් පරිද්දෙකින් කිසියම් පුරුෂයෙක් තෙමේ අපරාධයක් කොට මල්ලවරුන් පමණකින් දඬුවම කිනුදු මිදෙන්නේද එපරිද්දෙන් මෙතෙමේත් ලොකොකුඹුයෙහි ඉපිද යට යන්නේ තිස්දහසක් හවුරුද්දෙන් පත්ලට පැමිණ නැවත මතුවන්නේ තිස්දහසක් හවුරුද්දෙන් කුඹුවුව පැමිණ මිදෙන්නේය ඉදිරිකල්හිද 'විජිතමසඟ' නම් පසේබුදුවී පිරිනිවන් පාන්නේය" යන මේ දම්දෙසුම් අසා ඔහු විසින්

ලැබිය හැකි මහානිසංශය දැන ඔහුගේ පැණ විසඳනසේක් සීලඤ්ඤබ්බවගීසඤ්ඤි සාමඤ්ඤඵලසුත්‍රානනධම්ම දෙසනා කර වදාළසේක.

දෙසුම් කෙළවර රජතෙමේ සුන්වූ මාගීඵලොපනිශ්‍රය ඇති යෙන් සොවාන්ඵලයෙන් පිරිහී ආතම්ඤනනිය්‍යාතනසරණා ගමනයෙන් තිසරණගියේය ඉදින් ඒ රජහුවිසින් පියා නොමරවනලද්දේවීනම් එව ආඤනයෙකිම සොවාන්වනනේය පාප මිත්‍රසංසඝීයෙන් වනාහි ඒරජ්ජුරුවන්ගේ මාගීඵලාධිගමයට අනතරාය වූයේය මෙසේ ඒ රජතෙමේ තිසරණ හොස් බුදුන් හමුයෙහි තමන් විසින් කරනලද අපරාධය ප්‍රකාශකොට බුදුන් ක්ෂමාකරවා හුනස්නෙන් නැගීසිට තෙවිටක් බුදුන් පැදකුණු කොට දෙහොත් මුදුනෙහි පිහිටුවා වැඳගෙන දශීවිෂය ඇතිතාක් බුදුන්ට අභිමුඛවූයේම පසුපස්සට හොස් ඇස්දුඹවිය හරින තැන පසහ බිම පිහිටුවා වැඳ ගියේය.

අඤබාලඅසත්පුරුෂයෝ තමන්ගේ වචනයට කීකරුවූවන් විනාශකරනබැව් දක්වනු පිණිස බඤාලනලද සාමඤ්ඤඵල සූත්‍රවර්ණනායෙහි අජාසත්රාජවසතුව මෙසේ සැකවින් දක්වා නිමවනලද්දේය.

"අතීතකාලයෙහි දීඝවිදශීකශාතෘතෙමේද තමාවිසින් වර දවා ගන්නාලද බාලඝංකල්පනාව හෙතුකොටගෙන බුඩාතතර සතරෙක්හිම සැටයොදුන් පමණවූ ආතම්භාවයෙන් උඩුකුරුව වැටුනේ මහානරකයෙහි පැසෙයි ඔහුගේ දෘෂ්ටිය රැවිකළා වූද පන්සියයක් කුලයෝ ඔහුගේ සඤඤාවයට පැමිණියාහු එසේම මහානරකයෙහි පැසෙන්නාහුය" යි යන මෙයද අතීත කථායෙහි කියනලද්දේය.

පූරණ කාශ්‍යපාදි සශාසෘහුද තමන් විසින් වරදවා ගන්නාලද දෘෂ්ටියෙන් "අපි අනුත්තරවූ සම්‍යක් සම්බෝධිය අවබොධ කොළෝ වම්හ" යි පිළින කරන්නාහු තමන්ගේ ආඩම්බර විනාශකළාහුය. ඔවුන්ගේ දෘෂ්ටිය රැවිකළාවූ බොහෝ අඥන බාලයෝද විනාශයට පැමිණියාහුය. ඒසියල්ලෝම දුගතිපරායනවූවාහුය.

කුමක් හෙයින් වනාහි උහුතුමූ පූරණාදි නාමයක් ලැබූහුද යත් එකෙක් වනාහි අනික් කුලයක්හට එකුන්සියයක් දෘඝයන් පූරවම්න් උපන එහෙයින් ඔහට 'පූරණය' යි නමක්

කළාහුය මඞ්ගලදූසයා බැවින් ඔහු විසින් කරනලද නපුර නමුත් 'අයුතුය'යි කියන්නාහු නම් නැත කටයුතුදෙය නොක රනලද නුමුත් 'අසවල්දෙය නොකරනලදැ'යි අපවාද කියන් නාහුත් නැත එසේ කල් යන කල මෙතෙමේ සිතනුයේ "මොහු සියල්ලෝම මාකෙරෙහි අවඥාපයහ එසේ හෙයින් මට කිසිත් නොකියති මම මෙහි කුමකට වෙසෙම්ද? පලායම්" යි සිතා පලාගියේය. එසේ යන කල සොරු ඔහුහඳනා පිළිපැහැරගත්හ හෙතෙමෙ තණපත් ආදියකින් පවාවත් ලැජ්ජාස්ථානය පිළිසන් කරගන්නට නොදන්නේ නොපිළිසන් නොටම එක්නමකට පැමිණියේය. එගම්වැස්සෝ ඔහු දැක "මේ මහණතෙමෙ රහත්ය අපිස්ගුණ ඇත්තේය මුත්වහන්සේ හා සමවූ උතුමෙකු මේ ලෝකයෙහි තවත් නැතැ"යි කියා හැඳබත්අවුලු ආදිය බරටව ගෙනවුත් දුන්හ. හේ තෙමේ "පිළිනො හැඳ නන්නව සිවි බැවින් මේසාමඟත් අහර රැසක් මට උපනැ"යි සිතා එතැන් පටන් පිළි ලැබුත් නොම හැන්දේය. ඒ නොපිළිසන් බවම පැවිද්දකැයි ගත්තේය. එම සවනාවයට පත්වූ පන් සියයක් දෙන උහුගේ සමීපයෙහි එම පැවිද්දට පැමිණියාහුය. හෙතෙමේම හොත්වහයෙන් 'කාශ්‍යපය'යන නාමය ලදුයේය. මේ උභයකාරණයෙන් ඔටගත් කාමවය සමොධානය වීමෙන් 'පූරණකාශ්‍යප' නම් වීය.

එකෙක් වනාහි එක්සවාමියෙක්ගට දූසයෙක් වූයේම බෙල සුල්මඩසහිතබිමෙක තෙල්කළයක් හෙන යන්නේ සවාමියා විසින් "තාත! මා ඛලී"කි (දරුව! නොපැකිල යවයි) කියනලද් දේත් ප්‍රමාදයකින් පැකිල වැටී තෙල්කළය බිඳීමෙන් සවා මියා කෙරෙන් භිංසාවට පත්වෙයි යන බිහයන් පැන දුවන්ට පටන්ගත්තේය. එකල සවාමියා දුවගොස් රෙදිකාණ අල් වන ලදුව රෙද්ද හැරදමා සෙලුවේම පලාගියේය. සවාමියා විසින් කියනලද 'මාඛලී' යන වචනය හෙයින් මොහු 'මකඛලී' යයි ප්‍රසිඛවිය. මෙහි සෙසු පුවත් පූරණයාගේම මෙනැයි දතයුත්තේය. මේ තෙමේ ගාලක උපන් බැවින් ගොසාල'ය යිද කියනලද්දේය. මෙම කාමවය සමොධානය වීමෙන් 'මක්ඛ ලීගොසාලය'යි ලොවැ ප්‍රකටවීය.

එකෙක් "අපව හෙතෙන කෙලෙස් හෙවත් මෙතන කෙලෙස් ගඛය මෙතැන මහකෙලෙස් ගඛය නැවතනැවතත් කෙලෙස්මයයි පළිබොධකරන අනගාරික කෙලෙස් හා පළි

බොධන කෘත්‍යසංඛ්‍යාත තෙත්වත්පුත්‍රදාරාදී විශෙෂවූ අගාරික රාගාදී කෙලෙස්ද අපට නැත අපි කෙලස්ගැටි නැත්තෝ වමු"යි මෙසේ කියනලද බැවින් නිගණ්ඨය"යි ලබනලද නම් ඇත්තේ'නාථ' නම් තැනැත්තහුගේ පුත්‍ර බැවින් නාථපුත්‍රයයිද කියනලද්දේය මෙම නාමවයාගේ සමොධානයෙන් නිගණ්ඨ නාථපුත්‍රය'යි ප්‍රසිඩ්වීය.

එතෙක් වනාහි නමින් 'සඤය' නම් වීය 'බෙලට්ඨ' නම් තැනැත්තහුගේ පුත්‍රබැවින් 'බෙලට්ඨිපුත්‍ර' නමුදු වීය, මෙම නාමවයාගේ සමොධානයෙන් සඤය බෙලට්ඨිපුත්‍රය'යි ලොවැ ප්‍රකටවීය.

එතෙක් තමින් 'පකුධනම්' වීය, ගොත්‍රවශයෙන්'කච්චායන ය'යි කියන ලද්දේය මෙමනාම්වයාගේ සමොධානයෙන් පකුධකාත්‍යායන' නම් වීය. යෙතෙමෙ සිහිල්දිය පිළිකෙවුන් නළ කෙනෙක, මෙතෙමෙ වනාහි වර්ෂස් කොටද අහර අනුභව කොටද කිසියම් අපිරිසිදු දෙයකින් තැවරුනේද දියකිස නොකෙරෙයි උණුදිය හෝ කැද හෝ ලැබ දියකිස කෙරෙයි ගඟ හෝ මඟදිය හෝ ඉක්මවා ගොස් මාගේ සිල් බිඳුනේ යයි කියා ව්‍රතශීලයෙන් වැලිසෙන් සැයක් කොටසිල් ඉවා යන්නේය. මෙතෙමෙ මෙබඳුවූ නිශ්‍රීතලබ්ධි ඇත්තෙක්වීය.

එතෙක් නාමවශයෙන් අජිතය මිනිස් කෙසින් කරන ලද කම්බිලියක් ධරනලද හෙයින් 'කෙසකම්බලය'යිද කියනලද්දේය, මෙම නාමවයාගේ සමොධානයෙන් 'අජිත කෙසකම්බලය'යි ලොවැ ප්‍රසිඩ්වූයේය. මෙහි විසතර සාමඤඤඵලසූත්‍ර වණ්ණනායෙහි සඟායනාවසානුව බලා දන්නේය.

මෙසේ අන්ධබාලඅඥතයෝ තමන් විසින් වරදවාගන්නා ලද මිථ්‍යාදෘෂ්ටියෙන් තමන්ද තමන්ගේ වචනය කරන්න වුන්ද විනාශකරන්නාහුය. පණ්ඩිතයෝ වනාහි තමන් විසින් මනාකොට ගන්නාලද සම්‍යක්දෘෂ්ටියෙන් තමන්ද තමන්ගේ බස්ගන්නවුන්ද බුඩාදීහු මෙන් යහපතට පමුණුවන්නාහුය. කාමරූපඅරූප යන ලොකත්‍රයෙහි භූතභවිෂ්‍යත්වර්තීමානසථාවර ජංගමනිත්‍යානිත්‍යාදී සඊඝසංසකාරප්‍රවාහනිධඒයන්කරතලාමලක ක්‍රමයෙන් සවය‍ම්භූඥතයෙන් අවබෝධකළාවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ වනාහි තමන්වහන්සේ විසින් මනාකොට ගන්නාලද උත්තමවූ සම්‍යක් දෘෂ්ටියෙන් ක්ෂාන්තිමෙත්‍රාදී

ගුණාගෙණෙන් හෙබියාවූ සවීඥතාඥණයට පැමිණවදුළසේක්. එසේම සාරීපුත්‍රමෞද්ගල්‍යායනාදී මහාශ්‍රාවකයන් වහන්සේලාද ශ්‍රාවකපාරමී ඤාණාදී ගුණසමූහයට පැමිණියාහුය. බුදුරජාණන් වහන්සේ වෙනැ පැමිණ වනාහි ගණන පථාතික්‍රාන්තදිව්‍යමනුෂ්‍යයෝ ආශ්‍රවක්ෂයට පැමිණියාහුය. එසේම අප්‍රමාණවූ දිව්‍ය මනුෂ්‍යයෝ බ්‍රහ්මලොකයටද පැමිණියාහුය. සැරියුත්තෙරපාණන්හෙරෙහි සිත පහදවා චීවරාදී සියුපස්ථෙන් තෙරුන් උවටැන් කොටැ අසූදහසක් ඛුලශෝ දෙවිලොවැ උපන්නාහුය. එසේම මහමුනලන් මහකස්සප් ආදී සියලු මහාශ්‍රාවකයන් වහන්සේලා හෙරෙහිද සිතපහදවා උවටැන් කොටැ දෙව්ලොවැ උපදනට හැකිවූවාහුය. අතීතකාලයෙහි අපමහබොසතාණන් වහන්සේ සුනෙත්‍රතම් ගණශාස්තෘවරයෙක් වූයේ සුගතියට බැසගන්නා තොටක් කරනුයේ විසකම්හතවසයෙන් කාමයන්හි පහවූ රාගඇත්තෙක් විය.

"අථ ඛෝ භික්ඛවෙ! ... උපපජ්ජතීති" යි යමෙක් සඳහා වදුළ සේක්ද නම් ඒ මේ සුනෙත්‍ර නම් ගණශාස්තෘවරයන් වහන්සේ සඳහා වන්නේය.

එහි සංක්ෂේපඅදහස නම්-මහණෙනි! සුනෙත්‍ර නම් ශාස්තෘතෙමේ සත්ත්වව්‍රැද්දක් මුළුල්ලෙහි මෙත්තා සමාධිය හා මෙත්තා බ්‍රහ්මවිහාරය උපදවා හා වඩා සත්මහාපක්මුළුල්ලෙහි හෙවත් විපත්තිකරමහාමේඝය පටන් විසිඅනන්තඃකල්පයක් මුළුල්ලෙහි ගින්නෙන් දැ බඹලොව පැහැර සිටි වහ්නිජවාලොපචේදය දක්වා පැවති කාලයයි කියනලද 'සංවර්තී' නම් අසංඛ්‍යකල්පය,

ඒ ජවාලොපචේදයෙහි පටන් පින්කළ සියලු සත්වයන්ගේ කුසලානුභාවයෙන් ලොකනිර්මාණය පිණිස පහළවන සම්පත්තිකරමහාමේඝය දක්වා ඒ අතර විසිඅනන්තඃකල්පයක්හුගේ ආයුමදකුත් අඩුනොකට යටින් අජටාකාශයෙහි පටන් මත්තෙන් සතරවන පරිත්‍රාණ නම් බඹලොව දක්වා මුළුලෝ නැසී සිස්වෙණබැකිකාරව පැවති කාලයයි කියනලද 'සංවර්තස්ථායී අසංඛ්‍යකල්පය,

ඒ සම්පත්තිකරමහාමේඝයෙහි පටන් නවම්මැදිම් දෙමහ අතර අටදින බාන පිණිසෙයින් සියුම් සියුම් තොට වසිමින් ක්‍රමක්‍රමයෙන් මහත්ව කුවුදුනළ හීදඹු මුහුල පුවක්ගුරු තල්

තුරු පමණ වැසිපොද වසිමින් කෙළලක්ෂයක් සක්වළ නැසී
ගියතාක් ලොව මිහිරිජලයෙන් පුරාලමින් වැහි අනතීත
වෙයි එකල මහාවාතය නැගී ජලය යටින් සරසින් අඹරමින්
සිදුරුගෙන නැගෙමින් තරදමින් කරඛවමින් තෙළඹුපතැදිය
සෙයින් වැරකෙරෙමින් සණය කොට වියලයි මෙසේ අනන්ත
දීඝීකාලයක්හුගේ ඇවෑමෙන් ජලය වියලී ක්ෂයවෙමින්
ක්‍රමයෙන් පහතබැස පළමු ශක්‍රභවන පිහිටි තැනට ළඟාවන්
නේය එකල පළමු බඹලෝ පිහිටි තන්හි බඹලෝ පහළ
වෙත් දෙවිලෝ පිහිටිතන්හි දෙවිලෝ පහළවෙත් එකල
ආභස්සරාදී මතු මතු බඹලෝවඝන බ්‍රහ්මරාජයන් අතු
රෙන් සමහරෙක් ආයුක්ෂයවීමෙන් හෝ පුණ්‍යක්ෂයවීමේන්
හෝ එයින් චුතවැ. මහාබ්‍රහ්මඅබ්‍රහ්මපුරොහිතඅ බ්‍රහ්මපාරිෂද්‍යඅ
ඝන ප්‍රථමධ්‍යානික තුන්තලයෙහි උපදනාඅ සමහරතෙනෙක්
පරනිර්මිතවසවර්ත්‍යඅ නිම්මානරතීඅ තුසිතඅ යාමඅ ඝන
සතරදෙව්ලොවැ උපදනාඅ, ඒ ජලය ක්‍රමයෙන් අඩුවී පළමු
පෘථිවිසථානයට බටකල්හි ඔබරාවෙඅ පුරා විසුළ දියත්තක්
සෙයින් හාත්පසින් නැගී දියවට කෙරෙමින් මිරිකයි එතල
ක්ෂයවන්නාවූ මධුරොදකඅ දියපිටදැමූ තෙළඹපතක් සෙයින්
හාත්පසින් නැගී දියවටකෙරෙමින් තරදමින් මිරිකයි එකල
අමාරසපෘථිවිඅ නඟයි දෙදහසක් යොදුන් පෘථිවිතලය කිණි
හිරිමලක් සෙයින් සවණිණවණිණයෙන් සොභමානවෙයි නිත්‍ය
සුරභිසුගඛ පැතිරෙයි දිව්‍යරසඔජස් ගෙන බහලූතලක් මෙන්
අමාරසවෙයි එහි මහාබොධිප්‍රීඔකඅ පිහිටන ජඅමහාභූමිසථා
නඅ හැමට ප්‍රථමයෙන් පිහිටයි ලෝනස්නා කල හැමට
පසුව නැසෙයි එහි පූජිනිමිත්තඅ දක්වන්නාක් මෙන් නෙළුම්
පැලයක් පැලවෙයි ඉදින් බුදුකෙනෙකුන් වහන්සේ ඒ කපැ
උපදනාසේක් වී නම් එහි මලෙක් පිපෙයි නැතහොත් නො
පිපෙයි මෙකපැ එකතුවේ මල්පසෙක් කණිණිකා බෙදී
පිපිනා. එහි පිරිකර පසෙක් වඅ. එකල දෙලොස්වඅ අවිහ
නම් බඹලෝ ඇතුළුවූ පංචසුඛාවාඅ බඹලොව අනාගාමි අර
හඅන්ත බ්‍රහ්මරාජයෝ තමන් බුඬොතපාද ලකුණු දන්නා සෙ
යින් "නිදුකාණෙනි! අපි පූජී නිමිති දක්නට යම්හයි" සම්මත
කොට ක්ෂණයකින් මුළුලොවැ අදුරුබිඳ බෝමැඬකරා බැස
රන්වන්නෙළුමල හා එහි පිරිකර පසක් දැක 'පසැස්ඇති
බුදුකෙනෙකුන් වහන්සේ උපදනා සේකැයි' උපන් ප්‍රීතිසොම්
නසින් දෙඅතින් සීවිරු ගෙන අහසට නැගී' පස්දෙනා

වහන්සේගේම ගර්භාවක්‍රාන්තිය අභිනිෂ්ක්‍රමණය සම්බුද්ධත්වය ධර්මචක්‍රප්‍රවර්තනය යමකප්‍රාතිහාර්යය දෙවොරොහණය ආයුසංඛාරොස්සජ්ජනය පරිනිර්වාණමඩල යන අටතන්හි දසසහස්‍රලෝකධාතුව කම්පනාදි බුදුපෙරහර දකුම් හයි' ප්‍රීතිවාක්‍ය පවත්වමින් තමතමන්ගේ පවසුඩාවාස බඹලෝ ගියාහුය. මෙසේ භූමියෙහි පවත් තුන්තෙළඹක්වියි ලක්ෂ්‍ය රදහසක් යොදුන් මත්තෙහි පිහිටි අකණිට්ඨ නම් බඹලොවැසි අරහන්ත නම් බ්‍රහ්මරාජයෝ සතසහස්‍රලෝකධාතුව ශරීරප්‍රභායෙන් ඒකාලෝක කෙරෙමින් හිඳිරු ගෙනගොස් බඹලොව තුබූහ. එකල සත්වොත්පත්තිය පිණිස ආශාසර නම් බඹලොවින් බ්‍රහ්මරාජයෝ ආයුක්ෂය විමෙන් චුතවී අවුත් මේ මිනිස්ලොවැ ඔපපාතිකවැ උපදින්, ඔවුහු සවකිය ශරීර ප්‍රභායෙන් අඳුරු බිඳ දිලිසෙන්නාහ. අහසින් යන ගමන් ඇත්තාහ ප්‍රීතිඇපම අහරභක්ෂාව ඇත්තාහ ස්ත්‍රීපුරුෂභේදයක්ද ව්‍යවහාරයෙක් නැතිව අසංඛ්‍යායුක්ෂවැ අනන්ත දීර්ඝකාලයක් වසන්නාහු මධුරතරසුරභිගන්ධසමාකීර්ණවූ පෘථිවියෙන් මදක් ඇඟිල්ලෙන් ගෙන දිවැහා ලෙහෙනොවැ ඉතා මධුරරසයකි පෘථිවිරසය අනුභවකරන්නාහු සිත්ලොබ වැඩුන් වැඩුන් පෘථිවිරසය අන්තර්ධානවැ අභිකැකුළුවැනි අමාරස ඇති සතුවගීයෙක් පහළ විය. හෙද ලොබ වැඩුන් වැඩුන් අන්තර්ධානවැ මධුරරසඇති භද්‍රලතා ලිය පහළවිය. හෙද අන්තර්ධානවැ ඔවුන්ගේ කුසල බලයෙන් දහසියා හා කුඩුනැති මුතුසේ පිරිසිදුවූ මිහිරි සුව දැනි සවයංජාත හැල් පහළවිය. ඒ සවයංජාත හැල් ගෙන පහළවූ මැණික් බඳුන්හි ලා මැණික් උදුන තබා පිළියෙළවූ දිව බොජුන් වැනි සුවඳබත් අනුභවකරන කලැ ජලමල උපන. ඒ ජලමල නික්මීමට කලට හටගන්නා එලමුකුළුසෙයින් ජල මලඹාගී බිඳී ඒ ඒ ස්ත්‍රීපුරුෂලක්ෂණවය හටගන්නේය එතැන් පවත් ස්ත්‍රීයන පුරුෂයන්හි ව්‍යවහාරයක් විය. අහසින් යන සෘද්ධි නැතිවිය. සදවෙන් බබළන් සශරීරප්‍රභා නැතිවිය. මුළුලෝ ඝණාන්ධකාරවිය. එකල ඒ ඝණාන්ධකාරයට පැමිණි ප්‍රථමකල්පික මහාබ්‍රහ්මයෝ "අහෝ!! අපි අනන්තාසංඛ්‍යායුවළඳමින් ශරීරප්‍රභායෙන් මුළුලොවැ අඳුරු බිඳ අහසැ සැරිසරාවුම්හ දැන් අපි කළකම් ඉතා බලවත් නිසාය"යි කියා හඬන්නාහ එකල ඔවුන්ගේ පුණ්‍යානුභාවයෙන් ඒ ඝණාන්ධකාරය විඛවං සනය කෙරෙමින් දෙශාලිස්දහසක් යොදුන් මත්තෙහි අහසැ පළස්යොදුන් හිරුවිමනෙක් පහළ විය ඒ දැක'මහත්වූ සූරභා

වය දක්වමින් ඝණාන්ධකාරය දුරුකළේය එහෙයින් මොහු සුගතීහ'යි නම් තැබූහ. ඒ හිරුවිමන ඉතාවූරුවැ ගියකල පෙර සෙයින් අඳුරට පැමිණී "හිරුසෙයින් තවත් ආලෝකමයක් පහළවී නම් යහපතැ"යි සිතූහ. ඔවුන්ගේ සිතීම හා සමඟ සඳ විමන පහළවිය. ඒ දැක 'අපගේ ඡන්දය ලෙසට පහළවූයේ සඳ හුය'යි නම්කළූහ. මෙසේ හිරසඳ පහළවූ දවස්හිම ඉදිරිපසූ නොව එකවටම මහමෙර වක්‍රවාට හිමවත්පර්වත දිවයින් කොදෙව් සමුද්‍ර දෙදෙව්ලොව යන සියල්ලම මැදිමිදිනපස ලොස්වක්පොහෝදවස්හිම එකවට පහළවිය. කෙසේ පහළවීද? යත්-යම්සේ තණබත් ඉදෙන කල්හි එතවරම බුබුලුනැගී මෙන් එක්පියසෙක්හි ථූපථූප නවයි එක්පියසෙක් මිටිමිටි වෙයි එක්පියසෙක් සමයම වෙයි ථූපථූපසථාන නොයෙක් කඳු පර්වතවෙයි නිනනනිහනසථාන නොයෙක් සරසරින් සාගර වෙයි සම්භමසථාන දිවයින් දඹදිවැ දෙදහසක් කොදෙව් වෙයි. මෙසේ සම්පතනිකරවකාමෙඝය පවත් විසිඅනනූතලපයක් හුණේ ආයු අඩුවෙනාකට ක්‍රමයෙන් ලොව තැනෙමින් ප්‍රථම කල්පික මාහුසිත මහාබ්‍රහමයෝ ඝණාන්ධකාරයට පැමිණ හඬ මින් හිරසඳමඟමෙර සක්වළහල්පහළවනතැන් දක්වා පවත්නා කාලයයි කියනලද විවර්තී නම් අසංඛ්‍ය කල්පය,

එතැන් පටන් හිරසඳ මඟමෙර ඇතිව දෙව්ලොව ඇතිව බඹලොව ඇතිව දිවයින් ඇතිව හිමවත්සක්වළහල් ඇතිව තුන් දහසක් යොදුන් දඹදිවැ සුවාසූදහසක් රාජධානි ඇතිව නො එක් සතිසමාකිණ්ණ අසංඛ්‍ය ආයුෂ්කව සිටි මිනිසුන්ගේ ක්‍රම යෙන් ආයු පිරිහී දසවශීතයව රොගදුර්භික්ෂශසනූතනූතලපය යන එකකින් අතුරුනාපෙනෙ සතුන්නැසී ඉතිරි මිනිසුන් ආයු වැඩී අසංඛ්‍යයට ගොස් නැවත ආයුපිරිහී දසවශීතයවමින් මෙසේ වීසිතුරුනෙපක්මුළුල්ලෙහි හෙවා මඟකලපය තස්තට හව් රුදුලක්ෂණයක් නිබියදී වස්නා විපතනිකර මහාමෙඝය දක්වා පැව ති කාලයයි කියනලද විවර්තාසථායිනා අසංඛ්‍යකලපය, යන සියු අසංඛ්‍යකලපයකින් මහාකලපයක් වන්නේය. එබදු සත්මඟ කපක්මුළුල්ලෙහි හේ පර්වතොපමාදීන් හා සදෘශවන බැවින් කලප නම් වන්නේය. හේ මෙසේයි—යම්සේ දිගින් යොදුනැති පලලින් යොදුනැති උසින් යොදුනැති අවශීදුවූ අසුසිරවූ එකඝණවූ මඟපර්වතයක් වේද ඒ පර්වතය යම් පුරුෂයෙක් තෙමේ සියක් අවුරුද්දක්හුගේ හෝ දහස්කවුරුද්දක්හුගේ හෝ ඇවැමෙන් ඉතාසියුම්වූ කාසිකවසත්‍රයකින් වරක් වරක් බැගින් පිරි

මදින්නේවී තම් මේ උපක්‍රමයෙන් නොබෝකලකින්ම ඒ මහා පඨිතය ක්‍ෂයභාවයට යන්නේ මය මහාකල්පය නොහෙවෙන් නේය. එබදු සත්මහකපක් මුළුල්ලෙහි පිළිගිදගැනීම් වශ යෙන් මේ මිනිස් ලොවට නොපැමිණියේය ගින්නෙන්ද, කල්ප විනාශය වනකල්හි පිළිගිදගැනීම්වශයෙන් ආභස්සර තම් බඹ ලොවට පැමිණියේය. ක්‍රමයෙන් කල්පාතපත්තිය ඇතිවනකල්හි කිසි සත්වයක්හුගේ උත්පත්තියක් වනට පළමු බැවින් සූන්‍යවූ පථමඛ්‍යානභූමිසංඛ්‍යාත පළමු භවගත් බඹවිමනට පිළිගිදගැ නීම් විශයෙන් පැමිණියේය.

එකල වනාහි මහබෝසතාණෝ අෂ්ටසමාපත්තිලාභී වූයේ ම තමන්වහන්සේගේ සතිසහිතවූ පැරැම් පිරීමද බලවත් එවදු ඡවිඇති ධ්‍යානභූමින්හිම ආසාව උපදවමින් මෙත්තාබ්‍රහ්මවිහාර විශයෙන් ඔබමොබ සැරි සැරූ සේක. සූතෙත්‍ර තම් ශාස්තෘන් වහන්සේට වනාහි බ්‍රාහ්මණ සිඟන්නන් ශ්‍රාවකයෝ වූහ. ඒ සිඟල් ලෝම ඒ මහබෝසතාණන් වහන්සේගේ දෙශනාව අසා උන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා සුගතිපරායණ වූහ උන්ව හන්සේලා අතුරෙන් සමහරු බඹලෝ ගියහ, සමහරු සදෙව්ලෝ ගියහ, සමහරු ක්ෂත්‍රියබ්‍රාහ්මණගෘහපතිමහාසාරකුලගතවූහ පණ්ඩිතයෝ වූකලි තමන් විසින් ගන්නාලදඅභප්‍රාප්තිදෘෂ්ටියෙන් තමන් හා තමන්බස් පිළිගන්නවුන්ද සැපට පමුණුවනබැව් දැක්වීමට හෙතෙරපාතලද සූතෙත්‍රයසතුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය. මෙහි විස්තාර සත්තාඛ්‍යානාකාරයෙහි පුබ්බේනිවාස සූත්‍රය හා සපතසූයෙහීදගමන සූත්‍රයද බලා දන් නේය.

ඉකුත් කල්හි සත්සියක් වෙළඳුහු වෙණදම් පිණිස මුහුදු පිට නැවින් දිවූහ. සත්වන දිනෙහි මුහුද මැද නැව බිඳී නැවට දිය පිරෙන්ට වන්හ. වෙළඳහු බියපත්වැ තම තමන් ගේ ඉෂ්ට දෙවතාවුන්ගේ නම් කියා කියා හඬමින් යාදුම් කළහ. ඔවුනතුරෙන් එකෙක් වනාහි තමන් නැව්නගින, දිනෙහි බික්ෂුනට දුන්දනක් හා ගත් සරණසිල්ද සලක මින් නොබිය වී හුන්නේය. නොබන්නාවූ ඔහු දැන අනික් දෙනා නොබියවන කරුණ ඔහු අතින් විවාළහ. හේ තෙමේ ඔවුනට ඒ කරුණ කීයේය. "කිමෙක හිමියෙනි. ශීලය ඔබට පමණක්ම වවනේද නැතහොත් අනිකුන්ටත් වවනේ" දැයි? විවාළේය. "එසේය සීලය නම් සියලුවම් වවනේය"යි

කීයේය. එසේවීනම් කිම්යෙනි. අපටත් සිල් දුනමැනවැ "යි ඉල්වූහ. හේ තොවම ඒ යෙනහ සියය සියය බැගින් සත්කොවසක් කොට සත් වරකට පන්සිල් දුන්නේය. එසිට් පළමු සියය හොප්ඇටය දියෙහි ගිලෙනකලද දෙවන සියය දනපමණ ගිලෙන කලද තෙවන සියය කටිය පමණ ගිලෙන කලද සියුවන සියය නැබ පමණ ගිලෙන කලද පස්වන සියය ඵන පමණ ගිලෙන කලද සවන සියය ගෙල පමණ ගිලෙන කලද සත්වන සියය මුවැ ලුණුදිය පෙවෙන කලද පන්සිල් ගත්හ. හෙතෙමේ ඔවුන්ට සිල්දී "තොපට අන්පිළි සරණක් නැත ශීලයම පිළිසරණ වන්නේය එසේ හෙයින් ශීලය ආවජිනා කරව්ය"සි මහත් හඬින් ඝොෂා කොට දියැ ගැලී මියැ ශීලානුභාවයෙන් තවුතිසාභවනයෙහි උපන සෙසු සියල්ලෝද මරණාසන්නකාලයෙහි ගත්ශීලය බැවින් එම පිරිසිදු ශීලානුභාවයෙන් ඕහට පිරිවරව් එහිම උපන්හ ඒ සියල්ලෝම සත් පුරුෂධම්ය සමාදානදිශානන් උලුපනයකොටැ සඟෙහි උපන් බැවින් ැසතුලුපකාසිතා දෙවියෝය'සි කියනලද්දහ. එහි සියල්ලට මැද පන්සිල්දුන් ඇදුරුහට සියක් යොදුනැති රන් විමනෙක් මැවින. අනික් විමානයෝ ඒ විමනට පිරිවරවූහ. ඒ විමන් අතුරෙන් සියල්ලටම කුඩාවිමන දෙළොස්යොදුනක්විය. මෙසේ ඔවුන්ට කැවිවිම් වශයෙන්ම විමාන පහළවූහ. ඒ දෙවියෝ තුමූ එහි උපන් කෙණෙහිම තමන්කම් බලනුයේ පන්සිල් දුන් ඇදුරු නිසා මේහා මහත් දිවසැපත ලැබුම්හයි දැන බුදුන් වෙතැ අප ඇදුරුගුණවණම්හයි කියා මැදුම්යම ඉක්ම ගතකල මුළුදෙව්රම තමතමන්ගේ ශරීරප්රභාවෙන් බබුලුවා අවුත් බුදුන් වැඳ එකත්පසෙක සිටගත්හ. එසේ සිටගත් දෙවියන් අතුරෙන් සියයකට එකෙකා බැවින් සදෙව් කෙනෙක් පිළිවෙළින් එකෙකී ගාථාව කියනු කැමතිවූවාහු සියුවනපාදය විෂමවූ ඉතිරි පාදත්රය සමමකාට සගාථාවකනෙක් කීහු. හේ කෙසේය යත්? පළමු දෙව්පුත්තෙමේ:

"සබ්බිරෙව සමාහිතෙථ සබ්බි කුබ්බෙථ සන්ථවං
සතං සබ්භමමක්ඛයා සෙය්යා හොති න පාපියෝ"

පින්වත් සහාය දෙව්වරුනි! මිනිසත්බැවිනි අපට පන්සිල් දුන් අපගේ ආචාර්යවරයා වැනි පණ්ඩිතසත්පුරුෂයන් හා සම ගම සියලු ඉරියව්හි වාසය කරන්නහුය එබදුවූම පණ්ඩිත සත් පුරුෂයන් හා සමගම මිත්රසන්ථවය කරන්නහුය එබදුවූම්

පණ්ඩිතඝත්පුරුෂයන්ගේ පංචශීලඝංඛ්‍යාත සඩ්ඝීඝ දැනීම හෙතු කොටගෙන අභිවෘඩ්ඝට පැමිණෙන්නේඝ ලාමකඝයක් නොවන්නේඝ අපිදු අපගේ ආචාඝඝීවූ පණ්ඩිතඝත්පුරුෂඝාගේ සේවනයෙන් පංචශීලඝංඛ්‍යාතඝඩ්ඝීඝ දැනීමෙන් මනාකඝන ඕන වන දිවසිරින් මෙසාමඝත් අභිවාඩ්ඝකට පැමිණිසෝවමුයි කියා ඇදුරුඝට පැඝසුයේඝ.
දෙවන දෙවිපුත්තෙමේ

"සබ්භිරෙවඝ පඝාසඝ්ඝ ලබ්භති නාඝඤ්ඤතෝ"

පින්වත් සඝාඝ දෙවිවරුනි! මිනිඝත් බැවිඝ්ඝ පෙඝ සඩ්ඝීඝ දැනීම හේතුකොටගෙන ප්‍රඥව ලැබෙන්නේඝ. අනිකුත් අඤ්ඤ බාලඅඥඅසත්පුරුෂයන් ඝා සෙවනයෙන් වැලිඅාදිඝ නිදීමෙන් තෙල්අාදිඝ නොලැබෙන්නාක්මෙන් බාලඝාගෙඝරින් නම් ප්‍රඥවක් නොලැබෙන්නේමඝ. තලඅාදිඝ නිදීමෙන් තෙල් අාදිඝ ලැබෙන්නාක්මෙන් පණ්ඩිතඝත්පුරුෂඝන්ගේ සඩ්ඝීඝ දැනීම හේතුකොටගෙන පණ්ඩිතඝන් සේවනඝ කරන තැනැත්තේම ප්‍රඥව ලබන්නේඝ. අපිදු අපගේ ආචාඝඝීවූ පණ්ඩිතඝත් පුරුෂඝාගේ සේවනයෙන් පංචශීලඝංඛ්‍යාතඝඩ්ඝීඝ දැනීමෙන් මෙම කම්පල දැනෙඝ ප්‍රඥාඅැතිබවට පැමිණිසෝ වමුයි කියා ඇදුරුඝට පැඝසුයේඝ.
තෙවන දෙවිපුත්තෙමේ

"සබ්භිරෙවි පෙඝ සොකමජ්ඣේ න සොචති"

පින්වත් සඝාඝ දෙවිවරුනි! පෙඝ සඩ්ඝීඝ දැනීම හේතුකොටගෙන ශොකවසතුන්ගේ ශොකානුගත සත්ත්වඝන්ගේ අතරට පැමිණිඝේ නමුදු ශොකනොකරන්නේඝ. අපිදු පෙර මිනිසත්බැවිහි තැවෙන්නිදීමෙන් විපතට පැමිණ ශොකඋත් මිනිසුන් අතර අපැදුරු පණ්ඩිඝ සත්පුරුෂඝා සේවනඝ කිරීමෙන් පංචශීලඝංඛ්‍යාතඝඩ්ඝීඝ දැනීමෙන් තිසරණඋපන්සිල් පිළිසරණඝයි පතන් සිත් උපදවා ශොක නොකොළෝ වමුයි කියා ඇදුරුඝට පැඝසුඝේඝ.

පණ්ඩිතඝත්පුරුෂසේවනයෙන් කවරක්හුඝමන් ශොක නොකරන්නාහුදඝත්? බඹුලඝසෙනෙවිඝාගේ 'මල්ලිකා' නම් උපාසිකාව මෙන්ද පන්ඝඝයක් සොරුන් මැදට පැමිණි සංකීවව කෙරණ පාණන්මෙන්ද ශොකනොකරන්නාහුඝ.

කුසිනාරානුවර වනානි පඝෙනදිරජු ඝා සමඝ එකඇදුරු කුලෙහි උඝත් ශිල්පඇති 'බඹුල' නම්වූ මල්ලරාජපුත්‍රයෙක්

විය. හෙතෙම මල්ලිකා' නම්වූ දෙවියක් රැගෙන කුසිනාරා නුවරින් සැවැත්නුවරට ගොස් පසෙනදි රජුනට සෙනෙවියෙක් වූයේය. මල්ලිකා තොමෝ ඔහු නිසා වරනට පුත්‍රයන් යුගයබැගින් සොළොස් වරක් වැදීය. ඒ සියල්ලෝම සුරවූවාහු බල සම්පන්නවූවාහු සියලු ශිල්පයන්හි පරතෙරට පැමිනියාහු වූහ. ඔවුන් එකෙකාගට පිරිවර දහසක් දහසක් බැගින් ඇතිවිය. එක්දිනක් කුටවිනිශ්චයකරුවන් පැරැදියේ ඉදිරියට එන්නාවූ බඹුලුසෙනෙවියා දුන විනිශ්චයකාරඇමතියන්ගේ කුටවිනිශ්චයකාරභාවය කිවාහුය. හෙතෙම ඒ අසා විනිශ්චයශාලාවට ගොස් ඒ නඩුව විභාග හිමියන් හිමියන් කොට අහිමියන් අහිමියන්ම කොළේය. රැස්ව හුන් මහජනයා මහත් හඬින් ඊට සාධුකාර දුන්නේය. ඒ සාධුකාරනාදය අසා පසේනදිරජු ඒ කිම දැයි විචාරා ඒ කාරණය දැන ඒ කුටවිනිශ්චයකාර ඇමතියන් පහකරවා බඹුලුසෙනෙවියාහටම විනිශ්චයකාර තනතුර පත් කෙළේය. ඒ බඹුලුතෙමේ එතැන් පටන් මනාසේ නඩු විභාග කළේය. එකල පැරැණි කොරවිනිශ්චයකාරයෝ අත්ලස් කොල බන්නාහු ධනමදවැ කොපයෙන් 'බඹුලුසෙනෙවියා රජය පත නේය'යි රජුහට කියා ඒ සෙනෙවියාකෙරෙහි රජු බිඳවූවාහුය. රජ්ජුරුවෝ ඔවුන්බස් ගෙණ යොදනලද පුරුෂයන් ලවා පසල් ගම පහරවා 'පසල්ගම කිපුනේල නුඹ පුතුන් සමග ගොස් සොරුන් අල්වා ගනුව'යි කියා බඹුලයා යවා 'දෙනිස් පුතුන් සහිතවූ ඔහුගේ හිස සිඳිව්ය'යි අනික් සමජීවියන්ට එහි යවා ඔවුන් සිස් සින්දවූයේය. එදවස වනාහි මල්ලිකාතොමෝ පන් සියයක් භික්ෂූන් වහන්සේ සහිතවූ දැහැවිවන්වහන්සේලාට බතින් පැවරූ දිනක් විය. එකල ඇඟට පෙරවරු සෙමෙහි "නීපුතුන් සහිත හිමිහුගේ සිස් සිඳනාලදැ"යි පතක් දුන්හ. ඕ තොමෝ එය කියවා බලා දැන කිසිවෙක්නව කිසිවක් නොකියා එපත බඩතුර තබා බික්ෂහනම වැලඳවීය. එක්බිහි ඇඟගේ මෙහෙවරකරන්නියෝ ගිතෙල්බදුනක් ගෙන එන්නියෝ තෙරුන් ඉදිරියෙහි බදුන ප්‍රමාදයකින් බිඳපිහ. එය දුටු දම් සෙනෙවිසැරියුත්තෙරතෙමේ "හෙදනධම්මං භික්ඛවෙ න විනෙතබබං" බිඳීම සවභාවකොට ඇත්තක් බිදුනේය. අනික් පසුතැවිල්ලක් නොසිතියයුතුය"යි වදාළහ. එවිට ඕතොමෝ බඩතුරතුබූ මලපත අතින් ගෙන දිගහැර දක්වා සවාමීනි! මෙ පුවත අසාත් අනික් පසුතැවිල්ලක් නොසිතූ මම ගිතෙල්සැලි බිඳිනැයි කියා කිම පසුතැවිලි සිතන්නෙම්දැයි කීය. දම්

සෙනෙවිඅැරියුත් මහතෙරපාණෝ ඇයටදම්දෙසා විහාරයට වැඩිසේක. ඒ මල්ලිකාතොමෝ පුතුන්හඹු දෙනිස්සෙහෙලියන් කැඳවා "තොප හිමියෝ නිරපරාධිහුය ඔහුතුමූ ඔවුන්ගේ පෙර කම්පල ලැබුහු නොසොව රජුනෙරෙහි නොදුස" මෙසේ ඔවාදී සෝපත් ඔවුන්ටැද නොසොවිය. මෙලෙස හදසාලජාතක වණ්ණනාදියෙහි කියනලද්දේය.

සංකිච්ච නම් හෙරණවහන්දැද සැවැත්නුවර බමුණුමහසල් කුලයකැ ඉපිද සත්හැවිරිදි කල්හි දම්සෙනෙවිඅැරියුන් මහ තෙරණුවන් ළඟ පැවිජීවැ කරගෙහිම සියුපිළිසිඹියාපත් මහ රහත්වීය. හෙතෙම හෙරණකලැ නිස්තමක් හිඤ්ඡූන් සමඟ වල්වැද මහණදම් කරනුයේ පන්සියයක් සොරුන්විසින් මොහු මරා දෙවියන්ට බිලිපුදම්වැහි කියා ගෙනගොස් පැන්නක තැබූ කලැ එහිම දහන්සමවැද හුන්නේය. සොරදෙවුතෙමේ ගිනි මෙලවිම්ආදි කිස කරවා සුරතින් කඩුව ගෙන තෙරණපාණන් ගේ සිරුරෙහි පහලේය. අසිපත නැමිගොස් මුවහතින් මුවහත වැදී සිවිසේය සොරදෙවුතෙමේ යලිත් අසිපත දිගහැර එසේම පහලේය. එකල අසිපත තල්පතක් නෙවත් ජන්මපත්‍රයක් සෙසින් හැකිලෙමින් කඩුමිට ලඟට පැමිණියේය. එකල ඒ සිරුලු සොරහු ඒ අසිරිදැක උන්වහන්සේගේ දහම්ද අසා පැහැද උන්වහන්සේ ළඟ පැවිජීවැ උන්වහන්සේ සමඟම දෙවිරමට ගොස් ත්‍රිභුවනජනකණ්ණිණාමෘතසමෝදර ධර්මදේශනාවෙන් අනු ශාසනාකර වදරන්නාවූ ශාස්තෘන්වහන්සේගේ දම්දෙසුම් අසා සියුපිළිඹියාපත් මහරහත් බවට පැමිණියහුය.

පණ්ඩිත සත්පුරුෂයන් සේවනය කරන තැනැත්තේ ශොකපත්වූවන් අතර පැමිණියේ නමුදු ශොක නොකරණ බැව් දුක්වීමට ගෙනහැරපානලද සංකිච්චසාමණේරකථා වසතුව මෙසේ සැකෙවින්දක්වා නිමවනලද්දේය. මෙහි විස්තර ධම්මපදවණ්ණනා ආදිය බලා දන්නේය.

සියුවත දෙව්පුත්තෙමේ

"සබ්භිරෙව සමාසෙථ පණ්ඩිතේහත්ථදස්සිභි
සන්තෝහි ඛන්තිසෝරච්චේ සාධූනං සංගමෝ සුඛෝ"

පින්වත් සභාය දෙව්වරුනි! මිනිසුන් බැව්හි පෘථග්ජනභාවය හේතුකොටගෙන සතුරන්ගේ මධ්‍යයෙහි බබලන්නේය. අපිදු අපගේ ආචාර්යවූ පණ්ඩිතසත්පුරුෂයාගේ සේවනය හේතු කොටගෙණ දැන් මේ දිව්‍යසතුරන්ගේ මධ්‍යයෙහි බබලන්නෝ වමුයි කියා ඇදුරුහට පැහැසුණේය. මිනිස්ලොව ඒ බැබලීම

මකසේද යත්? අධිමුත්තකාතෙරණවහන්දු සඤ්ඤීන්ගේ මඛ්‍ය යෙහි බැබලියාක් මෙනි.

උන්වහන්සේ වනාහි සංකිච්චසාමිරයන් වහන්සේගේ බැනෆුණෙනෙක් වන්නේය. කෙසේනමේ "යව වයස විවාරා එව තා උපසම්පදාකරන්නෙමැ"යි ආචාර්‍යයන් වහන්සේ විසින් පිටත්කොට යවනලද්දේ පාසිවුරුගෙන දෙටුකොහොවුරියගේ ගමට ගොස් එහි බත් කිස කොට තමන් වයස විවාළේය. ඕ තොමෝ 'එය මම නොදනිමි මව් දනීතැ"යි කිය එවිට හෙරණ තෙමේ "එසේ වීනම් නුඹ නැවතීයන්න මම මව්කරා යන්නෙමි"යි කියා එහි යනු පිණිස සොරුවසන වතමගට පිළිපන්නේය. එසේකල සොරු උන්වහන්සේ අල්වාගන ඔවුනතු රෙන් සමහරු මොහු මරමුයයිද සමහරු හැරදමමුයයිද කිහුය. හෙරණතෙමේ 'මම සෙක්‍ෂයෙක්මි සියුමහින් කටයුතුවූ දෙය ඇත්තෙක්මි මොවුන් සමඟ කථාකොට තමහට ඥානනියක්කර ගන්නෙමැයි' සිතා 'ඉදින් තෙපි මා මරන්නහුනම් එකල එය දැනීමෙන් මගිහු මේ වතමගින් නොයති එසේ ඇතිකල ඔවුන් නොලැබීමෙන් තොපට මහත් ධනඤානියක්වන්ට බැරිනැතැ'යි කියේය. එකල සොරහු මෙතෙමේ යුකතියක් කියන්නේයයි සිතා 'ඉදින් නුඹවහන්සේ මහදී අනිකෙක් දැක මෙපවත් නොකියන්නෙහිනම් යතහැක නැතනොත් නොහැක්කේය'යි කිකල්හි කිසිවක්හට නොකියනලෙස ගිවිසගෙයින් ඔව්හු උන්වහන්සේ හැරියාහුය. ඒ හෙරණතෙමේ ඒ සොරුන් විසින් හරිනලද්දේ එවනමඟ ගමුව ගිය මව්පියාදී සඤ්ඤීන් දැක ඔවුන්ටද ඒ පුවත නොකියා තමන් පිළිත තඟවුරු කෙළේය. සොරහු ඒ මව්පියාදින් අල්වාගෙන වෙගෙහනකල හෙරණමව් තොමෝ වැලපෙන්නී සොරුන් විසින් විවාරණලද්දී "මම අධිමුත්තකාහෙරණුන්දුමගේ මවිය මේ පියාය මේ සොහොවුරුය"යි කීය. ඒ අසා සොරහු "මේ මහණතෙමේ ඒකාන්තයෙන් සත්‍යවාදී කෙනෙකැ"යි පැහැද ඒ හෙරණුන්දුගේ නැගන් හැරදමා උන්වහන්සේවෙතැ ගොස් එ පුවත් කියා පැවිද්ද ඉල්වා පැවිජීවූහ. ඒ අධිමුත්තකහෙරණපාදයෝ ඒ අතැවැසි හෙරණුන් රැගෙන සංකිච්ච තෙරුන්වෙතැගොස් පළමුවැ තමන් උපසපන්වැ තදනන්තරවැ ඔවුන් තමන් අතැවැසියන් කොට උපසපන්කරවීය. ඔහුතුමූ අධිමුත්තකතෙරහුවන්ගේ අමෘදෙන ඔවා ලෙස මනාසේපිළිපැදි මහත්ගුණඇති රහත්බවට පැමිණියාහුය.

පස්වන දෙවිපුත්තෙමේ

"සබ්බිරෙව පෙ සන්තා ගච්ඡන්ති සුගතිං"

පින්වත සහාය දෙව්වරුනි! මිනිසත්බැව්හි පෙ දැනීම හෙතුකොටගෙන සත්වයෝ සුගතියට පැමිණෙන්නාහ. අපිදු අපගේ ආචාර්‍යවූ පණ්ඩිතසත්පුරුෂයාගේ සෙවනය හෙතු කොටගෙන දැන් මේ දෙව්ලෝසංඛ්‍යාත සුගතියට පැමිණියෝ වමුයි කියා ඇදුරුහට පැසසුයේය.

සවන දෙවිපුත්තෙමේ

"සබ්බිරෙව පෙ සන්තා නිබ්බන්ති සාසන"න්ති.

පින්වත් සහාය දෙවිවරුනි! මිනිසත් බැව්හි පෙ දැනීම හෙතුකොටගෙන සත්වයෝ දීර්‍ඝකාලයක් මුළුල්ලෙහි සැපයේ හිඳිනාහුය. අපිදු අපගේ ආචාර්‍යවූ පණ්ඩිතසත්පුරුෂයාගේ සෙවනයෙන් පංචශීලසංඛ්‍යාත සත්පුරුෂධර්මය දැන අනන්ත දීර්‍ඝකාලයක් මුළුල්ලෙහි රම්‍යවූ දිවයිරි විදිමින් සැපෙහි පිහිටා සිටීමට පැමිණියෝ වමුයි කියා ඇදුරුහට පැසසුයේය.

සත්වනසියය වෙනුවෙන් ඉදිරිපත්වූ සත්වන දෙවිපුත් තෙමේ බුදුන්වැඳ සමුගෙන සවාමීනි! භාග්‍යවතුන් වහන්ස මෙසේ කියනලද කවරදෙව්පුතක්හුගේ කිමක් සුභාෂිතදැයි විවාළේය.

එසඳ සාන්තසුඛප්‍රණීත අමෘතමහානිර්‍වාණදැනප්‍රදානය කරන පරමාර්‍ථ ධර්මදේශනාවෙන් දෙව්මිනිසුන් සහිත ලොකයාහට අනු ශාසනා කරන මාගේ තිලෝගුරුවූ ශාස්තෘන් වහන්සේ "නිදු කාණෙනි! නොපසියලලන්ගේ භාෂිතය කාරණාවශයෙන් සුභා ෂිතමය එතකුදුවුවත් මාගේ භාෂිතයත් අහවිය"යි වදාරා මේ ගාථාව වදාළසේක.

"සබ්බිරෙව සමාසෙථ සබ්බිකුබ්බථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සබ්බදුක්ඛා පමුච්චරේ"ති.

එම්බා දෙව්වරුනි! පණ්ඩිතසත්පුරුෂයන් හා සමඟම ඒකා නිඋදාදී සියලු ඉරියව්හිම වාසය කරන්නේය බුදුපසේබුදුමහා ශ්‍රාවකයන් වහන්සේලා ආදී සත්පුරුෂයන් සමඟම මිත්‍රසන්ථවය කටයුත්තේය තෘෂ්ණාසන්ථවය වනාහි කිසිවෙක් සමඟ නොකට යුත්තේය බුඩාදී සත්පුරුෂයන් වහන්සේලාගේ පංචශීලදස ශීල සතරසතිපට්ඨානාදී ප්‍රභෙදවූ සද්ධර්මය දැනීම හෙතුකොට ගෙන හුදෙක් මනාඅභිවාඩියක් වනබැව් පමණක්ම නොවෙයි

හුදෙක් ප්‍රඥාවගේ ලැබීම පමණකුත් නොවෙයි ශොකපත්වූ වන් අතරදී ශොක නොකරනබව පමණකුත් නොවෙයි නැගන් මඩ්‍යයෙහි බබලන බව පමණකුත් නොවෙයි සුඛයි යෙහි උපදිනබව පමණකුත් නොවෙයි බොහෝකල් සැපයේ සිටිනබව පමණකුත් නොවෙයි, වැලි එකෙක් ඇති රාගවෙෂ මොහවිපරීතමනසකාරාදී සකී අකුසලධම්මයන් නිරවශෙෂකොටැ විසුඛාගමීප්‍රතිලාභයෙන් බිඳහැර සියලුසංසාරප්‍රවෘත්තිසංඛ්‍යාත වූතදුඃඛයෙන්ද මිදී අජරාමර සාත්තසුඛප්‍රණීතඅමෘත මහානිබ්බාණසංඛ්‍යාත නිස්සරණවිමුත්තියටද පැමිණෙන්නේයයි වදළසේක.

පණ්ඩිතවූ සත්පුරුෂයෝ තමාවිසින් මනාසේ ගන්නාලද ලද්ධියෙන් තමන්ද තමන්බස්ගන්නවුන්ද සැපට පමුණුවන බැව් දක්වීමට හෙතුහැර පානලද දෙවනාසංයුත්තාවණ්ණනා යෙහි සම්මුදවාණිජවසතුව මෙසේ සැකෙවින් දක්වා යිමවත ලද්දේය.

මෙසේ පණ්ඩිතයෝතුමු තමන්ද තමන්බස් කරන්නවුන්ද නොවනසන්නාහුය එකරුණෙහිලා යම්හේකින් යමෙක්තෙමේ බාලයන් සේවනය නොකෙරේද හෙතෙමේ පණ්ඩිතයන් ශ්‍රව නය කරන්නේ නම් වෙයි යමෙක්තෙමෙ පණ්ඩිතයන් සේවනය කෙරේද හෙතෙමේ බාලයන් සේවනය නොකරන්නේ නම් වෙයි එහෙයින් ඒ දෙකම අර්‍ථවශයෙන් එකක්ම වන්නේය. ඒ කිමයත්? යම්සේ වනාහි මහදුනීසමහි දක්ෂපුරුෂයෙක්තෙමේ මහකියන්නේ "වම්පසැ මහ නොගනු දකුණුපස මහ ගනුව"යි මෙසේ පළවූව හොගතයුත්ත කියා පසුව ගතයුත්ත කියයි එක රුණෙහිලා යම්හේකින් යමෙක්තෙමෙ වම්පසැ මහ නොගනීද හෙතෙමේ දකුණුපස මහ ගන්නේ නම් වෙයි යමෙක්තෙමේ දකුණුපසැ මහ ගනීද හෙතෙමේ වම්පසැ මහ මුදන්නේ නම් වෙයි එබැවින් ඒ දෙකම අර්‍ථවශයෙන් එකෙක්ම වන්නේය. එසේත් "වාමං මුචා'ති ඉදං වම්පසැ මහ මුදව" යන මේ වච නය "මා දක්ඛිණං මුව ඉති" දකුණුපසැ මහ නොමුදව යන විප රීත වචනයාගේ අර්‍ථයමහැඟවීම පිණිස කියනලද්දේය. "දක්ඛිණං ගණ්හා'ති ඉදං" දකුණුපසැ මහ ගනුව යන මේ වච නය "මා වාමං ගණ්හා'ති" වම්පසැ මහ නොගනුව යන මේ විප රීතවචනයාගේ අර්‍ථයම හැඟවීමට කියනලද්දේය. එමන්ම මෙසිද්ධ "අසෙවනා ච බාලාන'න්ති එතං" බාලයන් සේව

නය නොකිරීමද" යන මේ වචනය "බාලයන් සේවනය කිරීම නොමහුලැයි යන මේ විපරීත වචනයාගේ අර්ථය හඟවන පිණිස කියනලද්දේය. "පණ්ඩිතානං ච සේවනා'නි එසා" පණ්ඩිතයන් සේවනය කිරීමද යන මේ වචනයද පණ්ඩිතයන් සේවනය නොකිරීම නොමහුලැයි යන මේ අර්ථය හැඟවීමට කියන ලදැයි දතයුත්තේය. මෙසේ කොට පණ්ඩිතසේවනය පළමු කොට නොකියා බාලසේවනය පළමුකොට කීහ ලද්දීය. ඉදින් පණ්ඩිතසේවනය පළමුකොට කීනම් පණ්ඩිතවචනවශයෙන් බාලාර්ථය නොහැඟෙන්නේය එය නොහැහුනුකල්හි බාලසේවනයද නොහැඟෙන්නීමය යම්හේතුවින් බාලසේවනය පළමුකොට හඟවන්ට කැමතිවීද එබැවින් බාලසේවනයම පළමුකොට කියනලද්දීය. "අසේවනාච බාලානං" යි වදාරන්නාවූ අපඝම්මාසම්බුදුරජානන් වහන්සේ බාලයන් සේවනය නොකිරීමම පළමුකොට අවබොධකරවනු ලබන්නිය. භාග්‍යවත්තෙමේ වනාහි මිහදුනීමෙහි දක්ෂයෑ. එබැවින් වම් මහවැනිවූ නොගතයුතු පණ්ඩිතඅසේවනයයි කියනලද 'බාලසේවනය පළමුකොට අවබොධකරවා පසුව දකුණුපසැ මහවැනිවූ ගතයුතු පණ්ඩිතසේවනයයි කීහනලද බාලඅසේවකය උගන්වා වදාළ සේක. බාලසේවනය වනාහි පරාභවහෙතුබැවින් නොමහුලී.

එසේහෙයින් භග්ගාරාගඤ්ඡාදීගුණඇති හෙයින් භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක.

"අසන්තස්ස පියා හොන්ති සන්තෙ න කුරුතෙ පියං,
අසතං ධම්මං රොචෙති තං පරාභවතො මුඛ"න්ති.

පූරණකාශ්‍යප ය මක්ඛලිගොසාලය නිගණ්ඨනාථපුත්‍රය සඤ්ඤයබෙලට්ඨපුත්‍රය පකුධකාත්‍යායනය අජිතකෙසකම්බලය යන සඟාසන්‍යාදී අසත්පුරුෂයෝ මේ බාලයාහට ප්‍රියයෝවන්නාහුය, බුඩාදී සත්පුරුෂයන් තමහට ප්‍රියයන් නොකරන්නේය, දෙසැටමිථ්‍යාදෘෂ්ටිය හා දසාකුසලකර්මපථයාද යන මෙයම ඒ බාලයා රුචිකෙරෙති. අසත්පුරුෂයන් ප්‍රියබවද සත්පුරුෂයන් අප්‍රියබවද මිසදිටුආදිය රුචිකරනබවද යන මේ ත්‍රිවිධ කාරණය පිරිහෙන්නාවූ වැනසෙන්නාවූ පුහුලාගේ විනාශයට හෙතුවූ කරුණුය එහින් යුත් පුහුලා මෙලොවැ පරලොවැ දෙක්හි අභිවෘඩියට නොපැමිණෙන්නේයයි වදාළසේක.

මෙතෙකින් ගුද්ජන මනනඳන බාලපණ්ඩිතා සෙවන සසවන කථාව නිමවනලද්දේය.

පූජාවනම්- ආමිෂපූජා ප්‍රතිපත්තිපූජා වශයෙන් දෙවැදෑරුම් වන්නීය. ඔවුනොවරෙන් චීවරාදී සිය්‍යුපසයෙන් පිදීම ආමිෂපූජා නම් වන්නීය. පිළිවෙතින් පිදීම ප්‍රතිපත්තිපූජා නම් වන්නීය. අට්ඨාසෙකි වනාහි පූජාවනම් සත්කාර ගරුකාර වඳනමානනා යයි කියන ලද්දීය. පූජාහීයෝ නම් උත්කෘෂ්ටපරිවේදයෙන් බුදුපසේබුදුආර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සෙලා වන්නාහුය. උන්වහන්සේලා වනාහි දක්ෂිණාගී බැවින් තමන්වහන්සේලාතෙරෙහි කරනලද සවලපවුද පූජාව හෙතුකොටගෙන බොහෝකලක් මූළුල්ලෙහි හිතසුවඵලවනබව කරතෙහින් පූජනෙය්‍යයයි කියන ලද්දාහ.—එහි- පුදනුලැබේනුයි පූජා නම් වේ, පිදිය යුතුබව ඇතිකල්හි පිදීමයි ක්‍රියාමාත්‍රයයි. එම පූජාක්‍රියාව පිළිලැබීමට සුදුසුවූවාහුනුයි 'පූජනෙය්‍ය'නම් වෙත්. පූජාවට යොග්‍ය යහ පූජාවට සුදුසුයහ යන අර්ථයි "අරහතෙතා ඡ්ඨෙඤ්ඤා" යන ශබ්දනීති සූත්‍රයෙන් එෂ්‍ය ප්‍රත්‍යයව සිඩ්ඝි. දැන් වනාහි "පූජනීය්‍යානං" යීද කියත්. එව සූත්‍රයෙන්ම ඡ්ඨ ප්‍රත්‍යයව සිඩ්ඝි. අනීඝප්‍රත්‍යයයිද සමහරු කියත්. එඝ වනාහි "පූජනෙය්‍යානං" යන්නට දුන් "පූජාරහානං" යන අට්ඨාවවනඝ හා සමනොවන්නේඝ. බුඩාදීඋත්තමඝාණන්වහන්සේලාතෙරෙහි පූජාව නම් අල්පවූවත් දීඝීකාලඝක් මූළුල්ලෙහි හිතසුවඵලවන්නීමඝ. මෙකරුණෙහි සුමනමාලාකාරාදීහුද නිදර්ශනවශයෙන් දැක්විඝ යුත්තාහ.

රජගහනුවර වනාහි එක්තරා සුමන නම් මාලාකාරයෙක් වීඝ. හෙතෙමේ දිනපතා උදැසනම සමන්මල් අටනැලියකින් බිම්සර රජුහට උවටැන් කරනුයේ කහවණු අටඅට බැගින් ලබයි. උහු එක්දිනක් මල්ගෙන රජුවටැනට යන්නේ භික්ඛඝන්විසින් පිරිවරන ලදුව සවතඝාන බුදුරජාණන් වහිදුවා පිඬුපිණිස නුවරට වඩින්නාවූ බුදුන්දැක පහන්සිත් ඇතිසේ අපහිම් රජතෙමේ මේ මල් නොලැබීමෙන් මා නඝතඝොත් නඝන්වා රවින් තෙරපා ලතඝොත් තෙරපාලන්වා ඝතෙතේමේ වනාහි මේ පිණිඝ මට දෙන්නෙත් මෙම අත්බැව්හි දිව්ඝැවීමට පොහොතා පමණවූම ධනඝක් දෙයි බුඩපූජාව වනාහි සංඛ්‍යා නොකට හැකි ඵල ඇත්තීඝ. දීඝීකාලඝක් මූළුල්ලෙහි හිතසුව ඵලවන්නීද වෙයි මේ මල්අටනැලියෙන් බුදුන් පුදන්නෙමියි සිතා ලොබ හැර බුදුන්ට තමදිවිපුදා, ඒ මල් අටනැලිඝ දෙනැලි දෙනැලි වෙන්කොට බුදුන් දෙස දැම්ඝ. පළමු මල් දෙනැලිඝ බුදුන් මතුයෙහි මල්විඝනක් වී පිහිටිඝහ. දෙවනුව බණාලනලද දෙනැලිඝ දකුණු පෑ

ඒද නෙවනුව බඳාලනලද දෙනැළිය පිටිපසැඟිද සියුවනුව බඳා ලනලද දෙනැළිය වම්පසැඟිද මල් නිරිඳු පිහිටියහ. ඉදිරියෙහි ගමනවාරය පමණක් වීය. මල්නටු ඇතුළුදෙසට හැරී පෙති වනිර්මුඛවැ සිටියහ. ශාස්තෘන්වහන්සේ රිදීපටකින් වටකරන ලද්දාක්මෙන් වී වැඩිසේක.

මල්ද නොබිඳී නොවැටී ශාස්තෘන්වහන්සේ හා සමගම යන්නා හුය. වැඩසිටිනැන මල්ද සිටිනාහුය. ඒ අයිරි දැන මූළුනුවර කැලඹිණ. ඇතුළුනුවර වනාහි ජනයො නවදෙළක් පමණ ඇත්තාහ. ඔවුනතුරෙන් සිඟාවා නොගෙන නික්මුනු එකෙකුන් නැත්තේය මහජනතෙමෙ සියගණන් බිල්වරබඳ සියගණන් හිසවට පිළිසිඳැරීම්ද කරමින් බුදුන් සමගම හැසුරුණේය. මාලාකාරතෙමෙ වනාහි මෙසේ අප බුදුපියාණන් වහන්සේ පූජාකොට සතුතිකොට නමස්කාරකොට හිස්පැහැම රැගෙන පෙරලා ගෙට ගොස් 'මල්කොහිදැ'යි ගිනිණියට විසින් විචාරණ ලද්දේ 'මවිසින් එයින් ශාස්තෘන්වහන්සේ පුදනලදැ'යි කියේය "රජුහට දැන් කුමක් කරන්නෙහිද?" 'රජතෙමෙ මා නසත ගොත් නසත්වා රටින් නෙරපාලතගොත් නෙරපාලත්ව මම ලොබ හැර බුදුන්ට දිවිපුදා මලින්ද බුදුන් පිදුසෙමි මවිසින් මෙබඳු මල්පූජාවක් කරනලදැ'යි හැමපුවත් කියා. ඔහුගේ බිරිඳ වනාහි අඤ්ඤතර මෙබඳු පුදුමයෙහිත් නොපැහැද උහුට බැණ වැදී "රජහු නම් සැඩඝන එක්වරක් උදහස්වූවාහු බොහෝ අන ර්‍ථීකරන්නාහුය තා කළකම්න් මටද මහත් අවැඩ වන්නේය අපට සිදුවූයේ මහත් හානියෙකැ, අපි මැනසුනෝ වමු තාවිරුදු කමැ කුළුපල තා ලබනවා විනා අපි කුමට ලබමෝදැ"යි යනාදී බොහෝ රළුපරළුදැ දෙඩා ඇතුන් ගෙන තතනාමින් රජුහු රැවත් කරා එළඹ ඒ දෙදෙන කළකී සියල්ල කියා "පින්වා දෙව ඝන්වහන්ස! මට ක්ෂමාවකුමැනව මා අත වරද කැත මස්මින් විසින් කළකම් වැඩ හෝ අවැඩ හෝ ඒ පිළිපිඳ ඵලය උහුට වේවා මවිසින් උහු බැහැරලනලදබව දනුමැනවැ"යි දෙනොත් නහා වැඳ කීය. ඒ අසා බිම්සර රජ්ජුරුවෝ 'අනේ මේ ගිහිණිය අඩබාලිය. මෙබඳු ගුණයෙහිත් පහත් නොවදනවාය'යි සිතා තදින් කිපියෙක්මෙන්, උහුවිසින් මට උවැටනට ගෙනා මලින් පිදුයේදැ'යි විචාරා 'එසේය දේවඝන්වහන්සැ'යි කීකල "නීවිසින් එබඳු නොකටයුත්තක් කළ උහු හැරලුබැව් ඉතා මැනව උහු විසින් මාගේ මලින් පූජාකරනලද්දීය. උභට කළයුතුදැ මම දනඉන්නෙමි"යි කියා ඇය පිටත්කොට යවා වහා බුදුන්වෙතැ

ඵලඞ්ග බුදුන් සමඟම ගැසුරැ ලේඛ.ශාස්තෘන් වහන්සේද රජු ගේ සිත පහන් බැව් දැන මාලාකාරයාගේ ගුණය ප්‍රකට කරනු පිණිස තුන්ගව් රජගහනුවර බෙර වැදන ළඟින්ම වඩිනසේක් කඹට වත් පාත්‍රය නොදී රජමිදුලට වැඩවදුරා ගනු කැමති රජුට පාත්‍රය දී රජ ගෙට නොවැඩ එහිම වැඩහිඳ රජ්ජුරුවන් විසින් ප්‍රණීතආහාරයෙන් වළඳවනාලද්දේ ඉක්කිය අවසන් භුක්තානුමොදනා කොට එවෙහෙරට වැඩ සුරභිගන්ධවාසිත සුගන්ධගන්ධකුටියට පිවිසියේහ. ඒ මල්ද බුදුන්වඩනාකල ඝන්තාහුය සිටිනා කල සිටිනාහුය ගඳකිලිසට පිවිසිකල දෙරකොටුවෙහිවැටුනාහ. රජ්ජුරුවෝ වහාම බුදුරජානන්වහන්සේ. අනුවණහාස් නැවැත්තේ මාලාකාරයා කැඳවා ඔහු කෙරෙහි පහන්වූයේ හස්තිඅශ්වදාසදාසීන්ද දිව්‍යප්‍රකාරයන් වැනිවූ සම්භාරණවිභූෂිතවනකයන පිනවන කන්‍යාඔගනාවන්ද ගම්වරද දානයක් කඹවණුදුයි යන මේ හසනිආදි සප්තවිධවස්තූන් අටඅට බැගින්ද මෙලපලදනාද ඔහට දුන්නේය. ඛීණාසවභික්ෂුණීන් වහන්සේ විසින් විහාරයට ගොස් 'සවාමිනි භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්ස! සුමනමාලාකාරයාගේ විපාකය කවරේදැ'යි විචාරනලද ශාස්තෘන්වහන්සේ " ආනන්දය! මේ මාලාකාරතෙමෙ මට දිවි පුදු මල් පූජාකළ විපාකයෙන් කල්පලක්ෂයක් දුගතියට නොපැමිණ දෙවිමිනිස් දෙගතියෙහිසැරිසරා 'සුමන' නම් පසේබුදු වන්නේය"යි වදුරා දහම් දෙසනාවක් ධම්පියාවෙහි බාලවර්ගයෙහි:—

"තව කම්මං කතං ඝාධ්‍ය යං කත්වා නානුතප්පති,
යස්ස පතීතෝ සුමනෝ විපාකං පටිසෙවති"නි.

යි වදාළසේක. ගාථාවසානයෙහි සුවාසුදහසක් ප්‍රාණීන්ට ධම්මාභිසමයවූයේහ. බුබ්බාදි පූජාහීනන් වහන්සේ කෙරෙහි මදවූ වද පූජාව දීඝ්කාලයක් මුළුල්ලෙහි ඝිතසුව ඵලවන බවට නිද සන්වහයෙන් ගෙනහැරපානලද සුමනමාලාකාරවස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

එක්තරා කුලපුත්‍රයෙක් පෙර බුදුවරයන්වහන්සේලා කෙරෙහි කරකලද අධිකාරඇත්තේ ඒ ඒ භවයෙහි පින්රැස්කරමින් සිඛාජී නම් භාග්‍යවත් බුදුරජානන්වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද එම්බුදුන් ජීවමානකලැ පින්කරන්නට නොහැකිවී පිරිනිවිකල්හි ඒ බුදුන්ගේ ධාතුවෙත්‍යය කරවනු ලබනකල දෙපයින් පැමිණි ඛණ්ඩනාන්තරයෙහි එක් සුණුපිඬක්

[illegible] [illegible] [illegible] [

යන් වහන්සේලා කෙරෙහිද පූජාභාරන්තානවද ජනිතවන් තාවූ කුසලය තීරණවශයෙන් මෙය මෙහොතැයි තයග්‍රාහ යෙන් හෝ ධාරණවශයෙන් තරාදියෙන් කිරීමෙන් හෝ පූරණ වශයෙන් නැළිආදියෙන් මැණීමෙන් හෝ සතඝඝග්‍රාදීවශ යෙන් ගණන්කරන්නට කිසියම් මහානුභාවසම්පන්නපුද්ගලයෙකු විසින් නමුත් නොහැක්මෙක්ය. යම් පුඥාලෝකයක් ඇතමෙ දෙදහසක් කොදෙව් පිරිවරකොටඇති සතරවනා ලිපය එක්කොට මුළුසක්වළඟැබෙනි ඉසුරට අධිපතිවූ සක්විති රජය කරන්නේ නමුදු මුළුසක්වළ සත්රුවන්ආදී සියලු ධනය ධාතුචෛත්‍යයෙහි සුධාපිණ්ඩපූජායෙන් හටගත් කුසලතාගේ සොළොස්වන කලාවෙන් සොළොස්වන කලාවකටත් නොවට නේය. මිනිසුන් අතුරෙන් අග්‍රවූ ශ්‍රේෂ්ඨවූ එබඳු පූජාහිවූ සිඛාඊ නම් සම්මාසම්බුදුරජානන් වහන්සේගේ ධාතුචෛත්‍යයෙහි දෙපසින් පැමිණි බඹතානතරයෙහි පහන් සිතින් යුක්තව මවිසින් සුධාපිණ්ඩයක් තබනලදිදේය.

මෙසින් සියුඅනුකපකින් මත්තෙහි සුධාපිණ්ඩපූජාසංඛ්‍යාත යම්බදු කාම්මයක් මම කෙළෙම්ද ඒ පුණ්‍යකම්මය කරණකොට ගෙණ දුගතියකට පැමිණීම බවක් නම් නොදනිමි. මේ චෛත්‍ය ප්‍රතිසංසකරණයාගේ ඵලය වන්නේය. ඒ පුණ්‍යකම්මය හෙතු කොටගෙනම මෙසින් නිස්වන කපෙහි තෙළෙස් වාරයෙක්හි 'පටිසංඛාර, නාමයෙන් සත්රුවනින් යුක්තවූ සක්විතිරජ වීමි. ඒ පුණ්‍යකම්මය හෙතුකොටගෙණම සියුපිළිසිඹියාවෝද අෂ්ට විමොක්ෂයෝද ෂට්අභිඥාවෝද යන මේ සියල්ලම මවිසින් සාක්ෂාත් කරණලදිදැහැ. සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ අනුශාසනා වද කරනලදිදේයයි ප්‍රකාශ කෙළේය.

පූජාගියන් වහන්සේලා කෙරෙහි කරණලද මදවූද පූජාව බොහෝ කාලයක් මුළුල්ලෙහි හිතසුව ඵලවතබවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද අපදානයෙහි දසබලගීයෙහි සුධාපිණ්ඩියථෙරවස්තුව මෙසේ යැකෙවින් දක්වා නිමවන ලදිදේය.

ඒවැදෑහෙන්වූ බුදුරජාණන් වහන්සේ සියලු බුඩකෘත්‍ය යන් කොට පිරිනිවන් පැවැදුළ කල්හි මහාඝිශ්වරවූ අජාසත් රජ්ජුරුවන් විසින් තමන්ලත් ධාතුමහාථූපය තොයෙක් පුද පෙළහරින් වැඩවාහෙන හොස් රජගහනුවර මහත්වූ දහඩක් කරවා ජීවමානබුදුන්ට පූජාකරන්නාසේ මහත්වූ පූජා

සක්කාර පවත්වනලද කල්හි රජගහනුවර වසන්නාවූ එක්තරා සත්‍රියක් අලුයම් නැගිට සිරුර පිළිදුනුම්කොට පවිත්‍රශීලිව සකසාගැඳ වැටකොලු මල් සතරක් කඩාගෙන ශ්‍රද්ධාබලයෙන් නොසසුඛවිහාරීඇතිව මාගීඵලහි වත උවදුරු නොසලකා ඒ දෙවැබදිසාවට අභිමුඛව ගන්නීය. එකල අලුත වැදූ දෙනක් ලමාවස්සෙකුගෙන දිවන්නී මගබැස ඒ පූජාපුජා දිණීය ගන සත්‍රිය අභිමුඛව වහා අවුත් අගින් ඇන එහැන්හිම ජීවිතක්ෂයට පමුණුවාපුව. ඒ උපාසිකා වනාහි එහැන්හිම කාලක්‍රියා කොට ඛාතුපූජා පිණිස ගිය කුසලය හෙතුකොටගෙන තව්තිසා දෙව් ලොව උපදනා කැනැත්තිය උයන්කෙළියට ගත සක්දෙව් මහරජාණන්ගේ අභිමුඛයෙහි දෙතෙළ පණස්ලක්ෂයක් පමණ දෙවඟණන්මැද ඇගේ ශරීරප්‍රභාවෙන් සියලු දෙවඟනන් අභිභවනය කෙරෙමින් රථවිමානය හා සමග පහළවූවාය. සක් දෙවිරජාණෝ ඒ දෙව්දුව දැක විස්මයත්ව ආශ්චර්‍යවූ ප්‍රීතිසෞමනස් ඇතිව කවරහම් උදාරතර කුසලයක් හෙතු කොටගෙන මේ දිව්‍යාඞ්ගනාව මෙබඳු මහත් දිව්‍යසම්පත්ති ලබන්නීයාදැයි විචාරනු කැමතිව මේ ගාථාවලින් විමාලේය.

"පිතවත්‍රේ පිතඛජේ පිතාලඞ්කාර භූසිතෙ,
පිතවන්දන ලිත්තඞ්ඝ පිතුපපලමාලිනී.

පිතපාසාදසඝතෙ පිතාසනෙ පිතහොජනෙ,
පිතඡත්තෙන පිතරථෙ පිතසෙසු පිතවීජනෙ.

කිං කම්ම මකරි? හදෙද! පුබ්බෙ මානුසකෙ භවෙ,
දෙවතෙ! පුච්ඡිතාවික්ඛ කිස්ස කම්මස්සිදං ඵල"නති,

යනුඇසින් ශරීරයත් ශරීරයෙහි පලඳනාලද වස්ත්‍රාභරණ සඳුන්මාලාදිය හා කූඩකොඩි ෙ සත් විමානාසන පරිවාරාදි සියල්ලම සඞ්ඛේපවර්ණනයෙන්ම බබළන්නාහ. නී මෙබඳු දිව ඉසුරක් ලැබීමට මිනිස්ලොවදී කළාවූ කුසලය කවරේදැයි විචාළේය. මෙසේ ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් විචාරනලද පැණය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනාතොමෝ මේ ගාථාවලින් ප්‍රකාශකළාය.

"කොසාතකී නාම ලතත්ථිහනෙන! නිත්තිකා අනහිජ්ඣිතා,
තස්සා චත්තාරි පුප්ඵානි ථූපං අභිහරිං අහං.

සත්ථු සරීරං උද්දිස්ස විපසන්නෙනාන චෙතසා,
නාසෙසිං මිගහං අවෙකඛිස්සං තදඟඟමනුසාසනී.

තතොහං අවධී ගාවී ථූපං අපතතමානසං,
තඤ්චාහං අභිසඤ්චෙය්‍යං සීසෙ නූන ඉතො සියා.

තෙන තමේමන දෙවින්ද! මඝවා දෙවකුඤ්ජර!,
පහාය මානුසං දේහං තව සහව්‍යතමාගතා"ති.

යනුහෙයින් සවාමිනි! දිව්‍යරාජොත්තමවූ සවාමින්වහන්ස, මිනිස්ලොව වැටෙනොලුනම් බැල්ජාතියක් ඇත්තේය මවද අවිද්‍යාවෙන් නුවුළාව කුසලඵල දන්කාබැවින් බුදුන් සිහිකොට වැටෙනොලුමල් සතරක් තබා ශරීරධාතූන්ට පූජාකෙරෙමි සිතා මඟට බැස දැගැබදිසාවට යන්නෙමි, එකල අලුත වැටූ දෙනක් ලමාවස්සෙකුගෙන දිවඵන්නී උවදුරු නොසලකා තුන්තුරුවන් ගුණ සිතසිතා යන්නාවූ මා දැගැබ සමීපයට යන්ට පළමුවෙන් ඇත මැරුවාය. ඒ මල්සතර ධාතුප්‍රදේශ යොමුකොට මදතැනක් ගෙන ගිය පමණින් මෙබදු සැපතක් ලදිමි. නුඹවහන්සේ සමග සැපවිඳීමට පැමිණියෙමි. ඉදින් ඒවල් පූජාකළාතම් මීටත්වඩා උදාරතර සම්පත්ලදිමි කිව. එබස් අසා සතුටුව ශක්‍ර දෙවෙන්ද්‍රයෝ මාතලිදිව්‍යපුත්‍රයා ඇතුළුව තව්තිසා වැසි දෙවි යන්ට මෙසේ බණ කීයේය.

"පස්ස මාතලි! අවෙච්චර විඤ්ඤං කම්මඵලං ඉදං,
අපපකම්පි කතං දෙය්‍යං පුඤ්ඤං හොති මහප්ඵලං.

තත්ථි විත්තෙන පඤ්ඤාමහි අප්පිකාකාම දක්ඛිණා,
තථාගතෙ වා ඵබ්බුඬෙ අථ වා තස්ස සාවකෙ.

එහි මාතලි! අමෙහපි හීයෝ හීයෝ මඤ්ඤෙ,
තථාගතස්ස ධාතුයෝ සුඛාපුඤ්ඤූනම්ුවවයෝ.

තිට්ඨන්තෙ නිබ්බුතෙවාපි සමෙ විත්තෙ සමං ඵලං,
වෙතෝ පණිධි හෙතූනි සත්තා ගවජ්ඣන්ති සුග්ගතිං.

බහුඤ්ඤාං වත අත්ථාය උපපජ්ජන්ති තථාගතා,
යත්ථ කාරං කරිත්වාන සඝං ගවජ්ඣන්ති දායකා"ති.

යනුහෙයින් මාතලී දිව්‍යපුත්‍රය! බුදුන්ගේ ආශ්චර්‍යවත් ගුණයක් බලව, දිනයුතු දැනවසතුව සවලපවී නමුදු කුසලය මඟත්ඵලවන්නේය. එබැවින් බුදුන් කෙරෙහිද බුදුසව්වන් කෙරෙහිද පහන්සිත්ඇතිව දුන් කල දැනවස්තුව සවලප වනනේ නොවෙයි නුඹබිජුවට කුඩාවුවත් ගස මහත් වන්නාසේ දැනය සවලපවූ නමුදු මහත්ඵලවන්නේය. එබැවින් මෙහි එව මාතලිය! උගන්කෙළියට යාමෙන් ප්‍රයොජන නැත, බුදුන්ගේ ධාතු පූජාකිරීම කුසල් අතුරෙන් උතුම්වූ කුසලයෙක් නම් වන්නෙය. ශරීරධාතු පූජාවම යම්සේ බුදුන්කෙරෙහි සමඅදහස්

ඇතිව යමක් පිදුයේ වීනම් ජීවමාන බුදුන්ට කළාවූ පූජාවත් පිරිනිවන් පෑකල කරනලද උදෙසිසිත පූජාවත් සමථිප්‍රාප්ත වන්නේය. සිත්ප්‍රසන්නවූ කුසලය හෙතුකොටගෙන සත්වයෝ සුවගීලොක සම්පත්තියට හා නිර්වානයට පැමිණෙන්නාහ. එබැවින් බොහෝ දෙනාට වැඩ පිණිස බුදුවරයෝ ලොවැ පහළවන්නාහ. බුඩොත්පාද කාලයෙහි තමතමන්ගේ ශක්තිපමණින් පූජාසත්කාර කොට දැයකයෝ සුගතියට ගන්නාහයි කියා ප්‍රශංසා කොට උන්වහන්සේට ඉතා තමන් නිරන්තරයන් පූජා සත්කාරකරනලද සිළුමිණියෑය සමීපයට ගොස් සත්දවසක් මුළුල්ලෙහි පූජාසත්කාර කෙළේය. එයින් පසු එක්දවසක් ආයු සම්පූර්ණ නාරදමහතෙරුන් වහන්සේ දෙවවාරිකාවෙන් තව්තිසා භවනයට වැඩිසේක. ශක්‍රදෙවෙන්ද්‍රයෝ සියලුම ප්‍රදේශනීය උන්වහන්සේට කීයේය. නාරද මහතෙරුන් වහන්සේ මිනිස් ලොවට වැඩ ඇඩයිනිකාරකම්හාසථිවිරයන්ට කීසේක. උන්වහන්සේලා මේ විමානවණ්ණනාවත් බොහෝ දෙනාට වැඩ පිණිස ධම්මසංග්‍රහවට නහා සඞ්ගායනා කළහ.

බුදුන් පිරිනිවිකල්හිදු පූජාහිවූ ධාතුවෙත්‍යයට මුදවූ වසතු වෙන් නමුදු කරන ලද පූජාව පුදන්නවුන්ට දීඝීකාලයක් මුළුල්ලෙහිතසුව ඵලවනබවට නිදසුන්වශයෙන් ගෙතඟැරපාන ලද **පිනවිමානවණ්ණනායඤ්ච සඞ්ඛාසානඤ්ච දෙවතාවසානුව** මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

මෙසේ බුඩපූජාතොමෝ දීඝීකාලයක් මුළුල්ලෙහි හිතසුව ඵලවන්නීමය.

අතීතයෙහි බරණැස්නුවර විසූ දිළිඳු සත්‍රියක්තොමෝ මැටි අතා ගෙහි භිකනියක් තවරමින් හුන්නීය. එකල එක්තරා පසේ බුදුවරයන්වහන්සේ තමක් තමන් වහනසේගේ ප්‍රාග්හාරය පිරිබඩකරන පිණිස මැවිසිහීමට නුවරට වැඩ ඇට භුදුරු තැන සිටිසේක. ඕතොමෝ උන්වහන්සේ දෙස බිපී බලන්නී 'මහණ! මැවිවත් නොලබන්නෙහිදැ'යි කියා මහත් මැවිපිඬක්කොට ගෙතවුත් උන්වහන්සේගේ පාත්‍රයෙහි ලීය. පසේබුදුරජාණන් වහන්සේ එය ගෙන වැඩිසේක. ඕතොමෝ එයින් චුතවැ බරණැස බටහිර ගම්දොර නළකාරගමැ එක්තරා දිළින්දක්ගව දුවනියක් වී උපන. පසේබුදුවරයන්වහන්සේ කෙරෙහි කෝපයෙන් බැලූවිපාකයෙන් ඇගේ අත්පා මුව ඇස් කන් නාසා දිව

විරූපවූවාහුය. එහෙයින් ඇට 'පංචපාපියා'යි නම් කළාහුය. මැවිපිඩ දුන් විපාකවශයෙන් වනාහි ඇයගේ ශරීරය සුවපහස් ඇතිවීය. එකල බරණැස්නුවර 'බක'නම් රජදරුවෙකුනෙක් විය. ඒ රජතෙමේ එක්දිනක් රාත්‍රිභාගයෙහි අප්‍රසිඩවශයෙන් නුවර පරිග්‍රහකරනුයේ ඇ වර්ණන තැනට පැමිණියාහ. පංච පාපිද හම්දුරියන් සමග කෙළමින් සිට නොදුන රජ්ජුන ඇල් විය. රජතෙමේ දිවපහසින් ස්පර්ශසුඛලෝභයෙන් පියෙව්බැව්හි පිහිටා සිටින්නට නොහැකිවන්නේ ස්පර්ශරාගයෙන් රත්වූයේ කවරක්හුගේ දුවනියක්දැයි විචාරා ගාමචාරවාසීහුගේ යහි කී කල සඤ්ඤාමික අඤ්ඤාමිකභාවය විචාරා අඤ්ඤාමිකබැව් දැන 'මම කිට හිමිවන්නෙමි යව මව්පියෝ විචාරව'යි ක්‍රීය. ඕතොමෝ ගෙට වැද මව්පියන්ට එපුවත කීය. මව්පියන් නොමනු දැන්වූ වාහුය. ඇය තදනන්තරව රජ්ජුරුවන්ට එපවත් කී කල රජ්ජු රුවෝ ඇය සමග ගෙට ගොස් සෘෂණාසඤ්චය කොට රැය පහන් වන්නට පෙරතුව රජගෙට පිවිසියේය. එහෙන් පටන් රජ්ජුරුවෝ අනික් කුමරියන්දෙය බලන්නට පවා නොක මැතිවනුයේ අප්‍රසිඩවශයෙන් නිබඳ ඇයකරා පැමිණෙන් නේය. එසේ කල්යනකල එක්දිනක් ඇයගේ පියහට ලොහි තපකඛන්ධාබාධයක් උපන. දියනුමුසු කිරිමීයකුරුගොදන ලද කිරිබතක් ඊට බෙහෙත විය. මව්තොමෝ දිළිදු බැවින් එය නිපදවන්නට නොහැකිවන්නී දුවෙනි! කිම තී හිමිතෙ මේ එම බෙහෙත් කිරිබත නිපදවන්නට හැකිවන්නෙක්දැ?'යි විචාළීය ඕතොමෝ රජුඅකල ඒකාරණය දැන්විය. රජ්ජු රුවෝ 'සොඳුර! ඉසුරුමහන් වීසින් ලැබියහැකි මේ බෙහෙත මා කොයිබින් ලබන්නෙම්ද'යි කියා ඇය උපායකින් ඇතුළුනුවරට ගෙනයනුකැමැත්තේ දෙවනදිනෙහි රජගෙට ගොස් එබඳුවූ කිරිබත පිසවා බත් මුළුදෙකක් කොට එක, බත්මුළෙක්හි සිළුමිණ බහා රාත්‍රිකාලයෙහි අවුත් මහාදුව! නිගේ පියහට අද මෙයද සෙට මෙයද අනුභවකරවව'යි කීය. ඕතොමෝද එසේ කළාය. රජ්ජුරුවෝ පසුදින අලුයම රජ ගෙට ගොස් මුවදෙවුන් මකාවැ 'මාගේ සිළුමිණ නොදක්න මේයි කිව්ය. ඇතුළුනුවර පටන් කොට පිටතුවර ඇතිතාක් සැමතැනම යටත් පිරිසෙයින් බත්මුළෙහි පවා සොයවිය'යි කීය. රාජපුරුෂයෝ සොයන්නාහු පංචපාපියගේ ගෙයි සිළු මිණ දැක ඇයගේ මව්පියන් බැඳගෙනාවාහුය. එකල ඇයගේ පියතෙමේ 'දෙවයන්වහන්ස! අපි සොරු නොවමු මේ සිළුමිණ මාගේ දුවනියන්ගේ හිමියා විසින් ගෙනඑය ලදැ'යි කීය. ඔහු

දැන් කොබද'යි විවාළතල 'මම නොදනිමි මාගේ දූ දනීය'යි කියා ඇය විවාළේය. 'පියාණෙනි! මා හිමිතෙමේ අඤ්ඤාර යෙහිම අවුත් අඤ්ඤාරයෙහිම යන්නේය එබැවින් මම ඔහුගේ රූපය නොඇදුනමි අත ස්පර්ශකිරීමෙන් ඔහු හඳුනන්නට හැක්කෙමි'යි කීය. හෙතෙමේ රාජපුරුෂයන්ට එපවත් කීය. රාජ පුරුෂයෝ රජුහට කීහ. රජ්ජුරුවෝ නොදන්නාක්මෙන් එසේවී තම් ඒ සත්‍රිය රජමිදුලෙහි තිරයනින් වටලා තබා අතලන පමණ තිරයෙහි සිදුරක් කොට අත ස්පර්ශකිරීමෙන් සොරු අල්වා ගනිව්ය'යි කීහ. ඔහුතුමූ එසේ කොට මූළුතුවර වැඩියන් රැස්කෙරෙව්වාහුය. ඕනොමෝ අය වුන්ගේ දිහු කොට තිරසිදුරෙන් ඇතුළට ලන අත් අල්වා 'මොහුනොවෙයි මොහුනොමැ'යි කීයයි. මනුෂ්‍යයෝ දිවපහසවැනි ඇගේ ස්පර්ශයෙහි බැඳී 'ඒ මේ සොරතෙමේ යම් දඬුකට සුදුසුද ඒ දඬය අපි ගෙවා නමුත් දස්කම්කරුබවනට පැමිණ නමුත්මැය ගෙන ගොස් ඉඟි තබාගන්නෙමු'යි සිතන්නාහු පහකරන්නට නොහැකිවූහ. එකල රාජපුරුෂයෝ දඬුවලින් තළා ඔවුන් තෙරපා ලූහ. යුවරජආදී සියල්ලෝම උමතුවන්මෙන් වූහ. එක්කිනි රජ්ජුරුවෝ කිමෙක මමවත් වන්නෙම්දෝ හෝයි කියා අත ලූහ. ඕනොමෝ රජුඅතඅල්වා නොමුදුම 'මව්සිඳුන් සොරු අල්වනලද සොරු අල්වනලදු'යි කියා මුරහඬලීය. රජ්ජුරුවෝ සිදුවූ සියලු නතු කියා ඇය අභිෂේක කොට අගමෙහෙසිය කොට ඇගේ මව්පියන්ට බොහෝ ඓශ්වර්‍යයී දී එතැන් පටන් අනික් සත්‍රීන් දෙසවත් නොබැලූහ. ඒ අතින් කුමරියෝ ඇය තෙරෙහි කිපී සිදුරු සෙවූහ. එක්දිනක් ඕ නොමෝ රජුන්දෙදෙනෙක්හට අනමෙහෙසිවන බවට සිහි නෙන් කරුණක් දැක රජහට කීය, එකල ඒ කුමරියෝ එය දැන සුපිනපාඨකයන්ට අත්ලස් දුන්හ, රජුවිසින් විවාළතල ඒ සුපිනපාඨකයෝ "මහරජ්ජුරුවන්වහන්ස! දෙව්යගේ සජී සෙවතඉසහිකඛඬවරගතභාවය නුඹවහන්සේගේ මරණයට පූජිනිමිතෙතක ඉසහිස්ඛඬවරගත ඇගේ සදපිරිමැදීම පස මිතුරුරජුන් විසින් නුඹවහන්සේ ගෙනයන බවට පූජිනිමි පෙනකැ"යි කීහ; දැන් කුමක් කටයුතුදැයි විවාළතල 'දෙවඟන් වහන්ස! මැය මරන්ට නොවටනේය මැය නැවත තබා පා කොට යවන්ට වටනේය,යි කීහ; රජතෙමේ ආහාරපානවසත්‍රා ලඞ්කාරාදිය සමග රාත්‍රිභාගයෙහි ඇය නැවත තබා පාකොට යැවූහ; එකල පාවාරික තෙම් රජෙක්තෙමේ ඝටිගඳදිය කෙළ මින් සිටියේ පාමි ආවාවූ ඇය දැක 'පියාවිඳක් වැනි තී නාවරී

දූ'සි විවාළහ; ඕතොමෝ සිනාකොට තවත් බකරජ්ජුරුවන් ගේ මුළුදඹදිවැ ප්‍රකට පංචපාපී නම් වූ අගමෙහෙසි බව කීය; ඉක්බිති පාවාරිකරජතෙමෙ ඇඟගෙන සපතීරාහගෙන් රත් වූයේ අනික් සත්‍රීන් කෙරෙහි සිතීම් පමණකුත් නොකොට අග මෙහෙසිය කළහ; ඒ අසා බකරජතෙමෙ මම ඇය ඕනට නොදෙනේමියි කියා සියුරහසෙනහ රැගෙන ඔහු ඉදිරිතොටෙහි කඳවුරබැඳ 'මාගේ භාග්‍යවිව හෝ දෙව්ද යුඩ හෝ කරවිදූ'යි හස්නක් යැවූහ; පාවාරිකරජතෙමෙ යුදයට සැරසින; දෙර ජුන්ගේ ඇමතියෝ 'සත්‍රියක් නිසා මරණය අයුතුය පෙරහිඹියා බැවින් ඕතොමෝ බකරජුහටද අයිතිය නැවින් ලබනලද බැවින් පාවාරිකරජුහටද අයිතිය; එබැවින් එතෙකී රජුගේ ගෙහි ඕතොමෝ සන්සත්දින වෙස්වා'යි මන්ත්‍රණය කොට දෙරජුන්හටම දූන්වූවාහුය; ඒ රජහු දෙදෙනම සතුටුවැ හඟ දෙපසැ දෙතොටෙහි සුවරවල් මවා සමගියෙන් විසූහ; එලෙ සම ඕතොමෝ දෙරජුන්හටම දිවිඇතිනාක් මහමෙහෙසිබව කළාය.

මෙතෙකින් පූජාගීයන්වහන්සේලා කෙරෙහි පූජාතොමෝ බොහෝ කලක් මුළුල්ලෙහි හිතසුව එලවන එලඇතිබවට නිදසුන් වශයෙන් ගෙනහැරපෑනලද **කුණාලජාතකවණ්ණනා** යෙහි පංචපාපිවස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

ඝටගීයදවස බරණැස් නුවර එක්ගමෙක එක්තරා **සත්‍රියක්** තොමෝ සියතින් කම්මානන කොට ජීවත්වන්නීය. ඕතොමෝ එක් දිනක් තෙතෙහි පැලවයන්නී අතරමඟැ එක්විලෙකැ අලුයමැ පිපියාවූ පියුමක්දූක ඒ විලටබැස ඒපියුමද විලද බහනු පිණිස පියුම්පතක්ද ගෙන තෙතෙහි හැල්කරල් සිදගෙන කුටි කායෙහි නිදි විලද බැඳ පන්සියයක් ගණන්කළාය. එතෙණෙහි මූලගන්ධාදිසම්පත්තුගන්ධයෙන් ගන්ධිතවූ ගන්ධමාදන පර්වතයෙහි නිරෝධසමාපත්තියෙන් නැගී සිටියාවූ එක්තරා පසේබුදුවරයන්වහන්සේ නමක් එතනට වැඩ ඇට නුදුරුවැ සිටිසේක. ඕතොමෝ උන්වහන්සේ දූකැ විලද සමඟ පියුමගෙන කිළියෙන් බැඳ පසේබුදුරජාණන්වහන්සේගේ පාත්‍රයෙහි විලද බහා පියුමෙන් පාත්‍රය වසා පිළිගන්වා උන්වහන්සේ මදතැන් වැඩිකලැ 'ප්‍රවුජිතයන් වහන්සේලා කම් පියුමෙන් ප්‍රයෝජන ඇත්තෝ කොවෙත් මම පියුම්ගෙන පලදින්නෙමියි සිතා ගොස් උන්වහන්සේගේ පාත්‍රයෙන් පියුමගෙන'ඉදින් ආශ්චර්යයන් වහන්සේපියුමෙන්

වැඩ නොවන්නේ නම් පාත්‍රය මත්තෙහි තබන්ටනොදෙන් නේය එකාන්තයෙන් උන්වහන්සේට ඉන් වැඩෙක් වන්නේ ය'යි තැවත සිතා අනුව ගොස් පියුම පාත්‍රය මතුයෙහි තබා උන්වහන්සේ සමාකරවා 'සාමිනි පසේබුදුවරයන්වහන්ස! මේ විලද පූජානිසංශය හෙතුකොටගෙන විලදගණතායෙන් මට පුත්‍රයෝලැබෙත්වා පියුමගේ ආනිසංශයෙන් උපනුපන් තැන පියවරක් පියවරක් පාසා පියුමක්පැනනැගීවා'යි ප්‍රාර්ථනා කළාය. පසේබුදුරජතෙමේ ඇ බලාහින්දදීම අහසින් ගන්ධමාදනයට වැඩ ඒ පියුම නඳමූලක නම්වූ රන්ලෙනෙහි පසේබුදුවරයන්වහන්සේලා අක්මන හිනිපෙනිමුල පාපිස්නක් කොට තැබූසේක. ඕතොමෝද ඒ ආනිසංශයෙන් දෙවිලොව උපන. උපන් කල්තැන් පටන් ඇයගේ පියක් පියක් පාසා මහපියුම් පැනනැංගුය. ඕතොමෝ ඉන්ඇව පළිතපාදයෙහි එක්පියුම් විලෙක්හි පියුම්ගැබෙකැ උපන. ඒවිල ඇසුරුකොට වසන්නාවූ එක් තාපසයෙක්තෙමේ පාදෙවුන් මුදුදෙවුන් පිණිස විලට ගොස් ඒ පියුම දැකැ 'මේ පියුම සෙසු පියුම්වලට වඩා මහත්ය. සෙසු පියුම් පිපියහ. මෙය මුකුලිතමය. මෙහිලා කරුණෙක් විය යුතුය'යි සිතා විලට බැස ඒ පියුම ගත්තේය. ඒ තවුසා විසින් එයගත්කෙණෙහිම පිපින. තවුස්තෙමේ පියුම් ගැබතුල උපන් ඒ දැරිය දැකැ ධීතාසෙනානය පිළිලැබ පියුම්යම ගම පන්සලට ගෙනගොස් ඇදෙක්හි හෙවිය. ඉක්බිති ඇය ගේ පුණ්‍යානුභාවයෙන් ඒ තවුසාණන්ගේ ඇඟිල්ලෙහි කිරි උපන. හෙතෙමේ ඒ පියුම මැලදී ගියකලැ අනික් අලුත් පියුමක් ගෙනවුත් ඇය හෙවිය. ඉක්බිති ඔබමොබ දිවපැන ඇවිද කෙලනට සමත්කල්තැන් පටන් ඇගේ පියවරක් පියවරක් පාසා පියුමක් පැනනැංගේය. තවුස්තෙමේ එහෙයින් ඇයට 'පදුමවතිය'යි නමක් කෙළේය. යොකුම්රූසක්හුගේ මෙන් ඇය ගේ ශරීරවර්ණය විය. ඕතොමෝ පැමිණි දිව්‍යව ස්ත්‍රීන්ද ඉක්මවනලද මිනිස්වර්ණයක්ද ඇත්තියක් විය. ඇය දැඩ බරණැසරජහුගේ වනචරකයෙක් බරණැසට ගොස් රජුනට එපවත් සැලකෙළේය. ඒ අසා රජ්ජුරුවෝ එහි ගොස් තවුසාණන්වැඳ එකත්පසකැ හිඳ තවුසාණන්ගේ ධීතාව ගෙන එහිදීම කෘත වඤ්ඤරූසක තබා අභිසෙසා කොට සියනුවරට පමුණුවාගත්හ. එතැන් පටන් සෙසු සත්‍රීන්ගේ දෙසවත් නොබලා ඇය සමඟම අභිරමනය කළහ. එම්සංවාසය නිසා ඇයගේ කුසැ දරුගැබක් පිහිටියේය. ගැබමුහුකුරා ගියකල ඇයගේ ගර්භ්‍යුත්තිය විය. මහා

පදුම්කුමාරතෙමේ හුදකලාවම ගැබ්වසූ සේය. අවශෙෂවූ එකුන් පන්සියයක් දරුවෝ එකාගී මහාපදුමකුමාරයා මව්කුසින් නික්ම හොත්කල්හි සංසෙදජවී උපන්හ. ඒ සියල්ලෝම තමන් සොළොස්හැවිරිදිවයස්කල්හි එකතුව මිගුලුඅතෙහි පියුමෙන් ගැවසීගත්හාවූ මිගුල් පොකුණෙහි කෙළහාහු අලුත් පියුම් පිපි ඇවුන් පැරණිපියුම් හැටවෙන් හිඳිහුනවුන් දැක "අනුපාදිසන කවූ නෙවත් නිසොලසිවූ මේ පියුමට පවා මෙබඳුවූ ජරාවක් පැමිණිකල අපගේ ශරීරයට වූකලී කියතුම කවරේද? මේ ශරීරයද මේලෙසම ජරාව ගන්නාලද්දක්ම වන්නේය"යි රූපයන්ගේ උත්පාදව්‍යවස්ථාත්‍රයෙන් මත්තෙහි ජීර්ණවන හඞහා ඉවූඛාවස්ථාවයහි කියතලද ඒ ජරාසඛාවයම අරමුණුකොට ගෙනැ ප්‍රත්‍යක්ෂබොධිය අවබොධකොටැ ආකාශයෙන් තනදු මූලකසව්ණ්ණකුඛාවට වැඩවදුරා එහි වැඩවාසඅකරනසේක්ලා ආයුපරියොසානයෙහි පිරිනිවන් පැවදුළාහුය. පදුමවතී වහාහි ඉන් සැව සසරැ සැරිසරන්නී මේ බුදුසෙමෙහි මහරහත් උපුල්වන් මහාසව්විරියයහි ලොකයෙහි ප්‍රකටවැ ආයුපරියොසානයෙහි පිරිනිවන් පැ වදුළසේකැ.

මේසේ පසේබුදුවරයන්වහන්සේලා කෙරෙහි කරනලද පූජා තොමෝ මහත්ඵල මහානිසංස ඇතිබවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද කුසලයෙහි සිත උත්සාහවත් කරවත අප දුනවණ්ණාදිඅඞඞිවූ පදුමවතී වසතුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

මෙසේ ප්‍රත්‍යෙකබුඞ්ධපූජාතොමෝද පුදන්නවුන්ට
හිතසුව ඵලවන්නීමය.

අතීතයෙහි කාශ්‍යපසම්මාසම්බුදුරජාණන්වහන්සේගේකාලයෙහි එසිකානම් රටෙහි පණණකටනම් නුවරෙහිසත්‍රීහු සතරදෙනෙක් වූහ ඔවුනතුරෙන් එක්සත්‍රියක්තොමෝ එක්දාරා පිණ්ඩවාරිභික්ෂුවක් දැක පහන්සිත්ඇත්තී උන්වහන්සේට කොබලිඳු ඔල්කලඹක් දුන්නීය. එක්සත්‍රියක්තොමෝ එබදුවූම භික්ෂුවක්හට නිලුපුල්මල්කලඹක් දුන්නීය. එක්සත්‍රියක්තොමෝ එබදුවූම භික්ෂුවක්හට පියුම් කලඹක් දුනහිය. එක්සත්‍රියක්තොමෝ එබදුවූම භික්ෂුවක්හට දනතවණ්ණ දෑමන් මල් කැකුළුරැසක් දුන්නීය. මෙසේ ඒ සත්‍රිහු මෙපමණක්ම පින්කම් කොට ආයුඃකල්වර මිය ගොස් තව්තිසා භවනයෙහි ඉපිද මෙනමෙවනම් අප්සරාවන් දහස දහස පිරිවර ඇත්තීවූහ ඒ දෙවඅනාගේ ආයු

පමණින් එහි දිවසිරි විඳ ඒ කර්මයාගේම විපාකාවශේෂයෙන් එතිම ඔබමොබ හැසිරෙන්නීයේ මෙබඳු සෙවකිද එතිම උපන්හ එක්බිනි ආයුෂ්මත්වූ මහාමෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේ දේවචාරිකායෙහි හැසිරෙනසේක් තව්තිසාභවනයට පැමිණ එහි පිළිවෙළින් පිහිටි සතරවිමානයෙහි ඒ දිව්‍යඳුගි තෘන් දැක චතුර්ථවිමානයෙහි කිනසින් ඔවුන්ගේ පූජාකර්ම යන් විචාළේහ. ඒ සත්‍රින්ද උන්වහන්සේට තමතමන් විසින් කරනලද පූජාකර්මය ප්‍රකාශකාලයෙහි ඔවුන්ට අනුපිළිවෙළ කථාව වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවරැ පිරිවරසහිතවැ ඒ සියල්ලෝ සෝවාන් පෙළෙහි පිහිටියාහුහ. මහාමෞද්ගල්‍යායනසථවිරයන්වහන්සේ දෙව්ලොවින් දෙවිරම් වෙහෙරට අවුත් එපවත් සියලුලම භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේට සැලකෙළේය. ඒ සම්මාසම්බුදුරජාණන්වහන්සේ එහෙම අනේකාතපතිකොට සපෙමිණිපිරිසට ධර්මදේශනාකර වදාළසේක. ඒ දේශනාතොමෝ මහාජනයාට සාර්ථකවිය.

පූජාර්හයන්වහන්සේලා කෙරෙහි කරනලද පූජාතොමෝ මහත්ඵල ඇතිවනබවට නිදසුන් වශයෙන් හෙතෙහැරපානලද විමානවර්ණනායෙක් චතුර්ථවර්ගයනුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

රජගහනුවර වනාහි හැල්කෙතක් රක්නා සත්‍රියක්තොමෝ හැල්කරල් කඩාගෙන විලදකොට ජීවත්වන්නීය. රජගහනුවර සමීපයෙහි වනාහි එක්ගුහාවෙක් ඇත්තීහ. ඒ ගුහාවාරසමීපයෙහි එක්තරා පුලිලරුකෙක් ඇතිබැවින් එහ 'පිපඵලිගුහාහ'හි ප්‍රසිද්ධවිය. එහි ආයුෂ්මත්වූ මහාකාශ්‍යපසථවිරයන්වහන්සේ සත් දිනක් නිරෝධසමවතට සමවැද ඉන් නැගී සිව පිඬු පිණිස හැසිරීමට තැනක් දිවසින් බලන්නේ ඒසත්‍රිය දැක කසින් සිවුරු හා අසින් පාත්‍රාදද ගෙන කෙතසමීපයෙහි සිටිසේක. ඔතොමෝ තෙරුන්වහන්සේ දැක පහන්සිත් ඇත්තී තමාසතුවිලද තෙරුන්වහන්සේගේ පාත්‍රයෙහි බහලා "සවාමිනි! මමද නුඹ වහන්සේ විසින් දක්නාලද ධර්මඵලවම හිමිකාරියක් වන්නෙම්"යි ප්‍රාර්ථනා කොට උන්වහන්සේ 'එසේ වේවා'යි කියා වැඩිකල්හි තමන්ගේ විලද පූජාව ආවර්ජනාකරමින් කැමැත්තී කුඹුරසීමා ශෛලි ගමනය කරන මාර්ගයෙහි එක්තරා බිලයකින් නික්මියාවූ

සොරවිෂනාගයෙකු විසින් දෂ්ටකරනලද්දී එසිම වැටී මිය ගොස් තව්තිසා භවනයෙහි දහසක් අපසරාවන්ගෙන් පිරුනාවූ රන්විමනෙහා නිදු පිබිදියාක් මෙන් සමීහරණයෙන් හෙබියාවූ තුන්ගවු පමණවූ ආතමභාවයෙන් ඉපිද දෙලොස් යොදුන් පමණැති එක්දිවවතක් හැඳ එක්දිවවතක් පොරවා පූජාකමීය ප්‍රකාශකරනු පිණිස රන්විලදින් හරිතවූ එල්ලබන රන්ඛබරාවකින් හෙබියාවූ විමානවාරයෙහි සිටියා තමන්ගේ දිවසැපත බලා කිසාම් පුණ්‍යකමීයකින් මෙය ලබනලද දැයි දිවසින් පරීක්ෂාකර බලන්නී මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේව කලවිලඳපූජාගෙනැයි දැනගත්තීය. ඒ දෙව්දු තොමෝ තමන්ගේ සම්පත්තිය තහවුරුකරනු කැමැත්තී අලුයමමැ සවණීමය මුත්තා කසල බැහැරලන යැහැද ගෙනවුත් තෙරුන්වහන්සේගේ පිරිමවහ හැමද පිඟයුතුපැන් හා පරිභොගකටයුතු දියද එලවා තබන්නීය. මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ කිසියම් කොල්ලෙකු විසින් හෝ හෙරමණකුවිසින් හෝ කරතලද්දක්වන් නේශයි සලකා තුන්වනදිනයෙහි දෙරහැර බලන්නේ ඇය දැක "පහවෙව දෙව්දුව! අනාගතකාලයෙහි විසිතුරු විජිනීපත ගෙන හුන් ධර්මාශෝකරජතුමා විසින් 'දෙව්දුවක්තොමෝ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේට වත්පිළිවෙත් කොට පැන්දිය එලවා තැබීල්ලයි මා සඳහා කියයුත්තක් නොකරව මෙතැන් පටන් පෙරලා මෙහි නොමෙල්ලයි කියේය. ඕතොමෝ 'සවාමීනි! මා නොනසනු මැනවැ'යි කැවත නැවතත් යාඥාකළාය.

සථවිරතෙමේ තීගේ පමණ තී නොදනෙහිදැයි කියා අසුර ගැසූයේය. ඕතොමෝ එහි සිටින්නට නොහැකිවන්නී 'සවාමීනි! මේසින් ලබනලද සම්පත්තිය නොනසනුමැනව තහවුරුකරන්නට දුකමැනවැ'යි කියා හඬමින් අහසෙහි සිටියාය. සතරා මරසකලලෝකවාසීන් ජාතිකාන්තාරාදීන් තරණය කොවා අමෘතමහානිර්වාණක්ෂේමභූමියට පමුණුවනසේ අනුකම්පා කරන ශාසනාචාර්යවහන්සේ පන්සාලිස්යොදනකින් මත්තෙහි ජේතවනාරාමයෙහි ඝණ්ඨාශබ්දයෙන් ගන්ධවත්වූ සුගන්ධකුටියෙහි වැඩහුන්සේක්ම ඇයගේ හඬනලද ශබ්දය දිව්‍යශ්‍රොත්‍රවිඥානයෙන් ශ්‍රවණය කොටැ ආලෝකයක් පතුරුවා ඇයගේ ඉදිරියෙහි වැඩහුන්සාක්මෙන් "එඬා දෙව්දුව! මාගේ පුත්‍රවූ කාශ්‍යපතෙරුන්ට සංවර කිරීමම භාරවන්නේය පියන් ත්‍රාසයා ජන ඇත්තවුන්ට වනාහි 'අපට මෙය අවශ්‍ය'යි සලකා පින්කිරී

මම භාරය පින්කිරීම දිව්‍ය මනුෂ්‍යයන උභයලොකයෙහිම සැප ළබවන්නේමයයි" වදාරා ධම්මපියාසෙහි පාපවගීසෙහි මේ ගාථාව වදාළසේක.

"පුඤ්ඤං වෙ පුරිසො කයිරා කයිරාථෙතං පුනපපුනං,
තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයොති.

එහි සංක්ෂෙපඅදහස නම්:-ඉදින් යම්කිසි පුදගලයෙක්තෙ මේ එක්වරක් යම්කිසි පිනක් කරන්නේද ඒ පුදගලතෙමෙ 'මව්හිනි එක්වරක් පින්කරනලද්දේය මෙතෙකින් මට පමණ යැ'සි නොපසුබටවී නැවත නැවතත් එම පින කරන්නේය එය නොකරත කෙණෙහිත් ඒ පිනතෙරෙහි ඡන්දය රුචිය උත්සාහය උපදවන්නේමය ඉහලොකපරලොකදෙක්හිම හිතසුව ළබන බැවින් කුසලයාගේ අභිවෘඩිය සැපවන්නේමය යනුයි.

ගාථාදේශනාවසානයෙහි ඒ දෙව්දූ තොමෝ සොවාන්ඵල යෙහි පිහිටා දෙව්ලෝ ගියාය.

පූජාහියන්වහන්සේලාකෙරෙහි කරනලද පූජාතොමෝ හිතසුව ළබවනබවට නිදහුන් වශයෙන් ගෙනහැර පානලද ධම්මපියාසෙහි පාපවගීසෙහි ලාජාදෙවධීතා වස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

රජගහනුවර වනාහි ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ මිසිලනුවූ එක්තරා බ්‍රාහ්මණයෙක් වාසයකරන්නේය. ඒ බමුණුතෙමේ "යමෙක් තෙමෙ වනාහි මසක්පාසා දහසක් ධනවිය දම් කිරීමෙන් දන්දෙන්නේද නෙතෙමේ බඹලොවන්නේය මෙය බ්‍රහ්මලොකගමනමාර්ගය"යි කියා ආචාර්යත්වයක්හු කෙරෙන් අසා එසේ නිශ්චය නම්ව දන්දුන්නේය, ශාරිපුත්‍රස්ථවිරයන්වහන්සේ එක් දිනක් ඔහුවෙත වැඩමවා එපවත් අසා "බමුණ! නුඹවත් නුඹගේ ආචාර්යත්වයත් බඹලොවට මාර්ගය නොදන්නේය අපගේ ආචාර්යවූ ශාස්තෘන්වහන්සේ පමණක්ම එය දන්නේය එව බමුණ! නුඹට බඹලොවට මාර්ගය කියවන්නෙමි"යි කියා ඔහු ගෙන වේළුවනාරාමයට පිවිස ශාස්තෘන්වහන්සේව එය සැලකෙළේය ඉක්බිති ශාස්තෘන් වහන්සේ "බමුණ! සියක්හවුරුද්දක් මුළුල් ලෙහිත් මේසේ තා දුන් දානයට වඩා මොහොතක් පමණකුත් පින්හිතින් මාගේ ශ්‍රාවකයෙක් දෙස බැලීම හෝ සැන්දක් පමණකුත් හිඳුවා දීම හෝ අතිශයින් මහත්ඵලය"යි බණ වදා

වදරා ශ්‍රාවකපූජාව ප්‍රශංසාකොට වදාරතසේක් ධම්මපදයෙහි සහස්සවග්ගයෙහි මේ ගාථාව ගෙනහැර දක්වා වදාළසේක.

"මාසෙ මාසෙ සහස්සෙන යෝ යජේථ සතං සමං,
එකංව භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ,
සායෙව පූජනා සෙය්‍යෝ යං වෙ වස්සසතං හුත"නති.

මෙහිදු යථාවුත්ත අදහස්ම වන්නේය. ගාථාවසානයෙහි බ්‍රාහ්මණතෙමේ සොවාන්ඵලයෙහි පිහිටියේය. එසේම ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේගේ බුහුනන්ගේ කථාවසානුවද සහායක බ්‍රාහ්මණවසානුවද ගෙනහැර දක්විය යුත්තේය.

මෙසේ පූජාභීන්ගේ වහන්සේලාකෙරෙහි පවත්වනලද පූජාව ප්‍රදාන්තවුන්ට මහත්ඵලවන්නීමය. එසේ ඇතිකල ප්‍රතිපත්තිපූජාව මහත්ඵල මහානිශංස ඇත්තීය යනු කියතුම කවරීද?

යම්හේකින් යම්බදු කුලපුත්‍රයෝ සරණාගමනශික්ෂාපදප්‍රතිග්‍රහණ උපෝසථාඞ්ගසමාදාන යන මෙයින්ද චතුපාරිසුද්ධිශීල සමාදානාදියෙන්ද යන මේ තමන්ගේ ගුණගෙණින් භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ පුදන්ද ඔවුන්ගේ ඒ පූජාඵලය කවරෙක් තුමූ වර්ණනාකෙරෙත්ද නොකෙරෙත්මැයි. ඔහුතුමූ තථාගත යන්වහන්සේ උත්තමපූජායෙන් පූජාකරන්නාහු නමැයි භාග්‍ය වත්වූ බුදුරජාණන්වහන්සේ විසින් වදාරතලද්දාහ. යම් කලෙක්හි වනාහි සඞ්ඝසංඝකාරව්කාරලක්ෂණ නිර්වාණප්‍රඥප්තිය යන පංච විධඥෙය්‍යාවබෝධය කරතලාමලක ක්‍රමයෙන් සම්‍යක් සම්බෝධිසමධිගමකල සර්ව්ඥයන් වහන්සේ නානානය නිපුණ අනෙකාඛ්‍යාශයාමූර්ත්තානාවිධව්‍යඤ්ජනසමපන්න විවිධ ප්‍රාතිභාර්‍යයෙන් යුක්තව ශ්‍රී සඞ්ඝාදේශනාවිලාශයෙන් පන්සාලිස් හවිරුද්දක් මුළුල්ලෙහි සකලබුද්ධකෘත්‍යයන් කොට නිමවා සමස්ත ලෝක ප්‍රශස්තාඛ්‍යාවූ ශ්‍රීමහාබෝධිදුම්මූලයෙහි පෘථිවිසම්භූද්‍යෝ දෙදහස අපරාජිතාසනාභිෂේකාරූඪව සර්ව්මාරවිජය ශාසනාභිවෘද්ධිප්‍රතිලබ්ධසර්ව්ඥතාඥාණය හා සමඟ සකලලෝකහිතසුඛ නිර්වාණප්‍රතිපත්තියෙන් පිරිනිවන්පා වදාරතු පිණිස මල්ලරජදරුවන්ගේ ථූලවූ සල්උයනෙහි උත්තරශීර්ෂකොට පනවනලද මහාපරිනිර්වාණමඤ්චයෙහි වැදහොත්සේක්ද එදවසෙහි දසදහසක් සක්වළ දෙවතාවෝ මෙම සක්වළට රැස්ව දිව්‍යමාලාගන්ධාදියෙන් අපතිල්ලෝගුරුගෞරවයෙන් බුදුරජාණන්වහන්සේ පූජ

කළාහුය. ඉක්බිති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වැදහොත් මේම පෘථිවිතලයෙහි පවත් සක්වළ මුවවිට දක්වාද සක්වළ මුවවිට පවත් බඹලොව දක්වාද රැස්වූ ඇතිනාක් පිරිස විසින් මහොත්සාහයෙන් කරනලද මහාඝත්නාරය දැක මහාපජාපතිගෝතමියෙහි වදළ තැන් ආනන්දස්ථවිරයන්වහන්සේට ඒ සත්කාර දක්වා එසිතුදු තමන්වහන්සේට සත්කාරනොකරනලද බවම දක්වා වදාරනසේක් "න බො ආනන්ද! එතාවතා තථාගතෝ සක්කතෝ හොතිගරුකතෝ පූජිතෝ නාම හොතීති"යි වදළසේක. එහි සංක්ෂේප අදහස තම්—ආනන්දය! මෙපමණකින් හෙවත් මෙසේ කරනලද ආමිසපූජා පමණකින් තථාගතතෙමේ සත්කාරකරනලද්දේත් නොවෙයි ගරුකාර කරනලද්දේත් නොවෙයි බුහුමන් කරනලද්දේත් නොවෙයි පූජා කරනලද්දේත් නොවෙයි එසේහෙයින් මවිසින් මෙය කියනලද්දේය හේ කුමක්ද යත්? ආනන්දය! දීපඞ්කරපාදමූලයෙහි වැදහොත්හාවූ මවිසින් මාලාගන්ධිතූර්‍යගීතාදිසත්කාරාදියක් පිණිස අභිනීහාරකරනලද්දේ නොවෙයි මේ පිණිස පාරමීන් පුරණලද්දාහුත් නොවත් එතෙයින්මම මේ ආමිසපූජායෙන් පුදනලද්දේ නොවෙමි යන මෙයයි. කුමක් හෙයින් භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ අත්තැනෙක එක මුහු නමලක් පමණකුත් ගත බුදුගුණ මෙතෙකිසොට කරනලද පූජාවගේ විපාකය බුඞ්ඝතයක්නුත් පරිවේජද නොකරනලදැයි වණ්ණනාකොට කුමක් හෙයින් මේහි මෙබඳුවූ මහත් පූජාව ප්‍රතික්ෂේප කළසේක්ද? පිරිසට අනුග්‍රහවශයෙන් හා ශාසනයාගේ විරසපිනිය සැමතිහාවයෙන්ද එසේ කළසේක. ඉදින් භාග්‍යවත්වහන්සේ මෙසේ එය ප්‍රතික්ෂේප නොකළසේක්වී නම් අනාගතයෙහි ශීලසමාධ්‍යාදීන් සම්පූර්ණ නොකරන්නාහු විදර්ශනා ගැබ් කොගන්වන්නාහු උපසථාංගකර්ම සමාදන් කරවා පූජාවන්ම කරකර වාසය කරන්නාහුය. මේ ආමිසපූජාව එකඇඳ උගුරක් බොනකලක් පමණකුත් ශාසනය රඳා සිටුවාලන්ට මහඇක්කීමය. මහාවිහාරය වැනි විහාරදහසකුත් රුවන්වැලි මහාසෑය සමානවූ මහාසෑය දහසකුත් ශාසනය ධරන්ට නොහැක්මක්ය. යමෙකුවිසින් එබඳු යමක් කරනලද්දේවී නම් ඒ විපාකය ඔහුට පමණක්ම වන්නේය. සම්‍යක් ප්‍රතිපත්තිය වනාහි ශාස්තෘන්වහන්සේට සුදුසුවූ පූජාව වන්නීය. ඒ ප්‍රතිපත්ති පූජාතෙමෝ වනාහි ශාස්තෘන්වහන්සේ විසින් ප්‍රාර්ථනා කරනලද්දීත් වන්නීය ශාසනය ධරන්ට හැකිත් වන්නීය එහෙ

කින් ආමිසපූජාව ප්‍රතික්ෂේප කොට ප්‍රතිපත්තිපූජාව අනුදැන වදාරන සේක්, "යෝ ඛෝ ආනන්ද මම වා මමසාවකෝ වා තථාගතං වා තථාගතසාවකං වා උද්දිස්ස චේතියං කරෝති සාරීරිකං පූජං උපාදාය අදහන්ති නාම.-ආනන්දය! යම්කිසි මහණෙක් හෝ මෙහෙණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ ධම්මානුධම්මප්‍රතිපන්නයයි කියනලද නවලෝ, නොතන්තර ධම්මයට අනුධම්මවූ ප්‍රතිපදාවෙන් හෙවත් ශීලාචාර ප්‍රඥප්ති ධූතාඞ්ග යන මේ සමාදානයෙන් ගොත්‍රභූඤ්ඤාණය දක්වා, සම්‍යග් ප්‍රතිපදාවෙන් ශ්‍රාවකභාව වාසය නොරේද අනුරූපභාවයෙන් සාමීචි නම්ලද එම ප්‍රතිපදාවෙන්ම යුක්තවේද ඒ ප්‍රතිපදාවම කරන පුරුෂ බැවින් අනුධම්මචාරිභාවයෙන් යුක්තව වෙසේද ඒ මහණතෙමේ උත්තරාසඞ්ගපූජායෙන් තථාගතයන් වහන්සේට සත්කාර කරන්නේ නමුදු ගරුකාර කරන්නේ නමුදු බුහුමන් කරන්නේ නමුදු පූජා කරන්නේ නමුදු වන්නේය. එහෙයින් ආනන්දය! ධම්මානුධම්මප්‍රතිපදාවෙන් යුක්තව වාසය කරන්නෙමුය සාමීචිප්‍රතිපදාවෙන් යුක්තව වාසය කරන්නෙමුය අනුධම්ම චාරිහු වන්නෙමුයයි මෙසේ නොපවසින් ශික්ෂිතයුත්තේය යනුයි.

එහෙයින් ශබ්දවිධවූ අගෞරවයන්හි පිහිටා ශික්ෂාපද ඉක්මවා එක්විසිඅනෙසනයන්ගෙන් දිවිපවත්වන්නාවූ පැවිද්ද ධම්මානුධම්මප්‍රතිපන්නයා නම් නොවෘත්තේය ඒ සියලුම තමහට පණවනලද ශික්ෂාපදයන් සවලපමාත්‍රයකුත් නොමික්මවා දැහැමින් සෙමෙන් ජීවත්වන තැනැත්තේ ධම්මානුධම්මප්‍රතිපදාවට පිළිපන්නේ නම් වන්නේය. ගෘහස්ථයා වනාහි පංචවෛරදස අකුසලකර්මපථයන් කරන්නේ ධම්මානුධම්මප්‍රතිපත්තියට පැමිණියෙක් නොවන්නේය. යමෙක් වනාහි ශරණශීලයන් පරිපූරණය කරන සුලුවේද මසකට අටවරක් පෙහෙවස් සමාදන් වේද දන් දේද ගන්ධපූජා මාලාපූජා කෙරේද මව්පියන් ධාර්මික ශ්‍රමණබ්‍රාහ්මණයන් උපස්ථාන කෙරේද මේතෙමේ ධම්මානුධම්ම ප්‍රතිපන්නයෙහි පිළිපන්නේනම් වන්නේය. යම්හෙ කතවූ 'උත්තරාසඞ්ගපූජාවෙන්'හි වදාරමින් "නිරාමිසපූජා නාම සකෙකානි මම සාසනං සඞ්ගරෙතුං යාව ඒහි ඉමා චතසෝ පරිසා මං ඉමාය පටිපත්තිපූජාය පූජෙසසන්ති තාව මම සාසනං නහෝම්පෙක්ඛි පුණ්ණමනෙවිය විරොචිස්සති"යි යන මේය ගෙන හැරදක්වා වදාළේය.

එහි සංක්ෂේප අදහස නම් නිරාමිසපූජාවම මාගේ ශාසනය ධරන්නට භාරකිවන්නීය යම්තාක්කල් මේ භික්ෂුභික්ෂුණී ආදී සියුපිරිස මේ ප්‍රතිපත්තිපූජායෙන් මා පුදන්ද ඒ තාක් මාගේ ශාසනය නෙහොමධ්‍යයෙහි පූර්ණවස්ත්‍රයාමෙන් බබලන්නේය යනුයි.

මේ පූජෝඝතවූයේ මහාපරිනිර්වාණ
සූත්‍රවර්ණනාක්‍රමය වන්නේය.

මින් පෙරත් භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ප්‍රතිපත්ති පූජාවම ප්‍රශංසාකොට වදාළසේක. එහි මේ මතුකියනලද කථාවස්තුහු වන්නාහුය. යම්දිනෙක්හි භාග්‍යවතුන් වහන්සේ "ඉතෝ භික්ඛවේ! චතුම්මාසච්චයෙන පරිනිබ්බායිස්සාමි,,යි මහණෙනි! මෙතැන් පටන් සාරමසක්හුගේ ඇවෑමෙන් මම පිරිනිවන්පාන්නෙමි,යි වදාවසේක්ද එදින පුහුදු මහණහු කැඳවූ ධරන්ට නොහැකිවූවාහු මුළුමුළුව පියා කුමක්කාරන්නෙමුද කුමක්කරන්නෙමුදැයි සිතන්නාහු ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහිම වාසය කළාහුය. එකල නිස්ස නම්වූ එක්තරා තෙර කෙනෙක් 'ශාස්තෘන්වහන්සේ අදපටන් සාරමසක්හුගේ ඇවෑමෙන් පිරිනිවන්පාවදාරන්නේල මම වනාහි නොරහත්මි ශාස්තෘන්වහන්සේ දිවමන්කල්හිම මවිසින් අර්හත්ඵල ලබන්නට වටනේය'යි සිතා භික්ෂූන්ගේ සමීපයට නොගොස් කිසිවක්හු සමඟ කථාසල්ලාපාදියකුත් නොකොට සතරඉරියව්වෙහිම හුදකලාව වාසය කෙළේය. භික්ෂූන්වහන්සේලා ඒ භික්ෂුවගේ ඒ ක්‍රියාව ශාස්තෘන්වහන්සේට සැලකළාහුය. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂුව කැඳවා විචාරා ඒ කාරණය අසා ඒ මහණහට සාධුකාර දී "මහණෙනි! මාකෙරෙහි යමෙකුගේ සෙනහයක් ඇද්ද හෙතෙමේ නිස්සසථවිරයන් සමානවන්නේය. ගඳමල්ආදියෙන් පුදන්නෝ මා නොපුදන්නෝමය. ධම්මානුධම්මප්‍රතිපත්තියෙහි පිළිපන්නාහුම වනාහි මා පුදන්නෝ නමැ"යි වදාරා ධම්මපියායෙහි සුඛවග්ගයෙහි මේගාථාව වදාළසේක,

"පවිවෙකරසං පිත්වා රසං උපසමස්ස ව,
නිද්දරෝ හොති නිප්පාපෝ ධම්මපීතිරසං පිව"නති.

කායවිවේකය චිත්තවිවේකය යන මේ උභයවිවේකයෙන් උපන්කාවූ සුඛසෞමනස්‍යයයි කියනලද රසයද රාගාදිකෙලෙස ව්‍යුපසමයයි කියනලද නිර්වාණයාගේ රසයද පානය කොට සෝවත් දුඃඛතාපරිඥානාදීන් කෙරෙමින් ආලඹනකරණ

යෙන්ද ප්‍රත්‍යක්ෂකරණයෙන්ද අනුභවකොට තව්තලාභෝ තතරධම්මවශයෙන් උපන්නාවූ ප්‍රීතිරසය පානය කරන්නාවූ ක්ෂීණාශ්‍රවභික්ෂූන්ගේ මේ උභයරසපානයෙන් නිවියාවූ රාගද්වේෂාදීන්ඇති හෙයින් පීඩාරහිතද වන්නේය රාගපාපාදීන්ගේ අභාවයෙන් නිෂ්පාපිද වන්නේහි යනු භාවයි.

ගාථාදේශනාවසානයෙහි තිස්සසථවිරයන් වහන්සේ රාගාදීඝකාල කෙලෙසුන් හොරෙන් දුරුවූ අහිතුඩට පැමිණියේය.

ප්‍රතිපත්තිපූජාවමහත්ඵලමහානිසංසඅඟිවක බවට හිදසුන් වශයෙන් ගෙනහැර පාතලද තිස්සසථවිරයනුව මෙසේ සැකෙවින්දක්වා නිමවතලද්දේය.

අතතදත්ථසථවිරයන් වහන්සේද එසේම සිතා භික්ෂූන්ගේ සමීපයට නොගොස් හුදකළාවූයේ අහිතය පිණිසම පිළිපන්නේය. භික්ෂූන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට ඒ පුවත සැලකළාහුය. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ඒ මහණහටද සාධුකාරදී "යස්ස භික්ඛවෙ! මයි සිනෙහො අත්ථි පෙමං පූජෙත්ථ" යි වදාරා ධම්මපදයෙහි අතතවගීයෙහි මේ ගාථාව දෙශනාකර වදාළසේක.

ඒ පාළියෙහි අදහසද යටකී නයින් දන්නේය.

"අතතදත්ථං පරත්ථෙන බහුනාපි න හාපයෙ,
අතතදත්ථමභිඤ්ඤාය සදත්ථපසුතො සියා" යි.

මේ ලොකයෙහි පුදුගලතෙමේ තුටටුවක් පමණකුදු තමන්ගේ අර්ථය හෙවත් ධනය දහසක් පමණවුවත් අනිකාගේ ධනය හෙතුකොට හෙළ නොපිරිහාලන්නේය. ඝනසථයාවූ කලි තුටටුවක් පමණකිනුත් තමාගේ අර්ථය පිණිස නෙවත් ප්‍රයෝජනය පිණිස කැයුතු දෙයක් හෝ බුදියයුතු දෙයක්හෝ උපදවන්නේය අනුන්ගේ වැඩෙහි නොමඋපදවන්නේය. මේය වනාහි මෙසේ නොකියා කම්සථාන ශීඝ්‍රයෙන් කියතලද්දේය.

එහෙයින් බොහෝදවූ පරාර්ථයට වඩා ආතමාර්ථය නොපිරිහාලන්නේය. අහිත්ථලසංඛ්‍යාත ආතමාර්ථය'මට ආතමාර්ථයනම් මේ ය'යි විශිෂටවූ ඤාණයෙන් දුන අහිත්ථලාධිගමයයි කියන ලද සවාර්ථයෙන් යුකතප්‍රයුකතවන්නේහි. 'මම සවාර්ථය කරන්නෙමි වෙමිදැ'යි මහණවිසින් සලකා ඉවතය්‍යප්‍රතිසංයුකතරණාදි සංඝයාහට උපන් කෘතයයද ආවාසථීවත් උපාධ්‍යායවත් ආගනතුකවත් ගිලන්වත් ආදි වතාවකුදු නොපිරිහාලියයුත්තේය. ආහිසමාචාරිකවත් නොමපුරා ආදිබ්‍රහමචරියපුරන්නේය

ඝනු නැත. ආභිඤ්ඤාවාරිකවත් පුරන මහණහුම ආඝ්‍රීඵලාදීඤවම් පැමිණෙන්නේය. එහෙයින් ආභිඤ්ඤාවාරිකවත් පිරීමද 'සවාඩීනම් වෙයි. යම් මහණෙක් වනාහි අතිඝයින් වඩනලද විදර්ශනා ඇතිව 'අදඅදම රහත්ඵලඝ පඤ්කරන්නෙමි'යි ප්‍රතිවෙධඝ ප්‍රාර්ථනා කෙරමින් වෙසේද ඔහුවිසින් උපාඛ්‍යායවත් ආදිඝ පිරිහෙලානමුදු ආත්මාර්ථඝෙහිම් අතිඝයින් නියුකතවිඝ යුත්තේඝ ඝනු භාවයි.

ශාස්ථාවශානඝෙහි අහනදත්ථසාවිරඝන්වහන්සේද රාගාදී සකලකෙලෙසඝන් නසා අර්හත්ඵලඝෙහි පිහිටියේඝ.

ප්‍රතිපත්තිපූජාව මහත්ඵලමහානිසංඝඇතිබවට නිදසුන් වඝ ඝෙන් ගෙනහැර පාකලද අහනදත්ථසාවිරවසතුව මෙසේ සැකෙවින් දක්වා නිමිවනලද්දේඝ.

මේ පිණිසම් ධම්සිරාඝෙහි භික්ෂුවගීඝෙහි ධම්මාරාමසාවිර ඝන්වහන්සේගේ ශාස්ථාවශානුවද ගෙනහැර දැක්විඝ යුත්තේඝ මෙසේ ප්‍රතිපත්තිපූජාඝතාමේ ධම්මරාජන්වූ ධම්මාධිපතිවූ. ධම්ප්‍රභවිවූ ශාස්තෘන්වහන්සේ විසින් ප්‍රශංසාකරනලද්දීඝහිද, සිඝල්ලව දිඹා උත්කෘෂ්ඨපූජාඝයිද දතයුත්තීඝ.

ඝම්සේ වනාහි ආමිසඝෙන්ම පූදන්නාවූ මහණතෙමේ ධම්මානුධම්මප්‍රතිපත්තිඝෙහි නොපිළිපන්නැනැත්තේ නම් වේද ශාසනඥඝ එසේ නොවන්නේඝ ආමිසඝෙන් පූජාකරන ශාසනඥතෙමේ ධම්මානුධම්මප්‍රතිපත්තිඝෙන් පුදන්නා නම් වෙයි. එහෙයින් මහාපරිනිබ්බාණසූත්‍රවණ්ණනාඝෙහි ධම්මානුධම්මපටිපන්නාධිකාරඝෙහි "දූතං දෙති ගන්ධපූජං මාලාපූජං ච කරොති"යි කියනලද්දේඝ. ශාසනඥඝ වනාහි ආමිසඝ පුදන්නෙක ශාස්තෘන්වහන්සේ විසින් තමනට ඝම් අවවාදඝක් දෙනලද්දේද ආමිසදූතඝ කටයුතුඝ ඝන ඒ අවවාද කරන්නේ නම් වෙයි අවවාදඝ කරන තැනැත්තේද පුදන්නේ නම් වෙයි එහෙයින් ශාසනඥතෙමේ සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ අවවාදානුරූපවූ ආමිසපූජාකරන සංඛ්‍යාතවූ තමන්ගේ ගුණඝෙන් ශාස්තෘන්වහන්සේ පුදන්නේ නම් වන්නේඝ.

මෙසේ ඝමේක්තෙමේ පූර්වොකතවූ බාලපණ්ඩිතඅසෙවන සෙවනඝෙන් පිළිවෙළින් පූජකෙඝ්‍යභාවඝට පැමිණියාවූ උත්කෘෂ්ටවූ බුඩාදීසාතඝන්වහන්සේලා පූජාකෙරේද සත්කාර

කෙරේද ප්‍රශංසාකෙරේද නෙතෙමේ වනාහි හිතයුව බවට පැමිණෙන්නේය. යමෙක්වනාහි ඉන්ද්‍රිපයත්‍රිය පක්ෂපෙතිවූ අසත්පුරුෂයන් පුදද නෙතෙමේ දුකට පැමිණෙන්නේය එහිලා මේ කථාවසතුහු කියනු ලැබෙත්.

එක්දිනක් දෙව්දත්තෙරතෙමේ රජගහනුවර 'සාරිපුත්‍රයාගේ පිරිසය මෞද්ගල්‍යායනයාගේ පිරිසයයි කියා වෙන වෙනම ගණධුර දෙකක්වූහ, මමත් එක් ගණධුරයක් බැහැර කරගන්නෙමි, එහෙත් ලාභසෙන් තොරවැ පිරිසක් උපදවන්නට නොහැකිය එබැවින් මම අජාසත්රජු සමඟ එක්වී ලාභ උපදවන්නෙම්'යි සිතා සාඝභේදකර්මය සෙයින් ආනසින් අජාසත්කුමරහු සාර්ධප්‍රාතිහාර්‍යයෙන්පැහැදවීය. ඒඅජාසත්තෙමේ ඕහට පැහැද අසත්පුරුෂයා සංග්‍රහකොට ඕහට සත්කාර කරනුකැමැත්තේ බොහෝ ධන විත්තදම් කොට ගයාමත්තෙහි විහාරයක් කරවා දිනපතා ථාලිපාකපත්තියයක් බැගින් දුන්හ. උදය සවස දෙව්දත්හට උපස්ථානය පිණිස ද ගියහ ඒ අජාසත් තෙමේ යටකී නයින් දෙව්දත්හුගේ වචනය පිළිගෙන පියා නසා තමන්ගේ සොවාන්මාණීය ලැබීමට තුබුනු හෙතුඋපත් නසා දුකට පැමිණියේය නෙතෙමේම.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුරුකෙ නෙකුන් රාජ්‍යය කරන සමයෙහි බොධිසත්වයන් වහන්සේ බරණැස්නුවර බ්‍රාහ්මණකුලයක ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ගාවාට ගොස් ශිල්පශාස්ත්‍රඉගෙනගන අවුත් බරණැස් නුවර දිසාපාමොක් ආචාරීන්ගේ පන්සියයක් අතවැස්සන්ට අකුරු කරවා විසය කරන්නාහු ඉන් එක් සංජීවක නම් මානවකයෙකුට මලමිනීමන්ත්‍රය පිරුවා දෙවතානුභාවයෙන් උපද්දවා කිහිප අඩියක් ඇවිදිනා පමණට මන්ත්‍රය ඉගැන්වූහ. ළඟට ආකාලට නවහන මන්ත්‍රය නුහැන්වූහ. එසමයෙහි ඒ ශිෂ්‍යයා ඇතුළු පන්සියයක් ශිෂ්‍යයෝ දරව වලව ගියහ. එවිට ව්‍යාඝ්‍රයෙකු මියපියා බිම වැදහොන්නා දැක සෙසු අතවැස්සන්ට කියන්නේ 'මලව්‍යාඝ්‍රයා උපද්දවා දෙම්හයි කීය. ඒ අතවැස්සෝ එනම් දෙයක් කවරකලෙකත් බැරිය'යි කියන්නාහ එසේවී නම් බලවයි කියා මන්ත්‍රය පිරුවන්නට පටන්ගත්හ. සෙසු අතවැසියෝ කවුරු දනිද්දැයි සියා ගස් උඩට නැංගාහ. එතෙම මන්ත්‍රය පිරුවපිරුවා ගල්දැමීය. එවිට ව්‍යාඝ්‍රයා නැගිසිටි මන්ත්‍රය පිරවූ තැනැත්තහුගේ බෙල්ල කඩා මරා තෙමේත් එතනම වැටිනා. සෙසු අතවැස්සෝ දරකඩා ගෙන අවුත් ආචාරීන්ට එපූ

වත් කීහ. එපවත් ඇසූ ආචාරීන් වහන්සේ ශිෂ්‍යයන් ළඟට කැඳවා අසත්පුරුෂයාව සංග්‍රහකරන තැනැත්තේ නම් අයුක්ත ස්ථානයෙහි සත්කාරසම්මානකරන්නේ මෙබඳු දුක් ලබාමයහි කියා දහම් දෙසන්නේ මේ ගාථාව කීහ.

"අසන්තං යෝ පග්ගණ්හාති අසන්තඤ්ච පසේවති,
තමේව ධාසං කුරුතෙ ව්‍යග්ඝා සංජීවකං යථා.

ක්ෂත්‍රියආදී ජාතීන් අතුරෙන් යම්කිසි ගිහියෙක් හෝ පැවිදියෙක් දුශ්චරිතයෙන් යුක්තවූ දුස්සීලවූ අසත්පුරුෂයන්හට යුවරජ සෙනාපතිආදී තනතුරක් හෝ වෙනයම්කිසිවක් හෝ දීම්ආදීන්ගේ වශයෙන්ද පැවිද්දන් පිළිබඳවූ හොත් විවරාදී යම්කිසිවක් දීම් ආදිවශයෙන් හෝ සංග්‍රහකෙරේද සත්කාර සම්මානකෙරේද සෙවනයත් කෙරේද ඒදුස්සීලතෙමේම තමහට සංග්‍රහ කරන්නාහුව සංජීවක නම් මානවකයා විසින් මනා ප්‍රිය පිරිවහ ජීවිතදානයෙන් සංග්‍රහකරනලද ව්‍යාඝ්‍ර තෙමේ තමහට දිවිදුන් සංජීවකයාම විනාශයට පමුණුවාලුවාක්මෙන් වනසන්නේය. එසේම මෙයින් අන්‍යවූද යම්කිසිවෙක්තෙමේ යම්කිසි අසත්පුරුෂයක්හු සංග්‍රහකෙරේද ඒ දුස්සීලඅසත්පුරුෂයා තමහට සංග්‍රහකළතැනැත්තහු විනාශයට පමුණුවන්නේය. මෙසේ අන්‍යතා අසත්පුරුෂයාව සංග්‍රහකරන්නහු විනාශයට පැමිණෙන්නේමය.

අසත්පුරුෂසංග්‍රහයතෙමේ විනාශයට හෙතුවනබව දක්වීමට නිදන් බහයෙහනනේ හැර පාතලද සංජීවකජාතකයෙහි සංජීවකවස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලදී දේය.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජතුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි චම්මඝාටක නම් පිරිවැජියෙක් සිටියේය ඔහුගේ හැදිම් පෙරවීම් සම්මවූයේල ඒ තෙමේ එක්දවසක් පිඬුපිණිස හැසිරෙන්නේ එළුවන් දෙදෙනෙකු පොර ඇතගන්නානැනකට පැමිණියේය ඉන් එක එළුවෙක් ඒ පිරිවැජියා දැක ඔහට පහර දෙනුකැමතිව පසුබැස්සේය පිරිවැජිතෙමේ ඒ දැක එළුවා තමහට සංග්‍රහ කරන පිණිස පසුබසිනියසිතා එතනින් ඉවත්කොට 'මෙතෙක් මිනිසුන්අතර මේ ජාතිසම්පන්න එළුවා පමණක්ම මාගේ ගුණ දනියි එසේහෙයින් මම තොපවඳිමි මමත් උතුම්ජාති ඇති බ්‍රාහ්මණකුලයෙන උපතිමි'යි කියා කියා දෙතොහත් මුදුනෙහි තබා වැඳ සිටියේය. ඒ දැක සල්පිළඟහුන් වෙළඳ සෙට්ටියෙක් බමුණ! ඔහු ඌවා නේ ඇඟිලුලක් දුකීවෙන් විශ්වාසයට තොපැමිණෙව එළුවා පසුබස්නේ දැඩි පන

රක් දෙන්නටයයි විලතාලන නියාමයෙන් කියද්දීත් පිරිවැජියා ඉවත්නොව සිටියේය. එකෙණෙහිම එළුවා වේනයෙන් අවුත් ලෙහි ඇන එහිම හෙලීය. වේදනාවට පැමිණි ඒ පිරිවැජිතෙමේ එහිම හොත්තේ

"එවං සෝ නිහතෝ සෙති යෝ අපූජං පසංසති,
යථාහමජ්ජ පහටෝ හතෝ මෙණ්ඩෙන දුම්මති"නි.

'එළුවා විසින් දැඩිපහරින් ඇන අද මරුමුවට පත්කරනලද අසත්පුරුෂයාට සංග්‍රහකොට සිටියාවූ නුවුවණැති මාගෙරෙන් අනිකුත් යම් ඒ කවුරුනමුත් නොපිදියයුත්තෙක්හට පුදද නොපැසසියයුත්තක්හටපසසාද ඒපුද්ගලයාත් මාමෙන්ම දුක් අනුභවකරන්නේය මරුමුවට පත්වන්නේය'යි වැලපා එතනම මෙලේය. හෙතෙමේද මේ බුඩොත්පාදා කාලයෙහිදු සැවැත්නුවර එනම් ඇත්තාවුම පිරිවැජියෙක්වී එසේම පිළිපදනේ එළුවෙකු විසින් ඇන ජීවිතක්ෂයට පමුණුවාපියයි වදළ සේක.

නොපිදියයුත්තන්ට පිදීම විපතට පමුණුවනබැවි දුක්වී මට ගෙනහැර පානලද චතුක්කනිපාතෂඨ චම්මසාටකජාතක ශෂයෙහි පරිබ්‍රාජකවස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවා ලද්දේය.

එනකාෂඨපූජාහීඛඨා සමාපතයි.

තවද පැවිද්දන් අතුරෙහි අන්තෙවාසිකාදීන්ට ආචාරය උපාඛ්‍යායයෝද සවකයන්ට වැඩිමහල්ලෝද ගෘහස්ථයන්ට සිඟලුම පැවිද්දෝද පූජාහීයෝ නම් වන්නාහ. ගෘහස්ථයන් අතුරෙහි වයසින් බාලයන්ට වැඩිමහලු සොහොවුරුසොහොවුරියෝද පුත්‍ර ධීතෘන්ට මව්පියෝද කුලඥාතීන්ට තමහිමියන් හා සොහොවුරෝද පූජාහීයෝ නම් වන්නාහ. මෙහි පූජාහීයෝ මොවුහුයයි දතයුත්තාහුය.

මෙකියනලද පූජාහීයන්ට කරනලද පූජාතොමෝ කුසල ධර්මසමාදාන හෙයින්ද ආයුආදීන්ගේ වැඩීමට හෙතුවන හෙයින්ද මඞ්ගලවන්නේය.

එහෙයින් චක්‍රවර්තිසූත්‍රයෙහි "තෙ මෙතෙනය්‍යා භවිස්සන්ති පෙතෙනය්‍යා යාමසුයසු බ්‍රහමසුයසු කුලෙජෙඨාපචායිතෙ ඉදං කුසලධම්මං සමාදය වත්තිස්සන්ති තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති"නි සි වදළ සේක.

එහි සංක්ෂෙප අදහසතම්:— මහණෙනි! විශිදනෘයක් හවු රුදුට ආයුඇති මව්පියන්ගේ යම් ඒ පුත්‍රයෝ සතලිස් නව්රුද් දට ආයුඇති මනුෂ්‍යයෝ වෙද්ද ඒ පුත්‍රවූ මනුෂ්‍යයෝ මව කෙරෙහි හිත පිණිස පිළිපන්නෝ පියාකෙරෙහි හිතපිණිස පිළිපන්නෝ මහණබමුණන්කෙරෙහි හිතපිණිස පිළිපන්නෝ තමන්ගේ කුලයෙහි මව්පිය සුලුපිය වැඩිහිටියොහොවුරුආදීවූ වෘඩයන්ට අපවායන විධි හෙවත් යටතත් පැවතුම් ඇත්තෝ වන්නාහුය. ඔහුතුමූ නිරවද්‍යලක්ෂණවූ ඒ කුශලකර්මය සමා දන්ව පැවතීම හෙතුකොටගෙන ආයුෂයෙන්ද වර්ණයෙන්ද වැඩෙන්නාහුය. යනුයි.

සූජනෂ පූජාකථාව සමාදැක්විණි.

මෙසේ මේ ගාථායෙන් බාලයන් සේවනය නොකිරීම් ආදී මඞ්ගලත්‍රයක් කියතලද්දේය. ඒ සියලුලම මේ කරුණෙහි ලා නොහොත් මේලොකයෙහි ප්‍රශාෂාදියට හා සම්පත්තීන්ගේ අභිවෘඞ්ගියට හෙතුවන බැවින් මඞ්ගලෂ යි කියන ලද්දේය. අර්ථකථායෙහි වනාහී බාලඅසෙවනාතොමෝ බාලසෙවන ප්‍රත්‍ය යෙන් නවගත් භයාදීන්කෙරෙන් රැකගැනීමෙන් දෙලොව්හිම හිතහෙතුබැවින්ද පණ්ඩිතසෙවනයද පූජාහීපූජාවද නිර්‍වාණ යට හා සුගතියට හෙතුබැවින්ද මහුලැයි කියතලද්දේය.

මේ ගාථාව පථ්‍යාවක්ත්‍ර නම් වෘත්තයයි.

ශ්‍රීජනමනනන්දනවූ මඞ්ගලසූත්‍රයෙහිමඞ්ගලත්‍රයක් ප්‍රකාශිත ප්‍රථමගාථාවගේ අර්ථවර්ණනාව මෙනෙකින් නිමවන ලද්දේය.

ත්‍රිභුවනජනවන්දනීයවූ මාගේ බුදුරජාණන් වහන්සේ ප්‍රථම ගාථායෙන් මඞ්ගලත්‍රයක් වදාරා මත්තෙහිත් මඞ්ගල වදාරනෂේක් "පතිරූපදෙසවාසොච" යනාදිය වදාළසේක.

එඕ දෙවනාව.

ගාමනගරජනපදාදිමිනිසුන්ගේ වාසයට අවකාශ ඇති දුදුසු ප්‍රදෙශයෙහි වාසයද අතිතජාතීන්හි රැස්කරනලද පින් ආතිඛවද තමන්ගේ සිත මනාසේ පිහිටුවාගැන්මද යන මේ ත්‍රිවිධවූ කර්මය උතුම් මහුලැයි කියා ඛරාගතුයි වදාළසේක. යනු මෙහි සංක්ෂෙප අදහස වත්තේය.

මේ මතුකියනුලබන්නේ මෙහි විස්තරය වන්නේය පතිරූපදෙශවාසය නම්:-යම් දෙශයෙක්හි භික්‍ෂු භික්‍ෂුනී උපාසකඋපාසිකා යන සිඟුපිරිස හැසිරේද දැනදී පුණ්‍යක්‍රිය, වසනුහු පවතින්ද සූත්‍රගෙය්‍යාදී තවාඛ්‍යාසනාශාසනය බබලාද ඒ දෙශයෙහි වාසය සම්‍යක්ත්‍රේ පින්කිරීමට ප්‍රත්‍යය වන හෙයින් මගුලැයි කියනුලැබේ යනුයි එකරුණෙහි ලා මේ කථාවසතුව කියනුලැබේ.

සැවැත්නුවර වතාහි අරිය නම්වූ එක්තරා කෙවුලෙක් වාසය කෙරෙයි. ඒ කෙවුළු දිනක් බිලිබාමින් හිඳිනතල සැවත්නුවර උත්තරගාමවාර නම් ගමැ පිණ්ඩවය්‍යා කොට බික්ඝඟනවිසින්පිරිවරනලදුව එයින් වඩිනානාවූශාස්තෘන්වහන්සේ දැක බිලිපිත්ත අතින් හැරදමා සිටියේය. තිලෝගුරුවූ ශාස්තෘන්වහන්සේ ඔහට නුදුරුතන්හි නැවති වදාරා තෝ කිනම්ද? තෝ කිනම්දැ?යි සැරියුත්ආදීශ්‍රාවකයන්වහන්සේලා අතින් විවාළසේක. ඒ ශ්‍රාවකයන්වහන්සේලාද ''මම ශාරිපුත්‍රය මම මොග්ගල්ලාන''යයි යනාදී වශයෙන් තමතමන්ගේ නාමයන් කිවාහුය. කෙවුළා'ශාස්තෘන්වහන්සේ සියල්ලන්ගේ නම් විවාරයි දැන් මාගේද නම විචාරන්නේය'යි සිතමින් සිටියේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ සිත දැන ''උපාසකය තෝ කිනම්දැ''යි විවාළසේක. 'සවාමීනි, මම අරිය නමැයි කියැ. එකල ඔබට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ''උපාසකය! තාවැනිවූ ප්‍රාණඝාතාදී අකුසලකම් කරන්නෝ අරිය නම් නොවන්නාහ ආර්‍ය්‍යයෝ නම් සත්ත්වහිංසා නොකරනහා වයෙහි පිහිටියාහුය''යි වදාරා දහම් දෙසනසේක් ධම්මපියාසූත්‍රයෙහි ධම්මඤ්ඤවග්ගයෙහි මේ ගාථාව වදාළසේක.

''න තෙන අරියෝ හොති යෙන පාණානි හිංසති,
අහිංසා සබ්බපාණානං අරියොති පවුච්චති''නි.

යම් පුද්ගලයෙක් තෙමේ යම්හේකින් ප්‍රාණවධ කරන්නේද ඒ කාරණය කරණතොටගෙන ආර්‍ය්‍ය නම් නොවන්නේය. කුමකින් ආර්‍ය්‍ය නම් වන්නේද යත්? සියලු ප්‍රාණීන් කෙරෙහි අහිංසාසංඛ්‍යාත විත්තසංකල්පනා ඇත්තේනම් ඒ කාරණයෙන් ආර්‍ය්‍ය නම් වන්නේයයි වදාළසේක.

ශාස්තෘදෙශනාවසානයෙහි කෙවුළු සොවාන්ඵලයෙහි පිහිටියේය. මෙසේ ඔහුගේ සුදුසුප්‍රදෙශයෙහි වාසය ශ්‍රවණමය පුණ්‍යක්‍රියාවසතුවට ප්‍රත්‍යයවූ හෙයින් මඟුල නම් වන්නේය.

පතිරූපදෙසවාසය මගුල්බව දැක්වීමට නිදසුන් වශයෙන් ගෙනහැර දානලද කෙවට්ටවත්‍රුව මෙසේ ඇතෙමින් දක්වා, නිමවන ලද්දේය.

තවද පතිරූපදෙසවාසය නම්:—යම් තැනෙක සපරිවාර මාරපරාජය කොට සම්බුද්ධඥානය අවබෝධකොට බුදුවූ භාග්‍යවතුන් වහන්සේලාගේ හා කොණ්ඩඤ්ඤදී පස්වග මහණුන්වහන්සේලාගේ හමුයෙහි ධම්මචක්‍රය පවත්නා සක්‍රළ ප්‍රදේශය දෙලොස්යොදුනක් තැන පිරිසිදු පිරිස්මඬ්‍යයෙහි සිටුලු තීර්ථකයන්ගේ මදවිද යමකප්‍රාතිහාර්‍යය දක්වනලද භණ්ඩබබවෘක්ෂමූලය පිහිටි ප්‍රදේශය දෙවොරොහණ ප්‍රදේශය යන මේ පිහිටියේද එහිවාසය සත්වයන්ට සානුත්තරිය කුසලකර්මප්‍රතිලාභයට ප්‍රත්‍යය වනහෙයින් මගුල්නම්වන්නේය.

අනුත්තරියයෝ නම් කවරහ?යත්, මෙයින් අන්‍යවූ උත්තරි තරකුසලකර්මයක්හු නැතිබැවින් නිරුත්තරවූ රූපදර්ශනාදීහු වන්නාහුය.

"ඉධ භික්ඛවෙ! එකච්චෝ හත්ථිරතනම්පි දස්සනාය ගච්ඡති අස්සරතනම්පි...පෙ...අනිපපඤ්ඤෝ, ඉදං වුච්චති භික්ඛවෙ අනුස්සරිතානුත්තරිය"නති-සි.

මෙසේ ජාතකඛුත්තරයෙහි අනුත්තරිය සූත්‍රයෙහි කී නයින් දතයුත්තාහුය. අර්ථනථානයින් කියනලද එහි සංක්ෂෙප අදහසනම්:—

මහණෙනි! මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්තෙමේ ඇත්රුවනක්හෝ අස්රුවනක් හෝ මිණිරුවනක්හෝ දැකීමට යන්නේය මහත්වූ හෝ කුඩාවූ හෝ උස්වූ හෝ මිටිවූ හෝ යම් කිසි රූපයක් දැකීමට යන්නේය මිත්‍යාදෘෂ්ටිකවූ මිත්‍යාලෙස පිළිපන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් දැකීමට යන්නේය යන මේ කාරණයක් ඇත්තේයයි කියමි මෙය නැත්තේයයි නොකියමි, මහණෙනි! ඒ මේ දැකීමවනාහි ලාමකය ග්‍රාම්‍යය සෙවත් ගම්මැසියන් සතුය පෘථග්ජනයන් සතුය අනාර්‍යය සෙවත් ආර්‍යයන් නොපිළිබඳය අනුත්තරය අපරිසිදුය අනර්‍ථ සම්හිතය වුතදුඃඛයෙහි කලකිරීම පිණිස රාගාදීන්ගේ නොඇලීම පිණිස රාගාදීන්ගේම නොපැවැත්ම කිරීම පිණිස රාගාදීන්ගේම ව්‍යුපසමය පිණිස දුක්ඛාදීවතුස්සත්‍යාවබෝධය පිණිය සම්‍යක්සම්බෝධිසංඛ්‍යාත අතරමාර්ගඥානයාගේ ප්‍රතිවෙදය පිණිය

නිම්‍රාණධම්ම සාක්ඛිකරම පිණිස නොපවත්නේය, මහණෙනි! සම්පුඛලයෙක්නෙමේ මහාඝ පිහිටි ශ්‍රද්ධාව ඇත්තේ පිහිටි ප්‍රේමය ඇත්තේ එකාන්තගතවූයේ අවලශ්‍රද්ධා ඇත්තේ අනිශයින් පහන්වූයේ තථාගතයන් වහන්සේ හෝ තථාගතශ්‍රාවක යන්වහන්සේ නමක් හෝ දැකීමට යන්නේද මහණෙනි! දැකීම් අතුරෙන් මේ දැකීම උත්තරිතරයි කෙවත් අනිශයින් උතුම්ය සත්වයන්ගේ සොලෙසුන්ගේ අභාවයෙන් වත විශෙෂසුඛ යට පැමිණීම පිණිස ද ශොකයාගේ හා පරිදෙවයාගේ අස්තාඛ මය පිණිස කෙවත් බැහැයාම පිණිස විදර්ශනාසහිත මාර්ගයාගේ අධිගමය පිණිස අපවයනිර්ඛාණයාගේ සාක්කිරීම පිණිස පවත් නේය. මහණෙනි! මේ දස්සනානුත්තරියයි කියනුලැබෙයි.

මහණෙනි! මේලොකයෙහි ඇතැම්පුද්ගලයෙක්නෙමේ බෙර හඬක් ඇසීමට හෝ යන්නේය විණානාදයක් ඇසීමට හෝ යන්නේය වෙනයම් කුදුවිහත්ශබ්දයක් ඇසීමට හෝ යන්නේය මිත්‍යාදෘෂ්ටිකවූ මිත්‍යාප්‍රතිපත්තියෙන් යුක්තවූ ශ්‍රමණයකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ ධර්මශ්‍රවණය පිණිස යන්නේය යන මේ ශ්‍රවණය මහණෙනි! ඇත්තේමය, නැත්තේයයි නොකියම්. මහණෙනි! ඒ ශ්‍රවණය වනාහි ලාමකය පෘතග්ජනිර්ඛාණය සාක්කිරීම පිණිස නොවන්නේය. මහණෙනි! මේලොකයෙහි යමෙක් වනාහි පිහිටි ශ්‍රද්ධාව ඇත්තේ පිහිටි ප්‍රේමය ඇත්තේ අවල ශ්‍රද්ධාව ඇත්තේ අනිශයින් පහන්වූයේ තථාගතයන් වහන්සේ කෙනෙකුන්ගේ හෝ තථාගතශ්‍රාවකයන් වහන්සේ කෙනෙ කුන්ගේ හෝ ධර්මශ්‍රවණය පිණිස යන්නේද මහණෙනි! මෙය ශ්‍රවණයන් අතුරෙන් උත්තරිතරයි, සත්වයන්ගේ විසුද්ධිය පැමි ණීම පිණිස පෘතග්ජනිර්ඛාණය පසක්කිරීම පිණිස පවත්නේය. මහණෙනි! මෙය සවණානුත්තරියයි කියනුලැබේ.

මහණෙනි! මේලොකයෙහි ඇතැම්පුද්ගලයෙක්නෙමේ පුත්‍ර ලාභය ද ලබයි හඹුවන් ලාභයද ලබයි ධන ලාභය ද ලබයි මෙහින් අනිත් කුදුමහත් ලාභ ද ලබයි මිත්‍යාදෘෂ්ටිකවූ මිත්‍යාපිළිවෙතෙහි පිළිපන්නාවූ ශ්‍රමණයෙක්නෙමෙහි හෝ බ්‍රාහ්මණයෙක්නෙමෙහි හෝ ශ්‍රද්ධාව පිළිලබයි මහණෙනි! මෙම්ලාභය ඇත්තේමය, මෙය නැතැයි නොකියම්. මහණෙනි! ඒ ලාභය වනාහි ලාමකය පෘතග්ජනිර්ඛාණය සාක්කිරීම පිණිස ද නොපවත්නේය. මහණෙනි! යමෙක්නෙමේ වනාහි පිහිටි ශ්‍රද්ධාව ඇත්තේ පෘතග්ජනතථාගතයන් වහන්සේ කෙනෙහි හෝ තථාගතශ්‍රාවකයන් වහන්සේ කෙනෙහි

හෝ පෙ ශ්‍රද්ධාව පිළිලබාද මහණෙනි! ලාභයන් අතුරෙන් මෙය උත්තරිතරයි. මහණෙනි! මෙය ලාභානුත්තරිය යි කියනු ලැබේ.

මහණෙනි! මේලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්තෙමේ ඇතුන් නිමිත්තකොට ඉගෙනගත යුතුවූ හස්තිශිල්පයද ඉගෙනගනී අශ්වශිල්පයද ඉගෙනගනී රථශිල්පයද ආවුධශිල්පයද අනිකුත් කුදුමහත් ශිල්පද ඉගෙනගනී මිථ්‍යාදෘෂ්ටිකවූ මිථ්‍යාප්‍රතිපත්ති ඇත්තාවූ ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ භික්ෂුවක් ඉගෙනගනීද මහණෙනි මේ ඉගෙනීම ඇත්තේය, මේ ඉගෙනීම නැත්තේයයි නොකියමි. මහණෙනි! ඒ මේ භික්ෂු තොමෝ ලාමකයෙ පෙ නිවන් පිණිස නොපවත්නේය. මහණෙනි! යමෙක්තෙමේ වනාහි පිහිටි ශ්‍රද්ධාඇත්තේ පිහිටි ප්‍රේමය ඇත්තේ අවලශ්‍රද්ධාවඇත්තේ තථාගතයන්වහන්සේ විසින් ප්‍රකාශකරනලද ශාසනයෙහි අධිශීලශික්ෂාවෙන් භික්ෂු මේද අධිචිත්තශික්ෂාවෙන්භික්ෂුමේද අධිප්‍රඥාශික්ෂාවෙන් භික්ෂු මේද මහණෙනි! ශික්ෂාවන් අතුරෙන් මෙය උත්තරිතරයි, සම්බුද්ධයන්ගේ පරිසුද්ධත්වයට පැමිණීම පිණිස පෙ නිවන් සාක්ෂාත් කිරීම පිණිස පවත්නේය. මහණෙනි! මේ සික්ඛානුත්තරිය යි කියනු ලැබේ.

මහණෙනි! මේ ලොකයෙහි ඇතැම්පුද්ගලයෙක්තෙමේ ක්ෂත්‍රියයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ ගෘහපතියෙකු හෝ පරිවරණය කෙරෙයි හෙවත් වතාවත් කෙරේද අනිකුත් කුදුමහත් කාරණා තමුන්ත් පරිවරණය කෙරෙයි මිථ්‍යාදෘෂ්ටිකවූ මිථ්‍යාප්‍රතිපත්තියෙහි පිළිපන්නාවූ මහණෙකු හෝ බමුණෙකු හෝ පරිවරණය කෙරෙයි මහණෙනි! මෙබඳු පරිවරණයක් ඇත්තේය මේ පරිවරණය නැත්තේයයි නොකියමි. මහණෙනි! ඒ පාරිවරියානොමෝ හෙවත් ඒවතාවත්තොමෝ වනාහි ලාමකය පෙ නිවන් පිණිස නොපවත්නේය.

මහණෙනි! යමෙක් වනාහි පිහිටි ශ්‍රද්ධාඇත්තේ පිහිටි ප්‍රේමය ඇත්තේ අවලශ්‍රද්ධාඇත්තේ තථාගතයන්වහන්සේ කෙනෙක් හෝ තථාගතශ්‍රාවකයන්වහන්සේ නමක් හෝ පරිවරණය කෙරේද මහණෙනි! පාරිවරියාවන් අතුරෙන් මෙය උත්තරිතරයි, සම්බුදුරජාණන්වහන්සේ විසුද්ධිය පිණිස පෙ නිවන් පැමිණීම පිණිස පවත්නේය. මහණෙනි! මේ පාරිවරියානුත්තරිය යි කියනු ලැබේ.

මහණෙනි! කවි ලොකයෙහි ඇතැම්පුද්ගලයෙක් තෙමේ පුතුද සිඟිතෙරෙහි හඹුද සිඟිතෙරෙහි ධනද සිඟිතෙරෙහි උපන් කුත් කදම්බත් දෙයක් හෝ සිඟිතෙරෙහි මිථ්‍යාදෘෂ්ටිකවූ මිථ්‍යාප්‍රතිපන්නියෙහි පිළිපන්නාවූ මහණෙකුගෙන් බුදුණෙකු හෝ සිඟිතෙරෙහි මහණෙනි! මේ සිඟිසිරීමතොමෝ ඇත්තීය වෙයි. තොමෝ නැත්තීයයි නොමකියමි. මහණෙනි! ඒ අනුස්සතීතොමෝ වනාහි ලාමකයන් දෙනිවන් පිණිස නොපවත්නීය. මහණෙනි! යමෙක්තෙමේ වනාහි පිහිටි ශ්‍රද්ධාඇත්තේ පිහිටි පෙමය ඇත්තේ අවලශ්‍රද්ධා ඇත්තේ තථාගතකෙනෙක් හෝ තථාගතශ්‍රාවකකෙනෙක් හෝ සිඟිතෙරේද මහණෙනි! අනුස්සතීන් අතරෙන් මේ අනුස්සතීතොමෝ උත්තරිතරයි කවත් අනිශයින් උත්තෘෂ්ඨයි. මහණෙනි! මෙකියතලද්දේ අනුස්සතානුත්තරියයි කියනුලැබේ. යනුයි.

පිහිටි ශ්‍රද්ධාඇත්තහුගේ වනාහි භාග්‍යවතාණන්වහන්සේගේ හෝ බික්ෂුසඟනගේ කෂිණගේ අසුභනිමිත්තනය යනාදීන් අතුරෙන් එක්තරා එකක්හුගේ හෝ දැකීම දස්සනානුත්තරිය නම් වේ, හත්ථිරතනාදීන්ගේ දැකීම දස්සනානුත්තරිය නොවන්නේය.

බුබාදීරතනතයෙහි ගුණකථාවගේ හා ත්‍රිපිටකබුද්ධවචනයාගේ ඇසීම සවණානුත්තරිය නම් වන්නේය, ක්ෂත්‍රියාදීන්ගේ ගුණකථාශ්‍රවණය ශ්‍රවණානුත්තරිය නොවන්නේය.

සප්තවිධ ආර්‍යධන ලාභය ලාභානුත්තරිය නම් වන්නේයා මණිරතනාදීන්ගේ ලාභය ලාභානුත්තරිය නොවන්නේය.

ත්‍රිවිධ ශික්ෂාවන්ගේ පූර්ණත්වයම සික්ඛානුත්තරිය නම් වන්නේය, හත්ථිශිල්පාදීන්ගේ ශික්මීම සික්ඛානුත්තරිය නොවන්නේය.

රතනත්‍රය විෂයෙහි කරනලද වතාවතම පාරිචරියානුත්තරිය නම් වන්නේය, ක්ෂත්‍රියාදීන්කෙරෙහි කරනලද වතාවත පාරිචරියානුත්තරිය නොවන්නේය.

රතනත්‍රයාගේ ගුණසිඟිසිරීමම අනුස්සතානුත්තරිය නම් වන්නේය, ක්ෂත්‍රියාදීන්ගේ ගුණසිඟිසිරීම අනුස්සතානුත්තරිය නොවන්නේය යනු එහි වණ්ණනාක්‍රමයයි.

ධම්මභණ්ඩාගාරිකවූ ආනන්දස්ථවිරයන් වහන්සේ උදයභවය චක්ෂුර්විඥානයෙන් භාග්‍යවතාණන්වහන්සේ දකින්නට ලබයි. මෙය දස්සනානුත්තරිය නම් වන්නේය. නිතර භාග්‍යවතාණන් වහන්

සේගේ බුඩවචනය ශ්‍රවණය කරන්නට ලැබේ. මෙය සවණානුත්තරිය නම් වන්නේය. භාග්‍යවත්තෙමේ සම්‍යක්සම්බුඩයයි ශ්‍රඩාව පිළිලැබේ. මෙය ලාභානුත්තරිය නම් වන්නේය. ශාස්තෘ ශාසනයෙහි ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නේය. මෙය සික්ඛානුත්තරිය නම්වන්නේය. නිතර ශාස්තෘන් වහන්සේට වතාවත් කෙරේ. මෙය පාරිචරියානුත්තරිය නම් වන්නේය. ශාස්තෘන් වහන්සේගේ ලෞකිකලෝකොත්තර ගුණ සිහිකෙරේ. මේ අනුස්සනානුත්තරිය නම් වන්නේය.

අනිකුදු සොවාන් ඵලදෘගාමී අනාගාමීහුද ආනන්දස්ථවිර යන්වහන්සේ මෙන්ම ශාස්තෘන් වහන්සේගේ දැකීම ලබත් ශාස්තෘන් වහන්සේගේ වචනය ශ්‍රවණය කරන්නට ලබත් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ශ්‍රඩාව පිළිලැබත් ශාස්තෘන් වහන්සේගේ ශාසනයෙහි ත්‍රිවිධශික්ෂාවෙහි හික්මෙත් ශාස්තෘන් වහන්සේට වතාවත් කෙරෙත් ශාස්තෘන් වහන්සේගේ ලෞකිකලෝකොත්තරගුණ සිහිකෙරෙත්. මෙයද දස්සනානුත්තරිය නමුදු සවණානුත්තරිය නමුදු ලාභානුත්තරිය නමුදු සික්ඛානුත්තරිය නමුදු පාරිචරියානුත්තරිය නමුදු අනුස්සනානුත්තරිය නමුදු වන්නේය.

කල්‍යාණපෘථජ්ජනයා වතාහි ආනන්දස්ථවිරයන් වහන්සේ මෙන් ප්‍රසාදභාවමෙත්තාපූජීකවූ ශාස්තෘදර්ශනය ලැබ ශාස්තෘ වචනය ඇසීමද ලැබ උන්වහන්සේ කෙරෙහි ශ්‍රඩාව පිළිලැබ ශාස්තෘශාසනයෙහි ශික්ෂාත්‍රයයෙහි හික්ම ශාස්තෘන් වහන්සේට උපස්ථානකොට දැසනමුඛයෙන් පැවතියාවූ විදර්ශනාව වඩා දර්ශනමුඛයෙන් අනුලෝමඤාණය දක්වා විදර්ශනඤාණයද වඩා ඊට අනතුරුව අවවැනි භූමියට බැසගන්නේ දර්ශනය ලැබ මාර්ගඵලට පැමිණෙන්නේ නම් වෙයි, එතැන් පටන් පැවති දර්ශනය දර්ශනම නම් වන්නේය. මූලදර්ශනය සත්‍යදර්ශනයටද කාරණාවනාහෙයින් දස්සනානුත්තරිය නම් වන්නේය. සෙස්සද මෙම නයින් දතයුත්තේය.

සැවැත්නුවර වතාහි වක්කලී නම්වූ එක්තරා බ්‍රාහ්මණයෙක් වාසය කෙරේ. ඒ බමුණා එක්දිනක් සැවැත්නුවර පිණ්ඩචාරීයෙහි වඩින්නාවූ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේගේ අශීත්‍යානුව්‍යඤ්ජනබ්‍යාමප්‍රභාකේතුමණ්ඩලාදියෙන් ප්‍රතිමණ්ඩිතවූ දෙඅසිරිරූපදර්ශනයෙන් තෘප්තියට නොපැමිණියේ ශාස්තෘන් වහන්සේ දැක උන්වහන්සේ සමඟම දෙවරමට මහාස් බණ අසා

ලබ්භලද ශ්‍රද්ධාඇතිව "මව මෙසේ නිතර බුදුරජාණන්වහන්සේ දක්නට ලබ්මිය"යි ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි පැවිදිව අතර බුදිනකාලය පමණක් හැර සෙසු කාලයෙහි යම්තැනක ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දක්නට ලැබේද එතැන සිවිසේ හැදෑරීම් කමටහන් මෙනෙහි කිරීම් ආදිය කැර බුදුරජාණන් වහන්සේ බලමින්ම වාසය කෙරෙහි. තිලොක තිලකාභමානවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඔහුගේ නුවණ මිහිකිරිම බලාපොරොත්තුවෙමින් බොහෝ කලක් කිසිවක් නොවදරා නුවණ මුහුතුරානියකෙණි "එඛ, වකකලිය! මේ කුණුකය දැකීමෙන් තට කිතම් වැඩෙක්ද? වකකලිය! යමෙක් තෙමේ ධම්මය දකිද හෙතෙමේ මා දක්නේය, යමෙක් ධම්මය නොදකිද හෙතෙමේ මා නොදක්නේය, වකකලිය! ධම්මය වනාහි දක්නා තැනැත්තේ මා දකී? මා දක්නා තැනැත්තේ ධම්මයදකියි"යි වදරා වස් එලඹ සිටිකල රජගහනුවරට වැඩ වස් එලඹෙන දිනෙහි "වකකලිය! පහවෙවයි වදරා අස්කෙළේය. හේතෙමේ සිටින්ට නොහැකිව 'යම්බදුවූ මම ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දක්නට නොලබම් නම් ඒ මාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනද? පවිතයකින් පැන දිවි නසා ගනිම්"යි සිතා ගිජුකුළුනැගීගත්තේය. බුදුරජාණන්වහන්සේ ඒ දැන වදරා "මෙතෙම මා වෙතින් අස්වැසීමක් නොලබන්නේ මාගී ඵල ලැබීමට තුබූ හෙතුසම්පත් නසන්නේය"යිද දැන වෙළුවනාරාමයෙහි වැඩහුන්සේක්ම ආලෝකයක් පතුරුවා තමන් වහන්සේ දක්වා ඕනට බලවත් ප්‍රීතියක් උපදවමින් ධම්පියාවෙහි හිකඛුවගීයෙහි මේ ගාථාව වදළසේක.

"පාමොජ්ජබහුලෝ භිකඛු පසන්නබුඛසාසනෙ,
අධිගච්ඡ පදං සන්තං සංඛාරූපසමං සුඛ"නති.

පියෙව්ගෙන්ම බුදුන්කෙරෙහි සාසනාභබහුලකොට ඇත්තාවූ බුදුන්ගේ අනුශාසනාගෙහි ප්‍රසන්නවූ මහණතෙමේ සියලුසංස්කාරයන් සන්සිඳුවන්නාවූ එකෙහින්ම එකාන්තසුවවූ අත්‍යන්තශාන්තවූ නිර්ඛාණයට පැමිණෙන්නේය යනු එහි අදහසයි.

මෙසේද වදරා වහාහි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ විදසුලුතාවක් බදුවූ දක්ඛිණශ්‍රීඛසාය දිගුකොට "වකකලිය! මේහි එව නොබව"යි වදළසේක. ඒ වකකලි නම් සඛවිර තෙමේ "මව්හින් ශාස්තෘන්වහන්සේ දක්නාලද්දේය එව යනු

අඩගැසීමද ලබතලදු"යි කියා බලවත් ප්‍රීතියත් උපදවා කොඳිබින් යන්නෙම්දැයි තමන් යනබව පමණකුත් නොදැනම බුදුන්හමුව අහසින් දිවගොස් ප්‍රථමපාදයෙන් පර්වතයෙහි සිරියේම ශාස්තෘන්වහන්සේ විසින් වදුරතලද ගාථාව ආවර්ජනාකරන්නේ ආකාශයෙහිදීම ප්‍රීතිය විච්ඡේදනය නොවී සිව් පිළිසිඹියාවන් සහිත රහන්හාවයට පැමිණ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ වඳිමින්ම බැස්සේය.

බුද්ධසාසනාදිය දායනානුත්තරියඤ්ඵලතෙජිතවත බවට නිදසුන් වශයෙන් ගෙඹහැර පානලද වක්කලිතාපසවස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවතලද්දේය.

මෙසේ උන්වහන්සේගේ බුබාදී තුනුරුවන් වාෂයතරත දෙනයෙහි වාසය කිරීමතෙමේ ශාස්තෘන්වහන්සේගේ රූපදර්ශනසඞ්ඛ්‍යාත දායනානුත්තරියය, ශාස්තෘන්වහන්සේගේ සඛම්ශ්‍රවණසංඛ්‍යාත සවණානුත්තරියය, ශාස්තෘන්වහන්සේ කෙරෙහි ශ්‍රඛාපිළිලාබීම්සංඛ්‍යාත ලාභානුත්තරියය, ශික්ෂාත්‍රය පිරිමිසංඛ්‍යාත සික්ඛානුත්තරියය, ශාස්තෘන්වහන්සේට වඩාවත් කිරීම්සංඛ්‍යාතවූ පාරිචරියානුත්තරියය, ශාස්තෘන්වහන්සේගේ ගුණානුස්මරණසංඛ්‍යාත අනුස්සතානුත්තරියය, යන ඡානුත්තරිය ධර්මයන්ගේ පිළිලැබීමට ප්‍රත්‍යය වූයේය.

වැලිදු පකිරූපදේශවාසයනම්:-පූර්වදිශාභාගයෙහි කජංගල නම් නියම් ගමය ඊට බටහිර මහාසාලා නම් ගමය එතැන්පටන් ප්‍රත්‍යන්තජනපදයෝය, අග්නිදිශාභාගයෙහි සලලවතීනම් ගඟ ඉන්මත්තෙහි ප්‍රත්‍යන්තජනපදයෝය, දකුණුදිශාභාගයෙහි සෙවනකණ්ණිකා නම් නියම්ගමය ඉන් මත්තෙහි ප්‍රත්‍යන්තජනපදයෝය, පශ්චිමදිශාභාගයෙහි ථූන නම්වූ බ්‍රාහ්මණගමය ඉන් මත්තෙහි ප්‍රත්‍යන්තජනපදයෝය, උත්තරදිශාභාගයෙහි උසීරධවජ නම්වූ පර්වතය ඉන් මත්තෙහි ප්‍රත්‍යන්තජනපදයෝය යන මෙසේ මේ සීමාවන්ගේ මධ්‍යයෙහි චතුරඞ්ගසමන්විත පිරිසිඳිනා ලද්දේ මධ්‍යමදේශ නම්වූ ජනපදය වන්නේය. එකන්තඛුත්තරවණ්ණනායෙහිද එම පාළිය දක්වා මේ ජනපදය මිහිතුබෙරයකටබඳු සටහන් ඇත්තේය කෙලින් කිහිතැනෙක්හි අසූයොදුනක් විය කිහිතැනෙක්හි හියක්යොදනක කිහිතැනෙක දෙසියයක් යොදනෙක මැදවනාහි තුන්සියයක් යොදනෙක වවින් තුවසියයක් යොදනෙකැයි කියනලද්දේය. ඒ මධ්‍යමදේශයෙහි අසීඥුඉුදුවරයන් වහන්සේලාය ප්‍රත්‍යේකබුදුවරයන්

එහන්සේලාය ශාරිපුත්‍රමහාතෙරාදී අසුමහශ්‍රාවකයන් වහන්සේලාය බුඩොපසථාසිකයන් වහන්සේය බුඩමාතෘබුඩ පිතෘහුය යක්විනිරජදරුවෝය යන මේ උත්තමයෝ පහළවන්නාහුය. එහි සත්ථෘෝ සක්විතිරජහුගේ අවවාදයන් ගෙන පංච ශීලයෙහි පිහිටා සවගීපරායනාවන්නාහුය. එසේම ප්‍රත්‍යෙකබුදු වරයන්වහන්සේලාගේ අවවාදයෙහි පිහිටාද සත්ථෘෝ සවගී පරායන වන්නාහුය සම්මාසම්බුදුවරයන්වහන්සේලාගේ හා බුඩ ශ්‍රාවකාඝන්වහන්සේලාගේත් අවවාදයෙහි පිහිටන්නාවූ සත්ථෘෝ වනාහි නිම්ාණසුගතිපරායන වන්නාහුය. එහෙයින් ඒ මඩ්‍යදෙශයෙහි වාසය තෙමේ මේ සම්පත්තීන්ගේ පිළිලැබීමට ප්‍රත්‍යයවන්නේය. එසේ හෙයින් මෙය මඩ්‍යමලයහි කියන ලද්දේයැ.

වැලිදු ගත්ගත්තාසින් මඩ්‍යමදෙශය ලැබෙන්නේය. මූලපබ්බුවිපයම මඩ්‍යමදෙශය නම් වන්නේය. සෙසු වීපෘෝ ප්‍රත්‍ය නතජනපදයෝ වන්නාහුය. ලක්දිවැ අනුරාධපුරනගරය මඩ්‍ය දෙශය වන්නේය. සෙසු නගරයෝ ප්‍රත්‍යනතජනපදයෝයයි කියනලද්දාහ. හෙද යුකතියෙක, අනුරාධපුරයෙහි වනාහි මූටසීවරජ්ජුගේ දෙවනපුත්වූ දෙවනපෑතිස් නම් මහරජතෙමේ බුදුවසින් දෙසිඅසතිස්වැන්නෙහි ඇසළපුණුපොහොදින ලක්දිවි පැමිණි මහාමහිඳුතෙරපාණන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා මහපින්කොට සතලිස් හවුරුද්දක් රජය කරවා ඉන් සැව තව්තිසා දෙව්ලොවැ උපන. ඊටපසු මූදසීවරජ්ජුගේ උත්තරිය නම්වූ සිසුවන පුත්තෙමේ දසවසීයක් රජය කරවීය. ඒ රජහු ගේම මහාසීව නම් පස්වන පුත්‍රයාද සූරසෙන නම් සත්වන පුත්‍රයාද එසේම රජය කරවීය. එසේම සෙනය ගුත්තය යන දෙමළරාජපුත්‍රයෝ දෙදෙන සුරතිස්ස රජු පහකොට අනුරාධ පුරයෙහි දෙළොස් හවුරුද්දක් රජය කරවූහ. එකල මූටසීව රජුගේ අසෙල නම්වූ නවවන පුත්‍රතෙමේ සෙනය ගුත්තය යන දෙරජුන් පහකරවා දසහවුරුද්දක් රජය කරවීය. එකල එළාර නම්වූ දෙමළරජෙක්තෙමේ අසෙලරජු පහකරවා සුසාලිස්වසක් රජය කරවූයේය. එකල දෙවනපෑතිස් රජතුමන්ගේ මුනුබුරුවූ කාවන්තිස්ස මහරජහුගේ පුත්‍රවූ දුටුගැමුණු අභය නම් මිහිපල්තෙමේ එළාර රජු තසා ලක්දිවැ අනුරාධපුරත්‍රුවර අභය රජ වීය. මෙසේ ඒ දුඨගාමිණී අභය තෙමේ දෙවනපෑතිස් රජතුමන් සඟපත් හවුරුද්දෙන් පසු සාත්‍රුහවුරුද්දකින් මත් තෙහි රජය කරවීය එකල දෙවනපෑතිස් දෙව්පුත්තෙමේ

සංසකාරයන්ගේ අනිත්‍යතාවය බලා අතිමූනතාකාලක්‍රියාවෙන් තව්තිසා දෙව්ලොවින් සැව ලක්දිවැ සිටුකුලයෙහි ඉපිද සත් හවුරුදු වයස්හි කල්හි පැවිදිව සකලකෙලෙසුන් ප්‍රහීණකොට අර්හත්වයට පැමිණියේය. පතිරූපදෙශවූ එම අනුරාධපුරයෙහි වාසය කොට මාඝඵලප්‍රාප්ත අනික් ජනයන්ගේද ගණන පථාතික්‍රාන්ත වීය.

හුදීජනමනනන්දනවූ පතිරූපදෙශවාස සාථාව
මෙ සේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

පූජෙකතපුණ්‍යතාවය නම්:—බුඩ ප්‍රත්‍යෙක බුඩ ඍෂිණාශ්‍රව යන්වහන්සේලා අරහයා රැස්කරණලද පින්ඇතිබව කරනලද අධිකාරඇතිබව වන්නේය. එබදුවූම උත්තමගුණවූ කුශල් මුල් ඇත්තක්ම වී එම කුසලමූලය හෙතුකොටගෙන බුදුවරයන් වහන්සේ කෙනෙකුගේ හෝ බුඩශ්‍රාවකයන් වහන්සේ කෙනෙකුගේ හෝ දෙශනාව අසා මහාකපිනරාජාදිහු මෙන් මහාඵලවූ අර්හත්වයට පැමිණෙන්නේය. එබැවින් එබදුවූවහුගේ පෙර කරනලද පින් ඇතිබව මතුල් නමැති කියනලද්දේය.

මේ මතු කියනුලබන්නේ එකරුණවිෂයෙහිලා කථාවස්තුවක් වන්නේය.

අතීතකාලයෙහි බරණැස්නුවර සමීපයෙහි එක්ගමෙක දහසක් පමණ පෙසකාරයෝ වාසය කළාහුය. එකල දහසක් පමණ පසේබුදුවරයන්වහන්සේලා අටමසක් හිමාලවනයෙහි වාසය කොට වස්ආරම්භ දනව්වෙහි වාසයකරනු කැමැත්තාහු අහසින් වැඩමවා නුවර සමීපයෙහි බැස සෙනසුන් කිරීම පිණිස හස්තකර්මාන්ත ඉල්වන්නට ඉන් අවනමක් බරණැස්රජුවෙත යැව්වා හුය. එකල වනාහි රජුගේ විප්මගුල්නැකැත් වීය. ඒ රජතෙමේ වනාහි පසේබුදුවරයන්වහන්සේලා වැඩියහයි අසා නික්ම ගොස් වැඩිකරුණු අසා "ස්වාමීනි! අද අවකාශ නැත සෙට අපගේ විප්මඟුලෙක් ඇත අනිත්ද, නුඹවහන්සේලාගේ මෙහෙය කරන්නෙමි"යි කියා පසේබුදුවරයන්වහන්සේලා නොපවරාම පිවිසියේය. එවිට උන්වහන්සේලා අන්තැනකට යන්නෙමුයි සිතා ඉන්බැහැර වැඩියසේක්ලාය. එකණෙහි දෙටුපෙසකාරයාගේ බිරිඳ කිසියම්කටයුත්තක් පිණිස බරණැස්නුවරට යන්නී උන්වහන්සේලා දැක පැහැ පිහිටුවා වැඳ "ස්වාමීනි! අය්‍යි

ගන්වහන්සේලා නොකල්හි කුමක් හෙයින් වැඩියේක්ලාද"යි විචාරා මූලපටන් සියලු එපවත් අසා ශ්‍රද්ධාවන්නවූ සතුටුවන්නවූ ඒ සත්‍රිතොමෝ "ස්වාමීනි! සෙට අපගේ භික්ෂාව පිළිගන්නා සේක්වා"යි ආරාධනා කළාය. එවිට පසේබුදුවරයන්වහන්සේලා "නැහැනියෙනි! අපි බොහෝවමු", ස්වාමීනි! තුඹවහන්සේලා කෙතෙක්ද? දහසක් පමණය, "ස්වාමීනි! මෙහෙමැ දහසක් ගිල් පිහු ඇත එකඑකා එකඑක පසේබුදුවරයන්වහන්සේට භික්ෂාව දෙයි භික්ෂාව ඉවසා වදාළමැනව මම්ම තුඹවහන්සේලාට වාසස්ථාන දැකරවහෙන්මි" යිකීය. පසේබුදුවරයන්වහන්සේලා එය ඉවසා වදාළහ. ඒ දෙටුබිරිඳු තොමෝ ගමට වැද "මම දහසක් පමණ පසේබුදුවරයන්වහන්සේලාට ආරාධනා කෙළෙමි. ඒ අය්‍යීන් වහන්සේලාට හිඳිනාතැන් සදවි කැඳබත්අවුලු ආදිය සපයව්ය"යි උසස්කොට සොළොසකළාය. ඒ අසා ගම්වාසීහු රැස්ව ගම මැදමණ්ඩපයක් කරවා අසුන් පණවා දෙවනදිනෙහි පසේබුදුවරයන්වහන්සේලා වඩාහිඳුවා ප්‍රණීත භොජනයෙන් වළඳවා බත්කිස අවසානැ එගමැ සියලු සත්‍රීන් ඉදිරියට ගෙනවුත් ඔවුන්සමඟ උන්වහන්සේලා වැද "ස්වාමීනි! තෙමසක් වසනු පිණිස ප්‍රතිඥා දුනමැනවැයි අයැද උන්වහන්සේලාගේ ප්‍රතිඥාව ගෙන නැවත ගමැ "මව්වරුනි! පියවරුනි! එකඑක ගෙයින් එකඑකා පුරුෂයා වැපොරෝ ආදිය ගෙන වල්වැද ද්‍රව්‍යසම්භාරයන් ගෙනවුත් ආය්‍යීන්වහන්සේලාට වාසස්ථාන කෙරෙත්වා"යි උසස්කොට සොළොසකළාය. ගම්වැසියෝ ඇයගේ අවවාදයෙහි පිහිටා එකඑකා රාත්‍රිස්ථාන දිවාස්ථාන සමඟ එකඑක පන්සල බැගින් පන්සල් දහසක් කරවා තමතමන්ගේ පන්සලෙහි වස්එළඹියාවූ පසේබුදුවරයන්වහන්සේට "මම සකස් කොට උපස්ථාන කරන්නෙමි, මම සකස් කොට උපස්ථාන කරන්නෙමි"යි කියා උපස්ථානකළාහුය. වස් පවාරණවූ කල "තමතමන්ගේ පන්සලෙහි වස් එළඹියාවූ පසේබුදුවරයන්වහන්සේලාට නිච්චදන සළු සදවිය"යි සමාදන් කරවා එක එකා නමට දහසක් දහසක් මිලවූ තුන් සිවුරු දෙවිය. පසේබුදුවරයන් වහන්සේලා වැසකිමවූ වස් ඇත්තාහු අනුමෝදනා කොට වැඩියාහුය. ගම්වාසීහුද මේ පුණ්‍යකර්මය කොට ඉන් චුතවූවාහු තව්තිසා භවනයෙහි ඉවිද ගණ දිව්‍ය පුත්‍ර' යන නාමයන් ප්‍රකටවූහ. ඔවුහු ඒ තව්තිසා භවනයෙහි දිව සැපත්විඳ කසුප්බුදුසසුනෙහි බරණැස කෙළඹි ගෙවල්හි උපන්හ. දෙටුපසකාරතෙමේ දෙටුකෙළඹියාගේ පුත් වීය, ඔහුගේ බිරිඳද දෙටුකෙළඹියක් හටවා දුවනියක් වීය. ඒ

සියල්ලෝම වැඩිවිය පැමිණියාහු සවාමිකුලවලට යන්නියෝ ඔවුනොවුන්ගේම ගෘහයන්ට ගියාහුය. එසේ කල්යනකල එක්දිනක් දෙවිරම්මහවෙහෙර ධර්මශ්‍රවණයක් සොඹිතවිය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ධර්මදෙශනා කරන සේකැයි අසා ඒ සියලුම කෙළඹියෝ දහම් අසන්නෙමුයි භාග්‍යවන් සමඟ විහාරයට ගියාහුය.

ඔවුන් විහාර මඩ්‍යයට පැමිණි තෙණෙහිම වැයි වැස පියය. යමෙකුන්ගේ කුලූපග භික්ෂූහු හෝ ඤාතිවූ භික්ෂූහු හෝ සාමණේරාදීහු හෝ ඇද්ද ඔවුහු පමණක් උන්වහන්සේලාගේ පිරිවෙන් ආදියට පිවිසියාහුය. ඒ කෙළඹියෝ වනාහි එබන් දන් නැති බැවින් කොයිබවත් වදින්නට අපොහොසත්වූවාහු විහාරමඩ්‍යයෙහිම සිටියාහුය. ඉක්බිති දෙටු කෙළඹිතෙමේ "අපට සිදුවූ විප්‍රකාරය බලව් කුලපුත්‍රයන් විසින් නම් මේ පමණකින්ම ලජ්ජාවන්නට වටනේය"යි ඔවුන්ට කීයේය. උත්තමය. අපි දැන් මීට කුමක් කරමුද?, "විශ්වාසකෙනෙකුන්ගේ ස්ථානයක් නැතිබැවින් දැන් අපි මේ විප්‍රකාරයට පැමිණියෝ වමු අපි සියල්ලෝම ධනය රැස්කොට පිරිවෙනක් කරමුය"යි කීයේය. සෙස්සෝ "උත්තමයන්වහන්ස. මැනවැ"යි කීහ. දෙටුකෙළඹිතෙමේ ඒ පිණිස දහසක් දුන්නේය. සෙස්සෝ පන්සියය පන්සියය බැගින්ද සත්හු දෙසිය පණස දෙසිය පණස බැගින්ද දුන්හ. ඔවුහු ඒ ධනය රැස්කොට දහසක් කුළගෙවල් පිරිවර කොට ඇති ශාස්තෘන් වහන්සේට වාසය පිණිස මහපිරිවෙනක් කරවන්නට ඇරබූහ. නවකර්මාන්තය මහත් බැවින් ධනය නොපොහොනාකල ප්‍රථම දුන් පමණින් අඩඅඩ නැවතත් දුන්හ. පිරිවෙන් කර්මාන්තය නිමිකල විහාරපූජාව කරන්නාහු බුදුන් ප්‍රමුඛ මහසඟනට සත්දවසක් මහදන් දී විසිදහසක් භික්ෂූන් වහන්සේලාට තුන්සිවුරු සූදානම් කළාහුය. දෙටුකෙළඹියාගේ භාග්‍යවතෝ සියල්ලන් සමඟද එකලෙස කොට තමා නුවණින් සිට ඉතා වැඩියක් කරන්ට ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ පුදන්නෙමියි අනෝජා පුෂ්පවණ්ණඇති දහසක් අඟතා සළුවක් සමඟ අනෝජා මල් පැසක් ගෙන අනුමෝදනා කරන කාලයෙහි අනෝජා මලින් බුදුන් පුද ඒ සළුව ශාස්තෘන් වහන්සේගේ පාදමූලයෙහි තබා "සවාමිනි. බුදුරජාණන් වහන්ස උපනුපන් තැන මාගේ ශරීරය අනෝජාමල්වන්මෙන් වේදා

මාගේ නාමයද අනොජාමි වේවා"යි ප්‍රාර්ථනා කැබිය. ශාක්‍යයන්වූ ඒ බුදුරජාණන් වහන්සේ එසේම වේවායි අනුමෝදනා කළ සේක. ඒ සිහල්ලෝම ආයුෂ්පමණින් එහි සිට ඉන් සැවැ දෙවි ලෝ ඉපිද මේ බුදුහෙමෙහි දෙව්ලොවින් සැවැ දෙවු කෙරුම් තෙමේ කුක්කුටවතී නුවර රජකුලෙහැ ඉපිද 'මහාකපින' නම් රජවිය. සෙසු ජනයෝ ඇමති කුලයන්හි උපන්හ. දෙවුනකලඹියාගේ භාග්‍යාතොමෝ මදුරට සාගලපුරනුවර රජකුලෙහැ ඉපිද අනෝජා මල්වන් ශරීරඇත්තියක්වී අනොජා නම් විය. ඕ තොමෝ වැඩිවිය පැමිණීමෑ කපිතරජ්ජුවෙහැ ගොස් අනොජාදේවී නම් විය. සෙසු අහතෝද ඇමතිකුලයන්හි ඉපිද වැඩිවිය පැමිණියාහු ඒ අමාත්‍ය පුත්‍රයන්ගේම ගෙවලට ගියාහුය. ඒ සිහල්ලෝ රජුගේ සම්පත්තිය හා සමානවූ සම්පත්තියක් අනුභව කළාහුය. ඔම්බේ රජ්ජුරුවෝ සිහලු රාජාභරණයෙන් සැරසී මහුලැතූ පිට නැඟ හැසිරුද එකල ඔවුහුත් එසේම හැසිරෙන්නාහුය. රජු අසුපිටින් හෝ රථයෙන් හෝ හැසිරෙන කල්හි ඔවුහුත් එසේම හැසිරෙන්නාහුය. මෙසේ ඔවුහු එකතුව කරනලද පුණ්‍යකර්මයන් පිළිබඳවූ විපාකසම්පත්තිය එකතුවම අනුභව කළාහුය. රජ්ජුරුවන්ට වතාහි වාලය වාලවාහනය පුපඵය පුපඵවාහනය සුපත්තය යි කියා අශ්වයෝ පස්දෙනෙක් වූවාහුය. රජ්ජුරුවෝ ඔවුනුරෙන් සුපත්ත නම් අසුපිට නැඟී හසුන් ගෙන ඒම පිණිස සෙසු අසුන් සතරදෙන අසරුවන්ට දෙති. රජ්ජුරුවෝ කිමදැරියෙන්ම ඔවුන් අනුභවකරවා "දරුවෙනි! ඔව් දෙතුන් නොදුනක් ඇවිද බුදුන් හෝ දහම් හෝ සඟුන් හෝ උපන්බව් දුනමට සැපවූ හස්තක් ගෙන එව්ව"යි කියා පිටත් කොට යවන්නාහ. ඒ අසරුවෝ සතරවාසල් දොරටුවලින් නික්ම දෙතුන් යොදුනක් ඇවිද එබදුහසුන් නොලැබ පෙරලා එන්නාහුය. මෙසේ කල්‍යතකල එක් දවසක් රජ්ජුරුවෝ අසුනැඟ ඇමතියන් දහයක් පිරිවර කොට ඇතිව උයනට යන්නේ නුවරට පිවිසෙන්නාවූ විඛාපත් අසුරුඇති පන්සියයක් වෙළඳුන් දැක "මොවුහු අද ග්‍රහණින් කලානතවූවාහුය. ඒකාන්තයෙන් මොවුන්ගේ සමීපයෙන් උතුම් හස්තක් අසන්නට ඇත්" යිතා ඔවුන් කැඳවා "කොයිබසිට එන්නහුද"යි විමසූහ. "පින්වත දේව යන්වහන්ස! මෙතැන්සිට එක්සියවිසිදොදුනකින් මත්තෙහි සැවැත් නම් නුවරක් ඇත්තේය. අපි එහි සිට එන්නමෝ." "නොපගේ ඒ දෙශයෙහි කියයුතු ගම්කිසි අමුතු හස්තක් ඇත්

තේද?" "දේවයන්වහන්ස! අන්කිසිවක් නැත ඝම්මාඝබුදුරජාණන් වහන්සේ වනාහි උපතැ"යි කීහ. රජතෙමේ එකෙණෙහිම ක්ෂුද්‍රික ප්‍රීතිය ක්ෂණික ප්‍රීතිය අවක්‍රාන්තික ප්‍රීතිය උත්ප්‍රේක්ෂික ප්‍රීතිය සප්තුරණප්‍රීතියයි යන පස්වණක් ප්‍රීතියෙන් පැතුරුනු ශරීරඇත්තේ කිසිවක් සලකාගන්නට නොහැකිව මොහොතක් ඉක්මවා දරුවෙනි! කුමක් කිව්දැයි විචාළේය.

ඔවුනතුරෙන් ක්ෂුද්‍රිකප්‍රීතිය ශරීරයෙහි ලොම් ඩැහැගැනුම් පමණක් කරන්නට සමර්ථ වන්නීය. ක්ෂණික ප්‍රීතිය ක්ෂුද්‍රිකප්‍රීතියට වඩා බලවත්ව ඉපිද ක්ෂණක්ෂණයෙහි විදුලි ගැසීමක් මෙන් වන්නීය, අවක්‍රාන්තික ප්‍රීතිය මහාසමුද්‍රයෙහි තැගි රළ මේඝයෙ රලදක්වා අවුත් පැතිරෙන්නාක්මෙන් සියලු ශරීරය පිණ පිණා පැතිරෙන්නීය. උත්ප්‍රෙක්ෂිකා ප්‍රීතිය බලවත් මී කම් ශරීරය උඩුකුරු කොට අහසට නගාපියන පමණට පැමිණෙන්නීය. ඒ එසේමැයි:-

මෙම ලක්දිවැපුණුණගල්ලක විහාරවාසී මහාතිස්ස ස්ථවිරයෝ පසළොස්වක් පොහෝ දවස සවස් භාගයෙහි පණගල්වෙහෙර දැගැබ්මලුවට එළඹ සඳපාන දුක රුවන්වැලමකාසැයට අභිමුඛව ඒකාන්තයෙන් මේ වේලායෙහි සියුපිරිස් රැස්ව මනසැය වදනාහයි පූජිතයෙහි මනසැයෙහි දුටුබිරු අරමුණුවශයෙන් සලකා බුදුන් අරමුණු කොට ඇති උත්ප්‍රෙක්ෂිකා ප්‍රීතිය උපයා සුණුපිරියම් කොට ඔපතැබූ බිම්පහළ මිසිතුරු පන්දුවක් මෙන් අහසට නැඟී සිතින්අරමුණුකළ මහසැවලුවෙහි ප්‍රීතිබලයෙන්ම අහසින් ගොස් පිහිටියේය.

එපරිද්දෙන්ම හිරිහඬුවෙහෙරට ගොදුරුගම්වූ වත්තකාල නම් ගමැ දැසි එක්තරා කුලදුවක්ද බුදුන් අරමුණු කොට උපදවාගත් උත්ප්‍රේක්ෂිකාප්‍රීතිය කරණකොටගෙන අහස් නැඟාය. හේ කෙසේද යත්?

ඇගේ මව්පියමදෙදෙන එක්දිනක් සවස බණ අසනු පිණිස වෙහෙරට යන්නාහු දියණියන් ගැබ්ගෙන සිටි බැවින් "අම්ම! නී දුරි ඇත්තීවී නොකල්හි ඒ ඒ තැන හැසිරෙන්නට අපොහොසත් වන්නීය අපි නෙහෙරට ගොස් තිට පින්පෙත් කොට බණ අසම්හ"යි නැඟී ගියෝය. ඇ වනාහි බණ අසනු කැමැත්තීද මව්පියන්තෙපුල් පැහැර කරන්නට අපොහොසත් වී ගෙහිම රැඳිනා. ඉක්බිත මව්පියෝ වෙහෙරට නික්ම ගියාහු, ගෙහි රැදු දියණියෝ ගෙම්දුලව බැස සිට සඳපානින් බලන්නී

ගිරිභණ්ඩවිහාරයෙහි ගල්මුදුනක පිහිටි අතිශය දුකැබි මලුයෙහි පහන්පූජාව හා සිප්පුවණක්පිරිස් රැස්වූ සුවඳදුම්වල් ආදිය යන් සැප පුද වැඳ පැදකුණු කරන්නවුන්ද දුටහ. භික්ෂුසංඝයා ධර්මය පිරිවහනා ශබ්දයද ඇසීය. ඉක්බිත්තෙන් ඇව වෙබදු සිතක් පහළ විය. "ඉදින් ගම් කෙණෙක් වෙතෙරට එළඹ මෙ බඳු දැහැබිමලුවෙක ඇවිදින්නටද මෙබදු මිහිරි බණකථා අහන් නටද ලබත් නම් ඔවුහු ඉතා පිතැන්තෝය"යි කියාගි. මෙසේ සිතමින් මුතුරුයක් වැනිවූ වෛතාය බලමින් සිටියාවූ ඇයට උත්පෙක්ෂිකා ප්‍රීතිය උපන. ඇ ඒ ප්‍රීතිවේගයෙන් අනාථව නැගී මව්පියන්ට පෙරාතුව ආතාශ වෛත්‍ය මළුවෙහි බැහැ වෛත්‍යය වැඳ බණ අසම්ඛයි සිටියාහ. ඉක්බිත්තෙන් ඇයගේ මව්පියෝ අවුත් ඇය දැක "අම්ම! නී අපට පෙරාතුව කොහිමයින් ආදැ"යි පිළිවිස්සෝය. ඇද "එහන්ස! මහකින්ම නොආයෙමි අහසින්ආවහ" යි කීය. "අම්ම! අහසින් නම් ඍෂිණාශ්‍රවයෝම ඇවිදිනාහ. නී කෙසේ අහසින් අවුදැ"යි විවාරණලද්දී "එහන්ස! සඳුහන් එලි යෙන් වෛත්‍යය බලමින් සිටියාවූ මට බුදුන් අරමුණුකොට බලවත් ප්‍රීතියක් උපන. ඉක්බිත්තෙන් මාගේ ශරීරය සිටිය ඔවක්වත් හුන් බවක්වත් මම නොදනිමි වෛත්‍යවන්දනාවද ධර්මශ්‍රවණයද අරමුණුකොටප්‍රීතිය උපන්කල්හි ගත්තාලද කුසල නිමිත්ත හෙතුකොටගෙන අහසට නැගී මේ දැහැබිමලු වෙහි පිහිටියා වෙමි"යි කීහ. මෙසේ උත්පෙක්ෂිකාප්‍රීතිය ශරීරය අහසට තංවන ප්‍රමාණ වන්නීය. සප්තරණප්‍රීතිය උපන් කල්හි සියලු ශරීරය සුලං පිඹ පිරූ විතක්මෙන්ද මහදිඇවතුරක් ඇතු ළුවන් පළිඟ කුක්ෂියක්මෙන්ද හාත්පසින් සියලු ශරීරය සපූරී කරනලද්දේවෙහි.

මෙසේ ප්‍රීතියෙන් පිණා ඒ රජු විවාළ කල "දේවයන් වහන්ස! බුදුරජ පහළවූසේකැ"යි,කීය. රජ්ජුරුමෝ දෙවනුවද තෙවනුවද එසේම කල් ඉක්මවා සිප්පුවන වාරයෙහි "දරුවෙනි! කුමක් කියවිදැ"යි විවාරා දේවඝන්වහන්ස! බුදුන් උපනැයි කීකල්හි "දරුවෙන්! මේ නිමිති කොට තොපට ලක්ෂයක් දෙමි" යි කියා තවත් ධර්මකිසි හස්තක් ඇත්තේදැයි විවාළේය. "දෙව ගන් වහන්ස! ඇත්තේය එතම් ධර්මයද ඇතිවිය"යි කීය. හෙද අනා රජතෙමේ පෙරසේම තෙවරක් මෙසෙනත මෙසෙනත කල් ඉක්මවා භික්ෂුවන වාරයෙහි සිහි එලවා ධර්මය යන පදය කීකල "තොහිද තොපට ලක්ෂයක් දෙමි"යි කියා "දරුවෙනි! තවත් කුමන හස්තක් ඇද්දැ"යි විවාළේය. "දේවයන්වහන්ස! ඇත්

තේජ සංසරත්තයද ඇතිවිය"යි කීහ. හෙද අහෝ රජතෙමේ එසේම තෙවරක් කල් ඉක්මවා සතරවන වාරයෙහි සංඝ යන පදය කීකල්හි "මේ භග්නවිසයෙහිද තොපට ලාභයක් දෙමැ'යි කියා ඇවතිහන් දහස දෙස බලා 'දරුවෙනි! කුමක් කරවිද්ද"යි විචාළේහ. "දේවයන්වහන්ස! නුඹවහන්සේ කුමක් කරන සේක්ද"? "දරුවෙනි! මම බුදුන් උපන දහම් උපන සඟන උපන්නැයි අහා නැවත නොනවතිම් ශාසනාවූ බුදුරජාණන් වහන්සේ උදෙසා ගොස් උන්වහන්සේගේ සමීපයෙහි පැවිදි වන්නෙම්"යි. දෙවයන්වහන්ස! අපිදු නුඹවහන්සේ සමඟ පැවිදි වන්නෙමු"යි කීහ. රජ්ජුරුවෝ රත්පවෙහි අකුරු ලියවා වෙණදුන්ට දී මෙසේ කීහ. "මෙහ ගෙන ගොස් අනොජා දෙවියට දෙව් එසේකල අනොජාදෙවිනොමෝ තොපට තුන්ලක්ෂයක් දෙනවා ඇත. මෙසේත් ඇහට කියව් "සැපවූ පරිද්දෙන් සම්පත් ප්‍රයෝජන ගනුවයි කියා රජ්ජුරුවන්ගේ ඉසුරු නුඹවහන්සේටම හැරදමනාලද්දේහ ඉදින් රජ්ජුරුවෝ කොපිදැයි නොපගෙන් විචාළනොත් ශාසනාරක්ෂාවහන්සේ උදෙසා පැවිදි වන්නෙමියි කියා ගියහයි කියව්"කියාහි. ඇමතියෝද තම තමන්ගේ භාග්‍යවන්ට එසේම හසුන් ඇවිටුවාහුය. රජ්ජුරුවෝ වෙණදුන් යවා ඇමතියන් දහස විසින් පිරිවරනලදුව එතෙණහිම නික්මියේහ.

ශාසනාරක්ෂාවහන්සේද එදින අළුයම් වේලෙහි ලොව බලාවදා රහසේක් පිරිවර සහිතවූ මහාකපිතරජු දැක "මේ මහාකපිත රජතෙමේ වෙණදුන්ගේ සම්පයෙහි තුතුරුවන් උපන් බැව් අහා ඔවුන්ගේ වචනයට තුන්ලක්ෂයක් පුදා රාජ්‍යය හැරදමා ඇමතියන් දහසක් පිරිවරකොට ඇත්තේ මාඋදෙසා පැවිදිවනු කැමතිව හෙට නික්මෙන්නේහ පිරිවර සහිතව ඒ රජ්ජුරුවෝ සියුපිළිසිඹියාවන් සහිතවූ අහිසුහට පැමිණෙන්නේහ. ඕහට පෙරගමන් කරන්නෙමි"යි සිතා දෙවන දිනෙහි කුඩා ගම්මුදලියක්හට සක්විතිරජෙක් පෙරගවන් කරන්නාක්මෙන් තෙමේම පාසිවුරු ගෙන එක්සියවිසිඅතක් පෙරගමන් කොට සඳ බඟතෙර නුගරුකක්මුල සවණගඟන බුදුරැස් විහිදුවමින් වැඩහුන්සේක. රජ්ජුරුවෝත් එන්නේ එක්තරා ගංගාවක් වෙත පැමිණ මේ ගඟ කිනම්දැයි විචාළේහ. දෙවයන්වහන්ස! අර වවුහා නම්, දරුවෙනි! මේ ගඟාවගේ ප්‍රමාණය කෙතෙක්ද? ගැඹුරින් ගව්මෙක පුළුලින් දෙගව්මෙක, මෙහි එතරම්ට ඔරු

පාරු ආදියක් ඇත්තේද? දෙවයනි! නැතැයි කීහ. ඕරුපාරු ආදියක් බලාපොරොත්තුවනකල අපවෙත ජාතිජරා එළඹෙන්නේය. මම ජරාමරණවෙත එළඹෙන්නෙක් වෙමි නිසැකවම තුනුරුවන් උදෙසා නික්ම ඒ තුනුරුවන්ගේ ආනුභාවයෙන් මේ ජලය ජලයක්මෙන් නොවේවායි තුනුරුවන් ගුණ ආවජ්ජනා කොට "ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ"යි කියා බුද්ධානුස්සතිය සිහිකොට පිරිවර සහිතව අසුන් දහයින් දිගැට දිවූයේය. අශ්වයෝ පිටිගල්තලාවෙක්හි මෙන් දිවූහු. ඔවුන්ගේ කුරග පමණක් තෙමුනාහුය. ඒ රජ්ජුරුවෝ ඒගඟ තරණය කොටැ මත්තෙහි යන්නේ තවත් ගඟක් දැක මේ කිනම්දැයි ඇසීය. දෙවයන්වහන්ස! නීලවාහිනී නම්ය, මෙහිප්‍රමාණය තෙතෙක්ද?, දෙවයන්වහන්ස! ගැඹුරින්ද පුළුලින්ද අඩයොත්තෙක, එහිදු ඕරුපාරු බලාපොරොත්තුවී මෙන් පමාවන බැවි සලකා "සවාක්ඛාතෝ භගවතා ධම්මෝ"යි ධම්මානුස්සතිය සිහිකරමින් පෙරසේම දිවූයේය.

හෙද ඉක්මවා යන්නේ තවත් ගඟක් දැක මේ කිනම්දැයි විචාරා සඳබා නැමැයි කීකල පෙරසේම එහිත් පමාවන බැවින් "සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ"යි කියා සංඝානුස්සතිය සිහිකෙරෙමින් දිවූයේය. හෙද ඉක්මවා යන්නේ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් නික්මෙන ෂඩ්වර්ණ බුඩරශ්මීන් දුටුසේක. ත්‍යග්‍රොධයාගේ අතුවලෙප්පත්ආදිහු රන්මුවාමෙන් වූවාහුය. රජ්ජුරුවෝ "මේ ආලෝකය සුශීර්ෂ බ්‍රහ්මනාගසුපණ්ණාදීන් අතුරෙන් කිසිවෙකුගේත් නොවෙයි මම ශාස්තෘන් වහන්සේ උදෙසා එනබව මහාගෞතම බුදුන් විසින් ඒකාන්තයෙන් දක්නාලද්දේයයිසිතා එකණෙහීම අසු පිටින් බැස අවනත ශරීරඇතිව බුඩරශ්මීන්ගේ අනුසාරයෙන් බුදුන්වෙත එළඹ හිරියල් රසයෙහි ගිලෙන්නාක්මෙන් බුදුරැස් අතර පිවිස බුදුන් වැඳ ඇමතියන් සමඟ එකත් පසෙක හුන්නේය. සතරාමරලෝකයිවඩකාවූබුදුරජාණන්වහන්සේ ඔවුන්ට දැනකථාශීලකථාආදී අනුපිළිවෙල කථාව වදාළසේක. රජ්ජුරුවෝ දෙශනාවසානයෙහි පිරිවරසහිතව සෝවාන්ඵලයෙහි පිහිටා සිගල්ලෝම නැඟිට මහණබැව් ඉල්වූවාහුය. ශාස්තෘන් වහන්සේ මේ කුලපුත්‍රයන්ට සාධුයෙන් පාසිවුරු එන්නේදැයි බලාවදාරණසේක් මේ කුලපුත්‍රයෝ දහසක් පසේබුදුවරයන්ට තුන්සිවුරු දහසක් දුන්හ.

කසුප්බුදුසෙමෙහි විසිදහසක් භික්ෂූන්ට විසිදහසක් සිවුරු දුන්හ. මොවුන්ට සෘද්ධියෙන් පාසිවුරු පැමිණීම අසිරි නොවෙසි දැන දසබිණ ශ්‍රී හස්තය දිගු කොට "එථ භික්ඛවේ!වරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය"යි වදාළේහ. ඔවුහු එතෙණෙහිම අවපිරිකරබැරු සියක් වස් ඇති මහතෙරුන්මෙන් වී අහසට පැනනැඟී නැවත බැස බුදුරජාණන්වහන්සේ වැඳහුන්හ. ඒ වෙණදහු වනාහි රජමාලිගාවටගොස් රජ්ජුරුවන් විසින් එවනලද බැව් කියා සිටිකල එව්ගසි දේවිය විසින් කැඳවුවිට එහි පැමිණ වැඳ එකත් පසෙක සිටගත. එවිට දේවිතොමෝ දරුවෙනි! කුමක් හෙයින් අවුද?දේවියෙනි! අපි රජ්ජුරුවන් විසින් නුඹවහන්සේගේ සමීපයට එවනලද්දේවමු. අපට තුන්ලකුණක් දුන්නේය. දරුවෙනි! ඉතා බෙහෙවක් කියතහුය නුඹලා විසින් රජහට කුමක් කරණලදද? මෙතෙක් ධනයක් දෙවූයේ නුඹලාගේ කුමන කරුණකට පහන්වූයේද?, දේවියෙනි! අන් කිසිවක්නැත අපිරජ්ජුරුවන්ට එක් හස්තක් කිවමේ. දරුවෙනි එය අපවත් කියන්ට හැක්කහුද? දේවියෙනි! හැක්කෝවමු. දරුවෙනි! එසේවිතම් කියව්. දේවියෙනි! ලෙව්හි බුදුන් උපත. ඒ දේවිතොමෝද එය අසා රජුසේම පස්වනක් ප්‍රීතීන් පැතුරුනු ශරීර ඇත්තී තෙවරක් කිසිවක් සලකාගතනොහී සියුවන වාරයෙහි බුඩගත පදය අසා දරුවෙනි! මේ බුඩ ගත පදය නිමිතිකොට රජු විසින් නොපට කුමක් කරවනලදද?, දේවියෙනි! ලකුණක් දෙනලද්දේය දරුවෙනි! රජු විසින් කළා නුසුදුසුහ. මෙබදු හස්තක් අසා ලකුණක් දුන්නා නොපවණය,මම වනාහී මාගේ දුගීපඬුර මේනිමිති කොට නොපට තුන්ලකුණක්දෙමියි කීය. අනික්හසුන්ද කිනල ඊටද සලකුණක් දුන්නීය. මෙසේ ඒ වෙණදහු දෙලොස්ලකුණක් ලද්දහුය. ඉක්බිති දේවිතොමෝ රජු කොසිබදුසි ඔවුන් අතින් විවාලීය. රජ්ජුරුවෝ බුදුන් උදෙසා පැවිදි වන්නෙමියි කියා ගියහ. ඒ රජු විසින් අපට කුමන හස්තක් දෙන ලදද? "නුඹ වහන්සේ වනාහි කැමතිසේ සම්පත් අනුභව කරව"යි කියා සියලු ඉසුරු නුඹ වහන්සේට පාවාදෙනලදයි කීහ. ඇමතියෝ වනාහි කොසිබ ගියහුද? දේවිනි! ඔවුහුද රජු සමඟම පැවිදි වන්නෙමුයි කියා ගියහ. දේවි තොමෝ ඔවුන්ගේ භාග්‍යාවන් කැඳවා නොපගේ සවාමිවූ ඇමතියෝ පැවිදිවන්නෙමුයි රජු සමඟ ගියහ,තෙපි දැන් කුමක් කරවිද? කිමෙක වනාහි දේවිනි! ඔවුන් විසින් අපට හසුන් එවන ලදද? එසේය, ඔවුන් විසින් වනාහි "නොපකැමති සේ

සම්පත් අනුභව කරව්ය"යි ඔවුන්ගේ සම්පත් තොප්පි භාරකළ හසුන්පත් එවනලදහ. දේවිනි! නුඹ වහන්සේ වනාහි කුමක් කරනෙහිද?, දූවරුනි! මහිමිතෙමේ රජෙක්වූයේ මහ සිවියේම තුන්ලක්ෂයකින් තුනුරුවන් පුදා රජකැපත කෙළපිඬක්මෙන් හැරදමා පැවිදිවන්නෙමියි නික්මුනේහ, මවිසින් වනාහි තුනුරුවන් පිළිබඳ හස්න අසා එකි එකි රත්නයට තුන්ලක්ෂය බැගින් නවලක්ෂයකින් පුදන ලද්දේහ, මේ සම්පත් තොමෝ නම් රජ්ජුරුවන්ට පමණක්ම දුක් නොවන්නීහ, මටත් දුක්මහ, රජ්ජු විසින් බැහැරලූ කෙළපිඬක් කවර නම් කෙණෙක් බිම දනගනු මුවින් ගන්නේද? මට සම්පත්තියෙන් වැඩෙක් නැත, මමත් ශාස්තෘන් වහන්සේ උදෙසා ගොස් පැවිදිවන්නෙමි. දේවිනි! අපිත් නුඹවහන්සේ සමඟම පැවිදිවන්නෙමු. දූවරුනි! ඉදින් හැකිවන්නහු නම් ඉතා මැනව. දේවිනි! හැකිවමු. එහෙනම් එව් යහි කියා රියදහසක් යොදවා රිය නැඟ රජ්ජුසේම ගියහ. තිලෝකතිලකභූතවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ. අනොජාදේවියගේ ආගමනය දැන ගම්සේ තමන් වහන්සේ සමීපයෙහි සිටි භික්ෂූහු නොපෙණෙත්ද එසේ අධිෂ්ඨානකළ සේක. දේවිද ගමින් ගමින් ශාස්තෘන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් නික්මෙන බුදුරැස් දැක එසේම සිතා බුදුන්වෙත එළඹ බුදුන් වැඳ එකත්පසෙක සිටියා,"ස්වාමිනි! බුදුරජාණන්වහන්ස! මහිමිවූ මහානපපිත රජ්ජුරුවෝ නුඹවහන්සේ උදෙසා නික්මින, මෙහි ආවා වෙන්ට ඇතැයි සිතමි, ඒ රජ්ජු කොසිබද? අපට දක්වා වදාළමැනවැ"යි කීහ. "පලමුකොට මෙහි හිඳගනිව් ඔහු මෙහිම දක්නට හැකිවන්නහුය" ඒ සිඟල්ලෝ තුටුපහටු සිත් ඇත්තියෝ මෙහිම අපහිමියන් දක්නට හැකිලූයි කියා හුන්හ. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ඔවුන්ට අනුපිළිවෙලකථාව වදාළසේක.අනෝජා දේවිතොමෝ දම්දෙසුම්කෙළවර සෝවාන් ඵලයට පැමිණියාහ. මහානපපිත සථවිරයන් වහන්සේ ඔවුන්ට වඩනාලද ධර්මදේශනාව අසා පිරිවර සහිතව සියුපිළිසිඹියාවන් සහිත අර්හත්ඵලයට පැමිණියහ. එකෙණෙහි ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ඒ භික්ෂූන් දැක්වූසේක. ඒකෙණෙහිම මුඩුකළ හිස් ඇති කඟට වස්ත්‍රු තමන්ගේ සිවුරු ඒ භික්ෂූන් දැක ඔවුන්ගේ සිවුරු එකඟ නොවන්නාහුය. එසේ කෙනින්ම මාර්ගඵලයන්ට පැමිණෙන්නට නොහැකි වන්නාහුය. එසේ ගෙයින් ඔවුන් අවලශ්‍රද්ධාගෙහි පිහිටිකල රහත්බවට පත් ඒ භික්ෂූන් දැක්වූසේක. ඒ සත්‍රීහුද ඒ භික්ෂූන් දැක පසඟ පිහිටුවා වැඳ "ස්වාමිනි! නුඹ

වහන්සේලාගේ නම් පැවිදි කිස මුදුන් පැමිණීයේන"යි කියා බුදුන් වැඳ එකත් පසෙක සිට පැවිද්ද ඉල්වූහු. මෙසේ කීකල වනාහි ශාසනයාන් වහන්සේ උපුල්වන් මහාසඨවිරිඅගේ ආඥම කස සිතුසේක. එකෙණෙහි උපුල්වන් මහාසඨවිරිතොමෝ අවුත් ඔවුන් පැවිදිකොට සැවැත්නුවර භික්ෂුනී අරමට ගෙන ගියාය. ඒ සියල්ලෝම රහත්වූහ. ශාසනයාන් වහන්සේද ඒ භික්ෂූන් දහස ගෙන අහසින් දෙවරම්වෙහෙරට වැඩිසේක. පෙර කල පින්ඇතිබව මතුල් බවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද එකඩහුනතර වණ්ණනාදිසෙහි මහාකපිනඅස්ථිර වසනුව මෙසේ මෙතෙකින් දක්වා නිමවනලද්දේය.

වැලිත් පෙර නොකළ පින්ඇත්තේ ආනුභාව සම්පන්න වසනුව ලබන්නේද දුකට පැමිණෙන්නේය. පෙර පින් කළ තැනැත්තේ වනාහි එසේ නොව සැපට පැමිණෙන්නේය. යම් හේකින් පෙර නොකොළ පින්ඇති තැනැත්තේ අනුන් විසින් දෙනලද ශ්‍රීයද ගන්නට නොහැකිවේද ඒ ශ්‍රී තොමෝ පින්වත්හු වෙතම පැමිණියාද එහෙයින් පෙරකළපින්ඇති බවම මතුලැබි දනයුත්තේය. එකරුණෙහිලා මේ මතු පහළවන කථාවස්තුහු වන්නාහුය.

අතීත කාලයෙහි බරණැස්නුවර බම්මණසියුබැතෙක්සෘෂි ද්‍රව්‍යාවෙන් පැවිදිව හිමවතෙහි පිළිවෙළින් පන්සල් සතරක් කොට විසූහ. ඔවුනතුරෙන් දෙවුබැතෙමේ එයින් මිය ගොස් සක් දෙවරජ වී උපන. ඒ සක්දෙවිරජතෙමේ ඒ කරුණදැන එක්දි නක් දෙවුනවුසාවෙත එළඹ වැඳ"සවාමීනි! නුඹවහන්සේට කිනම් දෙයකින් වැඩඅද්දැ"යි විමාළේය. ඒ තවුස් තෙමේ වනාහි පාණ්ඩු රොග ඇත්තෙක, එහෙයින් මට ගින්නෙන් ප්‍රයෝජනයයි කී සේය. සක්දෙවිතෙමේ'සවාමීනි! ගින්නෙන් ප්‍රයෝජන ඇතහොත් මෙය අතින් ගසා 'දර ගෙනවුත් ගිනි කරව'යි කියතෙහිය, එම්ව මෙය එසේ කරන්නේය"යි කියා වැපොරොවක් දුන් නේය. වෘෂිඵරසු නම් දණ්ඩක් ප්‍රවේශ කිරීම් වශයෙන් හෙවත් මිටක් ගැසීම් වශයෙන් වැඟද පොරොවද වැන්නේය. සක්දෙව් තෙමේ දෙවෙනි තවුසාවෙතද ගොස් එසේම විමාළේය. ඔහුගේ පන්සලින් ඇත්තු යන මාගීයක් වෙයි, "තෙතෙමේ ඇතුන් කෙරෙන් පීඩා ඇත්තෙක, ඇතුන්ගේ වශයෙන් මට දුක් උපදනේය, ඔවුන් පන්නා හරිවිය"යි කියා, සක්දෙවිතෙමේ "සවා

මිනි! මෙම බෙරඇස පහට ගල තුඹවහන්සේගේ සතුරෝ පැන යන්නාහුය, මෙම ඇස පහටකල මෙත්සිත් ඇත්තෝව සියුරස සෙනගින් පිරිවරන්නාහුය"යි කියා ඒ තවුසාණන්ට බෙරයක් දී තුන්වන තවුසාණන් වෙතද පැමිණ එසේම විවාළේය. ඒ තවුසාණෝද පාණ්ඩුරෝගියෙක, එතෙසින් "මට දිනිසෙන් ප්‍රයෝජනය"යි කීයේය. සක්දෙවිතෙමේ ඔහුට එක් දිනිකලයක් දී "ඉදින් තුඹවහන්සේ කැමති විටෙක මෙය පෙරලුව එකල මහගඟක් වී මහොඝයක් පවත්වා තුඹවහන්සේට රාජ්‍යය ගෙන දෙන්නට හැකිවන්නේය"යි කියා ගියේය. එතැන් පටන් වැපොරෝ තෙමේ දෙවුනවුසාණන්ට ගිතිකෙරෙහි, දෙවැන්නා විසින් බෙර ඇස පහටකල ඇත්හු පලායන්නාහුය, තුන්වන තවුසාණෝ දිනි පරිභොග කෙරෙහි. එකල එක් හූරක්ෂකයෙම් ගම්වැසියෝ පහරන තැන හැසිරෙන්නේ ආනුභාව සම්පන්නවූ මැණික් කඳක් දැක මුවින් ඩැහැගෙන ඒ මැණිකගේ ආනුභාවයෙන් අහස් නැඟ මුහුදමැද එක් දිවසිතක් දැන එහි බැස එක් දිඹුල්රුකක් යට විසූයේය. ඒ හූරුතෙමේ එක් දිනක් ගඟමුල මැණික්කඳ ඉදිරියෙහි නිදා නිද්‍රාවට පැමිණියේය. එකල කසී රට වාසිවූ එක්තරා පුරුෂයෙක් මව්පියන් විසින් ගෙයින් ඇද දමනාලද්දේ නාවිකයන්ගේ කම්කරුවෙක් වී නැව් නැඟ යන්නේ මුහුදමැද නැව බුන්කල පුවරුවෙක හිඳ ඒ දිවසිනට පැමිණ පලවැල සොයමින් හෝනාවූ ඒ හූරා දැක එතනටහොස් මැණික්කඳ ගෙන ඒ මැණිකගේ ආනුභාව යෙන් අහස් නැඟ දිඹුල් අත්තෙක හිඳ "මේ හූරාද මේ මැණිකගේ ආනුභාවයෙන්ම අහසෙහි හැසිරෙන සුලුවී මෙහි වසනවා වෙන්ට ඇත, මවිසින් මොනු මරා මස්කා යන්නට වටනේ"යි සිතා දිඹුල් දණ්ඩක් බිඳ ඔහුගේ කිසැ හෙලුයේය. හූරා පිබිද මැණික නොදැක වෙවුලමින් ඔබ මොබ හැසුරුනේය. ඒ දැක පුරුෂතෙම් සිනහකෙළේය. හූරා උඩ බලා ඔහු දැකැ හිසින් ඒ රුකට ගසා එහිම මළේය. ඒ පුරුෂතෙම් ගසින් බැස ගිනි කොට හූරාගේ මස් පුලුස්සා කා අහස් නැඟ හිමවත් මතුයෙන් යන්නේ අසපු පියස දැක දෙවුතවුසාණන්ගේ අසපුව සමීපයෙහි බැස දෙතුන් දිනක් එහි වැස වැපොරොවගේ ආනුභාවය දැක තමන්ගේ මැණිකෙහි ආනුභාවය කියා 'සවාමිනි! මේ මැණික ගෙන වැපොරෝ මට දෙනුමැනවැ'යි කීය. තවුස් තෙමේ අහසෙහි හැසිරෙනු කැමැත්තේ මැණික ගෙන වැපොරෝ ඔහුට දුන්නේය. ඔහු එය ගෙන මද නැනක් ගොස් වැපොරොවට ගසා

"තෝ සෘෂියාගේ හිස සිඳ මැණික ගෙන එව'යි කීය. වාසිඵර සුව එසේ කරපිය. ඔහු වාසිඵරසුව පිළිඹන් තැනෙක තබා දෙවන තවුසාණන්වෙත එළඹ එහි කිහිප දිනක් වැස බෙර ගෙහි ආනුභාවය දැක මැණිකදී බෙරය ගෙන පෙරළේ ඒතවු සාණන්ගේත් හිස සිදුවා තෙවැන තවුසාණන්වෙතද එළඹ දිගිකළගෙහි ආනුභාවය දැක මැණිකදී දිගිකළය ගෙන එසේම ඔහුගේ හිසත් සිදුවා ඒ සියල්ලම ගෙන අනස් තැඹ බරණැස සමීපගෙහි බැස "යුඬ නෝ කරව රාජ්‍යය නෝ දෙව"යි කියා එක් පුරුෂයෙක් අත බරණැස් රජුඛට පතක් යැවීය. බරණැස් රජුරුදෝ ගස්න අසා සොරු අල්වා ගන්නෙමියි කියා නික්මියේය. ඒ පුරුෂතෙමේ බෙරය ගැසීය. එවිට සියුරහසෙ නඟ ඔහු පිරිවරා ගත්තීය, රජහුගේ අවසථරණ භාවය දැන දිගි කළය විසිරවීය, එකළ මහාගඟාවක් පැවැත්තීය, මකජතතෙමේ දිගියෙහි කිදන්ට පටන්ගෙන එතරවන්නට නොහැකිවිය, ඒ පුරුෂතෙමේ වැපොරොවට ගසා 'රජුගේ හිස ගෙනෙව'යි කීය. ඒ වැපොරෝතෙමේ ගොස් රජුගේ හිස නෙනවුත් පාමුල තැබීය. එකෙක්වත් ආයුධයක් නඟාලන්නට නොහැකිවිය ඒ පුරුෂතෙමේ මඟත් බල සෙනඟින් පිරිවරනාලදුව නුවරට වැද අභිෂෙක කරවාගෙන දඹිවාහන නම් රජවූයේය.

පෙරතොකළ පින්ඇතිතැනැත්තේ ආනුභාව සම්පන්න වසනුව ලැබද දුකට පැමිණෙන බවට්ඨා පෙරකළ පින්ඇති තැනැත්තේ සැපට පැමිණෙන බවටද නුදසුන් වශයෙන් ගෙන හැර පාතලද දඹිවාහනජාතකයෙහි මණිලබ සූකර වශනුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

සැවැත්නුවර වතාහි සිරිලකඛණ කම්වූ එක්තරා බ්‍රාහ්මණයෙක් වාසය කෙරෙයි. ඔහු එක් දිනක් "මොහු දිළින්දෙක් වී නැවත ඉසුරුමතෙක්වූයේය. ඒකාන්තයෙන් මම "මොහුගේ ශ්‍රිය සොරුගෙන යන්නෙමි"යි සිතා අන්පිඬු මහසිටුහුගේ ගෙට ගියේය. සිටුහුගේ වතාහි සියල්ල සුදුවූ සේදු සඟක් හා සමානවූ රන් මැදිරියකැ තබා ඇතිකළ කුකුළෙක් ඇත්තේය, ඔහුගේ ශිබාභෙහි ශ්‍රිය පිහිටියේය. බමුණුතෙමේ එහි ගොස් සිටුහු විසින් කළ සත්කාර සම්මාන ඇත්තේ 'මක්නිසා මෙහි පැමිණියෙහිද'යි විමසූ ලදුයේ කොයිබ වතාහි ශ්‍රිය පිහිටියේදැයි බලන්නේ ඒ කුකුළාගේ ශිබාභෙහි

යයි දැන "මහසිටාණෙනි! මම පන්සියයක් මානවකයන්ට මන්ත්‍ර උගන්වම්. නොකල හඬලන එක් කුකුළෙක් නිසා ඔවුන්ත් අපිත් පෙළෙමු. මේ කුකුළා නම් කලට හඬලන සුලුය මොහු පිණිස්ස මම ආමි, මොහු මට දෙව"යි කීයේය. "මම නුඹට කුකුළා දෙමි ගනුව"යි කීයේය. "දෙමි"යි කී කෙණෙහිම ශ්‍රීය ඔහුගේ ශිඛායෙන් අස්වී භිස්දෙර තබතලද මැණිකෙහි පිහිටියේය. බමුණා එයද නා මැණිකද ඉල්වීය, මැණිකද"දෙමි"යි නා කෙණෙහිම ශ්‍රීය එයින් අස්වී ගොස් භිස්දෙර තබතලද අරක්යටැ පිහිටියේය. බමුණා එයද දැන එය ඉල්වීය එයද "දෙමි"යි කී කෙණෙහිම ශ්‍රීතොමෝ එයින් අස්වී ගොස් සිටුහුගේ පුඤ්ඤලක්ඛණා නම්වූ අගබිසවගේ හිසෙහි පිහිටියේය, බමුණාඑයද දැන, මෙය නම් නොදියහැකි වසතු මෙන, ඉල්වන්නටද නොමසුදුසුය'යි හිතා සිටුනට නත්වූපරිදි කියා ශ්‍රීයසොරා නන්නට නොකැක්කෙමි ඔබතුමාදය ඔබටම වේවායි කියා ගියේය.

"සිරි"යනු ඓශ්වර්‍යයි, යමක් සඳහා දෙවතාසංයුත්තක සෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් "සිරී හොති නමාසයෝ"යි වදාරනලදද එහෙයින් "සිරී"යනු ඓශ්වර්‍යය "ආසයෝ" යනු වාසස්ථානය, ඓශ්වර්‍යය අභිමුඛවූ කල්හි දිය හොඬදෙකින්ම සම්පත්තිහු පැමිණෙත්මය යන මෙය වදාරනලද්දේය අදීකථායෙහි කියනලද්දේය. එහෙයින් ඒ ශ්‍රීතොමෝ පුණ්‍යානුභාවයෙන් සිඹවන්නීය, ඕතොමෝ අතීවඝණයන් පුණ්‍යසම්පත්තියයි පුණ්‍යඵලයමැයි. එසේ හෙයින් මදටින් ඇත්තේ නොහොත් පින්නැත්තේ අනුන් විසින් දෙනලද ශ්‍රීය ගන්ටද නොහැකිවූයේමැයි.

පින් නැති බව තොමහුල් බවට නිදසුන් වශයෙන්දක්වනලද

සිරිසොර වස්තුව යි

ඒ බමුණු ඉන් බැහැර ගියහල අනේපිඬුමහසිටාණෝ දෙව් රම්ව ගොස් මේ සියලු පුවත් ශාස්තෘන් වහන්සේට සැලකළේය, ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "ගෘහපතිය! අනුන්ගේ ශ්‍රීය අන්තැනකට නොගියේ දැන්මතුද නොවෙයි. පෙරත් පින් නැත්තහු විසින් උපදවකලද සිරිතොමෝ වනාහී පින්වතුන්ගේ මේ පාමුලට පැමිණියාමැය"යි වදාරා ඔහු විසින් යාඤ්ඤකරනලද දිපදෙතනම සවීඤඤන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගියදවස බරණැස්නුවර එක්තරා කාෂ්ඨහාරකයෙක් හෙවත් දරඅදින්නෙක් වූයේය. ඔහු එක්දිනක් වනයෙන් දර ගෙන එන්නේ කලින් නුවරදොරට පැමිණෙන්ට නොහැකිව සවස එක් දේවාලයෙක්හි නොන්නේය, ඒ දේවාලයෙහි බාර පිණිස ගෙනවුත් හරිනලද බොහෝ කුකුලෝද ඒ සමීප රුකෙක හොත්නාහුය, එහි මතුභාගයෙක්හි හොඳියාවූ එක් කුකුලෙක් අළුයම් වේලෙහි යටභාගයෙක්හි හොත් කුකුළෙකුගේ ශරීරයෙහි මලපිඬක් බැහිය. එවිට "නවරෑ විසින් මාගේ ශරීරයෙහි වළිස් හෙලනලදදැ"යි හිතලා "නොදැන මවිසින් හෙලන ලදැයි"යි කියා නැවතත් හෙළීය. එවිට ඔහුදෙදෙනම "තෑගේ කුමන බලයක්ද? තාගේ කුමන බලයක්දැ"යි කියා කලහ කළාහුය. ඉක්බිති යට සිටි කුකුළා "මා මරා අහුරෙහි පුලුස්සා මස් කෑකෑනැත්තේ උදැහැනව කෑවිණු දැහැක් ලබන්නේය"යි කීයේය. මත්තෙහි සිටි කුකුලා වනාහි "එම්බල හීනය! තෝ මෙපමණකින් ගජිනා භාරන්නෙහිය, මාගේ සාරාංශය කෑකෑන්නේ රජවෙයි පිටවාංශය කෑකෑනැත්තේ පුරෝහිතයෙක් වී නම් සෙනෙවි තනතුරු ලබයි සන්ත්‍රීන් වී නම් අනමෙහෙයි තනතුර ලබයි අෂ්ඨීමාංශය හෙවත් ඇටමස් කෑකෑන්නේ වනාහි ඉදින් ගිහිගෙක් වී නම් භාණ්ඩාගාරික තනතුර ලබයි. පැවිද්දෙක් වී නම් රාජකුලූපගභාවය ලබාය"යි කිය. කාෂ්ඨහාරකයා ඔවුන්ගේ වචනය අසා වනවහා ගසට නැඟ මත්තෙහි සිටි කුකුළා අල්වා ගෙන මරා "රජවන්නෙමි"යි ගෙට ගෙනගොස් "මේ කුකුළුවාංශය මහාකොට සදව,"යි බිරින්දට දුන්නේය, ඕතොමෝ එසේ කොට "ගිමිය! අනුභව කරවයි" එලවා තැබිය. "සොඳුර! මේ මාංශය මහත් අනුභාවයක් ඇත්තක මෙය අනුභව කොට මම රජවන්නෙමි නුඹ අනමෙහෙයි වන්නෙහිය නුඹ බත්ද මස්ද ගෙන වරෙන්න මම ගඟෙහි නහා අනුභවකරන්නෙමු"යි කියා ඒ දෙදෙනම හොස් බත්බදුන ගඟ තෙරැ තබා නාන්නට බැස්සාහුය. එකෙණෙහි වාතයෙන් කැළඹියාවූ දිය බත්බදුන ගෙන ගියේය. එතැල හස්තාභාවඥාවූ එක්තරා මහා ඇමතිගෙක් ඇතා තෙවමින් සිටියේ ගඟබැඩ පහරින් පාවී එන්නාවූ එය දැක ඔහුවා ගෙන ඒ හැම දැක එය වස්වා බිරින්දට හැවීය. කාෂ්ඨහාරකයා වනාහී මූවැ පිටියි වැලි දියෙන් පිරී ඉදිමී ගිය බඳ දැක්කේ පලාගියේය. එක්බිති හස්තාභාවඥයාණන්ගේ කුලූපගවූ දිවැස්ඇති සවුත්තක්ගෙමේ රජ උයනෙහි වසන්නේ "මාගේ උපස්ථායකයා හස්තාභාවඥතන

තුර අත්තොහරිසි කවදා වත්තානි සැපතක් පැමිණෙන්නීදැයි දිව සින් බලන්නේ එතැන්හි දැන පළමුකොට නොස් හස්තාවාහීයාගේ හෙයි හුන්නේය. ඔහුද අවුත් හුන්නේ ඒ බත්බදුන හෙන්වා තවුසන්ට දුන්නේය. තවුස්තෙමේ ඝණමාංශාදිය කොටස් කරවා ඝණමාංශය හස්තාවාහීයාටද පිටත මාංශය ඔහුගේ බිරින්දටද දෙවා ඇටවස් තෙමේ අනුභව කොට "නුඹ මෙයින් තුන්වන දිනෙහි රජවන්නෙහිය සිහියේ තබාගනුව'යි කියා ගියේය. තුන්වන දිනෙහි වනාහි එක් ප්‍රත්‍යන්ත රජක් අවුත් බරණැස වටලැවේය. එවිට රජතෙමේ හස්තාවාහීයා රජවෙස් ගන්නවා "තෝ ඇතුපිට නැග යුඬ කරව"යි කියා තෙමේ අප්‍රතිබලවේගයෙන් සේනාවබ්‍යූහයෙහි හැසිරෙන්නේ මහා වේගයෙන් හරිනාලද එක්තරා ගිපකරක් වැදී එකෙණෙහිම මළේය. හස්තාවාහීයා ඔහු මළබවදැන බෙහෝ කනවණු බැහැරකරවා තෙවන් විසුරුවා යවා 'ධනයෙන් ප්‍රයෝජන ඇත්නෝ යුඬ කෙරෙන්වා"යි කියා අණබෙර ලැවීය. බල සෙනඟ මොහොතින්ම සතුරුරජු ජීවිතක්ෂයට පැමිණවීය. ඇමතියෝ තමරජුගේ ශරීරය ආදහන කරවා "රජ්ජුරුවෝ ජීවත්වන්නේම තමන්ගේ වේහෘය මොහුට දුන්නේය මෙතෙමේම යුඬ කොට රාජ්‍යය ගත්තේය මොහුටම රාජ්‍යය දෙමුය"යි ඇමතිසභාගෙහි මන්ත්‍රණය කොටැ හස්තාවාහීයා රාජ්‍යයෙහි අභිෂේක කොට ඔහුගේ භාර්‍යාව අගමෙහෙසිය කළාහුය. තවුසාණන්ද රාජකුලූපගවූයේය.

පෙරපින් නැත්තහු විසින් නිපදවනලද ශ්‍රීය පින්වත්හු කරා පැමිණීබවට නිදසුන් වශයෙන් හෙතෙහැර පානලද කණ්ඨාභරණයනුව මෙතෙකින් නිමවනලද්දේය.

සකරුමරලොක ශිවංකරවූ තථාගත සම්මා සම්බුදුරජාණන්වහන්සේ මෙසේ ඉකුත්වත් හෙතෙහැර දක්වා වදාරා ඕනට ධර්මදේශනා කරවදාරතසේක් **නිකනිපාතෙසු සිරිංවොර ජාතකෙසුහි** මේ ගාථාවන් වදාළසේක.

"යං උසභුකකා සංඛරනති අලක්කිකා බහූ ධනං,
සිපපවන්තා අසිපපං වා ලක්ඛිවා භාති භූසජ්ජති.
සබ්බත්ථ කතපුඤ්ඤස්ස අනිවත්තිපුඤ්ඤවා පාණිනෝ,
උපපජ්ජන්ති බහූ භොගා අපිනාගතනෙසුපී"ති.

එහි සංක්ෂෙප අදහස නම්:—

ධනරැස්කිරීමෙහි අභිලාෂ ඇත්තාවූ ඒ සේම උත්සාහවත් බවට පැමිණියාවූ ශ්‍රේෂ්ඨිලක්ෂණාදීන්ගේ වශයෙන් ලොකයෙහි විද්‍යමානවූ ශිල්පයන් අතුරෙන් යම් කිසි ශිල්පයක් හෝ බෙහෙවක් දන්නාවූ හෝ නොදන්නාවූ හෝ යම් කිසි නොකොළපින් ඇති පුරුෂයෝතුමූ යටත් පිරිසෙසින් වැටුප් පමණින් කම්මාන කොට නමුත් දුකින් හිරිහැරයෙන් බොහෝවූ යම් කිසි ධනයක් රැස්කෙරෙද්ද ඒ සියලුම ධනය පින්වත්වූ අනික් පුරුෂයෙක්ම ඔහුගේ පුණ්‍යබලය සරණ කොටගෙන කිසිම කම්මාන දියක් නොකොට පරිභොග කරන්නේය. ඔහු කෙරෙන් අන්‍යවූ නොකළ පින්ඇති සත්වයන් ඉක්මවා සියලු තන්හිම එනම් රත්නාකර නොවන තන්හි හෙවත් රත්නයන්ට උපත්තිස්ථාන නොවන තන්හි රත්නයෝද යවණිණාකර නොවන තන්හි සුවණ්ණයෝද හස්ත්‍යාශ්වාදන නොවන තන්හි හස්ත්‍යාදීහුද යන මේ සියලු තන්හිම අව්‍යාකුණ්ඩකසව්සුඛුණකවූ මේ බොහෝ භොගසම්පත්තිහු පෙරපින්කළ පුරුෂයාහවම් උපදනාහුය.

ඔවුනතුරෙන් අනාකරයෙහි මණිවුකනාදීන්ගේ උත්පත්තියෙහිලා දුඨගාමිණී අභය රජ වසතුව කියයුත්තේය,

රුහුණුජනපදයෙහි වනාහී මාගම රජය කරවන්නාවූ කාවන්තිස්සමහරජහට දුටුගැමුණු අබය නම් පුත්‍රයෙක් වූයේය. ඒ දුටුගැමුණු අබය කුමරතෙම පියරජහුගේ ඇවෑමෙන් එහිම රාජ්‍යය කරවා එයින් අවුත් එළාර නම්වූ දෙමළ රජු මරා ලක් දිවැ අනුරාධපුර නුවර අභයාය රජවිය.

ශාස්තෘන් වහන්සේගේ පරිනිර්වාණයෙන් හවුරුදු තුන්සියයකින්මතු දෙසැත්තැවෙනි වර්ෂයෙහි හෙවත් බුබවර්ෂ තුන්සිය දෙසත්තැවෙහිදී ඔහුගේ පුණ්‍යානුභාවයෙන් අනුරාධපුරාභාත්පස සවණිණබීජාදීහු උපන්නාහුය. ඒ එසේමැයි, පුරයෙන් ඉසානදෙසැ තුන්යොදුනකින් මත්තෙහි ආවාරවිටි නම් ගමැ සොළොස්කිරියක් පමණවූ භූම්ප්‍රදේශයෙහි ප්‍රමාණයෙන් නානාප්‍රකාරවූ සවණිණබීජයෝ උපන්හ. උඩත්පිරිසෙසින් විසත් පමණ හා යටත් පිරිසෙසින් අඟුල් පමණද වූහ. සවණිණයෙන් පිරුනාවූ ඒ භූමිය ඒ ගම්වැස්සෝ දුක තලියක් පිරුරන් ගෙන ගොස් රජහට සැලකළහ. පුරයෙන් ඉදුරුදෙසැ සත්යොදුනකින් මත්තෙහි ගඟඑතර තඹවිටි නම් ගමැ තඹලොනෝ උපන. එගම්වැස්සෝ තලියකින් තඹලොහෝ බිඳුවට ගෙන රජුරු

වින් කරා එළඹ ඒ කාරණයද සැලකළහ. පුරයෙන් බිහිකොන් පෙදෙසැ සතරයොදුනක් දුර සමීන්වැව් නම් ගමැ බොහෝ මැණික් උපත. එගම්වැස්සෝ උපුල් කුරුවින්දගල් හා මිශ්‍රවූම ඒ (මැණික්) තලියකින් ගෙනවුත් රජහට සැලකළහ. නුවරින් දකුණු පසැ අටයොදුන් මත්තෙහි අඹඋකොල නම් දනව් වෙහි ලෙණක රිදී උපත. නුවරවැසි වෙළෙන්දෙක්තෙමේ බොහෝ ගැල්ගෙන මලයරටින් හිඟුරු ආදිය ගෙනැත්තු පිණිස ඒ රටබලා යතුයේ ලෙණට නුදුරු තන්හි ගැල්නබවා කැමිවිලි සොයන්නේ ඒ පළිතයට නැංගේය. එසේ නැන සැලියක් පමණ පලයක් ඇත්තාවූ පලබරින් නැමුනාවූ කොස්පැලයද ගලක් පිට පිහිටි ඒ පලයද දැකැ එය පිහිගෙන් තුවටුව කපා "අගස්දනක් දෙමැ"යි සිතා ශ්‍රබ්ධගෙන් සංඝයාට කාලඝොෂා කෙළේය. එවිට රහත් සතර නමක් වැඩියහ. එයින් සතුටුවූයේ උන්වහන්සේලා වැඳ ආදරසහිතව වැඩහිඳුවා පිහිගෙන් එය තුවටුව හාත්පස සිවියකපා වහලලමුදු ආවාටය පුරාහිටි යුස පතින්ගෙන යුසින් පුරවනලද ඒ පාත්‍රාසතර උන්වහන්සේලාට ප්‍රදානය කෙළේය. උන්වහන්සේලා ඒ පිළිගෙන වැඩියහ. ඒ වෙණදතෙමේ නැවතත් කාලඝොෂා කෙළේය. අන්‍යවූ අහීන් සථවිරවරු සතරනමක් එහි වැඩියහ. හෙතෙම උන්වහන්සේලාගේද පාත්‍රයන් ගෙන වරකා මදුරුලන් පුරවා පිළිගැන්වූයේය. උන්වහන්සේලා අතුරෙන් තුන්නමක් බැහැර වැඩියහ. එක්වහන්සේ නමක් නොවැඩිය සේක. ඒ සථවිරයන් වහන්සේ ඕහට රිදී දක්වනු පිණිස එතැනින් බැහැ ලෙණසමීප යෙහි වැඩහිද ඒ මදුලු වැළදුසේක. වෙණදතෙමේද ඉතිරිවූ මදුලු කුසපුරා අනුභව කොට ඉන් අවශෙෂය පොදියකින් ගෙන සථවිරයන් වහන්සේගේ පාඅනුව ගියේය. එසේගොස් සථවිරයන් දැක වතාවත්ද කෙළේය. සථවිරතෙමේද ලෙණ දෙරින් ඕහට මාගීයක් මැවූසේක; හෙතෙම් සථවිරයන් වැඳ ඒ මගින් යන්නේ ලෙණ දුටුයේය. ඒ උතුම් වෙණදතෙමේ ලෙණදෙරැ සිට රිදීද දැක පිහිටයන් ගසා රිදීගසි දැන එක් රිදී පිඩක් ගෙන ගැල් සමීපයට ගොස් ගැල් එහි තබවා ඒ රිදී පිඩ ගෙන මහා අනුරාධපුරයට අවුත් නරෙන්ද්‍රයන්ට රිදී දක්වා ඒ කාරණය දන්වූයේය;

පුරයෙන් බටහිරපසැ යොදුනකින් මත්තෙහි උරුවෙල් පටුනෙහි මහඇඹුලුපල පමණවූ මුතුපල අතරතුර පබුලු සමිග

මුහුදින් ගොඩනැංගහ. (ඒ මුහුදුබඩ වැසි) කෙවුලෝ ඒ දැක පබුලු සමඟ මුතු එකතුකොට ගෙනවුත් රජ්ජුරුවන්කරු එළඹැ ඒ කාරණයද සැලකළහ. නුවරින් උතුරුපසැ සත්ගෝ දුනකින් මත්තෙහි පෙළවැව් නම් ගමැ වැව පිළිසි කදුරැලි යෙනි වැලිපිට ඇඟුරැම්නල් පමණ දියබෙරලිය මල්වන් පැහැ ඇති ගඟපත් උතුම් මිණිරුවන් සතරෙක් උපන්හ. බලුවැද්දෙක්තෙමේ ඒ දැක රජ්ජුරුවන්වෙත අවුත් මවිසින් මෙබඳු මිණිරුවන් දක්නා ලදහසි සැලකෙළේය; මහ පිනැති ඒ රජතෙමේ මඟසැඟ පිණිස උපන් ගබොල්ආදී මේ ද්‍රව්‍යයන්ද එදවස්ම ඇසුයේය; සතුටුසිත්ඇත්තේ සුදුසු පරිද්දෙන් (ප්‍රවෘත්තිදුන්වූ) ඔවුන්ට සත්කාර කොටැ ඔවුන්ම රැක මිරණකරුවන් කොට ඒ සියලු ද්‍රව්‍යයන් ගෙන්වා ගත්තේය; කළපින්ඇත්තාහට අනාකරයෙහිත් මාණික්‍ය මුක්තාදීහු උපද දනැබවට නිදසුන් වශයෙන් ගෙණහැර පාතලද මහවසැ අට විසිවන පරිවෙජදශෙහි දුළුගාමිණී අභයරාජ වසතුව මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

දසබලධාරිවූ බුදුරජාණන් වහන්සේ මේ ගාථාවයවදාරා නැවත "ගැහැවිය! මේ සත්වයන්ට කුසලය හා සමවූ අනික් ආයතනයක් නම් නැත්තේය. පුණ්‍යවන්තයන්ට වනාහී අනාකරයන්හිත් රත්නයෝ උපදනාහුමනැ"සි වදාරා නිධිකණ්ඩ සූත්‍රයෙහි කී නයින් දහම් දෙසනසේක් මේ ගාථාවන් වදාළසේක.

"එස දෙවමනුස්සානං සබ්බකාමදදෙනිධි,
යං යදෙවාභි පත්ථෙන්ති සබ්බමෙතෙන ලබ්භති.

සුවණ්ණතා සුස්සරතා සුසණ්ඨාන සුරූපතා,
ආධිපච්චපරිවාරා සබ්බමෙතෙන ලබ්භති.

පදෙසරජ්ජං ඉස්සරියං චක්කවත්තී සුඛංපියං,
දෙවරජ්ජම්පි ද්බෙඛු සබ්බමෙතෙන ලබ්භති.

මානුසිකා ච සම්පත්තී දෙවලොකෙ ච යා රතී,
යා ච නිබ්බාණ සම්පත්ති සබ්බමෙතෙන ලබ්භති.

මිත්තාසම්පද මාඝම්ම යොනිසොව පයුජතෝ,
විජ්ජාවිමුත්තිවසීභාවෝ සබ්බමෙතෙන ලබ්භති.

පටිසම්භිදා විමොක්ඛා ච යා ච සාවක පාරමී,
පච්චෙකබොධි බුද්ධභූමි සබ්බමෙතෙන ලබ්භති.

එවං මහිද්ධිකා එසා යදිදං පුඤ්ඤ සම්පදා,
තස්මා ධීරා පසංසන්ති පණ්ඩිත්‍යා කත පුඤ්ඤතා"නති.

මෙසේ භගවතාණන්වහන්සේ ගුණ ඇතිහෙයින් භාග්‍යවත්වූ මුනීන්ද්‍රයන් වහන්සේ යම්කිසිවෙක්තුමූ ප්‍රොත්සාහයෙන් පුණ්‍යභාග්‍ය තවූ නිධානයක් ක්‍රියාවෙන් සම්පාදනය නෙරෙද්ද ඒ සියලුම දෙවිමිනිසුන්ට ඒ පුණ්‍යනිධානයතෙමේ යම් ඵලයක් දේද ඒ ඵලය "එය දෙවමනුස්සානං සබ්බකාමදදෙ නිධි" යන ප්‍රථමගාථා ප්‍රථමාර්ධයෙන් සැකෙවින් දක්වා තදනන්තරවැ යම් හේතුවෙන් ප්‍රාර්ථනායුක්තයෙක්හටම සියලු කැමති දෑ දෙන බවකුත් එසින් තොරවූවක්හට නොදෙන බවකුත් වේද එසේ නොවෙන් ඒ ඒ කැමති පරිදි සිත උත්සාහවත් කිරීමය අධිෂ්ඨාන කිරීමය වැඩීමය පෙරටුකිරීමය යන ප්‍රාර්ථනාවෙන් යුක්තවේද ඕනට කැමති දෑ දෙන බැව්හි හේතු දක්වන සේක් "යං යදෙවාහි පත්ථෙන්ති සබ්බමෙතෙන ලබ්භති" යන චතුර්යාර්ධය වදාළසේක. ඒ ගාථා වෙහි අදහස නම්:—මේලොකයෙහි යම්කිසිවෙකුත් විසින් දන මයවූ හෝ ශීලමයවූ හෝ භාවනාමයවූ හෝ යම්කිසි පුණ්‍යධර්මයක් සම්පාදනය කරනලද්දේද ඒ පුණ්‍යධර්මය තෙමේ එය සම්පාදනයකළ ඒ සියලුම දිව්‍යමනුෂ්‍යයන්ට සියලු කැමති සම්පත් ගෙනදෙන්නාවූ නිධානයක් වන්නේය. ඔහුතුමූ ඒ මේ පුණ්‍යනිධානය හෙතුකොටගෙන යම්යම් සුවඵලයක් ප්‍රාර්ථනා කෙරෙද්ද ඒ ඒ සියල්ල මේ පුණ්‍ය නිධානය හේතුකොටගෙන ලැබෙන්නේය යනුයි. මෙසේ අනිසම් වශයෙන් දක්වනලද ආනිශංසඵලය නියම වශයෙන් දක්වන සේක් "සුවණ්ණතා" යනාදිය වදාළසේක.

එහි අදහස නම්:-සුන්දරවූ ජවිව්ඤ්ඤ ඇතිබව්‍ය තෙවත් රන්වන් ශරීරව ඤ්ඤ ඇති බවය බ්‍රහ්මස්වර ඇතිබවය තොකොත් කුරව් කෙව්ල්න්ගේමෙන් කවහඬ ඇතිබවය මනා ශරීරසම්පත් ඇතිබවය හෙවත් වැඩි පිරී වවමටසිලුවූ විසයුතු නන්හී අඛ්‍රප්‍රත්‍යඞ්ගයන්ගේ වැඩි පිරී වවමට සිලුවූ භාවයෙන් පිහිටි මය සකලශරීරසංඛ්‍යාතවූ රූපයාගේ සුන්දරභාවය හෙවත් යහපත් රූපඇතිබවය ඉතා දික්නුවූ ඉතා කොවනුවූ ඉතා කෘෂනුවූ හෙවත් නොවැකැරුනාවූ ඉතා ස්ථූලනුවූ හෙවත් ඉතා නොමහත්වූ ඉතා නොකලුවූ ඉතා නොසුදුවූ බවය යන ශරීරසම්පත්තියද අධිපතිබවය හෙවත් ක්ෂත්‍රියමහාසාලාදිභාවයෙන් සභාමිභාවය යන භොගසම්පත්තියද ඥාතිසජ්ජන වූකලී සජ්ජන පරිජන සම්පත්තිය පැමිද්දන්ට පරිවසම්පත්තිය යන පරිවාර සම්පත්තියද මේ ත්‍රිවිධවූ සියලුසම්පත්තියම් ඒ මේ පුණ්‍යනිධානය හෙතුකොටගෙන ලැබෙන්නේය යනුයි.

මෙසේ මේ ගාථාවෙන්, පුණ්‍යානුභාවයෙන් රාජ්‍යසම්පත්තිය යෙන් මොබලැබියහැකිවූ දිව්‍යමනුෂ්‍යසම්පත් දක්වා දැන් ඒ දිව්‍යමනුෂ්‍ය ඝන උභයරාජ්‍යසම්පත්තිය දක්වනසේක් "පදෙසරජ්ජං" යනාදිය වදාළසේක.

එහි සංක්ෂේප අදහස නම්:-එක් දිවසිනක් මුළුල්ලෙහිම රජබවට කොපැමිණ එනඑන ප්‍රදේශයෙහි රාජභාවයද එක් දිවසිනක් මුළුල්ලෙහි ඉසුරුමත් බවට පත්වන චිපවචක්‍රවර්ත්තිරාජභාවයද එක් සක්වළෙක්"හි දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතරවහදිවසිමෙනහි ඉසුරට අධිපතිවූ ඉෂ්ඨවූ මහාපවූ චාතුරන්තචක්‍රවර්ත්තිරාජභාවයද මහාමන්ධාතාදීන්ගේ මෙන් මිනිසත් බැවින් දෙව්ලෝ පැමිණ කරන දිව්‍යරාජභාවයද දිව්‍යනිකායෙහිම උපන්නවුන්ගේ දිව්‍යරාජභාවයද ඝන මේ සියල්ල ඒ මේ පුණ්‍යනිධානය හෙතුකොටගෙන ලැබෙන් නේය. ඝනුහි මෙසේමේ ගාථාවෙන්, පුණ්‍යානුභාවයෙන් ලැබියහැකිවූ දිව්‍යමනුෂ්‍යඝන උභයරාජසම්පත්තිය දක්වා තදනන්තරවැ ඒ සම්පත්තිය සංක්ෂේපවශයෙන් පෙරටුකොට ශාන්ත සුඛලක්ෂණවූ නිර්වාණසම්පත්තිය දක්වනසේක් "මානුසිකා ච සම්පත්තී" යනාදිය වදාළසේක.

එහි අදහස නම්:—මිනිසුන් පිළිබඳවූ මිනිසුන් විසින් ලැබියහැකිවූ සක්විති රජබැව් අවසන් කොට ඇති යම් පමණ මනුෂ්‍යසම්පත්තියක් ඇද්ද ශක්‍ර සුයාම සන්තුෂිතාදී දෙවියන් පිළිබඳවූ දෙවියන් විසින් ලැබියහැකිවූ යම් පමණ දිව්‍යසම්පත්තියක් ඇද්ද මේ ලෞකිකවූ විවිධ සම්පත්තිය පෙරටුකොට ඇති තෘෂ්ණාදී සකලක්ලේශාග්නි නිර්වාපනසංඛ්‍යාත හෙවත් වාන්තදුඛොපන ඝන සංඛ්‍යාත ලොකොත්තරවූ නිර්වාණසම්පත්තියක් ඇද්ද ඝන මේ ත්‍රිවිධ සම්පත්තියම මේ පුණ්‍යනිධානය හෙතුකොටගෙන ලැබෙන්නේය ඝනුහි.

මෙසේ මේ ගාථාවෙන්, පුණ්‍යානුභාවයෙන් ලැබියහැකිවූ ශ්‍රද්ධානුසාරිභාවාදීන්ගේ වශයෙන් පැමිණිය හැකිවූ නිර්වාණසම්පත්තිය දක්වා, තදනන්තරවැ ත්‍රිවිද්‍යාය උභතොභාග විමුක්ත භාවය ඝන මොවුන්ගේ වශයෙන් පැමිණිය හැකිවූ ඒ නිර්වාණය ද ඒට මහාහේතුවූ උපායද දක්වනසේක් "මිත්තසම්පදමාගම්ම" යනාදිය වදාළසේක.

එහි අදහස නම්:—යමෙක්තෙමේ ශාස්තෘන්වහන්සේ නමක් හෝ වෙන යම් ගරුකමයුතු සබ්‍රහ්මචාරියෙකුගෙන් හෝ ඝන මිත්‍රසම්පත්තියක් ආශ්‍රය නිශ්‍රය කොට උන්වහන්සේලා

කෙරෙන් අවවාද අනුශාසනා රූපගත ඒ අවවාද අනුශාසනා පරිදි ප්‍රතිපත්තියෙහි මනාහෙතුවූ උපායෙන් යොගානුෂ්ඨා නය කරන්නේද ඕහට පූජෝනිවාසානුස්මෘතිය දිව්‍යචක්ෂුඃය ආශ්‍රවක්ෂයඥානය යන ත්‍රිවිද්‍යාවය අෂ්ටාඞ්ගසමන්විත නිර්වාණ ප්‍රභෙදවූ විමුක්තිය යනමෙහි ඒ ඒ පරිදි අනලසභාවයෙන් වසඟවවය යන මේසියල්ල මේපුණ්‍යනිධානය හෙතුකොටගෙන ලැබෙන්නේය යනුයි

මෙසේ මේ ගාථායෙන්, පුණ්‍යානුභාවයෙන් ලැබිය හැකිවූ ත්‍රිවිද්‍යාභාවාදී වශයෙන් පැමිණිය හැකිවූ නිර්වාණසම්පත්තිය දක්වා, දැන් ගම්භේකින් විද්‍යාවිමුක්තිවසීභාවප්‍රාප්තයෝද ත්‍රිවිද්‍ය උභතොභාගවිමුක්තයෝද යන සියල්ලෝම ප්‍රතිසම්භිදාදි ගුණ සම්පත්තිය නොලබද්ද පුණ්‍යසම්පත්තිය ඒ ප්‍රතිසම්භිදාදි ගුණ සම්පත්තියට කාරණා වශයෙන් පවත්නා හෙයින් මේ පුණ්‍ය සම්පත්තියම හෙතුකොටගෙන ඒ ප්‍රතිසම්භිදාදි ගුණසම්පත්තියත් ලැබේද එහෙයින් හෙද දක්වනසේක් "පටිසම්භිදා විමොක්ඛා ච" යනාදිය වදළසේක.

එහි අදහස නම්:—ධම්මාභිසමයනිරුක්ඛත්තිප්‍රතිභාන යන මේ සත රෙහි ප්‍රභෙදයට ගිනාවූ ප්‍රඥාවද "රූපී රූපානි පස්සති' යනාදී වශයෙන් වදාරනාලද අෂ්ටලෞකික විමොක්ෂයෝද ශ්‍රාවකයන් විසින් ලැබිය හැකිවූ ශ්‍රාවකසම්පත්තිය සිඳුකරන්නාවූ ශ්‍රාවක පාරමීඤ්ඤණයද සවයම්භූ භාවය සිඳුකරන්නාවූ ප්‍රත්‍යේකබෝධි යද සම්සම්බොත්තම භාවය සිඳුකරන්නාවූ බුබහුම්යද යන මේ සියලුම මේ පුණ්‍යනිධානය හෙතුකොටගෙන ලැබෙන්නේය යනුයි

මෙසේ භාග්‍යවතුන් වහන්සේ "යං යදෙවාභිපත්ථෙන්ති සබ්බමෙතෙන ලබ්භති" යනුයෙන් යමක් වදාරනලදද එය මේ පස්ගයකින් නියමවශයෙන් දක්වා දැන් සබ්බකාමදදනිධිසංඛ්‍යා තවූ මේ සකලපුණ්‍යසම්පත්තියට පසඟ සේක් අවසානගාථාව වදළසේක.

එහි අදහස නම්:—එඹා ගෘහපතිය! යම් බදුවූ මේ පූජෝකත සම්පත්තියක් වේද. මේ පුණ්‍යසම්පත්තොමෝ මහත්වූ අර්ථය ප්‍රණීත පවත්නීය. එසේ හෙයින් ධීරවූ ප්‍රාඥයෝ පෙරකරනලද පින්ඇති බව වණ්ණිතාකරන්නාහුය. මේ කෙළෙස්ද යන්?

("අසාධාරණමඤ්ඤං අවොරා භරඤ්ඤා නිධි,
කඤ්ඤථ ධීරා පුඤ්ඤානි යෝ නිධි අනුගාමිකෝ"ති.)

යනුයෙන් මේ පුණ්‍යසංඛ්‍යාතවූ නිධානය අන්‍යයන්ට අසාධාරණවූ රජ සොරසතුරුආදීන් විසින් පැහැරනොහන කැකිවූ නිධානයෙක, එසේහෙයින් නුවණැත්තෝ දානමය ශීලමය භාවනාමයවූ ත්‍රිවිධකුසලසංඛ්‍යාත පුණ්‍යනිධානය කරව් එය සසරට තමන් නැටුවයන්නාවූ අනුගාමික නිධානයකැයි කීයාද "මාභික්ඛවෙ! පුඤ්ඤානං භායිථ සුඛස්සෙතං භික්ඛවෙ! අධිවචනං යදිදං පුඤ්ඤානී"ති යනුයෙන් මනණෙති! පිනට බියනොවව් මනණෙනි! පිනයයන මේ යම්ක් වේද මෙය සැපයට නමෙක යනාදී ඇඟුනකරයෙහි වදාළ වචනයන්ගෙන්ද පෙරකරනලද පින් ඇතිබව වණ්ණනාකරන්නාහුය. මෙසේ සර්වයන්ට ත්‍රිවිධ සම්පත්තිප්‍රදායී හෙයින් පෙරකළ පින්ඇතිබව මඟුල් නම් වන්නේය.

හුදීජනමනසඤ්ඤනවූ කෘතපුණ්‍යතාමඞ්ගලකථාව මෙතෙකින් දක්වා නිමවනලද්දේය.

භවාභවයන්හී දුවමින් නිතර සසරදුකට පැමිණෙන සිත හෝ මුළුආත්මභාවයම පෙරකරනලද පින්ඇත්තහු විසින් මනාසේ පිහිටුවාලිය හැකි බැවින් කෘතපුණ්‍යතාමඞ්ගලකථිකයට අනතුරුව අත්තසම්මා පනිධි මඞ්ගලකථනය කියනුලැබේ. එහි අත්ත ශබ්දයෙන් සිත කියනලද්දේය. එයින්ම සකලආත්මභාවයම හෝ කියනලද්දේය. කුමක්හෙයින්ද යත්? ඒ දෙකම චනාහී කුදුමහත් භවයන්ට දුවමින් ජාතිජරාදිප්‍රභෙදඇති. සසරදුකට නිතර පැමිණෙනහෙයිනි.

"අත්තසම්මාපනිධි නාම ඉධෙකච්චෙ අත්තානං දුස්සීලං සීලෙ පතිට්ඨාපෙති. අස්සද්ධං සද්ධාසම්පදාය මච්ඡරිං චාගසම්පදාය පතිට්ඨාපෙති අයං වුච්චති අත්තසම්මාපණිධි" එහි සංක්ෂෙප අදහස නම්:—මේ ලොකයෙහි ඇතැම් පුගුලෙක්තෙමේ දුස්සීලවූ චිත්තය ශීලයෙහි පිහිටුවයි ශ්‍රද්ධා විරහිතවූ චිත්තය ශ්‍රද්ධාසම්පත්තියෙහි පිහිටුවයි මසුරුමලින්යුත්චිත්තය ත්‍යාගසම්පත්තියෙහි පිහිටුවයි මේ අත්තසම්මාපණිධියයි කියනුලැබේ-යනුයි-

ඔවුනතුරෙන් 'ශීලගුණවිරහිතවූ සිත ශීලගුණයෙහි පිහිටුවයි' යන මෙකරුණෙහිලා කථාවසතුවක් කියනුලැබෙයි.

පෙර කසුප්බුදුසෙමෙහි පන්සියයක් තොරහු ගම්පැහැරීම් ආදියකොට තොරකමින් ජීවත්වූහ. ඔහු තුමූ එක්දිනක් මිනිසුන් විසින් ලුහුබඳනාලදින් පැනයන්නාහු වල්වැද එහි විසූ එක්තරා වනවාසී භික්ෂුවක් දැක උන්වහන්සේවෙත ගොස් වැඳ "සවාමිනි! අපට පිහිටවූව මැනවැ"යි කීහ. ඒසථවිරයන් වහන්සේ "ශීලය හා සමවූ පිළිසරණක් නම් නොම ඇත්තේය. එනිසින් තෙපි සියල්ලෝම පන්සිල් සමාදන්වව්ය"යි කියා ඔවුන් ශීලයෙහි පිහිටුවා "දැන් තෙපි සිල්වත්හුය දිවිනියාවුවත් සිල් තොබිඳිව්. වෙෂදතොකරව්ය"යි අවවාද කෙළේය. ඔහුතුමූ මැනවැයි එසේ පිළිගත්තාහුය. එක්බිති ඔවුන් ලුහුබැඳ ආ මනුෂ්‍යයෝ එතැනට පැමිණ ඒ සියල්ලන් මැරුවාහුය. ඔහුතුමූ තෙකඩවූසිල් ඇත්තෝවම් කලුරිය තොට දෙව්ලොවැ උපන්හ. ඔවුනතුරෙන් දෙටුසොරතෙමේ දෙටුදෙව්පුත් විය. ඒ සියල්ලොම අනුලොම් පිළිලොම් වශයෙන් එක් බඹාන්තරයක් දෙව්ලොවැ සැරිසරා මෙබුදුසෙමැ ඉන් සැව සැවැත්නුවර සම්පත්‍යයෙහි පන්සියයක් කුලඇති කෙවුළුඟමෙහැ උපන්හ. ඔවුනතුරෙන් දෙටු දෙව්පුත්තෙමේ දෙටුකෙවුළාගේ කුලයෙහි ඉපිද යසොජ නම් කුලපුත්‍රයෙක් වී ඔවුන්ට අග්‍රපුරුෂයෙක් විය. අනික් දිව්‍යපුත්‍රයෝ අනික් කෙවුළන්ගේ කුලයන්හි උපන්නාහුය. ඒ කෙවුළෝ එක්දිනක් අචිරවතී නදියෙහි දූලක් බහා රන්වන් මසෙකු ලැබ මේ මස්‍ර රන්වන්ය මොහු අපරජුට දක්වන්නෙමුයි කියා ඔරුවෙක බහා ඔරුව ඔසවාගෙන ගොස් කොසොල්රජුනට දැක්වූවාහුය. කොසොල්රජ්රුවෝ ඔවුන්ලවා ඔරුව ගෙන්වාගන දෙව්රම්වෙහෙරට ගොස් ශාසනයන් වහන්සේට දැක්වූයේය. ඒ දැක ශාසනයවූ බුදුරජාණන්වහන්සේ එය අසෝතපත්ති කොට ඒ අවසථාවට සුදුසු ධර්මයක් දෙසනාකරනසේක් සූත්‍රනිපාතයෙහි කපිලසූත්‍රය දේශනාකොට වදරා තැවත ධම්පියාවෙහි පාපවග්ගයෙහි "මනුජස්ස පමත්තචාරිනො" යනාදීවූ සතරගාථා කෙතෙක් වදුලසේක. ගාථාවසානයෙහි කෙවුළෝ සංවේගපත්වී, ශාසනයන්වහන්සේ වෙතැ පැවිදිවී ඉන් මැතභාගයෙහි උදුනයාගේ නෙවනවහැ යසොජසුතුරෙහි වදුල නයින් රහත්වී විපදෙහතමවූ සම්ඝයන් වහන්සේ සමග ආහාරූපභාර [illegible] ධම්දරිභොගයෙන් එකපරිභොග ඇත්තෝ වූවාහුය.

අනන්තඝම්මාපණ්ඩිතය මහුල්වන බවට නිදසුන් වශයෙන් මේ නගරෙ පාතලද කපිලසුතුරුවැනුමාදියෙහිවූ දුසිල්සිත් සුසිල්සි පිහිටුවා සඟපවඟපත් පන්සියසොරහුවත් මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

සඟසුවගීයෙහි "යෝ ච වස්සසතං ජීවේ දුස්සීලෝ" යනා දීවූ ගාථාවණ්ණනාදියෙහි සංකිච්ච අධිමුත්තතා යන සාමණෙර යන් වහන්සේලාකෙරෙහි පහන්වූ සොරුන්ගේ කථාවසතුවද මේ සඳහා කියයුත්තාහ.

'ශ්‍රද්ධාගුණ විරහිත විත්තයා ශ්‍රද්ධාසම්පත්තියෙහි පිහිටුව'යි යන මෙහිලා මේ මතුපහළවන කථාවසතුව දතයුත්තේය.

රජගහනුවර මිථ්‍යාදෘෂ්ටිකවූ අශ්‍රද්ධාව්‍යතනවූ තුනුරුවන්කෙරෙහි නොපහන්වූ භාරවාජගොත්‍රත නම් බමුණෙක් වාශ්‍රය කෙරෙයි. බුදුන්දහම්සහුන්යයි ඇසුනුනල දෙඅතින් කන්වසයි කිහිරිකණුවක්සේ තමන් ගත් දෘෂ්ටියෙන් නදවූයේ වෙයි. ඔහුගේ බැමිණිය වනාහි ධනඤ්ජානී නම්ය. ඕතොමෝ සෝවාන්ය අවල ශ්‍රද්ධායෙන් යුකත්‍රය තුනුරුවන් කෙරෙහි සිතපහන්ය පිරුවිසෙන්ම යාම්ඊම් ඉදීම් සිටීම් කිවිසීම් කැයීම්කොට නමුත් "නමෝ බුද්ධාය"යි කියා නමස්කාර කෙරෙයි. එක්කිති එක්දවසක් බමුණු නෙමෙ පන්සියයක්බමුණන්ට දිගනුමුසු කිරිබතත් දෙනු කැමැත්තේ සෙට පිණිස බමුණන්ට අමතා බැමිණියට මෙසේ කියා සොඳුර! සෙට අපගේ ගෙහිබවුණෝ අනුභව කරන්නාහුය. යම්බදුවූ කී ඒ මුඩුමහණහට යම් නමසකාරයක් කරන්නීද එය එකම සෙටදිනට පමණක් නොකරව එය අපා බමුණෝ නොස තුටු වන්නාහුය බමුණන් මා කෙරෙහි නොකලකිරුව"යිකියායි. එවිට ඕතොමෝ "බමුණ! නුඔබමුණන් කෙරෙන් බිදෙතුදු දෙවි යන් කෙරෙන් බිදෙතුදු මම නම් ඒ ශාස්තෘවූ බුදුරජතුමන් සිහිවූ විට නමස්කාර නොකර සිටින්නට නොහැක්කිමැ"යි කියා එවිට බමුණු කඩුව ගෙන "බොල කෙල්ල බැමිණිය! ඉදින් සෙට ඒ බමුණන් මෙහි අවුත් හුන්කල්හි ඒ මුඩුමහණහට නමස්කාර කෙළෙහි නම් මේ කඩුවෙන් තා කඩකඩ සොට සිදින්නෙමි"යි කියේය. දෙලක්‍ෂයතලිස්දහසක් යොදුන් සතකඩ මහාබොල්පොළොව කම්පාවතුදු ආර්‍යශ්‍රාවකයෝ කම්පානොකොළඹැක්කාහ. සැටඅවදහසක් යොදුන් උසඇති මහාමේරු පර්වතය පෙරළෙතුදු ආර්‍යශ්‍රාවකයෝ නොපෙරළීය හැක්කාහ. එසේ හෙයින් ඕතොමෝ

"සුඵුව මෙ අභිගම්භගානි කාමං ශ්‍රෙෂ්ඨිජ්ඨි බ්‍රාහ්මණ!
තෙවාහං විරම්සාමි බුද්ධසෙට්ඨස්ස සාසනා"නි

එහි බ්‍රාහ්මණය! නුඹ දිවින් මාගේ අත්පාකන්නාසාදී ශරීරාවයවයන් ඒකාන්තයෙන්ම සිදිනෙහි නමුත් ඒ බුඩශ්‍රේෂ්ඨයන් වහන්සේගේ ශාසනයෙන් මම වෙන්නොවන්නෙමියි කියා. ඒ මිසදිටු බමුණා ආඝාතශ්‍රාවිකාවූ ඇයගේ ශරීරයට අතනබන්ට හෝ ගසන්ට හෝ නොහැකිව "නී කැමැත්තක් කරව්" යි කියා කඩුව ඇදෙහි දමා හැසුරේය. දෙවන දිනෙහි බමුණා බමුණන්ට කිරිඛත පිළියෙළකරවා කල්දැන්වූකල ඔවුහු අවුදින් නිදහත්තාහුය. බමුණාද ඔවුන් හා එකපෙළට නිදහත්තේය. එකල බැමිණිතොමෝ රන්සැන්ද ගෙන බත්හලෙහි බමුණන් අනුභව කරවන්නී ඒ භිමි බමුණුනට බත් ඵලවන්නී නොසසස්ව තුබූ දැවකඩෙක පාහැපී දුඃඛවූ වෙදනාවක් ඉපිද එකෙණෙහිම බුදුන් සිහිවී බත් බදුන බිමතබා දෙහොත් මුදුන්කොට වේළුවනාරාමය දෙසට වැඳ මහානමස්කාර පාඨය තුන්යලක් ප්‍රකාශතළාය. එකෙණෙහි ඒ බමුණන් අතුරෙන් සමහරු අනුභවකොටැ අවසන්ය සමහරු අනුභව කරන්නා සමහරු ගත්අහර අත්හි ඇත්තෝ සමහරුන්ට බත් බදුන් ඉදිරියෙහි තැබුවා පමණෙක ඔනුතුවූ ඇයගේ නවස්කාර හඬ අසාම මහමෙර පමණ මුගුරකින් හිස්හි ගසනලද්දාක්හු මෙන්ද සාන්හි යහුල් ගසනලද්දාක්හුමෙන්ද දුක්දෙම්නස්විදින්නාහු "මේ අන්‍යලිඞ්ගියෙකු විසින් ගෙදරට අපි පමුණුවනුලදු මහැ කියා කිපී අතින්ගත් බත් පිඩු දමාගසා මුවෙහිතුබූ බත් පිඩු කාරු කෙළගසා බැහැර දමා බමුණුනට බැණදෙඩා හිඳක. බමුණාද බැමිණියට නොයෙක් ලෙසින් රොස්පරොස්බස් බැණදෙඩා කිසිවක්කරන්නට නොහැකිවන්නේ "වෙසේම මේ සැඩොලී යම් ඒ කොයිබදීවුවත් ඒ කුළුරළුවුඩුවන්නුගේ ගුණ කියා එම්බල රොඩී කෙල්ල! තීගේ ඒ මුඩුවගණහට මම ඵාද නගන්නෙමි"යි කියා රොස්ව් නොසතුටින් වෙළුවනාරාමයට ගොස් බුදුන් නොවැඳ එකත්පසෙකැ සිට මෙසේ විවාළේය.

"කිංසු සුඛා දුඛං සෙති කිංසු සුඛා න සොචති,
කිසසස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතමා"නි.

එහි අදහස නම්:—ගෞතම ගොත්‍රයෙහිවූ තථාගතයන් වහන්ස! කුමන නම් ධර්මයක් නසා සැපසේ හෝනේද? කුමන නම් ධර්මයක් නසා සොක නොකෙරේද? කවර නම් එකම ධර්

ඛක්ඛුගේ විනාඃඛය රුචිකරනෙඟිද එඛ විචාරන්නාවූ මට්
කියනුමැනවැයි ඛනුඟි.

ඉක්බිති තථාගතඃඛම්මාඃඛම්බුදුරජාණන් වඟන්සේ ඔහුගේ;
ප්‍රශ්නඛ විඃදනසේක්,

"කොධං ඤත්වා සුඛං සෙති කොධං ඤත්වා ඛ සොචති,
කොධඝ්‍ය විඝමූලඝ්‍ය මධුරඟඝ්‍ය බ්‍රාඟමණ!
වධං අරියා පඃංඝන්ති තඤ්ඤි ඤත්ථා න සොචති"හි.

එම්බා බමුණ! දඝවැදුරුම්වූ ක්‍රොධඛ නඟා ක්‍රොධපරිඛාඛ
ඛෙන් නොදැවෙන බැවින් සැපසේ සඛනඛ කරන්නේඛ, ක්‍රොධ
විනාඃඛඛෙන් දූරලනලද ප්‍රේමනස් ඇතිබැවින් සොක තොක
රන්නේඛ දුඃඛවිපාක ඇත්තාවූ අතිඝඝින් කිපියක්ඛට පෙරලා
ආක්‍රොඝ කොට ප්‍රහාරදනඛ කෙළෙක්ඛට පෙරලා ප්‍රහාර දනඛ
කොට සිටි කල සැපඋපදනා ඟෙඝින් කෙළවරැ සැප ඇත්තාවූ
ක්‍රොධඛ නැසීම බුඛාදීඋත්තමඛන් වඟන්සේලා වණිණඛා කර
නනාහුඛ. එබදුවූ ඒ ක්‍රොධඛ නඟා සැපසේ හෝනේඛයි වදළ
සේක. බමුණු තෙමේ ශාසනාඃඛන්වඟන්සේගේ ඒ ගාථාධම්මදේශ
නාව අසා පිළිලද සැදැහැ ඇත්තේ බුදුරජතුමාණන් වඟන්සේ
වෙතැ පැවිදිව ලබනලද උපඝපන් බැව් ඇත්තේ නොබෝකල
කින්ම සකල කෙලඝඛන් ප්‍රහීනකොට අහීඝඛට පැමිණිඛේඛ.

අශ්‍රඛාවනඤ්චනඛ ශ්‍රඛාඝම්පත්තියෙඟි පිහිටුවිම අත්තඃඛම්මා
පණිධි සංඛ්‍යාත මඟුල් බවට නිදසුන්වඝඟෙන් ඟෙනහැර පාන
ලද බ්‍රාහ්මණඝංයුක්තවණ්ණනායෙඟි භාරම්භපෙළර වඃනුව
මේසේ සැකෙවින් දක්වා නිමවනලද්දේඛ.

චතුක්කඛ්ඛුත්තරඝඟි කාලකාරාම සුත්තවණ්ණනායෙඟි
කාලකාඃසිටුවඃත්තුවද මේ සඳහාම කියඝුත්තේඛ.

සුරුම්මලින්ඝුත් සිත ත්‍යාඟඝම්පත්තියෙඟි පිහිටුවඃි ඛන
මේකරුණෙඟිලා මේ මතුපහළවන කථාවඃතුව දතඝුත්තේඛ

බරණැස්නුවර අසුකෙළක් ධනඛ ඇති සිටාණකෙනෙක්
නුවරදොරඝතරෙඟිද නුවරමැදද තමන්ගේ නිවෙඝනවාරයෙඟි
දැඃි ඛන මේකි සඳැන්ඟි දනඟල් ඝඛක්කරවා දිනපතා සලඝඝ
ඛක් ධඤ්ඤඛඤ්ඤකොට මඟදන් පැවැත්වූඛේඛ. ඒ සිටුතෙමේ
දිවිඟිම්කොටම එසේ මඟදන් පවත්වා "ඳිඛ පුතන්ඩ! මාඟේ

මේ දූතපරම්පරාව නොසිඳුව වෙසේ මාවෙන්ම දන්දෙව"යි කියා තමපුතුට අනුශාසනා කොට දිව්‍යකෙළවරැ ඉන් සැව සක් දෙව්රජවී උපන්නේය.

ඔහුගේ පුත්‍රතෙමේද එසේම දන්දී එසේම තමපුතුනට අනුශාසනා කොට දිව්‍යකෙළවර ඉන් සැව වසුදිව්‍ය රාජන්ව උපන්නේය. උහුපුතුද එසේම දන්දී එසේම පුතුනට අනුශාසනා කොට දිව්‍යකෙළවරැ ඉන් සැව සුයාමදිව්‍යරාජන්ව උපන්නේය. උහුපුතුද එසේම දන්දී එසේම තමපුතුනට අනුශාසනා කොට දිව්‍යකෙළවර ඉන් සැව මාතලිදෙවිපුත්වී උපන්නේය. උහුපුතුද එසේම දන්දී එසේම තමපුතුනට අනුශාසනා කොට දිව්‍යකෙළවර ඉන් සැව පංචශිඛනම් දෙව්පුත්වී උපන්නේය. ඔහුගේ පුත්තෙමෙ එකානී අසූකෙළක් ධනය ඇති මවජරිය කොසිය නම් සිටුවූයේය. ඒ සිටුතෙමේ "මාගේ මව්පියෝ මූසාවාදයෙන් රැස්කරණලද ධනය නොරැක නිකරුණේ බැහැරලූහ. කළලෙස නොමිසුදුසුය. මම වනාහී ඒ ධනය රකින්නෙමි කිසිවෙක්හට කිසිවක් නොමදෙන්නෙමි"යි සිතා දන්හල්සිදුවා බිදුවා සුණු විසුණුකරවා ගිණිලවා තදමසුරෙක් වී ධනයව රැස් නෙළේය. තෙමෙත් අනුභව නොකරයි අඹුදරුවන්ටද යම්තම් දිවියැපෙනා පමණට වැඩියක් නොදෙයි ඔහු වනාහි කාඛිදිය දෙවැනිකොට නිවුඩු සාලේ බත් බුදියි, තුන්කබ එකට ගැලපුහනපිළි හදියි පත්කුඩින් නිස මූවහ කොට ජරපත් ගොණුයෙදූ දුදුරු රියකින් සෙයි මෙසේ ඒ මසුරු නපුරු දුදකහුගේ මෙතෙක් ධනය සුණබයෙකු විසින් ලබාකලද ලෙලිපොලක්මෙන් විය. උහු එක්දිනක් රජඋවැහට යන්නේ අනුසිටුහුද මෙන ඇන්නෙමියි සිතා ඔහුගේ ගෙදරට ගියේය. එකෙණෙහි අනුසිටු තෙමෙ නවගිනෙල් කිරි මී සකුරුසුණු යන මෙයින් මනාසේ කරනලද කිරි බතක් අනුභවකරන්නට සැරසුනේ එහි පැමිණි මහඝිටු දූකා හුනස්නෙන් නැගිට "මෙහි එන්න මහඝිටුණෙනි! මෙහි ඳිදගන්න කිරිබතක් අනුභවකරමුය"යි කීයේය. ඔහුද කිරිබත් දුටු කෙණෙහිම එය බුදිනු කැමතිවූයේ මුව පිරුනු කෙළඇත්තෙක් වූයේය. එකකුදුවුවත් "ඉදින් දැන් මොහුගේ කිරිබත මම අනුභව කෙළෙම් නම් මාගේ ගෙට ආකල මොහු වත් පෙරළා සත්කාර කටයුතුවන්නේය එසේ ඇතිකල මාගේ ධනයද නැසෙන්නේය එබැවින් ඒ මේ කිරිබත් බුදීමෙන් කවි නැතැ"යි සිතා අස්නෙයි හුන්නා පමණක්ම වූයේ ඔහු විසින් නැවත නැවතත් යාඥා කරන ලද්දේත් "මම මේ දැන්

අනුභව කෙළෙම් ඇතිතාක් බබපිරුනෙක් වෙම්"යි කියා අනු
භව නොකෙළේමය. ඒ සිටුතෙමේ අනුසිටුහුගේ බත්කිසාව
සනැ ඔහුගෙන රජඋවටැනට ගොස් පෙරලා සියගෙට අවුත්
කිරිබත් නැණගාවෙන් පෙළුනේත් ධනය නැසෙන බියෙන්
කිසිවක්හටත් නොකියාම එසිනුපන් පිපාසය ඉවසන්නේ පිළි
වෙළින් උපනුපන් පඬුවන් පැහැ ඇත්තේ නහරවැල් ඉල්පගිය
සිරුරු ඇත්තේ කය වැහැර ගියේ දුබලවූයෙක්ද විය. මෙසේ
ඇතිනල්ගිත් ධනය නැසෙයි යන බියෙන් කිසිවෙක්හට නො
කියා කල්යවනතුරු අතිශයින්ම දුබලවී සයනයෙයි වැදහොත්
තේය. එසේකල සිටුනැගණියාව ළඟට ගොස් "කිමෙක නිදියති!
අපහසුවක් ද"යි විචාළ කලත් නොකියා ඇඳවත්ගිදගෙන
පිටපිරිමැද නැවත නැවත ලුනුබැඳ විචාළ කල එතතු කීයේය.
ඒ අසා සිටුනැගණිය නොමෝ "එම්බල! පාප මසුරු දුදුන! කිමෙක
හෝ දිළින්දෙක්ද මුළුබරණැස් නුවර වැසියන්ට පොහොනා
දමණ කිරිබත් පිසම්දු"යි කිය. ඒ අසා සිටුතෙමේ මුහුරකින්
හිසෙහි ගසනලද්දෙක්මෙන් නිපී "එම්බල කෙල්ල! මා තීගේ
මහධනවත් බව දනිමි ඉදින් තී ගෙයින් ගෙනා ධනය ඇත
හොත් එයින් කිරිබත් පිස නුවරැන්ට කව මාගේ ධනයිසදමින්
නොපිසුව"යි කීයේය. "එසේ වීනම් එනා වීපිඨක වසන්නවුන්ට
පොහොනා පමණක් පිසන්නෙම්ද"? "ඔවුන්ගෙන් අපට
කුමන වැඩෙක්ද"? "එසේ වී නම් අවට සත්ගෙයක වැසියන්ට
පොහොනා පමණක් පිසන්නෙම්ද"? ඔවුන් ගෙන් අපට කුමන
වැඩෙක්ද"? එසේ වීනම් මෙසිටුගෙයි වැසි හැමට පොහොනා
පමණකට පිසන්නෙම්ද? ඔවුන්ගෙන් අපට කුමනවැඩෙක්ද?
එසේවී නම් බඤ්ජනයාට පමණක් පොගෙනා පමණකට
පිසන්නෙම්ද? ඔවුන්ගෙන් අපට කුමන වැඩෙක්ද? එසේ
නම් නුඹටත් මටත් පොහොනා පමණකට පිසම්ද? තීත් කවරි
යක්ද? එස්වී නම් නුඹව පමණක්මපියන්නෙම්ද? "මට පම
ණක්ම නම් පිසන්නට වටී, මට පමණක්ම පිසතුදු බොහෝ
දෙනෙක් බලාපොරොත්තු වන බැවින් මෙහි පිසන්නට
නොවටී සහල් නැළියක්ද කිරි නැළි සතරක්ද අසුරක් පමණ
සකුරුද ගිතෙල් සහ මී බෝතල දෙකක්ද එක බඳුනක්ද දෙව
මම වනයට ගොස් පිසා අනුභව කොට එන්නෙමි"යි කීයේය.
ඔ නොමෝද එළස ඒ සියල්ලම දුන්නීය. සිටුතෙමේ ඒ සියල්ල
දසෙකුලවා ගෙන්වාගන වනයට ගොස් ගහක් අසබඩ
ගසක් මූලෙක දස්කොලුවාලවා ලිප බන්දවා දර දිය ගෙන්වා

ගත "කොල්ල! තෝ යව අත්වල් මගැ සිට කිසිවෙක් එනවා දුටහොත් වහා මට දන්වව මා අඩගැසුතල එව"යි කියා ඔහු යවා උදකලාවම ගිනිමොලවා කිරිබත පිසුවේය. එකල සක් දෙව්රජතෙමේ තමන්ගේ දුත පරම්පරාව පරීක්ෂාකොට බලන්නේ ඒ සියල්ල දුක "මෙතෙමේ තද මසුරෙක්වී මාගේ දුනවංශය සිඳබිඳදමා නිරයෙහි උපදින්නේය මොහුට අවවාද කොට මෙදෙව්ලොවැ උපදනට සුදුස්සෙක් කරන්නෙමි"යි සිතා වඤ්ඤ දිව්‍ය පුත්‍රාදීන් කැඳවා සියලු එපවත් කියා "පළමු කොට මම යම් මිනි කිරිබත ඉල්වාහුන් කල්හි නුඹලා පිළිවෙළින් එන්නහුය"යි කියා බමුණු වෙසකින් ඔහු වෙතැ එළඹ "පින්වත! බරණැසට යන මඟ කොහිද"යි විවාළේය. බමුණු දුක හිටුතෙමේ ක්‍රෝධයෙන් දිලිහී "බොල බමුණුමහල්ල!! තෝ උමතුවෙක බරණැසට යන මඟවත් නොදන්නෙහිය මෙහි කුමන මඟෙක්ද? මෙහි නොමෙව ඔතනින්ම ඔබ්බෙහි යව"යි කීයේය. සක්බමුණුතෙමේ නොදැනෙන්නෙක් මෙන් "කීදැ කිමෙක කීදැ කිවේකැ?"යි කියා කියා සිටු අත කත නම් නවා ඉදිරිපත්වේමය. එවිට සිටුතෙමේ බොල පිස්සු බිහිරි බමුණු මහල්ල!! මෙහි කුමට එන්නෙහිද? ඔතනින්ම ඔබ්බෙහි යව"යි මුරගැසය. සක්බමුණු තෙමේ "පින්වත! කුමකට මුරගා නෙහිද? දුම්කුත් පැණෙයි ගිනිත් පැණෙයි උදුනෙහි කිරිබතකුත් පැසෙයි බමුණන් පැවරූ නැනක් විසහැක බමුණන් බුදිනකලැ මම්ත් ඉන් ටිකක් ලබන්නෙමි"යි කීයේය. සිටුතෙමේ "බමුණ මෙහි බමුණන් ඇමතීමක් නැත ඔතනින්ම ඉදිරියට යව"යි මහත් හඬනහා කීයේය. "එසේවී නම් නුඹ කිරිබත් බුදිනකල ටිකක් ලබන්නෙමි"යි බමුණා කීයේය. "මෙයින් එක බත්තුල කුදු නට නොදෙමි මෙයද ඉතාමදය මට යැපෙනා පමණෙක් මය"යි සිටු කීයේය. ඒ අසා සක්බමුණුතෙමේ

"අපපඤා අපපකං දජ්ජා අනුමඤ්ඤිතා මඤ්ඤිතං,
බහුමඤා බහුකං දජ්ජා අදුනං නූපජීවති,
තං තං වදාමි කොසිය! දෙහි දුනානි භුඤ්ජ ව,
අරිය මඟඤං සමාරුහ නෙ'කාසී ලහතෙ සුඛං"නති.

මදදෙයින් මදක් නමුදු එනම් මදදෙයින් අඩක් නෝ එසේත් නැතහොත් අඹින් අඩක් හෝ දෙන්නේය. බෙදෙවින් බෙහෙවක් දෙන්නේය. ඒ මේ ලොකයේ නමුත් බෙහෙවක් හෝ මදක් හෝ දෙන්නේමය. නොදීම නම් යුතු නොවන්නේමය. ඒ දීමම මහත්ඵල වන්නේය. ඒ කාරණය හෙයින් නුඹට මම

කියම්. කොසිය හොත්‍රයෙහිවූ සිවාණෙනි! දහුන් දෙව හුඹත් අනුභව කර ඒතසින් දීමෙහි ඇලුම් ඇත්තාවූ ආඪ්‍යවූ බුඩාදී උත්තමයන් වහන්සේලාගේ මාඝීයට පිළිපදු හුදකලාව අනුභව කරන තැනැත්තේ දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්මාදී කිසිම සුවයක් නොලබන්නේයයි කියේය.

ඒ අසා සිටුතෙමේ "බ්‍රාහ්මණය! හුඹ හිසින් සහුටු විය යුත් තැම්ම කියතලද්දේය එහෙයින් මෙසින් කිරිබත් ටිකක් ලැබිය හැක්කේය. මෙහි නිදගනුව"යි කියේය. සක්බවුණු තෙමේ නිදගත්තේය. ඉක්බිති වසු දිව්‍ය පුත්‍ර තෙමේද බවුණු වෙසකින් එහි පැමිණ එලෙසම බොහෝ කථා කොට මේ ගාථාවලින්

"මොඝං තස්ස හුතං හොති මොඝංවාපි සමිහිතං,
අපිතිසම්ං යෝ නිසිනනසම්ං එකෝ භුජති හොජනං
තං තං වදාමි කොසිය.... වප.... වතකාසී ලහතෙ සුඛ"නති.

මේ ලොකයෙහි යම්කිසි පුගුලක්තෙමේ තමා වෙත ආගනතුකයෙකු පැමිණ හුන්කල්හි පිළියෙළකරනලද බොජුන ඒ අමුත්තාහට කියත් නොදී එකාකිව අනුභව කෙරේද වසතු නිපදවීම පිණිස එබඳුවූ ඔහුගේ ගාහාදීනහි බලිකම් කිරීමද සිස්වන්නේය වසතුනිපදවීම් වහසෙන් කරනලද අනිකුදු සියල්ලම සිස්වන්නේය, කොසිය හොත්‍රයෙහි උපන් සිවාණෙනි! එසේ හෙයින් මම තට කියම් තාගේ වසතු විසදම් කොට රසමසවුළන්යුත් මධුරදු කාබි සිටුව දුගිවගිය ආවකාදීන්වද එසේම දෙව දුනාභිරතවූ බුඩාදී ආඪ්‍යයන් වහන්සේලා ගමනයකළ මාඝීයට පිළිපදුව තමා පමණක් අනුභව කරන සුලු තැනැත්තේ ලොවිලොවුහුරාසුව නොලබන්නේයයි කියේය. ඒ අසා සිටුතෙමේ බවුණ! නෝද මනාවූවක් කියතෙහිය එහෙනම් නිදගනුව මෙසින් මදක් ලබතෙහියයි කියේය. ඒ සඳබවුණුද එසේම නිදගත.

ඉක්බිති සූඪ්‍යදෙවිපුත්තෙමේද එසේම බවුණු වෙසකින් එතනට අවුත් ඒ නයින්ම බොහෝදු කථාකොට මෙම ගාථාවලින්

"සවවන්නාසස හුතං හොති සවවංවාපි සමිහිතං,
අපිතිසම්ං යෝ නිසිනනසම්ං නෙකෝ භුජති හොජනං.
තං තං වදාමි කොසිය!.... වප.... වතකාසී ලහතෙ සුඛ"නති.

මේ ලොකයෙහි යම්පුද්ගලතෙක් තෙමේ තමාවෙතැ ආගනතුකයෙකු එලඹ හුන්කල්හි පිළියෙළතල අහර තනිවම

අනුභව කොකොට මනාසේ එයින් ඔහුද සතපවා තමනුත් අනුභව කෙරේද එබදු පුගුලාගේ ගෘහාදීන්හි ධනාදිපදවීම පිණිස කරනලද බලිකම්වාදිය ඇළුලවන්නේය ධනාදිපදවීම පිණිස කරනලද අනිකුදු සියල්ලත් ඇළුලවන්නේය කොසිය ගොත්‍රයෙහි වූ සිවාණෙනි! එසේහෙයින් මම තට කියම් තාගේ ධනය විඥම් කොට රසමසවුලෙන් යුතුකොට මධුර අහර තෝද අනුභව කර දුගීමිගීයාවකාදීන්ටත් එසේම දෙව දුනා හිරතවූ බුබාදී ආඥාධාරන් වහන්සේලා ගිය මාගීයට පිළිප දුව තනිවම අනුභවකරනසුලු තැනැත්තේ ලොව්ලොවුතුරා සුව නොලබන්නේයයි කියේය.....ඒ අසා සිටුතෙමේ බමුණ! තෝද කිදැ මැනවි එහෙනම් හිඳගනු මෙයින් මදක් ලබනෙහි යයි කියේය. ඒ හිරුබමුණුද එසේම හිඳගත.

තදනන්තරවැ මාතලිදෙවිපුත්තෙමෙද එසේම බමුණු වෙසකින් එතනට අවුත් ඒ තයින්ම බොහෝදු කථාකොට මේ ගාථාවලින්.

"සරං සබ්බං යෝ පූජති බාහුකාය ගයාය ච,
දෙණෙ නිම්බරුක්ඛසම්ං සිඝාසතෙ මහාවහෙ;
අත්‍රවස්ස හුතං හොති අත්‍රවස්ස සමිහිතං,
අපිනිසම්ං යෝ නිසිනනසම්ං තෙකෝ භුජති භොජනං.
තං තං වදාම් බොසිය!.....පෙ.....නෙකාසි ලහතෙ සුඛ"නති.

මේ ලොකයෙහි යම්කිසි පුගුලෙක් තෙමේ තමවෙතැ ආගනතුගයෙක් එලඹ හුන්කල සැදූ අහර තනිවම නොබුදිද මෙත්කුලුණු පෙරටුව අමුත්ගෙත් අනුභව කරවාද එ පුගුල් තෙමේ නාගයක්ෂරාක්ෂසාදීන්ට බලිකම්කරනුයේ මුහුදුකලපු පොකුණුආදීන්අතුරෙන් යම්කිසිවක්වෙතැ එලඹ එනම්:- බාහුකා නම් නදියෙහිද ගයා නම් පොකුණෙහිද මහගඟයැඩ පහරඇති දෙණතම් තොටෙහිද එසේම නිම්බරුකම් තොවෙහිද ඝන මෙතෙක් තන්හි බලිකම් කන්නේ වේද මෙකිතන්හි මෙහු ගේ මේ හෝමකම්ය සඵලද වෙයි සැපවිපාක ඇත්තේද වෙයි එසේහෙයින් කොසියගොත්‍රයෙහිවූ සිවාණෙනි! මම තට කියම් තාගේ ධනය විඥම් කොට රසමසවුලෙන්යුත් මධුර අහර අනු භවකර දුගීමිගීයාවකාදීන්ටත් එසේම දෙව දුනාහිරතවූ බුබාදී ආඥාධාරන් වහන්සේලා ගිය මාගීයට පිළිපන්නෙක් වෙව තනි වම අනුභව කරනසුලු පුගුල්තෙමේ ලොව් ලොවුතුරාසුව [illegible] එ දැ සිදුනෙමේ බමුණ! තොදැ

කියේ මැනව එහෙයින් හිඳහනු මෙයින් මදක් ලබනෙඟියයි කියේය. ඒ මානලිඛමුණුදා එසේම හිඳගත.

එක්බිති පංචසිඛ දෙවිපුත්තෙමෙද එසේම බමුණුවෙසකින් එතැනට අවුත් පෙරසේම බොහෝ දෑ කථාකොට මෙම ගාථාවලින්

"බලිසං භි යෝ නිගඵිලති දීඝසුත්තං සඛඩ්ඩනං,
අපිතිසම්මං යෝ නිසිතනාසම්මං එකෝ භුඤ්ජති හොජනං,
තං තං වදාමි කොසිය! මෙ තෙකාසී ලභතෙ සුඛ"නති

මේ ලොකයෙහි යම්කිසි පුහුලෙක්තෙමෙ ආහනතුක යෙක් තමාවෙතැ එලඹ හුන්කල්හි පිළිගෙලතරනලද බොජුන ඔහට කිසිත් නොදී තමා පමණක් බුදීද ඒ පුහුල්තෙමෙ ඒ බොජුන වැළදුවා නොව බැමිසඟිතවූ දික් හුයක් ඇති බිලියක් ඔහුවිසින් ගලනාලද්දේ වන්නේය, කොසිය ගොත්‍රයෙහිවූ සිවාණෙනි! එසේහෙයින් මම තට කියමි තාගේ ඛන විය දම් කොට රසමසවුලෙන්යුත් මධුර බොජුන් අනුභවකර දුගීවඟි යාචකාදීන්ටත් එසේම දෙව දානාභිරතවූ බුඩාදී ආර්‍යයන් වහන්සේලා ගමනයකළ මාර්ගයෙහි ගමනය කර එකාකීව අනු භව කරනසුලු පුද්ගලතෙමේ ලොවිලොව්තුරාසුව නොලබන් නේයයි කියේය ... ඒ අසා සිටුතෙමෙ ආර්‍යාසයෙන් නිපදවූ තමාගේ කිරිබත දෙන්නට සිදුවූ හෙයින් උපන් දුකින් කම්පා වෙමින් බමුණ! නොද කිදේ මැනව එහෙයින් හිඳගනු මෙයින් මදක් ලබනෙඟියයි කියේය. ඒ පංචසිඛ බමුණුතෙමෙද සෙස් සන්ගේ පෙළෙහිම හිඳගත්තේය. මෙසේ ඔවුන් හුන්කල්හි කිරිබතද පැසින. සිවාණෝ කිරිබත්බදුන උදුනින් බහා "බමු ණුගොල්ලෙනි! තොපට කිරිබත් දෙන්නට රුක්පත් ගෙනෙව්ය"යි කියේය. එවිට බමුණෝද ඉන් නොඅඟිටම අත් දිගු කොට හිමවතින් මාලුවාපත් ගෙනාවාහුය. සිටුතෙමෙ එදින 'මෙපමණ මහත් පත්හි දියයුතු කිරිබතක් මෙහි නැත කිහිරි පත් ගෙනෙව්ය"යි කියේය. ඔවුහු එද එසේම ගෙනාවාහුය. ඒකිහිරිපත් එකක් එකක් යොදුනක් පමණ විශාලය ඒ මහත දැඹිබැව් කියේය, පත්මහතින් තව කිම තා දෙන පමණක් දෙවයි කිවාහුය; එවිට සිවාණෝ සැන්දෙන් සියල්ලන්වම කිරිබත් දුන්නේය. සියල්ලනෙන් අන්තිමයාට දුන්කල්හිත් හැලෙහි අඩුබවක් නම් නුදුවුවේය. ඒ සිටුතෙමෙ ඔවුන්ට කිරි බත්දී තෙමෙත් අනුභව කිරීමට කිරිබත් සැළිය ගෙන ඔවු

ණන්ගේ පෙළෙහිම හිදගත්තේය. එකෙණෙහි පංචවිධ තෙවෙ සුනඛයෙක් වී ඔවුන්ගේ ඉදිරියෙහි මුත්‍රාකරමින් ගියේය. එවිට බමුණෝ කිරිබත තමතමන්ගේ අත්වලින් වසා ගත්හ. සිටාණෝත් එසේම වසාගත්තේය. එවිට සිටාණන්ගේ පිටිඅලුයෙහි සුනඛමූත්‍රාබිඳක් හුත්‍රුයේය. සිටාණෝ අතදෙවුන් කරනු කැමැත්තේ බමුණන් ඉදිරියෙහි තිබෙන් නාක්මෙන් පෙනුණ රන්කෙණ්ඩිවලින් පැන් ඉල්වීය. එවිට බමුණෝ අපි ගන්නෝ වමු දෙන්නෝ කොවමුයි කීහ. බමුණනි! එසේ කියන්නේ ඇයිද? මම තොපට කිරිබත් දුන්නෙන් නොවෙයිද එසේ හෙයින්වත් මට දිය දෙවයි කීය. එවිට බමුණෝ කියන්නා අපි දුන්නාවෙනුවට කිසිසේත් නොදෙන්නෝ වමු එසේ හෙයිකුත් තාහට දිය නොදෙන්නමෝයි කීහ. එහෙනම් ගහදියෙන් අත සෝධා එනතුරු මාගේ බත්සැලිය රැකබලාගතහැක්කහුද? එය නම් හැක්කොවමු. එහෙනම් බත්සැලිය රැකබලාගනිව්යයි කියා ගහට බැස්සේය. එකෙණෙහි සුනඛතෙමේ බත්සැළිය පිරි ඉතිරි යනතාක් බත්සැලියට මූත්‍ර කෙළේය. සිටුතෙමේ බත්සැළියට මූත්‍රකරන්නාවූ ඔහුදැක කෝපයෙන් දිලිසෙමින් මහත් මුගුරක් ගෙන ඔහු තැනිගන්වමින් පසුපස්සේ දිවුයේය. සුනඛයා ආජානීය අසෙකු පමණවී ඒ ඒ තැන ගියාවූ ඔහු ලුහුබැඳ දිවුයේය. සිටාණන් මරණභයින් බියපත්ව බමුණන් වෙතැ එළඹියේය. ඒ බමුණෝද පැත නැගී අහස්තලයෙහි සිටගත්හ. සිටාණෝ ඔවුන්ගේ ඒ ඍද්ධිය දැක විසමපත්ව කුඹලා කවරහුදැයි විවාළේය. එක්බියි සක්දෙව් තෙමේ "මේ සදුය මේ හිරුය මේ මාතලිය මේ ශක්‍රය මේ සුනඛයා නම් පංචසිඛ දෙව්පුත්ය"යි කියා "අපි තාගේ කිරිබත පිණිස මෙහි පැමිණියෝ නොවමු තෝ වහාහි අපගේ නැගයක එහෙත් දුන් තෝ මසුරෙක මසුරෝ නම් නිරයෙහි උපදනාහ. නොමසුරෝ සඟ උපදනාහ එහයින් තා කෙරෙ මෙත් කුලුණෙන්ම අපි මෙහි පැමිණියෝ වමු"යි කීහ. ඒ අසා සිටාණෝ මොවුහු මට හිතවැඩ කැමැත්තෝල මොවුහු මා නිරයෙන් නගාපියා සඟ පිහිටුවනු කැමැත්තෝලයි තුටුපහටු සිත්ඇත්තේ මෙතැන් පටන් මාගේ ආලෝපයෙන් අඬින් අඬකුත් ගම් ඒ කඹව නමුත් නොදියයුතු බවකුත් නම් නැත්තේය දිය අතලොස්සක් නමුදු ලැබ මම කඹව දුමුත් නොදී නම් නොබොන්නෙමියි සක්දෙව් හමුයෙහි වරගත්තේය. මෙසේ සක්දෙව් රජතෙමේ ඔහු දමා දැනයාගේ

එලය දන්වා ඔහට පන්සිල් දී චන්ද්‍රාදීන් සමඟ දෙව්ලෝ ගියේය. ඒ සිටුතෙමේද නුවරට ගොස් රජුගෙන්සමුරුගෙන අණබෙර ලවා ගෙනගෙනා බදුන් පුරවා වසතු ගනිත්වාසි ශ්‍රාවකයන්ට ධනය දී එකෙනෙහිම හිමවනින් දකුණුපසෑ එක් ගඟකට හා විලකටත් අතර පන්සලක් නොට සෘෂීප්‍රව්‍රජාවෙන් පැවිදිව එහි බොහෝ කල් වැස ඉන් මියගොස් ඔපපාතික දිව්‍ය පුත්‍රයෙක් ව ඒ සක්දෙව්රජු විසින් එවනලද වෛජයන්ත නම් රියනැඟ මාතලී දෙව්පුත් සමඟ සක්දෙව්රජුවෙතට පැමිණියේය. සක්දෙව්රජතෙමේ ඔහු දැක සතුටින්ඇත්තේ ගිරිදෙවී නම්වූ දුහිතෘව ඔහට පාවාදුන්නේය. ඔහට අපමණවූ ඉසුරුද ඇතිවූයේය. හේ තෙමේ මෙබුදුසෙමෙහි සැවැත්නුවර කුලපුත්‍රයෙක් වී ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේගේ දම්දෙසුම් අසා පැවිදිව ශීලයන්හි පරිපූරකාරීවූයේ ධුතගුණයෙන් යුක්තවූයේ දන්දෙන අදහස් ඇත්තේ දන්දීමෙහි ඇලුනේ සිහිකටයුතු ධර්මයන් පුරනසුභාව ඇත්තේ තමන් ලබනලද දෙය ප්‍රතිග්‍රාහකයන් ඇතිකල්හි සුන්බත් ඇත්තෙක් වී තමා දැක්දෙන්නේය. සතරාමරලොකෙකශිවංකරවූ අපතථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ ඔහුගේ ඒ දානාභිරතියම අල්ලාතපතතිකොට "මහණෙනි! මේ මහණතෙමේ පෙර නොදෙනසුලුය මසුරුය තණ්හා තෙල්බිඳක් පමණකුත් කිසි වෙක්හටත් නොදෙන්නේය එකල මම ඔහු දමනය කොට දානයාගේ ඵලය වණීණාකොට දීමෙහි පිහිටුවාලූයෙම් හේ තෙමේ දිගඅතඵලොස්සක් පමණ ලැබත් කෙනෙකුට නොදී නොබොන්නෙමිසි මාගේ සමීපයෙහි වරයක් ගත්තේය ඒ සඤ්ඤිවූ ඵලයෙන් දන්දෙන අදහස් ඇත්තේ දානයෙහි ඇලුම් ඇත්තක් වූයේය"යි වදාරා අසීතින්පානඤඤි සුධාභොජන ජාතකය ගෙතගැර දක්වා වදාළසේක.

මසුරුමලින් යුක්තිත ඉන් බැහැරකොට ත්‍යාගසම්පත්තියෙහි පිහිටුවීම අත්තඤඤාපණ්ඩි තම් මහුල්වතබවට නිදසුන් වශයෙන් ගෙතගැට පාතලද සාධුජනමනඃකොදවිකාශත ශශිබිම්බප්‍රතිබඹ රශ්මිමාලාවක් වැනිවූ සුධාභොජනජාතක යෙහි ඒලපරිසඤකාසියවසතුව මෙසේ සැකැවින් දක්වා නිමි එතලද්දේය.

එක නිපාතයෙහි අවිවනවඤ "උභො ඛජා උභො කුණී" ආදීන් වදාළ දුද්දීඤජාතඤවණීණනායෙහි එක් වතලැබෑ

බෙහෙ රහ බිබී සිටියාවූ නැමති සත්දෙවි රජුවිසින් දමනය කරනලදින් දුනයාගේ ඵලය දුන පින්කොට සඟපැමිණී ඉලලිය සිටුහුගේ කථාවසානුවද ධම්මපදාසෙති පුප්ඵවග්ගසෙති "යථාපි භමරෝ පුප්ඵං" යනාදීන් වදාළ ගාථාවණ්ණනායෙහි මුඟලන් මහතෙරිදුන් විසින් කබලු පූ කන්නට සත්බුවූපන මතුතෙලෙ හුන් බැව් දුන එහි වැඩමවා දමනය කරනලදින් නැවත දෙවරම් වෙහෙරට ගොස් බුදුන් දම් සවන් කොටැ සොවාන්පෙලැ පැමිණී මච්ඡරියකොසිය සිටුහුගේ කථාවසානුවද මේ සඳහාම ගෙනහැර දැක්විය යුත්තේය.

මේසේ මොවුහුතුමූ දුසසීලවූ අශ්‍රද්ධාවත්වූ මසුරුවූ සිත් ශීලශ්‍රද්ධාත්‍යාගසමපත්තීන්හි පිහිටුවා නානාවිධානිසංසයන්ට පැමිණියාහුය ඔවුන්ගේ දුසසීලතාවාදිය හෙතුකොට ඇති මෙලෝපරලෝදෙක්හි ලැබිය යුතුවූ යම් වෛරයක් වේද එය ශීලාදීන්හි පිහිටිකාලයෙන් පසු ප්‍රහීනවේද එහෙයින් සිතම මනාකොට පිහිටුවාලීම මහලයයි දතයුත්තේය. එහෙයින් අටුවාවෙහි ඒ අභාසමමාසුණිබිස කෙසේ නම් මහුල්වන්නේද යත් දිසසීලමිසසාසමපරාගික වෛරප්‍රහානයෙන් විවිධානිසංස යන් ලැබීමට හෙතුවන බැවින්මහුල්නම් වන්නේයයි කියන ලද්දේය.

මනාකොට පිහිටුවනලද සිතවනාහි සියලුම සමපත්දීමට හැකිවන්නේය එසේ හෙයින් සසීසත්ථාභිතොපායසාධකවූ අපායොපගමකරණාභිලාෂීවූ අපතථාගතසමමාසම්බුදුරජාණන් වහන්සේ, "යම්බදු සමපත්තියක් මවුපියන් විසින් පුත්‍රයන්ට දෙන්නට නොහැකිවේද ඒ මේ සියලුම සමපත්තිය මේ සත්ව යන්ගේ අභ්‍යනතරයෙහි පැමිණියාවූ මනාකොට පිහිටුවනලද චිත්තයම දෙන්නේය"යි වදාරා ධම්පියාසෙති චිත්තවග්ගසෙති මේ ගාථාව ගෙනහැරදක්වා වදාළසේක;

"න තං මාතා පිතා කයිරා අඤ්ඤේ වාපි ච ඤාතකා,
සම්මා පණිහිතං චිත්තං සෙය්‍යසෝ නං තතෝ කරේ"ති

එහි අදහස නම්:—සත්වයන්ට සියලුසම්පත් දීම සංඛ්‍යාතවූ ඒ කාරණය මනාහි මවුපියගුරුවරආදීහු හෝ වෙන යම්කිසි ඛත්තිමිත්‍රාදීහු හෝ නොකරන්නෝය දශකුසලකම්පථයන්හි පිහිටුවනලද චිත්තයතෙමේම ඔහු ඒ කාරණයට වඩා අතිශයින්ම උතුම්වූ පුද්ගලයෙක් කරන්නේය මවිපියෝ වෙනාහි පුත්‍රයන්ට දායාද දෙන්නෝනමුදු එක් අත්බැවෙක්හි පමණක්

කම්මානතකොකොට සැපසේ ජීවත්වන්නට පොහොනා ඔන යක් දෙන්නට හැක්කෝ වන්නාහුර පුත්‍රයන්ට සක්විතිසිරි සැපත දෙන්නට හැකිවන්නාවූ මව්පියෝ නම් නැත්තාහුර දිව්‍යසම්පත්තිය හෝ ප්‍රථමධ්‍යානාදී ලෝකොත්තර සම්පත්තිදානයෙහි කථාවතමා සිත්මත් කම්තැන මනාකොට පිහිටුවනලද සිතම සබයන්ට සිඟලුසම්පත් දෙන්නට හැකි වන්නේය එසේ හෙයින් කාවිසිතුත් දශකුසලකම්පථරත්හි මනාකොට සිත පිහිටුවිය යුත්තේය. එසේ පිහිටුවනලද සිත සියලුම සැප ගෙන දෙන්නේය වරදවා පිහිටුවනලද සිත හෙවත් දශ අකුශලකම්පථයෙහි පිහිටුවනලද සිත සියලුම දුක් ගෙන දෙන්නේය. එහෙයින් සම්මාරාරාතිමථනය කළාවූ අපතථාගතඝම්මා සම්බුදුරජාණන් වහන්සේ වදාරනසේක් "අඹුදරුවන්ට පිඩා කිරීමය හෙන්වන්ආදිය නැසීමය ජීවිතඝාතියට පත් කිරීමය යන මොවුන්ගේ වශයෙන් යම් ඒ අනයව්‍යසනයක් කරන්නේද එය දෙවියෑද කරන්නට හැකිවන්නෝ නොවෙති සොරහුත් කරන්නට හැකිවන්නෝ නොවෙති වෛරඇත් සෝන් කරන්නට හැකිවන්නෝ නොවෙති යම් මේ සත්ත්වයන්ගේ අභ්‍යන්තරයෙහි වරදවා තබනලද සිතක් වේද ඒ සිතම එය කරන්නේය" යි වදාරා එහිම මේ ගාථාඛණ්ඩය වදාළසේක.

"දිසෝ දිසං යං තං කයිරා වෙරී වා පන වෙරිනං,
මිච්ඡා පණිහිතං චිත්තං පාපියෝ නං තතෝ කරේ" යි

මෙහි අදහස නම්:—එක්තරා එකක්හුගේ අඹුදරුවෙකුත් චන්දූසිදස්ඝවමඞ්ගලාදීන්ට පිඩා කරන්නේ හෝ කෙත්වත් ආදිය නසන්නේ හෝ ඔවුන්ගේ ධනහරණය කරන්නේ හෝ වන්නේය එසේ නොව ඊට වඩා වරදවා දශඅකුශලකම්පථ යන්හි පිහිටුවනලද සිත වනාහි ඉහාතමහාවයෙහිම ගහිවට වඩබඤ්ඤටද පමුණුවා පරලොව නොයෙක් ජාතිශතසහස්‍ර යෙහි සතරඅපායාදියෙහි හෙලාගන්න හිස නහාපියන්නට නොදී විඤ්ඤයක් අනයව්‍යසන කොට ඔහු අතිශයින්ම ලාභ යෙක් කරන්නේය. එහෙයින් කාවිසිතුත් සිත වරදවා දශඅකු ශලකම්ථ්‍යන්හි නොතැබිය යුත්තේමය යනුයි.

යමෙක්තෙමේ ප්‍රථම කාලයෙහි මිථ්‍යාප්‍රතිපත්තියෙහි නබත්තලද සිත පශ්චාත්කාලයෙක්හි සම්‍යක්ප්‍රතිපත්තියෙහි පිහිටුවාද ඒ පුද්ගලතෙමේ අත්තදන්තයයි හෙවත් සිත දමනය කරන ලද්දෙකැයි කියනලද්දේය. අත්තදන්තපුද්ගලයා නම් පෙර නොගියවිරු දිශාවට යන්නේය. එසේ හෙයින් ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ පෙර ඇත්තොවිවෙක්ව සිට පැවිදිවූ එක්තරා භික්ෂුවක්හට අවවාද කරනසේක් ධම්මපදගාථාවෙහි මේ ගාථාව වදාළසේක.

"න හි එතෙහි යානෙහි ගවෙජ්ඣය අගතං දිසං,
යථාත්තනා සුදන්තෙන දන්තෝ දන්තෙන ගච්ඡති"යි.

එහි අදහස නම්:—චතුර්විධ ආර්‍යමාර්ගයෙන් දැමුනාවූ සප්‍රාඥ පුද්ගලතෙමේ සුචීභාගයෙහි ඉන්ද්‍රියදමනයෙන් දැමුනාවූ අපර භාගයෙහි ආර්‍යමාර්ගභාවනාවෙන් මනාව දැමුනාවූ චිත්තය කරණකොටගෙන සිහිනෙනුත් නොගියවිරු හෙයින් අගත නම්වූ නිර්වාණදිශාවට යම්සේ පැමිණේද මේ ලොකයෙහි ඇත්තාවූ ඇත්අස්ආදීවූ කිසි යානාවකින් ඒ නිර්වාණදිශාවට නොයන්නේය එසේ හෙයින් මහණෙනි! තාවිසින් සිත දමනය කිරීමම උතුම්වන්නේය යනුයි.

මෙසේ මනාකොට දශකුශලසඞ්ඛ්‍යාත ප්‍රතිපත්තියෙහි සිත පිහිටුවීම ඓහලෞකිකපාරලෞකික හිතසුවසාධක හෙයින් මඟුල් නම් වන්නේය.

සාධුජනකර්ණරසායනවූ අටසිය්‍යක් මඞ්ගලකථාවන් අතුරෙන් අත්තදමථසූත්‍රාදී නම්වූ සවණනම් මඞ්ගලකථාව මෙසේ සැකැවින් දක්වා නිමවනලද්දේය.

මේ ගාථාවෙහුදු සුදුසු පෙදෙසැ වාසය පෙරකළ පින් ඇති බවය සිත මනාසේ පිහිටුවීමය යන මඟලත්‍රයක් වදරන ලද්දේය. මෙහි ප්‍රථම පාදය "දානං ච ධම්මචරියා ච" "ඤාතීනං ච බ්‍රහ්මචරියං ච" යනු මෙන් නවකුරෙක් ඇත්තේය. දෙවන පාදය පථ්‍යාවක්ත්‍ර නම් වෘත්තයාගේ දෙවන ලක්ෂණයෙන් යුක්තය. තෘතීයාර්ධය සම්පූර්ණයෙන්ම "පථ්‍යාවක්ත්‍ර" වෘත්තය වන්නේය.

ශ්‍රුතිජනමනනන්දනවූ මඟුල්සූත්‍රය දෙවනඟය වැණුම් නිමි.

තදනන්තරවෑ "බාහුසච්චං ච" යනාදී නෙවත ගාථාවී
වණීණතාව පටන්ගනුලැබේ.

"බාහුසච්චං" යනු බොහෝ ඇසූ පිරූ තැන්ඇති බවයි. 'සිපපං" යනු යම් කිසි හස්තකර්මාදියෙක්හි දක්ෂබවෙක. **මජ්ඣිම පණ්ණාසකයෙහි වාසෙට්ඨ සූත්‍ර ටීකායෙහි** ඒ ඒ උපා යෙන් ශික්මවිය යුතුය යන අර්ථයෙන් සිපප නම්වැයිද එසම හළු කොසලු නමැයිද කියනලද්දේය. "චිනසෝ"යනු කාය වාවෘ චිත්ත යන මොවුන් ශික්මවීමයි. හෙවත් සුදුසු පරිදි දෙන් ඇවැත් කෙරෙන් හෝ දුස්සීලසවභාවය හෙරෙන් හෝ අකුශල කර්මපථයන් කෙරෙන් හෝ වලකාලීමයි. **සමාධානාදිකාදිෂයි** වනාහි චිත්තයපිටකයම සඳහා කායික වාචසික ඇවැත් වලකාලන හෙයින්ද මෙය කියද වචනයද ශික්මවානුයි චිනය නමැයි කියනලද්දේය. සුභාෂිත වචනය නම් "බ්‍යප්පථෝ"යි අට්ඨාවෙහි කියනලද්දේය. බ්‍යප්පථ නම් වාක්‍යභෙද යයි. අර්ථාවබොධ කරවනු කැමැත්තන්ට ඒ වාක්‍යය ම ඖෂධ හෙයින් බ්‍යප්පථ නමැයි කියනලදුයි **රූපසිද්ධ්‍යාදි වණීණනායි**. තවද "බ්‍යප්පථෝ" යනු වචනපථයයි. අනිකුත්හු දැනවානුහුගති යට පැමිණෙන්නවුන්ට වචනයම පෙරටුවන හෙයින් බ්‍යප්පථ නමැයි කියනලදුයි **මුසාවාදශික්ෂාපද වණීණනානයයි "වාචාය බ්‍යප්පථෙති"**යන **සද්ධිකල්ප ශබ්දනීති සූත්‍රයෙන්** හෝ **මහාවානතිසූත්‍රයෙන්** හෝ පථ ශබ්දය පරකළ්හි වාවා ශබ්දයට 'බ්‍ය' ආදෙශව 'බ්‍යප්පථෝ'යි සිඳියි. එබා දෙවතාව! මෙබදුවූ යම් බහුශ්‍රැත භාවයක් වේද යම් ශිල්පයක් වේද මහා කොට ශික්මෙනලද යම් විනයක් වේද යම් සුභාෂිතවචනයක් වීද යන මේ සියුවැදුරුම්වූ කාරණය උතුම් මඟුලැයි කියා සලකාගනුවයි වදළසේක්හුමේකියනලද්දේ මෙහි සංක්ෂේප අදහස වන්නේය.

මේ මතුකියනු ලබන්නේ එහි විස්තරය වන්නේය. බාහු සච්චය නම් බහුශ්‍රැතභාවයයි. අර්ථවශයෙන් වනාහි මතු ශිල්ප කර්මයෙහි කියනු ලබන ශිල්පොද්ග්‍රහණයෙන් ගන්නාලද හස්ත කෞශල්‍යය හැර බුද්ධවචනය හෝ බාහිර ශිල්පයක් හෝ ඉගෙන හෝ අසා හෝ උපන්නාවූ ඒ ඒ කරුණෙහි දක්ෂබවයි. එය අනගාරිය බහුශ්‍රැතභාවය අගාරිය බහුශ්‍රැතභාවයයි කියා දෙවැ දුරුම් වන්නේය. ඔවුනතුරෙන් අනගාරිය බහුශ්‍රැතභාවය නම්:— "බහුස්සුතෝ හොති සුතධරෝ සුතසන්නිචයෝ" යනාදී

නයින් උරුවෙලසූත්‍රාදීන්හි වර්ණිතාකරනලද ශාස්තෘශාසන ධාරිභාවයයි. උරුවෙලසූත්‍රය වනාහි චතුක්කනිපාතයෙහිපඨම පණ්ණාසකයෙහි සංග්‍රහකරනලද්දේය. එහි බහුස්සුතො යනු මොහු විසින් බෙහෙවක් නවාඞ්ගශාස්තෘශාසනය අසනලද්දේ වෙයි පාළිඅනුසන්ධි පූර්වාපරවශයෙන් ඉගෙනගන්නාලද්දේවෙයි යන අර්ථයි. "සුතධරො" යනු අසනලද්දට ආධාරවූයේ නොහොත් අසනලද්ද ධරා පවත්නේය යනුයි. යමෙකුවිසින් යම් තැනකින් ඉගෙනගන්නාලද්ද එතැනින්ම බැහැරගේද සිදුරු කළගෙහි දියක් මෙන් නොරදුද පිරිස්මැද සූත්‍රයක් හෝ ජාතකයක් හෝ කියන්නට හෝ කියවන්නට හෝ නොහැකිවේද මෙහොමේ සුතධර නම් නොවන්නේය. යමෙකු විසින් ඉගෙනගන්නාලද බුඩවචනය ඉගෙනගත් කලක්මෙන්ම වේද දස හවුරුද්දක් හෝ විසිහවුරුද්දක් හෝ නොනැසුරතලද තුමුත් නොනැසේද මේ තෙමේ සුතධර නම් වන්නේය. "සුත සන්නිවය" නම් අසනලද්ද රැස්මකොට තබාගන්නාලද්දෙක. යමෙකු විසින් අසනලද්ද ගලෙහි ඇඳි ඉරක් මෙන් රන්කළ යෙහි බහාලූ සිංහතෙලයක්මෙන් හෘදය නමැති පෙට්ටියෙහි රැස්ව සුරැකිව පිහිටියේද මෙතෙමෙ සුතසන්නිවය නම් වන්නේය යනු එහිවර්ණනායයි. "වෘතදුඃඛනිස්සරණාභිලාෂින් විසින් ඇසියයුතු හෙයින් සුත නම්. එනම් පඤ්චපනිධම්මයයි. එය ධරානුයි-සුතධර නම් වේ. පදයකුදු අකුරකුදු නොනසා රැස්කෙරේනුයි-සන්නිවය නම් වේ. ඒ අසනලද්ද මොහුගෙ රෙහි රැස්කෙරේනුයි- සුතසන්නිවය නම් වන්නේය. යනු එහි ටීකායි "චතුක්කනිපාතෙ පඨමපණ්ණාසකයෙහි අපප ණ්ණකසූත්‍රය හා එහි වර්ණිතාව ද මෙ පිණිස බැලිය යුත්තේය. යමෙක් වනාහි බහුශ්‍රුතවූයේ ශ්‍රුතියෙන් පැමිණිය ලද්දේ වේද ඒ පුද්ගල තෙමේ ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ විසින් ප්‍රශංසා කරන ලද්දේය. එසෙයින් චතුක්කනිපාතයෙහි පඨමපණ්ණාසකයෙහි අපණ්ණකසූත්‍රයෙහි වුත්තාවූ මෙ භික්ඛවෙ! දුග්ගහිතා ධම්මපදා සංවිජ්ජන්තා ඵලාකඞ්ඛං" යනාදිය වදාළසේක.

එහි අදහස නම්:—මහණෙනි! මේ ලොකයෙහි පුද්ගලයෝ සතරදෙනෙක් ඇතිවන්නාහුය. ඒ කවර සතරදෙනෙක් ද යත්? ශ්‍රුතියෙන් නොදැමිණියාවූ අල්පශ්‍රුතයාය ශ්‍රුතියෙන පැමිණියාවූ අල්පශ්‍රුතයාය ශ්‍රුතියෙන් නොදැමිණියාවූ බහුශ්‍රුතයාය ශ්‍රුතියෙන දැමිණියාවූ බහුශ්‍රුතයාය යන සතරදෙනාහි,

මහණෙනි! ඔවුනතුරෙන් ශ්‍රැතියෙන් නොපැමිණියාවූ අල්ප ශ්‍රැතපුද්ගලයා කවරේදයත්? මහණෙනි! මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණාදී නවාංගශාස්තෘශාසනයන් අතුරෙන් එක්තරා අඞ්ගයක් අසනලද්දේද ඒ පුද්ගලතෙමේ ඒ අසනලද එකඅංගයාගේ පෙළඅටුවාටිකා නොදැන නවලොකොත්තරධම්මයට අනුරූපවූ සිලසඞ්ඛාතවූ පූජාභාගප්‍රතිපත්තියෙහි නොපිළිපන්නේ වේද, මහණෙනි! මෙසේ වනාහි පුද්ගලතෙමේ ශ්‍රැතියෙන් නොපැමිණියාවූ අල්පශ්‍රැතයා නම් වන්නේය.

මහණෙනි ශ්‍රැතියෙන් පැමිණියාවූ අල්පශ්‍රැතයා නම් කවරේදයත්? මහණෙනි! මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙමේ නවාංගශාස්තෘශාසනයන් අතුරෙන් එක්තරා අංගයක් අසනලද්දේද ඒ පුද්ගලතෙමේ ඒ එකම අංගයාගේ පෙළ අටුවාටිකා නොදැන නවලොකොත්තරධම්මයට අනුරූපවූ සිල සඞ්ඛාතවූ පූජාභාග ප්‍රතිපත්තියෙහි පිළිපන්නේවේද, මහණෙනි! මෙසේ වනාහි පුද්ගලතෙමේ ශ්‍රැතියෙන් පැමිණියාවූ අල්පශ්‍රැතයාතම් වන්නේය.

මහණෙනි! ශ්‍රැතියෙන් නොපැමිණියාවූ බහුශ්‍රැතපුද්ගලයා නම් කවරේද යත්? මහණෙනි! මේ ලොකයෙහි යම් පුද්ගලයෙක්තෙමේ නවාංගශාස්තෘශාසනයන් අතුරෙන් බොහෝ අසනලද්දේවිද එ තෙමේ ඒ අසනලද බොහෝ ශාස්තෘශාසනයාගේ පෙළඅටුවාටිකා නොදැන නවලොකොත්තර ධම්මයට අනුරූපවූ සල් සඞ්ඛාතවූ පූජාභාගප්‍රතිපදයෙහි නොපිළිපන්නේවේද, මහණෙනි! මේ පුද්ගලතෙමේ ශ්‍රැතියෙන් නොපැමිණියාවූ බහුශ්‍රැතයා නම් වන්නේය.

මහණෙනි! ශ්‍රැතියෙන් පැමිණියාවූ බහුශ්‍රැතපුද්ගලයා නම් කවරේද යත්? මහණෙනි! මේ ලොකයෙහි යම් පුද්ගලයෙක් තෙමේ බොහෝකාල නවාංගශාස්තෘශාසනය අසනලද්දේද හේතෙමේ ඒ අසනලද නවාංගශාස්තෘශාසනයාගේ පෙළඅටුවාටිකා දැන නවලොකොත්තරධම්මයට අනුරූපවූ සීලසඞ්ඛාතවූ පූජාභාගප්‍රතිපත්තියෙහි පිළිපන්නේවේද, මහණෙනි! මෙසේ වනාහි මේ පුද්ගලතෙමේ ශ්‍රැතියෙන් පැමිණියාවූ බහුශ්‍රැතපුද්ගලයා නම් වන්නේය.

මහණෙනි! මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි විද්‍යමාන වන්නාහුයහි විදුරුවේකඤ්ඤමෙහි ප්‍රථමවාරයෙහි අල්පශ්‍රැත

දුස්සීලයාද දෙවනවාරයෙහි අල්පශ්‍රැත සම්පන්නශ්‍රවයාද තෙවන වාරයෙහි බහුශ්‍රැත දුස්සීලයාද සතරවනවාරයෙහි බහුශ්‍රැත සම්පන්නශ්‍රවයාද වදාරණලද්දේයයි එහි ඛණ්ඩනාථාභාසයි.

එසේ වදාරා එහිම

"අප්පස්සුතොපි වෙ හොති සීලෙසු අසමාහිතො,
උභයෙන නං ගරහන්ති සීලතො ච සුතෙන ච.

අප්පස්සුතොපි වෙ හොති සීලෙසු සුසමාහිතො,
සීලතො නං පසංසන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං.

බහුස්සුතොපි වෙ හොති සීලෙසු අසමාහිතො,
සීලතො නං ගරහන්ති නස්ස සම්පජ්ජතෙ සුතං.

බහුස්සුතොපි වෙ හොති සීලෙසු සුසමාහිතො,
උභයෙන නං පසංසන්ති සීලතො ච සුතෙන ච.

බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං,
නෙක්ඛං ජාම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,?
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතොති.

යන මේ ගාථාවන්ද වදාළසේක්. එහි අදහස නම්:-ඉදින් යමෙක් සූත්‍රගෙය්‍යවෙය්‍යාකරණාදී නවාංගශාස්තෘශාසනයන් අතුරෙන් එක්තරා අංගයක් අසනලද්දේ පූර්ණාගප්‍රතිපදයෙහි නොපිළිපන්නේ ශීලයන්හි අපරිපූරකාරීන් වීද ඒ පුහුලා බුද්ධාදී පණ්ඩිතයෝ ශීලයෙන්ද ශ්‍රැතියෙන්ද යන දෙකාරණයෙන්ම නිඳා කරන්නාහුය. ඉදින් යමෙක් තෙමෙ කියනලද නවාංග ශාස්තෘශාසනයන් අතුරෙන් එක්තරා අංගයක් අසනලද්දේ ශීලයන්හි පරිපූරකාරී වී නම් ඒ පුහුලා බුද්ධාදීපණ්ඩිතයෝ ශීලයෙන් ප්‍රශංසා කරන්නාහුය ඔහට ශ්‍රැතිය සම්පාදනය නොවන්නේය. ඉදින් යමෙක් තෙමෙ කියනලද නවාංගශාස්තෘ ශාසනය බොහෝකොට අසන ලද්දේත් ශීලයන්හි අපරිපූරකාරී වී නම් ඒ පුහුලා බුද්ධාදීපණ්ඩිතයෝ ශීලයෙන් නිඳාකරන්නාහුය ඔහට ශ්‍රැතියසම්පාදනය වන්නේය. ඉදින් යමෙක්තෙමේ කියනලද නවාංගශාස්තෘශාසනයෙන් බොහෝකොට අසනලද්දේ නවලොකොත්තරධර්මයට අනුරූපධර්මයවූ ශීලසහිත පූර්ණාගප්‍රතිපදයෙහි පිළිපන්නේත් වේද ඒ පුද්ගලතෙම බුද්ධාදීපණ්ඩිතයෝ ශීලයෙන්ද ශ්‍රැතියෙන්ද යන දෙකාරණයෙන්ම ප්‍රශංසාකරන්නාහුය. එහෙයින් බහුශ්‍රැතවූ ශාස්තෘධර්මයන්ට ආධාරවූ හෙවත් ධර්මධාරීවූ මහාප්‍රඥ ඇත්තාවූ බුද්ධශ්‍රාවකයන් වහන්සේට ජාති සවණීණසම්බන්ධිවූ නිෂ්කායකථමෙන් හෙවත් සවණීපසක් ප්‍රමාණවූ

සවණ්ණසට්ඨාවකට නිතු නොකටහැක්කාක්මෙන් කවරෙක් නිතුකරන්නට හැකිවන්නේද නොහැකිවන්නේමය ඒ පුතුල. හට දෙවියෝද බ්‍රහ්මයෝද ප්‍රශංසා කරන්නාහුය යනු එහි වණ්ණනා නයයි.

ධම්මභාණ්ඩාගාරිකවූ ආනන්දස්ථවිරයන්වහන්සේද තමන් වහන්සේගේ බහුශ්‍රැතභාවය නිසා "එතදග්ගං භික්ඛවෙ!" යනා දියෙන් සම්‍ඵමීයන් අවබොධකළ සම්‍ඵඳයන් වහන්සේ විසින් "මාගේ ශ්‍රාවකවූ බහුශ්‍රැත භික්ෂූන් අතුරෙන් මේ අනද තෙර තෙමේ අග්‍රය"යි පසසනලදභාවයට පැමිණියේය. බහුශ්‍රැත කැනැත්තේ නිදුකින්ම උපදවනලද ලාභසත්කාර ඇත්තෙක්ද වන්නේය. ඊට නිදසුන් වශයෙන් ගෙනහැර දක්වනලද කථා වස්තුවක් නම්.

එක්තරා බ්‍රාහ්මණයෙක් මෙසේ සිතුයේය. කෙසේද යත්? බුඩරතනයටද සඞ්ඝරතනයටද පූජාපෙණෙයි. කෙසේ වනාහි ධම්මරතනයට පුදනලද්දේ වේදෑයි කියයි. මෙසේ සිතා ඒ බමුණු තෙමේ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේවෙත එළඹ මෙකරුණ විවාළේය එකල අසරණසරණවූ ඵපදෙත්තමවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ බමුණ! තෝ ඉඳින් ධම්මරතනයට පුදනු කැමැත්තෙහි නම් එක් බහුශ්‍රැත භික්ෂුවක්හට පුදවයි වදාළසේක. සවාමීනි! බුදුරජාණන්වහන්ස! එක් බහුශ්‍රැතභික්ෂුවක් මට වදාළමැනවයි සැලකෙළේය. බමුණ! ඕක්සඟනඅතින් විචාරවයි වදාළේය. බමුණතෙමේ භික්ෂූන්වෙතැ එළඹ සවාමීනි! මට බහුශ්‍රැත භික්ෂුවක් කියනු මැනවැයි කීයේය. එකල භික්ෂූහු බමුණ! අනද තෙරතෙමේ බහුශ්‍රැතභික්ෂුවකැයි කීහ. ඒ බමුණතෙමේ ලක්ෂයක් අගණා සිවුරකින් ආනන්දස්ථවිරයන්වහන්සේ පිදූයේය. යන මේ කථාවස්තුව මහාගොසිඟසාලසූත්‍රවණ්ණනායෙහි දක්වන ලද්දේය.

මෙසේ බහුශ්‍රැතයාගේ බහුශ්‍රැතභාවය ප්‍රශංසාආදියට හෙතු වන හෙයින්ද අකුසලප්‍රහානකුසලාධිගම හෙතුවන බැවින්ද මඞ්ගල නම් වන්නේය.

එහෙයින් සත්තඞ්ගුත්තරයෙහි තිතීයඞ්ගීයෙහි නාගරොපම සූත්‍රයෙහි "සුතවා ච ඛො භික්ඛවෙ! අරියසාවකො අකුසලං පජහති කුසලං භාවෙති සාවජ්ජං පජහති අනවජ්ජං භාවෙති සුචි මත්තානං පරිහරති" යන මෙය වදාරන ලද්දේය.

එහි අදහස නම්:-මහණෙනි! ශ්‍රැතවත්වූ ආර්‍යශ්‍රාවකතෙමේ අකුසල් දුරුකෙරෙයි කුසල් වඩයි සාවද්‍යධර්මයන්ගේ දුරු කෙරෙයි නිරවද්‍යධර්මයන්ගේ වඩයි පිරිසිදුවූ සිතක් පරිහරනය කෙරෙයි යනුයි.

"සුඛමත්තානං පරිහරති" යන මෙහි සුඛය, පර්‍යායවශයෙන්ද නිෂ්පර්‍යායවශයෙන්දැයි කියා දෙවැදෑරුම් වන්නීය. පර්‍යායවශයෙන් ශරණාගමනයෙන් පිරිසුදුවූවක්කොට ආත්මය පරිහරනය කෙරෙයි. එසේම පංචශීලයෙන්ද දශශීලයෙන්ද චතුපාරිසුද්ධිශීලයෙන්ද ප්‍රථමධ්‍යානයෙන්ද ද්විතීයධ්‍යානයෙන්ද නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙන්ද සොවාන්මාර්ගඵලයෙන්ද සකදාගාමිමාර්ගඵලයෙන්ද අනාගාමිමාර්ගඵලයෙන්ද පරියාය වශයෙන් පිරිසුදුවූවක් කොට ආත්මය පරිහරනය කරන්නේ නම් වන්නේය. අනාගාමිඵලයෙහි පිහිටි ක්ෂීණාශ්‍රවතෙමේ වනාහී උදුළුතණමුල්ඇති පස්හඳ නහවන්නේ නමුදු කවන්නේ නමුදු පොවන්නේ නමුදු හිඳුවන්නේ නමුදු හොවවන්නේ නමුදු නිෂ්පර්‍යාය වශයෙන් ආත්මය පිරිසිදුවූවක් කොට හෙවත් අපිරිසුදුවූ ක්ලේශයන්ගේ අභාවයෙන් පිරිසුදුවූ රාගාදිකෙලෙසම්ලාපගමයෙන් නිර්මලවූවක් කොට ආත්මය පරිහරනය කෙරෙයි යනු එහි **වණ්ණනාභා විඤ්ඤායති**මෙසේ බහුශ්‍රැතභාවය පිළිවෙළින්ම පරමාර්ථධර්මයන් සාක්ෂාත්කිරීමට හේතුවන හෙයින්ද මඞ්ගල නම් වන්නේය.

භාරවාජ නම් බමුණුහට ධර්මදේශනා කරන භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ "**සඬ්ඪාජාතෝ උපසඞ්කමති උපසඞ්කමන්තෝ පයිරුපාසති**"යනාදී **මජ්ඣිමපණ්ණාසකයෙහි පඨම වග්ගයෙහි චඞ්කීසූත්‍රපාළිය** වදාළසේක.

එහි අදහස නම්:-"යමෙකුත් ශ්‍රද්ධාඇති පුද්ගලතෙමේ බහුශ්‍රැත ධර්මධාරීන්වෙත උවටැන් පිණිස එළඹෙයි උවටැන් පිණිස එළඹ සමීපයෙහි හිඳගනියි සමීපයෙහි හුන්නේ දහම් ඇසීමට ප්‍රසාදශ්‍රොතස යොමුකෙරෙයි යොමුකළ ප්‍රසාද ශ්‍රොතස ඇත්තේ දෙසනාදහම් අසයි ඇසූධර්මයන් ප්‍රගුණ කොට හෘදයෙන් ධරයි ද්‍රගුණ කොට ධාරාධර්මයන්ගේ අර්ථය අර්ථවශයෙන්ද කාරණවශයෙන්ද හෙතුවශයෙන්ද උදාහරණවශයෙන්ද උපපත්තිවශයෙන්ද විමසයි අර්ථවිමසන්නාහට "මෙහි සීලය කියනලද්දේය මෙහි සමාධිය කියනලද්දේය"යි මෙසේ ධර්මයෝ වැටහෙත් එසේ ධර්මයත් වැටහීම ඇතිකල්හි කත්තුකම්‍යතාසඞ්ඛ්‍යාත කුසලච්ඡන්දය උපදියි උපන් කත්තුකම්‍යතා කුසලච්ඡන්දය ඇත්තේ

පළමුකොට සහරවිසුඞින්ගේ සම්පාදනය කිරීම්වශයෙන් ව්‍යායාම කෙරෙයි ව්‍යායාම කොට අනිත්‍යාදිවශයෙන් තීරණය කෙරෙයි. තීරණය කොට මහාවහාහ මහාපරියාපන්නතාවතුසම්මප්පධාන යන වීර්‍යයන් වීර්‍යය කිරීම්වශයෙන් පරිපූරණය කෙරෙයි. එසේ වීර්‍යය කරන්නේම අමෝඝධම්මතායෙන් පරමාර්‍යසත්‍යය සහජාතනාමකායයෙන්ද නිර්‍වාණය සාක්ෂාත්කෙරෙයි. ප්‍රඥාවෙන්ද කෙලෙසුන් බිඳහෙලා ඒ නිර්‍වාණයම ප්‍රකටකොට දක්නේය" යනුයි.

මේකියනලද්දේ අනගාරිය බාහුසච්ච නම් වන්නේය.

දැන් මෙතැන්පටන් ගෘහස්ථයන්ගේ බහුශ්‍රැතභාවය නියතුලැබේ.

ගෘහස්ථයන්ට වනාහි බාහිරශිල්පයක් අසා හෝ ඉගෙන හෝ උපන් යම් දක්ෂබවෙක් ඇද්ද එසිනුත් යමක් නිරවද්‍යද එය දෙලෙවිහිම හිතසුව එලවන හෙයින් මහුල්නම් වන්නේය.

ඒට නිදසුන්වශයෙන් මේ සාථාවසතුව දක්වන ලද්දේය. ඝටගීසදවස බරණැස්නුවර ජනක නම්වූ බරණැස්රජ්ජුරුවන් රාජ්‍යයභාරත සමයෙහි අපමහබෝසතාණෝ සේනක නම් බ්‍රාහ්මණ කුමරෙක් වී තක්සලානුවරට හොස් සියලුශිල්පයන් ඉගෙන නැවත බරණැසට පැමිණිසේය. එකල රජ්ජුරුවෝ ඕහට මහත්වූ ඇසඉසුරුසමග මහඇමතිතනතුර දුන්නාහ. එකල ඔහු රජුහට අර්‍ථයෙන් ධම්මයෙන් අනුශාසනා කරන අමාත්‍යයා වී එක්දිනක් රාජාදීන් විසින් සදනලද දම්සභායෙහි අලංකාරභාරතලද ධම්මාසනයෙහි හිඳ බුබලීලායෙන් ධම්දෙසනා කෙළේය. එකල එක්තරා මහලුබමුණෙක්තෙමේ ධනාසිගීමෙන් දහසක් සහවණු ලැබ එක්බමුණුකුලයක තබා නැවතත් සිගීමට ගියේය. ඒ බමුණු කුලය ඒ සහවණු වළඳා ඔහු පෙරලා ආකල දෙන්නට නොහැකිය තමදු හඬුකොට ඕහට දුන්නේය. ඒ බමුණුද ඇය ගෙනවුත් බරණැස සමීපයෙහි බමුණුගැමැ ඇය සමග විසූයේය. ඕ තොමෝ වනාහි ඉතා තරුණ බැවින් මෙවුන් දම්හි තෘප්තිරහිතවූවා එක් තරුණබමුණෙකු සමග මිත්‍යාචාර කරන්නී මෙසේ මම නිහීයව නිතරම කරන්නෙමැයි සිතා එක් දිනක් "බමුණ! මම නුඹගේ ගෙයි වැඩ කරන්නට නොහැක්කෙම් නුඹ සිහා ලැබූ ඔනයෙන් මම දැසියක් ගෙන එව" යි බමුණුහට කීය.

බමුණුතෙමෙද ඇඟට වසඟවූයේ මැනවැයි කියා අක්සුණු පිරූ සම්පයියක් ගෙන ගම්නිගම්ගම්රාජධානීන්හි හැසිරෙන්නේ සත්සියයක් කඟවණු ලැබ පෙරළා එන්නේ අතරමග එක් බිලරුකක්මුල අක්සුණු කා පයිමුව නොබැඳ පැන් බොන්නට දියට බටුයේය. එකල රුක්බිල්හී විසූ නාරජෙක් අක්සුණුසුවදින් පයියතුළට වැද දරණගසා අක්සුණු ගලිමින් හුන්නේය. බමුණුතෙමෙ පැන් බී අවුත් ඇතුළත නොබලාම පයිමුව බැඳ කරලාගන යන්නේ "බමුණ! අද මගසිටියොත් නෝ නසසී ගෙදර ගියොත් අඹු නසසී" යන රුක්දෙවියෙකු විසින් කියනලද වචනය අසා මරණභයින් බියපත්ව වැළපෙමින් බරණැසැ දෙර සමීපයට පැමිණියේය. එදා පුණුරැසිපොහෝදිනක් විය. මනුෂ්‍යයෝ ගඳදුම්මල්ආදිය ගත් අත් ඇත්තාහු බෝසතාණන් වහන්සේගේ ධර්මය අසන්නට ගියාහුය. ඒ බමුණුතෙමෙ උන්දැක විචාරූ සේනකපඬිතුමන්ගෙන් බණ අසනු පිණිස යන බැව් අසා 'සෙනකපඬිතෙමෙ ධර්මකථිකයෙක්ලු ඔහු යම් ධර්මයක් කියා මාගේ ශෝකය බැහැරලන්නේය. මවිසිනුදු එහි ගොස් බණ අසන්නට වටනේය"යි සිතා ඔවුන් සමඟ එහි ගොස් කරගත් අක්සුණුපයියෙන් යුක්තවම හඬමින් පිරිස්කෙළවර සිටියේය. ඒ දැක බෝසතාණන්වහන්සේ "මොහුතුළ කදුලු නැගීමට සමර්ථවූ බලවත් ශොකයක් ඇතිවිය යුත්තේය"යි සිතා ශොකයට කරුණු විචාළේය. ඒ බමුණුතෙමෙ දෙවියා විසින් කියනලද වචනය කියා "මෙය අසා ශොකකෙරෙමි පණ්ඩිතයන්වහන්ස! මාගේත් බිරිඳගේත් මරණයට කරුණු නවරේදැ?"යි විචාළේය. බෝසතාණන්වහන්සේ සලකා බලනසේක් දිවසින් මෙන් තමන්වහන්සේගේ උපායකෞශල්‍යඥතයෙන්ම ඒ සියලු කරුණු දැන "බමුණ! තාගේ මේ පසුබිමෙහි අක්සුණු ඇතිද?"යි විචාළේය. පණ්ඩිතයන්වහන්ස! ඇතැයි කීයේය. අද උදය භොජනසමයෙහි කොයිබදී අක්සුණු කෑයෙහිදැ?යි විචාළේය. වෙනෙහි විලරුකක්සමීපයෙහිදීය. අක්සුණු කා පැන්බොන්නට යද්දී පයිමුව බැඳපිදැ? නොබැඳපීම්. එහෙනම් තා පැන්බොන්නට දියබටුකලැ අක්සුණුසුවදින් එක් නාරජෙක් පයිවන්නේයයි සිතම්. ඉදින් නෝ අතරමහැ වසනෙහිනම් තෙමේ අක්සුණු කන්නට පයියතුළ අතලන්නේය. එකල තාඅත නඟා විසින් දඟකරනලදින් අතරමහදී නෝ නස්නේය. මෙය තාගේ මරණයට කාරණය. ඉදින් අද ගෙට යන්නෙහිනම් එහි ගියකල තාබිරිඳ බඳුගන්නට පයිතුළ අතලන්නීය. එකල ඇඟඅත නඟා විසින් දඟකරනලදින් ඇ මියයන්නේය මේ ඇඟගේ මරණයට

කාරණය වන්නේය. මේ සඳහා ඒ දෙවියා එසේ කියේය. එබැවින් ඒ පසුම්බිය කරින් බහා පිරිසමැද තබා පයිමුව මුදා ඉවත්ව සිට දණඩකින් පයියට ගසවයි කියේය. බමුණා ඒ කිලෙසට කෙළේය. නාරජතෙමෙ පෙණයකොට සූ සූයයි ශබ්ද කරමින් එයින් නික්මුනේය. එක්බිති එක්තරා අභිගුණඩිකායෙක් ඔහු අල්වා වෙනෙහි හැරියේය. එහි රැස්ව සිටි මනුෂ්‍යයෝ සමීඥ බුදුකෙනෙකුමෙන් බෝසතාණන්වහන්සේ මෙය ප්‍රඥාඟකල්‍ය සේකැයි තුටු පහටු වූවාහු ලක්ෂගණන් හිසවට පිළිගරකැවීම්ද ලක්ෂගණන් අසුරැගැසීම්ද ලක්ෂගණන් සාධුනාදද පැවැත්වූවා හුය. මහපොළොව ගිහුම් දෙනහඬමෙන් සාධුනාදය වූයේය. ඝණමෙඝවර්ෂාවක්මෙන් මහබෝසතාණන්වහන්සේට පූජාපිණිස සත්රුවන්වැසිවට බමුණුතෙමෙද තමාලත් කහවණු සත්සිය යෙන් ඒ මහබෝසතාණන් පිදුයේය. මහබෝසතාණන්වහන්සේද ඒ කහවණුගෙන බමුණුහට දහස පුරවන්නට කහවණු තුන්සියයක් දෙවා කවරෙකු විසින් තා ධනසිරිමෙහි යවනලද දැයි විචාළේය. පණ්ඩිතයන්වහන්ස! මාගේ බිරින්දයයි කියේය. ඕතොමෝ මහලුද තරුණදැයි විචාළේය. පණ්ඩිතයන්වහන්ස! තරුණයයි කිය. එහෙනම් ඕතොමෝ අනිකෙකු සමඟ මිථ්‍යාචාරකරන්නී නා සිරිමෙහි යැවීය. ඉදින් මේකහවණු ගෙදර ගෙනගියහොත් සොරසැමියාහට දෙන්නේය. එසේ හෙයින් තෝ මේ කහවණු ගමින් පිටත කිසියම් රක්ෂාසථානයක තබා ගම්වදුවයි කියා ඔහු පිටත් කොට හැරියේය. බමුණුතෙමෙ එසේ කොට ගෙදොරසමීපයට ගොස් පින්වත සොඳුර! කියා කථාකෙළේය. ඕ තොමෝද එකෙණෙහි සොරසැමියා සමඟ හොත්තී ඔහුගේ ශබ්දය අසා පහන නිවා ඔහු ගෙයතුළවන් කල සොරසැමියා බැහැර කොට පිටිදොරතබා ගෙට වැද තා විසින් කිනම් දෙයක් ලදැයි විචාළීය. එවිට බමුණුතෙමෙ දහසක් කහවණු ලදිමි අසවල්තැන තැබීමියි කීයේය. බැමිණි ගොස් සොරහිමිහට ඒ බව කිය. සොරහිමිතෙමෙ එය ගෙන ගියේය. දෙවනදිනෙහි බමුණා ඒ නොදැන මහබෝසතාණන්වෙත එළඹ එපුවත සැලකෙළේය. මහබෝසතාණන් වහන්සේ ඒකාරණය දැන ඔහට සත්දිනකට පොහෝනා වියදම් දී පළමු දිනෙහි තාගේ කුලුපගවූ සත්දෙනෙක බිරිඳගේ කුලුපගවූ සත්දෙනෙ කැයි තුදුසක් බමුණන් පවරා වළඳවා දෙවන දිනෙහි පටන් එකෙකා අඩුකොට සත්වන දිනෙහි තාගේ කුලුපග එකෙක බිරිඳගේ කුලුපග එකෙකැයි බමුණන් දෙදෙනෙක් පවරා

දන්දෙව ඔවුනතුරෙන් ඛිරිඳුගේ කුලූපගවූ යම් බමුණෙක් සත්ද්‍රිය නිබඳවම ආයේද ඔහු මට කියවයි කියේය. බමුණු තෙමේ එසේ කොට බෝසත්හට කියේය. බෝසත්තෙමේ මිනිසුන් ලවා ඔහු අල්වා ගෙන්නවා එම්බල! තෝ අසවල් රුක් මූල තිබූ මොහුගේ කාහවණු දහස ගත්තෙහිදැයි විවාළේය පණ්ඩිතයන් වහන්ස! නොගනිමියි කියේය. කිමෙක බමුණ! මම සෙනකාපණ්ඩිත නමැයි තෝ නොදන්නෙහිදැයි විවාළේය. එබමුණු තෙමේ බියපත්ව පණ්ඩිතයන් වහන්ස! මවිසින් එය ගෙන අසවල්තැන තබනලදැයි කියේය. මහබෝසත් තෙමේ මිනිසුන්ලවා එය ගෙන්නවා සොරසැම්බමුණාට රජඅණකරවා නුවරින් පිටලා අනිකාහට මහත්යසඉසුරු සමඟ ලක්ෂයක් දී ඒ අඹුසැමිදෙදෙන තමන්ගේ සමීපයෙහි වාසයකරවීය. මෙසේ ඒ බෝසත් තෙමේ බමුණා දුකින් මුදවමින් පරමාඊ පාරමිතාව පිරූසේකා

එහෙයින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වරියා පිටක යෙහි

"පඤ්ඤය විචිනනෙනාහං බ්‍රාහමණං මොචයිං දුඛා,
පඤ්ඤය මෙ සමො නත්ති එසා මෙ පඤ්ඤ පාරමී"ති.

වදූළසේකා

එහි අදහසනම් මම සෙනකපණ්ඩිතව උපන්කල ප්‍රඥවෙන් සොයා බලා"මහසිවියොත් තෝ නසසී ගෙදරගියොත් අඹුනසසී" යන දෙවතාවචනයෙන් දුකටපත් බමුණා ඒ දුකින් මුදා ලීමි. එබදුවූ ප්‍රඥවෙන් මාහා සමවූවෙකු ලොව නැත්තේය. මේ මාගේ ප්‍රඥපාරමිතා නම් වන්නීය යනුයි

අඤසාලිනියෙහිද පසුබියතුළවන් සඊයා දක්වන්නහුගේ පාරමිතා තොමෝ පරමාඊපාරමී නම් වියයි කියනලද්දේය. මෙබදු ප්‍රශ්නයාගේ වනාහි බුඩලිලාවෙන් විසඳා ප්‍රකාශකිරීම ජාතිගොත්‍රකුලවයසඛන යන මොවුන්ගේ බලයක් නොවෙයි වැලිඑකෙක් ඇති ප්‍රඥවගේ බලයම වන්නේය ප්‍රඥවතතවූ පුරුෂ තෙමේ වනාහි විදසුන් වඩා ආයර්‍යිමාර්‍යසංඛ්‍යාත දෙර හැර නිවන් පුරයට පැමිණෙන්නේය. ප්‍රඥවත් පුරුෂ තෙමේ ශ්‍රාවක පාරමිතාවද ප්‍රත්‍යෙක බොධියද සම්‍යක්සම්බොධියද ප්‍රතිවෙධ කරන්නේය. සඞ්ඛයන් නිවන්පමුණුවනධර්මයන් අතුරෙන් ප්‍රඥ වම ශ්‍රෙෂ්ඨවන්නීය අවශෙෂධර්මයෝ ඊට පිරිවර වන්නාහුය.

එහෙයින්,

"පඤ්ඤා හි සෙට්ඨා කුසලං වදන්ති,
තක්කත්තරාජාරිව තාරකානං.

සීලං සිරිං වා 'පි සතඤ ධම්මං,
අභිභායිකා පඤ්ඤවතෝ භවන්ති"ති. යි වදළ සේක.

එහි අදහස නම් ආචාරශීලයද ඓශ්වර්‍යයද සත්පුරුෂ ධර්‍මයද ප්‍රඥාවද යන මේ චතුර්විධධර්‍මයන් අතුරෙන් තාරකාවන්ට වඩා උතුම් වූවාක්මෙන් ප්‍රඥාවම ශ්‍රේෂ්ඨවන්නීය සෙසු තුන්ධර්‍මයෝ ප්‍රඥාවත්තයාඅනුව යන්නාහුය ප්‍රඥාවටම පිරිවරවන්නාහුයයි බුධාදීපණ්ඩිතයෝ ප්‍රකාශකරන්නාහුය යනුයි.

මෙසේ ඒ සෙනසපඬිතෙමේ තමන්ගේ බහුශ්‍රැතභාවය කරණකොටගෙන ඇමතිතනතුරුආදී මෙලෝහිතකර දෙයට පැමිණ මිනිසුන්ට දම් දෙසීමෙන් හා බමුණා දුකින් මිදුවීමෙන්ද පරලෙවැ හිතසුව ඵලවන කර්‍මයන් කෙළේය.

මෙසේ බහුශ්‍රැතභාවය උභයලොකහිතසුව ඵලවන හෙයින් මහුල් වන බවට නිදසුන්වශයෙන් ගෙනහැර පාන්නලද **සත්ත නිපාතයෙහි සත්තුභත්තජාතකවණ්ණනායඤ්ච** සෙනකපණ්ඩිත වස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

එකිම පරහනපජාතකවණ්ණනායඤ්ච ආවාවූ තක්සලානුවරින් සියලු සිල්පයන් හා සියලු හඬහඳුනතමන්ත්‍රයද ඉගෙනගත් ආචාර්‍යවූ, පියා විසින් යුවරජතනතුරෙහි තබනලද, නැවත මහරජබැව් කරවා දැනදීපින්කම් කොට සවර්ගපරායන වූ, බඹදත්රජපුත්හුගේ වස්තුවද මේ පිණිස ගෙනහැර දැක්විය යුත්තේය.

භූදීජනමත්තනඳනවූ බාහුසච්ච නම් සත්වන මහුල්විතර මෙතෙකින් නිමවනලද්දේය.

බාහුසච්චකථාවට අනතුරුව සිප්ප නම් වූ අටවැනි මහුල් විතර කථනය පටන්ගනු ලැබේ.

ශිල්පය නම් අනගාරිය අගාරියවශයෙන් දෙවැදෑරුම්වූ හස්තකෞශල්‍යයයි, නෙවත් හස්තකර්‍මානතයෙහි දක්ෂබවයි, ඔවුන අතුරෙන් අනගාරියශිල්පය නම්:—

"පුන ච පරං භික්ඛවෙ! භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි පෙ අයම්පි ධම්මො නාථකරණො"ති දසඞ්ගුත්තරසෙඛ දෙසිතවගීසෙඛ සත්වනසුත්ත සෙඛ වදුරණුලද්දේඝ.

එහි අදහස නම්:-මහණෙනි! නැවතද අනික්‌ත් කියම් උස්මිටිවූ හෙවත් සිවිරු කිරිමය සිවිරු රැදිමය සැයෙහි සුණුපිරියම්ය පෙහෝගෙය සැමලසුන්ගෙය බෙෝමලසුන්ගෙය යන මේ තන්හි ඇවයුතුවූ කාමාන්නය යනාදීවූ මහත්කාමාන්නද පාදෙවුන් කිරිමය පාතෙල්ගැල්වීමය යනාදීවූ කුඩාකාමාන්නද යන උස්මිටිවූ කුම්කොරෙම්දැයි පිළිවිස ඇවයුතුවූ යම් ඒ කාමාන්නයෝ වේද්ද මහණතෙමේ ඒ කාමාන්නයන්හි දක්ෂවෙයි අනලසවෙයි ඒඒ මහත්වූද කුඩාවූද කාමයන්හි සිඛකිරිම්වශයෙන් එලඹිමෙහි සමර්ථවෙයි ඒ ඒ සිඛකටයුතුකමයන්හි උපායවු භික්ෂුධම්ඉරණතායෙන් යුකතාවෙයි ඒ ඒ කාමාන්නකිරිමෙහි විමසිමෙන් යුකතවෙයි කිරිමෙහි හා විචාරිමෙහි සමර්ථවෙයි මහණෙනි! මෙයද නාථකරණ හෙවත් තමහට ප්‍රතිඥාඅකරන ධම් නම් වන්නේඝ. මෙම අර්ථය අර්ථකථාටීකාසහිත සංගිතිසූත්‍රසෙඛිද බැලිය යුත්තේඝ. එය තමහටද මෙරමාහටද උභයලොකහිතසුව ඵලවනහෙයින් මහුල්නමැයි කියනලද්දේඝ.

එක්දිනක් භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ දක්ෂිණාගිරි නුවරෙහි සැරිසරනසේක් මගධක්ෂෙත්‍රය දැක ආනන්දඝ! භික්ෂූන්ට මේ ආකාරවූ සිවිරුකරන්නට හැක්කෙහිදැයි විචාළසේක. එකල ඒ ආකාරවූ සිවිරුකොට භාග්‍යවත් බුදුරජාණන්වහන්සේට දැක්වූයේඝ. ශාසනාවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ ඒ ආනන්ද ස්ථවිරයන්වහන්සේට ප්‍රශංසාඅරතසේක් භික්ෂූන්ට අඩගා වදුරා මහණෙනි! යමෙක් වනාහි මවිසින් සංක්ෂෙපයෙන් කියනලද භාෂිතයාගේ අර්ථය විසතරවශයෙන් දත්තේද ඒ අනඳතෙර පණ්ඩිතඝ ඒ අනඳතෙර මහපැණැත්තේඝයි වදුළසේක.

එකල එක්තරා භික්ෂුවක්හුගේ අඳනයෙහි සිදුරක්විඝ. ඒ මහණ තෙමේ "භාග්‍යවතුන්වහන්සේ විසින් දෙපට සඟලසිවුරද එකපටඋතුරුසළුවද එකපටඅඳනඝද අනුදුන වදුරණුලද්දේඝ. මාගේ අඳනයෙහි සිදුරක්විඝ ඉදින් මම අඟහලයක් හෙවත් අණඩයක් අලවන්නෙම් නම් භාක්පස දෙපවක් වන්නේඝ මැද එක්පැක් වන්නේඝ"යි සිතා අණඩයක් ඇලවූසේඝ ශාසනාවන් වහන්සේ ඒ දුන විහාරවාරිකාගෙහි වඩින්නාක්මෙන් ඒ

මහණවෙත වැඩමවා මහණ! නෝ කුමක් කරනෙහිදැයි විවාළ සේක. සවා මිනි!මම අඳනයෙහි අණියක් අල්ලම්සි සැලකෙළේය. ශාස්තෘන්වහන්සේ සාධු සාධු මහණ! මනාකොට අණඩය අල්ව වයි වදාරා භික්ෂූන්ට අඩහා වදාරා "අනුජානාමි භික්ඛවෙ! අහතානං දුස්සානං අහතකප්පානං ච්ගුණං සංඝාටිං" යනාදිය වදාළසේක.

එහි අදහසනම්:-"එක්වරක් සේදූ පිළිසම්බන්ධව දෙපටසඟළ සිව්රද එක්පට උතුරැසළුවද එක්පට අඳනයද බොහෝ කල් ගතවීමෙන් ලත් පැරණි පිළිසම්බන්ධව සතරපට සඟල සිව්රද දෙපට උතුරැසළුවද දෙපටහඳනයද පවුල්පිළියෙහි ඇතිපම ණද මම තොපට අනුදනිමි සල්පිළින් පතිත පිළියෙහි සෙවීමද කටයුත්තිය පිරිසිදීමෙක්ද නැත්තේය මහණෙනි! උදුරා අලවන පිළිකඬද හුයින් මැසීමද නූල්යටවනසේ වැටිකිරීමද මුද්‍රිකාපත්‍ර ද නොමැදුරා හෙත්තුකොට තබන පිළිකඬද මම තොපට අනුදනිමි"යි යනුයි.

මෙසේ මොවුන්ගේ හසනකම්නතයෙහි දක්ෂබව සුදුසු තන්හි යොදනලද්ද මෙලොහිතවැඩෙහි ඇතුළත්වනලද්දේ ප්‍රශංසා ඵලවනහෙයින් මඞ්ගල නම් වන්නේය. නුසුදුසු තන්හි යොදනලද්දේ නොමඟුල්වන්නේය.

උදායීස්ථවිරයන්වහන්සේ වනාහි සිව්රු කිරීමෙහි දක්ෂයෑ, සම්මදියෑ, හෙතෙමේ ගිහිකලැ භාග්‍යවතුන් සිට පැවිදිවූ මෙහෙණින්නට සිව්රක් කොට පඬුපොවා මැද නානාවණ්ණයෙන් කර නලද අඬාල මෙවුන්දම් ඇති සත්‍රී පුරුෂරූප ඇතිකොට හකුලා "නැගෙනිඝ! මේ සිව්ර හැකුළු පරිද්දෙන් ගෙනගොස් තබා යම් දිනෙක භික්ෂුනීසංඝයා ඔවා පිණිස එන්නේද එදින මේ සිව්ර පෙරවැ භික්ෂුනීසංඝයාගේ පසුපස්සෙන් එව"යි කියේය. ඕ තොමෝ එලෙස කළාය. ඒ දැක මනුෂ්‍යයෝ අවමන් ලෙසින් උසස්කොට කීවාහුය. ඕ තොමෝ එපුවත භික්ෂුනීන්ට කීය භික්ෂු නීහු භික්ෂූන්ට කීහ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට සැලකළාහුය භාග්‍යවතුන්වහන්සේ උදායීමහණහට නොයෙක් නයින් නින්දා කොට භික්ඛුනොවාදවගියෙහි චීවරසිබ්බනසික්ඛාපදය පණවා වදාළසේක.

මේසේ හසනකෞශල්‍යය නුසුදුසු තැන යෙදීම නොමඟුල් වන්නේය.

මෙකියනලද්දේ අනගාරියශිල්ප නම්වේ.

අගාරියශිල්පය නම්:-නානාවිධවේ එහි මෙරමාදිවූ තොර කිරීම් විරහිතවූ අකුශල්වර්ජිතවූ මණිකාරසවණ්ණකාරකම්දි යමක් වේද එය මෙලොවැ අජීවහනහෙයින් මඞ්ගලනම් වන් නේය. ඊට නිදසුන් වශයෙන් මේ කථාවස්තුව කියනුලැබේ.

ඉකුත්කාලැ කසීරටැ එක් නියම් ගමෙකැ මහාසම්පත් ඇත් නාවූ එක්තරා සිටාණොතෙක් වූයේය ඔහුගේ නිදන් ගතවූම සතලිස් කොළක් අමුරන් වූවාහුය ඔහුගේ බිරිඳ වනාහි කළුරිය කොට ධනලොභයෙන් ගොස් ධනය මතුයෙහි මූසිකාවක්වී උපන. මෙසේ පිළිවෙළින් සියලුම ඒ කුලය විනාශයට ගියේය ඒ ගමද මිනිසුන් විසින් හැරදමනාලද්දේ නාමරහිතභාවයට ගියේය. ඉක්බිති එක්තරා මණිකාරයෙක් තෙමේ ගල්කඩා මැණි කාක් ගනුකැමැත්තේ ඒ පැරණිගම තිබුතැන ගල්පහදා කැබූයේය ඒ මූෂිකා තොමෝ ගොදුරුපිණිස හැසිරෙන්නී ඔහු නැවත නැවත දක්නී ඔහුකෙරෙහි උපන් සෙනහඇත්තී මාගේ බොහෝවූධනය නිසරුණෙහි නස්නේය මොහු සමඟ එක්වී ඒ ධනය පරිභොගකරන්නෙමියි සිතා ඉන් එක් කහවණුවක් මුවින් ඩැහැගෙන ඔහුවෙතැබියොය ඒ මණිකාරතෙමේ ඒ දැන ප්‍රියවචනයෙන් කථාකරන්නේ කිමෙක දුව! කහවණුවක් ගෙනා දැයි කිය පියාණෙනි! මේ කහවණුව ගෙන පරිභොගකර මටද මස් ගෙනදෙවයි ඕතොමෝ කිය හේ තෙමේ කහවණුව ගෙට ගෙනගොස් මිලදී මස් ගෙනවුත් ඇයට දුන්නේය මූෂිකාතොමෝ මස්ගෙන තමන්වාසස්ථානයට ගොස් කෑය. ඕතොමෝ මේ නයින් දිනපතා ධනය ගෙනවුත් ඔහුටදී මස් ගෙන්වා කෑය. මෙසේ පිළිවෙළින් ඕතොමෝ ඒ සියලුමධනය ඔහට දුන්නීය. එයින් ඔහු ධනයෙන් ආඪ්‍යයෙක් වූයේය.

මෙසේ නිරවද්‍යශිල්පය මෙලොවැ ධනාගමයට හේතුවන හෙයින් මඟුල් වනබවට නිදසුන්වශයෙන් ගෙනහැර පාන්නලද පඤ්චනිපාතයෙහි තුදුස්වනවගැ ඛඛ්බුජාතකවණ්ණනාවෙහි මණිකාරවස්තුව මෙසේ සැකැවින් දක්වා නිමවන්නලද්දේය.

ශිල්පය නම් යම්කිසි හස්තකුශලතාවයෙකැයි අවිශෙෂයෙන් කියනලදහෙයින් වනාහි ඔමඤවාද ශික්ෂාපදවිභඞ්ගයෙහි ආවාවූ නළකාරාදී ශිල්පයද සාලිතශිල්පයද ලැබෙන්නේය. ඒ ශිල්පයද අජීවහනහෙයින් මඞ්ගල නම් වන්නේය.

අතීතකාලයෙහි තිවර නම් නුවර එක්තරා නළකාරයෙක් තෙමේ සිඛීපූ නම් සම්මාසම්බුදුරජාණන් වහන්සේට පිදීමට කළාලයක් දී ඒ කර්මය හෙතුකොටගෙන සුගතියෙහිම සුඅනුභව පක් සැරිසරා මෙබුදුසෙමෙහි කුලපුත්‍රයෙක් වී සස්නෙහි පැවිදි වැ රහත්බවට පැමිණියේය. ඒ රහත්තෙමේ තමන්ගේ පූර්වචරිතාපදානය ප්‍රකාශකරනසේක් අපදානයෙහි සූවිසිවගැ මෙමගාථාවන් ප්‍රකාශකෙළේය,

"තිවරායං පුරෙ රමේම නළකාරෝ අහං තදා,
සිඛිස්ස ලොක පජ්ජොතෙ පසන්නා ජනතා තහිං.

පූජෙතුං ලොකනාථස්ස කිලඤ්ජං පරියෙසති,
බුඩපූජං කරොන්තානං කිලඤ්ජං අදදං අහං.

චතුනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි කිලඤ්ජස්ස ඉදං ඵලං.

සත්තසත්තතිකප්පම්හි රාජා ආසිං ජලන්ධරෝ,
සත්තරත්නසමප්පන්නෝ චක්කවත්ති මහබ්බලෝ.

පටිසම්භිදා චතසෙසා ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුඩස්ස සාසන"නති.

එහි අදහසනම්:-"සකලලොකොත්තරාඪ්‍යයන් සිඩකළ හෙයින් සිඩාඪ්‍යනම්වූ තිලොකතිලකායමාන සම්මාසම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි සූයශ්දිව්‍යරාජයාමෙන් ත්‍රාජමානවනකාල්හි සිත්කලුවූ තිවරනම්වූ නගරයෙහි මම නළකාරයෙක් හෙවත් කුලුපෙත්තෙක් වීමි. එකල්හි ඒ නගරයෙහි ජනසමූහයා ඒ බුදුන්කෙරෙහි විශෙෂයෙන් පහන්වූවාහු ඒ ලොකනාථවූ බුදුරජාණන් වහන්සේට පුදනු පිණිස කළාලක් සොයන්නාහුය. මම ඒ දැක බුඩපූජාකරන්නවුන්ට එකල්හි කළාලක් දුනිමි. සුවානුකපකින් මත්තෙහි වූ එදින මම යම් බඳුවූ ඒ පුණ්‍යකර්මයක් කෙළෙම්ද ඒ කර්මය හෙතුකොටගෙන දුගතියක් නම් නොමදනිමි හෙවත් දුගතියකට නොපැමිණියෙමි කළාලදානයාගේ මේ ඵලය වන්නේය, ඒ හෙතුකොටගෙනම සත්සැත්තෑ කපෙක්හි සත් රුවනින් යුකතවූ මහාබලඇත්තාවූ ජලන්ධරනම් වූ සක්විතිරජ වීමි ඒ හෙතුකොටගෙනම සිඹුපිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂට්අභිඥාවෝද සාක්ෂාත්කරනලද්දහ ලොකශ්‍රෙෂ්ඨවූ බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව මවිසින් කරනලද්දේය."

යනුයි.

මෙසේත් නිරවද්‍යශිලපය ලෞකික ලොකොත්තරාර්‍ථ සාධක හෙයින් මඟුල් නම් වන්නේය.

අතීතයෙහි බරණැස්නුවර කුලුපොත්තෙක්තෙමේ කෙතව යන්නේ එක් පසේ බුදුවරයන්වහන්සේ නමක් දැකැ කෙතෙහි වපු රවියයි දස්කම්කරුවන් යවා තෙමේ පසුහැරි උන්වහන්සේ සිය ගෙට වැඩමවා වලඳවා නැවත ගංතෙරට වැඩමවා තම පුතුසමඟ දිඹුල්දඬෙන්බිත්තිකණුඇති නළදඬුයෙන් බිත්තිඇති පන්සලක් සොට සක්මන්මලුද කොට උන්වහන්සේ එහි තෙමසක් වාසයකර වීය. ඒ දෙදෙනාද වැසනිමවූ වස්ඇති පසේබුදුවරයන් වහන්සේ තුන්සිවුරෙන් අන්දවා පිටත්කොට යැවූවාහුය. මේ නයින්ම පසේබුදුවරයන් වහන්සේලා සත්නමක් එහි වස්වසවා තුන්සිවුරු පිදුවාහුය. පියපුතුදෙදෙනම කුලුපොත්තෝ වී ගංතෙර හුණ දඬුගන්නාහු පසේබුදුවරයන්වහන්සේ දැක මෙසේ කලාහුයයිද කියත්. ඔහුදෙදෙන ඉන් සැව තව්තිසා භවනයෙහි ඉපිද සදෙව් ලොවැ අනුලොම් පිළිලොම් වශයෙන් දෙව්සුවඅනුභවකරමින් හැසිරෙන්නාහුය. ඔවුනතුරෙන් පියතෙමේ දෙව්ලොව්හිම සිටි යේය. පුත්තෙමේ ඉන් සැව වැදුරට මිපිලානුවර සුරුවි නම් වූ රජුගේ සුමෙධා නම් දෙවියගේ කුසැ පිළිසිඳගෙන දසමසක්හුගේ ඇවැමෙන් නික්ම මහාපණාද නම් වීය සොළොස්වයස්කලැ හැම ශිල්පයන්හි පරතෙරට පැමිණියේය. පියරජතෙමේ "දරු වෙනි වඩුවෙක් ගෙන්වාගෙන මාගේපුතුහට පහයක් මවවි ඔහු රාජ්‍යයෙන් අභිසෙකකරන්නෙමිසි" වසතුවිද්‍යාචාර්‍යයන් ඇණ වූහ. ඔහුතුමූ "මැනව දෙවඳන්වහන්සැ" සි කියා බිම්පෙදෙසක් විමසත්. එකල ඒ කුමරහුගේපුණ්‍යානුභාවයෙන් සක්දෙවිරජ හුගේ පඬුපුල්සලස්න උණුඅසුරක් වීය. සක්දෙවිතෙමේ ඒ කිමදැයි බලාදැන පහයක් කරවයි විස්කම්දෙවිපුත් යැවීය. ඒ විස්කම් දෙවිපුත්තෙමේ වඩුවෙසකින් වඩුවන් වෙත ගොස් තෙපි උදය බොජුන් අනුභවකොට එවියයි ඔවුන් යවා දඩකින් භූමියට ගැසූ යේය. එකෙණෙහිම අඩයොදුන්දිග පුළුලැති පස්විසි යොදුනක් උසඇති සත්රුවන්මුවා සත්බුමු පහයක් පැනනැංගේය. ඒ සඳහා නිබ්බානිපානසෙහි මහාපණාද ජාතකයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරනලද්දේය.

"පණාදෙ නාම සො රාජා යස්ස ත්‍යූපො සුවණ්ණයො,
තිරියං සොළසපබ්බඩො උච්චම්හු සහස්සධා.
සහස්සකණ්ඩා සත්තහෙදෙ ධජාලූ හරිතාමයො,
අනච්චුං තත්ථ ගන්ධබ්බා ජසහස්සානි සත්තධා"ති.

එහි අදහසනම්:-යම්බදු රජක්හට රන්මුවාවූ විතරින් සොළසක් හී පතන ප්‍රදෙශප්‍රමාණ විස්ථාරය ඇති හෙවත් අඩයොදුන් පමණ දිගපුළුලැති උසින් දහසක් හී ගමනය කරන තැන පමණ හෙවත් පස්විසි යොදුන් පමණ උසඇති සප්තභූමකාවූ ධවජබහුල කොට ඇත්තාවූ ඉදුනිල් මිණියෙන් වටකරනලද්දාවූ හෙවත් ඉදුනිල්මිණිමුවා දෙරකාවුළුවාතපානාදියෙන් යුකතවූ සත් තැනෙකැ සතට බෙදී සසිය සසිය බැගින් ගණිකාවියන් රජුහට රතිඉපදවීම පිණිස කරනලද නෘත්‍යඇත්තාවූ පහයක් පැන නැංගේද ඒ රජතෙමෙ "පණාද" නම් වීය යනුයි.

ඒ පණාද නම් මහරජතෙමේ දුනාදීපින්කම් කොටැ ඉන්සැව දෙව්ලොවටම ගියේය. ඒ පහය මහගඟැ සැඩපහර අනුව වැටුනේය. ඒ ප්‍රාසාදයාගේ සමීප භිණිපෙති ඉදිරියෙහි 'පයාගපති ඣාන, නම්වූ නුවරක් මැවුණේය. බොත්කම්කළතැන 'කොටි ගාම' නම් ගමක්වීය. ඒ නළකාරදෙව්පුත්තෙමේ මෙබුදුසෙමෙහි දෙව්ලොවින් සැව භද්දියනුවර අසූකෙළක් සම්පත්ඇති භද්දිය සිටුහුගේ පුත්‍රවූ 'භද්දජී' නම් කුමරෙක් වීය. එකල භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ භද්දියනුවර නිසා ජාතියාවනයෙහි වැඩ වාසයකරවදාරනසේක. නුවරහු නුවරමැද දන්හලක් කොට මහ දන් පැවැත්වූවාහුය. දෙවිමිනිසුන් සහිත ලොකයාහට අනුශාසනාකරන ශාසනාවූ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ එහි කරනලදබත්කිසඇත්තේ අනුමොදනා කොට වදාළසේක. භද්දජී කුමරතෙමෙද ශාසනාන් වහන්සේ වෙතැ එළඹැ දම්දෙසුම් අසා රහත්බවට පැමිණ ශාසනාවූ බුදුරජාණන් වහන්සේ සමඟ විහාරයට ගොස් පැවිදිව උපසපන්දවීය. තිලෝගුරුවූ භාග්‍යවතුන් වහන්සෙ එහි සත්දිනක් වැඩවාසකොට චාරිකායෙහි හැසිරෙනසේක් කෝටි නම් ගමට වැඩමවා කරනලද බත්කිස ඇත්තේ අනුමොදනා කළසේක. ඒ අතර භද්දජීස්ථවිරයන් වහන්සේ ගමින් බැහැරගොස් බුදුන් වැඩිකල නැගිටින්නෙමියි ගංතෙර සමීපයෙහි රුක්මුලෙකැ ධ්‍යානයට සමවැද හුන්නේ වැඩිමහලුතෙරුන් ආකල්හිත් නොනැගිට බුදුන් වැඩිකල්හිම නැගිටියේය. පුහුදු මහණහු උන්වහන්සේට අවමන් සිතා කීවාහුය.

එකල ශාසනාන්වහන්සේ ඔරුදෙකක් ගළපා අතුළක් කොට "භද්දජී! මෙහි එව අපසමඟ එකතැවට නහුව"සි වදාළසේක. භද්දජී ස්ථවිරතෙමේ පැනනැගී අහසින් ගොස් බුදුන් හා එකතැවෙහි සිටියේය. විපදෙත්තවූ ශාසනාන්වහන්සේ ගඟ

මැදට පැමිණිකල භද්‍රජී! තාවිසින් මහාපණාදකලැ වාසයකළ පහය කොයිබදැයි විචාළසේක. ඒ භද්‍රජී තෙරතෙමේ සවාමීනි බුදුරජාණන්වහන්ස! මෙතැන කිදුනේයයි කියා බුදුන් වැඳ යාඞ්බලයෙන් ගොස් පහකොත ඇඟිල්ලෙන් දවටාගෙන අහසට පැනනැඟී ප්‍රහුදුන්ගේ සැක දුරලීම පිණිස දක්වා වීසි කෙළේය. පහය තුබුතැන්හිම පිහිටියේය. අදදක්වාත් අතුරුදන් නොවීය. කුමක්හෙයින් අතුරුදන් නොවීද යත්? පෙර පියවූ නළකාරදෙවිපුත්හුගේ ආනුභාවය හෙයිනි. ඒ දෙවිපුත්තෙමේ වනාහි අනාගතයෙහි "සංඛ" නම් සක්විතිරජවන්නේය. ඔහුගේ පරිභොගය පිණිස ඒ පහය නැවතත් පැනනගින්නේය. එහෙයින් අතුරුදන් නොවිය.

මෙතැන් පටන් අට්ඨවාකථා සහිත චක්‍රවත්තිසූත්‍රයෙහි කියන ලද්ද විස්තරභාවයුත්තේය. මෙකියන ලද්දේ මෙහි සංක්ෂේපයක් වන්නේය. ඒ සංඛ නම් සක්විතිරජතෙමේ ඒ පහයෙහි වාසයකොට මෙතෙබුදුන් උපන්බැව් දැන එය පැවිදිවනු කැමැත්තේ මේ පහය විසිරේවායි සිතක් උපදවන්නේය. එකෙණෙහි ඒ පහය කඩාඩවී විසිරයන්නේය. එකල ඒ රජතෙමේ නොරැදෙමින්ම ගොස් යමෙක් යම් පමණක් කැමතිද ඔහු එපමණක්ම ගනීවායි කියා මහණ බමුණු දුගීමගීයාචකාදීන්ට එහි අගණාදෙය දන් දී මෙතෙබුදුන්වෙත ගොස් පැවිදිව මහත්ගුණයුත් රහත්බවට පැමිණෙන්නේය.

මෙසේ නළකාරශිල්පය සියලු ලෞකිකලොකොත්තරාර්‍ථ වහනයට හෙතුවූයෙන් එය මහුල් වනබවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද **පකිණ්ණකයෙහි සුරුච්ජාතකවණ්ණනා යෙහිද මහාපණාදජාතකවණ්ණනායෙහිද චක්කවත්තිසූත්‍ර වණ්ණනායෙහිද නළකාරවසතුව** මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

සාලිතශිල්පය වනාහී යුත්තසථානයෙහි යොදනලද්දේ මහුල් වන්නේය අයුත්තසථානයෙහි යොදනලද්දේ නොමහුල් වන්නේය. ඒ අර්‍ථය දක්වන්නාවූ කථාවසතුහු මෙහි පහළවන්නාහුය.

අතීතයෙහි බරණැස්නුවර එක්තරා පිළෙක්තෙමේ අතකුරුහසන ශිල්පයෙහි දක්ෂයෙක් වූයේය. ගම්දරුවෝ ඔහු රථයකතබා නුවර දෙරසමීපයෙහි පිහිටියාවූ නුගරුකක් වෙත ගෙනගොස් තුඩිටුපණම් ආදිය දී ඇත්රූ අස්රූආදිය කරවයි කිහ ඒ

පිළුතෙමෙ ගල්විද නුගපත්හි නොයෙක් රූපයන් දැක්වූයේය. රජතෙමෙ උසනට යන්නේ එතනට පැමිණියේය. එවිට පෙළහ ඕසෙන් සියලු ගම්දරුවෝ පලාගියාහුය. පිළුතෙමෙ යානොහැකිබැවින් නුගමුල්අතර හොත්තේය. රජ්ජුරුවෝ නුගපත් සිදුරුකරතිබෙන්නාදැක තවරෙකු වීසින් මෙසේ භාරනලදදැයි විවාළේය එබසට පිළුතෙමෙ දෙවයන්වහන්ස!මවීසිනැයි කියේය. රජ්ජුරුවෝ ඔහු කැඳවා දරුව! මාගේ පුරොහිතයා අතිශයින් මුඛරිසෙසා බොහෝ කථාකරන්නෙසා ඔහු කථාකරන්නට පටන් ගත්කල අනිකෙක් අවකාශ නොලබන්නේය ඔහු නිශ්ශබ්ද කරවන්නට හැක්කෙහිදැයි? විවාළේය. දෙවයන් වහන්ස! නැළියක් පමණ එළබෙට් ලදහොත් හැක්කෙමියි කියේය. රජ්ජුරුවෝ පිළු මාළිගයට පමුණුවා තිරයක්තුළ හිදුවා තිරයෙහි සිදුරක් කරවා නැළියක් පමණ වියලි එළබෙට් ඔහුළඟ තබවා පුරොහිතයාට සිදුර අභිමුඛකොට අස්නක් තබවා රජුහට උපස්ථාන කරනකාලයෙහි පැමිණියාවූ පුරොහිතයා එහි හිදුවා කථාවක් ඉපදවූයේය. පුරොහිතයා අනිකෙකුට අවකාශ නොදී රජු සමග කථාව පටන්ගත්තේය. එක්බිහි පිළුතෙම එක එක එළු ලඬය මුවෙහි විද්දේය. පුරොහිතතෙමෙ ආ ආ එළුවසුර තල කැවුම්මෙන් ගලනේය ඒ නයින් සියල්ලම අවසන්වූහ. රජ්ජුරුවෝ එළුවසුරු අවසන්වූබැව්දැන "ඇදුර! නුඹ අනිශයින් මුකරිබැවින් නැළියක් පමණ එළබෙට් ගිලෙන්නාහුද කිසිවක් නොදත්තෙහිය දැන් මිට වැඩියක් ගලිතහොත් දිරවන්නට නොහැකිවන්නෙහිය යව පුවහුයුෂ බී එළබෙට් බැහැරලා ශරීරය නිරොගී කරගනුව"යි කියා පිටත්කොට හැරියේය. ඒ පුරොහිතතෙමේ එතැන්පටන් ගොලුවෙක් මෙන් වී කථා කරනකල්හිත් කිසිවෙකු සමග කථානොකරන සුභාව ඇත්තෙක් වූයේය. රජ්ජුරුවෝ මොහු වීසින් මාගේ කනට සැපඇතිකෙලේයයි කියා පිළුහට සියුදිග්හි ලක්ෂයක් උපදනා ගම්වරසතරක් දුන්නේය. එදා එක්තරා පණ්ඩිතඇමතියෙක් රජුවෙතැ එළඹ "දෙවයන් වහන්ස! ශිල්පය නම් ලොකයෙහි පණ්ඩිතයන් වීසින් ඉගෙනගතයුත්තේය පිළුවිසින් සාලිතකශිල්පමාත්‍රයකින් මේ සම්පත්තොමෝ ලබනලද්දීය අනික් ශිල්පයන්ගේ ආනිශංස පරිච්ඡේදය කොපමණක් වන්නේද"යි ශිල්පයාගේ ගුණ වර්ණනා කරන්නේ.

"සාධුඛො සිප්පකං නාම අපි යාදිසකීදිසං,
පස්ස ඛඤ්ජපහාරෙන ලඛා ගාමා චතුද්දිසා"ති.

යන ගාථාව කීයේය.

එහි අදහසනම්:-මහරජ්ජුරුවන් වහන්ස! යම් ඒ කෙබඳු නමුත් ශිල්පය නම් යහපත් වන්නේමය. පිළුහු විසින් එළු බෙටි විදීම හෙතුකොටගෙන සියුදිග්හි ලක්ෂයක් උපදනා ගම්වර සතරෙක් ලබන ලද්දහ ඒ බලනයේක්වා අනික් ශිල්පයන්ගේ ආනිශංසප්‍රමාණය කොතෙක්වන්නේදැයි කියා ශිල්පගුණවණ්නා කෙළේය යනුයි.

මෙසේ සාලිතශිල්පයද යුත්තස්ථානයෙහි යොදනලද්දේ ඉහලොකාදීසාධකහෙයින් මඟුල්වනබවට නිදසුන් වශයෙන් ගෙන හැර පානලද **පීඨසප්පිවඤ්ඤුව** මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

ඒ පිළිම මෙබුදුසෙමෙහි සැවැත්නුවර සාලිතශිල්පයෙහි දක්ෂවූ කුලපුත්‍රයෙක් වී එක්දිනක් දහම් අසා පිළිලදසැදැහැත්තේ පැවිදිව උපසපන්ද වීය. ඒ මහණතෙමේ එක්දිනක් ළදරුමහ ණෙකුගෙන අවිරවතියට ගොස් නහා ගංතෙර සිටියේය. එකෙ ණෙහිම අහසින් යන්නාවූ හංසයන් දෙදෙනෙකුදැක ළදරුමහණ හට කියනුයේ මේ පසුව යන හංසයා ගලකින් ඇසටවිද පාමුල හෙලන්නෙමිසි කියේය. ළදරුමහණතෙමේ එසේ කරන්නට නොහැක්කෙහියයි කියේය. එහෙනම් බලවයි කියා එක්බොරලු කැටයක් ගෙන ඒ හංසයාගේ පිටිපසැ විද්දේය. බොරලුකැටය රෑං යන ශබ්දයෙන් ගියේය. හංසතෙමේ පසුහැරී බැලූයේය. ඒ මහණ තෙමේ එකෙණෙහි වවකුරු බොරලුකැටයක් ගෙන පසුහැරී බලද්දී ඔහුගේ ඉදිරියෙන් ඇසෙහි විද්දේය. ගල්කැටය ඇසකින් පිවිස ඇසකින් පිටවී ගියේය. හංසතෙමේ මහත් හඬින් හඬා පාමුල්හිම වැටුනේය. භික්ෂූහු ඒ කාරණය දැන භාග්‍යවතුන් වහන්සේට සැලකළාහුය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ඒ මහණහට නින්දාකළසේක.
මෙසේ සාලිතශිල්පය නමුදු අයුත්තස්ථානයෙහි යොදනලද්දේ අනර්ථාවහනයට හෙතුවන බැවින් නොමගුල්වන බවට නිදසුන් වශයෙන් ගෙනහැරපානලද **සාලිතජාතකවණ්ණනායෙහි හංසජාතකවසතුව්** සැකැවින් නිමවනලද්දේය.

ඒ පිළිසමිපයෙහිම එක්තරාපුරුෂයෙක් ඒ ශිල්පය ඉගෙන ගත්තේය. ඉක්බිති පිළිතෙමේ ඕහට කථාකොට "දරුව තෝ ශිල්පය විමසනුයේ දෙනක් මැරුවහොත් සියයක්දඩය පුරුෂ යෙක්මැරුවහොත් දහසක් දඩය එහෙයින් යමෙකුට විද්දකල

දඩයක් නැතහොත් එබදු මව්පියන් නැත්නොහු සොයව"යි කියේය. ඒ පුරුෂයා ඔඩොක්කුවෙහි බොරළුලාගෙන එබන් දෙක් සොයනුයේ එක්දිනක් පිඬුපිණිස හැසිරෙන්නාවූ 'සුනෙත්‍ර' නම් පසේබුදුවරයන් වහන්සේ දැක මෙහෙමේ දෙමව්පියන් නැත්තෙකැයි සලකා උන්වහන්සේගේ දකුණු කණෙහි ගලක් විද්දේය. ගල දකුණුකනින් පිවිස වම්කනින් නික්ම ගියේය. උන්වහන්සේ උපන්දුක් වෙදනා ඇත්තේ පිඬුපිණිස හැසිරෙන්නව නොහැකිව අහසින් ගොස් තමන්වහන්සේගේ පන්සලෙහි පිරිනිවිසේක. ගොදුරුගමැ මනුෂ්‍යයෝ උන්වහන්සේ නොවඩා නාඝාල කිසියම් අපහසුවෙකැයි සිතා එහි ගොස් පිරිනිවියාවූ උන්වහන්සේ දැක හැඬුවාහුය. ඒ පවිටුපුරුෂයාද එකල එහි ගොස් උන්වහන්සේ හැඳින මම මාගේ ශිල්පය විමසනුයේ මුන් වහන්සේට ගලින් විද්දෙමියි කියේය. ඒ අසාමනුෂ්‍යයෝ ඔහු තලා මැරුවාහුය. ඒ පාපයා යම්තාක් කාලකින් මේ මහාපොළොව යොදුනක් පමණ උසවැඩිද ඒතාක්කාල් අවීචියෙහි පැසී පැසුනු අවශෙෂයෙන් ගිජ්ඣකූළපව්වෙහි සඞ්ඝාට ප්‍රෙතයෙක් වූයේය. ඔහුගේ ශරීරය තුන්ගව්පමණවෙයි ඇවිලගත්තාවූ දිලි සෙන්නාවූ සැටදහසක් යකුළු ඔහුගේ හිසැ වැදිවැදී හිස බිඳින්නාහ. බුන්බුන්හිස යලියලිත් පියෙවිබවට පැමිණෙන්නේය.....

මෙසේ සාලිතශිල්පය අයුත්තස්ථානයෙහි යොදනාලද්දේ අනර්ථාවහනයට හෙතුබැවින් නොමඟුල්වනබවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද ධම්මපදයෙහි බාලවග්ගයෙහි සඞ්ඝාට ප්‍රෙතවස්තුව මෙතෙකින් නිමවනාලද්දේය.....

වැලිදු,

"තච්ඡකෝ තන්තවායෝ ච රජකෝ ච නහාපිතෝ,
පඤ්චමෝ චම්මකාරෝ ච කාරවෝ ඉපපි තෝ මතා"

යනුහෙයින් වඩුවාය තන්නායියාය රදවාය කරතැවැමියාය සොම්මරාය යි සිල්පිහු පස්දෙනෙකැයි දන්නාලදහ. එහෙයින් වඩුකම්ය ශිල්පනම් වන්නේය. එය අර්ථාවහනය වනහෙයින් මඞ්ගලනම් වන්නේය. ඒව නිදසුන් වශයෙන් මේ මතු පහළ වන කථාවස්තුහු දතයුත්තාහ,

බිම්සර රජහුගේ පුත්වූ බොධිරාජකුමාරතෙමේ පොළොතෙලෙහි ඇති අනික් ප්‍රාසාදයන් හා නොසමවූ අහසෙහි පැනනැංගාක්වැනිවූ කොකනද නම් පහයක් කරවා තාවිසින් මෙබඳු පහයක් පෙරකලවිරුද නැතහොත් මෙය තාගේ පළමු ශිල්පය

මදැ?යි වඩුවාඅතින් විවාළේය. දෙවයන්වහන්ස! මෙය මාගේ ප්‍රථමශිල්පයමයයි වඩුවා කියේය. රජකුමරතෙමේ "ඉදින් මෙතෙමේ අනිකෙක්හටත් මෙබදුපහයක් කළහොත් මේ පහය අසිරි නොවන්නේය එබැවින් මවිසින් මොහු මරවන්නට හෝ මොහුගේ අත්පා සිදුවන්නට හෝ මොහුගේ ඇස් උපුටන්නට හෝ වටනේය"යි සිතා ඒ කාරණය තමන්ගේ ප්‍රිය යහලුවූ සජී කාපුත්‍රතම්වූ මාතවකඅහට කියේය. මාතවකතෙමේ මාතෘසෙතුදු අනඩිවූ ශිල්පය නොනැසේවායි සිතා වඩුවාහට සඤ්ඤුන්නේය. වඩුතෙමේ ස්වාමිනි! නුඹවහන්සේ විසින් මේපුවත මට කියමන ඉහාමැනව මම මෙහි කාවයුතුදෙය දැනගනිමියි කීයේය.

ඉක්බිති එක්දිනක් රජකුමරතෙමේ කළ පහකම් නිමියේදැයි වඩුවා අතින් විවාළේය. දෙවයන්වහන්ස! නොනිමියේය තව බොහෝ ඉතිරිවියයි කියේය. කවරකම්යක් ඉතිරිවීද? දෙවයන්වහන්ස! පසුව කියන්නෙමි වියල් නොහර රුක් ගෙන්වා දුන මැනවයි කියේය. රජකුමරතෙමේ ඒ දැවගෙන්වා දුන්හ. ඉක්බිති වඩුතෙමේ කුමරහට කියනුයේ දෙවයන්වහන්ස! මේ තැන්පටන් මාගේ සමීපයට නොපැමිණිය යුත්තේය. සියුම් කාර්‍යාන කාරද්දි වනාහි අනික් අය සමග කථාකරන්නහුගේ සිත විසෝපවන්නේය අහර වෙලාගෙයි වනාහි මාගේ භාර්‍යාව පමණක් අහර ගෙන එන්නේයයි කියේය. කුමරතෙමේ මැන වැයි කියා ඔහුට නොනික්මියහැකි කොට ගෙය පිරිකෙව් කොට අරක් නැබිය. වඩුතෙමෙද ගෙයතුළ හිද නොහර දැව සෑස ගුරු ඵපඤ්ඤයෙක් කොට සොඳුර! ගෙහි ඇති සියලු බඩු විකොට රන් රුවන් ගනුවයි බිරින්දට කියා නිමිකල්හි අද සියලුම දරුවන් ගෙන එවයි කියේය. ඕ හොමෝ එසේ කළාය. ඒ වඩුතෙමේ උදය වළඳා අඹුදරුවන් සහිතවූයේ පක්ෂියාගේ කුසතුළ හිද වාතවුළුයෙන් නික්ම පලාගොස් හිමවතෙහි බැස නුවරක් ඉදි කොට එහි රජය කරවා "කාඤ්චාහන"යැ‍ම් රජවීය.

මෙසේ වඩුසිල්පය පවා අර්‍ථාවහනයට හෙතුවන හෙයින් මහුල් වන බවට නිදසුන්වශයෙන් ගෙනහැරපාතලද ඔම්පිය, ගෙහි අහනවගීහෙයි කාඤ්චාහන වසතුව මෙතෙකින් නිම වනලද්දේය.

අතීතයෙහි බරණැස්නුවර එක්තරා රුක්වඩුවක් තෙමේ තමන් ඇදුරු හා සම්වූයෙක් වූයේය. ඔහුගේ ශිෂ්‍යයෝ සොළොසක් ඔවුන් එකෙකුහට දහස දහස බැගින් අතවැසිවයෝ වූහ.

ඒ සියල්ලෝම සතළොසක් අධිකකොට ඇති සොළොස් දහසක් පමණ වූහ. ඒ සියල්ලෝම වනයට ගොස් ඒ ඒ තන්හි ප්‍රාශාද විකෘතීන් කොට පසුරුබැඳ ගඟින් බරණැසට ගෙනවුත් විකුට ජීවත්වන්නාහුය.

ඔහුතුමූ එක්දිනක් වඩුකම්නන්නයෙන් හැමකල්හිම ජීවත් වන්නට නොහැකිය ජරපත්කල මෙය දුෂ්කරයයි කියා දිඹුල් ආදීවූ නොහර මහත් දැවින් ගුරුළුපක්ෂීන් කොට අඹුදරුවන් සමඟ එහිතුළ පිවිස හිමවතට ගොස් එහි එක්තරා තුවරෙක රාජ්‍යගත්තාහුය. ඉක්බිති සොළොස්ශිෂ්‍යයෝ ඇදුරුහු රාජ්‍යයෙහි අභිෂෙක කොට තමතමා ඇමතිතනතුරෙහි සිටියාහුය. ඒ රජතෙම කාෂ්ඨවාහනරජ්ජයයි ප්‍රසිඛවූයේය. ඔහු විසින් ගන්නාලද බඳින් එනුවරද එරටද කාෂ්ඨවාහනමයයි ප්‍රකට විය. ඒ කාෂ්ඨවාහන රජතෙමේ මැතභාගයෙහි කසුප්බුදුරජ උපන් බැව් අසා යව දරුවෙනි! පුවත් දැන එව්යයි කියා පිරිවර සහිත සොළොස්මහ ඇමතියන් යැවූයේය. ඔහුතුමූ යන්නාහු ඉදින් බුදුහු උපන්නේවිනම් නොමඑන්නෙමු නොවූ පන්නේ නම් එන්නෙමුයි කිවාහුය. ඉක්බිති රජ්ජුරුවෝ සොළොස්දෙටුමහඇමතියන් අතුරෙහිවූ තමන්ගේ බුහුනනුවූ එක් ඇමතියක්හට දරුව! තෝ පෙරළා අවුත් මට කියවයි කීයේය. හෙතෙමෙද මැනවැයි පිළිගත්තේය. ඒ සියල්ලෝම එකරැයටම ගොස් බරණැසට පැමිණියාහුය. ඔවුන් එහි පැමිණි කල්හිද කසුප්බුදුරජු පිරිනිවියේක. ඔහුතුමූ අනේ ඉතා දුරමඟ ගෙවා අවුතුදු දැකීම් පමණකුත් නොමලදුම්හයී කියා හඬන්නාහු බුදුරජාණන්වහන්සේ විසින් දෙනලද අවවාද කරනු කැමැත්තාහු ඒ බුහුනනුවූ ඇමතියා තබා සියල්ලෝම පැවිදි වූහ. බුහුනනු ඇමතිතෙමේ ශාස්තෘන්වහන්සේ විසින් පරිභෝග කරනලද ඛඛරාඛාතුවද එක්තෙරනමක්ද රැගෙන කාෂ්ඨවාහන රටට ගියේය. කාෂ්ඨවාහන රජ්ජුරුවෝද ඒ තෙරුන්දම් අසා විහාරයක්කරවා සැයක් පිහිටුවා දානාදිපින්කම් කොට ආයු පමණින් එහි වැස දෙවිලෝගියේය ඒ පැවිද්දෝද ඉන්සැව ඒ දෙවිරජ්ජගටම පිරිවරවූහ ඔහුතුමූ එක් බුඛාභනරයක් දෙවි ලොවැ ගතකොට අපබුදුන්නූපන්කල්හිම දෙව්ලොවින් චුතවූහ. ඔවුනතුරෙන් ඇදුරුතෙමේ කොසොල්මහරජහුගේ පුරොහිත කුලයෙහි ඉපිද බාවරී නම් විය. සෙස්සෝ සැවැත්නුවර බමුණු කුලයන්හි උපන්නාහුය. ඔවුනතුරෙන් පෙර සොළොස්දෙටු අතවැසිගේ බාවරීහුගේ සමීපයෙහිද සෙසුඅය සොළොස්දෙටු

අතවැසියන්ගේ සමීපයෙහිද ශිලෝපාදාන්ග්‍රහණය කළාහුය. එකල මහකොසොල්රජතෙමේ මෙළේය. පසෙනදිකුමරතෙම රජ වී තමපිය ආදීන්ගේ සමපත් බාවරීහට දුන්නේය. එතෙමේ වනාහි කුමරකලැ බාවරීගේ සමීපයෙහි ශිලෝපාදාන්ග්‍රහණය කෙළේය. මැතභාගයෙහි බාවරීතෙමේ රජුහට දන්වා ශිෂ්‍යයන් සමග තාපසපැවිද්දෙන් පැවිදිව පිළිවෙළින් හොඳවරි හංතෙරට පැමිණ එසි වැස ඵලාඵලයෙන් දිවිපැවැත්වූහ. ඔවුන් එහි වසනකලැ අසරණසරණසරණාගතවජ්‍රපඤරාධාරවූ තිලොකතිලක අපතිලෝගුරු බුදුරජාණන්වහන්සේ සවිසතන් මන් මඟුල්වනයේ තුන්ලෝ එකලුකොට ලොවැඟපිද වදාළසේක. ඒ බාවරීතෙමේ මැතභාගයෙහි බුඩොද්පාදය අසා පළමුනසින්ම සියලු පිරිවරසහිත සොළොස්අතවැසියන් යැවූයේය. ඔව්හු ගොස් **සුත්තනිපාතාවසානයෙහි පාරායනවග්ගයෙහි** කීනසින් බුදුන්දම්දෙසුම් අසා පිහිය නම් මනුහු හැර සියුපිළිසිඹියාපත් මහරහත්බවට පැමිණ එහි භික්ෂුභාවයෙන් පැවිදිවූවාහුය. බාවරිහුගේ බුහුනනුවූ සොළොස්අතවැසිගෙණෙහිවූ ඒ මානවකතෙමේ වනාහි මාගේ මයිලනුතෙමේ මේබදු වීසිතුරු දම්දෙසුම් අසන්නට නොලද්දේයයි සිතන ඒ සෙනහවිඤ්ඤපයෙන් හෙවත් ඒ සෙනහයෙන් හටගත් පසුතැවිල්ලනිසා රහත්වන්නට නොහැකිව අනාගාමීවී එහි භික්ෂුභාවයෙන් පැවිදිව පෙරළා අවුත් බාවරීහට බුඩොත්පාදය කියා බුදුගුණවනමින් හුන්නේය. බාවරීතෙමෙද ඒ අසමින්ම හුන්නේය. එකෙණෙහිම ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ඔවුන්ගේ ඤාණපරිපාකඥය දැන සැවැත්නුවර වැඩසිටිසේක්ම රශ්මන්ආලොකයක් මුදා හැරිසේක. පිහියතෙමේ ඒ ආලොකය දැන මේ කිම්දැයි එපිට මෙපිට බලනුයේ තමහමුවැ සිටියාක් මෙනි බුදුරජතුමන් දැක ශාස්තෘන්වහන්සේ වැඩිසේකැයි කීයේය. බාවරීතෙමේ හුනස්නෙන් නැගී දෙහොත් මුදුනෙහි තබා ඇදිලිබැඳ සිටියේය. තිලොකෙකතිලක අපතථාගතවූ බුදුරජාණන් වහන්සේ ආලොකපතුරුවා බාවරීහට තමන්වහන්සේ දක්වා වදාරා ඔවුන් දෙදෙනාහට සත්ප්‍රාශවූ ධම්මයක් දෙශනාකොට වදාළසේක. දෙසනාවසානයෙහි පිහියමානවකතෙමේ කෙලෙස්දෙස් හිස් කොටින් තොස්වූ මහරහත්බවට පත්වූයේය. බාවරීතෙමේ අනාගාමිවූයේය.

මෙසේ වඩුශිල්පය ඵෙහලෞකික පාරලෞකිකාර්ථාවහනයෙහි හා ලොකොත්තරාර්ථාවහනයෙහිත් හෙතුවනහෙයින් මඟුල්

වතබවට නිදසුන්වශයෙන් ගෙනහැරපානලද **පාරාසනාවගී වණ්ණනායෙහි ඣානඤ්චාභඤ්ඤා** මෙසේ සැකැවින් දක්වා නිමවනලද්දේය.

හුදීජනමනනඳනවූ ශිලපනම් මඟුල්වැනුම
මෙතෙකින් නිමවණලද්දේය.

විනයනම්:—අනගාරිය විනය, අගාරියවිනය යි කියා දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් අනගාරියවිනයනම් සත්ඇවැත් කඳැ නොමැවදීමය, හේ විනාහි මොනවට ඉගෙනගන්නා ලද්දේ නොකිලිටිබවට පැමිණීම හේතුකොටගෙනද ආචාරගුණ ව්‍යවස්ථාකිරීම හේතුකොටගෙනද ව්‍යාකොට නිත්මවනලද්දේ ශිතසුව ඵලවනහෙයින් මඞ්ගලනම් වන්නේය. ඇවදුනු ඇවැත්වූ කලි වුඨානගාමිනි ඇවැත්වූවහොත් තදනුරූපවිනයනාමානුඤ්ඤා නයෙන් ඉන්නැහිවිනුලද්දාහු හෝ දෙසනාගාමිඇවැත්වූවහොත් දෙසනුලද්දාහු හෝ අනන්තරායකර නොවෙත්මය. එහෙයින් **අභිඤ්ඤාසදඉච්ඡි** සගමොක්ෂ දෙනට අනන්තරාය නොරෙන්නුයි අනන්තරාසිඤ්ඤානමැසිද ඔහුතුමූ නාමනන්තරාසිඤ්ඤාය, ඵෙලඝනන්තරාසිඤ්ඤාය, විපාකනන්තරාසිඤ්ඤාය, උපවාදනන්තරාසිඤ්ඤාය, ආඥව්‍යතික්‍රමණන්තරාසිඤ්ඤාය යි කියා පස්වැදෑරුම්යසිද කියනලද්දේය. ඔවුනතුරෙන් පංචානන්තරියකාම්යෝ අතරතැනිසවහාවඇති චෙතනාධම්මෝ කම්මෝම වූවාහු අනන්තරායකර හෙයින් නාමනන්තරාසිඤ්ඤානම, එසේම භික්ෂුණීදූසණකම්යද නාමනන්තරාසිඤ්ඤානම, එය වනාහි මිථ්‍යාචාරලක්ෂණවිරහිතහෙයින් සඟගීයට නොව මොක්ෂයට පමණක් අනන්තරාය නොවේමය. මෙකියනලද්දේ පියවිමෙහෙණින්නගේ වශයෙනි. ආඝ්‍යියන්කෙරෙහි ප්‍රවත්වනලද්දේ අපාය පිණිස පවත්නේමය. මෙහිලා **නාඳමාතාවධකථා** නිදසුන් වන්නේය. දෙදෙනාගේ සමානච්ඡන්දතාවශයෙන් හෝ සඟීනන්තරාසඤ්චරභාවය නොවන්නේය. ප්‍රතිපත්තිය නමා දූසනය කළහෙයින් මොක්ෂානන්තරායකරභාවය වනාහි වන්නේය. අභිභවනය කොට හෙවත් බලාත්කාරයොට පැවැත්වීමෙන් සඟීනන්තරායකරභාවයද වුලනාලිය නොහැක්කේයයි කියත්. **අඤ්ඤතුකදුමූ** අකිරියදුමූවිහු අනියතමිච්ඡාදිට්ඨිකම්මෝවෙක්. ඔවුන් හැර සෙසු නියතමිච්ඡාදිට්ඨිකම්මෝ ඵෙලඝනන්තරාසිඤ්ඤානම. පණ්ඩකතිරච්ඡානගතඋභතොබ්‍යඤ්ජනකාදීන්ගේ ප්‍රතිසන්ධිචිත්තෙනාත්පාදයෝ විපාකනන්තරාසිඤ්ඤානම. සියලුම අහේතුකප්‍රතිසන්ධිහු විපාකනන්තරාසිඤ්ඤා නොවනහෙයිනි. ආඝ්‍යියන්වහන්සේ

ලාට උපවාදකරන වෙතනාවෝ උපවාදන්තරායිකානම්, ඔහු තුමූ වනාහි ආයස්මන්වහන්සේලා ඛමාකාරවචනයාත් අන්තරාය කරවෙත්. ඉන්මත්තෙහි අන්තරායකර නොවන්නාහ. දැන දැන ඉක්මවන්නලද සඤ්ඤාපත්තිස්ඛන්ධයෝ ආණාවීතික්කමන්ත රායිකානම, යටත්පිරිසෙසින් දැනදැන ඉක්මවහලද දුෂ්කෘතදු ර්භාෂිතය පමා සඟිමාගිඵලයන්ට අන්තරාය කෙරේමය. ඒ ඇවැත්හුදු පැරදිමහණ භික්ෂුභාවය හඟවමින් සිටින තාක්ද සෙසුගරුඇවතුන්ට පැමිණිතැනැත්තේ ඉන් නැගිටිනාතාක්ද ලුහුඇවතුන්ට පැමිණිතැනැත්තේ එම ඇවැත් දෙසන්නාතාක්ද අන්තරායකර වන්නාහුය, ඉන්මත්තෙහි අන්ත රායකර නොවන්නාහුය. ඒ ඒ කම්මාදීන් හා එක්වීමෙනුදු බණ්ඩ නවශයෙන් සඞ්ඝයන්ගේ චිත්තසන්තානාභ්‍යන්තරයෙහි ආගම නය කෙරේහුයි අන්තරාය නම්, හෙද ද්‍රිඝඨඞ්ගිකාදී අනාපත්තියයි. එහි ඒඅනාපත්තියකරන්නගිලිහු අන්තරායිකා නමැයි යනු එහි වණ්ණ නානයභාෂාන්තරයෙහි වන්නේය.

යම් ආපත්තාධිකරණයක් අකුසල්වී නම් හෙද දෙසන්නලද්දේ හෝ ඉන් නැගිටින්නාලද්දේ හෝ අන්තරායකර නොවේමය. යම් සේ වනාහි ආයෙත්‍රීපවාදකර්මය අකුසල්වූයේම වරද කියා ක්ෂමා කරවීමෙන් ප්‍රයෝගසම්පත්තියෙන් ප්‍රතිබාහනය කළහෙයින් අවිපාකසංවරභාවයට පැමිණියේ අහොසිකම්ය වේද එමෙන්ම අකුසල්වූ ආපත්තාධිකරණයද දෙසන්නලද්දේ හෝ ඇවතින් නැගිට්ටන්නලද්දේ හෝ ප්‍රයෝගසම්පත්තියෙන් ප්‍රතිබාහනය කළ හෙයින් අවිපාකසංවරභාව ඇතිබැවින් අහොසිකම්වීමෙන් අන්ත රායකර නොවන්නේමය. එසේ නොකරනලද්දේ අන්තරායකර වන්නේමය. එහෙයින්ම "සාපත්තිකස්ස භික්ඛවෙ! නිරයං. වදාමි තිරච්ඡානයොනිං වා"යි සාපත්තිකයාගේම අපායගාමීභාවය වදාරණලද්දේය. යනු සුලුවඟ සමථක්ඛන්ධකවණ්ණනා නයයි.

එහි සාපත්තිකයාගේ තිරච්ඡානයොනිගාමිත්වය නිදසුන් වශයෙන් මේ කථාවස්තුව ගෙනහැරපානලද්දේය,

කාශ්‍යපනම් තථාගතබුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි පැවිදිව සිටි එක්තරා නවක මහණෙක්තෙමේ විසිදහසක් හවු රුදු වෙනෙහි මහණදම් කොට එක්දිනක් නැවකින් හෙවත් හතුළකින් ගඟෙහායන්නේ එරක නම් රුකෙක පතක් අල්වා හතුළ තදින් ඇතල්හිත් අතනොහැර සිවිබැවින් ඒ පත සිදින. ඒ මහණතෙමේ මෙය සුලුයයි සලකා පිළිගම් නොකොට

සිව මරණාසන්නකාලයෙහි එරකපතින් ගෙලගන්නාලද්දෙක් මෙන් වී එමැවත දෙසනුකැමතිවුවද අනික් උපසපන් මහණක් හු නොදක්නේ මාගේ ගිලය අපිරිසිදුයයි විපිළිසරවී ඉන්සැව එරකදෑතින්කළ නැවක් හෙවත් ඔරුවක් පමණවූ නාරජක්හුවී උපන. ඔහුගේ නාමයද එරකපත්ත නම් විය. ඒ නාරජතෙමේ උපන් තෙණහිම තමන්ගේ ආත්මභාවය බලා මෙතෙක්කල් මහණදම් කොවත් අහෙතුකයොනියකැ මැඩියන් අනුභවකරණ තැනෙකැ උපතිමියි විපිළිසරවීය. මෙසේ කල්යන අතර එක්දුවක් ලැබගඟමැද දියපිට මහත්වූ පෙණගොබය ඔසවා දියනිය එහී තබා තවවමින් ශාසනාභිරවයි. මේසේ ඇතිකල ඔහට මෙබදු අදහසක් උපන "මම මේ උපායෙන් බුදුන් උපන්කල උන්වහන්සේ උපන්බැව් අසන්නෙම් යමෙක් මාගේ ගිතිකාවට පිළිගී කියාද ඔහට මම මහත්සම්පත් සමඟ දියනියන් දෙන්නෙමියි කියා"යි, මෙසේ සිතා දියනියන්ට මෙමගී උගන්වා අඞ්මසක් පාසා පොහෝදිනයන්හි දියනිය පෙණගාබෙහි තබයි දියනියද නවමින් මෙසේ ගිතිකා කරන්නීය.

"කිංසු අධිපති රාජා කිංසු රාජා රජ්ජසාරෙ,
කථංසු විරජෝ හොති කථං බාලොති වුච්චති".

එහි අර්ථයනම්:—කවරක්හට අධිපතිවූයේ රජුනම් වන්නේද කෙසේ වනාහි රජතෙමේ රජ්ජසාරනම් වන්නේද කෙසේ වනාහි ඒ රජතෙම විරජනම් වන්නේද කවරකරුණකින් පුද්ගලතෙමේ බාලයයි කියනුලැබේද යනුයි. මෙය අසා මුළුඅඹදිව් වැසියෝ නාමෙනෙවියන් ගන්නෙම්යි සිතා ගොස් තමතමන්ගේ ඤාණශක්තියෙන් පිළිගීකොට කියන්නාහුය, ඒ කියනලද සියලුම ඔතොමෝ ප්‍රතික්ෂෙප කරන්නීහ, ඇය අඞ්මසක් පාසා මෙසේ ගායනාකරද්දී එක්බුඩාන්තරයක් ඉක්ම ගියේය, ඉක්බිති ගෞතමනොත්‍රඇති අපතථාගතබුදුරජාණන්වහන්සේ ලොව පහළවී ලෝසතන්මැඩ වඩනසඳ එක්දිනකැ අලුයම් වෙලෙහි මහාකරුණාසමවතින් ලොවබලා වදුරණසේක් තමන් වහන්සේගේ ඤාණජාලාභ්‍යන්තරයට පිවිසි ඒරකපත්තනාරජු ආදිකොට ඇති උත්තරනම් මානවකයාද දැකවදුරා අද කුමක් වන්නේදැයි ආවර්ජනා කරනසේක් "අද ඒරකපත්තනාරජුගේ දියනිය පෙණගොබෙහි සිට නවත දිනය වන්නේය. මේ උත්තර නම් මානවකයා මවිසින් දෙනලද පිළිගී ඉගෙන සොවාන්වී එය ගෙන නාරජු වෙත යන්නේය. නාරජු ඒඅසා බුදුන්

උපනැසි දැන මවෙත එලඹෙන්නේය. ඔහු එලඹිකල මම මහාසමා
ගමයෙහි ගාථාකියන්නෙමි ගාථාවසානයෙහි සුවාසූදහසක්
ප්‍රාණීන්ට ධම්මාභිසමය වන්නේය"යි දුටුයේක. එසේ දැකවදාරු
තොස්වූ සත්හට නිත්කල් සෙත් සැලැස්වූ බුදුරජාණන්
වහන්සේ එහි වැඩමවා බරණැසසමීපයෙහි සත්මහරි රුක්
ඇතිහැන එක්රුක්මූලෙකැ වැඩහුන්සේක. දඹදිව්වැසියෝද
නාමෙනෙවියගේ ගීයට පිළිගී ගෙන රැස්වූහ. ශාස්තෘන්වහන්සේ
ඔවුනතුරෙන් පිළිගී ගෙන හුදුරෙහි යන්නාවූ උත්තරමාන
වකයා දැක "උත්තර"යි වදාළසේක. "කිමේක සවාමීනි"යි මාන
වකතෙමෙ පිළිවදන් ඇස්වූයේය. "එහි ගමනයට පෙරාතුව
මෙහි එව"යි වදාළසේක. එකල තමන්වහන්සේ වෙතැ එළඹ
වැඳ සිටි මානවකයාඅතින් "තෝ කොයිබට යන්නෙහිදැ?යි
විචාරා 'එරකපත්තනාරජුගේ දියනියගායනාකරනතැනටය'යි
සැලකළකල "තෝ ගීපිළිගී දන්නෙහිද"යි විචාළසේක. "දනිමී
සවාමීනි"යි "එසේවීනම් එය කීයව" එසේකල තමාදන්නා අයු
රින් කියන්නාවූ උත්තරයාහට "උත්තරය! මේ පිළිගී නොවෙයි
පිළිගී ඕම තව දෙන්නෙමි එය ගෙන යව"යි වදාළසේක. "සවා
මීනි! මැනවැ"යි කියා උත්තරමානවකයා පිළිගත්තේය. ඉක්බිති
තථාගතබුදුරජාණන්වහන්සේ "උත්තරය! නාමෙනෙවියගායනා
කළකල තෝ මේ පිළිගීය ගායනාකරව"යි උගන්වකසේක්,

"ඡවාරාධිපතී රාජා රජ්ජමානෝ රජීසසරෝ,
අරජ්ජං විරජෝ හොති රජ්ජං බාලොති වුච්චති"නිදි.

ඉගැන්වූසේක.

එහි අදහසනම්:—යමෙක්තෙමේ චක්ඛුර්වාරාදී සදෙරට
අධිපතිද එකවාරයෙක්ඛිත් රූපාදීන් විසින් නොමඩනාලද්දේද
හේතෙමේ රජු නම් වන්නේය, යමෙක් එනාහි රූපාදි සාරමු
ණෙහි රැඳේද හේතෙමේ රජීසසර නම් වන්නේය, යමෙක්තෙ
මේ ඒ සාරමුණෙහී රජනකවශයෙන් නොරැඳෙන්නේවේද හේ
තෙමේ විරජ නම් වන්නේය, ඒ රූපාදීන්කෙරෙහිම රැඳෙන
පුද්ගලතෙමේ බාලයා නම් වන්නේය යනුයි.

මෙසේ උගන්වා "උත්තරය! මේය ගායනාකළකල නාග
මානවිකාතොමෝද නැවතත් තාගේ ගීයට පිළිගීයක් වනයෙන්

"කෙනසසු වුච්චති බාලෝ කථං හුදති පණ්ඩිතෝ,
යොගකෙඛම් කථං හොති තං මේ අක්ඛාහි පුච්ඡිතෝ"යි

ගායනාකරන්නීය.

එහි අත්‍ථයනම්:—"බාලතෙමෙ කුමකින් ඉල්පයන්නේද පණ්ඩිතතෙමෙ කුමකින්කුමක් දුරුකරන්නේද කවරහෙයකින් පුද්ගලතෙමෙ යොගකෙඛමී නම් වන්නේද හමුවී විචාරන මට එය කියව" යනුයි.

ඊට පිළිගීවඟයෙන් තෝ මෙය ගාථාකාරවයි කියා

"ඔඝෙන වුය්හති බාලෝ යොගා හුදති පණ්ඩිතෝ,
සබ්බයොගවිසංයුත්තෙතා යොගකෙඛමී'ති වුච්චති"නි,

යන මෙයද උගන්වා යැවුසේක. එහි අදහසනම්:—බාල ජනතෙමෙ කාමොඝාදී චතුර්විධඔඝයෙන් ඉවිලයන්නේය, පණ්ඩිත ජනතෙමෙ සතරසම්‍යක්ප්‍රධානවීර්‍යසංඛ්‍යාතයොගයෙන් ඒ ඔඝය දුරුකරන්නේය, සියලු කාමයොගාදීන් කෙරෙන් වෙන්වූ පුද්ගලතෙමෙ යොගෙඛමීනමැයි කියන ලද්දේය, යනුයි.

උත්තරමානවකතෙමෙ මේ පිළිගීඉගෙනගන්නේම සොවාන් පෙළෙහි පිහිටියේ මේ ගීතිකා ගෙන එහි ගොස් "පින්වත්නි! මවිසින් ගීතිකාවට ප්‍රතිගීතිකාවක් ගෙනෙන ලද්දේය, මට ඉඩ දියව්" කියා නිරතුරුව සිටි මහජනයාගේ දසරුමතුයෙන්ම ගියේය. නාමෙනෙවිතොමෝ පියාගේ පෙණගොබෙහි සිට නට මින් "කිංසු අධිපතී රාජා" යනාදීන් ගායනාකළාය. එවිට උත්තරතෙමෙ "ඡවාරාඞිපතී" යනාදීන් ගායනාකෙළේය. එවිට නැවතත්නාමෙනෙවිතොමෝ ඊට ප්‍රතිගීතිකාවඟයෙන් "කෙනසඤ්ඤු වුය්හතී බාලෝ" යනාදීන් ගායනාකළාය. එවිට නැවතත් ඊට පිළිගීකොට උත්තරතෙමෙ "ඔඝෙන වුය්හතී බාලෝ" යනාදීන් ගායනාකෙළේය.

නාරජතෙමෙ ඒ අසාම බුදුන් උපන් බැව් දැන එක් බුඩාන් කරයක් මුළුල්ලෙහිත් මවිසින් මෙබදු පදයක් නම් නොම ඇසූ විරුය, පින්වත! එකාන්තයෙන් ලොකයෙහි බුදුරජ උපන්සේක් වනැයි තුටුපහටුසිත්ඇත්තේ තඹුවින් දියට ගැසුයේය. එසින් මහත් රළ නැංගාහ. ගඟදෙපස ඉවුරු බිඳුනාහුය, ඔබමොබ ඉස් ඔක් පමණ කැත මනුෂ්‍යයෝ දියෙහි ගැලුනාහ, ඒ නාරජතෙමෙ එතෑක් මහජනයා පෙණගොබෙහි තබා ඔසවාගෙනවුත් ගොඩ නැඹුයේය. එසේ කොට නාරජු උත්තරමානවකයාවෙත ගොස් "කිමියෙනි ඡාත්තාණ්ඩකන්සේ කොයිබදැ"යි විචාළේය. "මහා නාරජුනී! තෙලරුක්මුලැ වැඩහිඳිනාසේක" නාරජතෙමෙ

"ඉමිනයෙනි! එසේවීනම් එනුමැනවැ"යි කියා උත්තරමාතවුකුශා සමගම බුදුන්වෙතගියේය. මහජනතෙමෙද ඔහුසමඟම ගියේය. නාරජු ගොස් සවන්බුදුරැස්අතර වැද බුදුන්වැඳ හඬමින් සිටියේය, එකල ශාස්තෘන්වහන්සේ "මහානාරජ! මේ කිමකැ"යි විචාළසේක. සවාමීනි බුදුරජාණන්වහන්ස! මම නුඹවහන්සේ වැනි බුදුකෙනෙකුන්හට ශ්‍රාවකයෙක්වී විසිදහසක්හවුරුදු මහණදම් කොළෙමි, ඒ මහණදම් මා එතරකරවන්නට නොහැකිවිය සවලපමාත්‍රවූ එරකපහක් සිදිපමණක්ම නිසා අහෙතුකප්‍රතිසන්ධියක්ගෙන උදරයෙන් ව්‍යායාම් කරනතැන උපන්නෙමි එක්බුධාන්තරයක්ම මිනිසත්බවක්ද සදහම් ඇසීමක්ද නුඹවහන්සේවැනි බුදුකෙනෙකුන්ගේ දැකීමද නොලදිමි'යි කියේය. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ඔහුගේ ඒ කථාව අසා මහානාරජුනි! මිනිසත්බවද දුර්ලභමය එසේම සඞ්ඝශ්‍රවණයද දුර්ලභය. එසේම බුඩොත්පාදයද දුර්ලභය මේ වනාහි ඉතාදුකින් හිරිහැරයෙන් ලැබෙන්නේය"යි වදාරා දහම් දෙසනසේක්,

"කිවෙජා මනුස්සපටිලාභෝ කිවජං මච්චානජීවිතං,
කිවජං සඞ්ඝමසවණං කිවෙජා බුඩානං උපපාදෙ"තිඝ,

වදාළසේක.

එහි අදහසනම්:—මහත්ව්‍යායාමයකින් මහත්කුසලයකින් ලැබියහැකි බැවින් මිනිසත්බැව් පිළිලැබීමද ඉතාදුර්ලභය නිතර සීසැමි ගෙරි රැකිම් වෙණදැම් ආදිය කොට ජීවිකාවෘත්තීය පවත්වන හෙයින්ද ඉතාමදකලක් දිවිපවත්නා හෙයින්ද සත්වයන්ගේ ජීවිතයද දුර්ලභය නොයෙක් කෙළහණින් කල්පයන්හිත් දහම්දෙසන පුද්ගලයන් දුර්ලභබැවින් සදහම් ඇසීමත් දුර්ලභය මහත් ව්‍යායාමයෙන් අභිනීහාරයතමා සමෘඞ්ධවන හෙයින්ද සමෘඞ්ධවූ අභිනීහාරඇත්තාහටත් නොයෙක් කප්කෙළදහස් ගණකිනුත් උත්පත්තිය දුර්ලභහෙයින් බුඩොත්පාදයද අතිශයින් දුර්ලභමය"යි වදාළසේක. යනුයි.

දෙසනාවසානයෙහි සුවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමයය විය. නාරජුද එදවස සොවාන්ඵලය ලබන්නේය. එතකුදුවුවත් තිරිසන්ගතවූ බැවින් වනාහි එය නොලද්දේය. එහෙත් පිළිසිඳීම සිවිහැරීම නිදීම සඳජාතීන් හා මෙවුන්දම් සෙවීම වුත්තීම යන්

සම්බඳු පස්කරුණෙක්හී නාගයෝ නාගශරීරයමගෙන කලාතක වෙත්ද මේ කාරණු එසේ නොව එකී කාරණයන්හි මානවක රූපයෙන්ම හැසිරෙන්නට ලැබීය.

මෙසේ සාපතතිකයාගේ තීරවජ්ඣානයොනිගාමිත්වයට
නිදසුන්වශයෙන් ධම්පියාසෙහි
බුද්ධවර්ගයෙහි එරකපත්තනාගරාජවස්තුව
සැකැවින් දක්වා නිමවනලද්දේය.

ධර්මතා එසේහෙයින් යම් යම් ඇවතකට පැමිණියේද ඒ ඒ ඇවතෙහි ධර්මයවූ නියායෙන් පිළිපැදිය යුත්තේමය. එසේ පිළිපදිනාතැනැත්තේ වතාහි මාගීඵලයන්වද පැමිණෙන්නට හැකිවන්නේමය. ඒ එසේ මැනි.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ කොසොල්රට චාරිකායෙහි හැසිරෙනසේක් අතරමඟ ගිනිඇවිලගත් මහත්වූ බිලරුකක් දැක ගිනිකඳ උපමාකොට දහම්දෙසනුකැමතිසේක් එක්තරා රුකක්මුල වැඩහිඳ "පස්සථ පනෝ තුමෙහ භික්ඛවෙ! අග්ගිකඛන්ධං" යනාදි නයින් සත්තනිපාතඞ්ගුත්තරයෙහි අග්ගික්ඛන්ධොපමසූත්‍රය දෙසනාකොට වදාළසේක. ඒ අසා සැවතමක් මහණුන්ගේ නාමකය නැවුනේය නාමකය නැවුනු කල බලවත්පසුතැවිලිවීමෙන් කරජකය නැවුනේය කරජකය නැවුනුකල නිධානගතවූ හෙවත් හෘදයවස්තුව ආශ්‍රිතවූ පතක් පමණ සුඛලොහිතය හුණුවී මුවින් උතුළේය. ඒ මහණහු වනාහි පරිජීඇවතට පැමිණියාහු වන්නාහුය සැටනමක් මහණහු 'දිවි ඇතිතාක් පිරිපුන්වූවක් කොට පිරිසුදුවූවක් කොට බුදුසස් නෙහි බඹසර හැසිරීම දුෂ්කරය'යි කියා ගිහිබවට පැමිණියාහුය. ඔහුතුමූ ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපදයන් මඬිමින් හැසුරුනාහු වන්නාහුය.

සැවතමක් මහණහු ශාස්තෘන්වහන්සේගේ දෙසනාභිමුඛ කොට ඤාණය යවා සියුපිළිසිඹියාපත්මහරහත්බවට පැමිණියාහුය. උන්වහන්සේලා පිරිසුදු සිල්ඇත්තාහු වූවාහුය. මෙසේ මේ දෙසනාතොමෝ මේ තුන්පක්ෂයටම සඵලවීය. රහත්බවට පැමිණියවුන්ව වූකලී සඵලවූවා සැබව, අනික් අයට කෙසේ සඵලවීද යත් ඒ මහණහු වනාහි ඉදින් මේ ධර්මදෙසනාව නොඇසුවාහුනම් තවදුරවත් පමාවී 'භික්ෂු' යන ප්‍රතිඥව හරනවි

නොහැකිවන්නාහුය, එසින් ඔවුන්ගේ ඒ පාපය තෙමේ වැඩෙනුයේ ඔවුන් අපායයන්හිම කිදුවන්නාහුය, මේ දෙසනාව අසා වනාහි භවගත්සංවෙගඇත්තාහු 'භික්ෂු' යන ප්‍රතිඥව හැර හෙරණබැවිහි පිහිටා දසසිල්පුරා යොනිසොමනසකාරයෙහි යෙදුනාහු සමහරු සොවාන්වූවාහු සමහරු සකෘදාගාම්වූවාහු සමහරු අනාගාමිහුවූවාහුය. සමහරු දෙව්ලොවෙහිද උපන්නාහුය. මෙසේ මේ දෙසනාතොමෝ පැරදියවුන්ටද සඵලවීය. අනික් කොඩාසය වනාහි මේ දෙසනාව නොමැසුවාහුනම් කල් යත්යත් සහවෙසෙස්ඇවතුන්ටද පරිජීඇවතුන්ටද පැමිණෙන්නාහුය. මේ දෙසනාව වනාහි අසා 'අහෝ අසිරිය අතිශය කෙලෙස සංලිඛනයෙන් යුක්තව මේ බුදුසස්න පැවැත්තේය අපවිසින් ජීවිතාන්තය දක්වා මේ පිළිවෙත පුරන්නට නොහැක්කේය ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙකොට උපාසකධර්මය පුරා දුකින් මිදෙන්නෙමු'යි සිතා ගිහිවී තිසරණපන්සිල්හි පිහිටා උපාසකධර්මය පුරා සමහරු සොවාන්වූවාහු සමහරු සකෘදාගාමිහුවූවාහු සමහරු දෙව්ලොවැ උපන්නාහු වූවාහුය මෙසේ ඔවුන්ටද මේ දෙසනා තොමෝ සඵලවීය යනු **එකඛුත්තරයෙහි චුල්ලවජිරාසංඛ්‍යාත සුත්‍රවණ්ණනානය හා එහිදීකානයද** වන්නේය.....මෙසේ පැමිනියාවූද ආපත්තීහු නැගිවිතුලද්දාහුද දෙසතුලද්දාහුද අනන්තරාය නොකෙරෙත්මය. නොපැමිනි ඇවැත්හු අනන්තරාය නොකෙරෙත්ය යනු කියනුම කුමටද,.....ප්‍රාතිමොක්ෂසංවර ශීලය ඉන්ද්‍රියසංවරශීලය ආජීවපාරිසුද්ධිශීලය ප්‍රත්‍යයසංනිශ්‍රිත ශීලය යන සතරසංවරශීලය හෝ අනගාරියවිනයනම් වන්නේය. යම්කෙනක්හින් ඒ ශීලයෙහි පිහිටා රහත්බවට පැමිණේද එසේහෙයින් මෙලෙස භික්මෙන්නාහු විසින් මොනවට ඉගෙන ගන්නාලද ඒ චතුපාරිසුද්ධිශීලසංඛ්‍යාතවිනයතෙමේ ලොව්ලොව් තුරාසුව ඵලවාදීමට හෙතුවනහෙයින් **මඞ්ගල** නම් වන්නේයයි දතයුත්තේය.....කිසිම ඇවතකට නොපැමිණෙන්නාහුගේ ප්‍රාතිමොක්ෂසංවරශීලය පිරිසුදුවෙයි ඔහුවිසින් මෙය මනාකොට ඉගෙනගන්නාලද්දේනම් වන්නේය. එය **ඵඛානියඵස්ථවිරයන් වහන්සේගේ** ශීලය මෙන් ලොකොත්තරසැපද ඵලවන්නේය.....

හේ කෙසේදයත්:=කඩවත්වෙහෙර වනාහි කණ්ණිකාරපඨාන ගෘහයෙහි අරියවංශධර්මදේශනාව අසමින් සිටි ඒ **සඵවිරයන් වහන්සේ** **සොරවිශඇති** සර්පයෙක් දෂ්ටකළේය **සඵවිරයන් වහන්සේ** ඒ දුනද පහන්සිතින්ම හිඳ බණ අසයි එසේ වුවද විෂවේගය බලවත්විය එකල ඒ **සඵවිරයන්වහන්සේ** උපසම්පදා

මාලකයෙහි පටන්ශීලය ප්‍රත්‍යවෙක්ෂාකොට පිරිසුදුසිල්ඇත්තෙක් වෙමියි ප්‍රීතිය ඉපදවූයේය එම ප්‍රීතිචිත්තය උපන්බොණෙහිම විෂය හැඹිරී බිමට බවුයේය එසින් සුවසැපත්වූ සතොස්සිත් මුදුන්පත් නිදෙස් තෙරනුවෝ එහිම තමන්සිත් එකාහබැවි ලැබ සුදසුන්වූ නිදසුන්ඇති මදසුන්වන විදිසුන්වඩා මහත්වූ රහත්බවට පැමිණියේය.

ප්‍රාතිමොක්ෂසංවරශීලය පිරිසුදුවූයේ ලෞකිකලොකොත්තර සුව ඵලවනබවට නිදසුන්වශයෙන් ගෙනහැරපානලද **සඞ්ඛාරසූත්‍රවණ්ණනාදීන්හි පධානියත්ථෙරවත්ථුව** මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

මේනය උත්කෘෂ්ටවශයෙන් කියනලද්දේය. යම්හේකින් **වනාහි රූපියශික්ඛාපදවණ්ණනාදියෙහි** දෙසනාසුඛිය නම් ප්‍රාතිමොක්ෂසංවරශීලයවිද එහෙයින් එය වනාහි දෙසීමෙන් පිරිසුදුවන හෙයින් දෙසනාසුඛියයි කියනලදැයි කියනලද්දේය. මේ කරණකොටගෙන සුඛවේනුයි 'සුඛි' නම්: ධර්මයවූ පරිද්දෙන් දෙසීමම සුඛියවූවා 'දෙසනාසුඛි' නම්. ඇවතින් නැගීසිටීමද දෙසීමෙන්ම වන්නේයයි දතයුත්තේය. මූලාපත්තීන්ගේ වනාහි දෙසීම අභික්ඛුතා ප්‍රතිඥාකිරීම්වශයෙන් දෙසීමය යනු **එතිවිත්තානඤ හා විසුද්ධිමාගීවිත්තානඤයි** මෙහි 'දෙසනා' යන වචනය ගැනීමෙන් ඇවතින් නැගීසිටීමද සුන්මුල්ඇත්තවුන්ගේ හෙවත් පරිජ්ඇවතට පැමිණියවුන්ගේ අභික්ඛුතා ප්‍රතිඥාවද සංග්‍රහ කරනලදී. සුන්මුල්ඇත්තවුන්ගේද වනාහි පරිජ්ඇවතින් නැගී සිටීමෙන් යට රක්නාලද භික්ෂුශීලයද පිරිසුදුවූයේ නම් වෙයි. එසින් ඔවුන්ට මාගීප්‍රතිලාභයද සැපයෙයි යනු **අනුසිත්තානඤයි**. එහෙයින් ඇවතට පැමිණ දෙසනාදියෙන් නැගීසිටින්නාහුගේ ශීලයද සැප ඵලවන්නේවෙයි. **සුබමීසථෙරඤවහන්සේගේ** ශීලයමෙනි උන්වහන්සේ වනාහි චිත්තනම් නැහැවියා තල කැරලීවාදයෙන් ගට්ට ශාසනඤවහන්සේගේ සමීපයට ගොස් ඔවාගෙන පසුව ගොස් ඒ නැහැවියාගේ ඇස්හමුවෙහි ඇවත දෙසා ඔහු සමා කරවා එහිමවූ අඹාටකාරාමයෙහි වාසය කරන්නේ කිහිපදිනකින්ම සියුපිළිසිඹියාපත් මහරහත්බවට පැමිණියේය.

පැමිණි ඇවත දෙසීම්ආදියෙන් නැගිටියහුගේ ශීලය සැප ඵලවනබවට නිදසුන් වශයෙන් දක්වනලද **ධම්මපදඤයෙහි බාල වග්ගයෙහි සුදම්මත්ථෙරවත්** මෙතෙකින් නිමියේය.

තවද පාමොක්ඛසංවරය පුරන මහණ විසින් වෙනෙහි සොරුන් විසින් බඳනාලද තෙරතුවන්මෙන් වියයුත්තේය. හේ කෙසේද යත්? හිමවත්පසෑ වනාහි එවනෙහි සොරහු මෙහි අපසිවිනාබැව් ගම්වැද කිසිවෙක්හට නොකියවයි ගොතින් නොපතළ එක්තරාතෙරකෙනෙකුන් කළවැලින්බැඳ හෙවවූහ. ඒ තෙරනුවෝ හොත්අයුරින්ම වැලනොසිඳ සතියක් විදසුන්වඩා අනාගාමීවී ඉන්සැව බඹලොවැ උපන්නේය. තබපත් දිවසි නෙහිද මහවෙනෙහි එක්තරාතෙරකෙනෙකුන් කිදිවැලින් බැඳ බිම හෙවවූහ. ඒ තෙරපාණෝද ලැව්ගිණි එනකල වැල නොසිඳ විදසුන් වඩා ජීවිතසමසීසීවී පිරිනිවිසේක. එසේහෙයින් අනිකුදු සැදැහැවත් කුලපුත්‍රතෙමෙද

"පාතිමොක්ඛං විසොධෙත්වා අපෙපව ජීවිතං ජහෙ,
පඤ්ඤත්තං ලොකනාථෙන න භින්දෙ සීලසංවර"නති

පාමොක් පිරිසුදුකරනුයේ දිවිහරනෙම් නමුදු ලොකනාථවූ තථාගතයන්වහන්සේ විසින් පණවා වදාළාවූ ප්‍රාතිමොක්ෂසංවරශීලය නොබිඳින්නෙමිසි සලකන්නේය.

ඉන්ද්‍රියසංවරශීලය වනාහි සංවරඅසංවරදෙක්හි ආදීනවභා ආනිශංස දක්නහුට පිරිසුදුවන්නේය. ඒ මහණතෙමේ වනාහි ක්ෂේමවශයෙන් හෙවත් නිර්භයවශයෙන් ආනිශංසයද භයවශයෙන් ආදීනවයද දැක ඒ ඉන්ද්‍රියසංවරශීලය පරිපූරණය කරන්නේය. එහි මනාකොට හික්මෙන්නේය.

ආදීනවානිශංසයෝ වනාහි "ඡ ඉමෙ භික්ඛවෙ! ඵස්සායතනා අදන්තා අගුත්තා අරක්ඛිතා අසංවුතා දුක්ඛාධිවාහා හොන්ති කතමෙ ඡ? චක්ඛු, භික්ඛවෙ! ඵස්සායතනං" යනාදීනයින් සළායතනවගීසෙහි ප්‍රථමසූත්‍රයෙහි වදාරණලදහ.

මහණෙනි! මේ ඵස්සායතනයෝ සඳෙනෙක් දමනය නොකරනලද්දාහු ගොපනය නොකරනලද්දාහු නොරක්නාලද්දාහු සංවරණය නොකරනලද්දාහු හෙවත් නොපියනලද්දාහු නෙරයිකාදී ප්‍රභෙදගතවූ අධිකදුක් එලවන්නාහුවෙත්. කවරසඳෙනෙක් දයත් මහණෙනි! චක්ඛුසම්පසීයාගේ උත්පත්තිහේතුවූ චක්ඛායතනය ශ්‍රොතසම්පසීයාගේ පෙ ශ්‍රොතායතනය ඝ්‍රාණායතනය ජිව්හායතනය කායායතනය මනොසම්ඵස්සයාගේ උත්පත්තිහේතුවූ මනායතනය දමනය නොකරනලද්දේ ගොපනය නොකරනලද්දේ නොරක්නාලද්දේ නොපියනලද්දේ

නෙරයිකාදිප්‍රභෙදගතවූ අධිකදුක් ඵලවන්නේය, මහණෙනි මේ එසඃයතනයෝ නොදමනලද්දාහු ගොපනයනොකරනලද්දාහු නොරක්නාලද්දාහු නොපියනලද්දාහු.පෙ.අධිකදුක් ඵලවන්නාහුය. මෙමනසින්ම ශුකලපක්ෂයෙහිද අදහසදනයුත්තේය. එහි කියනලද සුඛයෝනම් දහන්මහඵල යන මොහු වන්නාහුය. එහිම ආදීනව අරියපරියෙසනසූත්‍රයෙහි "වරං භීකඛවෙ! තත්තකාය අයොසලාකාය ආදිත්තාය" යනාදී වදාළතයින් දන්නේය.

එහි අදහස:-හුණුවූ හාත්පසින් ගිනිගෙන දිලියෙන එකම ගිනිදැලින් යුකතවූ අයොමය තාරුඝතයකින් ඇස පිරිමදින ලද්දේවීනම් උතුම්වන්නේය ඇසින් දක්කයුතුවූ රූපාලඹනයන් කෙරෙහි කෙලෙසුන් ඉපදීමට සුදුසු ආකාරයෙන් අත්පාආදී අනුවිඅදුන් වශයෙන්ද ස්ත්‍රීපුරුෂාදීන් කෙරෙහි සුභාදීනිමිත්ත ග්‍රාහඃවශයෙන්ද ගැනීම උතුම් නොවන්නේය යනු විසුඛිමාගී ටීකා නයින් දන්නා ලද්දේය.

හුණුවූ ගිනිගෙන දිලියෙන ලද්දාවූ එකම ගිනිදැලින් යුකතවූ අයෝමයතාරාඝතයකින් ඇසපිරිමදිනලද්දේවීනම් ඒ උතුම් වන්නේය ඇසින් දැක්කයුතුවූ රූපාලම්බනයන් කෙලෙසුන්ගේ ඉපදීමට සුදුසුලෙස අත්ගොබනාඟ පාගොබනාඟ කන්ගොබනාඟ යනාදීන් විසින් බෙදූ කොටස්වශයෙන් සලකන අනුව්‍යඤජනවශයෙන්ද කුසිලග්‍රාහයයේ අත්පාආදීඅනුව්‍යඤජනයන් ගළපා ස්ත්‍රීපුරුෂාදීන් සුභාදිවිසින් සලකන නිමිත්තග්‍රාහවශයෙන්ද ගැනීම උතුම් නොවන්නේය. මහණෙනි! එකිනිමිත්තයාගේ ඃස්වාදනයෙන් හෙවත් රසවිඳගැනීමේන් හෙතුනාවූ හෝ අනුව්‍යඤජනයාගේ ආස්වාදනයෙන් හෙතුනාවූ හෝ කම්විඤඤණය සිවින්නේවේද එකල්හි එබඳුවූ පුද්ගලතෙමේ කළුරිය කරන්නේවේද එකල්හි යම්බඳුවූ නිරයද තිරිසන් යොනියද යන ගතිදෙක අතුරෙන් එක්තරා එකක් වන්නේය යන මේ කාරණය විද්‍යමානවන්නේය.මහණෙනි!මම්මේආදීනවය දැක හුණුවූ ගිනිගෙන දිලියෙන ලද්දාවූ.පෙ.නිමිත්තවශයෙන්දගැනීම උතුම් නොවන්නේය යන මෙය කියම්.මහණෙනි! හුණුවූගිනිගෙන දිලියෙන ලද එකමගිනිදැලින් යුකතවූ යහුලකින්දෙකන් සිදුරු විනිවිද යවා බිම ගසා තැබීම්වශයෙන් ශ්‍රොත්‍රෙන්ද්‍රිය පිරිමදිනාලද්දේවේද .පෙ.මහණෙනි! හුණුවූ ගිනිගෙනදිලියෙන එකමගිනිදැලින් යුකතවූ නියසිදීනා තියුණු ඝසත්‍රුයක් ප්‍රවේශකොට ඔසවා නාසා ඇටය සමඟ සිද ඝ්‍රාණෙන්ද්‍රිය මෙලීම්වශයෙන් පිරිමදිනාලද්දේ

පෙහුණුවූ පෙතියුණුකරයකින් ජීවෙහන්ද්‍රිය සිඳිනාලද්දේ පෙහුණුවූ පෙතියුණුවූ දණ්ඩක්ඇති මහත් වැයකින් කාය ප්‍රසාදය උපුටා හෙලීම්වශයෙන් පිරිමදිනාලද්දේ උතුම් වන්නේය.

කයින් දැනගතයුතු ඵොටඨබ්බාලඹනයන් කොරෙහි පෙ උතුම් නොවන්නේය පෙ යන මෙය මෙසේ කියම්. මහණෙනි! හොවවා යහුලින් දෙකන්සිදුරු විනිවිද යවා බිමගසාතබන ලද්දේ උතුම් වන්නේය. මහණෙනි! ඒ ජීවිතය මම වදහයි කියම් අඵලයයි කියම් මොමූහ යයි කියම් යම් බදුවූ විතර්ක යන්ගේ වශඟයට ගියේ සංඝයා බිඳුවන්නේද එබදුවූ විතර්ක යන් වීතකීනය කරන්නේ සංඝභෙදය දක්වා පාපකම්ය ඵලවන හෙයින් උතුම් නොවන්නේය. මහණෙනි! මම මේ ආදීනව දැක මෙසේ මෙය කියම්යි වදළසේක. යතු **අරියපරියෙසන සූත්‍ර වණ්ණනානයයි** දන්නාලද්දේය

දිටුදැමියෙහි විනාශයට පැමිණීම පාපාදීනවය වන්නේය ඊට නිදසුන් කිමයත්,

පෙර බරණැස්නුවර බඹදත්නම් රජක්හු රජය කරවන සමයෙහි අපමහබෝසතාණන්වහන්සේ අසූකෙළක් ධන ඇති බමුණුකුලෙහෑ ඉපිදැ රන්වන්ශරීරඇතිබැවින් හාරිතකුමාර යෝයයි ප්‍රකටවැ වැඩිවිය පැමිණ තක්සලානුවරට ගොස් දිසා පාමොක් ආචාරීන් අතින් උගත් ශිල්පඇතියේ දැරාපරිග්‍රහ කොට මවුපියන්ගේ ඇවැමෙන් රැස්කොට තුබූ අසූකෙළක් වසතුව දැක මේ වසතුව පෙනෙන්නේය මේවසතුව ඉපදවූ පුරුෂයෝ නොදක්නාලැබෙති මවිසිනුත් මරුමුවට පැමිණ සුනු විසුනු වියයුතුයයි මරණඛියෙන් ඛියපත්ව මහදන්දී භිමවතට වැද තවුස්පැවිද්දෙන්පැවිජියේ ඉන් සත්වනද පඤ්චාභිඤ්ඤඅෂ්ට සමාපත්ති උපදවා වනමුල්වනඵලඅහරින් එහි කලක් වැස ලුණු ඇඹුල්සෙවුනා පිණිස හිමවතින් බැස ගම්නියම්ගම්පිළිවෙළින් බරණැස්නුවරට පැමිණ රජඋයන්ලැගැ දෙවනදවස් බරණැස සිඟා ඇවිදිනාසේක් රජදොරට වැඩිසේක, බඹදත්රජ උන් වහන්සේ දැක පහන්සිත්ඇත්තේ කැඳවා තහනලදසේසත් ඇතිසිංහාසනයෙහි වඩා හිඳුවා නොයෙක් රසබොජුන් වළඳවා අනුමෙවෙනි ඛණ අසා ඉනා පහන්ව වහන්ස! කොයිබ වඩනා සේක්දැයි විචාරා මහරජ! වස් එලඹීමට තැනක් බලා යම්හයි වදහළකල වහන්ස! එසේදැයි විචාරා එසේඝයි වදළ ඉක්බිති

උන්වහන්සේ සාඳවාගන උයනට ගොස් ගෝනාගිදිනා සෙන සුන් සලස්වාදී උයන්ගොවිවා අන්පාමෙහෙවර කරනු සොට සලස්වා වැඳ සමුගෙන රජගෙට නිමේය. මහබෝසතාණෝ එතැන් පටන් දෙලොස්හවුරුද්දක් නිබඳ රජගෙයි වළඳ උයන්හි වාසය සෙළේය. එක්දිනක් බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ සතුරන්ගෙන් කිපුණු පසල්දනවිටක් සාගිදුවා එනු පිණිස යනුවෝ අපගේ පින්සොභ නොනසා ආරක්ෂාකරවයි කියා මහබෝසතාණන් වහන්සේ අගමෙහෙසුන්බිසවට භාරකොට යියෝය. එතැන් පටන් දේවී නොමෝ මහබෝසතාණන් නිබඳ සියතින්වළඳවන්නී දිනක් මධුරාහාරය සපයා තබා බෝසතාණන් කල්යවනුයෙන් සුවඳපැනින් නහා සිනින්සළුහැඳ ඇඟ පවන් ගන්වමින් මිටිපලඟෙසා හොත්තීය. එකල ඉහා දහවල් සොට හැඳපෙරවැ බික්බදුන ගෙන අහසින් ගොස්එදෙරසමීපයට වඩනා මහබෝසතාණන්වහන්සේගේ වැහැරිසිවුරුහඬ අසා වෙළෙවිව පලඟින් නැගී සිටිනා බිසවුන්ගේ සිලිටුසළුව මඳක් ලිහිල්වතුබුයෙන් ඉනින් ඉනි හින. එකල විසාඛාගාරමණය මහබෝ සතාණන්ගේ ඇසට අරමුණු විය, නොයෙක් හොළලකම ගණන් හවුරුදු මුළුල්ලෙහි සිත් සනහා විසූ රාගය පැසෙකැ ගොත් සපියෙකුසේ උද්ගතවැ ධ්‍යානය නැසිය. තවුස්තෙමේ සිහි එලවාගතනුහුනුයේ ගොස් බිසවඅතගෙන ලොකාස්වාදරතියෙන් යෙදී අහර වළඳ යලිත් උයනටම ගොස් වසනුයේ එතැන් පටන් ගෙහිමියෙකුසේ දිනපතා එසේම පැවැත්තේය. මෙසේ ඒ තවුස්තෙමේ ඉන්ද්‍රිය අසංවරයහෙතුකොට ගෙන ඉහඅන්ම බැවිහිම විනාසයට පැමිණියේය. එසේ පවත්නා තවුසාණන්ගේ ඒ රහස මුළුනුවර ප්‍රකටවූයේය. නුවරරැකවලසිටි ඇමතියෝ ඒබව පතැලියා රජුහට යැවූහ. රජ්ජුරුවෝ ඒ අසා ඇමතියෝ තවුසාණන්සොරේ මා බිදුවනු කැමැත්තාහු වැනැයි ඒ නොමදහා පසල්දනවිව සෙමෙහි පිහිටුවා පෙරළා බරණැසව අවුත් නුවර පැදකුණුකොට රජගෙට වැද බිසවුන් වසනගෙට ගොස් සැබෑද සොඳුර! අපගේ ආයාචිවූ තාපසයන් වහන්සේ තොපකෙරෙහි වරදවා පැවතිසේක්දැයි විවාළේය. එසඳ බිසව් සැබව දෙවයන්වහන්ස! කියා. එහෙත් රජ්ජුරුවෝ නොමදහා තාපසයන්වහන්සේම විවාරමියි උයනට ගොස් බෝසතාණන් වැඳ එකත්පස්ව හිඳ කාරණය විවාරන්නාහු එම්බා තාපසයන්වහන්ස! නුඹවහන්සේ අසඬම්මසේවනය කෙරෙතියි අපවිසින් අසනලද, කිමෙක ඒ සැබැබසෙක්ද? නොහොත් බොරුබසෙක්දැ?යි විවාළේය. එකල්හි බෝසතාණෝ

ඉදින් මේ රජ මා බොරුයයි කිවත් අදහාගන්නේය. එසේද වුවත් සත්‍යයවැනි මේලොවට පිහිටෙක් නම් නොමඇත්තේය සත්‍යවචනයෙන් දුරුවූ නෙනෙක් බෝමැඩඉඳ බුදුවන්ට නොහැනිවෙති එසේහෙයින් මා විසින් සැබවක්ම කියයුතුයයි සිතූසේක ඒ එසේමය: බෝධිසත්වයන්ට නිසිකලෙකත් ප්‍රාණඝාතයද අදත්තාදානයද කාමමිථ්‍යාචාරයද සුරාපානයද සිදුවන්නේය කවරකලෙකත් තුන්අඟින් යුත් බොරු සිදුනොවන්නේය එබැවින් සැබවක්ම කියන්නාවූ ඒ මහබෝසතාණෝ එම්බා මහරජුරුවෙනි! නොපවසින් යමක් ඇසිම්යි කියනලදද ඒ සැබෑදෙයක්මය එය සියලු සත්වයන්මොහනාරන්නාවූ කායගුණයෙහි මමත් මූලාව අසත්පථයට පැමිණියෙමියි වදළසේක. එබසට රජුරුවෝ එබ්‍රාහ්මසයන් වහන්ස! මේ ලොකයෙහි ගිලන් මිනිසුන්යෝ තමහට උපන් ව්‍යාධිය බසුවෙන් සන්සිඳුවා ගනිති උපන් විෂාසය දියෙන් සන්සිඳුවාගනිති නුඹවහන්සේවූ සැලී සිහලූපන්නාවූ රාගය නිසිසේත් දුරුකොටගතහුහුනුසේක එසේනාල මේ සූක්ෂම අර්ථනිමිතට සමර්ථවූ නුවනින් ප්‍රයෝජන කවරේදැයි කියේය. එසේකි රජහට ඒ පොළසුන්ගේ දැඩිබව හා එහි නුවන නොපවත්නා බව දක්වන්නාවූ මහබෝසතාණන්වහන්සේ,

"වත්තාරෝ 'මෙ මහාරාජ! ලොකෙ අතිබලා භූසා,
රාගෝ දෝසෝ මදෝ මොහෝ යත්ථ පාණෙ නගාධනි"

යන මේ ගාථායෙන් එම්බා මහරජුරුවෙනි! මේ ලෙව්හි සියලු සත්වයන්ට අනර්ථ කිරීමට සමර්ථවූ අධිකබලඇති වස්තූහු සතරදෙනෙක් දෙති ඔහුනවරහුද යත්, සීලසමාධ්‍යාදී බොහෝ ගුණ එබවට නසන හෙයින් රාගයද එක්බලවත් එනෙස ක්ෂාන්ති මෛත්‍රාදීවූ විශිෂ්ටගුණයන් නසන හෙයින් වෙසසද එක් බලවත් එමෙසා බොහෝකලක් පුරුදු ශීලසංවරාදීන් සතිවිප්‍රවාසයට පමුණුවා අනාපත්තාරී හෙයින් බලවත්ම පුරිසමදයි මදයද ඉතා දැඩි බලවත් එනෙසා අමෘතමහානිර්වානයට සාරණාවූ අනිත්‍ය දුඃඛ අනාත්ම සවභාව පරිඥානය මැඩපවත්නා හෙයින් මෝහය දැඩි බලවත් එනෙසා[illegible]යම්සේ ගැඹුරුමහවතුරෙහි වන් එනෙක් එහි පිහිනා සිටියනොහේද එසේම මේ පොළසුන් උපන් සිත සතන පැවති ප්‍රඥාවෙන් පිහිට නොලබන්නේයයි වදළසේක. මහබෝසතාණන්වහන්සේගේ ඒ හෙපුල් අසා බඹදත්රජුරුවෝ සවමිනි! තාපසයන්වහන්ස! නුඹවහන්සේ

පිරිසිදුයයි කියාද සිල්වතැයි කියාද නිකෙලෙශියයි කියාද සවාහා
විකප්‍රඥ ඇත්තේයයි කියාද අප විසින් සලකනලද්දේ වේදූහි
කීහ. එවිට නවුසාණෝ එඞා මහරජ්ජුරුවෙනි! සුභාකාරයෙන්
රාගය හා පැවැත්තාවූ ලාමක අකුශල චිතකීයෝ ධ්‍යානසමා
පත්ති ආදී විශෙෂගුණයෙන් යුක්ත බලවත් නුවණැති ඍෂිවර
යනුත් නස්නාහුමයයි වදළසේක. එක්බිති ඒ මහබෝසතාණන්
ගේ සිතැ උපන්නාවූ කෙලෙසුන් දුරුකිරීමෙහි උත්සාහ වඩ
වන්නාවූ බ්‍රහමදත්තරජ්ජුරුවෝ එඞා තාපසයන්වහන්ස! නුඹ
වහන්සේගේ සිතැ උපන් මේ රාගය නම් ශරීරවණ්ණය හා ගුණ
වණ්ය නසන්නේය ඒ දුෂ්ටවූ රාගචෙතනාව දුරුනාලමැනෝ
ඒ එසේමය, නුඹවහන්සේ ලොවැ බොහෝදෙනාහට නුවණැති
නොනැසැයි අභිමතසේක්මයයි කියේය. ඉක්බිති පුරණලද
බෝධිසමභාරඇති ඒ මහබෝසතාණෝ සිහි එලවා වෘත්තුකාම
කෙලෙසකාමයෙහි ආදීනව සලකා වදාරණසේක් එඞා බ්‍රහමදත්ත
රජ්ජුරුවෙනි! නුවණ නැමති ඇස අන්ධකරන හෙයින් මේ
රාගාදි කෙලෙසයෝ අදුරක්වැන්නාහ, තමන් උපන් චිත්ත
සන්තානයෙහි කුසල් නසන හෙයින් හා භයංකරවූ විපාක දෙන
හෙයින් විෂයෙක් වැන්නේය දෙලොවිහිම නොයෙක් දුඃඛදායක
වෙති එසේහෙයින් ඔවුන් සතසතු කැමත්තාවූ මම නුවණින්
මෙනෙහිකිරීමයයි කියනලද ඔවුන්ගේ උත්පත්ති කාරණයන්
සොයන්නෙමි මෙසේ රාගොත්පත්තිකාරණයන් දුටුවාවූ මම
සුභනිමිත්තාදී ඛණ්ඩනයෙන් යුක්ත රාගය ප්‍රඥනමැති ඛඩ්ග
යෙන් කපාහරිමි මහරජ! මට මදක් අවසර දෙවයි අවසරගෙන
පන්සලට වැද කිසුණුමඩුල්ල බලා නැවතත් රූපාරූපධ්‍යාන
උපදවා අහසැබඳපයඃඛකඃයන් වැඩහිඳ රජ්ජුරුවන්ට ධර්ම
දේශනා කොට මහරජ! මම අසථානයෙහි විසූනිසා මහජනයා
මැද මෙබඳුවූ නිඳුවට පැමිණියෙමි එසේහෙයින් සඞ්ඝසංචාර
විරහිතවූ හිමාලවනයටම යන්නෙමි තෙපිද කුසල් කිරීමෙහි
පමානොවයි කියා රජහු අඬඅඬා සිටියදී සත්පරාක්‍රම ඇති ඒ
තාපසයන්වහන්සේ නැවත හිමාලවනයටම ගොස් නොබිඳී
හුනු ධ්‍යානයෙන් බ්‍රහමලොකයෙහි උපන්සේක.....

මෙසේ මෙලොව විනාශයට පැමිණීමට හෙතු පාපාදීනවය
බැව් හැඟවීමට ගෙනහැරපානලද නවනිපාතයෙහි භාදිනජා
තකවණ්ණනායෙහි භාදිනතාපසවත්ථුව මෙතෙකින් නිමවන
ලද්දේය.....

එහිම් ලොමසකස්සපජාතකවණ්ණනායෙහි ලොමසක ස්සප තාපස වසනුවද එකනිපාතයෙහි දසවන තුදුස්ව නවති යන්හි නක්ඛසිලාජාතක පඤ්ඤගරුකජාතක වණ්ණනා වන්හි ආවාවූ ඉන්ද්‍රියඅසංවරය හෙතුකොටගෙන යකිනියන් විසින් කනලද රූපගොචරශබ්දගොචරාදීජනයන් පස්දෙනාගේ කථාවස්තුවද යකිනියන් විසින් නිමවනලද දෙව්රුව පවා ඉදුරන් බිඳ කෙළෙසුන්වශයෙන් නොබලා තක්සලානුවරට ගොස් රජපත් බරණැස්රජපුත්දෙදෙනාගේ කථාවස්තුවද මේ අර්ථයම ප්‍රකටකිරීම පිණිස ගෙනහැර දැක්වූත්තේය.

තවද සභාගගොචරයෙන් පිරිහීමද ආදීනවයක් වන්නේය, එහෙයින් විසුඬවිත්තසන්තානඇති හෙයින් විත්තාමාණික්‍යවූ භාග්‍යවතුන්වහන්සේ ඉන්ද්‍රියසංවරවිරහිතවූ මහණුන්ව ඔවා දෙකසේක් "මහණෙනි! මහණහු විසින් නම් රූපාදීන් කෙරෙහි සුභනිමිත්තවශයෙන් නිමිති ගන්නට නොවටනේය. ඉදින් වනාහි එසමයෙහි කළුරියකරන්නේවිනම් නිරයාදීන්හි උපදනේය එහෙයින් රූපාදීන්කෙරෙහි සුභයයි නිමිත්තග්‍රහණය නොකරව්ය"යි වදාරා යලිත් දහම් දෙසතු කැමැතිසේක් "තුම්හාකං රූපං ඔලොකනකාලොපි අත්ථි අනොලොකන කාලොපි" යනාදිය වදාළසේක.

එහිඅදහසනම්:—මහණෙනි! රූපය බලන කලක්ද නොබලනා කලක්ද තොපගේ ඇත්තේය රූපය බලන කාලයෙහි සුභවශයෙන් නොබලා අසුභ වශයෙන් බලව් එසේ ඇතිකල්හි තාමන්ගේ ගොචරයෙන් තුමූ නොපිරිහෙන්නහුය තොපගේ ගොචරයනම් භාවරේදයත්, සතරසතිපට්ඨානයෝය සතරසම්‍යක් ප්‍රධානයෝය ආයර්‍ය්‍ය. අභිඤ්ඤාකම්මාදීය නව ලොකොත්තරධම්මයෝය යන මොහුයි. මෙය මෙසේ ඇතිකල්හී ගොචරයෙහි හැසිරෙන්නාවූ තොපගේ සිදුරක් අවකාශයක් මාරයා නොලබන්නේය. ඉදින් වනාහී කෙළෙසුන්ට වසඟවී සුභනිමිත්ත වශයෙන් බලන්නාහුනම් 'පූතිමංස'නම් සිවලාමෙන් තමන්ගේ ගොචරයෙන් පිරිහෙන්නාහුය යතුයි. මෙසේ වදාරා ඉකුත්වත ගෙනහැරදක්වා වදාළසේක.

පෙර බරණැස්නුවර බඹදත් නම් රජෙකු රජය කරවත සමයෙහි හිමාලයවනප්‍රාන්තයෙහි අරණ්‍යයෙක ගල්ගුහාවෙක්හි නොයෙක්සියගණන් එළුවෝ වාසය කෙරෙති ඔවුන් වාසය කරන තැනට තුදුරුතන්හි එක් ගල්ලෙනක පූතිමංස නම්

කැනඹිලෙක් තමාගේ 'මෙනි' නම්වූ භාර්යාව හා සමග වාසය කෙරෙමින් එක්දිනක් ඇය සමග මෙනෙහි ගොදුරු සොයා ඇවිදින්නේ ඒ ගුහායෙහි වසන එළුවන් දැක එක් උපායකින් මොවුන් මරා මස් කෑයුක්තේයයි සිතා ගොස් දිනපතා එකි එළුවකු බැගින් මරා කන්නේය මෙසේ ඔවුහු දෙදෙනා එළුවන් කමින් ස්ථූලසරීර ඇතිව මහත් ශක්තිසම්පන්නවූවාහුය මෙසේ කල්යත්යත් එළුවෝ විනාශයට පැමිණියාහුය ඔවුන් අතුරෙන් 'මෙණ්ඩිමාහා' නම්වූ එක් එළුදෙනක් නුවණැත්තිය උපායෙහි දක්ෂවන්නීය ඒ කැනහිල්ලෙම ඇයමරාකන්නට නොහැක්කේ තමාගේ භාර්යාවූ මේනි නම් සිවල්දෙන සමග මන්ත්‍රණය කරනුයේ සොදුර! සියලු එළුවෝම අපව්සින් මරා කෑලදින් නිමාවට ගියානුය මේ එළුදෙන පමණක් ඉතිරිවිය මැය එක් උපායකින් මරන්නටවටනේය එසේ හෙයින් නිතනිවම ගොස් ඒ එළුදෙන හා සමග මිත්‍රව තොප ඇය සමග විශ්වාස කාල්හි මම මළඅහාර දක්වා හෙව නිදමි එකල නී ඇය ළඟටගොස් 'සෙහෙලිය! මාගේ සව මිත්‍රයා මළේය මමද යිසි පිළිසරණෙක් නැත්තී වෙමි දැන් නි හැර අනික් නොනෙක් මට නැත එසේ හෙයින් අපිදෙදෙන ගොස් අඩා වැලපා ඔහුගේ ආදාහනකෘත්‍යය කරම්හ'සි කියා ඇය කැඳවාගන මෙතැන්හි එව එසේ කල්හී මම හොත්පලින් පැනපාගි ඇගේ බොටුව බැහැ මරමිසි කියේය. එසඳ ඒ වෙනි නොමෝ යහපතැසි පිළිගෙන ඒ එළුදෙන හා සමග මිත්‍රවී විස්වාසය උපන් කල්හි පළමු සිහාලයා කි සියල්ලම එළුදෙනට නිය එසඳ ඒ එළුදෙන්නොමෝ කියන්නී සෙහලිය නීගේ සවාමියා මිසින් මාගේ සියලු නෑයෝ කනලද්දුහ එසේ හෙයින් ඔහුකරා යන්නට බිය ඇත්තෙම් කිය සෙහෙලිය! නී නොබව මැලහු කුමක් කරන්නේද එවසි කිය යලිත් එළුදෙන කියන්නී නිගේ සවාමිපුත්‍රතෙම ඉතා දැඩිවූ මන්ත්‍රණ ඇත්තේය එහෙයින් මම ඔහු සමීපයට නොයම්සි කී කලත් ඇය මිසින් යාඥා කරනලදුම එකාන්තයෙන් මල නියාව වේදැසි සිතා ඇගේ බස් ගිවිස ඇය එක්ව නික්ම ගියාය එසේ යන්නීත් කුමකින් කුමක් වන්නේදෝ හෝසි කැනහිලා කෙරෙහි සැකඇත්තී සිවල්දෙන ඉදිරිකොට ඔහු විමසමින් යන්නීය. එකල ඒ සිහාලතෙමේ එන්නාවූ ඔවුන්ගේ පදශබ්දය අසා එළුදෙන ආවාදේ හෝසි ඉස ඔසවා ඇසදල්වා බැලූයේය ඒ දුටු එළුදෙන්නොමෝ මේ පාපිෂ්ඨගුණඇති දුෂ්ටයා මා රවටා මරා කනු කැමැත්තේ මුලවෙස්ගෙන හොත්තේයයි පසුහැරී දුවන්නට වන්නීය. එකල සෙහෙලිය! නී කවර

හෙයකින් දුවන්නීදැයි කැනහිලිය විසින් විචාරණලද්දී එඹල යෙහෙලිය! තිගේ හිමියාවූ පුනිමංශ සිඟාලයාගේ බැලීම මට යහපත් නොවන්නේය එසේ හෙයින් එබඳුවූ වචාප්‍රයොගකාරී අසත්පුරුෂයාහෙරෙන් දුරුවීම යහපතැයි කියා තමාවසන නැනට ගියාය. එළඳෙනගේ ගමන වලකාලිය නොහැකිවූ ශොකපත් කැනහිලිතොමෝ කැනහිලාවෙත එලඹ ශොකඤර මින් නොයෙක් සිතිවිලිසිතමින් කලකිරී හුන්නිය එකල එසේ හුන් සිවල්දෙනට විඛානකරන්නාවූ ශොකපත් සිවල්තෙමේ එඹල වෙනියැ! නි පළමු 'මාගේ යෙහෙලිවූ එළඳෙන මට බෙහෝ සෙනහඇත්තිය මා හිමා හරන්නියයි ගුණවණ්ණනා කොට නුඹළහට කැඳවාගෙන එම්සි කියා ගොස් දැන් වනාහි අප සමීපයට නොමැත්ත් දුරසිටම නැවත පලායන්නීවූ ඇය වලකා ගතනොහී නි මෙතැන්හි අවුත් උමතුවාක්මෙන් හිඳ ඝමට ශොකකරන්නීදැයි කියේය එබසට සිවල්දෙන්තොමෝ;

"නිං ඛොසි සමම! උමමත්තෙතා දුම්මෙධා අවිචක්ඛණා,
යෝ නිං මතාලයං කත්වා අකාලෙන විපෙක්ඛසි"

යන මෙයින් එඹල සවාමිපුත්‍රය! යම්හේකින් තෝ පළමු වෙන් මලඵාක්හුගේ ආහාරය දක්වා හෙව ඇයළඟට ආ කාල්හිම නැගිසිට බොටුව ඬැහැ මරමිසි මන්ත්‍රණය කොට දැන් ඇ සමීපයට එන්ට පළමුවෙන් නොකල්හි හිස ඔසවා බැලූ යෙහිද එසේ හෙයින් එබඳුවූ තෝම විචාරණබුඩියෙන් තොරවූ අඥානවූ පිස්සෙකැයි කිය. මෙසේ කියා සිවල්දෙන්තොමෝ හිමියෙනි! ශොක නොකළමැනව නැවතත් මම ඇය උපායකින් මෙතනට කැඳවාගෙන එම් එකල ඇය පමානොව අල්ලාගත මැනවසි කියා ඇය සමීපයටගොස් කියන්නී එඹල යෙහෙලිය! පළමුතොපගිය ගමනින් බොහෝවැඩවිය තොපඵතැන්හි ගොස් දැකිමෙන් මාගේ සවාමියා දැන් සිහිලැබ ජීවත්වන්නේය එසේ හෙයින් ප්‍රියපඬුරක් ලදින් සතුටුකරන්නාක්මෙන් ඒ සවාමි පුත්‍රයා කරාගොස් පිළිසඳරකථා කොට එවයි කිය එසඳ ඒ එළඳෙන්තොමෝ මේ පවිටුකැනහිලි මා රවටා කතුකැමැත්තිය මොවුන් වෛරකරවාගැන්ම නුවණට හුරු නොවන්නේය එහෙයින් උපායෙන් මැ රවටා දුරුකෙරෙමැයි සිතා කියන්නී යහපත යෙහෙලිය! නි සතුටුකිරීමට එම් එසේ එන්නාමුදුබොහෝ පිරිවරගෙන එම් ඒ එන්නාවූ අපව කැඟුතුවූ භොජනයන් අදයැතබිවිති කිය ඉක බිති ඒ සිවල්දෙන්තොමෝවිචාරන්නී මම

නොප කිවාවූ පණිදට යම් හොජනයක් සදමි ඒ තීගේ පරිවාරි ජනයෝ කෙබදු වන්නාහුද කිනම් ඇත්තාහුද? ඔවුන් අපට නොවලහා කියවයි කීය. එවිට එළුදෙන් තොමෝ තමන් පිරිවර කියන්නී එඹල වේනිය! සුනඛයන් පන්සියයක් පන්සියයක් පිරිවර කොට ඇත්තාවූ මාලිය නම්වූද චතුරකඛ නම්වූද පිඟිය නම්වූද ජඹුක නම්වූද යන මොහු සතර දෙන මාගේ පිරිවර වන්නාහ මේ සියලුලවුන් පිරිවරාගන එන්නාවූ මට තී ගොස් අහර සපයා තබව ඉඳින් නෝ අහර සපයා නොතිබුවා නම් මාගේ පිරිවරවූ දෙදහසක් බල්ලෝ නොප දෙදෙන මරා කන්නා හුයයි කීය. එබස් අසා සිවල්දෙන යහපත ඉඳින් නොමෝ එතන්හි ගියා නම් අපට සිදුවන්නේ මහත් විපතෙක එසේ හෙයින් නොයන පරිද්දක් කෙරෙමියි සිතා කියන්නී එඹල යෙහෙලිය! තී මේ වසනතැනින් නික්ම ගිය කල්හි නොපගේ උපකරණ විනාශ වන්නේය එසේ හෙයින් තීගේ යහලුවූ ඒ සිගාලයාහට නොප නිදුක් නිරෝගි බව මම කියාලම් තී අනික් තන්හි නොගොස් මෙතැන්හිම සැපසේ වාසය කරවයි ඒ එළු දෙනට කියා නොමෝ මරනභයින් තැතිගෙන වේගයෙන් හිමියා වෙත ගොස් ඔහු කැඳවාගන අන්තැනක විසීමට ගොස් නැවත එම ගුහාවට නොම ආවාහුය. මෙසේ අතීත කථාව ගෙනහැර දක්වා **නවනිපාතයෙහි පූතිමංශජාතකයෙහි** මේ ගථාව වදාළසේක.

"න අකාලෙ විපෙකඛය්‍ය කාලෙ පෙකඛය්‍ය පණ්ඩිතෝ,
පූතිමංසොව ඛ්‍රායති යෝ අකාලෙ විපෙකඛති"

එහි අදහස නම්:-මහණෙනි! පණ්ඩිතමහජන තෙමෙ කාම ගුණයන් ඇරැඛ සුඛ නිමිත්ත වශයෙන් සිත උපදනා කාලයයි කියනලද නොකල්හි රූපාදී අරමුණු නොබලන්නේය අසුභවශ යෙන් හෝ අනුස්සතිවශයෙන් හෝ කසිණවශයෙන් හෝ රූප ග්‍රහණකාලයයි කියනලද සුදුසු කාලයෙහි අරමුණු බලන්නේය මහණෙනි! යමෙක් මෙකියනලද නොකල්හි බලන්නේ විනම් නොකල්හි එළුදෙන බලා ගොදුරින් පිරිහුනු පූතිමංස සිඟාලයා තැවුලි සිතුවාක් මෙන් සතිපඨානාදී ගොවරයෙන් පිරිහී දෙලෙවිහිම තැවුලි සිතමින් කලානතවේයයි වදාළසේක යනුයි.

නොකල්හි අරමුණු බැලීම ගොවරයෙන් පිරිහී දෙලෙවිහිම තැවුලිවන බවට නිදසුන් වශයෙන් ගෙනහැරපානලද **නවනි පාතයෙහි පූතිමංසජාතකය** මෙතෙකින් දක්වා නිමවන ලද්දේය.

එසේ හෙයින් මහණහු විසින් නම් රූපාදී ආරම්මණයන් අනුබ්‍යඤ්ජනග්‍රාහ නිමිත්තග්‍රාහ වශයෙන් නොගෙන සැගිරි වෙහෙර වසූ අසුභකම්මට්ඨානිකස්ස තෙරුන්මෙන් දිඝසුතමූත මාත්‍රයම ගතයුත්තේය. ඒ එසේවැයි, ඒ සථවිරයන්වහන්සේ වනාහි පියෙවින්ම අසිත කම්මට්ඨාන ඇත්තෙක්වීය උන් වහන්සේ සැගිරියෙන් අනුරාධපුරයට පිඬුපිණිස වඩනේ එක් තරා කුලස්ත්‍රියක් සවාමිපුරුෂයා හා සමග ඛබරකොට සැදී පැහැදී දෙවහනක් මෙන් උදෑසනම අනුරාධපුරයෙන් නික්ම සවකිය මවුපියන්ගේ ගෙට යන්නී අතරමගදී මහාතිස්සසථවිර යන් දැක රාගවශයෙන් පෙරළනාවූ සිත්ඇතිව තමන් දෙස බල වම්සි සිටා මහත් ශබ්දනඟා සිනාසුනීය මහතෙරුන් වහන්සේ යොනිසොමනසකාරයෙන් යුකතව වඩනේ මහසිනාහඬ අසා මේ කුමක්දෝහෝයි බලනුයේ සිනාසෙන්නීවූ ඒ ස්ත්‍රීගේ දත්ඇට දැක මහතෙරුන්වහන්සේ ප්‍රකෘතියෙන්ම අසිතකම්මට්ඨානය පුරුදුකරගත ආබැවින් පූර්වභාවිතාබලයෙන් ඇගේ දත්ඇට විෂයෙහි අසිතසඤ්ඤා පිළිලැබ එකෙණෙහිම කාමරාගහන් වඩා ප්‍රතිභාග නිමිත්තද උපචාරනිමිත්තද ලැබ එතන්හිම ප්‍රථමධ්‍යාන උපදවා ඒ ධ්‍යානය පාදක කොට ගෙන විදසුන් වඩා රහත්බවට පැමිණියේසේක.

රූපාදීන් අනුබ්‍යඤ්ජනග්‍රාහ නිමිත්තග්‍රාහ වශයෙන් නොගැනීම දෙලෙව්හිම නොපිරිහී ලොවිතුරාසුව ලබනුවට හෙතු වන බැව් හැඟවීමට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද විසුඛි මාගීයෙහි සීලනිද්දේශයෙහි අසුභකම්මට්ඨානිකස්ස තෙරුන්වන් නිමියේය.

මෙයද උතකෘෂ්ටවශයෙන් කියනලද්දේය. මේ සිතනම් ඇසිල්ලකින් පෙරළෙනසුලුය එසේහෙයින් අලුත පැවිදිවූ වංගීස තෙරුන් විසින් මෙන් උපන් රාගය අසුභමනසිකාරයෙන් දුරු කොට ඉන්ද්‍රියසංවරය සම්පාදනය කටයුත්තේය.

ඒ සථවිරයන්වහන්සේ වනාහි අනදතෙරුන් හා සමග පිඬු පිණිස හැසිරෙනුයේ එක්තරා සත්‍රියක් දැක ඇය කෙරෙහි පිළිබඳ සිත් ඇත්තේවීය ඉක්බිති වංගීසසථවිරයන්වහන්සේ ආයුෂ්මත් ආනන්දසථවිරයන්වහන්සේට,

"කාමරාගෙන ඩය්හාමි චිත්තං මෙ පරිඩය්හති,
සාධු නිබ්බාපනං බ්‍රූහි අනුකම්පාය ගෝතම."

යනුවෙන් ශෞතම ගොත්‍ර ඇති ආනන්දස්ථවිරයන්වහන්ස! කාමරාග නමැති ගින්නෙන් මම දවනු ලබමි මාහේ සිත හාත් පසින් දවනු ලැබේයි එහෙයින් මට අනුකම්පා පිණිස ඒ රාග ගින්න නිවීමට සුදුසු උපායක් කිවමැනවැයි ආරාධනා කෙළේය එකල ආනන්දස්ථවිරයන් වහන්සේද,

"සඤ්ඤාසවිපරියෙසා චිත්තන්තෙ පරිඩයාති,
නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූපසංහිතං.

අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං,
සංඛාරෙ පරතො පස්ස දුක්ඛතො නො ච අත්තනො,
නිබ්බාපෙහි මහාරාගං මා ඩය්හිත්ථො පුනප්පුනං."

යන මේ ගාථාවයෙන් ඇවැත්නි! අයහපත් අරමුණෙහි යහ පතැසි පැවති තොපගේ විපරීතසංඥාව හෙතුකොටගෙන තොපගේ සිත රාගනමැති ගින්නෙන් දවසි එහෙයින් රාගය ඉප දීමට කාරණාවූ යහපතැසි සිතාගන්නාලද ඒ අරමුණ මෙනෙහි නොකිරීමෙන් දුරුකරව ඒ සත්‍රිරූපය අසුභවශයෙන් සලකා අසු භාරමුණෙහි එකඟවූ සිත මනාකොට පිහිටුවා භාවනාවෙන් වඩව සියලු සංඝකාරධර්මයන් අනිත්‍යවශයෙන්ද ඉපදීමෙන් හා බිඳීමෙන් පෙළෙනසුලු දුක්වශයෙන්ද අනාත්මවශයෙන්ද බලව තුන්ලොවම මැඩපවත්වා සිටිනාවූ මහත් තෘෂ්ණා නමැති ගින්න සොවාන්ආදී සතරමඟඵල නමැති ජලයෙන් පිළිවෙළින් ගොස් නිවව දැන් තොප රාගාග්නියෙන් දැවාක් මෙන් නැවතනැවතත් නොදැවෙවයි අවවාද කළසේක.

ඒ ස්ථවිරයන්වහන්සේ එසේ කිරීමෙන් රාගය දුරුකොට විඹු පිණිස හැසුරුනේය. උන්වහන්සේ පසුකාලයෙක උතුම්වූ රහත්බවට පැමිණිසේක.

ඉන්ද්‍රියසංවරශීලය වනාහි (**නසුනෙවංකරිස්සාමිති**) නැවත මෙබන්දක් නොකරමියි සිතින් අධිෂ්ඨාන කිරීම් වශයෙන් සුබ වන හෙයින් '**සංවරසුඛිය**'යි අර්ථකථාචාරීන් විසින් කියනලද්දේය. "**නසුනෙවං**" යනතන්හි "**එවං**" යන්න සංවරභෙදය සඳහා කියේයයි එහි ටීකාචාරීන් විසින් කියනලද්දේය. එහෙයින් තමඟව වැඩකැමැති අනිකුදු කුලපුත්‍රයෙකු ඇතහොත් ඔහු විසින්ද අසංවරය බිඳ නැවත සංවරශීලය සම්පාදනය කට යුත්තේය.

තාවද ඉන්ද්‍රියසංවරගිලය පුරන්නාවූ මහණ විසින් කරඬුමහ
ලෙන්වැසී විත්තගුත්තමහාසථවිරයන්වහන්සේ මෙන් විසයුත්
[illegible]හේ නොසේදයත්, මෙම ලක්දිව කරඬුමහලෙනතුළ
විපසසි ආදී සත් බුදුවරයන්වහන්සේලා මහබිනිඃක්මන් කළ
ආකාරයට අදිනලද සිතුවම් දුටුවන් සිත් පැහැරගන්නාසේ
විසිතුරුවෙයි එම සථවිරයන්වහන්සේ එහි සැටවසකට වැඩි
කාලක් වසනුසෙන් විසදඹු පමණ තැන් බැලීම සඩහාවිකොට
ඇතීබැමින් ඇස දල්වා ලෙණඋඩ පෙර නොබැලූ විරූප එබැ
වින් එහි සිතුවම් ඇතිබවෙක් හෝ නැතිබවෙක් හෝ නොම
දත්තේය ආලොක කවාටයෙහි හෙවත් ජනෙල්කවුළුවෙහි පටන්
මකුළුදැල් පහකටයුත්තේයයි සෙනාසනසොඛනවතක් වදුරන
ලද්දේනොවේද කිමෙසා එහෙත් සථවිරයන්වහන්සේ සෙනසුන
සුඛනොකළේද? එසේය සුඛනොකෙළේය අතාවැසියෝම
උන්වහන්සේගේ සෙනසුන සුඛකෙරෙත් එක් කලෙක බොහෝ
හිඤ්ඤූහු සෙනාස්නෙන් සෙනස්නට විසිතුරු බලමින් ඇවිදිනාහු මේ
කරඬුමහලෙනට පැමිණ එහි තුබූ සිතුවම් කම්මත්ත දැක වහන්ස!
මේ සිතුවම් ඉතා සිත්කලුයයි කිහ. එබසට මහතෙරුන්වහන්
සේ ඇවැත්නි! මේ ගල්ලෙනැ වසන්නාවූ මට සැටඅවුරුද්දකට
වැඩිකල් ඉන්මගියහ එතකුදුවුවත් මේතාක්කල් මෙබදු විසිතුරු
සිතුවම් ඇතැයි යන බසකුදු නොදනුම්හ දැන් අද ඇවැත්වූ
නොපනිසා සිතුවම් ඇතිබව දන්නාලදුම්හයි කීයේය. ඒ තෙ
රුන්වහන්සේගේ ගල්ලෙන දෙරකඩ මහත්වූ නාරුකක්ද
ඇත ඒ නාරුකද තෙරුන්වහන්සේ විසින් කිසිකලෙකත් උඩ
නොබලන ලද්දේමය හවුරුදුපතා මල්පිපෙන සමයෙහි බිමහෙන
රොන්සලාදැකම රුක මල්පිපියහයි දැනගන්නාහ එසමයෙහි
මාගම්නුවර රජකරන රජතෙමේ තෙරුන්වහන්සේගේ ශීලාදී
ගුණසමපත් අසා වඳිනු කැමැතිව තුන්වරක් රාජදූතයන් යවා
තෙරුන්වහන්සේ නොවඳිනා කල ඒ මාගම් නුවර කිරිබොන
ලදරුවන්ඇති ගැහැනුන්ගේ පයොධරයන් පවින් බඳවා රාජ
මුද්‍රිකාවෙන් මුද්‍රණය කරවූයේය කුමක්සඳහාදයත්, සම්තාක්
මහතෙරුන්වහන්සේ නුවරට වඩනේද ඒතාක් කල් දරුවෝ
කිරිනොබොන්වායි කියායි. මහතෙරුන්වහන්සේ එපවත් අසා
ඒ තෙරුන්වහන්සේගේ නොයාමෙන් කිරි නොලබන්නාවූ දරු
වන්ට අනුකමපා පිණිස මාගම්නුවරට වැඩියහ රජතෙමේ මහ
තෙරුන්වහන්සේ වැඩියහයි අසා රාජපුරුෂයන් බණවා යව
සගය! මහතෙරුන්වහන්සේ රජගෙට වැඩමවාගත එවි තෙරුන්
වහන්සේගේ සමීපයේදී සිල්ගතුම්හයි කියා යවා තෙරුන්

වහන්සේ රජගෙට වඩා ගෙන්වා පසඟ පිහිටුවා වැඳ දන් වළඳවා ඉක්බිති ස්වාමීන්වහන්ස! අද අපට අවකාශ නැත්තේය සෙට දවස සිල් ගනුම්හයි නැඳිතත් තෙරුන්වහන්සේ දකිනු කැමතිව තෙරුන්වහන්සේගේ පාත්‍රයගෙන මඳක්දුර පසුගමන් කොට රාජදෙවිය හා සමග සිට වැඳ නැවැත්තාහ.

සථවිරයන්වහන්සේ වනාහි රජුගේද දෙවියගේද වන්දනාකාල යෙහි ශබ්දකාරයපමණක් ගත්තේය සත්‍රිය පුරුෂයාය යන විභාගයක් නොකෙළේය එහෙයින් මහතෙරුන්වහන්සේ රජු වඳිවයි හෝ රාජදෙවිය වඳිවයිහෝ මහරජ සුවපත්වේවායි එකාසමාන කොට කියන්නේය මෙසේ තෙරුන්වහන්සේද එසත්දවස රාජ ප්‍රතිඥ මුදවන පිණිස රජගෙට වඩනාහු රජුද සවමීනි! සෙට සෙට යයි කියමින් සත්දවසක් ඉක්මවූහ. තෙරුන්වහන්සේට පශ්චාත් ශ්‍රමණව වඩනාවූ සෙසු භික්ෂූහු ස්වාමීන්වහන්ස! නුඹවහන්සේ රජගෙට වැඩියවෙලෙහි රජු වඳිනාකල්හිද දෙවිය වඳිනා කල්හිද නොවෙනස්කොට මහරජ! සුවපත්වේවායි මෙපමණක්ම කුමක් නිසා කියනෙහිදැයි විවාලහ මහතෙරුන්වහන්සේ ඇවැත්නි! මම රජුයයි කියා හෝ දෙවියයයි කියා හෝ නියම නොකරමි හෙවත් විශෙෂලක්ෂණ දැක නොහඳුනම්හයි කියේය. මෙසේ සත්දිනක් ඉක්ම ගියකල තෙරුන්වහන්සේට මේ ඇතුළුනුවර විසීම දුක්වන්නේයයි සිතා රජු විසින්ම පිටත්කොට හරිනලදුව තමන්වහන්සේ වැඩවිසු කරඹුමහ ලෙනට වැඩ එදවස රාත්‍රිභාගයෙහි භාවනාකිරීම පිණිස සක්මනට නැඟාහ ඒ බව දුටු නාරුකඅධිගෘහිතවූ දෙවි දූ කොමෝ තෙරුන් වහන්සේගේ ශීලය සුපරිසුඛබැව් දැක දඬුවැටපහනක් ගෙන ආලොක කරමින් සිටියාහ ඉක්බිත්තෙන් තෙරුවන්වහන්සේ කාමීසඵාන මෙනෙහිකිරීමෙන්ම සක්මන් කරන්නේ මැදුම්යම දසපැය කෙළවර මුළුපඵීතය පෘථිවි කම්පා වෙන් නාදකරවමින් ඒ පඵීතවාසී දෙවියන්ගේ සාධුකාර පූජා ලබමින් සෝවාන්ආදීමාගීඵල පිළිවෙළින් ගොස් උතුම්වූ අර්හත්ඵලයට පැමිණියේක.

ඉන්ද්‍රියසංවරශීලය පිරිසිදු වූයේ ලොවුතුරා සුව ඵලවන බවට නිදසුන්වශයෙන් දක්වනලද විසුද්ධිමාගීශෙහි ශීලනිද්දේශයෙහි චිත්තහත්ථසාරවසතුව මෙතෙකින්නිමවනලද්දේය.

ඉන්ද්‍රියසංවරශීලය නිමියේය.

ආජීවපාරිසුද්ධිසීලය වනාහි එක්විසිඅනේසනයන් දුරුකොට බුද්ධප්‍රශස්ථවූ පිණ්ඩචරියාවෙන් දැහැමින් සෙමෙන් ලත් බොජුනෙන් මනාකොට ජීවත්වන්නහුගේ ආජීවය පිරිසිදුවන්නේය. එහෙයින් **මහාසකුලුදායිසූත්‍රයෙහි** "කතමො ච භික්ඛවෙ! සම්මාආජීවො? ඉධ භික්ඛවෙ! අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති අයං වුච්චති භික්ඛවෙ! සම්මා ආජීවො"යි වදාරනලද්දේය. මහණෙනී! සම්‍යක් ආජීවය නම් කවරෙද? මහණෙනි! මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙමෙ කෑයුතු බුදියයුතු ද්‍රව්‍යාදීන් පිණිස පවත්වනලද කායවාක් දුශ්චරිතයන් දුරුකොට බුද්ධප්‍රශස්ථවූ පිණ්ඩචර්‍යාවෙන් දැහැමින් සෙමෙන් දිවිපවත්වාද මහණෙනි! මේ සම්‍යක්ආජීවයයි කියනු ලැබෙයි යනු එහි **වණ්ණනායෙහි** හියනලද සංක්ෂෙප අදහස වන්නේය. එහි කායවාග් දෙදෙනාගේ ගැනීමෙන් කායික වාචසික විභාගවශයෙන් මිථ්‍යාආජීවයාගේ දෙවැදරුම් බව දක්වනලද්දේය. ඒ දෙකත් කායිකමිථ්‍යාජීවය නම්:-පිළිකෙව් කරනලද වෙදකම්ආදීන්ගේ වශයෙන් තෙල්අරිෂ්ඨපිසීමිආදියයි. වාචසික මිථ්‍යාජීවය නම් ගිහීන්ගේ හසුන් පිළිගැනීම් ආරොචනය කිරීමාදියයි **සම්මාසඞ්කප්පාදිවණ්ණනායෙහි** කීහයින් දැනගනුත්තේය.

එහි පිළිකෙව්කල වෙදකම් නම් පරජනයයි කියයුතු පිළිකෙව්කල නොමනුදන්නාලද පුද්ගලයාහට කල වෙදකම්වන්නේය. ඒ එසේමැයි. "ආගතාගතස්ස පරජනස්ස භාවන්තස්ස භෙසජ්ජං න කාතබ්බං කරොනෙතා දුක්කටං ආපජ්ජති"යනුවෙන් අයැදම්න් ආආ පරජනයාහට බෙහෙත් නොකටයුත්තේය. කරතහැනැත්තේ දුක්ඛලාවකට පැමිණේයයි වදාරනලද්දේය. වෙදකම්ද **භාණිභපාරාජිකාදෙසෙහි භෙසජ්ජසංකරණවසෙනුම්මණ්ණනායෙහි** විසතරවශයෙන් කියනලද්දේය විසතරාභිලාෂින් විසින් එසින් බලා ගතයුත්තේය. මේ කියනුලබන්නේ එහි සංක්ෂෙපමාත්‍රයක් වන්නේය.

පස්සහදුම්මයෝය පණ්ඩුපලාසයාය තමාගේ වතාවත්කරුවාය මවය පියාය මවුපියන්ගේ උපස්ථායිකායාය යන දසදෙනාද, දෙටුසොහොවුරු කණිටුසොහොවුරු දෙටුසොහොවුරී කණිටු සොහොවුරී සුලුමවු මහමවු සුලුපිය මහපිය පියාගේ සොහොවුරී මවගේ සොහොවුරා යන දසනැගෝද, ආගන්තුකයාය සොරාය යුද්ධයෙන්පැරදීයාය ඉසුරුමතාය නැගන් විසින් හැර

දමනලද ගම්කයාය යන පස්දෙන ගිලන්වී විහාරයට පැමිණි යාහු නම් ඔවුහුද, යන මේ අනුදන්නාලද පස්මිසිජනයන්ට බෙහෙත් කවයුත්තේය. "දසනෑයෝය" යන මෙහි ඔවුන්ගේ දුත්පරම්පරායෙහි සත්කුලපරම්පරාව දක්වා ඔවුන්ගේ දරු මුනුබුරු ආදීහුද ඔවුන්පිළිබඳබැවින් මහණහුගේ නැයෝම වෙත්නුයි ඔවුහුද මෙහිලා සංග්‍රහකරනලදීදැයි.

සොහොවුරාගේ ඛිරින්දය සොහොවුරියගේ හිමියාය සුදුමවගේ හිමියාය සුලුපියාගේ ඛිරින්දය යනාදීහු ගිලනුහුවෙද්ද ඉදින් ඔවුහු නැයෝ වෙත් නම් ඔවුන්ටද බෙහෙත් කරන්නට වටනේය. ඉදින් නැයෝ නොවෙත් නම් නොදන්නවුන් වුව හොත් බෙහෙත යොදා, තොප පිළිදගිනා තැනට දෙවියපි කියා සොහොවුරු ආදීන්ට දියයුත්තේය, තොපගේ මවුපියන්ට දිය යුතුයයි කියා ඔවුන්ගේ දරුවන්ට හෝ නොදන්නහු වුවහොත් බෙහෙත් යොදා දියයුත්තේය. මෙසේ යථොක්තවූවන්හෙරෙන් සෙසු ජනතෙමේ 'පරජන' නම් වන්නේය. ඕහට කරනලද වෙද කම පිළිකෙව්කාළ වෙදකම නම් වන්නේය. අනුදන්නාලද්දහුට නමුදු වෙදකම්කරන්නහු විසින් මූලකී දසමදනානට ඔවුන්සතු දෙය ගෙන එසින් පමණකින්ම බෙහෙත යොදා දියයුත්තේය. එසේ නැතිකල්හි තමසතුදෙයින් නමුත් බෙහෙත් කවයුත්තේය. එසේත් නැතිකල්හි භික්ෂාචාරවසින් නමුත් සෙයා බෙහෙත් කවයුත්තේය. එසේත් නොලබන්නහු විසින් තමා පැවරු තැනකින් හෝ ඔවුන්ගේ නැයන් විසින් පැවරු තැන කින් හෝ ලැබ බෙහෙත් කවයුත්තේය. එසේත් නොලබන් නහු විසින් නොකොළවිසඳුත්නි ඇතිතැනින්ද සෙවියයුතුයි. අකතවිසඳුත්නියෙ නම් "වදහනෙන! පවවෙනා"නි කීම්යෙනි! පසින් කියනු මැනවැයි නොකොළ පැවරුම් ඇති තන්හි විඟ වීමයි අවසෙෂ නැයන්ට බෙහෙත් කරන්නහු විසින් වනාහී ඔවුන්සතුදෙයින්ම කවයුත්තේය. ඔවුන් සතුදෙයක් නැතිකල්හි සාමීනි! දුනමැනව අපට ඇතිකල දෙමැයි අයැද සිටියහොත් එසේ සාපෙක්ෂකව තාවකාලිකවශයෙන් තමසතුදයින් බෙහෙත් යොදා දියයුත්තේය. ඉදින් වනාහී දෙත්නම් හතයුතුයි අනා දෙත්නම් වොදනා නොකවයුත්තේය. නැයන්සතුදය වනාහී ඉල්වා නමුදු ගන්නට වටනේය. එහෙයින් ඔවුන්ගේ සිහුපසය ගෙන්වන්නහුටද නොකොළ පවුරුණු ඇතිතැනින් ලදදෙයින් බෙහෙත් කරන්නහුවද වෙදකම හෝ කුලසංග්‍රහය පිණිස දෙන්නහුටද, ඒ හේතුවෙන් ඒ සත්කුලපරම්පරාවෙහි වුවන්ගේ

සියුපසය ගෙන්වන්නහුට නොකොළපවුරුණු ඇතිතැනින් විනවා ගැනීමෙන් වන පවිතිය හෝ බෙහෙත් කරන්නහුට වන දුකුළාව හෝ කුලසංග්‍රහය පිණිස දෙන්නහුට වන කුලදූෂණ ඇවිත හෝ හෙවත් සඟවෙසෙස හෝ නොවන්නේමය.

ආගන්තුකාදී පස්දෙනාහට වනාහි තමසතුදෙයින් නමුදු නැවිත ලබන අපෙක්ෂාවෙන් තොරව බෙහෙත් කටයුත්තේය. ආගන්තුකයාය සොරාය ගනාදීන්ට බෙහෙත් කරන්නහු විසිනුදු "මනුෂ්‍යයෝ නම් උපකාරකාරිහුවෙතැ"යි තමහට ඔවුන් කෙරෙන් ලාභ නොපතමින් කවයුත්තේය. පසලොබින් කරන්නහුගේ වනාහි වෙදකම කුලදූෂණාදි දෝෂය වන්නේය. "මෙසේ උපකාර කළ කල සස්නෙහි ගුණ දැන පහදිත් සඟනට උපකාරකාරිහු හෝ වෙතැ"යි සලකා කිරීමෙහි වනාහි දෙෂයෙක් නැතැයි **විඤ්ඤුවිඤ්ඤූනිඤ්ඤිද** කියන ලද්දේය.

අරිෂ්ටපිසීම නම්:—'අරිෂ්ටසංඛ්‍යාත බෙහෙත් විශෙෂය'යි **සුරාපානඩිඤ්ඤාපදවණ්ණනාඅඤ්ඤි** නෙල්ලිආදීන්ගේ රසයෙන් අරිෂ්ට කෙරෙත්. හේ මද්‍යයාගේ වණ්ණය හා ගන්ධය හා රසයද ඇතිවෙයි. එසේදවුවත් මද්‍යනොවේයයි කියනලද්දේය. පිළි කෙවිකාළ වෙදකම් ආදිය නිසා යම් ප්‍රත්‍යයක් උපදීද ඒ සියල්ල අකැපමය. එහෙයින් **ප්‍රථමපවාරණාසික්ඛාපදවණ්ණනාඅඤ්ඤි** කුලදූෂකාය භවදකමය උතුරුමිනිත්දම් හැඟවීමය. ඉවසුරුපියා දියය. යන මේ කරණකොටගෙන නිපදවන ලද්ද බුදුන් විසින් පිළිකුල්කරනලද අනෙසනයෙන් උපන් අකැප බෙජ්ජතයයි කියනලද්දේය.

ගිහීන්ගේ දූතකම්යෙහි විසතර **කුලදූෂකසික්ඛාපදවණ්ණනාඅඤ්ඤි** දතයුතුයි. මෙහි මේ මතු කියනුලබන්නේ සංක්ෂෙප අදහස වන්නේය, පස්සඟදූම්ගෝය පණ්ඩුපලාසයාය තමන්ගේ වනාවත්කරුවාය මවුපියෝය යන මේ නවදෙනාගේ හසුන් පිළිගන්නවද ආරොචනය කරන්නටද වටනේය. ඔවුන්කෙරෙන් අන්‍යයන්ගේ ප්‍රියහස්තක් පමණක්ම පිළිගන්නට වටනේය. එහෙයින් මාගේ වචනයෙන් බුදුන් වඳිවයයි කියවාද යම් පිළිමයක් බොධියක් සඟතෙරතමක් වඳිවයයි කියවාද යමෙකුන්ලවා ගඳ මල්පූජාවක්කරවියයි හෝ කික්සඟත රැස්කරවී දන්දෙන්නෙමු බණඅසන්නෙමුයි හෝ කියවාද මෙබදු හසුන් කෙරෙහි කුකුස් නොහටගුත්තේය. මොවුහු වනාහි කැපසාසන වන්නාහුය,

නිහීකම්මයන්ගෙන් යුක්තවූවාහු නොවන්නාහුය. යමෙක් වනාහි අන්‍යයන්ගේ කැපහසුන් කොරෙන් අන් හසුනක් ගෙනයන්නේ නම් පියක් පියක් පාසා දුඃඛලාවට පැමිණෙන්නේය. ඔහුගේ ඒ කම්මය නිසා ලත් බොජ්ඣ බුදින්නාහටද පිඬක් පිඬක් පාසා දුකුළා වන්නේය. අඤ්ඤකුලදූසන කම්මයෙන්ද උපන් පස පස්සහ දුම්මයන්ටද නොකැපවන්නාහුය, අභූතාරොචනය රුපියසං වොහාරය යන මෙයින් උපන් පස වැනිම වෙත්යයි යියන ලද්දේය. යමෙක් වනාහි දූතකම් වෛද්‍යකම්මාදීන් කාරණ කොටගෙන උපන් පස පරිභොගකොරේද ඔහුගේ ආජීවය අපිරිසිදුවන්නේය. එහෙයින් පිරිසිදුව උපන් සියුසය පරිභොග කරන්නහු විසින් ගෙවත් ධුතඟසමාදන්නුවූ මහණහට සංඝයා කොරෙන් හෝ ගණයාකොරෙන් හෝ ධම්මදෙශනාකිරීමය බහු ශ්‍රැතබවය වත්පිරීමය ඉරියාපථසම්පත්තීය යනාදී ඔහුගේ මේ ගුණයන්හි පහන් ගිහින් කෙරෙන් හෝ උපන් පිරිසිදු ප්‍රත්‍යයද, ධුතඟසමාදන්වූ මහණහට වූඅලි පිණ්ඩවය්‍යායෙන් හෝ මිත්‍ර සුහෘදයන් කෙරෙන් හෝ පංසුකූලචීවරයන් කරණකොට හෝ උපන්නාවූද ඔහුගේ ධුතගුණයන්හි පහන්වූවන් කොරෙන් ඒ ඒ ධුතගුණය නියම පිළිවෙතට අනුලොම් වශයෙන් හෙවත් අවිරුඬ වශයෙන් උපන්නාවූද, යන ඉතා පිරිසුදු ප්‍රත්‍යයද යන මේ පිරිසිදුව උපන් ප්‍රත්‍යයයන් පරිභොග කරන් මහණ විසින් පිළි කෙව් කළ අසුරු වෙදකම් දූතකම් ආදී හෙතුවෙන් උපන් අපිරිසිදු ප්‍රත්‍යයෝ විෂඝොරසපීඨයන් මෙන් දුරකටයුත්තාහුය යන මේ නය විසුඬිමාගීයෙහි හා එව විකාරෙහි නියනලද්දේය.

ආජීවපාරිසුඬිශීලය වනාහි එක්විසි අනේසනයන් හෙවත් යට කියනලද වෛද්‍යකම්මාදීන්ගේ වශයෙන්ද කුහනාදීන්ගේ වශයෙන්ද අසුතුලෙස සියුපසය. සෙවීම දුරුකොට හෙවත් නොකොඹ දැහැමින් සෙමින් සියුපසය උපදවන්නහුගේ ප්‍රත්‍යය සෙවීමෙහි විය්‍යය කරණකොටගෙන සුඩිවන හෙයින් 'පරිසඬි සුඬිය'යි අර්ථකථාචාරීන් විසින් කියන ලද්දේය.

එහෙයින් ආජීවය පිරිසිදු කරන්නාවූ මහණ විසින් නොවළඳ, නමුත් අසුතුවූ සෙවීම් පිණිස සිතකුදු නොම ඉපදවිය යුත්තේය. කායවාග්විප්පඤ්ඤත්තියෝ නොම ඉපදවිය යුතුය යනු කුමට කියන මෝද,

විරගුඬ නම් සථානයෙහි වාසය කළාවූ මහාතිස්සත්‍ථවිරයන් වහන්සේ මෙනී උන්වහන්සේ වනාහි දුර්භික්ෂකාලයෙහි මාගී යෙහි යන්නේ බත වැළකීමෙන්ද මාගීකලානතායෙන්ද කලානතවූ

ශරීරඇත්තේ එහෙයින්ම දුර්ලභවූයේ එක්තරා පලගත් අඹ රුක්මුල හොත්තේය, බොහෝ අඹඵලද තැනින්තැන වැටී තිබුනාහ, ඉක්බිති එක්තරා මහලු උපාසකයෙක් හෙරුන් දැක විඩාපත්බව දැන අඹපැන් පොවා තමන් පිටෙහි නංවා වාසය කරණ තැනට පමුණුවයි එකල සථවිරයන් වහන්සේ

"න තෙ පිතා න තෙ මාතා න ඤාති න 'පි බන්ධවො,
කරොති තාදිසං කිච්චං සීලවන්තාසස කාරණා.

යනුවෙන් එම්බල මහණ! මේතාගේ පියාත් නොවෙයි තාගේ මවුත් නොවෙයි තාගේ සහලේතැයෙකුත් නොවෙයි අනික් නැයෙකුත් නොවෙයි එසේත් නැතිකලත් මෙබන්දක් කෙරෙයි මීට කරුණු කිමයත් සිල්වද්හාවය කරණකොට වන්නේයයි කියා තමහට අවවාද කොට විදසුන් වඩා ඔහුගේ පිටදීම රහත් බවට පැමිණියේය.

ආජීවය පිරිසිදුකරන්නහු විසින් සුන්බත්වී නමුත් අසුතුවූ අන්වෙසනය පිණිස සිතීමවත් නොම ඉපදවූ බවට නිදසුන් වශ යෙන් ගෙනහැරදක්වනලද **විසුද්ධිමාගීඩීකායෙහි අඹඛාදකමහා නිසසථවිරවසතුව** මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

ආජීවපාරිසුද්ධිය නිමියේය.

ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය වනාහි පස්විකිමෙන් සුඛවන හෙයින් 'පච්චවෙක්ඛණසුඛිය'යි අර්ථකථාචාරීන් විසින් කියනලද්දේය. එබැවින් නොපස්විකා වැළදීමෙහි දෙස් දක්නහු විසින් ප්‍රත්‍යයයෝ ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තාහ. පෙර වනාහි මහණහු බොහෝසෙයින් නොපස්විකා පසවළඳ නිරයෙනුදු තිරිසන් යෝනියෙනුදු නොමිදුනාහ, ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දිවසින් දැක භික්ෂූන් වහන්සේට අනේකප්‍රකාරයෙන් නොපස්විකා වැළදීමෙහි ආදීනව දක්වා වදාරා බණවදාරණ සේක් "මහණෙනි! මේ ප්‍රියශීලීභික්ෂූන් විසින් සියුපසය ලදින් නොපස්විකා වැළදීම නොකටයුතුවන්නේය, එසේ හෙයින් මෙතැන් පටන් ගෙන මහණෙනි! තොපි පස්විකා වළඳව්ය"යි පස්විකන විධිය දක්වනසේක් "මහණෙනි! මාගේ ශාසනයෙහි යම් භික්ෂුවක් තෙමේ 'පටිසංඛායොනිසො චීවරං පටිසෙවාමි" යනාදීන් ඒ ඒ ප්‍රත්‍යයට සුදුසු පරිදි දෙන් ප්‍රත්‍යවෙක්ෂා පාලිය වදාරා "මහණෙනි! මේ නොපස්විකා වැළදීම නම් උග්‍රවිෂයක් අනුභවකිරීමක් හා සමානවන්නේය විෂඅනුභවකිරීමෙහි

ආදීනව නොදන්නාවූ පැරණියෝවනාහි ප්‍රත්‍යවෙක්ෂා නොකොට අනුභවකිරීමෙහි දෙස් නොදුන විෂඅනුභව කොට මහත් දුකට පැමිණියාහ”යි වදාරා ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු නෙතෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද පාරමිතාඇති අපමහබෝසතාණෝ එක්තරා මහාසම්පත්ඇති කුලයෙක ඉපිද වැඩිවිය පැමිණ දූකෙළියෙහි ලොල්වූ අක්ෂද්‍යූතියෙක්ව වසන්නාහුය, එසමයෙහි වංචාවෙන් දූ කෙළ අනුන් පරදවන්නාවූ තවද අක්ෂද්‍යූතියෙක් වීය, එකල්හි සොරවූ අක්ෂද්‍යූතියා බෝධිසත්වයන් හා සමග දූ කෙළනේ තමහට ජය පවත්නාකල්හි කෙළිමඩුල්ල නොබිඳිසි පරාජයකල්හි වනාහි පසඇට මුවැ ලා පසඇට අපවත්වියයි කියා කෙළිමඩුලල බිඳපියා පලායන්නේය, බෝසතාණන් වහන්සේ ඔහුගේ ඒ කාරණය දැන යහපත රිට සුදුස්සක් මම කෙරෙමැයි සිතා පසඇට ගෙන තමනිවසට ගොස් විෂයෙන් පසඇට දෙතුන්විටක් රඳාගෙන නැවත නැවත වියලා ඒ ගෙන ඔහුවෙත ගොස් ක්‍රීඩා කෙරෙයි එසේ ක්‍රීඩාකරනකල සොරවූ අක්ෂද්‍යූතියා පැරදියෙන් එක් පසඇටක් මුවැ ලා විෂවේගයෙන් මූර්ඡාවූයේ නෙත් පෙරළී කඳනැමී හින, මහබෝසතාණන් වහන්සේ ඔහට දිවිදෙනු කැමැත්තේ ඖෂධයෙන් පරිභාවිතා කරනලද ලඝුවිරෙචන බෙහෙතක් දී වමනය කරවා ගිතෙල් මී සකුරු ආදීවූ සීනි සහ බොජුනක් අනුභවකරවා ඔහු නිරොගී කොට මතු මෙබන්දක් නොකරවයි අවවාදකොට යවා දිවි පමණින් දුනාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොවැ ගියාහ.

ප්‍රත්‍යවෙක්ෂා නොකොට වැළදීමෙහි දෙස් දක්වනු පිණිස ගෙනහැරපානලද **එකනිපාතයෙහි දසමවග්ගයෙහි ලිතත ජාතකවණ්ණනායෙහි** අපච්චවෙක්ඛණ පරිභොගවසතුව සැකැවින් දක්වා නිමවනලද්දේය.

තවද බොහෝසෙසින් භික්ෂූහු ‘ගිහිකල්හිත් පැවිදිකල්හිත් මොවුහු අපට දියසුත්තෝමය’යි කියා මවුපිය සොහොවුරු සොහොවුරී ආදී ඤාතීන් විසින් දෙනලද සිවුපසය කෙරෙහි විශ්වාසබවට පැමිණියාහු නොපස්විකා පරිභොග කරන්නාහුය. ශාස්තෘවූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ ඒ කාරණය දිවසින්

දූතවදුරා මහණෙනි! මහණහු විසින් නම් තැගන් විසින් දෙනලද ප්‍රත්‍යයයෝ නමුදු පස්විකාම වැළඳිය යුත්තාහ, නොපස්විකා වළඳන්නෝ වනාහි මියගොස් යක්ෂප්‍රෙතආත්මභාවවලින් ළොම් දෙන්නාහ මේ නොපස්විකා වැළඳීම නම් විෂවැළඳීමක් හා සමානවන්නේය විෂය වනාහි විශ්වාසයා විසින් දෙනලද නමුත් අවිශ්වාසයා විසින් දෙනලද නමුත් වැළඳූතැනැත්තේ මැරේමය.

පෙරකලද එක්තරා සිංහයෙක් විශ්වාසයෙකු විසින් දෙනලද විෂ අනුභව කොට මරණයට පැමිණියේයයි වදුරා භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

ගේ සොසේද යත්,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුරුකොනෙ ඇති සිටුකුලෙහැ උපන්නාහ එහි මහබෝසතාණන්ගේ එක්තරා ගොපොල්ලෙක් වෙලෑ ගොයම් කොට වැට බැඳි සමයෙක්හි ගෙරිත් හැරගෙන ගොසින් වලට වැද එහි ගාලක් ගසා ගෙරි රකිමින් ඒ වලවසන්නේය. සිටාණන්ට සාලින්කල තෙල්දීකිරිද ගෙනැවිත් දෙන්නේය එකල්හි සිංහයෙක් තෙමෙ ගෙරිසිටිනා ගාලට නුදුරුතැනෙහැ වාසය කෙළේය සිංහයාහට බියෙන් තැවුනාවූ දෙනුන්ගේ කිරි මඳ විය. මෙසේ කල්යන අතර එක් දිනක තෙල්දීකිරි ඇරගෙන සිටාණන් දකින්නට ගොපල්ලා ආකල ගෙනා තෙල්ආදිය ඉතා මඳබැව් දැක මීට හෙතු කිම්දැයි විවාළේය. එකල්හි ගොපල්තෙමෙ කිරි මඳවූ කාරණය සිටාණන්ට කියාලින. සබඳ ගොපල්ල! සිංහයා සමඟ සහිකව වසන අන්සත්වයෙක් ඇද්දැයි විවාළහ. සවාමීනි සිටාණන්වහන්ස! එක්තරා මිහිවින්නක් සිංහයා හා සංවාසය කොට වෙසේසයි කීයේය. කොල! ඒ මිහිවින්නා තා විසින් අල්වාගන්නට හැක්කීදැයි කීයේය. සවාමිනි! මිහිවින්නා විවරක් අල්වාගැනීම පිළිවනැයි කීයේය. එසේවිනම් තා ඒ මිහිවින්නා අල්වාගෙන කලළපටන් ගෙන මුළුසිරුර ලොම්හි විෂ ගල්වා නැවත කිහිපවාරයකැ විෂ ඇහ ගා වියලා දෙතුන්දවසක් ඉකුත් කොට ඒ මිහිවින්නා ඇල්වූ තැනටම හැරපියවයි විධානකෙළේය. එකල්හි සිංහයා මිහිවින්නාකෙරෙහි සෙනහයෙන් සිරුර දිවෙන් ලෙව ජීවිතක්ෂයට පැමිණෙන්නේය. එසේ සිංහයා මලකල්හි ඔහුගේ සමඳ නියපදුරුද දළඳ සිංහතෙල්ද හැරගෙන අපළඟට එවයි කියා

විධාන කොට ගොපල්ලා යැවූහ. එසේ යන්නාවූ ගොපල්ලා ඊට නිසි විෂයකුත් සිවාණන්ට කියා හැරගෙන ගොස් මිහිවින්නා වසන තැන ගොපලු දැලක් බැඳ උපායෙන් ඒ මිහිවින්නා අල්වාගෙන සිවාණන් කි නයින් විෂය මිහිවින්නා ඇඟ ගල්වා හැරියේය. සිංහතෙමේ මිහිවින්නා දැඩ ඉතා සෙනහයෙන් ඇය ගේ සිරුර දිවින් ලෙව තෙමේ ජීවිතක්ෂයට පැමිණියේය.

නොපස්වික්කා වැළඳීමෙහි දෙස් දක්වනුවස් දැක්වූ **එකනි පාතසෙඛි දසමනවගෑ වියවාසනොජන ජානකස** මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

රූපියසික්ඛාපදවණ්ණනාදින්හි සිල්වතාගේ නොපස්වික්කා පරිභොගකිරීම ඉණපරිභොගනමැයි කියනලද්දේය. එසේම නයගැනියා සියකැමැත්තෙන් කැමතිතැනකට යන්නට නොලබාද එපරිදෙන් ඉණපරිභොගයෙන් යුකතාවූයේ ලොකයෙන් හෙවත් භවයෙන් බැහැරයන්නට නොලබායයි **එහි සීකාදින්හි** කියනලද්දේය. එහෙයින් යට කියනලද දෙස් දක්නහුවිසින් චතුර්විධප්‍රත්‍යයයෝ ප්‍රත්‍යවෙක්ෂාකටයුත්තාහුමය.

පස්වික්කන්නහු විසින්ද ප්‍රතිලාභකාලය පරිභොගකාලය පරිභොගයෙන් පසුකාලය යන කාලත්‍රයෙහිම පස්වික්කියයුත්තේය. ඔවුනතුරෙන් ප්‍රතිලාභකාලයෙහි "යථාපචචයං පවත්තා මානං ධාතුමත්තමෙවෙතං යදිදං චීවරං" යම්බදු මේ සිවුරක් වේද මෙය හෙතුවශයෙන් පවත්නාවූ ධාතුමාත්‍රයෙක්මය හේ මහාභූතපමණෙක්මය" යනාදින් ධාතුවශයෙන් හෝ "සබබානි පන ඉමානි චීවරානි අජිගුචඡනීයානි ඉමං පූතිකායං පතවා අතිවිය ජිගුචඡනීයානි ජායනති" යහපත්වූ ප්‍රණීතවූ නොපිළිකුල්කටයුතුවූ මේ සියලුම සිවුරු දෙනිස්කුණපයෙන් පිරී නිබෙන්නාවූ මේ කුණුකයට පැමිණ අතිශයින් පිළිකුල්කටයුත්තෝ වන්නාහුය" යනාදීන් පිළිකුල්වශයෙන් හෝ එක්වරක් නමුදු පස්වික්කිය යුත්තේය, මෙසේ පස්වික්කා නබනලද ප්‍රත්‍යයන් ගේද පිළිලදකාලයෙන් මතු පරිභොගය නිරවද්‍යමය ඉටාතැබූ පමණක්මවූ චීවරයන්ගේ පරිභොගය වැනිය. මෙය පස්වික්කීමෙන් පළමු සුඛය දැක්වීම පරමකොට ඇත්තේය. පරිභොගකාලයෙහි ප්‍රත්‍යවෙක්ෂාවගේ ප්‍රතික්ෂෙපකිරීම පරමකොට ඇත්තේ නොවෙයි. එහෙයින් පරිභොගකාලයෙහි නැවත පස්වික්කිය යුත්තේය. එහි වනාහි "පවිසංඛායොනිසෝ චීවරං පටිසෙවාමි" යනාදියෙන් එකණෙහි පස්වික්කීමෙන් පරිභොගය හා

සමකොට හෙවත් පරිභොගය හා සමකල් ඇතිකොට පස්විකිය යුත්තේය. එහෙයින් **අභිධම්මටීකාවන්හි** 'සිවුර පරිභොගයක් පරිභොගයක් හෙවත් හඳුනා පොරවනා වාරයක් වාරයක් පාසාද පිණ්ඩපාතය පිඬක් පිඬක් පාසාද, සෙනසුන පරිභොගයක් පරිභොගයක් පාසාද, පස්විකිය යුත්තේය'යි කියනලද්දේය. **විසුද්ධිමග්ගමහාටීකායෙහි** 'සිවුර කයින් උනා පරිභොගයක් පරිභොගයක් හෙවත් හඳුනා පොරවනා වාරයක් පාසාද, සෙනසුන පරිභොගකරන හෙවත් සෙනසුනට පිවිසෙන වාරයක් පාසාද, පස්විකිය යුත්තේය'යිද කියනලද්දේය.

රූපියඝණ්ඨාපදවිමතිවිනොදනියෙහි වනාහි "පරිභොගෙ" යනු නම් 'ඝයින් මුදු දමන හඳුනා පොරොවනා වාරයක් පාසාද, පියයිඅගින් දිගවැටෙන තැනපටන් ඇතුළට පිවිසීමෙහිද, නිසීදනසයනයන්හිද, පස්විකිය යුත්තේය'යි කියනලද්දේය.

ඉදින් යම් හේකින් පරිභොගකාලයෙහි පස්විකන්නට නොහැකි වීනම් පරිභොගයෙන් පසුකාලයෙහි "මයාපපච්චවෙකඛිත්වා අජ්ජ යං චීවරං පරිභුත්තං"යනාදියෙන් පස්විකිමෙන් එක්වරක්වත් පස්විකිය යුත්තේය. එහෙයින් **විසුද්ධිමග්ගටීකායෙහි** එසේ පරිභොගකාලයෙහි පස්විකන්නට නොහැකිවූවහු විසින් යට කියනලද කාලවිශෙෂයෙහි හෙවත් පරිභොගකාලයෙන් මතු පෙරබත්කාලය පසුබත්කාලය රෑය තුන්යම්කාලය යන මේ කාලවිශෙෂයෙහි සිවුවරක් තෙවරක් දෙවරක් යටත් පිරිසෙසින් වරක්වත් පස්විකිය යුත්තේය. මෙම නයම සෙසු පසෙහිත් යෙදෙන්නේය.

බෙහෙත වනාහි පිළිලදකාලයෙහි පස්විකා හෝ නොවිකා හෝ පරිභොගකාලයෙහි පස්විකිය යුත්තේමය. එහෙයින් **අභිධම්මටීකාවන්හි** බෙහෙත පිළිගන්නා කාලයෙහිද පරිභොගකාලයෙහිද පස්විකාම පිළිගතයුතුය පස්විකාම් වැළඳියයුතුය. මෙසේ ඇත්තෙහිදු පිළිගන්නාකල පස්විකුම් සිහිනොකොට වළඳනා කලත් පස්විකුම් සිහි නොකරන්නාහටම ඇවැත් වෙයි. පිළිගන්නාකල පස්විකුම් සිහි නොකොට නමුත් වළඳනාකල පස්විකා වළඳන්නාහට ඇවැත් නොවන්නේයයි කියනලද්දේය.

ඒ එසේමැයි. ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය ප්‍රත්‍යවෙක්ෂාවෙන් පිරිසිදු වෙයි ප්‍රත්‍යයසවභාවය සැලකීම් පමණකින් පිරිසිදු නොවෙයි යනු **විමතිවිනොදනියෙහි** කියනලද්දේය.

ප්‍රත්‍යය සැලකීම් මාත්‍රයෙන් සීලයතමා පිරිසිදු නොවන බැවින් පරිභොග නොකරන කල්හිදීම ඇවැත් වෙයි කියන්නේදී. මෙසින් පාමොක්සංවරශීලයාගේ භෙදය දක්වන ලද්දේය, ප්‍රත්‍යයසන්නිඃශ්‍රිතශීලයාගේ භෙදය දක්වනලද්දේ නොවෙයි, කුමක් හෙයින්දයත්, එයතමා අතීත පස්විකුම් පස් විකිමෙන් පිරිසිදුවනහෙයිනි. මෙහි වනාහි සෙසුප්‍රත්‍යයන්හිද ඉණපරිභොගාදිය කියනහෙයින් ප්‍රත්‍යයසන්නිඃශ්‍රිතශීලයාගේම භෙදය දක්වනලද්දේවෙයි. මෙසේ මොවුන්ගේ නානත්වය දත යුතුයයි කියනලද්දේය.....මෙ වනාහි මෙහි නියමයයි.....

බෙහෙතවිෂයෙහි වූකලි එසොළොහි ප්‍රත්‍යවෙක්ෂාව දෙවැ දැරුම්වූම සීලය භෙදවශයෙන් රක්නේය. අතීතපස්විකුම වනාහි ප්‍රත්‍යයසන්නිඃශ්‍රිතශීලයම රක්නේය. එසේම සෙසු ප්‍රත්‍යයසන් විෂයෙහි දෙවැදැරුම්වූ පස්විකුම ප්‍රත්‍යයසන්නිඃශ්‍රිතශීලය රක්නේය. එහෙයින් ඉදින් සිවුපසයෙහි එසොළොහි කටයුතු පස්විකුම කරනලද්දේවී නම් අතීතපස්විකුම නොකරන්නටත් වටනේද ඉදින් වනාහි කරනලද්දේ නමුත් අනික් ශීලයාගේ විසුද්ධිය පිණිස කටයුතුමය. බෙහෙතෙහි එසොළොහි කටයුතු ප්‍රත්‍යවෙක්ෂණය නොකිරීම් හෙයුවෙන් බිඳුනාවූද පාමොක්සං වරශීලය දෙසීමෙන් පිරිසිදුවෙයි ඉදින් සිවුපසයෙහි කිසිම පස්විකීමක් නොකොට අරුණ නංවාද එසේ කීනසින් ශීලය බිඳුනේ වීනම් ඉණපරිභොගස්ථානයෙහි සිටිනේමය.....

ප්‍රත්‍යයසන්නිඃශ්‍රිතශීලය පුරන්නහුවිසින් වනාහි භාගිනෙය්‍ය සංඝරක්ඛිත නම් හෙරණහුමෙන් වියයුත්තේය. ඒ හෙරණ පාණන් වහන්සේ වනාහි මනාසොට පස්විකා පසය පරිභොග කෙළේය, මැතහාගයෙහි එම්හෙතුවෙන්ම රහත්ඵලයට පැමිණ

"උපජ්ඣායො මං කුජ්මානං සාලිකුරං සුනිබ්බුතං,
මාහෙවං භිං සාමණෙර! ජීවහං ඛ්‍යාපෙසි අසඤ්ඤතා.

උපජ්ඣායස්ස වචො සුත්වා සංවෙගමලභිං තදා,
එකාසනෙ නිසීදිත්වා අරහත්තං මපාපුණිං.

සොහං පරිපුණ්ණසංකප්පො වනෙ, පණ්ණරසො යථා,
සබ්බාසවපරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

නයිමා අඤ්ඤාපි දුක්ඛස්ස පඤ්ඤත්තා පරික්ඛයං,
යොනිසො පච්චවෙක්ඛිත්වා පටිසෙවථ පච්චයෙ"ති.

මේ ගාථාවලින් මාගේ උපාඛ්‍යාඝවූ සප්වීරයන් වහන්සේ ඉතා සිහිල්වූ හැල්බත වළඳන්නාවූ මට එඹා සාමණේරය! තෝ අසංයතාචාරීව නොනොත් නොපස් විකාවළඳ දිව නොදව වසි කිසේක. උපාඛ්‍යායසප්වීරයන් වහන්සේගේ ඒ තෙපුල් අසා මම එතෙණෙහිම සංවෙගයට පැමිණියෙමි එව අස්නෙහිම හිඳ ගියලු තොලෙසුන් නසා රහත්ඵලයටද පැමිණියෙමි ඒ රහත්වූ මම පුණු පොහෝදවස සොළොස්කලාවෙන් පරිපූණිණ චන්ද මණ්ඩලය මෙන් පරිපූණිණවූචිත්තසංඛල්ප ඇත්තෙක්ද වීම් සාමාදී සියලු ආශ්‍රවයන් හාත්පසින්ම අවසන්කෙළෙමි එහෙයින් මාගේ නැවත භවයෙහි ඉපදීමෙක්ද නැත්තේය එහෙයින් මා මෙන් අනිකෙකුදු දුක්අවසන් කිරිමෙන් ලැබියයුතුවූ නිබ්බාණධම්මය පතන්නේවී නම් හෙතෙමේද නුවණින් පස්විකා විවරාදී සිසුපසය සේවනය කරන්නේයයි කියේය.

මේ මෙසේ සීලයාගේ පරිසුද්ධඅඞ්කුර ඇති භාවය වතුපාරිසුද්ධිසීලසංඛ්‍යාතවූ අනගාරියවිනයසුශික්ෂිත නම් වන්නේය. එහි සුශික්ෂිතවූවහුට ඒ ශීලයාගේ පරිශුද්ධඞ්කුරතාතොමෝ පබ්භාර වාසි ඨස්සසප්වීරයන් වනන්සේට මෙන් අග්‍රඵලසංඛ්‍යාත අභිඥාද ඵලවීමෙහි සමර්ථවන්නීය. ඒ සප්වීරයන්වහන්සේගේ කථා වස්තුව ධම්මපදාඨකථාවෙහි බ්‍රාහ්මණවග්ගයෙහි "අසංසඨංගහඨෙඛ්" යනාදී ගාථාවණ්ණනාවෙන් දතයුත්තේය.

අනගාරිය විනය කථා නිමි.

අගාරිය විනය නම්:-දසඅකුසලකම්පථයෙන් වෙන්වීමයි. ඒ අගාරියවිනය තෙමේ එහි නොඇලිවි බවට පැමිණීමෙන්ද ආචාර ගුණව්‍යවසථා කිරීමෙන්ද මනාකොට ඉගෙනගන්නාලද්දේ හෙවත් පුරුදුකරනලද්දේ උභයලොකහිතසුව ඵලවන හෙයින් මඞ්ගල නම් වන්නේය. එහි ප්‍රාණඝාතය අදත්තාදානය කාම මිත්‍යාචාරය මුසාවාදය පිසුනුවචනය ඵරුසවචනය සම්ඵප්පලාපය අභිද්‍යාය ව්‍යාපාදය මිත්‍යාදෘෂ්ටිය යන මොහු දසඅකුසලකම් පථයෝ නම් වෙත්. ඔවුනතුරෙන් ප්‍රාණඝාතය තිරච්ඡානගතජීතාවණ්ණනාවෙහිවිශෙෂවශයෙන් වණ්ණනා කරණලද්දේය අදින්නාදානය දුතිය පාරාජිකවණ්ණනාවෙහිද මිත්‍යාචාරය

සඤ්චිත්ත සිකඛාපදවණ්ණනායෙහි හා පාචිත්තියසික්ඛාපදසික්ඛා
සූත්‍රවණ්ණනායෙහිද ආදියෙහිවූ සහ බ්‍රහ්මජාලසූත්‍රවණ්ණ
නායෙහිද අත්තයෙහි වූ තුන සාමඤ්ඤඵලසූත්‍රවණ්ණනායෙහි
හා මූලපණ්ණාසඨකථායෙහි සාලෙය්‍යකසූත්‍රවණ්ණනායෙහිද
දසයම එහිම සම්මාදිට්ඨිසූත්‍රවණ්ණනායෙහිද අට්ඨසාලිනියෙහිද
වණ්ණනාකරණලද්දේය. එහෙයින් ඒ ඒ වණ්ණනාවන්හි කි
නය ගෙන කම්මපථකථා තොමෝ කියනුලැබේ.

ඔවුනතුරෙන් ව්‍යවහාරවශයෙන් සත්‍වයාය පරමත්‍ථවශ
යෙන් ජීවිතෙන්ද්‍රියයයි කියනලද ප්‍රාණියෙකුගෙරෙහි ප්‍රාණියාය
යන සඤ්ඤාව ඇත්තහුගේ රූපාරූපජීවිතෙන්ද්‍රිය විඝාතනය
හෙවත් සිදීම් කරන උපක්‍රමය උපදවන්නාවූ කායවාක්වාර
යන් අතුරෙන් එක්තරා එකෙක්හි පැවැත්නාවූ 'වධකචෙතනා
තොමෝ' පාණාතිපාත නම් වන්නේය. ඒ ප්‍රාණඝාතතෙමේ
ගුණවිරහිත තිරිසන්ගතාදී ප්‍රාණීන්අතුරෙන් කුඩා ප්‍රාණියා
කෙරෙහි පැවැත්තේ අල්පසාවද්‍යවෙයි මහාශරීරඇත්තහු කෙ
රෙහි මහාසාවද්‍යවෙයි කුමක්හෙයින්ද යත්, ප්‍රයොගමහත්
බැවිනි. ප්‍රයොගය සම්භාරයෙහිත් වත්‍ථුමහත් බැවින් මහාසාවද්‍ය
වෙයි ගුණවත් මනුෂ්‍යාදීන් අතුරෙන් මදගුණඇත්තහු කෙ
රෙහි පැවැත්තේ අල්පසාවද්‍යවෙයි මහාගුණ ඇත්තහු කෙරෙහි
මහාසාවද්‍යවෙයි ශරීරය ගුණය යන දෙදෙනාගේ සමත්‍වය
ඇතිකල්හි වනාහි කෙලෙසුන්ගේ හා උපක්‍රමයන්ගේත් මෘදු
භාවයෙන් අල්පසාවද්‍යවෙයි තීව්‍රභාවයෙන් මහාසාවද්‍යවෙයයි
දතයුත්තේය.

බ්‍රහ්මජාලවර්ණනායෙහි ප්‍රයොගය වත්‍ථුවය යන මොවුන්ගේ
මහත්භාවාදිය නිසා මහාසාවද්‍යබව වෙයි ඒ ප්‍රත්‍යයයන් කාරණ
කොටගෙන උපදිනුලබන චෙතනාවගේ බලවත් භාවයෙනැයි
දතයුත්තේය. අදහස්කළ පරිදි ප්‍රයෝගයාගේ වනාහි නිපද
වීම් වශයෙන් ආයාසසිඛවූ බොහෝවර පැවති ජවනයන්
විසින් ලබනලද ආසෙවනය ඇති නිශ්චය කාරවන චෙතනාවගේ
වශයෙන් ප්‍රයෝගයාගේ මහත්බව වෙයි. කිසිකලෙක්හි කුඩා
වූද මහත්වූද ප්‍රාණියා කෙරෙහි ප්‍රයොගයාගේ සම්භාවය ඇති
කල්හිත් මහත්ප්‍රාණියා පිණිස චෙතනා තොමෝ ඉතා තීව්‍රවූවා
උපදින්නීමය, හෙතුකිම යත්? වත්‍ථුන්ගේ මහත්බවයි. මෙසේ
මේ දෙකම චෙතනාවගේ බලවත් භාවයෙන්ම වෙයි එසේම
නැසිය යුත්තහුගේ මහාගුණවත්භාවය ඇතිකල්හි එහි උපකාර
චෙතනාවමෙන්ම ක්ෂෙත්‍රවිශේෂයාගේ නිඝපත්තියෙන් අනුපකාර

චෙතනාවද අතිශයින් තීව්‍රතරවූවාම උපදින්නීමනුසි ඒ චෙතනා වගේ මහාසාවද්‍යභාවය දතයුත්තය. එහෙයින් ප්‍රයොගවසතු ආදී ප්‍රත්‍යයයන්ගේ නොමහත්බැවිනිත් මහාගුණවත් බවත් ප්‍රත්‍යයයන්ට වඩා චෙතනාවගේ බලවත්භාවාදීන්ගේ වශයෙන්ම මහාසාවද්‍යභාවයත් මේයයි දතයුතුයයි කියනලද්දේය.

ප්‍රයොගය වසතුවය යන මොවුන්ගේ මහත්භාවාදියටත් වඩා චෙතනාවගේ බලවත් භාවය මහාසාවද්‍යභාවයට හෙතුවන්නේය. මෙසේ මේ දෙකම චෙතනාවගේ බලවත්භාවයෙන්ම වන්නේය.යටකියනලද හෙතුනිපයත්‍රීාසයෙහිද ඒ ඒ අකුසලය ප්‍රත්‍යයන්ට වඩා චෙතනාවගේ බලවත්භාවයෙන්ම මහාසාවද්‍ය වනබැවි දතයුත්තේය.ප්‍රයොග හා වසතුආදීන්ගේ නොමහත් බැවිනිද නැයියයුත්තහුගේ ගුණවත් බැවින් මහාසාවද්‍යවෙයි ඔවුන්ගේ මහත්බැවිනිත් නැයියයුත්තහුගේ නුගුණවත් බැවින් අල්පසාවද්‍ය බවද වසතුවගේ මහත් නොමහත් බැවිනි මෙන් දතයුත්තේය. හොලෙසුන්ගේ හා උපක්‍රමයන්ගේද යන දෙදෙනාගේ මෘදුභාවයෙන්ද අල්පසාවද්‍යමහාසාවද්‍ය භාවය යෙදිය යුත්තේය යනු **සම්මාදිට්ඨිසූත්‍රටීකානය** වන්නේය.

ඒ ප්‍රාණඝාතයාගේ සම්භාරපසෙක් වේ. සත්වයාය, සත්ව යෙහා යන සඤ්ඤ ඇතිබවය, වධකචෙතනාවය, උපක්‍රමය, එයින් මරණය, යනු බ්‍රහජ්ජාලයෙහි දක්නාලද්දේය. ප්‍රාණියෙහා යන සඤ්ඤව ඇතිබවද වධකචෙතනාවෝද යනමොහු පූර්භාගය හජ්නය කරන්නාහු වෙති. උපක්‍රමය වධකචෙතනාව විසින් උපදවනලද්දේය. පංචසම්භාරයෝය යනු ප්‍රාණඝාතචෙතනාවයසිද ඔවුහු පංචසම්භාරයන්කෙරෙන් අවිනිර්මුක්තයහයි දතයුත්තා හයිද කියනලද්දීය.

අන්‍යවූ බුද්ධිමියන් විසින් පරිගෘහිතවූ බැහැර නොදමා නලද්දාවූ රක්ෂාගොපනය කරනලද්දාවූ තමන්ගේ මනසින් හෝ වචනයෙන් නොදෙනලද්දාවූ දෙය කෙරෙහි එබදුවූම බව දන්නහුගේ එය ගන්නා උපක්‍රමය උපදවන සාඝවාග්චාරයන්හි පැවැත්තාවූ සොරසිත 'අදින්නාදාන' නම් වේ.එය අන්සතු හීනවසතුවක් කෙරෙහි පැවැත්තේ අල්පසාවද්‍යවෙයි. අන්සතු ප්‍රණීතවසතුවක් කෙරෙහි පැවැත්තේ මහාසාවද්‍යයි. කුමක් හෙයින්දයත් වසතුමහත්වය හෙයින් වසතුසම්පත්වය ඇතිකල ගුණාධිකයන්සතු වසතුවකෙරෙහි මහාසාවද්‍යයි ඒ ඒ ගුණාඛ්‍යාය පටන් කොට ඉන් ඉන් හීනගුණ ඇත්තහුසතු වසතුව කෙරෙහි

අල්පසාවද්‍යයි. තවද අන්සතු කුඩාවැතුව කොරෙහි අල්පසාවද්‍යයි අන්සතු මහාවැතුව කෙරෙහි මහාසාවද්‍යයි. කුමක්හෙයින්ද යත් ප්‍රයොගය මහත් බැවිනි. වැතුවය ගුණය යන මොවුන්ගේ සමවය ඇතිකල්හි කෙලෙසුන්ගේ හා උපක්‍රමයන්ගේද මෘදුභාවයෙන් අල්පසාවද්‍යයි. ඔවුන්ගේ තීව්‍රභාවයෙන් මහාසාවද්‍යයි ඒ අදින්නාදානයාගේ සමහාර පසෙක් වේ. ඔවුහු කාවරහුද යත්-අනිකෙකු විසින් පරිගෘහිතබවය, අනිකෙකු විසින් පරිගෘහිතබව දන්නා බවය, සොරසිතය, උපක්‍රමය, එයින් හැරගැන්මය, යන මේයි යනු **සම්මාදිඨිසූත්‍රවණ්ණනාදීනය** වන්නේය.

සදාරසන්තොසපරදාරගමන වශයෙන් දෙවැදෑරුම්වූ කාමමිථ්‍යාචාරය යුතු හෙයින් කාමනම්වූ මෙවුන්දම් සෙවනයන් අතුරෙන් නොහොත් මෙවුන්දම් සෙවනයට වස්තුවූ දෙවැදෑරුම් සත්වයන් අතුරෙන් එක්තරා එකක්කෙරෙහි පැවැත්තාවූ එකාන්තනින්දිතවූ එහෙයින්ම ලාමකවූ ආචාරය, ලක්ඛණවශයෙන් වනාහි මෙවුන්දම් සෙවනාභිලාෂයෙන් කායචාරයෙහි පැවත්තාවූ අගම්‍ය ස්ථානයයි හෙවත් නොයායුතු තැනයයි කියනලද, පුරුෂයන්ට වූකලි පුත්‍රදාරසංග්‍රහයෙහි මතුපළවන්නාවූ මාතුරක්ඛිතාදී විංසති ස්ත්‍රීහුය සත්‍රීන්ට වූකලි සාරක්ඛා සපරිදණ්ඩා යන දෙදෙනා හා ධනක්කීතාදී දසදෙනද යන දෙලොස් ස්ත්‍රීහුය යන මොවුන් ඉක්මවන චෙතනා තොමෝ 'කාමේසුමිච්ඡාචාර' නමැයි **සංගීතිසූත්‍රවණ්ණනා** හා **නව්විනීතාදියෙහි** සම්පිණ්ඩිත වන්නේය. එහෙයින් **සංවච්ඡරසික්ඛාපදවිභාවිනොදනියෙහි** පුරුෂයෝ වනාහි යම් ඒ කවුරුන් විසින් නමුත් රක්ෂාවරණය කරනලද ස්ත්‍රියක් වෙත යන්නට නොලබද්ද, එහෙයින් ඒ මාතුරක්ඛිතාදී අටදෙනාවෙත ගියවුන්ට මිථ්‍යාචාරය වේමය, හෙතුකිමයත්: පුරුෂයන් හා සමඟ සංවාසය කරන්නට නොහැකිවන සේ මවුපියාදීන් විසින් රක්ෂාකරනලද හෙයිනි. එයින් අනික් දෙලොස්ස්ත්‍රීන් වෙත ගියවුන්ට අනුන් විසින් වැළැක්වීම ඇති කල්හි නොහොත් බලාපොරොත්තු ඇතිකල්හි නමසතුනොවන නන්හි පිවිසි බැවින් මිථ්‍යාචාරය වෙයි, හෙතුකිමයත්: ඔවුහු වනාහි හිමියාසතු සඵලීය සොරකම් කොට අන්‍යයන්ට අභිරතිය උපදවත්හුයි ඔවුන්ට මිථ්‍යාචාරය වේමය. මාතුරක්ඛිතාදී අනික්අටදෙනාහට වනාහි පුරුෂාන්තරයක් වෙත හෙවත් පුරුෂයෙක් කරායාමෙහි මිථ්‍යාචාරය නොවන්නේය. හෙතුකිමයත්: හිමියක්හු නැතිහෙයිනි. තවද කවුරුන් විසින්වත් පරිග්‍රහණය නොකරනලද හෙවත් සතුකර නොගන්නාලද සඵලීය ඇති

හෙයින්ද තමපහසට තමාම හිමි බැවින්ද ඔවුන්ට මිථ්‍යාචාර යක් නැත්තේමය. මව්පියාදීහු තුමූම ඔවුන්ගේ පහස විඳිනු පිණිස ඔවුන් නොරකිත්මය, අනාචාරය පමණක් වලකාලමින් පුරුෂාන්තරගමනයම ප්‍රාර්ථනාකෙරෙත් එහෙයින් මවුපියාදීහු ඔවුන්ගේ පහසෙහි අධිපතීහු නොවෙත්යයි කියනලද්දේය.

ඒ මිථ්‍යාචාරයතෙමේ ශීලාදීගුණහීනවූ අගමනීයස්ථානයෙහි අල්පසාවද්‍යයි ශීලාදීගුණවතුන් කෙරෙහි මහාසාවද්‍යයි තවද ගුණවිරහිතයා හෙරෙහි නමුදු බලාත්කාර කොට පවත්වන ලද්දේ මහාසාවද්‍යයි දෙදෙනාගේ සමානවඤ්ඤය ඇතිබැවිණිද හොලෙසුන්ගේ හා උපක්‍රමයන්ගේත් මෘදුබැවින්ද අල්පසාවද්‍යයි ඔවුන්ගේම නිර්‍භාවයෙන් මහාසාවද්‍යයි. ඔහුගේ සම්භාර සත රෙක් වන්නේය, එනම්: අගමනීයවස්තුවය, එහි සෙවනසිතය, සෙවනයෙහි ප්‍රයොගය, මාගියෙන් මාගීප්‍රතිපාදනය ඉවසීමය, යනු බ්‍රහ්මජාලට්ඨකථාහි වන්නේය. අභිහවනය කොට ව්‍යතික්‍රමණය ඇතිකල්හි මාගියෙන්මාගීප්‍රතිපාදනය ඉවසීම ඇති කල්හි නමුදු පළමු උපන්සෙවනාභිසන්ධිප්‍රයොගයක්හු නැති බැවින් මඬිනුලබන්නහුට මිථ්‍යාචාරය නොවේයයි කියත්.

සේවන චිත්තය ඇතිකල්හි ප්‍රයොගයාගේ අභාවය මිථ්‍යාචාර යට ප්‍රමාණ නොවන්නේය, කුමක්හෙයින්දයත්. සත්‍රියගේ වැඩි වශයෙන් සෙවනප්‍රයොගයක් නැතිබැවිනි. එසේ ඇතිකල්හි පළමුකොට නොමෙලවාතබනලද සෙවනාචිත්තය ඇති සත්‍රියට මිථ්‍යාචාරය නොවන්නේය, කුමක්හෙයින්ද? සෙවනප්‍රයොග යක් නැතිබැවිනි. එහෙයින් පුරුෂයාගේ වශයෙන් උඩත්පිරි සයින් සතරසම්භාරකොනෙක් කියනලදහයි දතයුතුයයි සඳ හරු කිහ.

තවත් පරිද්දක් නම්:—සත්‍රියක් පුරුෂකෘත්‍යය කරනකල්හි පුරුෂයාගේද සේවනප්‍රයොගයක් නැතිබැවින් මිථ්‍යාචාරය නොවෙයි, මේ මෙහි නිශ්චයයි.

ඝියඤ්ඤාමැත්තෙන් පවත්වනු ලැබූවහුගේ සම්භාර තුනෙක බලාත්කාරයෙන් පවත්වනු ලැබූවහුගේ තුනෙක නිරවශෙෂ ග්‍රහණයෙන් සතරෙඤයි කියනලද්දේය. අඞ්ගිඞ්ගිය වනාහි තුනෙකින් පමණෙඤයි යනු ඉතිවුත්තකවණ්ණනා නය වන්නේය.

මේ යටකියනලද්දේ ත්‍රිවිධකායසකම්ය නම්වේ. ඔවුනතුරෙන් ප්‍රාණඝාතාදි දෙක කායවාග්ද්වාරිකවෙයි මිත්‍යාචාරය කායවාරිකයි අකුසලවූ කායකම්ය වනාහි කායවාග්ද්වාරයන්හි උපදී මනොද්වාරයෙහි නූපදී සියතින් ප්‍රාණියෙකු නසන්නහුගේද අන්සතුදෙය සොරසිතින් ගන්නහුගේද මිත්‍යාචාරය කරන්නහුගේද කම්යත් කායකම්ය වේ චාරයත් කායචාරය වේ, 'යම මෙනම් නැනැත්තහු ජීවිතයෙන් තොරකරව මෙනම් භාණ්ඩය (අවහරණය) සොරකම් කරව'යි අණවන්නහුගේ කම්ය කායකම්යයි චාරය වනාහි වාග්ද්වාරයයි. මෙසේ අකුසල කායසකම්ය කායවාග්ද්වාරයන්හිම උපදී. ඒ චිත්තයසහජාතවූ අභිඛ්‍යාව්‍යාපාදමිත්‍යාදෘෂ්ටිහු චෙතනාපක්ෂයෙහි වූවාහු හෝ අව්‍යවහාරිකයෝ හෝ වන්නාහුය යනු **අට්ඨසාලිනි** නයයි.

'මේ සත්ත්වයෝ නැසෙත්වා'යි ව්‍යාපාදවශයෙන් පැවැත්තාහු චෙතනාපක්ෂයෙහිවූවාහු හෝ වෙත් කායසාම්ව්‍යවහාරය ලබන්නාහු හෝ අව්‍යවහාරිකයෝ හෝ වෙත් මනොසාම්ව්‍යවහාරයෙන් තොරයහ. සසම්භාරපෘථිවිආදියෙහි අපාදදිහු මෙහි නිදසුන් වෙත්යනු **එකිච්චිකානය** වන්නේය.

විඩිලෙස පැවති ව්‍යාපාදය කම්පථවෙයි එය දක්වන්නට "ඉමෙ සත්තා හඤ්ඤන්තු"කියා ව්‍යාපාදයාගේ විඩිලෙස පැවැත්ම දක්වනලදී කායවාරිකචෙතනාවට සහකාරී කාරණා වනහෙයින් කායකම්ව්‍යවහාරය ලබයි අන්සතුවසතුවක් තමහට පිරිනැමීම්වශයෙන් "ඉමෙ සත්තා හඤ්ඤන්තු"යනාදියෙන් අභිජ්ඣාදීන්ගේ නොපැවැත්ම හෙයින් මනොසාම්ව්‍යවහාරයෙන් තොරවෙයි, අචෙතනසභාවහෙයින් හෝ මනොකම්ව්‍යවහාරයෙන් තොරවෙයි. ප්‍රාණඝාතාදිභාවයෙන් හෝ නොකියයුත්තේය යනු **තදනුදිකා** නයයි.

මෙතෙකින් කායකම්කථාව නිමවනලද්දේය.

මුසාවාදය නම්:—විසංවාදනය පෙරටුකොට ඇත්තහුගේ හෙවත් නොමැනවත් කියමන පෙරටුකොට ඇත්තහුගේ නොහොත් මුළාකරවීම පෙරටුකොට ඇත්තහුගේ අර්ථහානිකරවූ වාග්ප්‍රයොගය 'මුසාවාද' නම් වේ. එබඳුවූ කායප්‍රයොගය හෝ මුසාවාද නම් වේ. එහි කම්පථප්‍රාප්තභාවය දක්වන්නට "අත්ථභඤ්ඤා"යන්න කියනලද්දේය. වාක්ප්‍රයොගාදීන්ගේ ගැනීමෙන් මුසා ශබ්දයාගේ කාරිය ප්‍රධානබැව් දක්වයි. විසංවාදනයෙහි අභිප්‍රාය ඇත්තහුගේ අනිකෙකු මුළාකරවන කායවාග්

ප්‍රයොගය උපදවන්නාවූ වෙතනා තොමෝ මුසාවාද නම් වේ. මේ වෙතනාව කරණකොටගෙන යටකියතලද ප්‍රයෝගවූ මුසාව කියයි භණවයි උපදවානුයි හෝ මුසාවාද නම් වේ. විසංවාදන අධිප්‍රායද වනාහි පූර්භාගක්ෂණයෙහිම ලැබෙයි.

එහෙයින් කියනලද්දේමැයි:-"පුබ්බවස්ස හොති මුසා භණිස්ස'නති, භණනතස්ස හොති මුසා භණාමීති"හි.

මම මුසා කියන්නෙමියි මෝහට පළමුකොට අදහස් වෙයි කියනකල මම මුසා කියමියි ඔහට අදහස්වෙයි. මේ දෙක අඩංග වූයේ වෙයි, අනිසා වනාහි මේවා හෝ නොවේවා, එය කරුණක් නොවෙයි.

අනික් නයක් කියනුලැබේ: මුසා:-නම් නුවූ බොරුවූ වස්තුවකි, වාදය නම් ඒ වස්තුහුගේ වූවක් ලෙස සැබවක් ලෙස හැඟවීමයි, ලක්ෂණවශයෙන් වනාහි නුවූවස්තුවක් වූවක්ලෙස අනිසෙක්හට හඟවනු කැමැත්තහුගේ එසේ හැඟවීම උපදවන්නාවූ වෙතනා තොමෝ මුසාවාදනම්. මේ වෙතනාවෙන් බොරුකියනු ලැබේනුයි මුසාවාදනම්, මෙහිද පළමුනයෙහි මුසාවාදලක්ෂණය තමා අප්‍රකටබැවින්ද මුසාශබ්දයාගේද විසංවාදනය කවයුතු අර්ථවාචකවය සම්භවන හෙයින් සම්පූර්ණකොට ඒ ලක්ෂණය දක්වන්නට දෙවන නය කියනලද්දේයයි දතයුත්තේය.

ඒ මුසාවාදය යම් අර්ථයක් බිඳලාද ඔහුගේ අල්පභාවයෙන් අල්පසාවද්‍යයි මහත්භාවයෙන් මහාසාවද්‍යයි. තවද යමෙකුගේ අර්ථහානිහොරේද ඔහුගේ අල්පගුණහෙයින් අල්පසාවද්‍යයි මහාගුණහෙයින් මහාසාවද්‍යයි කෙලෙසුන්ගේ මෘදුභාවයෙන් අල්පසාවද්‍යයි තීව්‍රභාවයෙන් මහාසාවද්‍යයි.අනික් නයක් කියනු ලැබේ.

ගෘහස්ථයන්ගේ: තමසතුදෙයක් නොදෙනුකැමැත්තෙන් ඒ දෙය මාවෙත නැත යනාදීනයින් පැවති මුසාවාදය අල්පසාවද්‍යයි, ශාක්‍ෂිකරුවෙකුවී අර්ථහානිය පිණිස යොදනලද මුසාවාදය මහාසාවද්‍යයි. පැවිද්දන්ගේ වූකලි ඉතාමදක් තල තෙල් හෝ ගිතෙල් හෝ ලැබ සිනහ පිණිස 'අද ගමෙහි තෙල් ගහක් ගලාබසින්නීය'යි හඟිමියි පූරණකථානයින් පැවති මුසාවාදය අල්පසාවද්‍යයි නුදුවු දෙයක්ම වනාහි දක්නා ලැදැයි

යනාදී නයින් කියන්නවුන්ට මහාසාවද්‍යයි. පූරණකථාව නම්: මඳබැවින් ඌනපූරණවශයෙන් පැවතිකථාවයි, තමසතුදෙය නොදෙනුකැමති භාවයෙන්ද පූරණකථානයින්ද පැවති විසංවාදනය පෙරටුකොට ඇත්තහුගේ මුසාවාදය හෙයින් අල්ප සාවද්‍යවේද? එහි වනාහි චේතනාබලවත්හෙයිනුයි අල්ප සාවද්‍ය බව කියනලදී. ඒ මුසාවාදයාගේ සතර සම්භාරහෙතෙක් වන්නාහ. අභූතවූ වස්තුවය, විසංවාදනසිතය, විසංවාදනානුරූපවූ ව්‍යායාමය හෙවත් ප්‍රයෝගය, අනිකෙක්හට එම අර්ථය හැඟවීමය, යන සතරයි. විසංවාදන අධිප්‍රායෙන් ප්‍රයෝගය කළ කල්හිදු අනිකා විසින් එම අර්ථය නොදන්කල විසංවාදනය සිදුනොවනහෙයින් අනිකාහට එම කාරණය හැඟවීමම එක් සම්භාරයෙකැයි දතයුත්තේය. අභූතවස්තුවය, විසංවාදනසිතය, අනිකාහට තදර්ථවිජානනයයි, කියා සම්භාරත්‍රයෙකැයි සම්හරු කියත්.

අනුන් බිඳුවීම පිණිස හෝ තමනට ප්‍රියකාමතිකාරවීම පිණිස හෝ කායවාග්ප්‍රයෝගය උපදවන්නාවූ චෙතනා තොමෝ පිසුනාවාචා නම් වන්නීය. මේ චෙතනාව කාරණකොටගෙන ප්‍රියඥාත්‍යකරවූවක් කියානුයි පිසුනාවාචා නම් වේ.

ලොභය විසින් පෙළනලද්දාවූ හෝ ද්වේෂය විසින් පෙළනලද්දාවූ හෝ නොහොත් අර්ථවශයෙන්ම දූෂිතසිත් ඇත්තහුගේ ඒ පිසුනාවාචා තොමෝ යමක්හුගේ හෙදය කරන්නීවිද ඔහුගේ අල්පගුණභාවයෙන් අල්පසාවද්‍යවෙයි. මහාගුණභාවයෙන් මහාසාවද්‍යවෙයි. තවද යමක්හුකෙරෙහි යමක්හුගේ හෙදය කරන්නීද ඔවුන් නුබුන්කල්හි අල්පසාවද්‍යයි. බුන්කල්හි මහාසාවද්‍යයි. කෙලෙසුන්ගේ මෘදුතීව්‍රභෙදයෙහිද එසේම දතයුත්තීය. ඒ පිසුනුවචනයාගේ සතරසම්භාරයෙක් වන්නාහ. එනම්: බිඳියයුතු අනික් අයය, මේ අය මෙසේ හෙදවන්නාහුය වෙන් වන්නාහුයයි හෙදය පෙරටුකොට ඇතිබව හෝ මෙසේ මම මොවුන්ට ප්‍රියයෙක් වන්නෙමි විශ්වාසයෙක් වන්නෙමියි තමන් ප්‍රියකරවනු කැමතිබවද, තදනුරූප ව්‍යායාමයද, තදර්ථවිජානනයද, හෙවත් එමඅර්ථය හැඟීමද, යන මේ සතරයි. 'තදර්ථවිජානනය' යන මේ වචනයෙන් යමෙක්හට පිසුනුඵලවාද ඔහු බිඳුනේ හෝ වේවා නොබිඳුනේ හෝ වේවා එම අර්ථයාගේ හැඟවීමම ප්‍රමාණවන්නේයයි දක්වයි. අනුන් නුබුන්කලැ කම්පථභෙදයක් කොවන්නේය. බුන්කල්හිම් කම්පථභෙදය වන්නේය.

අනිභාක්ඛට මම්මවෙජ්දකරවූ කායවාග්ප්‍රයෝගය උපද වන්නාවූ එකාන්නඵරුෂවෙතනා තොමෝ ඵරුෂාවාචා හෙවත් ඵරුෂටවන නම් වේ. මේ එකාන්න ඵරුෂවෙතනාවකරණකොට ගෙන ඵරුෂවූවක් කියානුයි හෝ ඵරුෂවාචා නම්වේ. බ්‍රහ්ම ජාලවිභාගයෙහි 'මම්මයෝ' යනු විෂමයෝය. යම්ක්‍රිසි ස්ඵශීඝාළ පමණෙහිම දුඃඛවූර්ණයක්මෙන් ඵරුෂවචනයෙන් ගැටුනාවූ සිත අධිභාමාත්‍රදුඃඛට පැමිණියක් වේද ඒ ඵරුෂවචනයෝ මම්මවූ විෂමවූ වචනයෝ වෙත්. ඔව්හු කවරහුද යත්: ජාතිආදී ආක්‍රෝෂ වස්තුහුය. යම්කිසි කායවාග්ප්‍රයෝගයක් හෙතුකොටගෙන ඔව්හු සිදී බිදී යෙද්ද හේ මම්මවෙජ්දකයයි කියනලද්දේය. එකාන්න ඵරුෂවෙතනාව වන්නේ කෙසේද යත්: දුඃඛවිත්තය බැවිනි. ඒ ඵරුෂවෙතනාව ප්‍රකාශකිරීම පිණිස මේ කථාවස්තුව දක්වනලද්දේය.

එක්තරා ළදරුවෙක් තෙමේ මවට අකීකරු වී වල්වන්නේය. මවුතොමෝ ඔහු වලකාලන්නට නොහැකිවන්නී තා මීකුළී ඵලවාව'සි ආක්‍රෝෂකළා, එක්ඛිති ඕහට එසේම වෙනෙහි මීකුළියක් නැගී ආවා ළදරුතෙමෙ මාගේ මව මුවින් යමක් කීවාද එය නොවේවා සිතින් යමක් සිතීද එයම වේවාසි සත්‍යක්‍රියා කෙළේය. මීකුළී එතන්හිම බැදුනියක්මෙන් සිටියාය. මෙසේ මම්මවෙජ්දභාවූද ප්‍රයෝගය සිතමොලොක්බැවින් ඵරුෂවචන නොවෙයි මව්පියෝ වනාහි සමහරදවස්වලදී තමදරුවන්ට සොරහු තොප කඩකඩ කෙරෙත්වාසිද කියත් එසේදවූවත් ඔවුන්ගේ හිසට උපුල්පතක් වැටීමවත් නොරිස්සෝවෙත් ආචාර්‍යඋපාඛ්‍යායයෝද සමහර දිනෙකැ තමන්ඇසුරුකරන්න වුන්ට මේ විලිබියනැත්තෝ කුමක්කරන්නහුද මොවුන් බැහැර ලවියයි කියත් එනකුදුවූවත් ඔවුන්ගේ ආගමඅධිගමසම්පත්තියද ප්‍රාර්‍ථනාකෙරෙත්මය. බ්‍රහ්මජාලදීඝනිකායෙහි වනාහි චිත්ත යාගේ මොලොක්භාවය හෙතුකොටගෙන ඵරුෂවචනය නොවෙයි කම්පඵප්‍රාප්තභාවය හෙතුකොටගෙන වෙයි. කම්භාවය වනාහි වලකාලන්නට නොහැක්කේයයි කියනලද්දේය.

යම්සේත් සිත මොලොක් බැවින් ඵරුෂවචනය නොවේද එසේ වචන මොලොක්භාවයෙන් අඵරුෂවචනයත් නොවෙයි. මරවනුකැමැත්තහුගේ 'මොහු සැපසේ හොවේ' යන වචනය අඵරුෂ වචනය නොවෙයි සිත ඵරුෂබැවින් මෝ තොමෝ ඵරුෂවචනයම වෙයි. ඒ ඵරුෂවචනය තොමෝ යමෙක් සඳහා පැවතියාද ඔහුගේ අල්පගුණභාවයෙන් අල්පසාවද්‍යයි මහාගුණ

භාවයෙන් මහාසාවද්‍යයි. තවද සාම්මපථභාවයට නොපැමිණියෝ අල්පසාවද්‍යයි සාම්පථභාවයට පැමිණියෝ මහාසාවද්‍යයි සෙලෙසුන්ගේ මෘදුතීව්‍රභෙදයෙහිද ඒ නයමවන්නේය. කිසිවෙකු විසින් යමෙක් උදෙසා එරුෂවචනය කියනුලැබේද ඔහුහමු යෙහිම එරුෂවචනය මුදුන්පැමිණියයි සමහරුකියත්. සමහරු අනභිමුඛයෙහිද එරුෂවචනය වන්නීමයයි කියත් එනි මේ අදහස වන්නේය නිදිගත් නැනැත්තේ සම්මුඛයෙහි වූයෙක් වී නම් අගෞරවාදීන්ගේ බලවත්භාවය හෙයින් ප්‍රයොගයෙහි චෙතනාව බලවත්වන්නීය අනිෂ්ටාගත හදාඪිවිඥානනයකුත් හෙවත් ඒ කාරණයාගේ දැනීමකුත් නැත්තේය අනභිමුඛ යෙහිත් එසේම වන්නේය යම්සේ වනාහි ආක්‍රොෂකාරහු ලැබූවහු මලකල්හි සොහොනෙහිදී කරනලද ක්‍ෂමාකිරීම් තොමෝ උපවාදනතරාය වලකාද එපරිද්දෙන්ම අනභිමුඛයෙහි යොදනලද්දීද එරුෂවචනය වේමයයි සිතියහැක්කේය ඒ එරුෂ වචනයාගේ සම්භාරතුනෙක එනම්: ආක්‍රොෂකටපුතුවූ අනිෂ්ටාය, කෝපවූ සිතය, ආක්‍රොෂකිරීමය, යන මේ තුනයි. මෙහි කියන ලද්දේ ආක්‍රොෂකරණ අදහසින්ම කොපවූ සිත වේ. මරණ අදහසින් කෝපවූ සිත නොවන්නේය මරණ අදහසින් වනාහි සිත කෝපවූ කල්හි ව්‍යාපාදයමවන්නේය.

අනර්‍ථය හැඟවීමඇති කායවාග්ප්‍රයෝගය උපදවන්නාවූ අකුසලචෙතනා තොමෝ සම්ඵප්‍රලාප නම් වන්නේය. මේ අකුසලචෙතනාව කරණකොටගෙන නිරර්‍ථකවූවක් කථනය කෙරේනුයි හෝ සම්ඵප්‍රලාප නම් වේ. ඒ සම්ඵප්‍රලාපය ආසේවන යාගේ නෙවත් වැඩීමගේ මඳභාවයෙන් අල්පසාවද්‍යයි ඔහුගේ මහත්භාවයෙන් මහාසාවද්‍යයි තවද යමෙක්හට ගන්වන්නට පවත්වනලදකල්හි ඔහු විසින් නොගන්නාලදකල්හි අල්පසාව ද්‍යයි ගන්නාලදකල්හි මහාසාවද්‍යයි කෙලෙසුන්ගේ මෘදුතීව්‍රභාවභෙදයෙහිද පෙරකීනයින්ම වන්නේය. ඒ සම්ඵප්‍රලාපයාගේ සම්භාර දෙකෙකි එනම්: භාරතයුඛසීතාභරණාදී නිරර්‍ථක කථා පෙරටුකොට ඇති බවය, එබදුවූ කථාකීමය, යන දෙකයි. අන්‍ය යන් ඒ කථාව නොගන්නා කල්හි කාම්පථභෙදය නොවන්නේය ගන්නාකල්හිම වන්නේය.

සම්මාදිට්ඨිසූත්‍රවීභාගෙහි වනාහි යම්කිසි සම්ඵප්‍රලාපයක් වනාහි සම්භාරදෙකකින් සිඳවන්නේයයි කියනලද්දේය. යට කියනලද මේ සිවුවැදෑරුම්වූ වාක්කර්‍මය වනාහි විචාරික හෙවත් දෙදෙරකින් උපදනේවෙයි හස්තාමුද්‍රාභාෂාගෙන් වනාහි මුසා

වාදාදිය කියන්නහුගේ කම්ම වාක්කම්ම වේ වාරය වනාහි කාය වාරය වේ. වාක්භෙදය කොට ඒ මුසාවාදාදීන් කියන්නහුගේ කම්ම ද වාක්කම්ම වෙයි වාරද වාග්වාරම වෙයි මෙසේ මේ අකුසලවාක්කම්ම නම් කායවාග්වාරයන්හිම උපදනේය මනෝ වාරයෙහි උපදනේ නොවෙයි ඒ අකුසලචිත්තයන් හා සහජාතවූ අභිඛ්‍යාව්‍යාපාදමිථ්‍යාදෘෂ්ටීහු චෙතනාපක්ෂයෙහි වූවාහු හෝ වන්නාහුය අව්‍යවහාරිකයෝ හෙවත් සම්ඵප්‍රලාපභාවයෙන් නොකියයුත්තෝ හෝ වන්නාහුය යනු **අට්ඨසාලිනියෙ** වන් නේය. එහි වනාහි අභිඛ්‍යාදීහු වාක්කම්ම්‍යවහාරය ලබන්නා හුය චෙතනාපක්ෂයෙහි වූවාහුය මනොකම්ම්‍යවහාරයෙන් තොර යහ අචෙතනාසභාව හෙයින් නොකිය යුත්තාහ මුසාවාදාදී භාවයෙන්ද නොකියයුත්තාහ.

වාක්කම්ම කථාවයි.

මනොකම්මකථායෙහි ලොභොබ කෙරේනුයි අභිජ්ඣා නම්වේ. පරභාණ්ඩයට අභිමුඛවී එහි ලොභොබකිරීම් වශයෙන් අවනත භාවය පවතීය යන අර්ථයි. **සඞ්ගණිසූත්‍රටීකායෙහි** ධාතුශබ්දයෝ උපසඟීවශයෙන් අර්ථවිශෙෂවාචීහු කියා 'අභිජ්ඣා' යන මේ පදයාගේ අර්ථය පරභාණ්ඩයට අභිමුඛවී යනාදී නයින් කියන ලද්දේය. 'තණ්හින්නතාය' යනු ඒ පරභාණ්ඩයෙහි ලොභොබ කිරීම් වශයෙන් පහත්භාවයෙන්ය යන මේ අදහස මෙතැන් හිදී දතයුත්තේය. අභි යන උපසඟීය පුථුකොටඇති ඣා යන ධාතුව ශබ්දයෙහි වේ ලොභොබ කිරීමෙන් වැඩුනේයයි දත යුත්තේය. ධාතුශබ්දය උපසඟීයන්ගේ වශයෙන් අර්ථවිශෙෂය කියන්නහුම යයි කියනලද්දේය.

ඒ අභිජ්ඣා නොමෝ යමෙකුගේ භාණ්ඩයක් කෙරෙහි ලොභොබ කෙරේද ඔහුගේ අල්පගුණභාවයෙන් අල්පසාවද්‍යයි මහාගුණ භාවයෙන් මහාසාවද්‍යයි යනාදී නයින් අදින්නාදුන යාගේ මෙන් මේ අභිඛ්‍යාවගේද අල්පසාවද්‍ය මහාසාවද්‍යභාවය දතයුත්තේය. ඒ අභිඛ්‍යාවගේ සම්භාර දෙකෙක මේරමාසතු භාණ්ඩයක් වීමය, තමහට පිරිනැමීමය, යන දෙකයි.

සඞ්ගණිසූත්‍රටීකායෙහි තමහට පිරිනමන සිහින්ම කාමීපථ භෙදය වෙයයි දතයුත්තේයයි කියනලද්දේය. පරභාණ්ඩ යෙහි වසතුලොභය උපන්කල්හිදු අහෝ මේ දෑ මට වන්නේ නම් ඉතා මැනවැයි කියා යම්තාක් තමාවෙත පිරිනැමීම නොසිතාද ඒ තාක් කාමීපථභෙදය නොවන්නේය.

හිතසුව වනසාහුසි ව්‍යාපාද නම් වේ. හෙවත් හිතසුව වන සන හෙයින් ව්‍යාපාද නම් වන්නේය. සඟිණිසූත්‍රටීකායෙහි 'ව්‍යාපාදෙති' යනු යමෙක් තෙමේ ඒ ව්‍යාපාදය උපදවාද උපන් ඒ ව්‍යාපාදය රැසවූකල්හි තෙමේම ඔහුගේ හිතසුව වනසායයි කියනලද්දේය. යම් ජනයෙක් තෙමේ යමක්හු නිසා හිතසුව වනසාද ඔහුගේ අල්පගුණත්වයෙන් අල්පසාවද්‍යවෙයි මහාගුණභාව යෙන් මහාසාවද්‍යවෙයි යනාදිනයින් ඔහුගේ අල්පසාවද්‍ය මහාසා වද්‍ය භාවය එරූපවචනයාගේමෙනැයි දතයුත්තේය. ඒ ව්‍යාපාද යාගේ සම්භාර දෙකෙක් වන්නේය. අන්සතෙක් වනබවය, ඕහට විනාස සිතීමය, යන දෙකයි. පරසත්වසංඛ්‍යාත වස්තුයෙහි ක්‍රෝධය උපන් කල්හිදු අහෝ මෙතෙමේ සිදෙන්නේ නම් වැනසෙන්නේ නම් ඉතා යෙහෙකැයි කියා ඔහුගේ විනාශය යම්තාක් නොසිතාද ඒ තාක් කම්පථභෙදය නොවන්නේය.

සඟීතිසූත්‍රසම්මාදිට්ඨිසූත්‍රාදීන්හි 'අහොවත' යන මේ වචන යෙන් මෙරමාහට අතිශයින්ම විනාශයක් සිතීම දක්වයි. මෙසේ වනාහි ඔහුගේ දරුණුවූ පැවැත්මෙන් කම්පථප්‍රවෘත්තිය වේයයි කියනලද්දේය.

නතුසේ ගැනීමක් නැතිබැවින් වරදවා දකිනුයි 'මිච්ඡාදිට්ඨි නම් වේ. සඟීතිසූත්‍රටීකායෙහි 'යථාභුච්චගහණභාවෙන, යනු වෙන් තත්ත්වාකාරයාගේ ගැනීමක් නැතිබැවින් අනිත්‍යාදී සභාව යාගේ නිත්‍යාදීවශයෙන් ගැනීමෙන් වරදවා දකි අභූතවූවක් දකී යන අර්ථය කියන ලද්දේය. ඒ මිච්ඡාදිට්ඨිතොමෝ භාවනාලෙස සෙවනය හෙවත් වැඩීම මඳබැවින් අල්පසාවද්‍යයි ඒ මහත් බැවින් මහාසාද්‍යයි. තවද අනියතවූවා අල්පසාවද්‍යයි නියතවූවා මහා සාවද්‍යයි. ඒ මිච්ඡාදිට්ඨියගේ සම්භාර දෙකෙක් වේ. වස්තුහුගේ ගත්අයුරු වීපරීතබවය, එය ගත්සේ ඔහට වැටහීමය, යන දෙකයි.

සඟීතිසූත්‍රටීකායෙහි 'ගහිතාකාරවිපරීතතා' යනුවෙන් මිච්ඡාදිට්ඨිය විසින් ගන්නාලද ආකාරයාගේ විපරීතබවද 'වත්ථුනෝ' යනුවෙන් සිදුවූ පරිදි සභාවයද 'තථාභාවෙන' යනුවෙන් ගත්ආකාරයෙන්ම ඒ මිච්ඡාදිට්ඨිගතිකයාගේ හෝ ඒ වස්තුහුගේ 'මෙය මෙසේ මය අන්පරිද්දකින් නොවේය'යි වැට හීමද කියනලද්දේය.

ඒ දෘෂ්ටින් අතුරෙන් නාස්තික අහෙතුකඅකිරිය යන දෘෂ්ටින් කරණකොටගෙනම කම්පථභෙදය වෙයි. අනික් දෘෂ්ටීන්කරණ කොටගෙන නොවෙයි කියනලද්දේය.

අදීසාලනියෙහි යථොක්තවූ මේත්‍රීවිධමනඃකර්මය ත්‍රිචාරික වන්නේය. හේ කෙසේදයත්:-යම්කලෙක වනාහි තමසතු වසතුන් කෙරෙහි අධිකතෘෂ්ණාසංඛ්‍යාත අභිධ්‍යාසහගත සිතින් කාය අඟපසඟ සොලවා යම් කිසිවසතුවක් අතින් ගැනීමාදියක් කෙරේද මෙරමාහට අවැඩ සලකන ව්‍යාපාදසහගත සිතින් යුක්තව දඬුමුගුරු ගැනීමාදියක් කෙරේද 'සුගතිදුගතිදෙක්හි උපපත්තිය පවිපින් හෙතුකොටගෙන නොවෙයි ඉසුරුකතරග මාදි දෙවියන් හෙතුකොටගෙන වෙයි ඔවුහු ශ්‍රෙෂ්ඨයහ'යි කියා මිසදිටුගත් සිතින් ඔවුන්ගේ පිළිබිඹුපෙතිකඛඇදිය තනවා අභිවාදනඅජලිකම්දෙලබිලිපූජාආදිය කෙරේද එකල අභිධ්‍යාදීහු ප්‍රධානහෙයින් කර්මය මනඃකර්මය වෙයි වාරය වනාහි කායවාරය වෙයි. මෙසේ අකුසලවූ මනඃකර්මය කායවාරයෙහි උපදනේය. අභිධ්‍යාව්‍යාපාදදිහු ඇතිකල්හි වුවත් යම්කලෙක කායවාග් වාරයන්හි චෙතනාතොමෝ බලවත්වීද මනොවාරයෙහි එසේ බලවත් නොවීද එකල ප්‍රධානවූවහුගේ වශයෙන් චෙතනා තොමෝ කායකර්මය වාග්කර්මය යන ව්‍යවහාරය ලබන්නීය.

චෙතනාවගේ ඒ ප්‍රධානභාවය වනාහි ප්‍රාණඝාතාදීන්ගේ සිඛියෙහි ලා දන්නේය. එසේ හෙයින් මෙහි කර්මය කායවාර යෙහි උපනත් වාග්වාරයෙහි උපනත් චෙතනා තොමෝ වනාහි අභිධ්‍යාදිය ප්‍රධානකොට ඇති බැවින් කායකර්මය වාග්කර්මය යන ව්‍යවහාරය නොලබන්නීය. තිවිධා භික්ඛවෙ! මනොසංචෙතනා අකුසලං මනොකම්මං'යි වදාළහෙයින්ද ඒ චෙතනා තොමෝ සභාවයෙන්ම එහි මනඃකර්මයම වන්නීය.

යම්කලෙක වනාහි අභිධ්‍යාදීසහගත සිතින් යුක්තව වාගං ගයන් සොලවා මෙරමාසතු යම්වස්තුපකරණයක් ඇතහොත් එය මව වන්නේ නම් මැනවැයි කියමින් මෙරමාසතු වස්තුප කරණ පතාද ව්‍යාපාදසහගත සිතින් යුක්තව 'මේ සත්ත්වයෝ නැසෙත්වා හෝ පෙළෙත්වා හෝ වැනසෙත්වා හෝ නොවෙත්වා හෝ'යි කියාද මිසදිටුසහගිය සිතින් යුක්තව 'දුන් දෙයෙහි විපාක නැත' යනාදිය කියාද එකල කර්මය මනඃකර්මය වෙයි වාරය වනාහි වාග්වාරය වන්නේය. මෙසේ අකුසල මනඃකර්මය වාග්වාරයෙහි උපදනේය. මෙහි වනාහි කර්මය වාග්වාරයෙහි උපනත් අභිධ්‍යාදීහු බලවත් හෙයින් චෙතනා තොමෝ වාග්කර්මය, යනව්‍යවහාරය නොලබයි මනොකර්මය යන ව්‍යවහාරයම ලබයි.

යම් කලෙක්හි වනාහි කාශවාගේ අභයන් නොසොල්වා රහෝගතව හිඳ අභිඛ්‍යාව්‍යාපාද-මිථ්‍යාදෘෂ්ටිසහගත චෙතනා උපදවාද එකල්හි කර්මය මනඃකර්මය වෙයි. වාරයද මනොචාරයම වෙයි. මෙසේ අකුසලමනඃකර්මය මනොවාරයෙහි උපදනේය. කාශවාගේ අභයන් නොසොල්වා සිතන මෙම කාලයෙහි වනාහි චෙතනා සම්ප්‍රයුක්තධර්මරාශීද මනොචාරයෙහිම උපදනාහ.

මෙසේ අකුසලමනඃකර්මය කාශවාගේමනඃ යන තිදෙරෙහිම උපදනේය යන මෙය අට්ඨසාලිනිනට්ඨකථානුටීකා නය වන්නේය.

මනඃකර්මකථාවයි.

දැන් මනඃකර්මකථායෙහි ආවාවූ මිථ්‍යාදෘෂ්ටියගේ දෂ්ෂ භාවය පිණිස අකිරිවාදදිය කියනුලැබේ.

ඔවුනතුරෙන් මහරජ! සියතින්ම කරන්නහු විසින්ද මෙරමා ලවා කරවන්නහු විසින්ද මෙරමාජනයාගේ අත්ආදිය සිදුවන්නහු විසින්ද මෙරමාලවා සිදුවවන්නාහු විසින්ද මෙරමාජනයන් බැණීම් දෙඩින් තැළීම් ආදියෙන් පෙළන්නහු විසින්ද මෙරමාලවා එසේ පෙළවන්නහු විසින්ද මෙරමාබඳු පැහැරීම් ආදියෙන් ශොකකරවන්නහු විසින්ද තමන්ගේ වචන කාරිවූ මෙරමා ලවා එසේ ශොක කරවන්නහු විසින්ද ආහාරූපවෙජදබන්ධනගාරප්‍රවෙශන ආදියෙන් මෙරමාකලාන්ත කරවන්නහු විසින්ද තමන්වචනකරුවන් ලවා එසේ කලාන්ත කරවන්නහු විසින්ද මෙරමාපෙළන ප්‍රයොගයෙන් පෙළන්නහු විසින්ද එසේම තමන් වචනකරුවන් ලවා පෙළවන්නහු විසින්ද පණිවා කරන්නහු විසින්ද කරවන්නහු විසින්ද නුදුන් දැව් ගන්නහු විසින්ද ගන්වන්නහු විසින්ද ඇතුළපිට සන්ධිච්ඡේදිත්තහු විසින්ද මහාවිලොපය හෙවත් කිසිවක් නොතබා මුළු ධනය පැහැරගැනීම් වශයෙන් නිලෙලාපය කරන්නහු විසින්ද එකම ගෙයක්වටකොට වස්තුපැහැරගන්නහු විසින්ද ආආව වුන්ගේ වස්තු පැහැරගැනීමට වනය හාත්පසැ සිට වස්තු පැහැර ගන්නහු විසින්ද අන්අඹුවන්වෙත එළඹෙන්නහු විසින්ද බොරු කියන්නහු විසින්ද යන මේ 'යම්කිසි පාපයක් කරන්නෙමි'යි සිතා කරන කවුරුන් විසින්වුවත්, පෙර නොකළහු විසින් නොමඟපද්‍ය හැකි බැවින් පාපයක් කරනලද්දේ නොවේ"යි යන මේ ආදී අකිරිය වාදය 'පූරණ' නම් වූ තීර්ථකයා විසින් කියනලද්දේය. හෙතෙමේ වනාහි 'අකිරියවාදියා' නම් වීය.

සත්ත්වයන්ගේ කෙලෙසීමට හෙතුප්‍රත්‍යයයක් නැත හෙතුප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ කිලිටු වන්නාහ සත්ත්වයන්ගේ විසුඬියට හෙතුප්‍රත්‍යයයක් නැත හෙතුප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වන්නාහ යන මේ ආදී අහෙතුකවාදය මක්ඛලි නම් තීර්ථකයා විසින් කියනලද්දේය. ඔහුවන්හි සංසාරසුඬිදෘෂ්ටිකයෙක් වී සත්ත්වයන්ගේ කිලිටුවීම හා සුඬිය අහෙතුකවූවක් කොට කියන්නේය. ඔහු අහෙතුකවාදියා නම් වීය.

දුන් දෙයෙහි විපාක නැත මහායාගයෙහි විපාක නැත යන මේ ආදී නාස්තිකවාදය **අජිත** නම් තීර්ථකයා විසින් කියනලද්දේය. හේ වනාහි නාස්තිකවාදියා නම් විය. හේම කාබුන් මරණින් සත්ත්වයා සිදෙන්නේය වැනසෙන්නේය මරණින් මතු නොමළුපදනේය යන මේ ආදී සත්ත්වයන්ගේ උච්ඡේදය කියන හෙයින් උච්ඡේදවාදියා නමුදු වීය.

මෙසේ මේ වාදයෝ **සිලක්ඛන්ධවග්ගෙහි සාමඤ්ඤඵලසුත්තෙහි** මේ කයින්ම විස්තාරවශයෙන් ආවාහුය. **මජ්ඣිමපණ්ණාසකෙහිප්‍රථමවග්ගෙහිඅපණ්ණකසුත්තෙහි** වනාහි නාස්තික දෘෂ්ටිය අකිරියදෘෂ්ටිය අහෙතුකදෘෂ්ටියයි කියා මේ ක්‍රමයෙන් ආවාහුය. එසේ හෙයින් ඒ වණ්ණනායෙහි ඒ ක්‍රමයට අනුරූප ලෙස අත්ථවණ්ණනා කරන්නහු විසින් මේ දෘෂ්ටීන් තුන්දෙනා අතුරෙන් නාස්තිකදෘෂ්ටි තොමෝ විපාකය ප්‍රතිබාහනය කරන්නීය, අකිරියදෘෂ්ටි තොමෝ කර්මය ප්‍රතිබාහනය කරන්නීය, අහෙතුකදෘෂ්ටිතොමෝ ඒ දෙකම ප්‍රතිබාහනය කරන්නීය, යනාදිය කියන ලද්දීය.

මොවුනතුරෙන් **පූරණ** තෙමේ "කරොතො න කරීයති පාපං"යි කර්මය ප්‍රතිබාහනය කෙරෙයි, **අජිත** තෙමේ "කායස්ස භෙදා උච්ඡිජ්ජති"යි විපාකය ප්‍රතිබාහනය කෙරෙයි, **මක්ඛලි** තෙමේ "නත්ථි හෙතූ"යි දෙකම ප්‍රතිබාහනයකෙරෙයි. ඔවුනතුරෙන් කර්මය ප්‍රතිබාහනය කරන්නහු විසින් විපාකයද ප්‍රතිබාහනය කරණලද්දේ වෙයි, විපාකය ප්‍රතිබාහනය කරන්නහු විසින් කර්මයද ප්‍රතිබාහනය කරනලද්දේවෙයි, මේසේ මේ සියල්ලෝම අර්ථවශයෙන් හෙවත් සවරූපයෙන් (සභාවප්‍රවෘත්තියෙන්) උභයප්‍රතිබාහකත්වයෙන් අහෙතුකවාදයෝද අකිරියවාදයෝද නාස්තිකවාදයෝද වන්නාහුයයි **සාමඤ්ඤඵලසූත්‍රවණ්ණනායෙහි** කියනලද්දේය.

අකිරියවාදීභාවයෙන් කාමය ප්‍රතිබාහනය නොරෙයි, සඒප්‍ර කාරයෙන් උපපත්තියගේ ප්‍රතික්ෂෙපකරණයෙන් විපාකය ප්‍රතිබා හනය නොරෙයි, සඒප්‍රකාරයෙන්ම හෙතූන් ප්‍රතිබාහනය කිරී මෙන් ඵලයාගේද ප්‍රතික්ෂෙපය කරණලදබව වනහෙයින් කාමය විපාකය යන දෙකම ප්‍රතිබාහනය නොරෙයි. හේ තෙමේ වනාහි "අහෙතු අපපච්චයා සත්තා සංකිලිස්සන්ති විසුජ්ඣන්ති ච" කියම්න් කාමයාගේ හා විපාකයාගේත් නොලෙසීමය පිරිසිදුවීමය යන දෙකට හෙතුවක් නැතිබැවි කීමෙන්ද ඒ කාමය විපාකය යන දෙකම ප්‍රතිබාහනය කරන්නේනම් වෙයි. කාමයක් නැති කල්හි විපාකයක්ද නැතිහෙයින් විපාකය ප්‍රතිබාහනය කරනලද්දේ වෙයි, විපාකය නැතිකල්හි කාමය නිරර්ථකා බවට පැමිණෙන හෙයින් කාමය ප්‍රතිබාහනය කරණලද්දේ වෙයි.

යමෙක් තෙමේ වනාහි විපාකප්‍රතිබාහනයෙන් නාස්තික දෘෂ්ඨි ඇත්තේ උච්ඡෙදවාදී වේද, හේ තෙමේ සවරූපයෙන්, විපාකය නැතිකල කාමය නිරර්ථකා වනහෙයින් කාමයත් ප්‍රති බාහනය කිරීමෙන් අකිරිය දෘෂ්ඨි ඇත්තේ අකිරියවාදීත් වෙයි, ඒ විපාකය කාමය යන දෙදෙනාගේ ප්‍රතිබාහනයෙන් අහෙතුක දෘෂ්ඨි ඇත්තේ අහෙතුකවාදීද වන්නේය.

යමෙක් තෙමේ වනාහි කාමප්‍රතිබාහනයෙන් අකිරිය දෘෂ්ඨි ඇත්තේ අකිරියවාදී වේද, හේ තෙමේ සවරූපයෙන් හෙවත් සභාවයෙන් කාමයක් නැතිබැවිහි විපාකයක් ප්‍රතිබාහනය කිරී මෙන් නාස්තිකදෘෂ්ඨි ඇත්තේ නාස්තිකවාදියාත් වෙයි, ඒ කාමය විපාකය යන දෙදෙනාගේම ප්‍රතිබාහනයෙන් අහෙතුකදෘෂ්ඨි ඇත්තේ අහෙතුකවාදියා නමුදු වන්නේය.

යමෙක් වනාහි විපාකය කාමය යන දෙදෙනාගේ ප්‍රතිබා හනයෙන් අහෙතුකදෘෂ්ඨි ඇත්තේ අහෙතුකවාදී වේද, හේ තෙමේ සභාවයෙන්, හෙතු අවිද්‍යමානකල්හි විපාකප්‍රතිබහනය වනහෙයින් නාස්තිකදෘෂ්ඨිඇත්තේ උච්ඡෙදවාදීත් වෙයි, විපා කය අවිද්‍යමාන කල්හි කාමය නිරර්ථකවන හෙයින් කාමප්‍රතිබාහ නයෙන් අකිරිය දෘෂ්ඨි ඇත්තේ අකිරියවාදීත් වන්නේය. යනු එහි ටීකානයවීය.

නිකෙඛපකකණඩටීකායෙහිදු වාදත්‍රය දක්වා නැවත මේ වාදයන් අතුරෙන් පළමුවන වාදය තෙමේ බඞ්ඛන මොක්ඛයන්ට ඇති හෙතුව හෙවත් සංකිලෙසසුඛින්ට ඇති හෙතුව වලකන්

නේත් කම්ය වලඇයි, දෙවන වාදය කම්ය වලඇයි, තෙවන වාදය විපාකය වලඇයි, මේ මොවුන්ගේ වෙනසයයි කියනලද් දේය.

යමෙක් තුමූ වනාහි ඔවුන්ගේ "කරොතො න කරියති පාපං නත්ථි හෙතු පච්චයො මතො උච්ඡිජ්ජති" යන දෘෂ්ටියගෙන රාත්‍රිසථාන දිවාසථානයන්හි හුන්නාහු ඒ දෘෂ්ටිය දක්වන ග්‍රන්ථයන් ඉගෙන හදාරද්ද ඒ පිළිපිළ අර්ථය විමසද්දා එකල මිථ්‍යාවිතර්කයෙන් සමාධිගතකරුනු ලබන්නාවූ මිථ්‍යාව්‍යායාමයෙන් අනුබලකරනලද්දාවූ ආත්මසභාවය සභාවයයි ගන්නීවූ මිථ්‍යාසතියයි ලබනලද නම් ඇති ලබ්ධිසහගතවූ තෘෂ්ණා තොමෝ පවත්නීය. යථොක්තවූ විතර්කාදිප්‍රත්‍යය ලැබීමඇති එම අර මුණෙහි සිටි බැවින් අනෙකාග්‍රභාවය හැර එකඟවූයේ අකුරෙහි ගසා තබනලද්දක් මෙන් චිත්තශීඝ්‍රයෙන් කියනලද මිථ්‍යාසමාධිය වෙයි. නොයෙක්වර ඒ ආකාරයෙන් පූර්ණභාගයෙහිවූ ජවනවාරයන් පැවති කල්හි සියලුලට පසුජවනවාරයෙහි සත්ජවන් කෙනෙක් දිවෙත් ප්‍රථම ජවනයෙහිදී පිළියම් සහිතයෝ වෙත් ද්විතීයාදීජවන්හිද එසේමැයි. මෙය ධම්මසභාවය පමණක් දැක්වීම වෙයි. එකොණෙහි ඔවුන්ගේ පිළියම් කටහැකිබව වලඇතිම කවුරුන් විසින්වත් නොකට හැක්කේය. සත්වන ජවනවාරය දිවූකල්හි බුදුවරයන් විසින් වුවත් පිළියම් නොකටහැක්කෝ වෙත් නොනවත්නාහු වෙත්. කුකුරුමුවුවන් හා සමානයෝ වෙත්. කිසිවෙක් තෙමේ ඒ ත්‍රිවිධ මිථ්‍යාදර්ශනයන් අතුරෙන් එක්තරා එකකට ඇතුළත් වෙයි කිසිවෙක් දෙකකට ඇතුළත් වෙයි කිසිවෙක් තුනටම ඇතුළත් වෙයි. ඔවුනතුරෙන් යමෙක් තෙමේ ඒ ත්‍රිවිධ දර්ශනයන් අතුරෙන් එක්තරා එකෙක්හිම අභිනිවේස වේද භාවනාවශයෙන් ආසෙවනයත් පැවතීද හේ තෙමේ එකම දර්ශනයකට ඇතුළත්වූයේ වෙයි, යමෙකුගේ වනාහි දෙකකැ හෝ තුනෙහිම හෝ අභිනිවේසයවීද භාවනාවශයෙන් ආසේවනයත් පැවතීද හේ තෙමේ දර්ශන දෙකකට හෝ තුනටමද ඇතුළත්වූයේ වෙයි එකෙකු විසින් යම් දෘෂ්ටියක් තොමෝ පෙර උභයපටිබාහකතා මුඛයෙන් හෙවත් කම්ය විපාකය යන දෙදෙනාගේ ප්‍රතිබාහනභාව මුඛයෙන් දක්වනලදද ඒ අහෙතුක දෘෂ්ටි තොමෝ සියලු මිථ්‍යාදෘෂ්ටිභාවසංඛ්‍යාතවූ අර්ථය සිඛරන්නීද ඔතොමෝ පූර්ණභාගය භජනය කරන්නී මිච්ඡත්තනියමයට ඇතුළත් වන්නීය, ඕතොමෝ වනාහි සවුදරිද්දෙන් හෙතුසමුදයාගමඝකිණ් හෙවත් හෙතුන් සමූහයක්හු

ගේ පැමිණීම කරනකොටගෙන සිඩවූ හෙයින් වෙන් වෙන්වූ අර මුණුඇති විශෙෂාධිගමයන්ගේමෙන් එකට නොම්පදීමෙන් අසංකිණ්ණවූවාහුමයයි දක්වයි, එහා මිථ්‍යාදෘෂ්ටියකට ඇතුළත්වූ කල්හිද දෙකකට හෝ තුනටම ඇතුළත් කල්හිදු නියතමිථ්‍යා දෘෂ්ටිකයා නම් වන්නේය. එසේ කිමෙන් මිථ්‍යාදර්ශන තිදෙනාගේම සමාන බලඇතිබවද සමාන ඵලඇතිබවද දක්වයි. එහෙයින් ගම් දර්ශනයෝ තිදෙනම එකොක්හට උපන්නාහු අසංකිණ්ණවූවාහුම එකක් විපාකදුන්කල අනික් දර්ශනයෝ අනුබල දෙන්නෝ වෙත්.

මේ නියතමිථ්‍යාදෘෂ්ටික තෙමේ සවර්‍ගීමාර්ගාවරණයට හා මොක්ෂමාර්ගාවරණයටද පැමිණියේ වෙයි. එම අත්බැවට අනතුරුව සවර්‍ගයටද යන්නට නොහැක්කේවෙයි, මොක්ෂයට යනු බැරිබැව් කුමට කියනමෝද. මේ සත්වතෙමේ සංසාරකාන්තාරෙහා, ගැඹිවිලෙක,බෝහෝසෙයින් මෙබන්දහට භවයෙන් නැගිසිටීමක් නම් නැත යනු **සාමඤඤඵලසූත්‍රවර්ණනා** නයවන්නේය.

යමෙක්තුමූ වනාහි.පෙ.ගැඹිවිලෙක සංසාරකාන්තාරෙක" යන මේ වචනය නෙයාර්‍ථ ඇත්තකි හෙවත් පැමිණවිය යුතු අර්‍ථ ඇත්තකි, නීතාර්‍ථ ඇත්තක් හෙවත් පමුණුවනලද අර්‍ථ ඇත්තක් නොවෙයි, එහෙයින් එය විවෘතකොට හෙවත් ප්‍රකට කොට දැක්වීමට "කිං පනෙස" යනාදිය කියනලද්දේය. එහි අදහස නම්: එක් අත්බැවෙක්හි පමණක් නියතමිථ්‍යාදෘෂ්ටිකයා වේද නැතහොත් අනික් අත්බැවිහිත් නියතමිථ්‍යාදෘෂ්ටිකයා වේද? එක් අත්බැවෙක්හි පමණෙක, ආසෙවනා හෙවත් පුරුදු කිරීම් වශයෙන් වනාහි භවාන්තරයෙහිත් ඒ ඒ දෘෂ්ටිය රැවි කෙරේමය. "අබලං දුබ්බලං න කුසලං" කි පක්ෂය මෙන් මහාබල ඇත්තකි, එක් අත්බැවෙක්හි පමණක් නියතමිසදිටුවා වෙයි.

අනික්‍රමයකින් කියනකල සම්මත්තනියාමය මෙන් මිථ්‍යත්ත නියාමයද අතිශයින් කෙළපැමිණියේ වෙයි, මිථ්‍යාදෘෂ්ටීන් අතුරෙන් මොවුහු කොටිප්‍රාප්තයහ මේ වට්ටඛාතුවෙතනාව කෙසේවන්නීද යත්: ඒ දක්වනු පිණිස ආසෙවනා වශයෙන්, යනාදිය කීයේය. එහෙයින් යම්සේ බාලයෙක් යම් කිසි ගොහොරුවෙක්හි වරක් ගැටුනේනම් ගැටුනේම වේද එපරිද්දෙන් වට්ටඛාණුවෙතනා තොමෝ යම්බදු ප්‍රත්‍යයයන්නිසා උපන්නී නම් උපන්නීමය එය එක් අත්බැවෙක්හි පමණෙක, මොහු ඒ මිථ්‍යාදර්ශනයට ඇතුළත්වූයේ නැවත කිසියම් කාලෙක්හි

ර්ට ප්‍රතිපක්ෂහෙතුන් ආපාතගතවියහැකි බැවින් එයින් ඔහුගේ හිස එසවීමක්ද නොවන්නේයයි නොකියයුත්තේය. එහෙයින් "යෙහුයෙහන" යන බාහුල්‍යවචනිවචනය කියනලද්දේය යනු අපණ්ණකසූත්‍රවණ්ණනානය හා මිඛානය වන්නේය.

මෙසේ නියතමිථ්‍යාදෘෂ්ටිතොමෝ ආනන්තරිය කර්මයන්ටත් වඩා අතිශයින් බලවතැයි දතයුත්තීය.

එහෙයින්,

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහාසාවජ්ජං, යථයිදං භික්ඛවෙ! මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි පරමානි භික්ඛවෙ! වජ්ජානීති"යි **එකඛඟුත්තරයෙහි** වදරන ලද්දේය.

එහි සාමාන්‍ය අදහස නම්: මහණෙනි! යම් බදුවූ මේ මහවරදෙක් වේද එබදු අනික් එකම සවභාවයකුත් මම බුඬඥානයෙන් නොමදකිමි. කෙබදුමහවරදෙක් යත්, යම් බදුවූ මේ මිථ්‍යාදෘෂ්ටිසංඛ්‍යාහවූ මහවරදෙක් වේනම් එබදු සවභාවයයි. මහණෙනි! සියලුම වරද මිථ්‍යාදෘෂ්ටිය පරමකොට ඇත්තාහ හෙවත් මහවරදයයි කියනලද පංචානන්තරිය කර්මයන්ටත් වඩා උස්ව නැඟී පවත්නා හෙයින් අතිශයින් මහාසාවද්‍යයයි යනුයි.

පංචආනන්තරිය කර්මයෝ වනාහි මහාසාවද්‍යනම, ඔවුන්ටත් වඩා මිථ්‍යාදෘෂ්ටියම අතිශයින් මහාසාවද්‍යය යනු එහි භාවයයි. කුමක්හෙයින්ද යත්: ඒ ආනන්තරිය කර්මයන්ගේ වනාහි පරිවෙජ්දයක් හෙවත් විපාකවශයෙන් අවසානයක් පිරිසිදීමක් ඇත්තේය, සතර ආනන්තරිය කර්මයෝ වනාහි නරකයෙහි උපදවන්නාහුයයි කියනලදහ, සංඝභෙදක කර්මයද නරකයෙහි කල්පසථායීම වෙයි මෙසේ මොවුන්ගේ පරිවෙජ්දයක් ඇත්තේය, එහෙයින් කෙළපෙණෙයි. නියතමිථ්‍යාදෘෂ්ටියගේ වනාහි පිරිසිදීමක් නැත, ඕතොමෝ වනාහි සසරමුලෙක හෙවත් එයින් යුත් පුහුලා සසරඝණුවෙකි, එහෙයින් එයින් යුකතවූවාහට ඒ මිසදිටුභාවය නොහරනතාක් නැවතද ඒ සවභාවයම ඵලවන බැවින් ඔහට භවයෙන් නැඟිසිටීමක් නැත. සජීප්‍රකාරයෙන්ම නැත්තේ නොවෙයි, යම්බදු හෙතුන් නිසා මේ පුද්ගලතෙමේ ඒ මිථ්‍යාදර්ශනයට බැසගත්තේද නැවත කිසියම් කලෙක්හි ර්ට ප්‍රතිපක්ෂහෙතුන් ඇතිවියහැකි නිසා එයින් ඔහුගේ හිස එසවීමක් නොවන්නේමයයි නොකිය යුත්තේය. යමෙක්තුමූ ඒ මිසදිටුහුගේ වචනය ඇසියයුත්නක් කොට හිතද්ද ඔවුන් වරදවා පිළි

පදින්නවුන් කරවයි. ඒ මිථ්‍යාදර්ශනයෙන් යුක්තවූවාහට සුගතිය හෝ මාගීය හෝ නැත්තේය, කප නස්නාකල මහජනයා බඹලොවැ උපදනාකල නියතමිසදිටුතෙමේ එහි නොයිපදී දනුලබන සක්වළකෙරෙන් පිටසක්වළ උපදනේය, කිමෙක පිටසක්වළ නොමදැවෙන්නේද? දැවෙන්නේමය, එය දනකල්හි මේ නියතමිස දිටුතෙමේ දනුලබන්නාවූද නොදනුලබන්නා වූද සක්වළවල්අතර යම්බඳු ලොහොකුඹුනිරයෝ වෙද්ද එබදුවූ එක්තරා අවකාශ ස්ථානයෙකැ සක්වළ දනු ලබන කල්හිත් නොදනුලබනකල්හිත් තමන්ගේ කම්බලයෙන් පැසෙන්නේමයයි කියත්. යනු **එකඛහු තතරවණ්ණනා** හා **එහි ටීකානයයි**.

අහෙතුකදෘෂ්ටි අකිරියදෘෂ්ටි නාස්තිකදෘෂ්ටි යන මොවුන් අතුරෙන් එක්තරා එකක් ගෙන නොබැහැරලා සිටියාවූ යමෙක් ඇතහොත් ඔහු අවබොධකරවන්නට බුදුවරයන් සියයකටත් දහසකටත් නොහැකිවන්නේය. ඕහට මාගීය නොවළකනාලද් දේයයි දක්වයි. එහෙයින්ම අර්ථකථාවන්හි "යෙහුයෙන්න භව තො වුඬානං නත්ථීති"සි කියනලද්දේය.

මෙසේ නියතමිථ්‍යාදෘෂ්ටික තෙමේ ඔහු සේවනය කරන්න හුට පවා අනතරායකර හෙයින් දුරින්ම දුරුකටයුත්තේය. එහෙයින් **සාමඤඤඵලසූත්‍රවර්ණනා**යෙහි—

"තසමා අකල්‍යාණජනං ආසීවිසම්විොරගං,
ආරකා පරිවජ්ජයය භූතිකාමො විචකඛණො"යි

කියනලද්දේය.

යම් හෙයකින් අකල්‍යාණවූ නියතමිථ්‍යාදෘෂ්ටික තෙමේ මෙසේ සසරකණුබවටත් ප්‍රත්‍යයවේද එහෙයින් දිඝනිකායඅටුවා පරමාර්ථ යන මොවුන්ගේ වශයෙන් ගුණයෙන් තමන් වැඩෙනු කැමැත්තාවූ පණ්ඩිතසත්පුරුෂ තෙමේ ඒ අසත්පුරුෂමිථ්‍යා දෘෂ්ටික පුහුලා හලාහලවිෂ ඇති සර්පයෙකුමෙන් දුරින්ම දුරු කරන්නේය යනු එහි ටීකානය වන්නේය.

මෙසේ මේ ත්‍රිවිධ මිථ්‍යාදෘෂ්ටින් හෙතුකොටගෙනම කම්පථ භෙදය වන්නේය. අනික් දෘෂ්ටින් හෙතුකොටගෙන නොවන්නේය. මෙසේත් අපායගාමිනීභාවය හෙයින් කිසිම මිථ්‍යා දෘෂ්ටියක් නොගතයුත්තීමය. එහෙයින් **එකඛුත්තරයෙහි**

"නාහං භික්ඛවෙ! අඤඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙනෙවං සත්තා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති යථයිදං භික්ඛවෙ! මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨියා

හිකඛවෙ! සමන්නාගතා සත්තා නායසස පෙ උපපජ්ජන්තී ති''සි වදුළසේක

මහණෙනි! යමක් හෙතුකොටගෙන සත්වයෝ කාබුන්මරණින් මතු අපායෙහි උපදිද්ද ඒ මිථ්‍යාදෘෂ්ටිය බදුවූ අනික් එකම සවභාවයකුත් මම බුඩඳුනයෙන් නොමදකිමි. මහණෙනි! මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූ සත්වයෝ කාබුන්මරණින් මතු අපායෙහි උපදනාහසි වදුළසේක යනු එහි සාමාන්‍ය අදහස වන් නේය

සමහර මිථ්‍යාදෘෂ්ටිකෙනෙක් සවගීාවරණද මාගීාවරණද වන්නීය, සමහර මිථ්‍යාදෘෂ්ටිකෙනෙක් සවගීාවරණ නොව මාගීාවරණ වන්නීය සමහර මිථ්‍යාදෘෂ්ටිකෙනෙක් සවගීාවරණ මාගීාවරණ යන දෙකම නොවන්නීය ඔවුනතුරෙන් අහෙතුක අකිරිය නාස්තික යන මේ ත්‍රිවිධ දෘෂ්ටිහු සවගීාවරණද මාගීා වරණද වන්නාහ. කුමක් හෙයින්ද යත්: කම්පථප්‍රාපනවීමෙන් මහාසාවද්‍ය බැවිනි

''සසසතො අයං ලොකො'' මේ ලොකය සාසවතය යනාදි යෙන් දක්වනලද දසවසතුකඅන්තග්‍රාහික මිථ්‍යාදෘෂ්ටිය සවගීාවරණ නොව මාගීාවරණ පමණක් වෙයි කුමක්හෙයින්ද යත් විපයීාස දැකුම් ඇති බැවිනි. සවගීාවරණ නොවෙයි කුමක් හෙයින්ද යත්: කම්පථප්‍රාපන නොවන හෙයිනි. විංශති වසතුකවූ සතකායදෘෂ්ටි තොමෝ සවගීමාගීා යන දෙකම ආවරණය නො කරන්නේය

ඇතැම් මිථ්‍යාදෘෂ්ටිකෙනෙක් සවගීාවරණද මාගීාවරණද වන්නීය, ඇතම් මිථ්‍යාදෘෂ්ටිකෙනෙක් සවගීාවරණ නොව මාගීා වරණ පමණක් වන්නීය, ඇතැම් මිථ්‍යාදෘෂ්ටිකෙනෙක් සවගීා වරණත් නොවන්නීය මාගීාවරණත් නොවන්නීය, ඔවුනතු රෙන් අහෙතුක අකිරිය නාසපික යන මේ ත්‍රිවිධ දෘෂ්ටිහු කම් පථප්‍රාපනවීමෙන් මහාසාවද්‍ය වනබැවින් සවගීාවරණද මාගීාවර ණද වන්නීය. ''සසසතො ලොකො'' යනාදීන් වදුළ දසවසතුක අනනගහාහික මිථ්‍යාදෘෂ්ටිය කම්පථප්‍රාපන නොවන හෙයින් සවගීාවරණ නොව විපරිතදශීන ඇතිබැවින් මාගීාවරණ පම ණක් වන්නීය. රූපය ආතමවශයෙන් දකී යන උවෙඡද දෘෂ්ටි එකද, ආතමය රූපඇත්තක් කොට හෝ දකී, රූපය ආතමය කෙරෙහි ලා හෝ දකී, ආතමය රූපය කෙරෙහි ලා හෝ දකී යන සාසවත දෘෂ්ටිහු තුනද යන මේ සතර දෘෂ්ටිහු රූපසකඛය

කොරෙහිද මෙසේම සතරක් වෙදනාසකඛය කොරෙහිද සතරක් සඤ්ඤසකඛය කොරෙහිද සතරක් සංඛාරසකඛය කෙරෙහිද සතරක් විඤ්ඤාසකඛය කොරෙහිදැයි මෙසේ පංචසකඛය කෙරෙහි විස්සක්වූ වීසතිවසතුඃඛ සකකාය දෘෂ්ටිය කම්පථ ප්‍රාප්ත නොවීමෙන් සවගීාවරණද මාගීාවරණද නොවන්නීය.

මේ අර්ථය කියා තදනන්තරව ඒ සියල්ලෝම මාගීාවරණ යහ ප්‍රථම මාගීයට අන්තරාය කරයහ සවගීාවරණ නොවන්නා හුයයි කියනලද්දහ.

විපරීතදර්ශීනය නම්: 'සවගීාවරණත් නොවෙයි මාගීාවරණත් නොවෙයි' යන මෙය ධම්මය ඉක්ම ගිය හෙයින් විරුද්ධය. එසේ ඇතිකල සකකායදෘෂ්ටිය නිඛිලදී මාගීාධිගමයනොවියයුතුය යන අදහසින් යථොක්තවිධානය ප්‍රතික්ෂේපනොට සවගීාපපන්නි යගේ අවිනාභාවාරභාවය කියන්නවුන් විසින් කියන දෘෂ්ටියගේ සවගීාවරණභාවය නමුදු අනුඤ්ඤාකරනලද්දී වන්නිය යන මේ වාද යයි, මේ වාදයද ප්‍රතික්ෂේපකාරන්නහු විසින් ඒකාන්තගරුතර සාවද්‍යවූ හෙයින් සඟපමුණුවාලන්නට සම්මාවූ මිථ්‍යාදෘෂ්ටියක් නම් නැත්තේය. ඒනානත්තයෙන් නරඛයෙහි හිඳුවාලන්නීමයයි කියනලද්දේය. යනු අඤ්ඤත්‍රරාගබබණාණනා නාමඤ්ඤා නිරෙඛ පඛණ්ඩිවණාණනා යන මෙතෙක් තැන අදහසවන්නේය.

අකිරිසවාදී කථාවයි.

අකිරියවාදීදී කථාවට අනතුරුව පාණාතිපාතාදී නානා රම්මණකථාවෝ දක්වනුලැබෙත්. හේ කෙසේද යත්:—මෙහි ප්‍රාණවඩය ජීවිතෙන්ද්‍රිය අරමුණුකොට ඇත්තේය, අදත්තා දානය අබ්‍රහ්මචරියය සුරාමෙරයපානය යන මොහු රූපධම්මයන් අතුරෙන් රූපායතනාදීවූ සම්භර සංඛාර ආරම්මණයෝ වෙත්, මුසාවාදය යමෙක්හට බොරු කියයි නම් ඔහු ඇරැබූ පවත්නා හෙයින් සබ්බාරම්මණ වන්නේය, අබ්‍රහ්මචරියය සබ්බා රම්මණයයි සම්භරු කියත්, අදත්තාදානය යම් කලෙක සව යෙක් පැහැරගනයුත්තේවේද එකල සබ්බාරම්මණ වන්නේය, වැලිදු මෙහි සංඛාර වශයෙන් සත්වයන් සලකත්, ප්‍රඥප්ති වශ යෙන් නොසලකන්නාහ, පංචවෙර වශයෙන් බුද්ධඝෝෂාචා ර්ය්‍යාණන්ගෙහි කියන ලද්දේය.

අත්ථසාලිනී සම්මාදිට්ඨි සඞ්ගහිතසුත්තවණ්ණනාවන්හි ප්‍රාණාති පාතය ජීවිතෙන්ද්‍රිය අරමුණුකොට ඇති හෙයින් සංඛාරාරම්මණ

වෙයි, අදින්නාදානය සත්තාරම්මණ හෝ සංඛාරාරම්මණවෙයි, මිච්ඡාචාරය ඇපශී වශයෙන් සංඛාරාරම්මණවෙයි, සත්තාරම්මණයයිද සමහරු කියත්. මුසාවාදය සත්තාරම්මණ හෝ සංඛාරාරම්මණ වෙයි, එසේම පිසුනාවාචා ඵරුසාවාචා යන මොහුද සත්තාරම්මණම වන්නාහ, සම්ඵප්පලාපය දිඨසුතමුත විඤ්ඤත වශයෙන් හෙවත් රූපශබ්ද වශයෙන් හා ගන්ධරස ඇපශී දැනීම් වශයෙන්ද සත්තාරම්මණ හෝ සංඛාරාරම්මණ හෝ වෙයි. එසේම අභිඣා ව්‍යාපාදයෝද සත්තාරම්මණ වෙත්. මිච්ඡාදිට්ඨිය තෙහුම්භාධම්මවශයෙන් සංඛාරාරම්මණ වන්නීයයි කියනලද්දීය.

අදින්නාදානය සත්තාරම්මණයයි යන මේ ශික්ෂාපදය පරිත්තාරම්මණමද?යන මේ ප්‍රශ්නයාගේ විචාරීම පෙළව විරුඬද? යමක් වනාහි ප්‍රාණාතිපාතාදී දුස්සීල්‍යභාවයට අරමුණුවීද ඒ අරමුණම ඒ ඒ විරමණයට ඉක්මවියයුතු වසතු වනසෙයින්ම විරතිවීමෙන් සත්තාරම්මණ හෝ සත්තසංඛ්‍යාත සංඛාරාරම්මණ හෝ වන්නේය. ඒ නිසාම කියනලද හෙයින් කිසිවිරොධයක් නොවන්නේය. එසේ හෙයින් **සම්මාහවිනෝදනියෙහි** මෙහි යමක් සත්තාරම්මණයෝයයි කියනලද්දාහු නම් ඔවුන් සත්තය යන සංඛ්‍යාවට ගියකල්හී සංඛාරඅන්ම අරමුණු කරන්නාහුයයි කියනලද්දේය.

මින්මත්තෙහිදු මේ නයම වන්නේය. විසභාගවසතුනු සත්‍රී පුරුෂයයි ගතයුතු හෙයින් සත්තාරම්මණයයි සමහරු කියත්. එකෙක් දක්නාලද්දේය. දෙදෙනෙක් අසනලද්දාහුය යනාදී වශයෙන් සම්ඵප්පලාප කාථනයෙහි දිඨසුතමුතවිඤ්ඤත වශයෙන්ද "තථා අභිජ්ඣා"යන මෙහි තථා ශබ්දය දිඨසුතමුත විඤ්ඤතවශයෙන්දැයි යන මෙයද එලවා තබයි. සත්තයෝ සංඛාරාරම්මණ නොවන්නාහුය. කුමක් හෙයින්ද යත්: එයම දර්ශනාදි වශයෙන් ආසාකරණ හෙයිනි. ඕපපාතික සත්ත්වයෝ නැතැයි පවතිනු ලබන්නාවූද මිච්ඡාදෘෂ්ටි තොමෝ තෙහුම්භාධම්ම විෂය කොට ඇත්තීමය යන අදහසින් සංඛාරාරම්මණ බව කියනලද්දීය. කෙසේ වනාහි මිච්ඡාදෘෂ්ටියට සියලු තෙහුම්භාධම්මයෝ අරමුණු වන්නාහුද යත්: සාධාරණ හෙයිනි. පින්පව්භාම්පලවිපාකා නැතැයි පවතිනු ලබන්නාවූ මිච්ඡාදෘෂ්ටිය විසින් තමන්ගේ රූපාවචරඅරූපාවචරධම්මයෝද ගන්නාලද්දාහුම වෙත්. යනු **සම්මාදිට්ඨිසුත්‍ර සහනිසුත්‍ර ටීකා** ආදිය වන්නේය.

පාණාතිපාතාදි ආරම්මණඝටාසි.

කම්පථශබ්දඋච්චය වනාහි කම්යෝම දුගතිසුගතීන්ගේ ප්‍රවර්තනයට හෙවත් පැවැත්මට උපායවූ හෙයින් මාගීයවූ හෙයින් කම්මපථ නමැයි සම්මාදිට්ඨිසූත්‍රවණ්ණනා හා නෙට්ටිකා වන්හි අභිප්‍රාය වන්නේය.

චෙතනා තොමෝ අභිධර්මයෙහිදී කම්පථයන්හි ලා නොකියනලද්දී නොවෙද? පිළිවෙළින් සතක්හුගේ කම්පථ භාවය නොකියනලද්දේ නොවේද? ඊට හෙතුභාවරේද නොකිමට අනික් හෙතුකෙනෙක් ඇතිබැවින්ද නොවෙයි එහි චෙතනාවගේ කම්පථභාවයක් නොමැති බැවින්ද නොවෙයි, හෙතු කිම යත්: කම්පථරාශියෙහි ලා නොකිම හෙයිනි, නොකිමට හෙතු කිම යත්: කිසිකලෙක වනාහි කම්පථ වෙයි හැමකල්හි නොවෙයි එසේකල කම්පථවීම අනියතය, කම්පථභාවයාගේ අනියත භාවය නිසා කම්පථරාශියෙහි ලා නොකිම වීය. යම්කලෙක වනාහි කම්පථවීද එකල කම්පථරාශියෙහි ලා සංග්‍රහය නොවල කන ලද්දේය. එහෙයින් මෙහි කිහ ඉදින් හැමකල්හිම චෙතනාවගේ කම්පථභාවය නොවන බැවින් කම්පථභාවය අනියත වීනම් එහෙයින්ම කම්පථරාශියෙහි ලා නොකීමත් වීනම් කම්පථභාවයට නොපැමිණි අභිධ්‍යාදීන් ඇතිබැවින් ඔවුන්ගේත් කම්පථභාවය අනියතය, එහෙයින්ම ඔවුන්ගේත් කම්පථරාශියෙහිලා නොකීම වන්නේ නොවේද? ඒ අභිධ්‍යාදීන්ගේ කම්පථභාවය හා සහාග භාවය ඇත්තාහුයයි එහි කියනලද බැවිනි. ඉදින් එසේ වීනම් චෙතනාවත් එහි ලා කියයුතු වන්නීය, එය සැබැයි, ඒ ප්‍රාණාතිපාතාදිය වනාහි ප්‍රකටය ඊට කම්පථභෙදයයි නොකියනලද්දේ වන්නේය, චෙතනාවගේ වනාහි "චෙතනාහං භික්ඛවෙ! කම්මං වදාමි"යි 'මහණෙනි! මම චෙතනාව කම්මයයි කියමි' යනාදිය වදාළබැවින් කම්භාවය ප්‍රකට වීය. කම්යම සුගතිදුගතීන්ටද එයින් උපදනා සුඛදුඃඛයන්ටද උපාය වන බැවින් මාගීභාවයෙන් පැවැත්තේ කම්පථයයි කියනු ලැබේකුයිද එකම්යාගේ පථභාවය ප්‍රකටය අභිධ්‍යාදීන්ගේ වනාහි චෙතනා සමඟවන බැවින් සුචරිතයද චෙතනාජනිත භාවයෙන් සුගතිදුගතීති දෙකද එයින් උපදනා සුඛදුඃඛයන්ට උපාය භාවයද ප්‍රකට වෙයි. කම්පථභාවය එසේ ප්‍රකට නොවෙයි, ඒ අභිධ්‍යාදීන්ම ඒ සභාවයෙන් දක්වන්නට අභිධර්මයෙහි 'චෙතනා තොමෝ කම්පථරාශි භාවයෙන් නොකියනලද්දීය. එසේම

හෝ වෙතනා තොමෝ ඒ අභිඛ්‍යාදීන් සමග නොකියන ලද්දී යයි දතයුතුය යනු **සඞ්ගීතිසූත්‍රවිභාවනය** වන්නේය.

අකුශලකර්මපථකථායි.

යථොකතවූ දසඅකුසලකර්මපථයන් කෙරෙන් විරමණය නම්:-අජීවශයෙන් ප්‍රාණාතිපාතයෙන් විරමණය අදත්තාදාන යෙන් කාමමිථ්‍යාචාරයෙන් මුසවාදයෙන් පිසුනුවදනින් එරුෂ වදනින් නිශ්ඵලවදනින් විරමණය අනභිඛ්‍යාය අව්‍යාපාදය සම්‍යක්දෘෂ්ටිය යන මොහුම **සඞ්ගීතිසූත්‍රාදීන්හි** කියනලද දසකුසල කර්මපථ නම් වන්නාහ. ඔවුනතුරෙන් ප්‍රාණාතිපාතාදිහු **සීලකඛ්ඛවගීවෙහි කූටදන්තසූත්‍රවණ්ණනාවෙහි** කියනලද්දාහ. පාණාතිපාතාවෙරමණී යනාදියෙහි වෙරමණී නම්:-විරතියයි කියා ඒ විරතියගේ ත්‍රිවිධ බැවි කියනලද්දේය. වෙරයට හෙතු බැවින් වෙරතාම්, ප්‍රාණාතිපාතාදි පාපධර්මය වෙරයයි කියනලද්දේය. "තං මනති මයි ඉධ සිතාය කතමා ගච්ඡතීති තජ්ජන්නී විය නිවාරෙතීති=වෙරමණී" යනුද "තතෝ වා පාපධම්මතෝ විරමති එතායාති=විරමණී" යනුද නිර්වචන හෙයින් මා මෙහි සිවියදී කුමට එන්නීදැයි කියා තර්ජනය කරන්නාක් මෙන් වලකානුයි හෝ ඒ පාපධර්මයන් කෙරෙන් මැය කරණකොට වෙන් වේනුයි හෝ විරමණියයි කියයුතුතන්හි නිරුක්ති නයින් ඉකාරයට ඒකාරයක් කොට 'වෙරමණී' යයි කියනලදැයි යනු එහි ටීකා නයයි.

සම්මාදිට්ඨිසූත්‍රවණ්ණනාවෙහිදු වෙරං මණතීති=වෙරමණී: විරමතිවා එතාය කාරණභූතාය වෙරමහා පුග්ගලොති=වෙරමණී: යනු නිර්වචන හෙයින් වෙරය දුරුකෙරෙනුයි හෝ මැය කාරණා වීමෙන් පුද්ගල තෙමේ වෙරය කෙරෙන් වෙන් වේනුයි හෝ විරමණියයි කියයුතුතන්හි විකාරයට වෙකාරයක් කොටද 'වෙරමණී'යයි කියා ඒ විරමණයාගේ ත්‍රිවිධබව කියනලද්දේය. 'වෙරං' යනු ප්‍රාණඝාතාදිවූ පාපධර්මයයි. හේ වනාහි වෙරහෙතු බැවින් වෙරයයි කියනලද්දේය. තං මණති මයි ඉධ සිතාය කර්මඵලය සීති තජ්ජන්නී විය නිවාරෙතීති-වෙරමණී: යනු නිර්වචන හෙයින් මා මෙහි සිවියදී කුමට එන්නීදැයි තර්ජනය කරන්නාක්මෙන් දුරුකෙරේනුයි වෙරමණී නම් වන්නේය. එහෙයින් පජහති යන වචනය කිය. විරමණියයි කියයුතු තන්හි නිරුක්ති නයින් විකාරයට වෙකාරයක් කොට වෙරමණියයි කීයන ලදැයි යනු

එහි විභා නයයි...බුද්දඛාපාඨවණ්ණනායෙහි 'වෙරමණී' ශබ්ද දෘඪිය යටකි පරිදිම වන්නේය. එහි 'විභාරස්ස වෙඛාරං'යි කිය නලද්දේ ව ශබ්දයට නිශ්‍රයවූ ඉඛාරය වීමෙන්වූ 'වි' යන අක්ෂර යයි, එසේම වෙඛාරයයි අර්ථගත්ඛාල ඉඛාරයට එඛාරය වීමෙනි, මෙයින් සමාහන්ඛය වෙයි. ඛන්ඛාපි යන තන්හි 'අපි, ශබ්දයෙන් එඛාරය හෝ වෙඛාරය හෝ නොකිරීමද හඟවයි, එහෙයින් පඨම්වයම සුතුයි දන්නේය...එහෙයින් බුද්දඛාපාඨවණ්ණනා යෙහි "වෙරමණීසික්ඛාපදං"යි දෙපරිද්දකින් හඳුරනැයි කියනලද්දේය...සමපත්තවිරතිය සමාදානවිරත්ය යන ලෞකික විරති වය සියලුම වණ්ණනාවන්හි එඛාසමානය, ලොකොත්තර විරතිය වනාහි සෙතුඛාත විරතියයි කුටදන්තසුත්තවණ්ණනායෙහි කියන ලද්දීය...සමුච්ඡේද විරතියයි සෙසු වණ්ණනාවන්හි කියනලද්දේය...නොසමාදන් සිල්ඇත්තහුගේ තම වෙත ඵලඛසිටියාවූ ඉක්මවිය යුතු වසනුහු කෙරෙන් වෙන්වීම සම්පත්තවිරති නම්, සමාදන්වීම් මඟයෙන් උපන්නාවූ විරති නොමෝ සමාදාන විරති නමැයි සුභසුත්තටීඛායෙහි කියනලද්දේය...

සෙතු නම් ආර්‍යමාර්ගයයි, කියනලද්දේය රිට අනාගතවී පාප ධර්මයන්ගේ සමුච්ඡේද වශයෙන් නැසිම්සංඛ්‍යාවූ විරතිය සෙතු ඝාත විරතිනමැයි කුටදන්තසුත්තටීඛායෙහි කියනලද්දේය... කෙලෙසුන්ගේ සමුච්ඡේදන වශයෙන් පැවති විරති නොමෝ සමුච්ඡේද විරතිනමැයි සම්මාදිට්ඨිසුත්තටීඛානයයි...අර්ථවශයෙන් වනාහි වෙරමණී යනු කුසලචිත්තසමප්‍රයුක්තවූ විරතියයි සම්මා දිට්ඨිසූත්‍රවණ්ණනායෙහි කියන ලද්දේය...අර්ථශාලිනියෙහිද එසේ මැයි. ඒ දෙතන්හිම ලෞකිකාලොකොත්තර විරතීහු කියනලද්දාහ...බුද්දඛාපාඨවණ්ණනායෙහි වනාහි එඛානතායෙන් මේ වෙරමණී නොමෝ නම් ලොකොත්තරවූවාද ඇත, මෙහි වනාහි 'සමාදියාමි'යි කියනලද බැවින් සමාදානවශයෙන් පැවති විරතිය වෙනුයි කාමාවචරකුසලචිත්තසමප්‍රයුක්ත විරතියයි කියන ලද්දේය...මෙසේ ලොකොත්තරවිරතිසඞ්ඛ්‍යාතවූ සමුච්ඡේද විරතිය හැර අනික් සමපත්තසමාදාන යන විරතිවයම කියන ලද්දාහ...

දැන් ආරම්මණාදි විභාගය සමඟ විරතිත්‍රය ආරතිවිරති පාපා යන මෙහි මතුපහළවන්නේය...යථොක්තවූ මේ කුසල කම්පථයෝ තිවාරිකවූ කුසල කායවාක්මනඃකර්මයෝ වෙත්. කෙසේදයත්: යම් කලෙක වනාහි වචනයෙන් කියන්නට නොහැකියෙක් "පාණාතිපාතා අදින්නාදානා කාමෙසු මිච්ඡාචාරා

පටිවිරමාමී"ති ශික්ඛාපදත්‍රය හඤ්ඤමුද්‍රභාෂායෙන් ගනිද එකල කම්මයද කායකම්මයවෙයි වාරයද කායවාරයයි යම්කලෙක වනාහි වාග්භෙදය නොට ගනිද එකල කම්මය කායකම්මය වේ වාරය වනාහි වාග්වාරය වේ. යම් කලෙක වනාහි කායවාක් අභයන් නොසොලවා සිතින්ම ගනිද එකල කම්මය කායකම්මය වෙයි. වාරය වනාහි මනොවාරය වෙයි. මුසාවාද, වෙරමණි ආදීවූ චතුඃඝාය වනාහි කිනසින්ම කායාදියෙන් ගන්නාහටද මේ නයම වන්නේය. මෙසේ කුසල්වූ කායකම්වාග්කම්මයෝ වාරත්‍රයෙහිම උපදනාහුය. එ විත්තයන්ගෙන් යුකතවූ අනභිඩ්‍යාදීහු වනාහි චෙතනාපක්ෂයෙහි වූවාහු හෝ කායවාරයෙහි උපනත් වාග්වාරයෙහි උපනත් අනභිඩ්‍යාදීහු ප්‍රධානභෙසින් කායකම්ම වාග්කම්ම යන ව්‍යවහාරය නොලබන්නෝ හෝ වෙත්යයි කියනලද්දේය. ධම්මසංගණීපාළියෙහි "තිවිධා නිකඛවෙ! කායසචෙතනා කුසලං කායකම්මන්ති" යනාදිය වදාළ හෙයින් ප්‍රාණඝාතාදියට ප්‍රතිපක්ෂවූ ඒ විරති තොමෝ විශිෂ්‍යවූ චෙතනාවක්මැයි, ප්‍රාණඝාතයෙන් වෙන්වීම් ආදිය වෙත්නුයි "චෙතනාපකඛිකා වා"යි කියනලද්දේය. 'විරති පකඛිකා'යි නොකියනලද්දේය. අනභිඩ්‍යාසහගතසිතින් වනාහි කායාඟයන් සොලවා සැමලු හැමදීම් ගඳමල් ආදිය පිදීම් සැවැදීම් ආදිය කරන්නහුගේ කම්ය මනඃකම්ය වෙයි, වාරය වනාහි කායවාරය වෙයි. අනභිඩ්‍යාසහගතසිතින් වාඟයන් ක්‍රියාකරවා 'මෙරමාසතු මේ වස්තූපකරණය මට නොවන්නේනම් මැනවැයි' කියමින් අභිඩ්‍යා නොකරන්නාහටද අව්‍යාපාද සහගත සිතින් 'සියලු සත්වයෝ අවෙරීවූවාහු නිදුක්වූවාහු නිරොගිවූවාහු සැපඇත්තාහු ආත්මයන් පරිහරණය කෙරෙත්වා'යි කියන්නහුගේද සම්‍යක්දෘෂ්ටිසහගතවූ සිතින් 'දුන් දෙයෙහි විපාකඇත' යනාදිය කියන්නාහුගේද කම්ය මනඃකම්ය වෙයි, වාරය වනාහි වාග්වාරය වෙයි. මෙසේ කුසලවූ මනඃකම්ය කායවාග් වාරයන්හි උපදනේය. මෙහි චෙතනා තොමෝ වනාහි, කාය වාරයෙහි උපනත් වාග්වාරයෙහි උපනත් අනභිඩ්‍යාදිය ප්‍රධාන භෙයින් කායකම්ය වාක්කම්ය යන ව්‍යවහාර නොලබන්නීය යන අදහසවන්නේය. "තිවිධා නිකඛවෙ! මනඃසචෙතනා කුසලං මනොකම්මං"යි වදාළ හෙයින් වනාහි සවභාවයෙන්ම ඒ මනඃසචෙතනා තොමෝ අනභිඩ්‍යාදීන්ගේ පක්ෂයෙහි වූවා මනොකම්ය වන්නීය. එහෙයින් අට්ඨසාලිනියෙහි "අනභිජ්ඣාදී පකඛිකා වා"යි නොකියනලද්දීය. කායභාවාඟයන් වනාහි ක්‍රියා නොකරවා භෙවත් නොසොල්වා රහොගතව හිඳ සිතින්ම අන

භිඩ්‍යාදීසහගත සිත් උපදවන්නහුගේ කාමයද මනඃකාමය වෙයි, චාරය වනාහි මනොචාරයම වෙයි. මෙසේ කුසලවූ මනඃකාමය මනොචාරයෙහි උපදනේය. කායඝචාගඝයන් නොඅසාලවූ සිතන මෙම තන්හි වනාහි චෙතනාවත් චෙතනාසම්ප්‍රයුක්ත ධර්මයෝත් මනොචාරයෙහිම උපදනාහ. එහෙයින් චෙතනාවගේ අව්‍යවහාරිකභාවයක් නැත්තේය. එ චෙතනා නොමෝද මෙහි මනඃකාමය යන ව්‍යවහාරය ලබන්නිය. චෙතනාව චෙත නාකාමයයි. අනභිඩ්‍යාදීහු චෙතනාසම්ප්‍රයුක්තකාමය යන මෙප මණක්ම වනාහි මනොචාරයෙහි චෙතනාවගේ අභිඩ්‍යාදීන්ට වඩා මනඃකාමභාවයෙහී ඇති චෙනසය යනු **නාභිජ්ඣා නාදනුමිජ්ඣා අඤ්ඤාලිනිනය** වන්නේය.....මෙහි කිය. මේ ගාථායෙහි පාප විරතිය ගන්නාලද්දී නොවීද එසේ ඇතිබල කුමක් පිණිස "ආරති විරති පාපා"යි නැවත කියන්නේද? ඒ මෙසේ කියනලදී, යම් පාපයක්හු කාමපථවශයෙන් දෙශනාරූඪ ලද්දාහුද ඔවුන් කෙරෙන් විරතිය හෙවත් වෙන්වීම මේ ගාථා යෙහි කියනලද්දීය. යමෙක්හු පංචවෙර වශයෙන් කියන ලද්දාහුද ඔවුන්කෙරෙන් විරතිය එහි කියනලද්දීය. තවද පංචවෙරයන් අතුරෙන් ආදියෙහි කි සතරවෙරයෝ කාමකෙලශ යෝයයි **සිඟාලසූත්‍රයෙහි** කියනලද්දාහ. සුරාපානය හොගා පායමුඛයයි හෙවත් හොඟවිනාශයට ප්‍රධාන හෙතුයයි කියනලද්දේය. එහෙයින් සිගාලසූත්‍රදෙශනා වශයෙන් පාපවිර තිය දක්වන්නට "ආරති විරති පාපා" යනාදිය කියනලදැයි දතයුත්තේය. මෙම අර්ථය භගවතු කැමති අට්ඨාචාරීන් විසින්ද "පාණාතිපාතා ඛො ගහපතිපුත්ත! කම්මකිලෙසො" යනාදීවූ සිගාලසූත්‍රපාළිය එහිදක්වනලද්දීය. ඒ පාළිය මතුපහළවන්නීය.

එය තිබේවා, යමෙක් අකුසලකම්පථයෙන් වෙන් වේ නම් හෙතෙමේ අර්ථවශයෙන් කුසලකම්පථධර්මය සාරන්නේ නම් නොවේද යමෙක් ඒකුසලකම්පථධර්මය කෙරේ නම් හෙතෙමේ අර්ථවශයෙන් අකුසලකම්පථයන් කෙරෙන් වෙන් වන්නේ නම් නොවේද? මෙසේ ඇතිකල "දුනං ච ධම්මචරියා ච" යන මෙහි ධර්මචරණය නැවත කුමට කීයේද? ඒ මෙසේ කියතු ලැබේ, මේ ගාථාවෙහි ඒ පාපවිරතියගේ මඟලභාවය දැක්වීම පිණිස "ධම්මචරියා"යි කියනලද්දේය, ඇරත් ධර්මචරියාව නම් අර්ථවශයෙන් දසකුසලකම්පථධර්මයමැයි. හේ වනාහි **සාලෙය්‍යක සූත්‍රාදීන්හි** මෙසේ දක්වනලද්දේය, එහෙයින් සාලෙය්‍යක

සූත්‍රාදී දෙශනා වශයෙන් "ධම්මචරියා"යි කියනලදුයි දතයුත් තේය. අට්ඨවාචාරින් විසිනුදු "ධම්මචරියසමචරිය හෙතු ඛො ගහ පතයො" යනාදීවූ සාලෙය්‍යක සූත්‍රාදී පාළිය එහි දක්වනලදී.

කුශලකර්මපථකථාය.

මේ දෙවදූරුම් කර්මපථයන් අතුරෙනුදු කුසලකර්මපථයෝ සුචරිතයෝයයිද අකුසලකර්මපථයෝ දුශ්චරිතයෝයයිද කියනු ලැබෙත්. ඔවුනතුරෙන් දුශ්චරිතය අකරණීය බැවින් නොකට යුත්තේය. කටයුතුදෙය කරනතැනැත්තේ අත්තානුවාදදියට නොපැමිණෙයි, නොකටයුතුදෙය කරනතැනැත්තේ වනාහි ඒට පැමිණෙන්නේය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ **දුක්කඅභූතනා** යෙහි **ආනන්දසූත්‍රයෙහි** "එකංසෙනාහං ආනන්ද! අකරණීයං වදාමි. පෙ. සගහං ලොකං උපපජ්ජතීති"යි වදාළසේක.

එහි සංක්ෂෙප අදහස නම්:-ආනන්දය! කායදුශ්චරිතයද වාග් දුශ්චරිතයද මනොදුශ්චරිතයද එකාන්තයෙන්ම නොකටයුතුයයි මම කියමි, ආනන්දය! යම්බදුවූ මේ කායදුශ්චරිතයත් වාග්දුශ්ච රිතයත් මනොදුශ්චරිතයත් එකාන්තයෙන්ම නොකටයුතුයයි මවිසින් කියනලද්දේද. ඒ නොකටයුත්ත කරනුලැබුකල්හි මේ මතුකියනුලබන ආදීනවය බලාපොරොත්තු වියයුත්තේය. එනම්: තමන්ගේ සිතද තමහට උපවාද කෙරෙයි පණ්ඩිතයෝ නිඳා කරත් ලාමකවූ කිත්තිශබදය උස්ව පැනනඟී සිහිමුලාව කළුරිය කෙරෙයි කඩුන් මරණින් මතු අපායෙහි උපදනේය යනමේ ආදීනවය වන්නේය. ආනන්දය! කායසුචරිතය වාක්සුචරිතය මනඃසුචරිතය එකාන්තයෙන්ම කටයුතුයයි මම කියමි.

ආනන්දය! යම්බදු මේ කායසුචරිතයත් වාක්සුචරිතයත් මනඃසුචරිතයත් කටයුතුයයි මවිසින් කියනලද්දේද ඒ කටයුතු දෙය කරනු ලැබුකල්හි කවර ආනිසංසයක් බලාපොරොත්තු වියයුත්තේද තමන්ගේ සිතද තමහට උපවාද නොකරන්නේය පණ්ඩිතයෝද පසසන්නාහ යහපත්වූ කිත්තිශබදය උස්ව පැන නගින්නේය නොමුලාව කළුරිය කරන්නේය කඩුන් මරණින් මතු දෙව්ලොව උපදනේය යනුයි. මෙසේ අර්ථකථායෙහි අගාරිය අනගාරිය වශයෙන් විවිධවූ විනයකියනලද්දේය.

තවද විනයයනු ආචාරප්‍රඥප්තිවිනයයි කියන ලද්දේත් සුතු වන්නේය. එ අර්ථය දක්වන්නට විනාපසවයතුව ගෙනහැරදක්වීය යුත්තේය. ඒ කෙසේද යත්?

ඉකුත්කාල වනාහි අපමඟ බෝසතාණන් වහන්සේ ධ්‍යානාභිඥාලාභිවූ ගඞ්ගාර නම් වූ තවුසෙක් වීය. ඔහට යහලුවූ වෙදෙහ නම් වූ තවත් තවුසෙක් වීය. ඔවුනතුරෙන් වෙදෙහතෙමේ ලුණු සහනිධි කොට තැබීය, ගඞ්ගාර තාපසතෙමේ එදින නොයෙක් අයුරින් ඔහට ගැරහීය, ඒ වෙදෙහතෙමේ ඒ නිගුව නොඉවසන්නේ ඔහට කිපුනේය, බොසත් !තෙමේ ඔහට අනුකම්පායෙන් අවවාදකරන්නේ **සහනනිසානයෙහි ගඞ්ගාර ජාතකයෙහි.**

"නො වෙ අසස සඤාබුඞ්ඩි චිතයො වා සුසිකඛිතො,
වනෙ අඞ්ගමහිසෝ'ව චරෙය්‍ය බහුකො ජනො.
යසමා ච පනිධෙකාවෙව ආචරියමහි සුසිකඛිතො,
තසමා විනීතවිනයා චරන්ති සුසමාහිතා"ති

යන මේ දෙගය කියේය.

ඒ ගාථාවන්හි සංඛෙප අදහස නම්:-යහලු වෙදෙහය! මේ සත්‍වයන් අතුරෙන් යමෙක් තෙමේ ඉඳින් තමනුවණෙහි හෝ ඔවා දෙන පඬිවරුන් නිසා ආචාරප්‍රඥප්තිවිනයෙහි හෝ මොනවට නොහික්මියේ වන්නේ නම් එසේ ඇතිකාල තෘණලතාදියෙන් ගහනවූ වෙනෙහි අඞ්ගමීමෙකු ගොදුරු නොගොදුරුද සැකනිසැක තැන්ද නොදන යම්සේ හැසිරේද එපරිද්දෙන් තොපවැනිවූ බොහෝ ජනතෙමෙ හැසිරෙන්නේය.

යම්හේකින් වනාහි මේ ලොකයෙහි සියනුවණින් තොරවූ සමහර සත්‍වයෝ ඇදුරන්සමීපයෙහි ආචාරප්‍රඥප්තියෙහි මොනවට නික්මියාහුද එසේ හෙයින් ඇදුරන් කරණ කොට ගෙන තමහට සුදුසුවූ විනයෙහි හික්මෙනලද හික්මීම් ඇත්තාහු සන්හුන්වූවාහු එකඟසිත්ඇත්තෝ වී හැසිරෙන්නාහුය යන මේයසි දක්වයි.මේ සත්‍වයා විසින් වනාහි ගිහියාවූකලී තමකුලානුරූපවූද පැවිද්ද, විසින් ප්‍රව්‍රජ්‍යානුරූපවූද ශික්ෂාවෝ හික්මියයුත්තාහ, ගිහියෝද වනාහි තමකුලානුරූපවූ ගොසිතැන් ගෙරිරැකීම් ආදී ශික්ෂාවන්හි මොනොවට හික්මියාහු ආජීවසම්පන්නවූවාහු මනාකොට සන්හුන්වූවාහු හැසිරෙන්නාහුය පැවිද්දේද වනාහි පැවිද්දට සුදුසුවූ දුටුවන් පහදවන්නාවූ ඉරියව්පසු ගමන්හිද අධිශීල අධිචිත්ත අධිප්‍රඥ ශික්ෂාවන්හිද මොනොවට හික්මියාහු සන්හුන්වූවාහු හැසිරෙන්නාහුය යනු භාවයි.

"බාහුසච්චං ච සිප්පං ච විනයෝ ච සුසික්ඛිතෝ,
සුභාසිතා ච යා වාචා එතං මඞ්ගලමුත්තමං"නති.

යනු වදාළහෙයින් බහුශ්‍රැතභාවයද නිරවද්‍යශිල්පයද මොන වට හික්මෙනලද විනයද සුභාෂිත වචනයද යන මේ චතුර්විධ කාරණය උභයලොකහිතසුඛාවහනය කරන හෙයින් ලොකයෙහි උතුම් **මඞ්ගල** වන්නේය.

ඒ අසා වේදෙහතෙමෙ ඔහුඔවාහි පිහිටා ඔහු කි නයින් කිසුණු පිරියම්ද කොට ධ්‍යානාභිඥ ලාභියෙක් වී දෙදෙනම බඹලෝ පැමිණියාහුය.මෙහි මේ කියනලද්දේ සංක්ෂෙපයයි විස්තාරය වනාහි එම ජාතකයෙන් ගතයුත්තේය.

මිනාපඝකථාවසානවසි.

ගුදිජනමනනඤනවූ බිනඝ නම් ලද නවවන මඞ්ගලකථාව මෙසේ මෙනෙකින් දක්වා නිමවන ලද්දේඝ.

සුසික්ඛිතවිනය නම්ලද මඞ්ගලකථනයට අනතුරුව සුභාසිත වචනසංඛ්‍යාත දසවන මහල වණ්ණනා කථනය පටන්ගනු ලැබේ.

"සුභාසිතා ච යා වාචා" යන මෙහි වනාහි සමුල්ලපන හෙවත් කථාකරන වචනයයි. "යා සා වාචා ගිරා බ්‍යප්පථෝ"ය "වාචා නෙළා කණ්ණසුඛා"ය යන මේ ආදීතන්හි ඕ තොමෝ එන්නීය. යම් වචනයක් නොමෝ වනාහි "වාචාය වෙ ඝතං කම්මං"යි මෙසේ විඥප්තියද "යා වතුහි වචීදුච්චරිතෙහි ආරති .පෙ. අයං. වුච්චති සම්මාවාචා"යි මෙසේ විරතියද "එරුසා වාචා භික්ඛවෙ!ආසෙවිතා භාවිතා බහුලීකතා නිරයසංවත්තනිකා හොති"යි, මෙසේ වෙතනාවද වාචා යි එන්නීද ඕ තොමෝ මෙහි ලා දතයුත්තීය. කුමක් හෙයින්ද යත්: නොකිය යුතු හෙයිනැයි **සූත්‍රනිපාතයෙහි සුභාසිතසූත්‍රවණ්ණනායෙහි** හා **පඤ්චකනිපාතඅංගුත්තරයෙහි සුභාසිතසූත්‍රවිභාගයෙහිද** කියන ලද්දේය. ඔවුනතුරෙන් 'වාචා ගිරා' යන මෙය වචීවිඤ්ඤත්ති නිද්දෙශයෙහි ආවාවූ වචනයසඳහා කියනලද්දේ කියයුතුවන්නීය. මුසාවාදසික්ඛාපදවිභඞ්ගයෙහි නොම යෙදෙන්නේය. එහි වනාහි

චෙතනා තොමෝ 'වාචා'යි ලැබෙයි. එහෙයින් එය **සික්ඛාපද වණ්ණනායෙහි** "වාචාතිමිච්ඡාවාචාපරියාපන්නාවචනසමුට්ඨාපිකා චෙතනාති"යි නිර්වචන හෙයින් 'වාචා' යනු මිථ්‍යාවචනයට ඇතුළත්වූ වචනයඋපදවන්නාවූ චෙතනාවයයි කියනලද්දේය.

තන්ති්කායෙහිද "වුච්චති එතායාති=වාචා: වචනසමුට්ඨාපිකා චෙතනාති"යි නිර්වචන හෙයින් මේ චෙතනාව කරණකොටගෙන කියනු ලැබේනුයි වචන නම්, වචන උපදවන්නාවූ චෙතනාව යයි කියනලද්දේය. කරණ සාධනවූ හෙවත් කරණ කාරක යෙහිවූ වාචාශබ්දය වනාහී චෙතනායෙහි වැටෙන්නේය. එහෙයින් **ඉහමජාලවිඤ්ඤායෙහි** "චෙතනා පිසුනා වාචා, පිසුනං වතති එතායාති"යි නිර්වචන හෙයින් චෙතනාව පිසුනුවචනයයි, මේ චෙතනාව කරණකොටගෙන පිසුනු වූවක් ශබ්දකරනුලැබේනුයි 'වාචා' නමැයි කියනලද්දේය. එහි 'වතති' යනු 'වදති' යනුයි. එහෙයින් **ශබ්දනීතියෙහි** "වව වියතනියං වාචායං; වතති වචති වචනති වචසි ඉච්චාදීනි කතනුපදානි, තත්‍ථ වතතී'ති, වදති; ආඛ්‍යාතපදවෙතං" යනුවෙන් වව ධාතු ව්‍යක්තවචන යෙහි වැටෙයි. එහෙත් වතති වදති වචනති වචසි, යනාදීවූ කතෘකාරකපදයෝ සිඛවෙත්. 'වතති' යන අට්ඨවා වචනයට අර්ථ වශයෙන් 'වදති' යන වචනය දෙනලද්දේය. මෙය ආඛ්‍යාත පදයෙක යනු කියනලදී. ඒ කතෘසාධනවූ ආඛ්‍යාතපදය මෙහි බලාපොරොත්තු නොවිය යුත්තේය. මෙය කම්මසාධනද වෙයි. ශබ්දයෙහි වැටෙයි. ඒ කම්මසාධනය මෙහි දතයුත්තේය. යට කියනලද.

"වාචාය වෙ කතං කම්මං වච්කම්මන්ති වුච්චති,
වාචා ච වච්කම්මං ච අඤ්ඤමඤ්ඤවවත්‍ථිතා."

යන මේ ගාථාව වච්කම්මවව්‍යවත්‍ථා කිරීමෙහි අට්ඨවාවාරීන් විසින් කියනලද්දීය. එහෙයින් ශබ්දයම වාචානම්, චෙතනාව නොවෙයි කියා මෙහි නිෂ්ඨාවට පැමිණිය යුත්තේය.

අට්ඨසාලිනියෙහි "චතුහි භික්ඛවෙ! අඟෙහි සමන්නාගතා වාචා...පෙ...විඤ්ඤූනං" යන මේ චෙතනා තොමෝ වාචා නමැයි වච්කම්මවාරකථායෙහි කියනලද්දේය. එය පූර්‍වෝක්තවණ්ණනා හා නොගැලපෙන්නේය.

සුභාෂිත ලක්ෂණය වනාහී "පඤ්ච භික්ඛවෙ! අඟෙහි සමන්නාගතා වාචා...පෙ...විඤ්ඤූනං"යි **පඤ්චනිපාතඅඞ්ගුත්තරයෙහි චතුක්කපණ්ණාසකයෙහි සුභාසිතසූත්‍රයෙහි** කියනලද්දේය. තවණ්ණනායෙහි කිසිවක් නොකියනලදී.

එහි අදහස නම් මහණෙනි! කරුණු පසකින් සමන්විතවූ හෙවත් යුක්තවූ වචනය සුභාෂිත වන්නීය. දුර්භාෂිත නොවන්නීය රාගාදීන් නිසා අගතිගමනට පැමිණීමෙන් ඇතිවියහැකි දෝෂයක් නොමැතිහෙයින් නිරවද්‍ය වන්නීය නිදිපසස් දෙක්හි බාලයන් නොව පඬුවන්ම පමණහෙයින් පඬුවන්ට අනුවාද විනිර්මුක්තය හෙවත් අපවාදයෙන් කියයුත්තක් නොමැත්තේය. කවර පසකින්ද යත්: සුදුසු කල්හි කියනලද්දීත් වීද, සත්‍යවූ වකුත් කියනලද්දීත් වීද, මෘදුවූවකුත් කියනලද්දීත් වීද වැඩ ඇත්තකුත් කියනලද්දීත් වීද මෙත්සිතින් කියනලද්දීත් වීද මහණෙනි! මේ පසගින් යුක්තවූ වචනය සුභාෂිත වන්නීය දුර්භාෂිත නොවන්නීය. නිරවද්‍ය වන්නීය. පණ්ඩිතයන්ට අනුවාද විනිර්මුක්තය. අන්‍යයෝ ප්‍රතිඥාදීවූ අවයවඇති නාමපදයන් ගෙන්ද ලිඟවිභක්තිවචනකාලකාරකසම්පත්තියෙන්ද යුක්තවූ මුසාවාදාදී යම් වචනයකුත් සුභාෂිතයයි පණවත්ද එය ප්‍රතිසෙධ කරවයි. අවයවාදීන් යුක්තවූවා නමුදු එබඳුවූ වචනය දුර්භාෂිතම වන්නීය. අන්හටද තමහටද යන දෙපක්ෂයටම අනර්ථ කරන්නීමැයි එහි ටීකානයින්ද දක්වනලද්දේය. මෙසේ **පංචඟුත්තරසෙඛ** පස්පරිද්දකින් සුභාෂිතවචනය කියන ලද්දීය.

සුතුරුනිපා තෙවනවගැ සුබැසිසුතුරු සිවු අයුරු කොට දක්වනලද්දීය. එහෙයින් එහි "චතූහි භික්ඛවෙ! අඞ්ගෙහිසමන්නාගතා වාචා සුභාෂිතා හොති න දුබ්භාසිතා අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනං. කතමෙහි චතූහි? ඉධ භික්ඛවෙ! භික්ඛු සුභාෂිතං යෙව භාසති නො දුබ්භාසිතං ධම්මං යෙව භාසති නො අධම්මං පියං යෙව භාසති නො අපපියං සච්චං යෙව භාසති නො අලීකං, ඉමෙහි ඛො භික්ඛවෙ! චතූහි අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාෂිතා හොති නො දුබ්භාසිතා අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනං"සි වදාරනලද්දේය. නැවත එම අර්ථය දක්වන්නාහු,

"සුභාසිතං උත්තමමාහු සන්තො
ධම්මං භණෙ නාධම්මං තං දුතියං,
පියං භණෙ නාපපියං තං තතියං
සච්චං භණෙ නාලිකං තං චතුත්ථං."

යන මේ ගාථාව වදාළසේක.

එහි අදහස නම්:—මහණෙනි! සතර කරුණකින් නොහොත් අවයව සතරකින් යුක්තවූ වචනය සුභාෂිතවචනය වන්නේය. (මුඛවාඅෙන් දුරුවීම් ආදීවූ සතර, සුභාෂිතවචනයට කාරණාවූ සත්‍යවචනාදීවූ සතරඅවයවයෝය) දුර්භාෂිත නොවන්නීය.

(එයින් මේ වචනයාගේ අනවද්‍යභාවය නොවන භාවය දක්වයි) රාගාදි දෝෂරහිත හෙයින් නිරවද්‍යද වෙයි, (එයින් මේ වචනයාගේ කාරණා සුඛිය හා අගතිගමනාදි දෝෂාභාවය දක්වයි) නුවණැත්තවුන්ට අනුවාද විනිර්මුක්තද වෙයි. (මෙයින් මේ වචනයාගේ සඞ්ගීතිකාරසම්පත්තිය හා නිදිපසස් දෙක්හි බාලයන් ප්‍රමාණනොවනබැවිද දක්වයි) කවර සතර කාරණයකින් නොහොත් අගයකින්දයත්: මහණෙනි! මේ සස්තෙහි මහණතෙමෙ සුභාෂිතවූවක්ම කියාද දුර්භාෂිතවූවක් නොකියාද දහම්වූවක්ම කියාද නොදහම්වූවක් නොකියාද ප්‍රියවූවක්ම කියාද අප්‍රිය වූවක් නොකියාද සැබවක්ම කියාද නොසැබවූවක් නොකියාද මහණෙනි! මේ සිවුකරුණෙන් නොහොත් සිවු අයින් යුක්තවූ හෙවත් පැවැත්තාවූ වචනය සුබැසි වන්නිය දුබැසි නොවන්නිය නිවැරදි වන්නිය නුවණැතියන්ට අනුවාද රහිතත් වන්නියයි වදාළසේක.

එහි "සුභාෂිතං යෙව භාසති"යනු පුද්ගලඅධිෂ්ඨාන දෙශනාවගේ සතර වාගඝයන් අතුරෙන් එක්තරා එකක් දක්වන වචනයයි. "නො දුබ්භාසිතං" යනු එම වාගඝයනට ප්‍රතිපක්ෂ වූවක් කිම වලකාලයි. එයින් මුසාවාදාදීහුද කිසිවිටෙකැ කියයුතුය යන දෘෂ්ටිය වලකයි; "නො දුබ්භාසිතං" යන මෙයින්ම මිථ්‍යාවචනයාගේ ප්‍රහාණය දක්වයි; "සුභාසිතං" යන මෙයින් ප්‍රහීණ මිථ්‍යාවචනයෙන් හැමකල්හි කියයුතුවූ වචනයාගේ ලක්ෂණය දක්වයි; "සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා" යි වදාළාක් මෙන් අවයව දැක්වීම පිණිස වනාහි නොකිය යුතු වචනය පළමුකොට නොවදාරා කියයුතුවචනයම පළමු කොට වදාළහ. "ධම්මං යෙව" යනාදියෙහිත් ඒ නයින්ම දතයුත්තේය. මෙහිදු "සුභාසිතං යෙව භාසති නො දුබ්භාසිතං" යන මෙයින් පිසුනුදෙස් රහිතවූ සමගි කරන වචනය කියනලදී. "ධම්මං යෙව භාසති නො අධම්මං" යන මෙයින් සම්ඵප්‍රලාප දෝෂයෙන් තොරවූ ධර්ම්මයෙන් තොරනොවූ ප්‍රමාණවත්වූ වචනය කියනලද්දේය. අනික් අහවයෙන් එරුෂ හා අසත්‍යවචන රහිතවූ සත්‍යප්‍රියවචනයෝ කියනලදහ යනු එහිවණීණනායි. මුසාවායෙන් දුරුවීම් ආදීවූ සිවුවැදැරුම්වූ වාක්සුචරිතය සුභාෂිත වචනයට කාරණාවූ අහයයිද සුභාසිතභාෂණාදී සතර අවයවවූ අහයයිද දතයුත්තේය.

මෙතෙකින් වචීකම්මාරකථාව
කියා නිමවනලද්දීය.

ටීකායෙහිද සුබැසි බිණුම් සංඛ්‍යාතවූ තොපිසුනු වදනය දහම් බිණුම් සංඛ්‍යාතවූ අරුත්වදනය පියබිණුම් සංඛ්‍යාතවූ නොපරොස් වදනය සත්බිණුම් සංඛ්‍යාතවූ නොමුසා වදනයයි සිවුවැදෑරුම්වූ අවයවාඟය කියනලද්දේය.

එසේ හෙයින් මුසාවාදීන්ගේ දෙස්දක්නහු විසින් සුබැසි බසම කියයුත්තේය,ඒ දෙඟය වනාහි **අඞ්ගුත්තරනිකායෙහි** සබ්බලහුසසූත්‍රයෙහිදු ආයේය. එහි වනාහි මෙසේ වදරණලදී.

"මුසාවාදෙ භික්ඛවෙ! ආසෙවිතො පෙ අභූතබ්භක්ඛානා සංවත්තනිකො හොති පිසුනා භික්ඛවෙ! වාචා ආසෙවිතා පෙ මිත්තෙනහි භෙදනසංවත්තනිකා හොති ඵරුසා භික්ඛවෙ! වාචා පෙ අමනාප සංවත්තනිකො හොති සම්ඵප්පලාපො භික්ඛවෙ පෙ අනාදෙය්‍යවාචා සංවත්තනිකො හොති"නි එහි අදහස මහණෙනි! මුසාවාදය ආසෙවනය කරනලද්දේ භාවිත කරනලද්දේ බහුලවශයෙන් නැවත නැවත වඩනලද්දේ නරකය තිරිසන්යොනිය ප්‍රෙතකාය යන ගති පැවැත්ම ඇත්තේ වෙයි. මුසාවාදයාගේ අනන්තිමසැහැල්ලුවූ හෙවත් ඉතා සුලුවූ යම් විපාකයක් වේද එය නම් මනුෂ්‍යවූ වහුට බොරුවෙන් මැඩපියාලීම පවත්නේ වෙයි යම් ඒ කව්රුන් විසින් නමුත් කරනලද අපරාධය අවුත් තමන් කළ එකක් ලෙස තමාපිට පැවරෙන්නේය මහණෙනි! පිසුනු බස සෙවුනා ලද්දී පෙ පිසුනු වචනයාගේ සියල්ලට සැහැල්ලු විපාකය නම් හෙවත් සියල්ලට සුලු විපාකය නම් මනුෂ්‍යවූවහුට මිතුරන් හා බිඳීම පවත්නේ වෙයි. කළ කළ මිතුරා බිඳීමට පැමිණෙන්නේය මහණෙනි! ඵරුෂවචනය සෙවිනාලද්දී පෙ ඵරුෂ වචනයාගේ සියල්ලට සැහැල්ලු විපාකයක් වේද එය මනුෂ්‍යවූ වහුට අමනාප ශබ්දශ්‍රවණය පවත්නේ වෙයි යම්බඳු ඒ වචන යක් තොමෝ දූවහඬ මෙන් ගඬඇත්තීද කකීෂද කට්ටකද රිදුම් ඇතිව ඇනීයාද මම් සිඳී කාවදීද ගියගිය තැන එබඳු වචනම අසයි මනාප ශබ්දඇසීමක් නම් නොලැබෙයි මෙබඳුවූයේ ඵරුෂවචනයාගේ ගිය මාගීය නම් වන්නේය මහණෙනි! සම්ඵප්‍රලාපය ආසෙවනය කරනලද්දේ පෙ සම්ඵප්‍රලාපයාගේ සියල්ලට සුලු යම් විපාකයක් වේද එය නම් මනුෂ්‍යවූවහුට නොමැදහියයුතු වචන ඇතිබැව් පැවැත්ම වන්නේය තෝ කුමට කථාකොළෙහිද තාගේ වචනය කවරහු පිළිගන්නහුද'යි කියයුතු බවට පැමිණෙන්නේය, මේ සම්ඵප්‍රලාපයාගේ ගිය මාගීය නම් වන්නේයයි. එහි අටුවානයින් දක්වනලද්දේය

වැලිදු පිසුනාවාවාදීන්ගේ ආදීනවය සූකරප්‍රෙතවස්තුවෙන් දැක්විය යුත්තේය. හේ කෙසේද යත්: සාසුප්බුදුසෙමෙහි වනාහි එක් ගමක් පිළිබඳ ආවාසයෙහි සැටවයස්පිරී මහතෙර කෙනෙක එකුන්සැටවයස් පිරි තෙරකෙනෙහැයි තෙර දෙනමක් එක මවුකුසැ හොත්තවුන් මෙන් වැඩි සමගිව විසූහ. ඉක්බිති ධම්මකථිකභික්ෂුවක්තෙමේ ඒ ආවාසයට ගොස් භික්ෂාචාර සම්පත්තිය දැක උන්වහන්සේලා පලවා හැර තෙමේ එහි වසනු කැමැත්තේ "සවාමීන්වහන්ස! මා ආදී පටන් අනුතෙරුන් වහන්සේ මට මෙසේ කියේය 'පින්වත සත්පුරුෂය! ඔබ කුලදරුවෙක මේ මහතෙරතෙමේ අලජ්ජියෙක අපෙසලයෙක මොහු සමග සම්භොගකරන්නේ පරිභෝග ඇතිව හෙවත් සිහිඇතිව කරව"සි' කියාසි. මෙසේ මහතෙරපාණන්ට පිසුනු එලවා යලිත් අනුතෙරපාණන්ටද එසේම පිසුනු එලවීය, එවිට ඒ තෙරුන් වහන්සේලා දෙනම බිදී එසින් බැහැර යන්නාහු එක මහනොගොස් කැමති තන්හි වැස පසුව සියක් අවුරුද්දක් හුගේ ඇවැමෙන් එකවෙහෙරැ එකසෙනසුනැ ඔවුනොවුන් එක්වී ඔවුනොවුන් ඇවත් දෙසා එදිනැ සමගිවී"අපි යමු ඔහු ඒ වෙහෙරින් ඇද දමන්නෙමුසි" කියා එවෙහෙරට ගොස් "තෝ මෙහි වස්වසන්ට නුසුදුස්සෙකැ"සි කියා අසුර හැසූහ. ඒ මහණ එහි සිටින්නට නොහැකිව පලාගියේය. ඉක්බිති විසිදහසක් හවුරුදු මුළුල්ලෙහි කළ මහණදම් තෙමෙ ඔහු ධරන්නට නොහැකිවූයේය. ඔහු ඉන් සැව අවීචියෙහි එක් බුඩානන්තරයක් පැසී දැන් ගිජුකුළු පව්වෙහි සූකරපොතකයෙක් වීය, ඔහුගේ ශරීරය තුන්ගව්වෙක මිනිස් සිරුරක් වැනිය හිස සූකරහිසක් වැනිය ඔහුගේ නගුට මුඛයෙහි ඇත්තේය ඉන් පණුවෝ වැගිරෙන්නාහසි. ධම්පියායෙහි මගවගැ මෙය වදාරණ ලද්දේය.

පිසුනුබස්දෙස් දක්වනු වස් ගෙනහැර පානලද සූකර ප්‍රෙතවස්තුව මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

එසේ හෙයින් දුභාෂිතවචනසංඛ්‍යාතවූ පිසුනුබස් දුරු කොට සුභාෂිතවචනසංඛ්‍යාත නොපිසුනුබස්ම කියයුත්තේය. වගීසස්ථවිරයන් වහන්සේද මෙම අර්ථයම භගවමින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි-

"තමේව වාචං භාසෙය්‍ය-යායත්තානං න තාපයෙ,
පරෙ ව න විහිංසෙය්‍ය-සා වෙ වාචා සුභාසිතා"නි.

සුභාෂිතසුත්‍රපර්‍යාපන්නවූ මෙම ගාථාව ප්‍රකාශ කොළේය. එහි අදහසනම්:-යම්බදු වචනයක් හෙතුකොටගෙන තමන්ගේ සිත විපිළිසරභාවයෙන් නොතවන්නේද හෙවත් කිදේ නොමැනවැසි පසුතැවුලි නොකෙරේද එබදු වචනයක්ම කියන්නේය යම්වචනයක් හෙතුකොටගෙන ඔවුනොවුන් කලහ කරවමින් නොපෙළවන්නේද එවචනය ඒකාන්තයෙන් සුභාෂිතවචන නම් වන්නේය යනුයි.....යමෙක්වනාහි නිරර්ථකවූවචන කථා කෙරේද ඒ මනුෂ්‍යතෙමේ අධර්මවාදීනම. අධර්මවාදී පුරුෂතෙමේද ශාසනය අනන්‍තර්ධාන කරන්නේ නම් වෙයි. එහෙයින් **එකනිපාතහුත්තරයෙහි** මහණෙනි! යම් ඒ මහණහුතුමූ අධර්මය ධර්මයයි දක්වද්ද මහණෙනි! ඒ මහණහුතුමූ බොහෝ ජනයාට අහිත පිණිස බොහෝ ජනයාට අසැප පිණිස බොහෝ ජනයාට අනර්ථ පිණිස දෙවිමිනිසුන්ට අහිත පිණිස පිළිපන්නාහු වෙත්. මහණෙනි! ඒ මහණහුතුමූ බොහෝ පව් රැස්කරන්නාහුය, ඔවුහුද මේ ශාසනය අන්තර්ධාන කරන්නාහුයයි වදරණලද්දේය.....එහෙයින් අධර්මභාෂණසංඛ්‍යාතවූ සපථප්‍රලාපය හැර ධර්මභාෂණසංඛ්‍යාතවූ අසපථප්‍රලාපවචනය කියයුත්තේය.....

ඝාෂ්‍යප නම් සම්මාසම්බුදුන්ගේ කාලයෙහි බහුශ්‍රැතවූ තිපිටකධාරීවූ මහපිරිවරඇත්තාවූ මහත් ලාභසත්කාර ඇත්තාවූ කපිළ නම් එක්තරා භික්ෂුවක් වීය. ඒ මහණ තෙමේ බහුශ්‍රැත මදයෙන් මත්වූයේ ලාභතෘෂ්ණායෙන් මඩනාලද්දේ අතිපණ්ඩිතමානී වී අනික් පියශීලිමහණුන් විසින් කියනලද කැපවූ දෙයද අකැපයයි කියා පියශීලී මහණුන් විසින් ඇවැත්වූ කපිළය! මෙසේ නොකියයයි අවවාද කරනුලබන්නේද "තෙපි කුමක් දන්නහුද තෙපි හිස්මිටි වැනියහ"යි යනාදිවචන වලින් ගටමින් පහත්කරමින් තමන්බස් නොගන්නාවූ ඔවුන්ට පරොස්බසින් ආක්‍රොෂ පරිභව කරන්නෙක්ද වූයේය. ඒ කපිළ මහණතෙමේ ඉන් සැව අවීචියෙහි ඉපිද එක් බුඩානන්තරයක් එහි පැසී විපාකාවශෙෂයෙන් අවිරවතියෙහි රන්වන් මසෙකු වී උපන්නේය. ඒ කපිළතෙමේ පෙරයම් මහණක්හට ආක්‍රොෂපරිභව කෙළේද ඒ අකුසලබලයෙන් මොහුගේ මුව දුගඳවීය. ඔහු ඉන් සැවද අවීචියෙහිම උපන්නේය.

එරුෂවාදී පුද්ගලයා නිරයගාමී වන බවට නිදසුන් වශයෙන් දක්වනලද **කපිළසුත්‍රවණ්ණනාදියෙහි කපිළමත්ස්‍ය වෘත්තය** මෙසේ සැකැවින් දක්වා නිමවනලද්දේය.....

එසේ හෙයින් අප්‍රිය වචනසංඛ්‍යාතවූ ඵරුෂවචනය හැර ප්‍රිය වචනසංඛ්‍යාතවූ නොඵරුෂවචනයම කියයුත්තීය.....ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේද පරොස්බස් බණින්නාවූ සවගමහණුන්ට ගරහා මහණෙනි! ඵරුෂවචනය නම් අනර්ථදායකමය තිරිසන් ගතවූවන්ට පවා අමනාපය පෙරත් එක් තිරිසන්ගතයෙක් තම හට පරොස්බසින් කථාකෙළෙන් දහසකින් පැරදුයේයයි වදාරා භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.....

යටගිය දවස ගන්ධාරරට තක්සලානුවර ගන්ධාර නම් රජුරු ජොතෙකුන් රාජ්‍යය කරනසේක. එකල්හි අපමහබෝසතාණන් වහන්සේ ගවජන්මයෙහි උපන්සේක. ඉක්බිත්තෙන් බෝසතාණන් වහන්සේ ළදරු වසුකාලයෙහිම එක්තරා බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නාවූ දායකයන්ගේ සමීපයට ගොස් ඒ වසුපැටවා ලබාගත නැත්විසාලයයි නම් ජොට පුත්‍රස්ථානයෙහි තබා ඔහට බොහෝ ප්‍රියවෙමින් කැඳබත් ආදිය දී පොෂණය කරන්නේය. එසේ කල්යන අතර බෝධිසත්වයන් වහන්සේ වැඩිවයසට පැමිණි සේක් "මම මේ බ්‍රාහ්මණයා විසින් ජොසේ රක්ෂාකරණ ලද්දෙක් වීමි මේ මුළුමහත්දඹදිව මා සදෘශ විය උසුලන අනික් ගවයෙක් නම් නැත්තේය එහෙයින් මම මාගේ බලය දක්වා බ්‍රාහ්මණයාහට මා රක්ෂාකළාට මිල දුන්නෙමි වී නම් ඉතා මැනවැ"යි බ්‍රාහ්මණයාහට අනුකම්පා සිතා බෝධිසත්වයන් වහන්සේ එක් දවසක් බ්‍රාහ්මණයාහට කියනසේක් 'බ්‍රාහ්මණය! යව ගවයන් ඛනකොට ඇති සිටාණන් කරා එළඹ මාගේ ගවතෙමේ එකට බැඳි ගැල් සියයක් අදනේයයි කියා දහසකින් පරදුතබා වයි හෙවත් දහසක් ඔටුකරව'හි කියේය. ඒ අසා බ්‍රාහ්මණතෙමේද ඒ සිටාණන් වෙත එළඹ කථාවක් පහළකොට මෙනුවර කවරක්හුගේ ගවයෝ කායශක්තියෙන් අධිකදැයි කියේය. එවිට ඔහට සිටුතෙමේ කියනුයේ අසවල්හුගේය අසවල්හුගේයයි කියා මුළුනුවරෙහිම අපගේ ගවයන් හා සදෘශ ගවයෝ කවත් නැත්තාහයි කියේය. එබසට බ්‍රාහ්මණතෙමේ එකාබබ කොට බඳනාලද ගැල්සියයක් අදනට සමර්ථවූ එක් ගොණෙක් මාගේ ඇත්තේයයි කියේය. බමුණ! එසේ වී නම් පරදුතබවයි කියේය. යහපතැයි කියා දහසකින් පරදු තැබුයේය. බමුණුතෙමේ එසේ කොට ගැල්සියයක් වැලිකැටසැබිලිතිවලින්ම පුරවා පිළිවෙළින් තබා විය හැලෙහි නිශ්චල කොට බැඳ එක් දකළක්ගැල්යොතින් වෙළා වියැ අනික් කෙළ අකුරඇණමුලනිසා

සම්පොට සක්ඛට බල්ලන්දී ඒ යොකින් නිශ්චලකොට බැඳ විය එයට හෝ මෙයට නොයනකල නන්දිවිශාලගොණු නහවා සුව දින්පසතුල්දීගෙලැ මල්පලඳවා විය කෙළැ බැඳ තෙමේ ගැල්දුරෙහි හිඳ හැටිව ඔසවාගෙන "අදුව කුළ උසුලව කුළ"යි කියේය. එවිට නන්දිවිශාලගවතෙමේ මට කුළු වාදයෙන් නථා කෙළේයයි ඊට නොසතුටුවැ සතර පය වැඩක්මෙන් නිශ්චලකොට සිටියේක. සිටාණෝ එතෙණෙහිම බ්‍රාහ්මණයාගෙන් වසතුදහස ගෙන්වා ගත්තේය. බමුණුතෙමේ දහසකින් පැරදියේ ගවයා මුදා හැර ගෙට ගොස් ශොකයෙන් මඩනාලදුව හෝත්තේය. නන්දිවිශාල ගවතෙමේ තණ හා ආයේ ශොකයෙන් මිඩනාලද සිත්ඇති බමුණා දැක සමීපයට එළඹැ බ්‍රාහ්මණය! කවර හෙයකින් නිදුකරන්නෙහි දැයි කීසේක. දහසකින් පැරදූ තට කෙසේ වුවත් දහසකින් පැරදුනු මට නිදි කොයිත්දැයි කිය.

බ්‍රාහ්මණය! මෙපමණ කාලක් තොපගේ ගෙයි වසන්නාවූ මම කිසි භාජන ආදියක් බිඳපීමක් හෝ කිසිවක් මැඩපීමක් හෝ නුසුදුසු තැනෙක්හි මලමූත්‍ර බැහිමක් හෝ කළවිරිදැයි කීසේක. පුත්‍රය! එවෙනි දෙයක් නැත්තේයයි කීයේය. එසේ කල මට කවර කාරණයකින් කුළු වාදයෙන් කීයෙහිද මෙතෙමේ තොපගේ දෙඟය වන්නේය මාගේ දෙඟයෙක් නොවන්නේය යව ඒ සිටාණන් හා සමඟ වසතුදෙදහසකින් පරදූ කොට තබව හුදක් මට කුළුවාදයෙන් නථා නොකරවයි කීසේක. බ්‍රාහ්මණ තෙමේ මහබෝසතාණන් වහන්සේගේ වචනය අසා ගොස් වසතු දෙදහසකින් ඇපකොට තබා යලිත් පෙරකිනසින් ගැල් සියය එකාබඩකොට නන්දිවිශාල නම් වෘෂභයා සරහා පෙර සේම ගැල්වියෙහි බැඳ තෙමේ ගැලෙහි හිඳ පුතන්ඩ වෘෂභය මේ ගැල් යෙහෙන් අදුව උසුලව යහපතැයි කීය. මහබෝසතාණන් වහන්සේ එකට බැඳ තුබූ ගැල්සියයම එකවෙගයෙන් ඇද පසුව සිටි ගැල අභිමුඛයෙහි ගැලපිහිටිනැන තිබූය. ගවධන කොට ඇති සිටාණෝ පැරද බ්‍රාහ්මණයාහට වසතු දෙදහස දුන් නෝය. අනිකුත් මනුෂ්‍යයෝද බෝධිසත්වයන්වහන්සේට බොහෝවසතු දුන්නාහ. මෙසේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාරා මහණෙනි! එරූපවචනය නම් කිසිවෙක්හටත් මනාප නොවන්නීමයයි වදාරා **එකනිපාතයෙහි නෙවන්නවගෑ නන්දිවිශාලජාතකයෙහි**–

"මනුඤ්ඤමෙව භාසෙය්‍ය නාමනුඤ්ඤං කුදාචනං
මනුඤ්ඤං භාසමානස්ස ගරුභාරං උදබ්හරී
ධනං ච තං අලභෙථ තෙනවත්තමනෝ අහූ.

යන මේ ගාථාව වදාළසේක.

එහි අදහස නම්:-අනුන් සමග සාර්ථකාචරණ තැනැත්තේ මුසාවාදදීවූ සතරදෙෂයන් තොරකොට ඇති මධුරවූ මනාපවූ සියුම්වූ මෘදුවූ ප්‍රිය වචනයක්ම කියන්නේය කියාලෙහක් අප්‍රිය වචනයක් නොකියන්නේය නන්දිවිශාලගවතෙමේ තමහට අම නාපබස් කියන්නහු පිණිස බර නොමුදුරා පසුව මනාපබස් කියන්නාවූ ඒ බමුණා පිණිස ගරුවූ බර උදුරා පැමිණවූයේය ඒ කරණකොටගෙන බ්‍රාහමණයාහට ඒ පරදූ තැබූ ධනය ලැබුනේ යයි කියා බ්‍රාහමණයාගේ ධනලාභය සාරණකොටගෙන ඒ නන්දි විශාලතෙමේද සතුටුවූයේය යනුයි.

එරූෂ වචනය තිරිසන්ගතසත්ත්වයන්ට පවා අමනාපබැව් දැක්වීමට ගෙනහැර පානලද නන්දිවිශාලජාතකය මෙසේ සැකැ වින්දක්වා නිමවනලදිදේය.

නැවතද දෙවියන් සහිත ලොකයාහට අනුශාසනාචාරන ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ පරොස්බස් කියන ඒ සවගමහ ණුන්ට ගරහා සාරම්භවස්තුවද වදාළසේක.

අතීතකාලයෙහි අපමහබොසතාණන් වහන්සේ ගන්ධාරරට තක්සලානුවර එක්තරා බමුණකුගේ 'සාරම්භ' නම් බලිවදීයෙක් වූයේය. සියල්ල නන්දිවිශාලවස්තුව මෙනි මෙසේ ඉකුත්වත් දක්වා **එමනිපානයෙහිම නවවනවගැ සාරම්භජාතකයෙහි**

"කල්‍යාණීමෙව මුවෙය්‍ය නහි මුවෙය්‍ය පාපිකං,
මොකෙඛා කල්‍යාණීයා සාධු මුත්වා තපති පාපිකං.

යන මේ ගාථාව වදාළසේක.

එහි අදහස නම්:- චතුර්විධ දෙෂ විනිර්මුක්තවූ නිරවද්‍යවූ යහපත් වචනයක්ම කියන්නේය අනුන්ට අප්‍රියවූ ලාමක වචන යක් නොකියන්නේය. කල්‍යාණවූ වචනයම කථාකිරීම උතුම් වන්නේය ලාමකවූ එරූෂ වචනය කියා පුද්ගලතෙමේ පසුතැ වුලි වන්නේය.

එරූෂවචනයෙහි දෙස්දැක්වීමටදක්වනලද සාරම්භවස්තුවයි.

ප්‍රියවචන කියනසුලු තැනැත්තේ අන්‍යයන් කෙරෙන් ඉතා වැඩියක් ලබනලද ලාභඇත්තේ වන්නේය.

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුරුකෙනෙ කුන් රාජ්‍යය කරනා සමයෙහි අපමහබෝසතාණන් වහන්සේ එම නුවර සිටුපුත්‍රව ඉපිද එක් වැදිපුත්‍රයෙකු මුවදඩයමට ගොස් බොහෝ මස්ලැබ ගැලක් පුරාගන වෙළඳමට නුවරට යන්නට නික්මුණු වෙලෙහි ඒ නුවර අනික් සිටුපුත්‍රයන් තිදෙනෙකු හා එක්ව නුවරින් නික්ම මහවලට නුදුරු එක් තැනෙක්හි දුක්සැප කථාකරමින් උන්නේය. ඉන් එක් සිටුපුත්‍රයෙක් මස්පිරුනු ගැල පදවන්නාවූ වැද්ද දැක තෙල වැද්දගෙන් මම මස්කඩක් ගන්නෙමිදැයි කීකල්හි ඉතිරි නුන්දෙනා යහපතැයි කීහ. එකල ගැලකරා ගොස් කොල වැද්ද! මට මස්කඩක් දෙවයි කීයේය. ඒ අසා වැදිපුත්තෙමේ

"එරුසා වත තෙ වාචා යං මං යාචනකොවසි,
කිලොමසස සදිසි වාචා කිලොමං සම්ම! දදාමි තෙ."

යනුවෙන් අනුන් අතින් කිසිවක් ඉල්වන්නවුන් විසින් ප්‍රියකථාවෙන් ඉල්විය යුතුය, නුඹ එසේ නොව එරුෂවචන යෙන් ඉල්වූ දැය, එවැනි නුඹට නුඹ විසින් කී වචනයමෙන් එරුෂ සහිතවූ දලබුවම සුදුසුය ඒම නුඹට දෙමි කියා පිට මාංශය හා කැපූ රොමසහිතවූ දලබුව දුන්නේය.

ඒ දැක දෙවෙනි සිටුපුත්තෙමේ මමද මොහුගෙන් මස් ඉල්වමියි කියා ගොස් දෙටුබෑයි!මටත් මස්කඩක් දෙවයි කියේය. එබසට වැදිතෙමේ

"අඞ්ගමෙතං මනුස්සානං භාතා ලොකෙ පවුච්චති,
අඞ්ගසස සදිසී වාචා අඞ්ගං සම්ම! දදාමි තෙ."

යනුවෙන් යහලුව! මේ ලොකයෙහි මිනිසුන්ගේ අඞ්ගය හා හෙවත් ශරීරාවයවයන් හා සදෘශ බැවින් දෙටු සොහොවුරු කණීටු සොහොවුරු දෙටු සොහොවුරි කණීටු සොහොවුරි යන යම් අයෙක් ඇද්ද මේ අය 'අඞ්ග' නම් වන්නාහයි යන වචනය හෙයින් නුඹගේ මේ වචනය අඞ්ගය හා සමාන වන්නීය. මේ වචනයට සුදුසුවූ අඞ්ගයම නුඹට දෙමියි කියා ඇඟ මස්කඩක් දුන්නේය.

ඒ දැක නෙවන සිටුපුත් තෙමේ පියාණෙනි! මටද මස් කඩක් දෙවයි කියා ඉල්වූයේය. එබසට වැදිපුත් තෙමේ

"නාතාති පුතෙනා වදමානො කමෙපති හදයං පිතු,
හදයසස සදිසී වාචා හදයං සම්ම! දදාමි තෙ."

යනු වෙන් මේ ලොකයෙහි පුත්‍රතෙමේ පියාණෙනි යන මධුරවචනය කියමින් පියාගේ ලය සම්පාදරවන්නේය මේ වචනය එබඳුවූ හෘදයට සමානවන්නිය, එසේ හෙයින් මේ වචනයට අනුරූපවූ හෘදයම නුඹට දෙමියි කියා හෘදයමාංශ සහිතවූ මධුර මස්සාඩක් දුන්නේය.

ඒ දෘඪ බෙඩිසත්වූ සතරවන සිටුපුත්තෙමේ මිත්‍රය! මටත් මස්කඩක් දෙවයි කියා ඉල්වූයේය. එබසට වැදිතෙමේ,

"යස්ස ගාමේ සඛා නත්ථි යථා'රඤ්ඤං තථේව තං,
සබ්බස්ස සදිසී වාචා සබ්බං සමම! දදාමි තෙ."

යනුවෙන් සවාමීනි! යමක්හට තමන්වසන ගමැ යහළුවෙක් නැත්තේද ඒ ගම ඕහට ජනශූන්‍ය වනයක්මෙන් වන්නේය, මිත්‍රයෙක් ඇතිකල සියල්ල ඇත්තාක්මෙන් වන්නේය. එමෙන් නුඹවහන්සේගේ මේ වචනයද මාසතු සියලු සම්පත් හා සම වන්නේය, මේ වචනය නම් මාසතුසියලු මාංශයම නුඹවහන්සේ විසින් ලැබිය යුතුවචනයෙකැ, එසේ හෙයින් මාසතු මේ සියලුම මස් නුඹවහන්සේට දෙමි කියා බෝසතාණන් සමගම රිය පදවමින් උන්වහන්සේගේ ගෙදොරටම ගෙනගොස් රියත් සමගම භාරදුන්නේය. බෝසත්වූ සිටුපුත්තෙමේද වනාහි ඕහට සත්කාර සම්මාන කොට ඔහුගේ අඹුදරුවන්ද කැඳවා වැදි කම්මෙයෙන් අස්කරවා තමපවුලඅතරම වාසය කරවා දිවිහිම් කොටම ඔහු හා සමඟ නොබිඳියයුතු යහළුවෙක් වූයේය.

ප්‍රියවචන කියනසුලු නැනැත්තේ අනුන්කෙරෙන් බොහෝ දැ ලබන බැව් දැක්වීමට ගෙනහැර පානලද චතුක්කනිපාත සෙති දෙවනවග්ග මාංශලාති ජාතකසෙති සිටුපුත්වඤ්ඤව මෙසේ සැකෙවින් නිමවනලද්දේය.

එහෙයින් ප්‍රියවූවක්ම කියයුත්තේය. වංගීසඝ්ථවිරයන් වහන්සේද මෙම අර්ථයම හැඟවීමට භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේගේ අභිමුඛයෙහි සුභාෂිතසූත්‍රයට ඇතුළත්වූ,

"පියවාචමෙව භාසෙය්‍ය යා වාචා පටිනන්දිතා,
යං අනාදාය පාපානි පරෙසං භාසතෙ පියං."

යන මේ ගාථාව කීයේය. එහි අදහස නම්:—යම් වචනයක් නොමෝ පෙරමුනට පැමිණ අනින් ලෙසින් ප්‍රියකාරනුලබන්නීද

එබදු වචනයම් කියන්නේය, යම් වචනයක් කියනහැනැත්තේ මෙරවිහට ලාමකවූ අප්‍රියවූ පිළිකුල්වූ එරුම්වූවක් නොගෙන අර්‍ථව්‍යඤ්ජන මධුරතායෙන් යුක්තවූ ප්‍රියවචනයක්ම කියන්නේද එබදුවූ ප්‍රියවචනයක්ම කියන්නේය යනුයි.

මූසවා බණනසුලු පුහුල්තෙමේ වනාහි පිළිලද දෙසින්ද පිළිලැබිය යුතු දෙයින්ද පිරිහෙන්නේමය, දුකටද පැමිණෙන්නේය.මෙකරුණෙහි ලා අඹමතුරු දත් බමුණුආදීහු නිදසුන් වන්නාහ.

හෙයේද යත්:—

අතීතයෙහි පුරනලද බොධිසම්භාරඇති අපමහබෝසතාණෝ පසල්නුවරෙහ සැඩොල්ගමෙහ සැඩොලෙක්වූවෝ පණ්ඩිතවූවෝ ව්‍යක්තවූවෝ නොබැල්හි ඵලගන්වන මන්ත්‍රදතුවෝය. ඒ බෝසතාණෝ උදැසනම කදක් රැගෙන ඒ සැඩොල්ගමින් නික්ම වෙනෙහි එක් අඹරුක්හි සමීපයට ගොස් සත්පියවරක් මත් නෙහි සිට මන්ත්‍රය පිරුවා අඹරුකට දිය අතළොස්සක් ගසන්නාහුය, එකෙණෙහිම අඹරුකෙහි පැරණිපත් ගිලිහි නවදලු හා කොළද පිළිමල් ගිලිනි අඹමැලසිද හටගෙන ඒ මොහොතෙහිම පැසිඉදි මධුර ඔජෝවත්වී දිවඹඵල හා සමවැරුකින් හෙන්නාහ, ඒ බෝසතාණෝ අඹ අවුලා සැහෙන පමණක් අනුභව කොට සෙස්ස ගෙට ගෙනගොස් විකුට අඹුදරුවන් පොසනඅ කරන්නේය, එකල එක්තරා බමුණු කුමරෙක් ඔහුගේ ගෙදෙරට ගොස් ආචාරින්වහන්සේ කොයිබදැයි ඇදුරු බිරිඳුගෙන් විචාරා වනයට හියහයි කිකල්හි බෝසතාණන්ගේ ඊම බලබලා සිට ඉක්බිති එන්නාවූ බෝසතාණන් දැක පෙරමගටගොස් අතින් කද ගෙනවුත් තැබූයේය. මහබෝසතාණෝ ඒ බමුණුමානවකයාගේ මුහුන බලා භාග්‍යවතාවට කියනුවෝ 'සොදුර! මේ මානවකයා මන්ත්‍රය පිණිස ආයේය ඉදින් මම මෝහට මන්ත්‍රය දුනහොත් මොහු අත මන්ත්‍රය නොසිටින්නේය. මෙතෙමේ අසත්පුරුෂයෙකැ'යි කියේය. මානවකයාත් මම මේ මන්ත්‍රය ආචාරින්ට උපකාරීව ලබමී සිතා එතැන් පටන් හෙසි කළමනා කාරිය කරන්නේය නිරන්තරයෙන් දරදිය ගෙනෙන්නේය බත්මාලු පිසන්නේය මුවදෙනා පැන් ආදියද දෙන්නේය පාසොධ, තෙල් ගල්වන්නේය මෙසේ කල්යන කල්හි එක්දවසක් මහ බෝසතාණන් විසින් දරුව මානවකය! මා වැදහොත් ඇඳට ඇඳපා එලුවක් ගෙනවුත් දීලවයි කීකල්හි ඇඳපාඑලුමට කිසිවක්

නොදැක මුලුරැයෙහිම කාලවය මතුයෙහි ඇදපා නබා හුන්නේය ඊට පසුභාගයෙහි ඇදුරුබිරිඳු දරුවන් ප්‍රසූතකාලයෙහි කාලමනා යමක් ඇතහොත් ඒ සියල්ලම මානවකයාම කෙළේය. ඉක්බිති එක්දවසක් ඒ සත්‍රි බෝධිසත්වයන්ට කථාකොට සවාමීනි! මේ මානවකයා ජාතිසම්පන්නවූයේම මන්ත්‍රය නිසා උත්තමයන් නොකළමනා මෙහෙවර අපට කරන්නේය මොහු අහ මන්ත්‍රයටත් සිත ඇත්තේයයි කිය. එසඳ භාග්‍යවතොමෝ සවාමීනි! මොහුට මන්ත්‍රය දුනමැනවැයි කිය. එබස් අසා මහබෝසතාණෝ යහපතැයි ගිවිස ඔහට මන්ත්‍රය දී කියන්නාහු 'දරුව මානවකය! මේ මන්ත්‍රය ඉතා මාහැගිය නෝද මානිසා බොහෝ ධනය ලබන්නෙහිය රජසුවරජමහඇමතිආදී යමෙකුත් විසින් විවාලූ කල අසවල් සැඩොලුවෙතින් මේ මන්ත්‍රය මවිසින් ගන්නාලදැයි මා නොසඟවා කිය ඉඳින් සැඩොලක්හු වෙතින් මේ මන්ත්‍රය මවිසින් ගන්නාලදැයි කීමට ලජ්ජාවී බ්‍රාහ්මණමහාසාරයක්හු වෙතින් ගන්නාලදැයි කියෙහිවී නම් මේ මන්ත්‍රයෙහි ඵලනොලබන්නේය'යි කිහ. එබස් අසා මානවකයා සවාමීනි! මම තුඹ වහන්සේ සඟවන්නේ ඇයිද යමෙකුත් විසින් විවාළකල තුඹ වහන්සේ මාගේ ආචාරිභාවය නොකියන්නෙම්ද කියන්නෙම්ම යයි කියා වැඳ සමුගෙන සැඩොල්ගමින් නික්ම මන්ත්‍රය පරීක්ෂාකොට ක්‍රමයෙන් බරණැස්නුවරට ගොස් මන්ත්‍රානුභාවයෙන් නොකල අඹඵලගන්වා ඒ අඹ අවුලා විකොට බොහෝ වසතු ලද්දේය.....එකල බරණැස්නුවර උසිරථ නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරවයි, එක්බිති ඒ රජුගේ උද්‍යානපාලයා ඔහුඅතින් අඹ මිලයට ගෙන රජ්ජුරුවන්ට දුන්නේය, රජුත් ඒ අඹ කා තා විසින් මෙබදු අඹ කොයිබින් ලබනලදැයි විචාරා අකල්හි අඹඵලගන්වන මානවකයෙකු අතින් මිලදී ගන්නාලදැයි කීකල්හි එසේ වීනම් ඔහු ගෙන්වවයි කියා ගෙන්වා මෙතැන් පටන් ඔබහ නොවිකු මෙතනම ගෙනවුත් දී මට සේවය කරවයි රජ්ජුරුවන් විසින් කියනලද්දේය. එබසට මානවකයා මැනවැයි කියා ගිවිස රාජසේවය කොට බොහෝ වසතු ලැබ ක්‍රමයෙන් විශ්වාසවිය. මෙසේ කල්යනකල එක් දවසක් රජ්ජුරුවෝ මානවකයාට කථාකොට මානවකය! තෝ නොකල වණ්ණගන්ධරසයෙන් සමෘද්ධවූ අඹ කොයිබින් ලබන්නෙහිද කිමෙක්ද තට නයෙක් ගරුඩෙක් දෙවියෙක් දේද නැතහොත් මන්ත්‍රානුභාවයකින් ලැබීමෙක්ද?යි! විචාළාහ. එබස් අසා මානවකයා කියන්නේ 'මහරජ්ජුරුවන් වහන්ස! ඒ අන්කිසිවෙක් නොදෙන්නේය මාගේ අනර්ඝවූ මන්ත්‍රයෙක් ඇත නොකල අඹ

ලැබීම ඒ මන්ත්‍රයාගේ ආනුභාවයෙනැ'යි කිය. එසේ වී නම් අපිත් දවසක් ඒ මන්ත්‍රයාගේ බල බලම්හයි කියා රජ්ජුරුවෝ දෙවන දවස් මානවකයා සමඟ උයනට ගොස් මන්ත්‍රඵල දක්වවයි කීහ. මානවකයාද යහපතැයි කියා යස අඹරුකක් සමීපයට ගොස් සත්පියවරක් මත්තෙහි සිට මන්ත්‍රය පිරුවා අඹරුකට දිය අතලොස්සක් ගැසුයේය. එකෙණෙහි අඹරුකැ පැරණිපත් ගිලිහි නව දලුපත් වැඩි අඹමල් සැදී පිපී වැටී ඵලහටගෙන පැසී ඉදී මධුරඔජාවක් වී මහමේවට මෙන් අඹපතිතවූහ. ඒ දැඩ සතුටුවූ ජනයෝ සාධුකාරනාද පවත්වමින් සියදහස් ගණන් පිළිහිසවට කරඬවමින් නැවූහ. රජ්ජුරුවෝ ඒ අඹ අනුභව කොට ඔහට බොහෝ වසතුදී මානවකය! මෙබඳුවූ අසිරිමත් මහානුභාසම්පන්න මන්ත්‍රයක් කවරක්හු සමීපයෙන් උගතුදැයි විවාළාහ. එතල මානවකයා ඉදින් මම වණ්ඩාලයක්හු සමීපයෙන් උගනිමි කියෙමි නම් මම ලජ්ජාකටයුතුවන්නෙමි මටත් නිදහා රන්නාහ. මන්ත්‍රඥවූකලි මට ඉතා ප්‍රගුණවන්නේය දැන් නොනස්නේය දිසාපාමොක්ආචාරීන්ගේ නම කියමි සිතා බොරුවක් යියන්නේ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන්ගේ අතින් උගනිමියි කියමින් ආචාරීන් ප්‍රත්‍යක්ඛ්‍යානය කෙළේය. එහෙණෙහි මන්ත්‍රය අනනඞ්ඝ වීය. රජ්ජුරුවෝ සොම්නස්ව ඒ මානවකයා කැඳවාගන නුවරට වැද නැවත එක්දවසක් අඹ අනුභවකෙරෙමියි කියා උයනට ගොස් මඤ්ඡල්වට මත්තේ හිඳ මානවකය! අඹ ගෙනෙවයි කීහ. මානවකයා මැනවැයි කියා අඹරුකක් සමීපයට ගොස් සත්පියවරක් මත්තෙහි සිට මන්ත්‍රය පිරුවම්හි සිතා සිහිකරත් කරත් සිහිනොවනසාල්හි අනනඞ්ඝවූ නිඝාව දැන ලජ්ජාවට පත්ව සිටියේය. රජ්ජු විසින් නැවත නැවත විචාරන ලද්දේ අද මම අඹඵල නොගෙන්වම්හි කියේවිනම් රජ්ජුරුවෝ මට කිපෙන්නාහ බොරුවකින් වංචා කෙරෙම්හි සිතා දෙවයන් වහන්ස! අද මම නක්ෂත්‍රයොගයක් පරීක්ෂාකොට සිටියෙමි ඒ නක්ෂත්‍රමුහුනීය ලදිම් නම් නුඹවහන්සේට බොහෝ අඹගෙනවුත් දෙන්නෙමි වේදැයි කියේය. එබස් අසා රජ්ජුරුවෝ මානවකය! පෙර නෝ නක්ෂත්‍රයෝගයකුත් නොකියන්නෙහිය නක්ෂත්‍රමුහුනීයකුත් නොකියන්නෙහිය වණ්ණයෙන් ගඞ්ධයෙන් රසයෙන් යුක්තවූ බොහෝ අඹ ඵල ගෙනවුත් දෙන්නෙහිය පෙර මන්ත්‍රය පිරවීමෙන් බොහෝ අඹ ඵලගන්නේය එසේ මන්ත්‍රය පිරුවීමෙන් අඹ ඵලගන්වන්නාවූ නෝ අදවූකලි කිසිවක් කොටගත නොහී සිටිනෙහිය තාගේ මේ සවභාවය කිමෙක්දැයි විවාළේය. එබස් අසා මානවකයා රජ්ජු බොරුවෙන් රවවන්නට

නොහැක්කා මවිසින් ඇත්ත කීකල්හි රජ්ජුරු කරනසේක් වී නම් විදිම් ඇත්තම කියමියි සිතා මහාරජ්ජුරුවන් වහන්ස! චණ්ඩාලපුත්‍රයෙක් දැහැමින් සෙමින් නොසඟව ඇතිසැටියේ මට මන්ත්‍රය දින. කොයි කෙනෙකුන් විසින් විචාරනලද්දේ නමුත් නෝ මාගේ නාමගොත්‍රය නොසඟව, ඉදින් මාගේ නම් ගොත් සැඟවූයේ වී නම් මන්ත්‍රය අතුරුදන් වන්නේයයි මන්ත්‍රය නස්නා සුභාවයද මට කියේය. මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ විසින් මහජනයා මධ්‍යයෙහි විචාරනලද මම මකුහුණයෙන්මඩහා ලදුව මෙය සඟවා බ්‍රාහ්මණමහාසාරයන් හොරෙන් උගතිමියි බොරුකීම්ද ඒ මවිසින් කියනලද බොරුව නිසා මන්ත්‍රය නටූ යේය නටුවාවූ මන්ත්‍රය ඇති මම දැන් බැගැව හඬමියි කියයි.

එබස් අසා රජ්ජුරුවෝ මේ ලාමක සුභාව ඇති මානවකයා මෙබඳු රත්නයක් නොබැලුයේය මෙබඳු උත්තම රත්නයකුත් ලදකල්හි ජාතිය කුමක් කෙරේදයි කිපී කියන්නාහු එරඬු බමුරු කොසඹ එරබදු ආදීවූ යම්කිසි වෘක්ෂයකින් මියෙන් ප්‍රයොජන විඳිනා සත්‍වතෙමේ මී ලද්දේ වීනම් මී කැමැත්තාවූ ඒ පුරුෂයාහට ඒ වෘක්ෂයම උතුම් වන්නේය. එසේ හෙයින් ක්ෂත්‍රිය බ්‍රාහ්මණවෛශ්‍යශූද්‍රව චණ්ඩාලාදීවූ යම්කිසි සත්වයන්හු සමීපයෙන් යම් ධර්මයක් හෝ ධර්මනිශ්‍රිත කාරණයක් හෝ යුක්තියක් හෝ මන්ත්‍රයක් හෝ උගත්තේ වීනම් ඔහට ඒ තෙමේ උතුම් පුරුෂ වන්නේය එසේ හෙයින් යම්බඳු ඒ පුරුෂයා දුකසේ ලබනලද් දුවූ උතුම් මන්ත්‍රය අධිකමානයෙන් නසාපීදැයි එසේවූ අසත් පුරුෂයාගේ සර්ව්වහරණාදී වශයෙන් කොල්ලකා හුණපත්තෙන් දෙපත්ත හසුකොට පැන්තේ පොත්ත පත්තට යනලෙස තළා සම උපුටවා වධකොට බොටුව අල්වා නුවරින් බැහැර ලවයි කෝපයෙන් අණකළෝය. රාජපුරුෂයෝ එබස් අසා ඔහට කළමනා වධකොට තාගේ ආචාරීන් කරාගොස් උන්සිත්ගෙන මන්ත්‍රය ලදහොත් නැවත මේ නුවරට එන්නට සිතුව ඉදින් මන්ත්‍රය නොලදහොත් මේ දිසාවවත් නොබලවයි කියා ඔහු තැතිගන්වා නුවරින් නෙරපූහ. ඒ මානවකයා අනාථව අශරණව සිතන්නේ ආචාරීන්වහන්සේ හැර මට අන්පිළිසරණක් නැත් තේය උන්වහන්සේ සමීපයට ගොස් උන්සිත්ගෙන නැවත මන්ත්‍රය දෙතහොත් ඉල්වා ගන්නෙමියි සිතා හඬමින් වැලපෙ මින් බෝධිසත්වයන් වසන සැඩොල්ගමට ගියේය. එහි පැමිණ සියලු තතු කියා මන්ත්‍රය ඉල්වූයේය. එපවත් අසා මහබෝස තාණෝ "මානවකය! මම තාගේ රත්නන්ආදීවූ ආචාර්‍යභාගයකුත්

නොගෙන දැහැමින් සෙමින් මන්ත්‍රය දිනිම්, තොසිත් මට කිසි වක් නොදී දැහැමෙන්ම මන්ත්‍රය උගත්තෙහිය, ආචාරින් ප්‍රත්‍යාඛ්‍යානය කළඉහත් මන්ත්‍රය සිතනොතිබී අපවත්වන් නේයසි මන්ත්‍රයේ තබුය තට කිම් ඉදින් තෝ සත්පුරුෂධම් යෙහි පිහිටියෙහි වී නම් මන්ත්‍රය හැරපලා නොයන්නේය අඳුන තෝ දුසේ ලද නොලැබියහැකි මේ මන්ත්‍රය බොරු කියා නසාපිය තෝ නුවණ නැත්තෙන් අද මහත් වනසව පැමිණියෙහිය අඳුනවූ මුසුවූ අසාතඳුවූ මුසාවාදීවූ කායවාක්සමාචාර යෙක් නැත්තාවූ එවැදුවූ සත්‍යයාහට අපි මන්ත්‍ර නොදෙන්නම්හ, තා අසත්පුරුෂහෙයින් දැක්මත් මට රිසි නොවෙයි තට දෙන මන්ත්‍රයක් මෙහි නැත වහා මෙතනින් දුරුවෙවයි කීහ. එසේ ආචාරින් වියින් නෙරපා හරිනලද මානවකතෙමේ මට ජීවිතයෙන් කුමන ප්‍රයෝජනදැයි වල්වැද අනාථමරණයෙන් මෙලේය.

මෙසේ අමඟලවූ සුභාෂිත නොවන මුසාවාද කියන පුද්ගලතෙමෙ පිළිලද වසතුවෙනුත් පිළිලැබිය යුතු වස්තුවෙනුත් පිරිහෙන බැවි දැක්වීමට ගෙනහැරපානලද **නෙරයනිපාතයෙහි අඞ්ජනාභවණ්ණනායෙහි අඞ්ජනාභවස්තුව** මෙසේ සැකැවින් දක්වා නිමවනලද්දේය.

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙ ඝුන් රාජ්‍යය කරවන සමයෙහි අපමහබෝසතාණෝ සිටුකුල යෙක්හි සිටුකුමාරයෙක් වි උපන්නාහ, ඇතුළුනුවරද පියුම් පිපෙනා විලක් ඇත්තේය. ඒ විල රක්නා එක්තරා නැඟැසුන් මිනිසෙක් ඇත්තේය. එකල බෝසත් සිටුකුමරතෙමේ සුවදුක් විචාරමින් තවත් සිටුකුමරුවන් දෙදෙනෙකු සමඟ හැසිරෙන් නාහ. එක් දවසක් ඒ තිදෙන මල්පැලඳ උත්සව ක්‍රීඩා කරනු කැමැත්තාහු නැඟැසුන් විල්ගොවිවා බොරුවෙන් වණ්ණනා කොට මහනෙල්මල් ඉල්වාගන්නෙමුයි කියා ඔහුවෙත එළඹ සිටියාහුය. ඔවුනතුරෙන් එකෙක්

"යථා කෙසා ච මස්සූ ච ජීන්නං ජීන්නං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතෝ."

යනුවෙන් සිඳින් සිඳිනලද හිසකේ දැලිරැවුලු යලි යලිත් වැඩෙන්නේ යම්සේද එපරිද්දෙන් තාගේ නැඟැය වැඩේවා අපට මහනෙල්මල් දෙවයි කියා ඉල්වූයේය. ඌ ඊට කැමැතිව මල්නොදී භිඳිනවා දැක අනික් සිටුකුමරෙක්

"යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරුහති,
එවං රුහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො".

යනුවෙන් යම්සේ සරත්සෙමෙහි හොයම් කපාහෙන බහා තබනලද සාරවත් බීජය කෙතෙහි වපුලේ හොයම් වැඩේද එමෙන් තාගේ නාසයද වැඩේවා ඉල්වන්නාවූ අපට මල්දෙවහි කීයේය. ඊවද සෝපව මල් නොදෙනවා දැක තෙවන සිටුපුත් තෙමේ

"උභොපි පලපත්තෙතෙ අපි පදුමානි දස්සති,
වප්ජුං වා තෙ න වා වප්ජුං නත්ථි නාසාය රුහණා,
දෙහි සවව! පදුමානි තස්ස මෙ සමම! යාචිතො".

යනුවෙන් පින්වත් වූ යහලුව! මෙසේ කිසාල අපට මල් දෙන්නන්යහි සිතා ඒ දෙදෙනම බොරු කීවාහුය නුඹගේ නාහැ වැඩේවායි කීවාහු හෝ නොකීවාහු හෝ ඔවුන්ගේ ඒ වචනය නුඹගේ නාහැ වැඩීමටවත් නොවැඩීමටවත් ප්‍රමාණ නොවන් නීය, ඒ කොසිවිදියෙන් වුවත් නාහැවැඩෙන්නේනම් නැත, මම නම් නුඹගේ නාහැගැණ කිසිවක් නොකියම් ඉල්ලීම පමණක් කරමි, යහලුව මට මල්දෙවහි කියා ඉල්වූයේය. එවිට විල්පල්ලා ඔහුගේ එබස් අසා සතුටුව 'මේ අනික් දෙදෙනම බොරුකීවාහුය නුඹ පමණක් ඇතිතතු කීයේය නුඹට මල් සුදුසුය'යි කියා මහත් පියුම්කලඹක් දුන්නේය.

මුසවා බණනතැනැත්තේ ලැබියහැකි ලාභයෙන් පිරිහෙන බැවි දැක්වීමට ගෙතහැරපානලද **නිකනිපානයෙහි දෙවන වගෑ පදුමජාතකවණ්ණනායෙහි සිටුපුත් වස්තුව** මෙතෙකින් නිමවනලද්දේය.

"දුක්ඛං ව පපෙපානී"යි කීහෙයින් මුසවා බණනසුලු පුද්ගල තෙමේ දුකවද පැමිණෙන්නේය, යන මෙහි **ඛකුකනිපානයෙහි කකකාරුජාතකයද අඛකනිපානයෙහි මෙතිය ජාතකයද** කියයුත්තේය.

එසේ හෙයින් පෙරකල කිදුරන් දෙදෙන විසින් මෙන් මුස වාගෙන් බියවිය යුත්තේය.

කෙසේදයත්:-

අතීතකාලයෙහි බරණැස්නුවර වැසි එක්තරා වැදිපුත්‍රයෙක් හිමාලයවනයට ගොස් උපායකින් අඹුසැමි කිදුරන් දෙදෙනෙකු

අල්වාගෙනවුත් රජ්ජුරුවන්ට දුන්නේය. රජ්ජුරුවෝ පෙර නුදුටුවිරූ කිඳුරන් දැක වැදිපුත්‍රය! මොවුන්ගේ ගුණ කවරේදැයි විචාළාහ. දෙවයන් වහන්ස! මොවුහු මධුරස්වරයෙන් ගායනා කෙරෙති ලීලොපෙතව නටති මනුෂ්‍යයෝ මුන්සේ ගී කියන්ටත් නටන්ටත් නොදනිති‍සි කීයේය. රජ්ජුරුවෝ සතුටුව වැදි පුත්‍රයාට බොහෝ වසතුදී නටවි ගී කියවියයි කිඳුරන්ට කීහ. කිඳුරෝ 'ඉදින් අපි ගායනා කරන්නමෝ අක්ෂර සම්පූර්ණ කොට ගායනාකරන්ට අසමර්ථවුවමෝ ගායනාව නපුරු වන්නේය එසඳ අපට නිඝූකරති මරති බොහෝ කොට කියන්නට උගතුමෝ නම් බොරුකියවෙන්නේය' සිතා මුසාවාද බියෙන් රජු නැවත නැවත කියද්දීත් නොකීහ නැටුමුත් කොනැටූහ. එසඳ රජ්ජුරුවෝ කිපී මොවුන් මරා ඔස් පිසගෙනෙවයි කියන්නාහු 'ඉදින් මොහු දෙවතා කෙනෙක්වූ නම් ගාන්ධර්ව්‍යකෙනෙක් හෝ වූනම් නටති ගී කියති මොහු වූකලි තිරශ්චීනයහ වසතු පතන්නාවූ වැදිපුත්‍රයා විසින් අර්ථාසාවෙන් මා සම්පයව ගෙනෙනලද්දහ මොහුදෙදෙනාගෙන් එකෙකු ගෙන සවසට පිසව එකෙකු සෙව උදය පිසව'යි විධාන කළාහ. එසඳ කින්නරාහනාසිතන්නී 'රජ්ජුරුවන් වහන්සේ කිපිසේක. එකාන්තයෙන් අප මරවනසේක දැන්වූ කලි කථාකරන්නට කල්වන්නේය'යි සිතා—

"සතං සහස්සානං දුබ්භාසිතානං
කලම්පි නාඝති සුභාසිතස්ස,
දුබ්භාසිතානං සංකමානෝ කිලෙසෙ
තස්මා තූණ්හී කිංපුරිසෝ න බාල්‍යා.

යනුවෙන් කථාකරන්නී 'රජ්ජුරුවන් වහන්ස! වරදවා කියන්නාවූ ලක්ෂාක්බස් නොවරදවා කියන එකබසකුත් නොවටනාහ එසේහෙයින් අපව ගී කියන්ට කීකල්හී බොහෝ කොට ගී කීනම් වරද වේ දෙ, හෝයි යන බියෙන් නොකීවෝවමු කුඹ වහන්සේ කෙරේ නිස්සාර කමකින් නොකීවෝ නොවම්හ'යි කීහ. රජ්ජුරුවෝ කින්නරාහනාවට සතුටුව යම් කිඳුරගනක් මාහාසමග ප්‍රියතෙපුල් කථාකළාද ඇඟඟැර හිමාලයව්‍යාසට යවව මේ කිම්පුරුෂයාවූකලි හෙට උදෑසනම මාලුපිසගෙන එනපරිද්දෙන් මුලුතැන්ගෙට පාවාදෙවයි කීහ. කිම්පුරුෂයා රජ්ජුරුවන්ගේ බස් අසා 'මේ රජු මා කථාකොකොළහොත් අවශ්‍යයෙන්ම මරණසේක දැන්වූකලි කථාකරන්ව කල්වන්නේය'යි සිතා—

"පජ්ජුන්නනාථා පසයෝ පසුනාථා අයංපජා,
තං නාථොසම්හි මහාරාජ! මමං නාථා මම ගරියා,
චින්නාමඤ්ඤතරං ඤත්වා මුත්තෝ ගවෙජ්ඨය පබ්බතං"

යනුවෙන් 'මහරජ්ජුරුවන්වහන්ස! තෘණභක්ෂණය කරන්නාවූ පසුජාතීහු මෙසය නාගයා කොට ඇත්තාහ මේ මනුෂ්‍ය ජාතිහු පස්ගොරසින් ජීවත්වන හෙයින් පසුජාතිය පිහිට කොට ඇත්තාහ මමවූකලි නුඹවහන්සේ පිහිටකොට ඇත්තෙමි මාගේ භාර්‍යාව මා පිහිට කොට ඇත්තිය මම ඇට පිහිට වෙමි. අපදෙදෙනා අතුරෙන් එකෙක් එකෙකුමල නියාව දැක මෙසේ මරණින් මිදී පසු හිමාලය වනයට ගන්නේය ජීවත්ව හිඳ අපි දෙදෙන ඔවුනොවුන් හැර නොයම්හ එසේ හෙයින් නුඹවහන්සේ මේ කින්නරාඟනාව වනයට යවනු කැමැත්තෙහි නම් මා පළමුකොට මරා පසුව ඇය හිමාලය වනයට යවන සේක්වා'යි කියේය.....

රජ්ජුරුවෝ කිදුරාඟටද සතුටුවී ඒ දෙදෙන රන්මැදිරියෙක හිඳුවා ඒ වැද්දුම කැඳවා යව මොවුන් අල්වාගත්තැනම මුදවා හැරපියවයි කීහ. ඒ වැදිතෙමේද එසේ ඔවුන් හිමාලය වනයට හෙනගොස් හැරියේය.....මෙසේ මුසාවාදියෙන් දුර්භාෂිත නොකියා තමන්ගේ සුභාෂිතවචනය නිසාම මරණදුකින් මිදුනාහුය.

තස්මා මරණතෝ මොක්ඛං පත්ථයන්තෙන ජන්තුනා,
පහාය අලිකං සච්චං භාසිතබ්බං සුධීමතා.

කරුණු මෙසේ හෙයින් මරණදුකින් මිදීම ප්‍රාර්‍ථනාකරන්නාවූ පණ්ඩිතයා විසින් මුසාවා නොබැන සැබෑවදන්ම කිය යුත්තේය.....

මෙසේ සැබෑතෙපුල් බිණ්ණිම්සංඛ්‍යාතවූ සුභාෂිතවචනය මරණින් මිදීමටද හෙතුවන බැව් දැක්වීමට නිදසුන් වශයෙන් ගෙනහැරපාන්නේද **තෙරසනිපාතයෙහි තක්කාරිජාතක වණ්ණනායෙහි කින්නරවත්ථුව** මෙසේ සැකෙවින් දක්වා නිමවන්නේද්දේය.....

විඛ්‍යීසප්‍රථිවීරජන්වහන්සේද මෙම අර්‍ථයම හඟවමින් භාග්‍යවත්වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ හමුයෙහි සුභාෂිතසූත්‍රයෙහි ඇතුළත්ව-

"සච්චං වෙ අමතා වාචා එසධමෙමා සනන්තනො,
සවෙව අත්ථෙ ච ධමෙමෙ ච ආහු සන්තො සපපුරිසා.

යන මේ ගාථාව ප්‍රකාශ කෙළේය.

එහි අදහස්නම්:-සත්‍යවචනය සාධුභාවය කරණකොටගෙන එකාන්තයෙන්ම අමෘතවචන නම් වන්නේය. යම්බඳුවූ සත්‍ය වචනයක් වීද ඒ මේ සත්‍යවචනය පෞරණික ධර්මයෙක චාරිත්‍ර යෙහා ප්‍රවෙණියෙක මෙයම් පැරණි උතුමන්ගේ පුරුද්දෙක. ඒ උත්තමයෝ කිසිකලෙකත් අසත්‍යනොබිණුහු ඒ උත්තම සත්පුරුෂයෝ සත්‍යයද අර්ථයද ධර්මයද බිණුහු ශතුයි... එහෙයින්-

'සවෙව අත්ථෙ ව ධමෙමෙ ච ආහු සන්තොපතිට්ඨිතා'සි වදාළහ. එහි සත්‍යයෙහි පිහිටියාහුම ආත්මාර්ථපරාර්ථදෙක්හි පිහිටියාහු නම් වෙත්, අර්ථයෙහි පිහිටි බැවින්ම ධර්මයෙහිත් පිහිටියාහු නම් වෙතැයි දතයුත්තාහ. සත්‍යයෙහි පිහිටියහු කෙසේද යත්? අර්ථ යෙහිත් ධර්මයෙහිත් පිහිටියාහුම මෙරමා අර්ථයෙන් පහනොකළ බැවින් අර්ථහානි නොකෙරේයයි කියනලද්දේය...අර්ථහානිය ඇතිකලත් ධර්මයෙන් පහනොකරවූ බැවින් ධාර්මිකවූම අර්ථය සිඳනෙරේයයි කියනලද්දේය. සත්‍යවචනය කියනසුලුතැනැත්තේ අධිමුත්තකසාමණෙර මහාසුතසොම පණ්ඩිතාදීන්මෙන් තමහටද මෙරමාහටද අර්ථය ඵලවන්නේය...ඔවුනතුරෙන් අධිමුත්තක සාමණෙරවසතුව පණ්ඩිතසෙවනාධිකාරයෙහි කියනලද්දේය... මහාසුතසොම පණ්ඩිතවසතුව අසිතිනිපානයෙහි බැලිය යුත්තේය...

පෙරද එක් සත්‍රියක් තොමෝ දන්නොදින පූජාද නොකොළ දහම්ද නොමැසී සත්‍යය පමණක් රැක එයින් සැව ගොස් දෙව්ලොවැ උපන. ඉක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේ දෙව්සැරියෙහි ගොස් ඇගේ විමන් දොර කඩ සිටිසේක් තමන්වහන්සේ ඉදිරියට එළඹසිටි ඇය අතින් තීගේ සිරිසැපත ඉතාමහත්ය කුමක් කොට මෙය ලද්දීදැ'සි විවාළසේක. ඒ දෙව්දූතොමෝ සුලුපින්කමකින් උත්බැවින් ලජ්ජාවෙමින් කියන්නට නොකමැතිවන්නී නමුදු තෙරුන් වහන්සේ විසින් නැවත නැවත විචාරනලද්දී සඟවන්නට නොහැකිවන්නී සත්‍යය පමණක් මවිසින් රක්නාලදැයි කීය. ඒ අසා මහාමෞද්ගල්‍යායනසථවිරයන් වහන්සේ දෙවිරමට

අවුත් ශාස්තෘන් වහන්සේ වැඳ සවාමිනි! ත්‍රෛලොක්‍යෛකතිලකාශයමානවූ තථාගත බුදුරජාණන් වහන්ස! සත්‍යකථනය පමණකින්ම දිවසුව ලබන්නට හැකිවන්නේදැයි විවාළේය. දෙවියන් සහිත ලොකයාහට අර්‍ථයෙන් ධර්‍මයෙන් අනුශාසනා කරන හෙයින් ශාස්තෘනම්වූ බුදුරජාණන් වහන්සේ 'මෞද්ගල්‍යායනයිනි! කුමක් නිසා මා පුළුවුත්නෙහිද දෙවිදුව විසින් තොපට මේ මාගීය කියනලද්දේ නොවේදැ'යි වදාරා 'සත්‍යය පමණක් කියාත් දෙවිලෝ යන්නේමය'යි වදාළසේක.

මේ කථාවස්තුව ධම්මපදෙහි ඛොඩවග්ගෙහි "සච්චං භණෙනකුජ්ඣෙය්‍ය"යනාදී ගාථාවර්ණනාවෙහි ආයේය.

මෙසේ සුභාෂිතභාෂණාදී සතරඅඟයකින් යුක්තවූ වචනය සුභාෂිත නම් වන්නීය. ඒ සුභාෂිත වචනතොමෝ ලොව් ලොවුතුරාසුව ඵලවන හෙයින් මහල නම් වන්නීය.

එහෙයින් සුභාෂිතවර්ණනාවෙහි මහණෙනි! මේ සතරඅඟයෙන් යුක්තවූ වචනයසුභාෂිතවන්නීයයි වදාරමින් අන්‍යයන්ගේ මෙයින් අන්‍යවූ ප්‍රතිරූපදී අවයවයෙන්ද නාමලිඟවිභක්තිකාලකාරකාසමපත්තියෙන්ද යුක්තවූ වචනයක් සුභාෂිතයයි පණවද්ද එය ධර්‍මයෙන් ප්‍රතික්ෂෙප කෙරෙයි අවයවසම්පත්තියෙන් යුක්තවූවා නමුදු පිසුනුබස් ආදියෙන් යුක්තවූ වචනය තමහටද මෙරමාහටද අනර්‍ථ ඵලවන හෙයින් දුර්භාෂිත නම් වන්නීය. මේ සතරාඟයෙන් යුක්තවූ වචනය වනාහි ඉදින් මිළඟබහාෂා පර්‍යාපන්නවූ ෂටවෙටිකාවගේ ගීතිකාවකට ඇතුළත්වූ වචනයක් වීද එසේද වුවත් ලොව්ලොවුතුරාසුව ඵලවන හෙයින් සුභාෂිතම වන්නීය.

ලඞ්කාද්වීපයෙහි එක්තරා මහක් අසල කෙතක ගොයම් රක්නාවූ සිංහල දැසියක් විසින් සිංහලභාෂායෙන් ගායනා කරනලද ජාතිජරාව්‍යාධිමරණ ප්‍රතිසංයුක්තවූ ගීතිකාවක් අසා මහවඩින අහිඛුයට පැමිණි සැටනමක් පමණ විදර්‍ශක භික්ෂූහු මෙහි නිදර්‍ශන වන්නාහ.

එසේම තිස්ස නම්වූ ආරබ්ධවිදර්‍ශක මහණතෙමේද පියුම් මීලක් සම්පයෙන් යන්නේ පියුම්විලෙහි පියුම් බිඳබිඳ

"පාතකථුල්ලෙන කොක්කනදං සුරියාලොකෙන තජ්ජියනෙන,
එවං මනුස්සකතගතා සත්තා ජරාභිවේගෙන මද්දියනෙන."

මේ ගාථායෙන් බහුශ්‍රැතබවය, ශිල්පය, සුශික්ෂිතවූ විනය, සුභාෂිත වචනයදැයි, කියා මඞ්ගලචතුෂ්ටයක් වදාරණලද්දේය. මේ ගාථායෙහි වෘත්තයද "පථ්‍යාවක්ත්‍ර"නම් වන්නේය.

හුදීජනමනනඥනවූ මහුල් සුතුරු තෙවන ගයෑ අරුත් වැනුම් මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

තුන්වන ගාථාවෙහිඅදීවණ්ණනාව
සමාපතයි.

"මාතාපිතුඋපඨානං" යනාදීවූ සතරවනගාථායෙහි එඹා දෙවනාව! මවුපියන්ට උපස්ථාන කිරීමය, අඹුදරුවන්ව සංග්‍රහ කිරීමය, නිරවුල් කම්නන කිරීමය, යන ත්‍රිවිධකර්මය උතුම් මඟුලැයි ධරාගනුව යන මෙය සංක්ෂෙප අදහස වන්නේය.

මේ මතුකියනු ලබන්නේ විස්තරය වන්නේය. එහි මව නම් ජනික මවය පියා නම් ජනික පියාය. ඔවුනතුරෙන් මවුතොමෝම දුෂ්කර දෙය කරන තැනැත්තීය. එසේ හෙයින් මවගේ දුෂ්කර කාරියාවය මුළුදඹදිව්වැසි රජුන්ට ප්‍රකාශකරවන්නාවූ සොණ පණ්ඩිතනම්වූ තවුසාණන් විසින් කියනලද මෙම ගාථාවෝ අපසමාසම්බුදුරජාණන් වහන්සේ විසින් **සත්තනිපාතයෙහි සොණනන්දජාතකයෙහිලා** වදාරනලද්දාහ.

මවිතොමෝ නම් පුත්‍රසංඛ්‍යාතවූ ඵලය ප්‍රාර්ථනාකරමින් ඉෂ්ටදෙවතාවන් නමස්කාර කොට ආයාචනාකරයි ෂට්විධ ඍතූන් අතුරෙන් කවර ඍතුයෙක්හි කවර මසැ කවර නකතැ කවර දවසෙකැ උපන් දරුවෝ දිගාවෙද්ද? යසපිනැති පැණැතිසේ වෙද්ද? යනාදීන් නකත් මොහොත් තිථිකරණාදිය විචාරමින් වෙහෙසෙන්නීය.

තවද මෙලෙස සත්පුරුෂාකාරයෙහි නිරතවූ පුත්‍රලාභයට කාරණා ඇති තැනැත්තීවීනම් මල්වරගෙන සතරවන වාරයෙහි ගර්භීයාගේ පිළිසිඳීම වන්නේය, එලෙස පිහිටි ගර්භොත්පත්තිය නිසා දෙළදුක් ඇතී වන්නීය. ඒ ගර්භීයාගේ සුවපත්භාවයට හෙතුවූ ඒ දරුදෙළ ධරණකල්හි ඇයගේ කුසෙහි උපන් සත්ත්වයා කෙරෙහි සෙනහස උපදනේය. ඒ කාරණයෙන් මව් තොමෝ 'සුහදා' නම් වන්නීය.

හවුරුදිදක් හෝ ඉන් අඩු දසළුකඩමසක් හෝ මුළුල්ලෙහි ඒ දරුගැබ උසුලමින් ගැප්පෙරහර සොට ප්‍රසූතකරන්නීය. එසේ කියනලද කාරණයන් හෙතුකොටගෙන ඕ තොමෝ දරුවන් උපදවන්නීය. එසේ දරුවන් උපදවන නිසා මවුතොමෝ ජනෙනනී' නමැයි කියනුලදිදීය.

ක්ෂීරසංඛ්‍යාතවූ හෘදයලොහිතය පෙවීමෙන්ද දරුවන් හැල වීමපිණිස ගායනා කරනලද හිතිකාවෙන්ද ළෙඟි හොවවා තමන්ගේශරීරස්පර්ශී පතුරුවමින් තමන්ගේ ශරීරය පෑපුරණයක් කිරීමෙන්ද හෙවත් පෙරවීමෙන්ද අඩන්නාවූ පුත්‍රයා පොෂණය කරන්නීය. එසේ හෙයින් මවුතොමෝ 'පොසෙනනී' නමැයි කියනලදිදීය.

යලිත් දරුණුවූ ශීතොෂ්ණාදී අවස්ථාවන්කල 'අහෝ මාගේ පුතානුවන් මතුවෙහි සුලභ වදනේය අවව පැහිරෙන්නේය'යි මෙසේ මමත්වය කොට සිතිදුවූ ළඟින් යුකතව සොයා බලා ඉන් වලකා නොදන්නාවූ දරුවා සුවයෙහි යොදා සතුටු කරවන්නීය. එසේ හෙයින් මවුතොමෝ 'තොසෙනනී' නමැයි කියනලදිදීය.

මවුසමබන්ධිවූ රන්රිදී මුතුමැණික්වස්තු වස්ත්‍රාභරණාදී යම් ධනයක් වීද පියාසමබන්ධවූත් එබඳුවූම යම් ධනයකුත් වීද යන මේ දෙපක්ෂයෙහිමවූ ධනය 'අපගේ පුත්‍රයාහටම වේවා'යි පුත්‍රයා පිණිසම ඒ ධනය අනික් කිසිවෙක් හටත් නොදී නොපෙන්වා සාරගබඩාදියෙහි හොපත රක්ෂාවරණ කරන්නාහ.

මෙසේ සාපෙක්ෂාකව ඇතිකළ පුත්‍රයා මවුතොමෝ 'එඹා අඹබාලපුතණඹ! මෙසේ රාජකුලාදීන්හි නොපමා වෙව නොහොත් හිරේ විලඟුවෙහි නොපමා වෙවසිද මෙනම් කමීය නොකරවසිද නොයෙක් මරතියකියා භික්මවමින් මවුතොමෝ වෙහෙසෙන්නීය.

මෙසේ ක්‍රමයෙන් යොවුන්වියපැමිණි පුත්‍රයා රාත්‍රිකාලයෙහි අන්හඹුවන්ගෙවලෙහි පමාවුවහු සවසත් නොමෙනබැව් දැන බත් මාලු පිස වසා ගෙහි තබා කදුලු පිරුණු නෙතින් මග බල බලා හඬමින් පෙළෙන්නීය.

එබඳුවූ මාතාපිතෘ යන දෙදෙනම බ්‍රහ්මයසිද පූජිදෙවයසිද පූජ්‍යාචාර්‍යයසිද ආහුනෙය්‍යයසිද කියනු ලබන්නාහ.

එහෙයින් නිකඛුනතරවතුකකඛුනතරයන්හි සබ්‍රහ්මයුනයෙහි ''මහණෙනි! 'බ්‍රහ්ම' යන මෙයද මවුපියන්ට නමෙක 'පුබ්බාචාර්‍ය්‍ය' යන මෙයද මවුපියන්ට නමෙක 'පුබ්බදෙව' යන මෙයද මවුපියන්ට නමෙක 'ආහුනෙයය' යන මෙයද මවුපියන්ට නමෙක රිට හෙතු කවරහුදයත්:-මහණෙනි! මව්පියෝ දරුවන්ට බොහෝ උපකාරඇත්තාහ දරුවන්ගේ ජීවිතය පාලනය කරන්නාහ පුත්‍රයන්ගේ ජීවිතය වනාහි ඔවුන් විසින් පාලනය කරන ලද්දේය ගළපනලද්දේය අවිච්ඡින්නව පවත්වන ලද්දේය කිරි තෙල් ගා අතපය ඇදහැර අඹා වඩා නැහැකන්හිය් අඹා වඩා හෘදයලෝහිතය පොවා පොසනය කළහ මෙලෝ ඉටුනිවුඅරමුණු දැක්වූවාහුය''යි වදුරා තදනන්තරවැ

''බ්‍රහ්මා'ති මාතාපිතරෝ පුබ්බාචරියා'ති වුච්චරෙ;
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා''සි

වදුළුසේඝාතය එහි අදහස:-යම්සේ වනාහි මහාබ්‍රහ්මයාගේ සිතෙහි ලොකසන්‍තිප්‍රජාවකෙරෙහි මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන සතරබ්‍රහ්මවිහරණයෝ තොරතුවූවෝ වෙද්ද එලෙසින්ම මවුපියන්ගේ සිත්හිද දරුවන්කෙරෙහි එකී සතරහා වනාවෝ තොරතුවූවාහු වන්නාහුය. ඒ භාවනාවෝ ඒ ඒ අවස්ථා වන්හි ලා දතයුත්තාහුය. එනම්: දරුවා කුසැපිළිසිඳගත්කල්හි කවදා වනාහි මපුතු නිරොගිවූවහු පිරිපුන් අඟපසඟ ඇතියහු දකින්නෙමුදෝහොයි සිතනකල මවුපියන්ගේ සිත්හි මෛත්‍රිය උපදනීය. යම්කලෙක වනාහි මේ මොලකැවිදරුපොවුතෙමේ උඩුකුරුව හෝනේ උකුණුමකුණු මැසිමදුරුහෝහපටු ආදීන් විසින් විදිනලද්දේ හෝ දුඃඛසෙය්‍යාවෙන් හෝ පෙළුනේ හඬනේ වේද එකල ඔහුගේ හඬනහඬ අසා මවුපියන්ගේ සිතැ කරුණාව උපදනීය. දුවපැන ඇවිද කෙළනා කල වනාහි දැක ලොහොබ කටයුතු බබලන වණ්ඩාලගමන් පිරුණු අහපසඟඇති වයසෙහි සිටිකල හෝ දරුවා බලා මවුපියන්ගේ සිත ගිතෙල්මණ්ඩයෙහි බහාලනලද සියක්වර පොළනලද හිඹුල්පුලුන් පෙදක් මෙන් මෘදුවන්නේය මොදිතප්‍රමොදිතවන්නේද එකල ඔවුන්ට මුද්තාව ලැබෙන්නීය. යම්කලෙක වනාහි අඹුදරුවන් පොසතය කොට වෙන වෙනම ගිහිගෙයි වෙසේද එකල 'අපගේ පුත්‍ර තෙමේ දැන් තමන්ගේ ධර්‍මතායෙන් යැපෙන්නට හැකිවන්නේය'යි මවුපියන්ගේ සිත්හි මධ්‍යස්ථභාවය උපදනේය. මෙසේ එකල්හි උපෙක්ඛාව ලැබෙන්නීය. යන මෙම කාරණය හෙතු

කොටගෙන මවුපියෝ 'බ්‍රහ්ම'නමැයි කියනලද්දේය. මවුපියෝ දරුවා උපන්කලැ පටන් 'මෙසේ හිදු මෙසේ සිටු මෙසේ යව මෙසේ හෙව මෙසේ කව් මෙසේ බොද මේ තාගේ පියාගයි කිය යුතුය මේ අයියාය මේ මල්ලිය මෝ අක්කාය මෝ නංගිය කිය යුතුය මෙනම් දෙය කටයුතුය මෙනම් දෙය නොකටයුතුය අස වලා වෙත එළඹෙන්ට වටනේය අසවලාවෙත එළඹෙන්ට නො වටනේය'යි යනාදිය පළමුකොට උගන්වත්. ඉන්පසු අනික් ඇදුරුවරු හස්තීශිල්ප අශ්වශිල්ප රථශිල්ප ධනුඃශිල්ප ථරුශිල්පා දිය හා මුද්‍රාගණනාදී සංඛ්‍යාශාස්ත්‍රයන්ද උගන්වන්නාහ. අන් ඇදුරුකෙනෙක් සරණ දෙත් අන් ඇදුරුකෙනෙක් සිල් දෙත් අන් ඇදුරුකෙනෙක් පැවිදිකරවත් අන් ඇදුරුකෙනෙක් බුදු වදන් උගන්වත් අන් ඇදුරුකෙනෙක් උපසපන් කරවත් අන් ඇදුරුකෙනෙක් සොවාන්මාගීාදීන්ට පමුණුවත් මෙසේ ඒ සිය ලුම ඇදුරුවරු 'පසුඇදුරුවරු' නම් වන්නාහ. මව්පියෝ වූකලි සියලුන්ට පළමු පුතුන්ට ඉගැන්වූ හෙයින් 'පූර්ව්‍යාචාර්‍යවරයෝ' නමැයි කියනලද්දාහු දුරසිට ගෙනෙනලද රැස්කරනලද පිළියෙල කරනලද ආහුතයවූ ඵලවිශෙෂ සලකන්නහු විසින් ශිල්වත් ගුණ වතුන් විෂයෙහි දියයුතුවූ පුත්‍රයන්ගේ ආහාරපානාදීද්‍රව්‍යය මවු පියෝ උපකාරයට කෙත්වූ බැවින් පිළිගැනීමට සුදුසු වන්නාහ, එසේ හෙයින් මවුපියෝ පුත්‍රයන්ට 'ආහුනෙය්‍යයෝ'යයි කියනලද්දාහු මවුපියෝ තමපුතුන්ට අනුග්‍රහ කරන්නාහ අනුන්පණ සිද බිද නුමුත් තමසතු යම් ඒ කොයිදේ නමුත් පුදුවුවත් තමන්ගේ පුත්‍රපරම්පරාව පිළිදගින්නාහ ගොපනය රක්‍ෂණය කරන්නාහ. යන මේ තිකඝුත්තරවණ්ණනා නයින් දන්නේය.

චතුක්කඝුත්තරයෙහි කියනලද පූර්වදෙවතාවය නම්:–යම්සේ වනාහි ක්‍ෂීණාශ්‍රවසංඛ්‍යාතවූ විශුද්ධි දෙවියෝ බාලජනයන් විසින් කරනලද අපරාධය නොගැණ ඒකාන්තයෙන්ම ඔවුන්ට වැඩ දායකවූවක්ම කැමැත්තන්නාහුම හිතසුව පිණිස පිළිපදනාහුද දක්‍ෂිණාහීතාවයෙනුත් තමන්කෙරෙහි කරණලද ඒ උපකාර යන්ගේ මහත්ඵලමහානිශංසතාවය උසුලද්ද ඒ මාතාපිතෘහුද පුත්‍රයන්ගේ අපරාධය නොගැණ ඒකාන්තයෙන්ම ඔවුන්ට හිත සුව පිණිස පිළිපදනාහු දක්‍ෂිණාහියෝ වී තමන්කෙරෙහි කරණ ලද උපකාරයන්ගේ මහත්ඵලමහානිශංසතාවයද උසුලන්නාහ. එසේ හෙයින් ඔවුහු දෙවියන්ගේ වැනි පැවතුම් ඇති බැවින් දෙවියෝ නම් වන්නාහ. යම්සේත් පුත්‍රයෝතුමූ පළමු කොට ඒ මාතාපිතෘන්ගේ වශයෙන් අනික් දෙවියන් හැඳින පිළිපදනාහු

ප්‍රතිපත්තිඵලය අවබොධ කෙරෙද්ද එසේ හෙයින් අනික් සම්මුති උපපත්ති විසුඬි යන දෙවියෝ 'පජාදෙවයෝ' නම් වන්නාහ. මවුපියෝ වනාහි අනික් දෙවියන් කෙරෙන් ප්‍රථම කොට ඔවුන්ට උපකාරවත් බැවින් 'පුබ්බදෙවයෝ'යයි කියනු ලබන්නාහයි දත යුත්තේය.

දුතඞ්ගුත්තරවණ්ණනායෙහි වනාහි ආපාදකා යන්නට වඩා නය කරන්නහුය අනුව පාලනය කරන්නහුය යන අර්ථ දී පුත්‍රයෝ වනාහි මාතෘපිතෘන් විසින් වැඩිවඩිනය කරන ලද්දාහු යයිද, නැවත නැවත නොහොත් අවිච්ඡින්න වශයෙන් නොකඩ වම පාලනය කරන ලද්දාහුයයිද යන අදහස කියන ලද්දේය. **පොසඞා** යන්නට අත්පා වඩා හෘදය ලොහිතය පානය කරවා පොසනය කරන තැනැත්තෝය, යන අර්ථය දක්වා පුත්‍රයෝ වනාහි මවුපියන් විසින් පොෂණය කරන ලද්දාහුය හරණය කරනලද්දාහුය. ආහාරපානාදියෙන් පිළිදගිනාලද්දා හුය යන අදහස කියනලද්දේය.

දුතඞ්ගුත්තරටීකා යෙහි හදය **ලොහිතං** යන්නට කිරියයි අර්ථ දී ලොහිතය වනාහි ක්ෂීරභාවයෙන් පිරිනැමීම කැමති වන්නේය යන අදහස කියනලද්දේය. **දෙසෙනාරෝ** යන්නට ඉදින් වනාහි මවුපියෝ උපන්දිනමැ පුතු පාගෙන වෙනෙකැ හෝ ගෙනෙකැ හෝ හෙලකැ හෝ බැහුවාහු නම් ඒ දරුවෝ මෙලොවැ ඉටුනිවූ අරමුණු නොදක්නාහුය. එසේ නොකොට පොෂණය කළහෙයින් ඔවුන්ගේ ඉටනිටු අරමුණු දැකීම මව් පියන් නිසාම වූ හෙයින් ඒමාතෘපිතෘන හේ මේලොකය දැක්වූවාහු නමැයි අදහස දෙනලද්දේය. **පජාසඅනුකම්පකා** යන්නට තම පුතුන්ට අනුග්‍රහ කරන්නාහුය යන අර්ථය දී ඒ දෙමවුපියන් විසින් පරපණතාසා නමුත් අන්සතුදෙය කඩාවඩා කොලලකා නමුත් තමසතු යම්කිසිවක් පුදා නමුත් තමන්ගේ පුත්‍රප්‍රජාව පිළිදගින්නාහුය හොපතය කරන්නාහුය. එහෙයින් **පජාය අනුකම්පකා** යන මෙය කියනලදැයි යන අදහස දෙනලද්දේය. මේ ගාථාව **සොතානන්දජානකයෙහිත්** ආවේය.

මෙසේ ඔවුන්ගේ බහූපකාරත්වය බ්‍රහ්මාදීගුණවිසිෂ්ඨත්වය කරුණුබැව් දක්වනලද්දේය. යම්හෙයකින් පුත්‍රතෙමේ ඒ මවුපියන් ලෞකික උපකාරයකින් කිසිම ක්‍රමයකින් පිළියම් කරන්නට හෙවත් පෙරළා උපකාර කරන්නට නොහැකිවන් නේමද ඉදින් වනාහි අවුරුදුසියයට පරමායු ඇතිකලැ උපන්

එපමණක්‌ ජීවත් වන්නාවූ පුත්‍රයෙක්‌ හෝ මේ මවුපියන්ට පෙරළා උපකාර කරන්නෙමැයි සිතා දකුණු උරහිසෙ මවද වම් උරහිසෙ පියාද තබා හැමතන්හිම පරිහරණය කොට එහි සිටිය දීම ඔවුන්ව නැහැවීම් ඇඟඉලීම් අත්පා මැඩීම් ඇඟවිලවුම් ගැල්වීම් ආදී උපස්ථාන කරන්නේද ඔවුහුත් ඔහුගේ අංශකූටයන්හි සිටින්නාහුම මලමූත්‍ර විසර්ජනයත් කරන්නාහුද මෙලෙස පුතු අවුරුදුසියය මුළුල්ලෙහි කරන්නේ නමුදු මවුපියන් කළ දෙයට සමානවූවකුත් කරන්නට නොහැකිවන්නේය. ඒ තබා පියහු සක්විතිරජබැව්හිත් මව සක්විතිරජගුගේ අග මෙහෙසි බැව්හිත් පිහිටුවන්නේ නමුදු මවුපියන්ට උපකාර කෙළේ නම් නොවන්නේය. යමෙක් වනාහි අශ්‍රද්ධාදියෙන් යුක්තවූ මවුපියන් ශ්‍රද්ධාසම්පත්ත්‍යාදියෙහි පිහිටුවූයේද මෙපමණකින් පෙරළා උපකාරකරන්නට හැකිවන්නේ නම් වන්නේය.

එහෙයින් දුක්ඛඔහාරණෙහි මාතාපිතූනං සුත්‍රයෙහි මහණෙනි ජනකමවවද ජනකපියාටද යන දෙදෙනාහට උපකාර නොකෙරෙහැකියයි කියම් මහණෙනි සියක්ගවුරුදුදට පරමායු ඇති කල උපන්නාවූ සියක්ගවුරුදුදක්ම ජීවත්වන සුලු පුද්ගලයෙක් එක් අංශකූටයෙක්හි මවද එක් අංශකූටයෙක්හි පියාද තබා පරිහරණය කරන්නේය තවද ඒ පුත්‍රතෙමේ ඔවුන් අංශකූට යන්හි සිටියදීම දුගද දුරලීම පිණිස සුවඳ විලවුම් කිරීම් සංඛ්‍යාත උච්ඡාදනයෙන්ද විඩාසංසිදුවීම පිණිස අත්පා මැඩීමෙන්ද ශීතොෂ්ණකාලයන්හි උණුදිය සිහිල්දියෙන් නැහැවීමෙන්ද අත්පා ඔබමොබ ඇදීම් සඛ්‍යාතවූ සම්බාහනයෙන්ද උපස්ථාන කරන්නේය ඔවුනුද ඒ අංශකූටයන්හි හුන්නාහුම මලමූත්‍රවිසර්ජනයත් කරන්නාහුය. මහණෙනි! එසේ කළකල්හිත් මවුපියන් කළ උපකාරයට සමානවූවක් කරනලද්දේත් නොවෙයි කළදෙයට වැඩියක් කරන ලද්දේත් නොවෙයි. මහණෙනි බොහෝ සත්වරුවන්ඇති මේ මහාපොළොවෙහි ඉසුරට අධිපතිවූ සක්විතිරජබැවිහි මවුපියන් පිහිටුවා ලන්නේද මහණෙනි! එපමණකිනුත් මවුපියන්ට සමානව උපකාර කරනලද්දෙත් නොවන්නේය වැඩියක් උපකාර කරනලද්දේත් නොවන්නේය. ඊට හෙතු කවරේදයත් මහණෙනි! මවුපියෝ පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තාහ පුත්‍රයන්ගේ ජීවිතය පාලනය කරන්නාහුය අත්පා වඩා හෘදයලොහිතය පොවා පොෂණය කරන්නාහුය මෙලොව දැකීම් අරමුණු දක්වන්නාහුය එහෙයිනි. මහණෙනි! යමෙක් තෙමේ වනාහි සදහැනැති මවුපි

යන් සැදැහැගුණයෙහි පිහිටුවාද දුශ්ශීල මවුපියන් ශීලසම්පත්තියෙහිත් මසුරුමච්චිපියන් ත්‍යාගසම්පත්තියෙහිත් මොඞ්මවුපියන් ප්‍රඥාසම්පත්තියෙහිත් සමාදන්කරවාද නීවෙස කරවාද පිහිටුවාද මහණෙනි! මෙපමණකින් වනාහි මවුපියන්ට කළදෙයට සමානව උපකාරකරන්නලද්දේවෙයි වැඩියක් කරනලද්දේත් වෙයි අතිශයින් වැඩියක් උපකාර කරන ලද්දේත් වන්නේයයි වදාරනලද්දේය.

දුකනිපාතවණ්ණනායෙහි මවුපිය දෙදෙනඅතුරෙන් මවුතොමෝම ඉතා බොහෝසෙයින් උපකාරඇතිසෙයින් ඇයට ප්‍රධානභාවයෙන් පෙරළා උපකාර කටයුතුබැවින් දකුණුඅංශකුටය කියන්යයි කියනලද්දේය.

දම්සෙනෙවි සැරියුත් මහාස්ථවිරයන් වහන්සේ වැනිවූම මහණෙක් ඒ ශ්‍රද්ධාසම්පත්තාදියෙහි පිහිටුවන්නේ නමැයි දතයුත්තේය යනු එහි වණ්ණනානය වන්නේය. උපස්ථානය නම්: සත්කාරයෙන් හා නමස්කාරයෙන්ද උවටැන් කිරීමය එහෙයින් සබ්‍රහ්මසූත්‍රයෙහි හා සොණනන්දජාතකයෙහිත්

> "තසමා හි තෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතෝ
> අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච,
> උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච"සි.

වදාරනලද්දේය. එහිදු උදය සවස උපස්ථානයට ගොස් මේමාගේ උතුම් පින්කෙතයයි කියා නමස්කාර කරන්නේය ඊට අනතුරුව කැඳබත් කැවිලිපෙවිලි ආදියෙන්ද අෂ්ටවිධ පානවර්ගවලින්ද හදනාපොරොනා වස්ත්‍රයන් දීමෙන්ද ඇඳපුටු ඇතිරිලිකොට්ටමෙට්ටආදියදීමෙන්ද දුගඳදුරලීම පිණිස සුවඳ කරනවිලවුම් ඇඟගෑමෙන්ද නැහැවීමෙන්ද පාදෙව තෙල් මැකීමෙන්ද යනාදි මෙයින් සත්කාර කරන්නේය යන මේ අදහස එහි වණ්ණනානයින් දන්නේය.

විසුද්ධිමග්ගටීකායෙහි වනාහි උච්ඡාදනය නම් ඇඟ ඉලීමය සම්බාහනය නම් පිරිමැදීමයයි කියන ලද්දේය.

ඒ උපස්ථානවිෂයෙහි ගිහියා විසින් වූකලි නමස්කාර කිරීමෙන්ද මවුපියෝ උපස්ථාන කටයුත්තාහ. පැවිද්ද විසින් සත්කාරපමණකින්ම උපස්ථාන කටයුත්තාහ. මහණහු විසින්ද වනාහි මවුපියෝ උපස්ථාන කටයුත්තෝමය.

මාතාපිතෘඋපජ්ඣායානසංඛ්‍යාත මේ භාරුණවිෂයෙහි ලා දෝෂ යක් නොමැත්තේය. එහෙයින් **නතිඝපාරාජිකාදීසු හෙඨජ්ජ කරණවණ්ණනාසෙහි** යම්හෙයකින් වනාහි මහණතෙමේ තමන්ගේ මැණියන් තමන් වසන විහාරයට ගෙනවුත් තබාගන පිළිදහින්නේ වේද ඒ මහණ විසින් මැනියන්ගේ ශරීරය ආමශී නය නොකරමින් සියලු දෑ කටයුත්තේය. තමපියාණන් වනාහි ගෙනවුත් පිළිදගනේ චීනම් හෙරණවහන්දූ කෙනෙකුට මෙන් සියතින්ම නැහැවීම් ඇඟඉලීම් ආදී සියලුකටයුතු දෑ කොට උපස්ථාන කටයුත්තේයයි කියනලද්දේය. මෙහිදු මේ මාගේ මවයයි ගෙහසිතාප්‍රේමයෙන් ආමශීනය කරන්නාහට දුකුළා වක්ම වන්නේයයි දැක්වීම පිණිස ආමශීනය නොකිරීමෙනැයි කියනලද්දේය. එහෙයින් **ඛාරුණසංඝභීඝික්ඛාපදවණ්ණනාසෙහි** ඉදින් මහණෙක් තෙමේ ගඟදියසැඩපහරින් ගසායන තම මවුන් දුටුයේ චීනම්බදු අතින් පරාමශීනය නොකටයුත්තීය ඔරු පාරුඅාදියක් හෝ පුවරුවක් හෝ හෙහෙල් කඳක් හෝ දැව කඳක් හෝ ඉදිරියෙහි තැබිය යුත්තේය. එබන්දක් නොලත් කල තමන්සිව්රවත් ඉදිරියෙහි තැබියයුත්තේය මෙහි මෙය අල්වාගනුවයි නොකියයුත්තීය. අල්වා ගත්කල තමපිරිකර ගන්නා අයුරෙන් ඇදගතයුත්තීය. යම්හේකින් මවි හොමෝ බියවී නම් පෙරටුපෙරටුව යමින් නොබවයි කියමින් අස්වසා ලිය යුත්තීය. ඉදින් මියන්ට යන්නී වහාම පුත්වූ මහණහුගේ කරේ හෝ නහීද අත හෝ අල්වා ගනීද පහවෙව මැහැල්ලියයි කියා ගඟානොදමා ගොඩබිමට පැමිණවිය යුත්තීය. මඩෙහි ගැලුණු මව කෙරෙහිද ලිඳෙහි වැටුනු මවකෙරෙහිද මෙමනයින් ම පිළිපැදිය යුත්තේය. එහිදු ගොතක් හෝ වසත්‍රයක් හෝ බහා එය අතින් අල්වා ගත්බව දැන ගොඩනගාලියයුත්තීය. ආමශීනය නොකටයුත්තීමය. යන මේ අර්ථය කියනලද්දේය. ඔවුන්ට බෙහෙත්කරන්නෙත් වෙදකම් නම් නොවන්නේය. අනාමඬපිණ්ඩය දීමෙහිදු ශ්‍රද්ධාදෙය්‍යය නැසීමක් නොවන්නේය. එහෙයින් **හෙඨජ්ජකරණවඝනුවණ්ණනාසෙහි** ඉදින් යම්කිසි මහණෙකුගේ මවුපියෝ පොහොසත්වූවාහු නම් ඒ මහණහුගෙන් බෙහෙත් බලාපොරොත්තු නොවන්නේ නම් බෙහෙත් නොකරන්නට වටනේය. ඉදින් වනාහි රාජ්‍යයෙහි පිහිටියාහු නමුත් පුත්වූ මහණහු කෙරෙන් බෙහෙත් බලාපොරොත්තු නම් නොකරන්නට නොවටනේය. අනාමඬපිණ්ඩපාතයද මවුපියන්ට දියයුත්තේය. ඉදිනුදු පිණ්ඩපාතය කහවණුවක් අගනේ වී නමුදු ශ්‍රද්ධාදෙය්‍යය නැසීමක් නැත්තේයයි කියනලද්දේය.

අඤ්ඤං නවට්ටති යනුවෙන් බෙහෙත් නොකරන්නට නොව පිසි ඇත මෙහි දුකුළාඇවතක් වන්නේයයි කියත්. අයුත්ත තාවශයෙන්ම වනාහි මෙහි නොකරනු ප්‍රතික්ඛෙප කිරීම කියන ලද්දේය. ආපත්තිවශයෙනැයි කියා නොගතයුතුයයි **විමතිවිනෝදනියෙහි** කියනලද්දේය. අනාමඞ්ගපිණ්ඩපාතය නම් නොපැවිද්දක්හු අතින් ලබනලද තමාවිසින් හෝ අනිකෙකු විසින් හෝ නොගන්නාලද අග්‍රභාගය ඇති පිණ්ඩපාතයයි **සාරාදීපනියෙහි** කියනලද්දේය.

එසමයෙහි වනාහි එක්තරා මහණක්හට සිවුරු වැඩියක් ලැබුනේවීය, ඒ මහණ තෙමේද ඒ සිවුරු රැස මව්පියන්ට දෙනු කැමතිවීය, ඒ බව බුදුරජාණන් වහන්සේට සැලකළාහුය භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මහණෙනි! මවුපියන්ට දෙනුලබන කල්හි මම කුමක් කියන්නෙම්ද මහණෙනි! මවුපියන්ට දෙන්නට මම නොපට අනුදනිමි මහණෙනි! මව්පියන්ට හැර සෙසු ඤාතීන්ට දීමෙන් ශ්‍රද්ධාදෙය්‍යය නොනැසියයුත්තේය. යමෙක් එසේ කොට නැසුයේ විනම් දුකුළාවන්නේය යනු **විවරක්ඛන්ධකපාළියෙහි** වදාරනලද්දේය. මවුපියන්ට වනාහි තමන්සතුවූ ඵලමල්ද දෙන මහණහු විසින් තෙමේම ගෙනගොස්ද අනිකෙකු ලවා ගෙන්වාගන ගොස්ද තමන්වෙත කැඳවාද දෙන්නට වටනේය. සෙසුඤාතීන්ට වූකලි තමන්වෙත කැඳවාම දෙන්නට වටනේය ඔවුනතුරෙන් මල්දෙන්නහු විසින් තුනුරුවන් පිදීම පිණිසම දෙන්නට වටනේය සැරසීම් පිණිස හෝ ශිවලිඟපූජා පිණිස හෝ කහවු නුමුත් දෙන්නට නොවටනේය යනු **කුලදූසකසික්ඛාපදවණ්ණනානය** වන්නේය.

මෙය විකුට ජීවත්වන්නේයයි සිතා මවුපියන්ට දෙන්නට වටනේය සෙසුඤාතීන්ට වනාහි තාවකාලිකවශයෙන්ම දෙන්නට වටනේයයි **විමතිවිනෝදනියෙහි** කියනලද්දේය.

එහෙයින් භික්ෂුව විසින්ද යථොක්ත නයින් ඒ මාතාපිතෘහු උපස්ථාන කටයුත්තෝමය.

පාලියෙහිදු "මාතාපිතූ උපඨානං"යි අවිශෙෂයෙන් වදාරන ලද්දේය. අර්ථකථාචාරීන් විසින් ගිහිභාවය නොඅරණතාක් මාතාපිතෘඋපස්ථානයෙන් ශෙෂව තුබූ පැරණි නය මිල පිරිසුදු කරන්නාහු නමුදු අවශ්‍යතයෙහි ගිහින්ගේ වශයෙන් යම් උපස්ථානයක් කියනලදද ඒ මාතාපිතෘඋපස්ථානය නම් ගිහිවකෙකැයි

දක්වනු පිණිසත් පැවිද්දහු විසින් උපස්ථාන නොකටයුතු නොවේයයි දැක්වීම පිණිසත් තවද පැවිදිවන්නහු විසින් නම් නය ගැනියෙක් නොවියයුතුයයිද දක්වනු පිණිසත් මෙය කියන ලදැයි දතයුත්තේය. එසේ හෙයින් යම් ඒ භාග්‍යවතුන් මවුපියහු නම් උපස්ථානකටයුත්තෝමය.

මව්පියන් කෙරෙහි වරදවා පිළිපදනාවූ පුද්ගලයෙමේ වනාහි දුකට පැමිණෙන්නේය. මෙහි මිත්තවින්දකාදීහු නිදසුන් වන්නාහ.

භාසුප් බුදුරජාණන් වහන්සේ දවස වනාහි බරණැස් නුවර එක් ගමෙකැ අසූකෙළක් ධනය ඇති කුලයක්හුගේ දුශ්ශීලවූ අශ්‍රද්ධාවන්තවූ මිත්තවින්දක නම් පුත්‍රයෙක් ඇත්තේය. ඔහුගේ මව්පියෝ වනාහි සොවාන්යහ. නැවත බාල්‍යාමකින් ඔහුගේ පියතෙමේ මෙළේය. මවු තොමෝ පුතුහට අවවාද කරන්නී 'මපුතණඩ! මෙලොව ඇත පරලොව ඇත දන්පින් කරව"යි කිය. ඒ මිත්තවින්දක තෙමේ පින්කම් කොට කුමන කාරියෙක්ද පින්කම් කොට ලබන්නේ කිමදැයි මැණියන් කීවා නොකොට ඒ යාපතනපුර මමම දනගනිමි. නුඹට ඇසිදැයි කියා අනාචාර ශීලීවම වසන්නේය. මෙසේ කල්යනඅතර පසළොස්වක් පුණු පොහෝදවසෙක්හි මිත්තවින්දකයාගේ මැණියෝ කියන්නාහු 'පුතණඩ! අද පොහෝදවසය නොපට මසුරන් දහසක් දෙම් විහාරයට ගොස් බණ අසා එව'යි පුතනුවන්ට කිහ. පුතාත් යහපතැයි සම්පතෙහි කළ ලොභයෙන් දවල් මුළුල්ලෙහි ඇත මැත ඇවිද දුෂ්කම්කොට සවස්වෙලෙහි ගණිකයට ගොස් බණ නොමැසෙන තැන දුර වැදහෙව් නිදු නැගී උදැසන ඇසමුව සොදු ගෙට ආයේය. උන්ගේ මැනියෝත් අද මපුතු බණ අසා තෙරුන්වහන්සේ කැඳවාගෙන එන්නේයයි කැඳ අවුලු ඉදිකොට උන්නාහුය. ඒ මිත්තවින්දකයාත් තනිවම ගෙට එන්නා දැක මැනියෝ කියන්නාහු ඇයි පුතණඩ! තෙරුන්වහන්සේ කැඳවාගත නොමායේදැයි කිහ. එවිට ඔහු මම මසුරන් දහස නිසා බණ අසන්නට ගියා පමණක් විනා තෙරුන් කැඳවාගත එන්නට ගියෙම්දැයි කීය. එසේත් තොප බණ ඇසුයේම මට ලාභයෙක නොපි මේ කැඳත් බී අවුළුපතුත් අනුභවකරවයි කිහ. මට මසුරන් දහස දුනකොත් විනා කැඳ අවුළුපත් අනුභව නොකරමියි කියා මසුරන් දහස ඇරගෙන කැඳඅවුළුපත් අනුභව කොට වෙළඳුමට

ගොස් වෙළඳුම් කොට මසුරන් එක්ලක්ෂවියදහසක් සොයාගෙන ගොස් මැණියන්ට කියන්නේ මැණියෙනි! මම නැවින් වෙණදුම්ට යෙමියි මිල දෙවයි කිය. 'මපුතණඩ! නුඹ මාගේ එකම පුත්‍රයාය සමුද්‍රය නම් අතෙහා උපද්‍රව ඇත්තේය එබදු සමුද්‍රයෙහි නැව් නැගී ගොස් කරණ වෙණදුම නම් විශ්වාස නොකළහැක්ක මේ ගෙහි ධනයද බොහෝය වෙණදුමට යන්නේ මේ සම්පත් මදි වද නොයවා'යි කිහ. හෙතෙමෙත් මම යන්නෙම්මය මා වලහන් නට නොහැක්කිමයයි කියා යන්නටම ඇරඹිය. එවිට මැණියන් අනේ පුතණඩ! නොයවයි කියා අත අල්වාගත්තාල අත පැහැර මවට පහර දී බිම හුනුහාල මවගේ කඳ අතර කොට ගොස් නැව් නැගී මුහුදෙහි සත්දවසක් දිවුකල සත්වන දිනයෙහි මිත්තවින් දහයා නිසා ඒ නැව සමුද්‍රමධ්‍යයෙහි ඇණයක් ගසාපුවාක් මෙන් නොසෙලවී නැවතිත. එවිට නැවියෝ ඒකාන්තයෙන් මෙහි කාලකණ්ණියෙක් ඇත්තේ වන්නේයයි සලකා කුඹපත් ලා බැලූහ. ඒ මිත්තවින්දකයාගේ නම ලියූ කුඹපත තෙවරක්ම ඔහු අතට පත්විය. ඉක්බිති නැවියෝ ඔහු මුහුදුපිට අලහ. ඔහු පසුරකින් යන්නේ නොහොත් ප්‍රවරුවක් අසුරුකොට පිහිනන්නේ පිළිවෙළින් ගොස් දෑවාණමය ප්‍රාසාදයක විමානප්‍රෙත නම් සත්‍රින් සතරදෙනෙකු ඉන්නා සථානයකට පැමිණියේය. ඔවුහු ඒ මිත්තවින්දකයා දූක ප්‍රාසාදයට ඇරගෙන නවා පොවා සත් දවසක් මුළුල්ලෙහි සැපවිඳ සත්දවසක් දුක්විඳින්නට යන්නාහු අප එනතුරු උකටලී නොවවයි ඔහු ප්‍රාසාදයෙහි රඳවා ගියාහ. ඒ දිව්‍යස්ත්‍රින්ගේ ප්‍රාසාදයෙහි සම්පත් විඳනොහී පෙරනයින්ම ගොස් දිව්‍යස්ත්‍රින් අටදෙනෙකු හිඳිනා රිදීමය විමානයකටද එතනින් ගොස් දිව්‍යස්ත්‍රින් සොළසක් හිඳිනා මැණික්මය විමානයකටද එහින් නොරඳා පෙරනයින්ම ගොස් දිව්‍යස්ත්‍රින් දෙතිස් දෙනෙකු හිඳිනා සවණීණමය විමානයනට ගොස් සැපවිඳ එහින් නොරඳා පෙරනයින්ම ගොස් වටපවුරක් ඇති මහල් සතරකින් යුත් නුවරක්සේ බොහෝ නරකයෙහි පෙනෙන්නාවූ මනුෂ්‍යයන් දූක එතනට පැමිණියේය එය උස්සදනරකය නම් වන්නේය. එය බොහෝ තිරිසතුන්ගේ කම්කටුලු අනුභවකරන තැනක් වන්නේය. මිත්තවින්දකයාහට වනාහී එය අලංකාර කොට සරසනලද නුවරක් මෙන් වැටහී මවට ප්‍රහාර දුනයකළ කම්බලයෙන් 'මම මේ නුවර රජවන්නෙමි'යි සිතා එහි පිවිස බැලුවිට එතන එක් පවුලක පුරුෂයෙක් බුරවක්‍රමාලාවක් හිසැ තබා ගෙන පැසෙන්නා දූක මිත්තවින්දකයාහට ඔහු තෙලුම්

මලක් හිසතබාගත සිටින්නෙකුසේ පෙති ඔහුලය පස්තැනකින් යදමකින් මසා තිබුනා අවුල්හරක්සේ පෙණී ඌඇඟ මුළුල්ල ඛුරවක්‍රමාලාවෙන් කැපී ලෙහෙසෙන් තැවරී පිරී තිබුනා ඇඟ හැල්වූ රකතවඳනාකල්පායක් සේ පෙණී වෙදනාවෙන් මුරගා නේ ගී කියන හඬක් සේ ඇසී ඔහුවෙත ගොස් 'එඬල පුරුෂය! මේ නෙළුම්මල මට දීපියවසි නාවියින් මෙය බොහෝකලක් ධරණලද්දේය ඉතින් මෙය මට දීපියව'සි කියා

"යහලුව! මේ පියුමක් නොවෙයි මෙය ඛුරවක්‍රයෙකා මාගේ ලෙහි නිබෙන මෙය උරවජදප්‍රසාදනයක් නොවෙයි පවගිකා ඛණ්ඩයෙකා මේ වැගිරෙන්නේ රකතවඳන ලෙපනය නොවෙයි භ්‍රමණයවන ඛුරවක්‍රයෙන් කැපී වැගිරෙන ලෙයයි මා මේ කියනලද්දී ගීතිකාවන් නොවෙයි නොඉවසියහැකි වෙදනාව නිසා මුරගාකියන විලාපයයි මම මේ නටනවා නොවෙයි වෙදනාවගේ නොඉවසීමෙන් දහලන දුහලීමයි කියේය.

එවිට මිතතවිඳුකයා මට මෙය නොදෙනුකාමති හෙයින් මෙසේ කියනෙහිය ඔය පියුම මට දෙවයි යලියලිත් ඉල්වීය එකල නිරිසත් තෙමේ මාගේ කාමය කෂයවූයේ වන්නේය මොහුදු මා සේම මව මරාහෝ තළා ආයෙක් වියයුත්තේය එහෙයින් මොහට ඛුරවක්‍රය දෙමැයි සිතා පින්වත! මෙහි එව මේ පියුම ගනුවයි කියා ඒ ඛුරවක්‍රය ඔහුගේ හිසැ ලා අතුරුදන්වූයේය.ඒ කුරසක ඔහුගේ හිසැ පිසින්නාක් මෙන් භ්‍රමණය වන්නට පටන්ගත්තේය එකෙණෙහි මිතතවිඳුක තෙමේ එය ඛුරවක්‍රභාවය දැන 'කුරසක ගනු කුරසක ගනු'සි කියා වෙදනාවට පැමිණ වැල පෙන්නට පටන්ගත්තේය. මිතතවිඳුක තෙමේ වනාහි මවට පහරදුන් අකුසලබලයෙන් එහි බොහෝ කාලක් දුක් අනුභව කොට කාමය කෂයවූ කල්හි කුරසක හැර කම්වූ පරිද්දෙන් ගියේය.

දසකනිපාතයෙහි චතුවාර ජානක වණ්ණනායෙහි මිතතවිඳුකවස්තුව මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

අතීතකාලයෙහි බරණැස් නුවර එක්තරා පුරුෂයෙක් ඇඹ නියගේ වචනය ගෙන තමාගේ අඳ මවුපියන් නසනු කැමැත්තේ ඔවුන් යානාවකින් ගෙනයන්නේ වනමැදට වන්කල මෙහි සොරු වෙසෙත් මම බැස යන්නෙමියි කියා පියාගේ අතෙහි රැඟැන දී තමන් බැස යන්නේ සොරු එළඹිසිටි අයුරක් කොට

මව්පියන් තැළෑයේය. ඔහුතුමු ඇස් දුම්ල හෙයින් රූපදර්ශන රහිතවූවාහු පුතු නොහඳුනන්නාහු 'පුතණඩ! අඩවල් නම් සොරු අප නසත් නුඹ මහහැර පලායව'යි කියමින් ඔහු පිණිසම වැල පුනාහුය. හෙතෙමේ 'මොහුතුමු මවිසින් තළනු ලබනු කල්හිත් මා පිණිසම වැලපෙන්නාහ මවිසින් අයුත්තක් කරණලදැ'යි සිතා ඒ දෙමව්පියන් අස්වසා අත්පාවිඩා සංසිඳුවා 'මැණියෙනි! පියා ණෙනි! සොරහු පලාගියහ'යි කියා තවගෙටම ගෙනආයේය. ඔහු ඒ අකුසලකම්යෙන් දීඝීකාලයක් නරකයෙහි පැසි විපාකාව ශෙෂයෙන් සියක්අත්බැවිහි කොටා තළා සුණුවිසුණු කරනලදුව මරණයට පැමිණ පශ්චිම අත්බැවෙහි මහාමෞද්ගල්‍යා යන නම් අග්‍රශ්‍රාවකයන් වහන්සේ වී එම අකුසලකම්යාගේම බලයෙන් සොරුන් විසින් තළනාලදුව පිරිනිවිසේක.

සරභඟජාතක වණ්ණනායෙහි මහාමෞද්ගල්‍යායන වසනුව මෙසේ සැඟෙවින් දක්වා නිමවන ලද්දේය.

ඒ මාතාපිතෘන් කෙරෙහි යථොක්ත පාරිචරියායෙන් මනා සොට පිළිපැදීම හෙතුකොටගෙන වනාහි ඒ පාරිචරියා තොමෝ දෙලෝහිතසුව ඵලවන්නීමය. එසේ හෙයින් **සබ්‍රහ්මසූත්‍රයෙහි හා සොණනන්දජාතකයෙහින්**

"තාය නං පරිවරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධ වෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති"යි

යන මෙය වදාළසේක. ඒ ගාථායෙහි **තාය නං** යන තන්හි 'නං' යනු නිපාතයයි **තිකඛත්තුපරාමිකායෙහි** කියනලද්දේය. මාතාපිතෘන් කෙරෙහි පවත්වනලද ඒ පාරිචරියාව කාරණා සොට ගෙන මේ පුද්ගල තෙමේ මවකෙරෙහි හිත පිණිස පිළිපන්නෙක පියාකෙරෙහි හිත පිණිස පිළිපන්නෙක සවගීය පිණිස පවත්නා ප්‍රතිපදාව පුරන්නෙකැයි යනාදී නයින් ඒ මාතාපිතෘ උපස්ථායිකයා **පණ්ඩිතමනුස්සයෝ** මේ ලොකයෙහිද වණ්ණනා කරන්නාහුය මිනිසත්බැවින් චුතවැ පරලොවැ ගොස් සගෙහි සිටියේ ඒ මාතාපිතෘඋපස්ථායික පුද්ගලතෙමේ මූලපටන්ම සතුටු වන්නේය යනු ඒ ගාථායෙහි අදහස වන්නේය.

මාතාපිතෘ උපස්ථායකයා නම් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ විසිතුදු ප්‍රශංසාකරනලද්දේමය එහිලා මේ කථා වස්තුහු දතයුත්තාහ.

සැවැත්නුවර වනාහි එක් සිටුපුත්‍රයෙක් ශාස්තෘන් වහන්සේගේ ධර්මදෙශනාව අසා පිළිලද සැදුහැතියේ පැවිදිවැ ලබන

ලද උපසපන් බැව් ඇතිසේ පස්වසක් දහම් පුහුණුකොට උපාඛ්‍යායයන් සම්පයෙන් කමටහන් ගෙන දෙවරමින් නික්ම පසල්ගමකට වැද එගම ඇසුරුකොට වෙනෙහි විසූසේය. ඔහු පැවිදිවූ කල්හැන් පටන් මවුපියෝ පිළිවෙළින්ම ක්ෂයවූ සමපත් ඇත්තාහු අතිශය දිළිඳු බවට පැමිණියාහු කබල්ගත් අත් ඇත්තාහු සිහා වළඳ අනුන්ගේ ගෙපිළිකණු නිසා වාසය කරන්නාහ. ඒ මහණතෙමේ මැනහාගයෙහි තමන්ගේ මවු පියන්ගේ දුඃඛිතභාවය අසා "මම දෙළොස් හවුරුද්දක් වෙනෙහි ව්‍යායාම් කොටත් මාගීඵලයක් ලබන්නට නොහැකිවීමි මම මාගීඵල ලබන්නට අභව්‍යයෙක්මි මට පැවිද්දෙන් කුමන වැඩෙක්ද? හිහි වී මවුපියන් පොසතය කෙරෙමින් දානාදී පින් කෙරෙමින් සඟපරායණ වන්නෙමි"සි සිතා වෙනෙන් නික්ම පිළිවෙළින් සැවැත්නුවරට පැමිණ 'අද බුදුන් දැක බණ අසා සෙට උදෑසනම මවුපියන් දකින්නෙමි"සි සිතා දෙවිරමට වන් නේය. එදවස වනාහි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ අලුයම් ලොව බලාවදුරණසේක් ඔහුගේ ප්‍රථමමාගීයට හෙතුසම්පත් දැක ඔහු පැමිණ වැදහුන් කල්හි **මාතුපෝසකසුත්‍රයෙන්** මාතෘපි තෘන්ගේ ගුණවර්ණනා කොට වදාළසේක. ඒ මහණතෙමේ ඒ අසා 'මම ගිහිවී මවුපියන් පොසතය කරන්නෙමි'යි සිතා ආයේ වෙමි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ 'පැවිද්දෙක් වූයේමත් මවුපියන්ට නම් උපකාරකාරයෙක්මය'යි වදාරති ඉදින් මම බුදු රජාණන් වහන්සේ නොදැක ගියේ වී නම් මෙබඳුවූ පැවිද්දෙන් පිරිහෙන්නෙමි දැන් වනාහි මම පැවිද්දෙක් වූයේම ඒ මවුපියන් පොසතය කරන්නෙමි'සි සිතීය. ඒ මහණ තෙමේ දෙවනා දිනෙහි තමන්ගේ පාත්‍රයද කෑදලඟබත්ලහද ගෙන ගම්වැද කෑදබත් ආදිය ගෙනවුත් මවුපියන්ට දී යලිත් පිඬුසිඟා බත්කිස කොට ඔවුන්ට වාසස්ථානයක් කොට එතැන් පටන් නිතර මවුපියන් පිළිදගනේය. ඒ මහණතෙමේ වනාහි තමන් ලබනලද පකඹිත බත්ආදිය ඔවුන්ට දී තෙමේ පිඬුසිඟා ලැබුනොත් වළඳයි නො ලැබුනොත් නොවළඳයි ලැබෙනදවසට නොලැබෙන දවස් ඉතා බොහෝ වන්නාහ. විස්සාවාසිකවූ හෝ වෙන යම්වූ හෝ වස්ත්‍ර යක් ලැබ ඔවුන්ටම දී ඔවුන් විසින් පරිභොග කරනලද කඩ රෙදි අහුලු කොට පඬු පොවා තෙමේ පරිභොග කරන්නේය. මෙසේ ඒ මහණ තෙමේ මවුපියන්ට කරනලද උපස්ථාන පළි බොධයෙන් පෙළෙන්නේ වැහැරගියේය. ඒ දැක මහණහු භික්ෂූ ය දැන ඒ මහණහට ගරනා ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේට ආරොවනය කළාහුය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඒ මහණ

කාඳවවා කාරණය දන්නාසේක්ම විචාරා ඔහු ලවා කියවා සාධුකාර දී තමන්වහන්සේගේ පූර්වචරිතයක් වදාරනු කැමතිසේක් 'මහණ! තෝ යම් ඒ කවුරුන් නමුත් පොසතය කෙළේ නම් ඔවුන් තාගේ කවරහුදැ'යි පිළිවිසිසේක. 'සවාමීනි බුදුරජාණන් වහන්ස! ඔවුහු මාගේ මව්පියෝය'යි සැලකෙළේය. එක්ඛිති තථාගතඛාදී කාරණයෙන් තථාගත නම්වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ ඕහට තුන්යලක් සාධුකාර දී 'මහණ! තෝ මව්සින් යනලද මාගීයෙහි ගියෙකා මම්ද පෙර මවුපියන් පොෂණය කෙළෙම්මය'යි වදාරා **මහානිපාතයෙහි සුවණ්ණසාමජාතකය** වදාරා චතුස්සත්‍යයන් ප්‍රකාශකොට වදාළසේක...චතුස්සත්‍ය දෙශනා පරියොසානයෙහි ඒ මහණ තෙමේ සොවාන් වූයේය...

තවත් මහණෙක් තෙමේ එසේම මවුපියන් පෝසතය කෙළේය. සියල්ල පෙරසේම කියයුත්තේය. ශාසනඃන් වහන්සේ ඕහටද සාධුකාර දී සත්තනිපාතයෙහි **සුතසොමජාතකය** වදාරා චතුස්සත්‍යයන් ප්‍රකාශකොට වදාළසේක...චතුස්සත්‍යදෙශනාවසානයෙහි ඒ මහණතෙමෙද සොවාන්වූයේය...

තවත් මහණක්හටත් සාධුකාර දී 'මහණ! තෝ පැරණි පඬිවරයන්ගේ වංශය පාලනය කෙළෙහිය පැරණි පඬිවරයෝ නිරිසන්යෝනියෙහි ඉපිදත් මවුපියන්ට දිවිදුන්නාහ'යි වදාරා **ඡඡ්ඣනිපාතයෙහි නන්දිසමිගජාතකය**...තවත් මහණක්හටත් සාධුකාරදී **සත්තනිපාතයෙහි ගිජ්ඣජාතකය**...තවත් මහණක්හටත් සාධුකාර දී "මහණෙනි! මේ මහණ ලාමක කොට නොසිතව් නොකියව් පැරණි පඬිවරයෝද ගුණවෘතයෙන් තොනැසන්ටද උපකාර කළාහුය මවුපියන්හට උපකාරකිරීම මෝහට භාරය"යි වදාරා **දුකනිපාතයෙහි ගිජ්ඣජාතකය**...තවත් මහණක්හටත් සාධුකාර දී "මහණෙනි! පෙර පඬිවරයෝ තිරිසන් ජාතියෙහි ඉපිදත් ජරාජීර්ණවූ මවුපියන් කැදැල්ලෙහි හෙවවා මුවතුඩින් ගොදුරු ගෙනවුත් පොෂණය කළාහුමය"යි වදාරා **ප්‍රකිණ්ණක නිපාතයෙහි කෙදරජාතකය**...තවත් මහණක්හටත් සාධුකාර දී "මහණෙනි! මේ මහණ ලාමක කොට නොසිතව් නොකියව් පුරාණ පණ්ඩිතයෝ තිරිසන් ජන්මයෙහි ඉපිදත් මවගෙන් තොරවූවාහු සත්දිනක් නිරාහාරතාගෙන් වියලුනාහු රාජභොජනය ලැබත් මව නොදැක අනුභව නොකරන්නෙමිසි කියා මව දැකම අහර ගත්තාහුය"යි වදාරා **එකාදසනිපාතයෙහි මාතුපොසකජාතකය** වදාරා චතුස්සත්‍යය

ප්‍රකාශකළසේක. චතුස්සත්‍යදෙසනාවසානයෙහි ඒ පස්නමද සෝවාන් ඵලයෙහි පිහිටියාහුය.

මෙසේ මව්පියන්ට උපස්ථාන කරන පුද්ගලතෙමේ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ විසිනුත් ප්‍රශංසාකරන ලද්දෙක්වී ආත්ම හිතෝපායයටත් පැමිණෙන්නේය.

මාතෘපිතෘඋපස්ථායක පුද්ගලතෙමේ නම් විෂපොවනලද හියෙන් විදිනාලද්දෙත් සුවණ්ණසාම නම් තවුසාණන් මෙන් මරණ දුකින්ද මිදෙන්නේය යක්ෂයෙකු සමීපයට පැමිණියේත් සුතන නම් දුගියා මෙන් මිදෙන්නේය. රුකුම්ඛළ ඇතෙක්හි සිටියෙත් නාදියමෘගයා මෙන් මිදෙන්නේය මලෙක්හි බැඳුනේත් හිජ්ජලිහිණිරාජයාමෙන්ද සුවරාජයාමෙන්ද මිදෙන්නේය බඹුනයෙන් බඳනාලද්දේත් හස්තිරාජයාමෙන් මිදෙන්නේය.

ඒ කරුණුවිෂයෙහි මේ මතුපහළවන ජාතාවතුනු නිදසුන් වන්නාහ.

යවගිය දවස අපමහබෝසතාණන් වහන්සේ සුවණ්ණසාම නම් තාපසතෙනෙක් වී 'මිග' නම්වූ ගහනීරයෙහි පිහිටි 'සකක දත්තිය' නම් අසපුවෙහි වාසය කරමින් තමන්ගේ අඹුවූ මව්පියන් සකස්කොට පිළිදගනාහ. එකල්හි බරණැස් නුවර 'පිළියක්' නම් රජතෙමේ මුවමස් ලොබින් මැණියන්ට රජය භාර කොට හුදකලාවූයේම හිමවතට ගොස් මුවන් විද මරා මස්කමින් හැසිරෙන්නේ එතැනට පැමිණ සාමතවුසාණන් පැන් ගන්නා තොටෙහි මුවපියසටහන් දැක අතුකොටුවක් තනා සැඟ වී සවස් කාලයෙහි මුවමුළුපිරිවරින් අවුත් සනානය කොට යන්නාවූ සාම තවුසාණන් දැක විෂ පොවනලද හියකින් විද්දේය. මහබෝසතා ණන් වහන්සේ වැටී හොත්තේ අපරාධකාරයා සොයමින් මෘදු මොළොක්වචන කියේය. එකල පිළියක් රජතෙමේ ඒ අසා 'මේ තෙමේ මව්සිත් විද වැටෙනලද්දේත් මට ආක්‍රෝශ නොකෙරෙයි පරිභාෂණය නොකෙරෙයි ප්‍රියවචනයෙන් කථාකෙරෙය'යි සිත මින් ඔහුවෙත ගොස් දුක්දෙම්නස් ඇති ඔහු දැක තෙමේත් හැඬුයේය. එකල්හිදු ගඞ්ගාමාදනපර්වතයෙහි වසන 'සුන්දරී' නම් දෙව්දුවක් නොමෝ මහබෝසතාණන් වහන්සේට පෙර සත් වන අත්බැවිහි මවු වූවිරී ඒ කරුණ දැන "ඉදින් මම එහි නොගියොත් මපුත්වූ සාමතෙමේ මැරෙන්නේය ඔහු මලකල ඔහුගේ මවුපියෝද නිරාහාරව මැරෙන්නාහ පිළියක් රජතෙමෙද ළඟපැලී මැරෙන්නේය මා එහි ගියකල රජ්ජුරුවෝ අසපුවට

ගොස් සාමයාගේ මවුපියන් ගෙන එන්නාහ ඔවුහු අවුත් සත්‍ය ක්‍රියා කරන්නාහ මමද සත්‍යක්‍රියා කරන්නෙමි මෙසේ මාගේ පුත්‍ර නෙමේ ජීවිතය පිළිලබන්නේය ඔහුගේ අඳ මවුපියෝද නෙත් පිළිලබන්නාහ රජ්ජුරුවෝද සාමතවුසන්ගේ දෙඝනාව අසා නුවරට ගොස් දුනාදී පින්කම් කොට දැහැමින් සෙමින් රජය භොට සවගීපරායණ වන්නාහ" යන මෙතෙක් දැ සිතා එහි ගොස් අදෘශ්‍යමානශරීරයෙන් සිට "මහරජ! නුඹ සාමයාමෙන් ඒ අන්ධයන් දෙදෙන පොසනය කරනෙහි මෙසේ තාවිසින් දෙව් ලොව යායුතු වන්නේය"යි කිය. එබස් අසා රජතෙමේ ඔවුන්ට උපස්ථානයට අසපුවට ගොස් සියලුම පුවත කියා මහරජ! එහෙ නම් අප ඔවුන් වෙත පමුණුවයි කීකල රජ්ජුරුවෝ ඔවුන් එහි පැමිණවූහ. එසේ උන්වෙත පැමිණ

"යෙන සච්චේනයං සාමෝ ධම්මචාරී පුරෙ අහු,
එතෙන සච්චවජ්ජේන විසං සාමස්ස හඤ්ඤතු"

යනාදී සත් ගයකින් සත්‍යක්‍රියා කළාහුය.

එහි අදහස නම්:-මේ සාමතෙමේ පෙර යම් භවභාවයකින් දසකුසලකම්පථසංඛ්‍යාතධම්මයෙහි හැසිරෙනසුලු කෙනෙක් විද ඒ මේ සත්‍යය කරණකොට මේ සාමයාගේ විෂය නැසේවා යනුයි. මෙසේ සත්‍යක්‍රියා කළකලද සාමතෙමෙ පෙරළී හොන්මය ඉක්බිති මදව්තොමෝද

"පබ්බත්‍යාහං ගන්ධමාදනෙ විරරත්ත නිවාසිනී,
න මෙ පියතරො කොචි අඤ්ඤා සාමාහි විජ්ජති,
එතෙන සච්චවජ්ජේන විසං සාමස්ස හඤ්ඤතු"

යන ගාථාවයෙන් සත්‍යක්‍රියා කළාය.

එහි අදහස නම්:-මම විරාත්කාලයක් මූළුල්ලෙහි මෙම ගන්ධමාදන පර්වතයෙහි වාසය කරන සුභාවය ඇත්තී වීම් එබදුවූ මට මේ සාමයාට වඩා අතිශය ප්‍රියවූ අයෙක් විද්‍යමාන නුවූයේමය. මේ සත්‍යවචනය කරණකොටගෙන සාමයාගේ විෂය නැසේවා.

ලොකයෙහි ප්‍රසිඩවූ ගන්ධමාදන පර්වතයෙහි සියලුම වනය සුගන්ධමැයි හෙවත් සුවඳින්ම නිම්යේය ඒ මේ සත්‍යවචනය කරණකොටගෙන සාමයාගේ විෂය නැසේවායි යනුයි.

මෙසේ සත්‍යක්‍රියාකළ කල්හි සාමතාපස තෙමේ පහවූ විෂ ඇතිව නිරෝගිවී නැගිටියේය. මෙසේ ඔහුගේ නිරොගිභාවයද

අදමවුපියන්ගේ නෙත්‍රප්‍රතිලාභයද අරුණෝද්ගමනයද දෙව තානුභාවයෙන් ඒ සහරදෙනාගේ එම අසප්‍රුවෙනි ප්‍රකාටභාවයද යන මේ සියලලම එකෙණෙහිම සිදුවූයේය. ඉක්බිති මහබෝසතා ණන් වහන්සේ රජුහට ධර්මදෙසනා කරමින්

"යො මාතරං වා පිතරං වා මවෙවා ධම්මෙන පොසති,
දෙවාපි නං තික්විජනති මාතාපෙතති හරං හරං.
යො මාතරං වා පිතරං වා මවෙවා ධම්මෙන පොසති,
ඉධවෙව නං පසංසනති පෙචව සග්ගෙ පමොදති."

යන ගාථාවය කියේය.එහි අදහස නම්:-මහරජ්ජුරුවෙනි! මේ ලොකයෙහි යම්කිසි මනුෂ්‍යයෙක් තෙමේ දැහැමින් සෙමින් මව හෝ පියා හෝ පොෂණය කෙරේද මවුපියන් පොෂණය කරන ඒ මිනිසාහට දෙවතාවෝද පිළිගම් කරන්නාහුය.

නවද මහරජ්ජුරුවෙනි! මේ ලොකයෙහි යම් මනුෂ්‍යයෙක් තෙමේ දැහැමින් සෙමින් මව හෝ පියා හෝ පොෂණය කෙරේද එබඳුවූ පුද්ගලයාහට පණ්ඩිතජනයා විසින් මෙලෙවිනිද ප්‍රශංසා කරන්නාහුය පරලොවැ විපාකවශයෙන් සුගතියෙහි ප්‍රමුදිත වන්නේය යනුයි.මෙසේ කියාද වනාහි නැවත මහරජ්ජුරුවෙනි! ඉදින් දෙව්ලොව ගොස් එහි දිවසැපත පරිභොග කරන්නට කැමැත්තෙහිද මේ දසධර්මචර්‍යාවන්හි පවතීවායි දක්වමින් "ධම්මං චර මහාරාජ!" යනාදී දසරාජධර්මචර්‍යා ගාථාවන් කියේය.

ඔවුනතුරෙන් ප්‍රථමකොට දක්වනලද ධර්ම නම් මාතෘ පිතෘ උපස්ථානසංඛ්‍යාත ධර්මයවන්නේය.එහිමදැරියෙන් නැගිට මාතෘ පිතෘන්හට මුවදෝනා දිය හා දැහැටුදඬු ඵලවීමාදිය කොට සියලු ශරීරපරිහරණය කරන තැනැත්තේද මාතෘපිතෘ උපස්ථාන සංඛ්‍යාත ධර්මචර්‍යාව කරන තැනැත්තේ නම් වේ.

පුත්‍රදාරාවන් කෙරෙහි කෙසේදයත්:-දුපුතුන් පාපයෙන් වළකා කල්‍යාණයෙහි යොදවමින් ශිල්පොද්ග්‍රහණය කරවමින් වැඩිවියපැමිණිකල අනුරූපකුලයන්ගේ වශයෙන් ආවාහවිවාහ කරමින් සමසමවම දායාදයද දෙන තැනැත්තේ පුත්‍රයන් කෙරෙහි ධර්මචර්‍යාව කරන තැනැත්තේ නම් වේ.

බිරින්දට බුහුමන් කරමින් අන්අඹුවන් වෙත නොමෙලෙඹින් තමඉසුරු පාවාදෙමින් වස්ත්‍රාභරණ පිළියෙළකොට දෙනතැනැත්තේ දරාවන් කෙරෙහි ධර්මචර්‍යාව කරන තැනැත්තේ නම් වේ.

මිත්‍රාමාත්‍යයන් කෙරෙහි වනාහි කෙසේද යත්:-

සිවුසඟරාවතින් සංග්‍රහකරමින් සත්‍යප්‍රියවචන කථාකරන තැනැත්තේ මිත්‍රාමාත්‍යයන් කෙරෙහි ධම්මචය්‍යාව කරන තැනැත්තේ නම් වේ.

ඇත් අස්ආදී වාහනයන්ටද භටසෙනාවටද දියයුතු දෑ දෙමින් ඔවුනට සත්කාර කරමින් ඇත් අස් ආදී මහලුකල කම්නන්නයන්හි නොයොදන තැනැත්තේ වාහනභටසෙනාවන් කෙරෙහි ධම්මචය්‍යාව කරන තැනැත්තේ නම් වේ.

ගම්නිගම්ගම්වාසින් දඩබිලිආදියෙන් නොපෙළන තැනැත්තේ ග්‍රාමනිගමග්‍රාමවාසීන් කෙරෙහි ධම්මචය්‍යාව කරන තැනැත්තේ නම් වේ.

රට හා දනවිද නිකරුණේ පෙළමින් හිතසිත නොමෙලවන තැනැත්තේ ග්‍රාමනිගමග්‍රාමයන් කෙරෙහි අධම්මචය්‍යාකරන තැනැත්තේ නම් වේ.ඔවුන් නොපෙළමින් වනාහි හිතචිත්තය පතුරුවන තැනැත්තේ ඔවුන්කෙරෙහි ධම්මචය්‍යා කරන තැනැත්තේ නම් වේ.

ශ්‍රමණබ්‍රාහ්මණයන්ට සිවුපසය දෙන තැනැත්තේම මහණ බමුණන් කෙරෙහි ධම්මචය්‍යාව කරන තැනැත්තේ නම් වේ. සියලු චතුප්පාද සත්වයන්ට හා පක්ෂීන්ටද අභයදානය කරන තැනැත්තේ මෘගපක්ෂීන් කෙරෙහි ධම්මචය්‍යා කරන තැනැත්තේ නම් වේ.

පෘථිවීශ්වරවූ මහාරජ්ජුරුවන්වහන්ස! ධම්මචය්‍යාවෙහි හැසිරෙනු මැනව ත්‍රිවිධ කුසලසමපත්තීන්හි මනාකොට පුරුදුකරන ලද සමචය්‍යාධම්මියතෙමේ ෂට්විධ කාමසවර්ගයෙහි සැප ඵලවන්නේය පින්වත මහාරජ්ජුරුවන්වහන්ස! මේ ලොකයෙහි ධම්මචය්‍යා කොට දෙව්ලොසැපට පැමිණෙන්නෙහිය නරදෙවවූ මහාරජ්ජුරුවන්වහන්ස! ධම්මචය්‍යාකළමැනව කායසුචරිතාදී වශයෙන් මේ ලොකයෙහි මනාකොට පුරුදුකරනලද ධම්මය කරණකොටගෙන දිව්‍යලොක ඉන්ද්‍රලොකසංඛ්‍යාතවූ දිව්‍යගතියට පැමිණියාහුය එහි දිව යසස් පිළිලද්දේවූහ. ජනරජනය කරන මහරජ්ජුරුවන් වහන්ස! කරුණු මෙසේ හෙයින් එම ධම්මයෙහි ප්‍රමාද නොවන සේක්වා”යි ධම්මදේශනා කෙළේය.

මෙසේ මේ ගාථාවන්ගේ මේ අර්ථය චතුනාළිසනිපාතයෙහි මනසකුණජාතකවණ්ණනායෙහි කියනලද්දේය.

පිළියක් රජතෙමේ ඒ අසා සතුටුසිත් ඇත්තේ පඤ්චශීල යෙහි පිහිටා බෝසතාණන් වහන්සේ වැඳ සියනුවරට පැමිණ දානාදී පින්කම් කොට නොබෝවම පන්සිල්රැහැ දැහැමින් සෙමෙන් රජය කරවා ආයුකෙළවර සුවෙන් අගපත් සගපත්වූහ. අපමහබෝසතාණන් වහන්සේද මව්පියන් සමඟ ධ්‍යානාභිඥ උපදවා බඹලෝ වැඩියේක.

මාතෘපිතෘඋපස්ථායක තෙමේ නම් විෂපෙවී ගියෙන් විදිනා ලද්දේ නමුදු මරණදුකින් මිදෙන බවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද **මහානිපානයෙහි සාමජාතකවණ්ණනා යෙහි සුවණ්ණසාමවසනුව** මෙසේ සැකෙවින් දක්වා නිමවන ලද්දේය.

යටගිය දවස බරණැස් නුවර අපමහබෝසතාණන් වහන්සේ 'සුතන' නම් දුගියෙක් වී බැලමෙහෙ කොට මවුපියන් පොෂණය කොට පියා මලකාල මව පොෂණය කෙළේය.

එකල බරණැස් රජතෙමේ මුවදඩයම් කරනු කැමතිව එක් දිනක් ඇමතිමඩුලු හා සෙනඟ හැරගන මුවදඩයමට ගොස් එක් බැද්දකට වැද යමෙක් සිවිතැනින් මුවෙක් පලාගියේ වීනම් ඔහට රජඅණකරවමැසි බියගන්වා ලැහැබ වටකොට රැකවල් ලවා කොටුපසෙක තුමූත් සිටියාහ. එදවස එණිමුවෙක් රජ්ජුරුවන් සිටිකඬින්ම ඉදිරියට එන්නේය රජ්ජුරුවෝත් විෂපෙවී කණු හීය දුනුපිට ලා ඇද මුවාට විද්දාහ. ඒ මුවතෙමේත් උගත්මුව මාඝම් ඇත්තේ හීය ඉලඇට බලා එනබව දැන කරකැවී හීය වළහා හීපහර ලදුයෙක් මෙන් හඟවා බිම වැටී හිනා. රජ්ජුරුවෝත් මවිසින් විදිනලද මුවා විත්කා වැටී හිනැයි සිතා ගන්නට ලඟට ගියාහ. ලඟඑන රජු දැක මුවතෙමෙ නැඟී පලාගියේය. වටසිටි ඇමතියෝ රජ්ජුරුවන් වහන්සේ සිටිතැනින් මුවා පලාගියේයයි රජුහට සරදම් කළහ. රජ්ජුරුවෝ ලජ්ජාවී කඩුව ගෙන මුවා ලුහුබඳවාගෙන තුන්යොත්තක් ගොස් කඩුවෙන් මුවා දෙපළු කොට දඹුවෙක කදබැඳ කද කරතබා ගෙන එන්නාහු අතරමඟැ ඝනසෙවනලුඇති නුගරුකක්මුල සැතපී හිඳ ඉන් නැඟිට යන්නට වන්නාහු ඒ නුගයෙහි වසන 'මඛාදෙව' නම් යක්ෂයෙක් රජ්ජුරුවන්කරා ගොස් දඩමස්කද අල්වා 'රදව මවිසින් බුදියසුත්තෙක් වෙහිය'යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු 'මම තාවිසින් බු යසුතුබවට කරුණු කවරේදැ'යි විචාළාහ. යක්ෂයා කියන්නේ 'මේ නුගසෙවන යටට වන් කෙනෙකුන් කන නියාලෙන් වෙසමුණුරජ්ජුරුවන්ගෙන්

වරම් ලදිමි මට ගොදුරුවු යාතොහැක්කැ'යි කිය. රජ්ජුරුවෝ බියපත්ව 'අදපමණක් කන්නෙහිද නැතහොත් නිබඳම කන් නෙහිදැ'යි විචාළේය. 'ලැබෙතහොත් නිබඳම කන්නෙමි'යි කිය. රජ්ජුරුවෝ 'අද මේ මුවා කා මා යන්නට හැරපියාලව දෙවන දිනයෙහි පවන් දවස බත්තළියක් සමග මිනිසෙකු බැගින් එවන්නෙමි'යි කිහ. යක්තෙමේද 'එහෙත් මතකනැති නොහරව නොම එවූදවස නාම කන්නෙමි'යි පිළිණගෙන රජු මුදලේය. රජ්ජුරුවෝත් 'මමද එසේ මෙසේ යම් ඒ පුරුෂයෙක් නොවෙමි මම බරණැස් රජුවෙමි මට නැතිදෙයක් නම් නැතැයි වහසි බැණ නුවරට පිවිස තමන් වැඩ පසස්නා ඇමතියක්හට කිහ ඇමති කියන්නේ 'සාමිනි! අවඩි කියේ ඇද්දැ'යි කිය. රජ්ජුරුවෝත් නැහැයි කිහ. අමාත්‍යයා කියන්නේ 'අවඩියක් නොකියේ වරදය එසේදවුවත් නොබිය මැනව නුඹවහන්සේගේ දිවි රැකදෙමි මට සිරගෙය දුනමැනව'යි සිරගෙය රැගෙන විධානකරන් නාහු රැකොන්නා කැමති කෙනෙක් මේ බත්තලිය යක්‍ෂයාට දෙවයි කියා යවන්නාහුය. සකුද බනට මාලුවසේ නිබඳ බත් කා මිනිසුන්ද කැයේය. මෙම නියාගෙන් නිරන්තරයෙන් බත් තලි යක් හා මිනිසෙකු බිලිදීමෙන් සිරගෙයි මනුෂ්‍යයෝත් නිමාවට පැමිණියාහ. අමාත්‍යයා එපවත් රජ්ජුරුවන්ට කිය රජ්ජුරුවෝ එපවත් අසා මරණ භයින් බියපත්ව ජීවිතයට වඩා මනුෂ්‍යයෝ අතීයෙහි ලොහඇත්නාහ දහසින් බැඳි පියල්ලක් ඇතුපිට තබා මේ මසුරන් දහස දැරගෙන යක්‍ෂයාට බත්තලිය ගෙන ගොස් දෙවයි නුවර බෙරලවා මසුරන් දහස ගත්තෙනෙක් ඇත්නම් ඌ අතබත්තලිය යවයි කිහ. අමාත්‍යයාත් එලෙස කෙළේය. ඒ අසා මහබෝසතාණන් වහන්සේ දහසින් බැඳි ඒ පියල්ල ගෙන මැණියන්ට දී සිතන්නාහු මේ මසුරන් දහස මැණියන් දුට දී ගියකල යක්‍ෂයා දමනයෙහි ලා ගතිමි නම් බොහෝ සම්පත් ලැබෙයි එසේ නැත මේ යක්‍ෂයාට බිලිවෙමි මසුරන් දහස මැණියන්ට කිහිපදවසක් රැකෙන්ට ඇත්තේවේදැයි සිතා මැණියන් වහන්ස! මම යක්‍ෂයාට බත්තලියක් ඇරගෙන යමි කිහ. එවිට මැණියන්ද කියන්නී 'පුතණුඩ! තොපකි මසුරන් දහසෙන් මට කමිනැත. යක්‍ෂයා ළඟට තොපි නොයව'යි කිහ. බොධිසත්වයෝ කියන්නාහු 'මැණියන්වහන්ස! බිය නොවනු මැනව ඒ යක්‍ෂයා දමනයෙහි ලා අඬන්නාවූ නුඹවහන්සේගේ මුහුන සිනහ කරවමින් එන්නෙමි' කියා මැණියන් කිප වාරයක කී ඔවා නොගිවිස අස්වසා රාජපුරුෂයන් හා සමග

රජගෙට ගොස් රජුන් වැඳ සිටියේ දරුව! යකුහට බත් ගෙන යන්නෙහිදැයි විචාරණලද්දේ 'දේවයන්වහන්ස! එසේය'යි කියේය. 'දරුව! තා විසින් කුමක් ලබන්නට වටනේද දෙවයන් වහන්ස! නුඹවහන්සේගේ රන්මිරිවැඹිසඟළුත් සෙවතවඡත්‍රයත් කඩුවත් ලබන්නට වටනේය' 'දරුව! ඊට කරුණු කව රේද? දෙවයන්වහන්ස! අමනුෂ්‍යයෝ නම් අපි දැරුවන්ට බිය වෙත්මය එහෙයින් මම කඩුගත් අත්ඇතිව ඔහුගේ සමීප යෙහි බිම නොසිට රන්මිරිවැඹිසඟළෙහි සිටින්නෙමි ඔහුගේ රැක්සෙවනෙහි නොසිට කුඩසෙවනෙහි සිටින්නෙමි ඒ යකු වනාහි තමසතුබිමෙහි රැක්සෙවනෙහි සිටියක්හුම කන්නට ලබන්නේය.' 'දරුව! නැවතත් කුමක් ලබන්නට වටනේද? 'දෙවයන්වහන්ස! මාවැනි පණ්ඩිත පුරුෂයෙකු විසින් නම් මැටි බඳුනෙහි මිහිරිබොජුන් ගෙනයන්නට නොවටනේය එහෙයින් නුඹවහන්සේගේ රන්තැටිය පුරා නුඹවහන්සේ වළඳන බතම ලබන්නට වටනේය'යි කියේය. රජ්ජුරුවෝ ඒ සියල්ල දෙවා ඔහට වතාවත් කරුවෙක්ද භාරකෙළේය. මහබෝසතාණන් වහන්සේ උපකරණ ගෙන්වාගන එහි ගොස් නුගරුකට නුදුරු තැන මිනිසුන් රඳවා රන්මිරිවැඹි නැඟී සේසත ඉසලා බත් තලිය ගෙන රුකසමීපයට ගොස් සෙවන කෙළවරැ සිටියේම මඟුල්මඩලගින් බත්තලිය නුගගසයටට කොටැ 'මේගසැ වසන්නාවූ 'මඛාදෙව' යක්‍ෂයා අපගේ රජ්ජුරුවන් වෙනින් එවනලද රසමසවුලෙන් යුක්තවූ මේ තලිය ඇරගනුව'යි හඬගා ලීය.

එවිට යක්‍ෂයා සිතන්නේ 'මූ මෙතෙක්ද එන්නාවූ පුරුෂයන් වැනි නොවෙයි වංචාප්‍රයොග දන්නා එකෙක මා වංචාකොට ගැලවීයමැයි සිතා ආයෙක මොහු වංචාඩොවැ සෙවනට පිවිසි යහු කන්නෙමි'යි සිතා 'මානවකය! මෙහි එව තා ඉවතැ සිට කථාකරන්නේ ඇයිද? නුගගසයට සිට මා හා සමඟ කථාකරව බත්තලියත් මාගේමය නොපිත් මාසතනකමය බත්තලිය කම් නොපත් කම්'යි කීය. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු 'එඹල රාක්‍ෂය! මා කැයි නම් අඩුව නටමය බරණැස් නුවර මට වඩා නුවණැති පුරුෂයෙක් නැත. එබඳුවූ මවුපියන් පොෂණය කරන සුතනුකුමරුවන් වැනි නුවනැති ගුණඇති පුරුෂයෙකු කාපු රකුසා අප තිබාදැයි කියා සෙට පටන් නට ගෙනෙනා බත්තළි යත් නැත මිනිසාත් නැත ඉඳින් නො මා නොකා අලවූ නම් නොපව නිරන්තරයෙන් එවන බත්තලිය එවම්. ඉඳින් මා කන්

නට සිතූ නමුත් මා කැවුමුත් නැත රැකින් බැහැර සිටි බැවින් අපගේ රජ්ජුරුවනුත් අල්වාගන්ට නොලබන්නෙහිය මාත් කන්නට නොහැක්කේය මා වනාහි තාසතුබිම නොසිට මිරිවැඩි සහළෙහි සිටිමි තාගේ රුක්සෙවනෙහි නොසිට සේසත් සෙවනෙහි සිටිමි. ඉදින් වනාහි තෝ මා සමඟ විරුඬවන්නෙහි නම් මේ කඩුවෙන් තා දෙපළු කරන්නෙමි තා මේතාක් කළදේ දැන මමද අද මේ පිණිසම සැරසී ආයෙමැ'යි කීහ. යක්ෂයා මෙතෙමේ යුකතියක්ම කියන්නේයයි පහන් සිත්ඇත්තේ බත්කා

"ඛගහං ජත්තං ච පානිං ච ගවෙජ්ඣාදය මානව!
සොත්ථිං පස්සතු තෙ මාතා ත්වං ච පස්සාහි මාතරං."

යනුවෙන් පින්වත පණ්ඩිතවූ මානවකය! මහුල් කඩුවද සේසතද රන්තැටියද හැරගෙනම යනු මැනව ඔබගේ මවු තොමෝ සවසථවූම ඔබ දකීවා ඔබද එසේමවූ මව දකීවාසි ආශීර්වාද කෙළේය. මහබෝසතාණන් වහන්සේද එඹා යහලු යක්ෂය! තෝ පෙර පව්කම් කොට යක්ෂයෙක් වී උපන අදින් මතු ප්‍රාණඝාතාදීන් නොකරවයි ශීලයෙහි අනුසස්ද දුශ්ශීල භාවයෙහි ආදීනවයද කියා ඔහු පංචශීලයෙහි පිහිටුවා බැඳ්දෙහි විසුමෙන් තට කුමන වැඩෙක්ද? එවයි කියා මඞ්ගල ඛඩ්ගාදිය ඔහු ලවාම ගෙන්වාගන නුවරට පැමිණියේය. බරණැස් රජ්ජුරුවෝ බෝසතාණන් වහන්සේට පෙරගමන් කොට යකු නුවර දෙරැ හිඳුවා අඟබත් ආදිය ලැබීම ඇත්තෙක් කොට නුවර දෙරට ගොස් 'එඹා අමාත්‍යයිනි! මාගේ ජීවිතය රැකදුන්නේත් නුවරවාසීන්ට සැපත දුන්නේත් සුතනු මානවකයෝමය'යි බෝධිසත්වයන්ගේ ගුණකියා සෙනෙවිරත් තතතුරු දී බෝසතාණන් වහන්සේගේ අනුශාසනායෙහි පිහිටා දසරාජධම්මයෙන් රාජ්‍යය කොට සඞ්ගීපරායණ වූයේය.....

මවුපියන් පොෂණය කළ තැනැත්තේ යකුවෙත පැමිණත් යකු කෙරෙන් මිදෙන බවට නිදසුන් වශයෙන් ගෙනහැර පාන ලද සුතනුජාතකයෙහි සුතනුවසනුව මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.....

යටගිය දවස 'සාකෙත' නම් නුවර කොසොල් රජ්ජුරුවන් රාජ්‍යකරවන සමයෙහි අපමහබෝසතාණන්වහන්සේ මුවයෝනියෙහි ඉපිද වාසය කරන්නාහ. ඒ මුවරජ්ජුරුවන්ට නම් තබන්නාහු 'නන්දිය මුවරජ්ජුරුවෝය'යි නම් තුබුහ. එසමයෙහි කොසල

රජ්ජුරුවෝ මුවමාංසයෙහි ඉතා ගිජු වී මිනිසුන්ගේ සිසැම් වෙණ යුම් ආදියට අවධාන නොදී මිනිසුන් පිරිවරා දවසකට වරක් බැගින් ඇමදවස්ම මුවදඩෙහි යන්නාහ. මනුෂ්‍යයෝ ගොවිතැන් බත් කරන්නට අවසර නොලබන්නාහු එක්දිනක් රැස්ව 'අපි අජානවනොද්‍යානය වටකොට දෙරපැලලි යොදු බැඳිදක් වටලා මුවරලක් එක්කොට ගෙනගොස් ලා ගොවිතැන්බත් කරන්නට අවසර ලබන්නමෝ නම් මැනවැ'යි මන්ත්‍රණ කළාහුය. ඒ මැනවැයි සියල්ලෝම එක්සිත්ව එක්දිනක් අජානවනොද්‍යානය සොදනක් පමණ තැන වට කොට දෙරපැලලි යොදු බැඳිදක් වටලා දඩෙන් පත්තෙන් ගසා මුවරුලක් එක්කොට ගෙන යන්නාහ. නන්දිය නම් මුවරජ්ජුරුවෝත් එක්හෙරා කුඩා පදුරෙක්හි මවුපියන් ගෙන වසන්නේ ඒ දැක අද මවිසින් දිවිපුදා නමුදු මවුපියන්ගේ ජීවිතය රක්නට වටනේයයි සිතා මාගේ පෙම්බරවූ සුන්දර මවුපියවරුනි! නුඹවහන්සේලා එක්හෙරා උපායකින් ජීවත් වන්නාහුය මම ජීවිතය හෝ දෙන්නෙමි එක්කෝ නුඹවහන්සේලාගේ මුවබඹුලුවමින් එන්නෙමි මිනිසුන් පිසින් පදුර තළනා ලද කෙණෙහිම මම පලායන්නෙමි එවිට ඒ මනුෂ්‍යයෝ 'මේ කුඩා පදුරෙහි එක් මුවෙක් පමණක් වන්නේය'යි සිතන්නාහු පදුරට නොවදනාහු නුඹවහන්සේලා නොදක්නාහුය. සිහිනුවණින් යුක්තව වසනු මැනවැයි මවුපියන් කෘමා කාරවා යන්ට සැරසී පදුර තළනලද කෙණෙහිම එයින් නික්ම දුවගොස් මුවන් අතරට පිවිසියේය. ඒ මනුෂ්‍යයෝත් එලෙසම සිතූහ. ඒ කුඩා වනපෙතට නොවැදම මුවන් උයනට වදුවා වට රැකවල් ලවා කෝසලරජ්ජුරුවන්ට ගොස් කියන්නාහු 'දෙවයන් වහන්ස! මුවරුලක් ගෙනවුත් අජකවනයෙහි ලා වට රැකවල්ලා ආම්හ නුඹවහන්සේට අභිප්‍රායක් කළමැනවැ'යි කියා රජ්ජුරුවන්ට වැඳ සමුගෙන තමතමන්ගේවලට ගොස් ගොවිතැන්බත් බලාගත් නාහුය. රජ්ජුරුවෝත් එතැන් පටන් ඇතැම් දිනෙක තෙමේම ගොස් එක් මුවෙක් විදගෙන එයි ඇතැම් දිනෙක එකෙකු යවා මුවෙකු විදුවා ගෙන්වන්නාහ. ඒ මුවහු දිවිදීමට වාරතැබූහු. වාරය පැමිණි මුව තෙමේ එකපැත්තෙක්හි සිටිනේය ගිය අයෙක් ඔහු ඕද ගෙනෙන්නේය. ඉක්බිති එක්දවසක් නන්දිය නම් මුවා හට වාරය පැමිණියේ වෙයි එදවසද රජු තෙමේම ගොස් විදින්ට සැරසුනේය. නන්දිය තෙමේ මෛත්‍රිය පෙරමුනෙහි යන්නක් නොට නිශ්චලව සිටියේය. රජතෙමෙ ඔහුගේ මෛත්‍රීආනුභාවයෙන් නිය විදින්නට නොහැකිවන්නේ දුන්න හැරදමා 'මේ

අවෙතනිකා දඩ්ඩකඩ පවා තුඹගේ ගුණ දන්නෙහිය සවෙතනිකවූ මනුෂ්‍යවූද මම නොදනිමි මට ක්‍ෂමාවනු මැනව තුඹවහන්සේට අභය දුනය කොරෙමි'යි කීහ.

මහරජ්ජුරුවන් වහන්ස! මට පමණක් අභය දෙන්නෙහිය මේ වෙනෙහි මුවසමූහයාට කුමක්කරන්නෙහිද මේ මුවසමූහයාටත් අභයදෙන්නෙමියි කීයේය. මෙසේ මහබෝසතාණන් වහන්සේ සියලුම වනමෘගයන්ටද ආකාශචාරී පක්‍ෂීන්ටද ජලචර මත්ස්‍යයන්ටද අභය දුනය කරවා මහරජාණන් පවශීල යෙහි පිහිටුවා මහරජ්ජුරුවන් වහන්ස! රජු විසින් නම් අගති ගමනය හැර ගනිගාමීවැ දසරාජධම්මයන් කොපනොකරවා දැහැමින් රාජ්‍යය කරවන්ට වටනේඅයි කියා දසරාජධම්මයන් දෙසනා කරමින්

"දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං,
අක්කොධං අවිහිංසා ච ඛන්තී ච අවිරොධතා.
ඉච්චෙතෙ කුසලෙ ධම්මෙ සිතෙ පස්සාහි අත්තනි,
තතො තෙ ජායතෙ පීති සොමනස්සං ච නපපකං".

යන ගාථාවයෙන් සවකිය වසතු දීමෙහි වෙතනාසංඛ්‍යාතවූ දානය, පංචශීලදසශීලසංඛ්‍යාතවූ ශීලය, දෙය්‍යධම්ම ත්‍යාගකිරීම් සංඛ්‍යාතවූ පරිත්‍යාගය, ඍජුභාව සංඛ්‍යාතවූ අජ්ජවය, මෘදුභාවසංඛ්‍යාතවූ මද්දවය, උපොෂථකම්මසංඛ්‍යාතවූ තපසය, මෛත්‍රීපූර්වභාගවූ අක්‍රොධය, කරුණාපූර්වභාගවූ අවිහිංසාවය, අධිවාසනක්ඛාන්තිය, විරොධරහිතබවය, යන මේ දසරාජධම්මයන් ප්‍රකාශකෙළේය.

මේ ගාථාවන්ගේ මෙම අර්ථය මහාහංසජාතකයෙහි කියනලද්දේය.

බෝසතාණන් වහන්සේ රජුසම්පයෙහි කිපදවසක් වාසය කොට නගරයෙහි සියලු සත්වයන්ට අභය දානය ප්‍රකාශකිරීම පිණිස රන්බෙර පියවිකරවා මහරජ! නොපමාවෙවයි කියා මවු පියන් දක්නා පිණිස වනයට ගියේය.

ආරක්ෂාස්ථානයෙහි සිටියේ නමුදු මවුපියන් පොෂණය කරන තැනැත්තේ ඉන්මිදෙන බවට නිදසුන් කොට දක්වනලද නාළිසම්භවජාතකය මෙසේ සැකෙවින් දක්වා නිමවනලද්දේය.

යවශිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අපමහාබෝසතාණන්

වහන්සේ ගිජුලිහිණිව ඉපිද මහලුවූ අඳමවුපියන් ගුහායෙක්හි තබා ගවමාංශාදිය ගෙනවුත් දී පොෂණය කෙළේය. එකල බරණැස්නුවර සොහොනෙහි 'නීලිය' නම් එක්තරා වැද්දෙක් අනියමයෙන් මලක් ලා ලීය. එකල මහාබෝසතාණන්වහන්සේ ඒ මලෙහි බැඳී තමන්වහන්සේගේ දෙමව්පියන් සිහිවී මාගේ අඳමවුපියෝ කෙසේ යැපෙද්ද? මා බැඳුනු බවකුත් නොදන්නාහු ආහාරපානාදිය නොලබන්නාහු අනාථවූවාහු පර්වතගුහායෙහිම වියලී මියයන්නාහු වන්නාහුයයි මට අදහස් වන්නේයයි කියා මනුෂ්‍යභාෂායෙන් වැලප හැඬීය.

ඒ අසා වැදී තෙමේ:-

"යතනු ගිජ්ඣා යොජනසතං ඛුණපානි අවෙක්ඛති,
කසමා ජාලං ච පාසං ච ආසජ්ජාපි න බුජ්ඣති".

යතුයෙන් සියක් යොදනකින් මත්තෙහි පිහිටි කුණපයන් ගිජුලිහිණියා දක්නේය යන මේ ලොකව්‍යවහාරවචනය ඉදින් සැබවක්ම වීනම් එසේ ඇතිකල ගිජුලිහිණිවූම තෝ මේ දැලත් මලත් ළඟට පැමිණෙත් නොමදත්ය ඊට කාරණා කිම්ද?යි විවාළේය.

එකල මහබෝසතාණෝ—

"යදා පරාභවෝ හොති පොසෝ ජීවිතසංඛයෙ,
අථ ජාලං ච පාසං ච ආසජ්ජාපි න බුජ්ඣති".

යතුයෙන් එම්බල නේසාදය! යම් කලෙක අකුසලහෙතුවකින් ජීවිතවිනාශවත්කලක් වීනම් පුරුෂතෙමේ විනාශවේමද එසේ හෙයින් එකල සමීපයට එළඹත් දැලත් මලත් නොදක්නේමයයි කීහ. එකල වැදිතෙමේ ඔහුගේ ධර්මකථාව අසා 'මේ ගිජුලිහිණි රජු පණ්ඩිතයෙක වැලපෙන්නේත් තමන් පිණිස නොවෙයි මවුපියන් නිසා වැලපෙයි මොහු මරන්ට නම් නොවවනේමය'යි ඔහුකෙරෙහි සතුටුව ඔහුකෙරෙහි ප්‍රියවූ සිතින්ම පාදයෙන් මල මුදා-

"හරසසු මාතාපිතරෝ වුඩ්ඪෙ ගිරිදරීසයෙ,
මයා තුවං සමනුඤ්ඤතෝ සොත්ථිං පස්සාහි ඤාතකෙ".

යතුයෙන් 'පින්වත ගිජුලිහිණිරාජය; රුක්ඛිලෙහි වසන්නාවූ වයොවෘද්ධවූ මවුපියන් මනාසේ පොෂණය කරව මවිසින් ප්‍රන්වත්වූ තුඹ ප්‍රියවන ලද්දේය මෙසින් ගමනය කොට තුඹගේ ඤාතීන්ගේ සවසථභාවය දකුව'යි කීයේය.

එකල මහබෝසතාණන් වහන්සේ මරණ දුකයෙන් මිදුනේ අනුමොදනා කරනසේක්-

"එවං එදඤ්ඤ! නන්දසසු සහ සබ්බෙහි ඤාතිහි,
හරියං මාතාපිතරෝ වුඩ්ඪේ ගිරිදරීසයෙ".

යනුයෙන් 'පින්වත නේසාද පුත්‍රය! නුඹ මෙසේ සලකා සියලුම ඤාතීන් සමග ප්‍රීතිසොම්නස් ඇති කරව මම රැක් බෙනෙහි වසන්නාවූ වයොවෘඩ්ධවූ මවුපියන් පොෂණය කරමින් වාසය කරන්නෙමැ'යි කියා මුවපුරා මස් ගෙන ගොස් මවු පියන්ට දුන්නේය.

මාතෘපිතෘඋපසථායක තෙමේ මළෙහි බැඳුනේත් ඉන් මිදෙන බවට නිදසුන්වශයෙන් ගෙනහැර පානලද **සන්ත නිපානයෙහි ගිජ්ඣජාතකය** මෙසේ සැකැවින් **දක්වා** නිමවන ලදී්දේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අපමහබෝසතාණන් වහන්සේ ගිජුකුලෙහි ගිජුලිහිණියෙක් වී මවුපියන් පොෂණය කරමින් වසන්නාහ. එකල එක්දිනක් මහවැසි මෙඝයක් හට ගෙන ගිජුලිහිණියෝ එය ඉවසන්නට නොහැකිවූවාහු බරණැසට ගොස් පවුරුවලලුසමීපයෙහි සීතලින් වෙවුලමින් හුන්නාහ. එකල බරණැස්සිටුතෙමේ නුවරින් නික්ම විඩාපත්වූ ඒ ගිජු ලිහිණියන් දැක එක් තැනකට රැස්කරවා ගිනි මොලවා දෙවා මිනිසුන් සොහොනට ගවා ගවමාංසාදිය ගෙන්වා දෙවා ආරක්ෂා තැබූයේය. ගිජුලිහිණියෝ වැසිවලා පහව ගිය කල්හි නිරුප දැනවූ සිරුරුඇත්තෝ ව පළිතයට ගොස් 'බරණැස් සිටුහු විසින් අපට බොහෝ උපකාර කරන ලද්දේය උපකාර කළ තැනැත්තහුට නම් ප්‍රත්‍යුපකාර කරන්නට වටනේමය. එසේ හෙයින් අද පටන් අපඅතුරෙන් යමෙක් යම්කිසි වස්ත්‍රාභරණා දියක් ලදහොත් ඔහු විසින් එය සිටුහුගේ ගෙයි හළයුත්තේය'යි මන්ත්‍රණය කළාහුය. ඔවුහු එතැන් පටන් වස්ත්‍රාභරණ අවිවෙහි වියලන්නාවූ මිනිසුන්ගේ ප්‍රමාද බලා වහා ගෙනගොස් සිටුහුගේ ගෙයි ලන්නාහ. සිටුතෙමේ ගිජුලිහිණියන් විසින් ගෙනෙන ලද බැව් දැන ඒ සියල්ලම වෙන්වෙන්වම තැබීය. ගිජුලිහිණියෝ නුවර විලුම්පනය කෙරෙත්යයි මනුෂ්‍යයෝ රජුහට සැලකළාහුය. රජ්ජුරුවෝ එක් ගිජුලිහිණියෙක් අල්වන්නට ඒ ඒ තැන මලද දැල්ද රැඳවීය. එකල මහබෝසතාණෝ එහි බැඳී මනුෂ්‍යයෝ ගෙනගොස් රජුහට දැක්වූහ. රජ්ජුරුවෝ විවාරා ඒ

සියලු කාරණු අසා දැන "යතනු ගිජ්ඣා යොජනසතං" යනාදී නයින් විවාලේය...ගිජුලිණි තෙමේද "යදා පරාභවෝ හොති" යනාදි නයින් ධර්මදෙශනා කොට සතුටුවූ රජු විසින් මුදුහරින ලද්දේ මවුපියන් වෙත යියේය...රජ්ජුරුවෝ මහසිටුලවා ඒ සියලු මිනිසුන්ට ඔවුනොවුන්සතු වස්ත්‍රාභරණ දෙවීය...

මවුපියන් පොෂණය කරන තැනැත්තේ මලෙහි බැඳුනේත් ඉන් මිදෙන බවට නිදසුන් වශයෙන් දක්වනලද **දුක නිපානයෙහි ගිජ්ඣවස්තුව** මෙසේ සැකැවින් නිමවන ලද්දේය...

යටගිය දවස මගධරට 'මගධ' නම් රජ්ජුරුනෙනෙකුන් රාජ්‍යය කරන කල්හි රජගහනුවරට ඊශානකොණ සාලිඳිය නම් බ්‍රාහ්මණගමෙක් විය. ඊටද ඊශානදිසාභාගයෙහි එක්තරා පාංශුපර්වතයෙක්හි මහත්වූ හිඹුල්වනයක් ඇත්තේය එහි නොයෙක් සියදහස්ගණන් ගිරවු සුවසේ වාසය කරන්නාහුය. එකල්හි පුරන ලද සමතිස් පැරැම්ඇති දෙනලද පඤ්චමහා පරිත්‍යාග ඇති ඥානාර්ණවශ්‍රීදීවූ ත්‍රිවිධ වශ්‍රීයෙහි කෙළ පැමිණියාවූ අපමහබෝසතාණන් වහන්සේ ඒ ගිරාසමූහයාට රජකරන්නාවූ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. ඒ මහබෝසතාණෝ වැඩිවිය පැමිණියාහු විශිෂ්ටරූ ඇතිව මහත්වූ ශකති සම්පන්නවූ ගැල්නැබක් පමණ ශරීරයඇතිවූහ. ඉක්බිති ගිරා රජ්ජුරුවෝ මහබෝසතාණන්ගේ ශරීරසම්පත්තිය හා විශාරද කම් දැක 'මම ඉතින් වයෝවෘඛව ගියහෙයින් දුරබැහැර නැගී යානොහෙමි. දරුවෙනි! මෙතැන්පටන් තෙපි මේ ගිරා සමූහයා පරිහරණය කරව'යි බෝධිසත්වයන්ට රාජ්‍යය පාවා දුන්නාහ. මහබෝසතාණෝ ඉන් දෙවනදා පටන් පියාණන් ගොදුරු පිණිස යා නොදී ගිරවුන් විසින් පිරිවරණලදුව හිමාලය වනයෙන් ගොදුරු ගෙනවුන් මවුපියන් පොෂණය කරන්නාහ...

එකල සාලිඳිය ගම වසන්නාවූ කොසිය ගොත්‍රඇති බ්‍රාහ්මණයෙක් තෙමේ දහසක් කිරිය පමණ කෙතෙක හැල් වපුරුවා කෙත්පල්ලෙක් නැබීය...එය පිදී පැසී ගියකල එක් දවසක් ගිරවු මහබෝසතාණන් වෙත පැමිණ සවාමිනි! පෙර මෙසමයට මගධරට කෙතක හැල්පැසෙන්නේයයි දැන්වූහ. එපවත් අසා බෝසතාණෝ 'හැල් මෙවකට කවරවිවරදැයි පරීක්ෂාකොට එව'යි ගිරවුන් දෙදෙනෙකු යැවූහ. ඒ ගිරාපොතාගේ දෙදෙන මගධක්ෂේත්‍රයට ඔස්නාවූ සවකියනලද

කෙත්පල්ලාගේ ක්ෂෙත්‍රභාගයට බැස ඇල් කා එක් ඇල්කර
ලක් කපාගෙන ඉඹුල්ව්‍යායට අවුදින් මහබෝසතාණන්ගේ සිරි
පාමුල හෙලා සවාමීනි! තෙල ඇල්කෙත පැසුනුවිවරවේදැ?සි
පැහ. මහබෝසතාණෝද එසින් හැල්පැසි තිබුනාදැක පසුදවස්
සමූහවශයෙන් නොයෙක් සියදහස්ගණන් ගිරවුන් පිරිවරා
ගොස් එම ක්ෂෙත්‍රභාගයටම බටහ. කෙත්පල්තෙමේද ඇල්
කන්නට කෙතෙහි ඒ ඒ තැන බස්නාවූ නොයෙක් සියදහස්
ගණන් ගිරවුන් වළකාලමිසි ඇතමැත දිව වළකන්නේ වළකා
ගතානුහුනුයේය. මෙසේ ඔහු නොවැළකියදීම සෙසු ගිරවු හැකි
තාක් ඇල් අනුභව කොට සිස්මුඛයෙන් යන්නාහුය. ගිරා
රජ්ජුරුවෝ වනාහි ඇල්කරල් එකිනෙක කඩා ගෙන බොහෝ
ඇල්කරල් එක්කොට තුඩින් ගෙනවුත් මවුපියන් පොෂණය
කළහ. මෙසේ බෝධිසත්වයන් හා ගිරවු එම කෙතට බැස ඇල්
අනුභව කරන්ට පටන්ගත්තාහ. ඉක්බිති ඉදින් ගිරවු මේ
සැටියේ කිපදවසක් කැවාහු වීනම් කෙත්වතින් තිබෙන
දෙයෙක් නැත එකල්හි බමුණාණෝ නටු කඩවා මානය කරන්
නාහ. එසේ හෙයින් කල් නොයවා ගොස් කිවමැනවැයි සිතා
ඇල්කරල් අසුරක් පමණ හා ශක්තිපමණින් අනිකුත් කිසිඋප
කරණයක් ඇරගෙන ගොස් බමුණන් දැක වැඳලා එකත්පස්ව
සිටිසඳ බමුණාණෝ කිමෙක්ද? පින්වත් පුරුෂය! පුරාතන
තෙත්වත පැසීගියේ වේදැ?සි විචාළාහ. එපවත් අසා ඒ පුරුෂ
තෙමේ 'කොෂිය ගොත්‍රයෙහි උපන් බමුණාණන් වහන්ස! ඇල්
කෙත පැසීගිය බව තෙල නුඹවහන්සේට පැ කරල් අසුරෙන්
දැනවදුළ මැනව එතකුදුවුවත් දැන් තුන්දවසක පවන් ගෙන
නොයෙක් සියදහස් ගණන් ගිරවු කුඹුර නොපෙණෙනසේ වසා
ගෙන ගියගිය අතින් ඇල්කන්නට පටන්ගත්හ. නොයෙක් පරිද්
දෙන් උත්සාහ කරන්නෙම් නමුදු වලකාගත නොහි ඒ බව නුඹ
වහන්සේට කියන්ට ආමි නවද වැඩිවිශෙෂකරුණක් නම් ඒ ගිරා
සමූහයා අතුරෙන් එක් ගිරවෙක් සර්ප්‍රකාරයෙන් ඉතා සොභ
මානවූ ශරීරවණීඇත්තේය පබළුදළුවක් බදුවූ තුඹකින් හා
මනාව වට වත් යුවලැසින්ද ලාක්ෂාරසයෙන් නහාගත්තාක්
බදුවූ පාගුගකින්ද මොනරක්හුගේ බදු ග්‍රීවයවට කළ රන්රෙඛා
තුනකින්ද දෙව්දුන්නක් බදු අනෙක වණීණයෙන් ඉතා රිසි
යෙන්නාවූ පෙදගොල්ලකින්දැයි මෙසේ සර්ීඞ්ගයෙන් සොභ
මානවූ සඳස් මොනරකු හා පමණ මහත ඇති ගිරවෙකු දවල්
දෙවරු ඇල්කරල් කා ඝනකල කරල්මිටියක් කපාගනයෙයි ඔහු
ඒ ගිරවුන්ට රජවනැයි සිතමි'යි කිව්ය. එබස් අසා සිවාණෝ

ඟැල්කරල් අපෙක්ෂා නොකොට ගිරාරජ්ජුකෙරෙහිම සෙනහ උපද වාගත එඹල පින්වත් පුරුෂය! එහෙනම් මලඅටවත විධි දන් නෙති නම් අස්ඉල රැගෙන යහපත් කොට ලනුඅඹරා ඒ පක්ෂි රාජයා නොවරදවා බැඳියනලෙස උගුල අටවා නොවරදවා බැඳවා බදුගත වැලිත් ජීවිතය නොනසාම ගෙනෙවයි කීය. එබස් අසා කෙත්පල්තෙමේ දනිමි සවාමීනි! එසේ කෙරෙමැයි කියා කෙත්වතට පලාගොස් බමුණා කි සැටියේ අස්මල් වටා පසුරු ඉදිකොට අද මෙතනට බසිනිසි සිතා ගිරා රජ්ජුරුවන් බස්නා තැන් සමකොට සුලඟට පවා ඇසිරෙන පරිදිදෙන් උගුලමල අටවා ගිරවු එනතියාව බලබලා පැලට වැදලා උන්නේය. ගිරා රජ්ජුවෝද ගිරාසමූහයාපිරිවරා අවුදින් නොලස්බව හෙතු කොටගෙන රෑයේ දවස් ගොදුරු කා ගල සඤ්ඣයට බස්නාවූ සොරකම්ඇති මලපසුරු නොදැන ඇතුළෙහිම පා තබා බවහ. එසද මලෙහි බැඳුනු ගිරාරජ්ජුරුවෝ ඉදින් මම දැන්ම බැඳි ගියෙමිසි අඩාලීම්නම් මාගේ බන්ධුවගීයා ගොදුරු නොගෙනම නැගීයන්නාහ. එසේ හෙයින් ඔවිහු ගොදුරු අනුභවකරනතාක් ඉවසුවමැනවැයි සිතා ඉවසා හිඳ ඔවිහු ගොදුරු අනුභවකොට බඬපුරා ඇතමැන කෙළඇවිදිනා අවස්ථායෙහි හඬාලීය. පැලේ උන්නාවූ ක්ෂෙත්‍රපාලද ගිරාරජහු බැඳී හැඬූ හඬද ගිරවුන් යුහුව ආකාශයට පැනනැගී අඬද අසා කුමකින් කුමක්දෝ හෝසි පැලින් බැස උගුල්පලට ගොස් බැඳිගියාවූ ගිරාරජ්ජුරුවන් දැසා යම් මේ ගිරාකෙනෙකුන් උදෙසා මල ඇටවීම්ද උඹම නොවැර දීම බැඳිගියේඇසි සොම්නසට පැමිණ ගිරාරජ්ජුරුවන් මලින්මුදා සාලිඳියනම් බමුණුගමට ගෙනගොස් බමුණන්ට දික්නළහ. බමුණාණෝද බලවත්වූ සෙනහයෙන් දැකින් වඩාගත ඇතයේ හිඳුවා මහබොධිසත්වයන්ට කථාකරන්නේ සුවපොතකයාණනි! අවශෙෂවූ ගිරවු තුමූවිවරක් සැපසේ කා නැගීයන්නාහ තෙපි වනාහි කැමතිවිවර අනුභවකොට යන කල්හි කරල්ම්විටක් කඩා ගෙන තුඩින් ගෙනයන්නෙහිය එසේ කරන්නාවූ තෙපි මා කෙරෙහි වෛරයකින් කන්නා කාපියා නොකන්නා නොඇාපියා කඩා පාලුකෙරෙම්සි ගෙනෑවිද? එසේ නැත ගෙනගොස් ඉඹුල් වනයෙහි වැසිසාරමස රැකීයන දිණිස පුරවන කොටුගුලක් ඇද්දැ?සි විචාළාහ. ඒ අසා මහබෝසතාණෝ මිහිරිවූ මනුෂ්‍ය භාෂායෙන් බමුණා සමඟ කථාකරන්නාහු **පකිණ්ණකනිපාත යෙහි කෙදුරජාතකයෙහි**

"න මෙ වෙරං තයා සඞ්ං කොඬං මයහං නවිජ්ජති,
ඉණං මූලාමිණං දම්මි සමපත්තෙනා කොටි සිඛලිං,
නිධිම්පි තත්ථ නිදහාමි එවං ජානාහි කොසිය!".

යන මේ ගාථායෙන් කොසිය ගොත්‍රඇති බමුණාණන් වහන්ස! නුඹ හා සමඟ මාගේ වෛරයකුත් නැත ඉඹුල්වතයේ ගෙන ගොස් පුරවන්නාවූ කොටුගුලකුත් නැත වැලි කුමක්පිණිසද යත්: නුඹවහන්සේගේ ඇල්කරල්ගෙනයන්නාවූ මම නයකින් මිදීමද කෙරෙමි තවද එම ඉඹුල්වෙනෙහි අනුගාමිකනිධානය කුත් නිධාන්ද කෙරෙමි කිහ...මෙසේ ඒ මහබෝසතාණන් විසින් තියුණු නුවණින් සලකා වදුරණලද වචනයෙහි කෞතුක ලවූ සිත්ඇති ඒ බමුණාණෝ සබඳ! නුඹවහන්සේගේ නයදීමය නයින් මිදීමය නිධාන කිරීමයයි යන තුන් පැනය අපට විසඳ, කිවහොත් පාඨඛ්ඛනයෙන් ගැලවීයනසේක්වේදැයි කිහ. මෙසේ බමුණාණන් විසින් විචාරණලද්දාවූ මහබෝසතාණෝ පැන විසඳනසේක්–

"අජාතපක්ඛා සකුණා පුත්තකා මයහං කොසිය!
තෙ මං හතා හරිස්සන්ති තසමා තෙසං ඉණං දදෙ.

මාතා පිතා ව මෙ වුඩ්ා ජිණ්ණකා ගතයොබ්බනා,
තෙසං තුණ්හිනා භාතූන මූලෙ පුබ්බකතං ඉණං.

අඤ්ඤෙපි තත්ථ සකුණා ඛීණා වුඩ්ා සුදුබ්බලා,
තෙසං පූජනත්ථිකො දම්මි තා නිධිං ආහුපණ්ඩිතා".

යනුවෙන් බ්‍රාහ්මණයාණන් වහන්ස! තවම පියාපත් අට නොගත්තාවූ මාගේ බොහෝ බාලදරුවෝ ඇත්තාහ උන්තරුණව ඇතමැත ගොදුරු කා ගෙනෙනතෙක් තුඩින් ගොදුරු ගෙන පොෂණය කෙරෙමි මෙසේ පොෂණය කරන ඒ මාගේ දරුවෝ මා මහලුකල තුමූ තුඩින් ගොදුරුගෙනවුත් පොෂණය කරන්නාහුය. එසේ හෙයින් මතු බලාපොරොත්තුවන නය දෙන්නේවේම්...ගිය යොවුන් ඇති ඉතා දුර්ලවූ මාගේ මවුපිය දෙදෙන තවදක්වා විද්‍යමානයහ දෙමවුපියෝ මා බාලකල තුඩින් ගොදුරු ගෙනැවිත් මා පොෂණය කළාහුද ඒ කරනලද නයින් ගැලවෙන පිණිස මේ දැන් මම ගොදුරුගෙන පොෂණය කරන්නෙම් පෙරනයින් මිදෙන්නා නම් වෙම්...තවද බමුණාණෙනි! ඒ ඉඹුල්වෙනෙහි වෘඛව වගුල පියාපත්ඇති සඬින් දුර්ලවූ ඉවත ගොස් ගොදුරුකැනොගෙන මහලු ගිරවුද ඇත්තාහ. උන්ම එනදවස් සසරවන්නාවූ ඉෂාඩ්පාක සලකා කුසල් පිණිස දෙන්

නෙම් නිධානකරන්නා නම් වෙමි එද වැලිත් අනුගාමිකනිධාන යයි පුරාතනයෙහි බුබාදී සත්පුරුෂයෝ වදළාහුයයි ප්‍රශනතුන විසඳ වදළසේක.....

ඉක්බිති බ්‍රාහමණයාණෝ ඒ අසා පහන්සිත්ඇත්තේ මහ බෝසතාණන්ට සතුතිකරන්නාහු අනේ මේ පක්ෂිරාජතෙමේ අතිශයින් ධර්මිෂ්ට එකෙක්වන එකානතයෙන්ම සමහර මනුෂ්‍ය කෙනෙකුන්ටත් මෙබදුවූ උතතම ගුණයෙක් නැතැයි සතුටුව ගිරාරජ්ජුරුවෙනි! නැවතනැවතත් නුඹවහන්සේගේ දශීනය අපට ඉතාප්‍රියය මෙතැන් පටන් නුඹවහන්සේගේ බනුවගීයා හා සමහ කැමතිපරිද්දෙන් සංකා රහිතව ඇල් අනුගව කළමැන වැයි දහසක් කිරියෙන් මහබෝසතාණන්ට පූජාකොට පසුවත් නුඹවහන්සේ දක්නාකැමැත්තෙම් අතරතුර අවුදින් මට ධම්ම දේශනා කොට වැඩිය මැනවැයි ධම්මගෞරවයෙන් ආරාධනා කොට ප්‍රියපුත්‍රයාණකෙනෙකුන් මෙන් මහබෝසතාණන්මූණ බලා පශබැදුම් උනා සතපාකතෙලයෙන් පාදසම්බාහනය කොට බඳපුටුවෙක්හි වඩාහිඳුවා රන්තැටියෙක්හි මී හා විලඳ කවා ශකීරාපැන් පොවා මහත්වූ ආදරයෙන් බලාසිටගත. මහබෝ සතාණෝද බමුණුහට බොහෝ ධම්දෙශනා කොට තමා පමණ දන්නා බැවින් තමන්වහන්සේට දුන් දහසක්කිරිය හැර අට කිරියක් පමණ තැන සැහෙසි කිහ. ඒ බමුණාණෝද යහපතැයි අටකිරියක් පමණතැන් වෙන් කොට ටැම් හිඳුවා පාවාදී දෙහොත් මුදුනෙහි තබා වැඳ වැඩිය මැනව සවාමීනි! නුඹ වහන්සේ නොදැක අඩන්නාවූ දෙමව්පියන් අස්වසා වදළ මැනවැයි සමුදුන්නාහ. ගිරාරජ්ජුරුවෝද මැනවැයි අටකිරියක් පමණ තැන පිළිගෙන බ්‍රාහමණයාණනි! නොපමාවෙවයි අව වාද කොට හැල්කරල් කඩා තුඩින් ගෙන ඉඹුල්වනයෙහි මවු පියන් සමීපයට වැඩිසේක.....බමුණුතෙමේ ටැම්සිටුවූ අටකිරිය පමණ තැනින් ගන්නාවූ අනයයන් වලකාලවයි කෙත්පල්ලාට කීයේය. එතැන් පටන් ගිරවු එහිම හැල්කරල් ගත්නාහුය.....

මවුපියන් පොෂණය කරනතැනැත්තේ පාසඛ්‍ඛිනයෙන්ද මිදෙන බවට නිදසුන් වශයෙන් ගෙනහැර පානලද **පකිණණක නිපානයෙහි කෙදුරජානකයෙහි සුවරාජවසතුව** මෙසේ සැකෙවින් කියා නිමවන ලදදේය.....

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පූරතලද බෝධිසත්වභාරඇති

අපමහබෝසතාණෝ හිමාලය වනයෙහි ඇත්කුලයක ඉපිද සබ්බාඞ්ගයවලව විශිෂ්ට රූපයක් ධරන්නාවූ අසූදහසක් පමණ ඇතුන් විසින් නිරන්තරයෙන් පිරිවරන ලදුව සිට නැවත ඇස් අඹවූ තම මැණියන් ඇත්රැලින් වෙන්කොට ගෙනයන්නා හු 'චණ්ඩාරණ'නම් පච්චන්තපාදයට ගොස් එතන හුණපදුරක් සමීපයෙහි පිහිටියාවූ ගල්ගුහාවෙක මැණියන් රඳවා නිරන්තර යෙන් එලාඵල ගෙනවුත් දී පොෂ්‍යය කරන්නාහ. එකල බරණැස් නුවර වසන්නාවූ වනචාරීවූ පුරුෂයෙක් නොහොත් වැදි පුත්‍රයෙක්තෙමේ සත්දවසක් මුළුල්ලෙහි දික්නියමයක්කොට නොනි මං මුළාව හඬමින් ඇවිදිනේ ඒ බෝසතාණන් වහන්සේට සම්මුඛවිය. බොධිසත්වවූ ඇත්රජතෙමේ ඔහුකෙරෙහි කරුණාවෙන් එඹල පුරුෂය! මානිසා තව බියක් නැත්තේය. තෝ මේ වෙනෙහි කුමක්නිසා අඩා ඇවිදිදැයි විචාරා ඔහු විසින් සවාමීනි! මංමුළාවූයේ අදට සතියෙකැයි කීකල්හි එඹල පුරුෂය! නොපට භයෙක් නොකොට ගෙනගොස් මනුෂ්‍යපථයෙහි පිහිටුවාලමි කියා ඒ මිනිහා පිටට නංවාගන වලින් මහට බැවා මහබෝසතාණෝ නැවත වල්වන්නාහ. ඒ පාපී පුරුෂයාද මා නුවරට ගියකල්හි රජ්ජුරුවන්ට කියම් සිතා තමා යන්නාවූ මඟ සලකුණු සතිටුහන්කොට ගියේය. එකල බරණැස් රජ්ජුරුවන්ගේ මහුලැතු මල්වෙයි රජ්ජුරුවෝද එදවස් නුවර බෙරලවන්නාහු කවරෙකු නමුත් මහුලැත්කමට සුදුසු ඇතෙක් දුටහොත් මට කියවයි නුවර බෙරලැවූහ. එසඳ ඒ පුරුෂතෙමේ රජ්ජුරුවන්කරා ගොස් දෙවයන්වහන්ස! නුඹවහන්සේට ආරොහනයට නිසිවූ සබ්බාඞ්ගයවලවූ ඇත් රජෙක් මවිසින් දක්නාලද ඔහු ළඟට මම මඟ කියම් මාහා කැවිව ඇතරුවන් එවා ගෙන්වාගතමැනවැයි කීයේය. රජ්ජුරුවෝද මැනවැයි කියා ඔහු හා කැවිව ඇතරුවන් ඇතුකරා යැවූහ. බොධිසත්වයෝද ඇතරුවන් දැක 'මට මේ උපන්නාවූ භය අනිකෙකු නිසා උපන්නේ නොවෙයි මවිසින් මනුෂ්‍යපථයට පමුණුවා සංග්‍රහ කරනලද පුරුෂයා සමීපයෙන් උපන්නේම වෙයි මම වනාහි හසුනීන් දහසක්දෙනා කිදුවා පියනතරම් මහබලඇත්තෙමි ඉදින් මම කිපුයෙම් වීම් නම් බලවාහන සහිතවූ මුළුරාජ්‍යය නසාපියන්නට සමර්ථයෙමි එසේ කිපියෙම් වීම් නම් මේනාක් රක්ෂාකරනලද ශීලය බිඳෙන්නේය එසේ හෙයින් මේ සත්වයෝ අද මට ශස්ත්‍රඅඞ්ගවිවලින් කොටන්නමුත් නොකිපෙමි'යි සිතා අධිෂ්ඨානකොට ගෙන කරබා නිශ්චලව සිටියාහ. එකල ඇතරුවෝද සමීපයට එළඹ බෝසතාණන්ගේ ලක්ෂණ සම්පත්ති දැක

මෙහි එව දරුවෙනියි කියා රිදීදමකට බදුවූ සොඩ අතින් අල් වාගෙන නික්ම සත්වන දවස් බරණැස් නුවරට පැමිණියේය. රජ්ජුරුවෝ ඇතු දැක සතුටුව හටගත් ප්‍රේමඇත්තේ මහුලැත්හ ලට පිවිසුවා නොයෙක් අගනා රසභොජනයන් ගෙන්වාගන ගොස් ඇතුහට දෙවූහ. බෝධිසත්වයෝද මැණියන් නැතුව ගොදුරු අනුභව නොකෙරෙමැයි ආලොපයකුත් නොගත්තාහ. රජ්ජුරුවෝ බෝසතාණන්ට ගොදුරු ගන්නාලෙස නැවතනැව තත් යාඥ කෙළේය. එකල බෝධිසත්වයෝ කියන්නාහු රජ්ජුරු වන්වහන්ස! මාගේ වියෝගයෙන් බැගැපත්වූ මාගේ අඹමැණි යෝ 'වණ්ඩාරණ' නම් පච්චන්තප්‍රාන්තයට පැමිණ එහි උල්පහන් මඩිමින් ඇවිදින්නියට අද සත්වන දවස වන්නේය. මා විසින් පොෂණය කරනලද මාගේ ඒ මවුතොමෝ මා නැතිව මිය යන්නීය. එසේ හෙයින් මැණියන් නොදැක ගොදුරු නොගන්නෙ මැයි කීහ. ඒ අසා රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කීන්නාහු—

"මුචඵෙතං මහානාගං යොයං හරති මාතරං,
සමෙතු මාතරා නාගො සහ සබ්බෙහි ඤාතිහි."

එඹා ඇමතියෙනි! යම්බඳු මේ මහඇත්රජෙක් තෙමේ ඇස් අන්ධවූ මැණියන් පොෂණය කෙරෙමැයිද ඒ මාවිසින් පොෂ ණය කරනලද ඒ මාගේ මැණියෝ ගොදුරු නොලද්දී අද සත් වන දවසය එසේවූ මාගේ මැණියෝ ගොදුරු නොලැබ වියලී මියයන්නාහයිද මාගේ මැණියන් ගොදුරු නොලැබ වියලී මිය යද්දී මම ගොදුරු අනුභව නොකෙරෙමැයිද කියද්ද? ඒ මේ මහාඇත්නාරජතෙමේ තමාගේ මැණියන් හා ද අවශෙෂ බන්ධුන් හා ද එක්ව සතුටුව සැපසේ වෙසේවා මේ ඇත්රජු මුදු හරිවිය'යි කියා බන්ධනයෙන් මුදුපූහ...ඒ බන්ධනයෙන් මිදුනාවූ ඇත් රජ්ජුරුවෝද මදක් සැතපී හිඳ නැගී රජුහට දසරාජධර්මයෙන් බණකියා මහරජ! අප්‍රමාද වෙවයි අවවාදදී මහාජනයා විසින් ගඳමල් ආදියෙන් පූජාකරන ලද්දේ නුවරින් පිටත්ව එදවස්ම පියුම්විලට ගොස් මාගේ මැණියන් ගොදුරු අනුභවකරවාම වනා ගොදුරු නොගනිමියි බොහෝ නෙළුම්මල් ඇරගෙන ගොස් ගල්ලෙනින් පිටත්ව දෙරකඩසමීපයෙහි සිටියාවූ මැණියන් සමීපයට ගොස් නිරාහාරයෙන් වියලී ගිය ශරීරයට සෙනහ පිණිස ඉක්මුදුනේ පැන්සැලූහ.....

රජ්ජුරුවෝද බෝසතාණන් වහන්සේගේ ගුණයෙහි පැහැද පියුම්විලසමීපයෙහි ගමක් කරවා මහබෝසතාණන්ට හා මැණියන්ට නිරන්තරයෙන් වැටුප් නැබ්බවූහ. මැතහාගයෙහි

බෝසතාණන්ගේ මැණියන් කළුරියකළකල්හි ඇයගේ ශරීරය ආදාහන කරවා එහන 'කාරණ්ඩක' නම් අසපුවක් කරවා රජ්ජුරුවෝ නුවරට පැමිණියාහ. ඒසථානයෙහි වනාහි පන්සියයක් පමණ තපස්වීහු හිමාලයෙන් අවුත් වසන්නාහු බොධිසත්වයන්ට තැබූ වෘත්තිය ඒ තාපසවරුන්ට සැලැස්වූහ. රජ්ජුරුවෝ මහබෝසතාණන්ගේ රුවට සම රුවක් ගලින් කරවා නිරන්තරයෙන් මහත්වූ සත්කාර පැවැත්වූහ. එහි ජඹුදීපවාසීහු අවුරුද්දක් පාසා රැස්ව හත්ථිවහ නම් පූජාවක් කරන්නාහ.

මවුපියන් පොෂණය කරණ තැනැත්තේ මලින් බැඳුනේ නමුදු ඉන් මිදෙන බවට නිදසුන් වශයෙන් වදාරනලද **එකාදස නිපාතයෙහි මාතුපොසකජාතකයෙහි නාගරාජවත්ථුව** මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

මෙසේ සුවණ්ණසාමාදීහු මාතාපිතාපොෂණ කම්මානුභාවයෙන් ඒ ඒ දුකින් මිදී ප්‍රීතිසැපයට පැමිණියාහුය. එසේහෙයින් ප්‍රියවිප්‍රයොගදුකඛයෙන් මිදීම ප්‍රාර්ථනාකරන්නාවූ තමහට වැඩ දක්නාවූ සත්පුරුෂ තෙමේ ඒ මාතාපිතාපොෂණය හැමකල්හිම කරන්නේය, බ්‍රාහමණය! මවුපියන් පොෂණය කර, මා නොවි චාරවයි වදාළසේක.

තවද මවුපියන් පොෂණය කරන තැනැත්තේ නම් රට විනාශවනකල්හිදු අනතරායින් මිදෙන්නේය. ඒ කරුණෙහි ලා මේ කථාවත්ථුව වන්නේය.

පුරනලද බෝධිසම්භාරඇති අපමහබෝසතාණන් වහන්සේ අතීතකාලයෙහි බරණැස් රජුහට පුරොහිතවිය. ඒ පුරොහිතයාණන් උපන්දින සියලුම ආවුධ බැබලුණු බැවින් 'ජෝතිපාල' නම් වීය. ඒ ජෝතිපාල නම් පුරොහිතතෙමේ ඉන් මැතභාගයෙහි සරභඞගජාතකයෙහි කී තසින් රජුහට නානාප්‍රකාර දුනුශිල්ප දක්වා එතැන් පටන් 'සරභඞගය'යි ප්‍රකටවිය. ඒ සරභඞගතෙමේ එක් දවසක් කිසිවෙක්හටත් නොදන්වා හුදකලාවම වනඅට පිවිස ගොධාවරීනම් ගංතෙරසම්පයෙහි තිස් යොදුන්පමණ ඇති ගිවුළුවෙනෙහි ශක්‍රයා විසින් දෙනලද හෙයින් සක්කදත්තිය නම්වූ අසපුවෙහිදී ඍෂිප්‍රජ්‍යාවෙන් පැවිදිව සත්වනදිනෙහි ධ්‍යානාභිඥ ඉපදවූයේය. ඉන් මැතභාගයෙහි බරණැස් රජු ආදීවූ රජදරුවෝ රටවැස්සන් සමඟ ඔහුගේ සම්පයෙහි පැවිදිවූහ. ගිවුළුඅසපුව ඍෂින්ගෙන් පිරිහියේය.

ඉක්බිති ඒ සරභඟතවුසාණන්ගේ දෙටු අතවැසිවූ 'කිසවච්ඡ' නම් එක්තරා තාපසකෙනෙක් විවේකසැප කැමතිවන්නේ එතනින් ගොස් කාලිඟුරට 'දණ්ඩකී' නම් රජහුගේ 'කුම්භපුර නම්වූ නුවර ඇසුරුකොට සෙනෙවියා විසින් උපස්ථාන කරන ලදුව රජඋයනෙහි වාසය කෙළේය. එකල දණ්ඩකී රජතෙමේ එක්තරා ගණිකාවකගේ තනතුර සිඳුවූයේය. ඕතොමෝ එතැන් පටන් ඔහු සමඟ සඤ්චය කොට තනතුර ලබන අයුරු සොයන්නී එක්දිනක් රජඋයනට ගොස් ඒ තවුසාණන් දැක මවිසින් මේ කාලසාණණියෙක් දක්නා ලද්දේය. මොහු දක්නාලද ඇස් සේදීමට දිය ගෙනඑව්යයි කියා දැහැටු කා තවුසාණන්ගේ ශරීරයෙහි කෙලගසා ජටාමතුයෙහි දැහැටු දඬුව ගසා දමා මුව දෙවු දියද උන්හිසැ වත්කොට නික්මියාය. එදවසම රජ්ජුරුවෝ ඇඟව පියවිතනතුරුම දෙවී. ඕතොමෝ පෙර කරනලද පිනක් නිසා ලබනලද ඒ තනතුර තවුසාණන්ගේ ශරීරයෙහි කෙලගැසීමෙන් ලබනලදැයි සිතීය. ඊටපසු කිපදිනක්හුගේ ඇවැමෙන් රජතෙමේ පුරොහිතයාගේ තනතුර නැවැත්වීය. හේතෙමේ ගණිකාව වෙතඟොස් කුමක් කොට නැවතත් තනතුර ලැබී දැයි විචාරා මෙනම් දෙයක් කොටයයි කීය. ඒ අසා සෙනෙවි තෙමේ එහිගොස් එසේම කොට එදවසම පියවිතනතුර නැවතත් ලද්දේය. හෙතෙමේද පෙරපින්බෙලෙන් එය ලැබ තවුසාණන්ට කෙලගැසීමෙන් ලබනලදැයි සිතුයේය. ඉන්පසු කිහිපදිනකින් රජුහට ප්‍රත්‍යන්තයක් කිපුනේය. රජතෙමේ ප්‍රත්‍යන්තය සංසිඳුවනු කැමැත්තේ කුමන උපායකින් කුමන හෙතුවකින් ප්‍රත්‍යන්තය සංසිඳුවා ජයලබන්නේ හෝයි කථාපැවතිකල රජඋයනෙහි සිටින තවුසාහට මෙසේ මෙසේ අපරාධ කොට එදවස් එදවස්හිම අසවල්ගණිකාවටද මටද වැඩසිදුවියයි මීටද එසේ කිරීම්ම හෙතුවන්නේයයි කියනලද පුරොහිතයාගේ වචනය ඇසා මේ කුළුදුළුල්ලාගේ වෙර කෙලගසම්යයි සියලු මිනිසුන්ව අණකරවා රජු සමඟ ඒ සියල්ලෝම එසේ කළාහුය. කෙලඇදිය තවුසාණන්ගේ මුළුසිරුරම වසා සිටියාහුය. සෙනෙවි තෙමේ වනාහි සියල්ලට පසුව එපවත් අසා වහා උයනට ගොස් ඒ සියල්ල පහකොට ඝනානය කරවා 'ස්වාමීනි! ඔවුන් විසින් අයුත්තියක් කරනලද්දේය එයින් මොවුන්ට කුමනවිපාකයක් වන්නේදැයි' විචාළේය. 'එම්බා සෙනාපතිය! මාගේනම් චිත්තප්‍රදෝෂයක් නැත දෙවිතාවෝ වනාහි අතිශයින් කිපියාහුය වෙයින් සත්වනදිනයෙහි මුළුරට කොරව කරන්නාහුය එසේ හෙයින් නුඹ මේ සත්දිනඅතුරෙහි විදෙහයකට යව'යි කීහ.

ඒ වචනයෙන් සෙනාපතිතෙමේ විදෙශයකට ගියේය. රජතෙමේ වනාහි ගියපමණින්ම පසල්ගම සංසිඳුවා පෙරලා අවුත් නුවරට වන්නේය. එදිනම දෙවතාවෝ දියවඤ්ඤාවන් වැස්වූහ. ඉක්බිති මනුෂ්‍යයෝ 'කුළුදුළුල්ලාහට අපරාධකළතැන් පටන් අපගේ රජ්ජුරුවන්හට අභිවෘඩ්ඨක්මය පසල්දනව්ව සංසිඳුවා ආදිනයෙහිම වැසිද වැස්සේය'යි කියා සතුටුවූවාහුය. ඉක්බිති දෙවියෝ සමන්මල්වඤ්ඤාවය මසුවඤ්ඤාවය කහවණ්ඩුවඤ්ඤාවය හසපාදීන්හි පලඳනා ආභරණවඤ්ඤාවය යන මේ වැසි වැස්වූහ. ඉක්බිති මනුෂ්‍යයෝ අතිශයින් තුටුපහටුවූවාහු තමතමන්ගේ සත්තෝෂවචනයන් ප්‍රකාශකොට රජු විසින් කරනලද පාපයෙහි අනුමොදන්වූහ. නොහොත් එකහවූහ. එදා දෙවතාවෝ එකපිටක මුවහත්ඇති ආවුධාදී ආවුධවඤ්ඤාවය ගිනිඅඟුරුවඤ්ඤාවය කුළුගෙවල් පමණැති ගල්වඤ්ඤාවය ගින්නෙන් දිලිසෙන වැලිවඤ්ඤාවය යනාදී නවවිධවැසි වස්වා එරට අසූරියනක් පමණ ගොඩ කලාහුය.

රට වනාහි නොනස්නාකල්හිම සරහගතෙමේ ඒ කාරණය දැන තරුණතවුසන් දෙදෙනෙක් යවා කිසවච්ඡ තවුසාණන් සිවි කාවකින් අහසින් ගෙන්වා ගත්තේය. සෙනෙවිතෙමේ වනාහි තෙමේම නික්මියේය. ඒ පාපකම්යෙහි අනුමතනුවූ තිරිසන් ගතයන්ට වනාහි පැන් හා තෘණආදිය නැතිවූහ. පැන් තෘණ ආදිය සම්පාදනෙක්ද එතනට යන්නාහු සත්වනදිනය පොහොය පැමිණිකල්හිම පිටරට පැමිණියාහුය එකල බරණැස් නුවරවාසිවූ 'රාම' නම් මාතුපොසක උපාසකයෙක් තෙමේ මවුපියන් පිළිදහින්නේ වෙළඳුම් පිණිස එනුවරින් දණ්ඩකීරජුගේ රටෙහි කුමඟ්වතීනුවරට ගොස් නවවිධ වැසි වස්නාකල මූළුරට වැන සෙනකල්හි මවුපියන්ගේ ගුණසිහිකෙළේය. ඉක්බිති මාතාපිතෘ උපස්ථානකම්බලයෙන් දෙවතාවෝ ඒ පුරුෂයා යහතින්ගෙන වුත් මවුපියන්ට දුන්නාහුය. එසින් අනිකුදු සියල්ලෝම වනාහි විනාශයට පැමිණියාහුය.

රට නැසෙනකල්හිදු මවුපියන් පොෂණය කරන තැනැත්තේ අනතරායෙන් මිදෙන බවට නිදසුන්වශයෙන් ගෙනහැර පානලද මජ්ඣිමපණ්ණාසකයෙහි උපාලිසුත්‍රවණ්ණනායෙහි හා සරහගජාතකයෙහිද මාතුපොසකරාමවසතුව මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

එහෙයින් පුත්‍රයා විසින් නම් මාතුපොසක උපාසකයා මෙන් මවුපියඋපස්ථානකම්යෙහි සථිරසිත්ඇත්තෙක් විය යුත්තේය.

යම් කලෙක මවුපියන් උපස්ථානකරන්ට ලැබේද එකල නැඳ පණ්ඩිතයා මෙන් පිළිපැදිය යුත්තේය.

සැවැත්නුවර වනාහි එක්තරා උපාසකයෙක් තෙමේ පියා මලකල මවු දෙවිකොට ඇත්තෙක්වී මුවදෙවුන්දිය දැහැටුදඬු ඵලවාදීම් ආදියෙන් හා කැඳබත්දීමාදියෙන්ද තමන්මව පිළිද ගිනේය. ඔහුගේ මවුතොමෝ වනාහි නැවතනැවත කියා ඔහු නොකමැතිසැල්හිත් බිරින්දක් ගෙනවුත් දුන්නිය. ඒ පුතනුවෝ ඇය සමඟ සමගිවාසය කෙළේය. ඒ බිරිඳද ඔහුගේ මෑණියන්ට මනාසේ උපස්ථාන කොට කල්යවත් ඉන්නැවතසලෙක්හි ඇය බැහැරලවනු කැමැත්තීවී එක්දිනක් හිමියාහට සවාමිනි! නුඹ ගෙසින් බැහැර ගියකල නුඹගේ මවුතොමෝ මට නොසරුප් බණනීයයි කීය. ඒ අසා හිමිතෙමේද නිශ්ශබදවීය. ඕතොමෝ එතැන් පටන් කෑද දෙන්නී නම් ඉතා උණුසුම්ව හෝ ඉතා සිහිල්ව හෝ ලුණුවැඩිව හෝ ලුණුනැතිව හෝ දෙන්නීය. දුවෙනි! උණුවැඩිය නැතහොත් ලුණුවැඩියයිද කිවා නම් උණුත් නැතිලෙසත් ලුණුත් නැතිලෙසත් සිහිල්දිය පුරවා දෙනුනීය. නැවත ඉතා සිහිල ලුණුනැතැයි කිකල ඇයි ඉන්නැවේ මේ දැන් උණුවැඩිය ලුණුවැඩියයි කීවේලේම කැවත උණුනැහ ලුණුනැතැයි දෙඩනීය නුඹ පිනවන්නට කවරෙකුට හැකිවන්නේදැයි අසලගෙවල වැසියන්ට ඇසෙනසේ මුරහඬ දෙන්නීය. නහන දියද උණුවැඩිකොට පිටට වත්කරයි අනේ දුවේ උණුවැඩිය මාපිට දැවායයි කීකල ඇල්දිය පුරවා වත්කරයි සිහිල්වැඩියයි කීකල මේ දැන් උණුවැඩියයි කියා දැන්ම සිහිල්වැඩියයි කියයි මැනේ මේ නවනෙය්‍යාඩම් කවරක්හට ඉටසන්නට හැකිදැයි උදහස්ව කියන්නීය.

මෙසේ ඕ තොමෝ නැන්දනිය සමඟ කලහ කොට හිමියා හට කියන්නී මෙබඳු කාලකණ්ණියක් සමඟ එකගෙයි වසන්නට නොහැක්කෙම් මැය පිටතැනෙන වාසය කරවවයි කීය. එසේ කීකල ඒ පුරුෂතෙමේ කියනුයේ සොඳුර! නුඹ තවම තරුණය වෙනයම් ඒ කොහිනමුත් ගොස් ජීවත්වන්නට හැකිවන්නීය මාගේ මවුතොමෝ දුර්ලභය අතපය ක්‍රියාකරවා වෙහෙසී ජීවත් වන්නට නොහැකිය මාගේ මවට පිහිට මම පමණෙකි ඇය බැහැර ලන්නට නොහැක්කෙම් නුඹම නික්ම නුඹගේ කුලගෙදරට යවයි කීය. එසඳ භායර්‍යාතොමෝ සිතන්නී ඉඳින් මම සිය ගෙදරට ගියෙම් නම් විධවාවාසය වසන්නෙම් දුඃඛිතවන්නීම යයි බියපත්ව අවුත් පෙරසේම නැන්දණිය සතුටුකරදී

පිළිදුගිය. ඉක්බිති එක්දිනක් උපාසකතෙමේ බණඇසීම පිණිස ජේතවනාරාමයට ගොස් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ශාස්තෘන් වහන්සේ විසින් කිමෙක උපාසකය කුසලකර්මයෙහි ප්‍රමාද නුවූයෙහිද මාතෘඋපස්ථාන කර්මය පිරුයෙහිදැයි විචාරණලද්දේ එසේය ස්වාමීන් වහන්සැයි කියා සියලුම ප්‍රවෘත්තිය සැලකෙළේය. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ උපාසකය! ඇයගේ වචනය නොගත්තේ දැන් පමණක්ම නොවෙයි පෙරත් ඇයගේ වචනය නොගත්තෙහියයි පෙර වනාහි මැයගේ වචනයෙන් නුඹගේ මව බැහැර ලා මා නිසා ඇය නැවත ගෙට ගෙනගොස් පිළිදුග්ගේයයි කියා **අඤ්ඤනිපාතෙහි කච්චානිජාතකය** වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකළ සේක. චතුස්සත්‍යදෙසනාවසානයෙහි උපාසකතෙමේ සොවාන්පෙළෙහි පිහිටියේය.

මාතුපොසක උපාසකයාගේ කථාවස්තුවයි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි එක්තරා පුරුෂයෙක් තමපියන් මියගියකල්හි සියමව දෙව්කොට ඇත්තෙක් වී පෙරකී නයින්ම කච්චානී නම් මැණියක් පිළිදගිනේය. සියලුම පුවත පෙරකියන ලද මාතුපොසක උපාසක කථාවස්තුව වැනිවීය. එකල ඒ පුරුෂතෙමේ බිරිඳුගේ බස්ගෙන තම මැණියන්හට කියන්නේ මැණියෙනි! මෙගෙයින් නික්මෙව වෙනයම් කැමති තැනකට ගොස් ජීවත්වෙවයි කියේය. මවුතොමෝද පුතනුවන්ගේ ඒ වචනය අසා ලයසරස සැප්පහරක් වන්නාක් වැනිවී අනේ පුතණුඩ! නුඹත් මා බැහැරකළකල මම කොබෑ ගොසින් රැකෙම් ද්‍යෝ හෝයි මැයිවිලි කියකියා වැලප හඬමින් ඒ ගෙයින් නික්ම ගොස් එක්තරා ධනවත් කුලයක් ඇසුරුකොට බැලමෙහෙකොට දුකසේ ජීවත්වන්නීය. ඇය ගෙයින් නික්ම සියකල වනාහි යෙහෙලනී තොමෝ දරුගැබ්ලද්දියක් වීය. දරුගැබ මුහුකුරා ගියපසු පුතකු වදා සමණන්හට කියන්නී නුඹගේ මැණියන් මේ ගෙයි හුන්නාක්කල් මුළුල්ලෙහි දරුවන් නොලදිමු. ඇය බැහැරගියපසු දැන් පුතෙකු ලදුමු මේ කාරණයෙන් නුඹගේ මැණියන් කාලකණ්ණියක් බැව් දනුවයි කීය. මේ කථාව මුඛපරම්පරාවෙන් ක්‍රමක්‍රමයෙන් ඒ ඒ දිශාවන්හි පතළවී ගොස් කච්චානී නම් මැහැලි අහතඥේද ශ්‍රොතපථයෙහි වැටී

තවදුරට දෙමිතස් බලවත්වී මා තළා හෙළා ගෙසින් ඇදදමා බැහැර කළකල්හි ඔවුන්ගේ වාසනාගුණ හෙලිවී දරුවන් ලදලු එය එසේ වූයේ සැබවනම් මේ ලොකයෙහි ජේඨාපචායන ධර්මය හා ත්‍රිවිධ සුචරිත ධර්මයද එකාන්තයෙන් මලේ වන්නේය. ඉදින් ඒ ධර්මය නොමලේ වීනම් බිරිඳගේ බස්ගෙන මවුන් තළා ඇද බැහැරලූ දරුවෝ පුතුන් නොලබන්නාහුය. සුවසේ දිවි නොපවත්වන්නාහුය එසේ නොව මොවුහු දරුවන් ලැබ සුවසේ දිවිපවත්වත්ලු ඒ කාරණය ඒකාන්තයෙන් ධර්මය මළනියාවට ශාක්ෂිවෙයි එසේ හෙයින් ඒ මළ ධර්මයට පිතෘපිඬදානය කොරෙමි සිතා හෙවත් ඒ මළ ධර්මය නිමිත්තකොට මතකභත්තදානයක් දෙන්නෙමියි සිතා තලමුං සහල් පිටි හැඳි වලං ආදිය සොහොන කට ගෙනගොස් මිනිස්හිස් සාබල් තුනකින් ලිපබැඳ ගිනි මොලවා ගඟට ගොස් ඉස්සොධා නහා හන්පෙරවි පිළි සොධා වියලාගැඳ ලිපගාවාට අවුදින් ඉසකේ මුදලා තලමුංසහල් බද නෙක ලා දෙනට වන්නීය. එකල පුරනලද බොධිසම්භාරඇති අපමහබෝසතාණන්වහන්සේ සක්දෙව්රජව ඉපිද එකොණෙහි ලොවබලනුයේ එසේ කරන ඒ මැහැලි අඟත දැක බමුණුවෙස කින් ඇයවෙත එළඹ එඹා කවවානිය! ඉස්සොධා නහා සුදුපිළි හැඳ මිනීඉස්කබලින් ලිප්බැඳ තලකිරිබත් පිසන්නී කඟටදැයි විවාළේය. එබසට මැහැලි කියන්නී බමුණාණෙනි! මේ ලොකයෙහි වැඩිමහලු නැයන්ට ආදරසත්කාර කිරීම් ආදීවූ සුචරිත ධර්මය නැසුනේය එසේ හෙයින් මම ඒ නැසුනාවූ ධර්මයට පිතෘ පිඬදානය කෙරෙමි කීකල්හි ශක්‍රබ්‍රාහමණ තෙමේ කියනුයේ එඹා කවවානිය! අශුද්ධවූ ආනුභාව හා දහසක් නුවණැස් ඇති ධර්මස්වරූපවූ සක්දෙව්රජ තෙමේ ධර්මය පවත්වමින් ජීවත්වන්නේය. එසේ හෙයින් ධර්මය නොනැසුනේයයි කීයේය. එබස් අසා මැහැලි කියන්නී බමුණාතෙනි! කුමක්කියවුද? මේ ලොකයෙහි යම් සත්‍වකෙනෙක් කුසලධර්මයෙහි නොයෙදී පාපයෙහි යෙදී වාසය කෙරෙද්ද? එබදුවූ සත්වයෝම පුත්‍රදාරාදාසිදස්ගව මහිසාදී ධනධාන්‍යසම්පත්තියෙන් සමෘඩවෙති පළමු වදවූ මාගේ යෙහෙළනිය අදෙහිවූ කුලජ්‍යෙෂ්ඨවූ මාතළා ගෙසින් බැහැරලා දරුවන් වදා සියලු අපගේ කුලයට ප්‍රධානවූවාය තොප කුමක් කිවත් ධර්මය නැසුනැයි යනු එකාන්තයෙන් මට සැකනැතැයි කිවාය. ඉක්බිති සක්රජ කියනුයේ කාත්‍යායනිය! නී යම් ධර්මයක් මළායයි කිවුනම් ඒ ධර්මය නම් අනිකෙක් නොව ජීවමානවූ මව්මය අන්කාරියක් නැතිව නී නිසාම මෙතැන්හි පැමිණියෙම්

මඞ්ගලාඵලදීපනීසිංහලභාවාඵලවණ්ණනාව.

යම් සන්‍ථියක් තොප තළා ගෙයින් නෙරා දරුවන් ලැබ ප්‍රබ‍ා වූද ඇ දරුවන් හා එක්ව මාගේ ධම්තෙජසින් දවා අලුණාරෙම් කිව්ය එවිට මැහැලි අනේ මේ කුමක් කියනනියාද මාගේ මුනු පුරා හා යෙහෙලිය සැපසේ හිඳිම යහපතැයි සිතා කියන්නී සවාමීනි! සක්දෙවිරජ්ජුරුවන්වහන්ස! මා පිණිස මෙතැන්හි වැඩි සේක් වීනම් මමද මාගේ පුතාද යෙහෙලීද මුනුපුරාද අපි ඇම දෙන ඔවුනොවුන් හා සමග සතුටුව යම්සේ වාසය කරමෝද ඒම නුඹවහන්සේටත් රිසිවේවායි කී කල්හි උන්විසින් දුකට පමුණුවනු ලැබූ නී සත්පුරුෂධම්මය නොහැර ඔවුනොවුන්ට යහපතක් කැමතිවියයි සතුටුවී තෙපි හැමදෙනම ඔවුනොවුන් හා සමග සතුටුව එක්තැනෙක්හි වාසයකරවයි කියා සක්දෙවු රජ ශක්‍රානුභාවයෙන් සැදී පැහැදී අහස්හි සිට කියනුයේ නොබව කාත්‍යායනිය! තොපගේ පුතනුවන් හා යෙහෙලනියද මුනුපුරාද මාගේ ආනුභාවයෙන් පෙරමහට අවුත් ක්‍ෂමාකරවා තොප කැඳවාගෙන යෙති කුශලධම්මයෙහි අප්‍රමාදව වාසය කර වයි අවවාද කොට තමා වසන්නාවූ දිව්‍යලොකයටම ගියේය. ඒ පුත්‍රාදීහුද ශක්‍රානුභාවයෙන් ඇයගේ ගුණසිහිවී සොහොන් මහට පිළිපැද යන්නාහු අතරමඟැ ඇය දැක පාමුල්හි හිසින් වැඳ වැටී වරද ක්‍ෂමාකරවා ගෙදරට ගෙනවුත් එතැන් පටන් සමගිවාසයෙන් විසුවාහුය.

කවවානිවසනුවසි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරනසමයෙහි සොනපණ්ඩිත නම් දෙටුබෑ කෙනෙක්ද නන්දපණ්ඩිත නම් කණිටුබෑකෙනෙක්දැයි දෙබෑ තවුස් කෙනෙක් මවුපියන් පොසනය කරමින් හිමවත් පෙදෙසෙහි වාසය කළාහුය. උන්වහන්සේලා අතුරෙන් දෙටුබෑතෙමේ පවාහිඥ ලාභී බැවින් ඉතා දුරද ගොස් මධුර ඵලාඵල ගෙනවුත් මවුපියන්ට දෙයි කණිටු බෑතෙමේ වනාහි ලඟලඟම ඇවිද යම් ඒ කෙබඳු ඵලාඵල නමුත් දෙටුබෑයාට පළමු ගෙනවුත් දෙයි දෙටුබෑයා විසින් එසේ නොකරවයි කියනලද්දේ නමුදු උන්ගේ වචනය නොපිළිගත්තේමය. ඉක්බිති දෙටුතවුස් තෙමේ කණිටු තවුසාණන්ට කථාකොට කියන්නාහු තන්‍දය! නුඹ අවවාදය නො පිළිපදිනෙක පණ්ඩිතයන්ගේවචනය නොකරන්නෙහිය මවුපියෝ නම් දෙටුහව භාරය මම ඒ මවුපියන් පිළිදහින්නෙමි තෝ මෙහි

නොවසුව අන්කාමෙහි තැනෙක්හි යවසි කියේය. නන්දපණ්ඩිත තේමී සිටින්වි නොහැකිවූයේ තමන්ගේ පුත්සලුව වැද නසිණ මඩුල්ල බලා එදිනම ධ්‍යානාභිඥ උපදවා වීම් ඒ සියයක් රජුන් හෙන මාසොහොවුරාණන්ගේ සෘතිකරවා මිදුපියාණ උවටැන් කරන්වි අවසර ඉල්වාගන්නෙමියි කියා යැයියෙන් විනෝද නම්වූ බරණැස්රජුරුවන්වෙත එළඹ පියාවත මිහිරෙළාණන්වහන්ස! මම මාගේ නිලයෙන් ඔබවි මුළුදඹදිව් රාජ්‍යය අරන් දෙනුනෙමි අදම ඊට ඔක්මෙතු මැනවැයි කියේය. ඒ අසා රජුරුවෝ ඒ වචනය පිළිගත්තේය. ඉඳින් සේනාව සූදානම්කොටගෙන් තැවේදැ එහෙණෙහි නන්දපණ්ඩිතතෙමේ සෙවිනකොට සිසිල් කරාගත්තේය. මැසිවස්නාකල මතුවෙසි වැසි වලාකුලුත් පෙරිය ලෙණය හෙවි සිතල හෙවි වාතය හෝ වළකාලුත් පෙරිය. මෙසේ තාතුනපුටු ආදිය අතුරුදන් කරවා කිපුණිමසුරුලුක් මෙහි පම් කොරවිසි ඒ නන්දපණ්ඩිතතෙමේ අකාලෙහි සම්පත්සිරි අතුව සිදු සෙනාව විසින් පරිවරණලදුව හැමට පළමුව කොසොල් රටට හොස් සුසි හෙව් කෙරේවා නානාකොන් මැහේ වසන පෙති හෙව් පවතිවාසි කියා දූතයෙක් යැවූයේය. කොසොල් රජුරුවෝ ඊට කිපී යුද්ධකරන්ට නික්මෙයේය. නන්දපණ්ඩිතතෙමේ දෙපෙ නන අතර තමන්ගේ අදහස්දිසිසම මෙසේ පොට දිනෙවිමින් විදිහස්දිනලද ඒ සිහතුරොන් එතැසියකින්වත් තුවාලලක් එකද නොතෙක් නම් නුවූයේය. ඒ සියල්ලොම අවසන්වූ බි ඇත්තාතු නිරුත්සාහිව සිටියාතුය. එවිට නන්දපණ්ඩිතතෙමේ නොඛිය මහරජ! ඔබගේ රාජ්‍යය ඔබටම වන්නේය නුදෙක් මනොජ රජුරුවන්ගේ වසයෙහි පමණක් පවතිවාසි කොසොල් රජුරුවන්ට කීයේය. කොසොල් රජුරුවෝද මැනවැසි එවස පිළි ගත බරණැස් රජු පිරිවරා අතුරට බලා යියේය. මේ නියාගෙන් නන්දපණ්ඩිතතෙමේ සත්තවුරුදු සත්මස් සත්දිනක් තුළ මුළු දඹදිව් රාජ්‍යයන් ගෙන බරණැස මනොජරජහට දී ඒ එක්සිය ගණ් රජුන්ව දෙවුකොට ඒ සියලු රජවරුන් ගෙන තමසොහොදුරු නොණපණ්ඩිතයාණන්වෙත අවුත් ඔහු සමඟකරවා මවුපියන් පොෂණය ඉල්වා සිටියේය. බෝසතාණෝද සතුටුසින් අන්හන් දැන් තව කෙමොවෙමි මවුපියන් අතුරෙන් එක්කෙනෙකුන් පිළිදගින්ව ලබනෙහියයි කීහ. එකල මවුතොමෝ දරුව නොණපණ්ඩිතය! නුඹගේ මලනුවෝ බොහෝ කල්වෙන්ව විසු මෝය එබැසින් නුඹගේ මලනුවෝ මා උපස්ථාන් කෙරේවා නුඹ සියාණන් වහන්සේම උපස්ථානකෙරේවාසි කීවාය. මහබෝස තාණෙනි මැණියන්ගේ වචනය පිළිගෙන නැඟය! නුඹ විසින්

වැඩීමහල්ලාට අයිති භාගය නොහොත් ප්‍රධාන භාගය ලබන ලද්දෙහිය නොපමාව සිතතබා පිළිදගුවයි කියා මැණියන්ගේ ගුණ ප්‍රකාශකාරම්න් **සොණනන්දජාතකයෙහි**—

"අපත්‍යකාමපඤා පතිඤා ව පුබ්බෙ රසදදී ව නො,
මගෙහා සඟහස්ස ලොකස්ස මාතා තං වරතෙ ඉසෙ!.
පුබ්බෙ රසදදී හොති මාතා පුත්තූපසංහිතා,
මගෙහා සඟහස්ස ලොකස්ස මාතා තං වරතෙ ඉසෙ!."

යන මේ ගාථාවලින් පින්වත මාමලනුවූ නැඳුපණ්ඩිතවූ සාණෙනි! මැණියෝ නම් මෘදුහෘදය ඇත්තාහුමය එසේම පුත්‍ර ප්‍රජාවට පිහිට ඇත්තෝමය සියල්ලට පළමු අපට ක්ෂීරසංඛ්‍යා තවූ රසය දුන්නෝය පුත්‍රප්‍රජාවට සුවගීලොකයට යාමට මාගී යෙක ඒ මැණියන්ට මා රිසි නොවන්නේය. තා රිසිවන්නේය පින්වත නැඳුපණ්ඩිතයාණෙනි! මැණියෝ නම් හැමට පළමු ක්ෂීර සංඛ්‍යාතරසය දෙමින් ප්‍රජාව ගෝපනය කරන්නෝමය එසේම පුත්‍රප්‍රජාව වෙත පුණ්‍යධම්මය එලවන්නෝය පුත්‍රප්‍රජාවට දෙව් ලෝයාමට මාගීයක එබඳුවූම මැණියෝ මා නුරුස්නාහ නොපම රුස්නාහයි කිහ

එසේ කියා දැන් රජුන් සහිත පිරිස අතුරෙහි මවුපියන් කෙරෙහි වරදවා පිළිපදනා තැනැත්තේ මේ අභිතට හෙවත් විපතට පැමිණේයයි දක්වමින් මේ ගාථාවන් කීයේය

"එවං කිවඤා හතො පොසො මාතු අපරිවාරකො,
මාතරි මිවඤා වරිත්වාන නිරයං සො උපපජ්ජති.

එවං කිවඤා හතො පොසො පිතු අපරිවාරකො,
පිතරි මිවඤා වරිත්වාන නිරයං සො උපපජ්ජති.

ධනමපි ධනකාමානං නස්සති ඉති මෙ සුතං,
මාතරං අපරිවරිත්වාන කිවඤං වා සො නිගච්ඡති.

ධනමපි ධනකාමානං නස්සති ඉති මෙ සුතං,
පිතරං අපරිවරිත්වාන කිවඤං වා සො නිගච්ඡති.

ආනන්දෙ ව පමොදෙ ව සදා හසිතකීළිතං,
මාතරං පරිවරිත්වාන ලබ්භමෙතං විජානතා.

ආනන්දෙ ව පමොදෙ ව සදා හසිතකීළිතං,
පිතරං පරිවරිත්වාන ලබ්භමෙතං විජානතා.

දුතඤ්ච පියවාචඤ්ච අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං,

එතෙ ඛො සඞ්ගහා ලොකෙ රථස්සාණීව යායතො,
එතෙ ච සඞ්ගහා නාස්සු න මාතා පුත්තකාරණා.
ලහෙථ මානං පූජං වා පිතා වා පුත්තකාරණා,
යසමා ච සඞ්ගහා එතෙ සම්මෙක්ඛන්ති පණ්ඩිතා,
තසමා මහත්තං පපොනන්ති පාසංසා ච භවන්තිතෙ"ති.

මෙහි අදහස නම්:—මැණියන් විසින් මෙසේ දුකින් හිරිහැරයෙන් භරණය පොෂණය පිළිදැගීම කරනලද්දාවූ යම් කිසි පුරුෂයෙක් තෙමේ තම්මැණියන්ට පරිවරණය නොකෙරේද හෙවත් වන්දනමානනගරුසත්කාරාදිය නොකෙරේද ඒ පුරුෂතෙමේ මැණියන් කෙරෙහි වරදවා පිළිපැද හෙවත් මැණියන් නොපිළිදැග උත්පත්තිවශයෙන් නරකයට පැමිණෙන්නේය.

පියාණන් විසින් මෙසේ දුකින් හිරිහැරයෙන් භරණය පොෂනය පිළිදැගීම කරනලද්දාවූ යම්කිසි පුරුෂයෙක් තෙමේ පියාණන්ට පරිවරණය නොකෙරේද හෙවත් ගරුබුහුමන් සත්කාරාදිය නොකෙරෙයිද ඒ පුරුෂතෙමේ පියාණන් කෙරෙහි වරදවා පිළිපැද හෙවත් පියාණන් නොපිළිදැග උත්පත්ති වශයෙන් නරකයට පැමිණෙන්නේය.

වසතුකාමැත්තවුන්ට උපන්නාවූ ධනයද ඔවුන් මැණියන් නොපිළිදග්නවුන් වූකලි ඔවුන්ගේ ඒ ධනයද නැසෙන්නේයයි මවිසින් අසනලද්දේය එසේ නොවත්හොත් මැණියන් නොපිළිදගිනාවූ ඒ පුරුෂතෙමේ ඒ පාපයෙන් දුකට හෝ පැමිණෙන්නේය.

වසතුකාමැත්තවුන්ට උපන්නාවූ ධනයද මවුන්පියාණන් නොපිළිදග්නවුන් වූකලි ඔවුන්ගේ ඒ ධනය නැසෙන්නේයයි මවිසින් අසනලද්දේය එසේ නොවත්හොත් පියාණන් නොපිළිදග්නාවූ ඒ පුරුෂතෙමේ ඒ පාපයෙන් දුකට හෝ පැමිණෙන්නේය.

පණ්ඩිතයා විසින් මැණියන් පරිවරණය කොට හෙවත් පිළිදැගුම්කොට මෙම මනුෂ්‍යලොකයෙහිද සදිව්‍යලොකයෙහිද ආනන්දසංඛ්‍යාතවූ ප්‍රීතිසැපයද පමොදසංඛ්‍යාතවූ ප්‍රකෂ්ටප්‍රීතිසැපයද හැමකල්හි කෙළිසිනහ සැපයද යනමේ සියලුසැප ලැබිය හැක්කේය. පණ්ඩිතයා විසින් පියාණන් පරිවරණය කොට හෙවත් පිළිදැගුම් කොට මෙම මනුෂ්‍යලොකයෙහිද සදිව්‍යලොකයෙහිද ආනන්දසංඛ්‍යාතවූ ප්‍රීතිසැපයද පමොදසංඛ්‍යාතවූ ප්‍රකෂ්ටප්‍රීතිසැපයද හැමකල්හි කෙළිසිනහ සැපයද යන මේ සියලුසැප ලැබිය හැක්කේය.

මවුපියන්ට දන් දීයයුතුයි ප්‍රියතෙපුල් බිණිය යුතුයි මේ ලොකයෙහි මවුපියන් විසින් සිඹකලයුතුලෙස උපන්නාවූ කට යුතු සිඹකිරීම් වශයෙන් රාජකුලාදීන්හි පවා එලඹැ කටයුතු සිඹකිරීමෙන් අඵීවරියා කටයුතුයි. ජඤාපවායනධම්මයන් එලඹ සිටිකල්හි හෙවත් කුලදෙටුවන් පිදීම එලඹසිටිකල්හි දෘනාදී සියුසඟරාවතින් සංග්‍රහ කටයුතු ඒ ඒ පුද්ගලයා කෙරෙහි රහෝ ගතව අභිවාදනාදිය නොකොට පිරිස්මැද අභිවාදනාදිය නො කටයුත්තීය. හෙවත් ආවීරහෝ යන හැමතන්හිම සුදුසුපරිද්දෙන් අභිවාදනාදිය කිරීමෙන් සමානයෙක් වියයුතුය යන සමානාත්මතාවය ඇත්තෙක් වියයුතුය.

ගමනය කරන්නාවූ රථයාගේ අකුරෙහි ගඤ්ඡතලද යකඩ ඇණ ඇතිකල්හිම රථය ගමනය කෙරේද නැතිකල්හි ගමනය නොකෙරේද එමෙන්ම ලොකයෙහි මේ සතරසංග්‍රහයන් ඇතිකල්හිම වනාහි ලොකය පවත්නේය නැතිකල්හි නොපවත්නේය ඉදින් මේ සතරසංග්‍රහයෝ ලෝකයෙහි නොවන්නාහු නම් එසේමත් මවුතොමෝ මේ සංග්‍රහයන් පුත්‍රයාහට නොකරන්නී නම් ඒ මවුතොමෝ පුත්‍රයා නිසා මානයක් හෝ පූජාවක් හෝ නොලබන්නීය. මේ සතරසංග්‍රහයෝ ලොකයෙහි විද්‍යමාන හෙයින්ද එසේමත් මවුපියෝ පුත්‍රයාහටත් කරන හෙයින්ද පුත්‍රයා නිමිත්කොට හෙවත් පුත්‍රයා හෙතුකොට ඇත්තාවූ නොහොත් පුත්‍රයා විසින් කටයුතුවූ මානයද පූජාවද ලැබෙන්නේය.

යම්හේකින් මේ සංග්‍රහයන් ලෝකයෙහි සත්පුරුෂ පණ්ඩිතයෝ මනාකොටම කටයුතු ධම්මයන්ලෙස සලකා බලද්ද එහෙයින් ඒ පණ්ඩිතයෝ ශ්‍රෙෂ්ඨබවට පැමිණෙන්නාහුය. ඒ පණ්ඩිතයෝ සංග්‍රහකටයුතු ඒ ඒ පුද්ගලයන් කෙරෙහි මේ සංග්‍රහයන් සුදුසු පරිද්දෙන් පවත්වන්නාහුයයි මෙසේ පැසසිය යුත්තෝද වන්නාහුය යනුයි.

ඒ අසා පිරිස්සහිතවූ රජදරුවෝ අතිශයින් පහන්වූවාහු මහබෝසතාණන් වහන්සේ විසින් පංචශීලයෙහි පිහිටුවා දෘනාදී පුණ්‍යක්‍රියාවන්හි අප්‍රමාදීහු වෙත්වායි අවවාද කරකලද්දාහු උන්වහන්සේ වැඳ තමතමන්සතු නගරයන්වෙත පැමිණ දැහැමින් රාජ්‍යය කරවා සවඟීපරායණ වූවාහුය. සොතාපන්න යනා ඵලබැගෝද දිවිකෙළවරදක්වා මාතාපිතෘ උපස්ථානය කොට බ්‍රහ්මලොකපරායණවූවාහුය.

මාතාපිතෘඋපස්ථානය මෙලොව ප්‍රශංසාදියට හා පරලොව බ්‍රහ්මදිව්‍යසුවයටත් හෙතුවන බැවින් මහුල් වනබවට නිදසුන්වශයෙන් ගෙනහැරපානලද සත්තනිපාතයෙහි සොනනන්දජාතකයෙහි වෙහාතුකාවස්තුව මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

මෙසේ යථොක්තවූ මාතාපිතෘඋපස්ථානය මේලොකයෙහි ප්‍රශංසාදිය ඵලවන හෙයින් මහුලැයි කියනලද්දේමය.

ඒට අනතුරුව අනික් ක්‍රමයක් කියනුලැබේ. උපස්ථානය නම් මවුපියන් පොෂණය කිරීමය, මවුපියන්ගේ කටයුතුකිරීමය, කුලවංශය පිහිටුවීමය, දායාදයට සුදුසුලෙස පිළිපැදීමය, දක්ෂිණාව පැමිණවීමය, හෙවත් පින්පැමිණවීමය, යන මොවුන්ගේ වශයෙන් උපස්ථානය පස්වැදෑරුම් වන්නේය. එසේ හෙයින් සිගාලක නම්වූ ගෘහපතිපුත්‍රයාහට ධර්මදෙශනාකරවදාරණ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ "පංචහි ඛො ගහපතිපුත්ත! ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරෝ පච්චුපට්ඨාපෙතබ්බා" යනාදී පාලියෙන් ගෘහපතිපුත්‍රය! කරුණුපසක් හෙතුකොට ගෙන වනාහි පුත්‍රයා විසින් පූර්වඋපකාරිත්වය නිසා පුරත්ථිමාදිසා නම්වූ මාතාපිතෘන්හු උපස්ථාන කටයුත්තාහුය. සාවර නම් කරුණු පසක් හෙතුකොටගෙනද යත්: මා උපන්නැන්පටන් මවුපියන් විසින් සැපවූ ප්‍රත්‍යය ඵලවීමෙන් හෘදය ලොහිතය සංඛ්‍යාත ක්ෂීරය පානය කරවා අත්පා වඩා මුවින් සෙම්සොටු උරා බැහැර දමා නහවා හන්දවා සරසා හරණය පොෂණය කරනලද්දේවෙමි. ඒ මවුපියන් මහලුකල පාදෙවීම් නැහැවීම් කැඳබත් ආදිය දීම් ආදියෙන් මම පොෂණය කරන්නෙමිය, මම මාගේ කටයුතු හැර නුවුත් මවුපියන්ට රාජකුලාදීන්හි උපන් කටයුතු ඒ ඒ තන්හි ගොස් කරන්නෙමිය, යම් හේකින් මවුපියන්සතු කෙත්වත්ආදිය නොනසා අරක්කොට පැවැත්ම ඔවුන්ගේ පරම්පරාසම්පත්තියට කාරණාවේද යම් හේකින් කුලවශස් ආදියෙන් තමා හා සමාන පුරුෂයෙකු හට ගෙල හෝ අතැ හෝ බැඳී මිණිවලලු ආදියක් පැහැරගතයුතුය යනාදී වශයෙන් පැවති අඛාර්මිකවංශයෙන් මවුපියන් ඉවත් කොට ඒ ඒ අධාර්මික දෙය බැහැරලවා හිංසාදියෙන් තොරවූ පැවති ධාර්මිකවංශයෙහි පිහිටුවීමෙන් හා දෙනලද දායන් නොසිඳ පැවැත්වීමෙන්ද මත්තෙහි ඔවුන්ගේ පරම්පරාව ගෙනයන්නෙකුත් වේද එසේහෙයින් එලෙස කුලවංශය තබන්නෙමිය,

යම් හේකින් දායාදප්‍රතිලාභයට යොග්‍යබැවිනි පවත්නාකල්හිම දායාදය පිළිලබන්නේ නම් වේද මවුපියෝ තමන්ගේ අවවාද යෙහි නොපවත්නාවූ වරදවා පිළිපන්නාවූ දරුවන් "තමන්සතු දායාදය පුතුහට නොදියයුතුය" යනා විනිශ්චයට පැමිණි අප්‍රතුන් කෙරෙද්ද ඔවුහු දායාදරහ නොවෙද්ද ඔවාසේ පවත්නාකල්හිම වනාහි කුලසතුදෙයට හිමිකෙරෙද්ද එසේ හෙයින් මම දායාදය පිළිලබන්නෙමිය, මවුපියන් මළකල ඔවුන්ට පින්දීමක්කොට නොවනදින ආදියෙහි පවන් දන්දෙන්නෙමිය, යන මේ කරුණු පස හෙතුහොටගෙන ගෘහපතිපුත්‍රය! පුරත්‍ථිමාදිසාසංඛ්‍යාතවූ මවුපියෝ පුත්‍රයා විසින් උපස්ථාන කටයුත්තාහුයයි වදළසේක.

එහි කුමක් පිණිස දන්දෙන්නේදයත්: එය මලාවූ දෙමවුපියන්ට පැමිණවීම පිණිසය. කිමෙක මේ දානය වනාහි මියපරලොවගියවුන්ට පැමිණෙන්නේද? භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින්ම වදාරනලදබැවින් මෙහි වනාහි අපවිසින් කියයුත්තක් නැත්තේමය.

ජානුස්සොනි නම්වූ එක්තරා බ්‍රාහ්මණයෙක් වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙත එළඹ මෙසේ විචාරසි කෙසේද?යත්: 'භවත් ගෞතමයාණන් වහන්ස! අපි බ්‍රාහ්මණයෝ නම් වමු. අපි දන්දෙන්නෝවමු මේ දානය මියපරලොව ගියාවූ නැසහලේනැආදීන්ට පැමිණේවා මේ දානය මියපරලොව ගියාවූ නැසහලේනැආදීහු අනුභවකරත්වායි කියා අදහා කටයුතු පින් කරන්නෝ වමු. කිමෙක භවත් ගෞතමයාණන් වහන්ස ඒ දානය මියපරලොවගියාවූ නැසහලේනැආදීන්වෙත පැමිණේද? කිමෙක භවත් ගෞතමයාණන්වහන්ස! මියපරලොවගියාවූ ඒ නැසහලේනැආදීහු ඒ දානය පරිභොග කෙරෙද්ද?"යි කියාසි. එකල භාග්‍යවතුන්වහන්සේ වදාරණසේක් "බ්‍රාහ්මණය! අවකාශස්ථානයෙහි වනාහි පැමිණෙන්නේය අනවකාශස්ථානයෙහි නොපැමිණෙන්නේය"යි වදළසේක. "භවත් ගෞතමයන්වහන්ස! අවකාශස්ථානයනම් කවරේද අනවකාශස්ථානය කවරේද?"යි විවාළේය. බ්‍රාහ්මණය! මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙමේ ප්‍රාණවධ කරන සුලුවේද පෙ. මිසදිටුවේද හේ තෙමේ කාබුන්මරණින්මතු නරකයෙහි උපදනේය යමක් නිරිසතුන්ව ආහාරවේද හේ තෙමේ එහි ඉපදවීම ඇතිකළ කර්මයවූම ඒ ආහාරයෙන් එහි යැපෙන්නේය හේ තෙමේ ඒ කර්මයකොටගෙන එහි සිටින්නේය

බ්‍රාහ්මණය! යම් තැනෙක සිටියහුට ඒ දැනය නොපැමිණේද මේ කියනලද්දේ ඒ අනවකාශසථානය වන්නේය.

බ්‍රාහ්මණය! මේ ලොකයෙහි ඇතැම් පුහුලෙක් තෙමේ වනාහි ප්‍රාණවධ කරනසුලුවේද.පෙ.හේ තෙමේ කාබුන්මරණින් මතු තිරිසන්යොනියෙහි උපදනේය යමක් තිරිසන්යොනියෙහි උපන්නවුන්ට ආහාරවේද හේ තෙමේ තෘණපණ්ණාදීවූ එයින් එහි යැපෙන්නේය හේ තෙමේ ඒ කරණකොට එහි සිටිනේය බ්‍රාහ්මණය! යම් තැනෙක සිටියහුට ඒ දැනය නොපැමිණේද මෙයද ඒ අනවකාශසථානයක් වන්නේය.

බ්‍රාහ්මණය! මේ ලොකයෙහි වනාහි ඇතැම් පුහුලෙක් තෙමේ ප්‍රාණඝාතයෙන් වැලැක්කේවේද.පෙ.සම්‍යග්දෘෂ්ටිකවේද හේ තෙමේ කාබුන්මරණින්මතුත් මිනිසත්බවට පැමිණේද යමක් මිනිසුන්ට ආහාරවේද, ඔදනකුම්මාසාදී එයින් හෙතෙම් යැපෙන්නේය ඒ කරණකොටගෙන හෙතෙමේ සිටින්නේය, බ්‍රාහ්මණය යම්තැනෙක සිටියහුට ඒ දැනය නොපැමිණේද මෙයද ඒ අනවකාශසථානයක් වන්නේය.

බ්‍රාහ්මණය! මේ ලොකයෙහි ඇතැම් පුහුලෙක් තෙමේ වනාහි ප්‍රාණඝාතයෙන් වැලැක්කේ වේද.පෙ.හෙතෙමේ කාබුන් මරණින්මතු දෙවුලොවැ උපදනේය යමක් දෙවියන්ට ආහාරවේද හේතෙමේ සුධාභොජනාදී එයින් එහි යැපෙන්නේය ඒ කරණකොට හෙතෙමේ එහි සිටිනේය, බ්‍රාහ්මණය! යම් තැනෙක්හි සිටියහුට ඒ දැනය නොපැමිණේද මෙයද වනාහි ඒ අනවකාශසථානයක් වන්නේය.

බ්‍රාහ්මණය! මේ ලොකයෙහි ඇතැම් පුහුලෙක් වනාහි ප්‍රාණඝාතයෙන් වැලකියේ වේද මිසදිටුත් වේද හේ තෙමේ කාබුන්මරණින්මතු ප්‍රෙතනිකායෙහි උපදනේය යමක් ප්‍රෙතවිෂයෙහි උපන්නවුන්ට ආහාරද ඒ සෙම්සොටුආදියෙන් හෙතෙම් එහි සිටිනේය, යමකුත් මේ මිනිස්ලොවින් මිතුරුවූ මනුෂ්‍යයෝ හෝ නැසහලේනැයෝ හෝ ඕහට පමුණුවද්ද 'පරදත්තූපජීවී' නම් ප්‍රෙතනිකායෙහි පමණක්වූම හෙතෙමේ එයින් එහි යැපෙන්නේය ඒ කරණකොට හෙතෙමේ එහි සිටිනේය, බ්‍රාහ්මණය! යම් තැනෙක්හි සිටියහුට ඒ දැනය පැමිණේද මේ වනාහි ඒ අවකාශසථානය වන්නේය"යි වදළසේක.

ඉදින් වනාහි භවත් ගෞතමගන්වහන්ස! පරලෝ සැපත් ඒ නැසහලේනැතෙමේ එමසථානයට නොපැමිණියේ විනම් කවු

රෙක් ඒ දානය පරිභොග කරන්නේද? "බමුණ! පරලොවසැපත් අන්කිසි නැසහලේනැකෙනෙක් එමයථාතයෙහි උපන්නාහු වේද්ද ඔවුහු ඒ දානය පරිභොගකෙරෙත්ය"යි වදළසේක. භවත් ගෞතමයන්වහන්ස! ඉදින් වනාහි පරලෝසැපත් ඒ නැසහලේනැතෙමේත් එතනට නොපැමිණියේවේද පරලෝසැපත් අනිකුත්නැසහලේනැකෙනෙකුත් එතනට නොපැමිණියාහුවේද්ද එසේකල කවරෙක් ඒ දානය පරිභොගකරන්නේද?"බමුණ! යම් හෙයකින් මේ දීඝීකාලයකින් පරලෝසැපත් ඤතීන් කෙරෙන් ඒ සථානය නිස්ය යන යම් මේ යමක් ඇද්ද මේ කාරණය වනාහි හෙතු රහිතය අවකාශ රහිතය. බමුණ! යම් හෙයකින් එසේ වුවත් දානය නෙමේද ඵලරහිතයෙක් නොවන්නේය"යි වදළ සේක.

මේ දසනිපානඛණ්ඩනාතරයෙහි ජානුස්සොණිසූත්‍රයෙහි අදහස වන්නේය.

ඉදින් වනාහි "ඉදං නො ඤතීනං හොතු"යි කියනලද කල්හිද ඒ ප්‍රෙතයෝ එහි අවුත් අනුමොදන්වෙද්ද ඒ දානය ඔවුන්ට පැමිණේද ඔහුතුමුත් සමපත් ලබන්නාහුය. ඊට නිදසුන්කොට බිම්සරමහරජහුගේ පූර්ඞ්ඤති ප්‍රෙතයෝ දක්වනලද්දහ.

මෙකපින් වනාහි පෙර දෙයාතුකපෙහි 'කාසි' නම් නගරයෙහි 'ථූසස' නම්වූ ශාසනාරක්ෂවහන්සේ ලොව පහළවූසේක. 'ජයසේන' නම් රජතෙමේ උන්වහන්සේහට පියවීය. 'සිරිමා' නම් දෙවී තොමෝ මවුවීය. උන්වහන්සේගේ බාලමලුතුවූ වෙමාතිකවූ රාජපුත්‍රයෝ තිදෙනෙක්වූහ. ඒ තිදෙනාහටම එකම හාණ්ඩාගාරිකයෙක්ද එකම ජනපදනියුක්තපුරුෂයෙක්ද වූයේය. එකල ඒ රාජපුත්‍රයෝ තමන්දෙවු බැවූ ශාසනාරක්ෂවහන්සේ උපස්ථාන කරනු කැමැත්තාහු පියරජුහට යාඥාකළාහුය. රජ්ජුරුවෝද වනාහි බුදුන් වෙත එළඹ "මාගේ දෙවුපුත් තෙමේ බුදුය කණිටුපුත් තෙමේ අගසව්ය පුරෝහිතයාගේ පුත්තෙමේ දෙවැනි අගසව්ය"යි උන්වහන්සේලා දෙසබලා "මගේම බුදුන්ය මාගේම ධර්මයය මාගේම සංඝයාය"යි කියා දෙහොත් මුදුනෙහි තබා "නමොතසස භගවතො අරහතො සමමා සම්බුඩසස"යි තෙවරක් උදන් අනා ශාසනාරූඪ එම බුදුන් සිරිපාමුල්හි වැදහෙව සවාමිනි බුදුරජාණන්වහන්ස! දැන් මාගේ අනුදනසක් ප්‍රමාණවූ ආයුෂයාගේ කෙළෙහිද නිදන කලක් වැනිය එබැවින් මාජීවත්වනතාක් අනුන්ගේ ගෙදොරව

නොවැඩ මාගේ සියුපසය ඉවසාවදුලමැනවයි පිළින ගෙන් නීබඳ බුදුන් උවටැන් කරන්නෝය. එසේහෙයින් අවසර නොදින යලියලිත් යාඥා කොටත් නොලැබ පසුව පසල්දනවිවක් කිපි කල්හි එය සංසිදුවීමට යවනලද එකුමරුවන් එය සංසිදුවා පෙරලා අවුත් රජුවැද සිටිසඳ රජුරුවෝ උන් වැළඳ හිස සිප දරුවෙනි! මම නොපට වරයක් දෙමි කීහ. කුමරුවෝ දෙවයන් වහන්ස! මැනවැයි කියා නැවතද කිපදවසක්හුගේ ඇවැමෙන් පියරජුරුවන් විසින් දරුවෙනි! වරය ගනිව්යයි කියනලද්දාහු දෙවයන්වහන්ස! අපට අනිසකින් කම් නැත මෙතැන්පටන් භාතෘවූ බුදුන් වළඳවන්ට වරදුනමැනවයි කීහ. රජුරුවෝ දරුවෙනි! නොදෙමියි කීහ. නිතිකල් නොදෙනහොත් සත්ගවු රුද්දක් දුනමැනවයි කීහ. රජුරුවෝ දරුවෙනි! නොදෙමියි කීහ. එසේ වීනම් සාවුරුද්දක් පස්අවුරුද්දක් සහරඅවුරුද්දක් තුන්අවුරුද්දක් දෙහවුරුද්දක් අවුරුද්දක් සත්මසක් සමසක් පස්මසක් සියුමසක් තෙමසක් දුනමැනවැයි කීහ. එහෙනම් අප තිදෙනාහට එකඑක මාසය බැගින් තෙමසක් දුනමැනවැයි කීහ. හොඳයි දරුවෙනි! එහෙනම් තෙමසක් බුදුන් වළඳවවියයි කීහ. මෙසේ පියරජු විසින් අනුදන්නාලද ඒ කුමරුවෝ තිදෙන තමන්දනවිහි අයකැමිපුරුෂයාහට ශාසනාරූඪ වහන්සේට විහාරයක් කරවා අපට දුනුම් දෙවයි හස්නක් යැවූහු. ඒ අය කැමිතෙමේ එසේ කොට සැලකෙළේය. ඒ රජකුමරුවෝ ඒ බුදුන් තමන්දනවිවට වැඩමවා විහාරය පිළිගන්වා "තෙපි මෙතෙක් දුනවසතු ගෙන දිනපතා අනුදහසක් භික්ෂූන් පිරිවර කොටඇති භාග්‍යවතුන්වහන්සේට හා පිරිවර සහිත අපටද ඕයලුම කැයුතු බුදියයුතු දෙය සම්පාදනය කරව් මෙතැන් පවත් වනාහි අපි කිසිවක් නොකියන්නෙමු"යි භාණ්ඩාගාරික යාහට හා අයකැමියාටද කියා දහසක් පුරුෂයන් ගෙන දසසිල් සමාදන්වී කසාවත් හැඳ පෙරවූ විහාරයෙහිම තුන්මසමුළුල් ලෙහිම විසූහ. එතැන්පටන් ඔවුන් විසින් අණවනු ලැබූ භාණ්ඩාගාරිකාදීහු වරින්වර වසතුගෙන දන් දෙන්නාහ. ඔවුන තුරෙන් භාග්‍යවිව සහිත භාණ්ඩාගාරිකතෙමේ සැදැහැඇත්තේ පහන්වූයේ සකස්කොට දන් දෙයි අයකැම්පුරුෂතෙමේද ජනපදවාසීන් සහිතවූ එකොළොස්නහුතයක් පුරුෂයන් හා සමඟ සකස්කොටම දන්දුන්නේය. ඔවුනතුරෙන් දනව්වැසි ඇතැම් මනුෂ්‍යයෝ ලොභයෙන් තලතලද සිත්ඇත්තෝ වූවාහු අසූ සාරදහසක් පමණ වූහ. ඔවුහු දුනයට අනතුරාය නොට දුන වසතුන් තමන්ද කැවාහුය දුදරුවන්ටද කැව්වාහුය බත්හල්ද

ගිනිලැව්වාහුය. ඔව්හු මෙසේ අපරාධ කොට නිරයෙහි උපන් නාහ. පිරිවර සහිත රජදරුවෝද භාණ්ඩාගාරිකයාද නියුක්තක පුරුෂයාද සුවගියෙහි උපන්නාහ. මෙසේ ඒ දෙසෙනඟ සගින් සගෙහිද නිරයෙන් නිරයෙහිද උපදිද්දී දෙයානුකපක් අතික්‍රාන්ත වූවාහුය. "ඔවුන්ගේ කම්කරුවෝ එකල එසින් මියගොස් ප්‍රේත විෂයෙහි ඉපිද සුගති දුගති වශයෙන් සසර සැරිසරන්නාහු දෙයානුකපක් ඉක්මවා මේ මහාභද්‍රකල්පයෙහි සතරබුඩානන්තර යක්ම ප්‍රෙතවිෂයෙහි ඉපිද හුන්නාහුය"යිද කියත්.

ඔවුහු මේ මහාභද්‍රකල්පයෙහි පළමුකොටම ලොවැ පහළවූ හතළිස් දහසක් ආයුඇති **කකුසඳ** නම් බුදුරජතුමාණන්වෙත එළඹැ 'අපට අහර ලැබෙන කාලය කවරේදැ'යි විචාළාහුය. "තොපට මාගේ කාලයෙහි අහර නොලැබෙයි මාගෙන් පසු දහසක් හවුරුද්දට අඟලක් වැඩෙන මහපොළොව යොදුනක් වැඩුනුකල **කොණාගමන** නම් බුදුකෙනෙක් ලොවැ පහළවන්නේය ඔබඅතින් විචාරව්ය"යි වදාළේය. ඔවුහු එතාක්කල් එහි සිට උන්වහන්සේ උපන්කල වෙතඑළඹැ විචාළාහුය. ඒ බුදුරජතෙමේද "මාගේ කාලයෙහි තෙපි අහර නොලබන්නාහුය මාගෙන් පසු පොළොව යොදුනක් වැඩුනුකල **කාශ්‍යප** නම් බුදුකෙනෙක් ලොවැ පහළවන්නේය ඔබඅතින් විචාරව්ය"යි වදාළසේක. ඉක්බිති කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොවැ පහළවූකලැ ලොබින් මඩනලද සිත්ඇති ජනයෝ ප්‍රෙතවිෂයෙහි උපන්නාහුය එකල මනුෂ්‍යයෝ තමතමන්ගේ ඤාතිප්‍රෙතයන් පිණිස දන්දී 'අපගේ ඤාතීප්‍රෙතයන්ට පැමිණේවා'යි කියත් එසින් ඒ ඤාතිප්‍රෙතයෝ සම්පත් ලබත්. එකල මේ ප්‍රෙතයෝ ඒ දැක 'කිමෙක සඛාමිනි! අපිත් මෙබදු දේ ලබමුදැ?"යි කසුප්බුදුරජාණන් වහන්සේඅතින් විචාළාහුය. "දැන් නොලබන්නහුය මාගෙන් පසු පොළොව යොදුනක් වැඩුනුකල **ගෞතම** නම් බුදුකෙනෙක් ලොවැ පහළවන්නේය එදා තොපගේ නැකෑනෙක් බිම්සර නම් රජෙක් වන්නේය ඒ රජතෙමේ ඒ බුදුන්ට දන්දී තොපට පින් පමුණුවන්නේය එකල බත්ලබන්නහුය"යි වදාළසේක. ඔව්හු බිම්සරරජු බලාපොරොත්තුවෙමින් එක්බුඩානන්තරයක් ඉක්මෙව්වාහුය. මේ බුඬොත්පාදයෙහි වනාහි පිරිවර සහිත ඒ රාජපුත්‍රයෝ තිදෙන දෙව්ලොවින් චුතවැ මගධරට බමුණු කුලෙකැ ඉපිද උරුවෙල්කසුප්ආදී තුන්බැදුළුල්ලෝවූහ. එකල භාණ්ඩාගාරිකතෙමේ මෙකල 'විශාඛ' නම් මහසිටුවීය එකල ඔහුගේ ඇඹැණිය වනාහි මෙකල 'ධම්මදින්නා' නම් සිටුදූ විය

නියුත්තකපුරුෂතෙමේ වනාහි මෙකල 'බිම්සර' රජ විය අනික් සියලු පිරිස රජුහට පිරිවරවූහ.

ඉක්බිති ශාස්තෘන්වහන්සේ සම්බුදුනාඟුනයට පැමිණ පිළිවෙළින් වැල්මිවන උයනට වැඩවදුරා එහි එදවසම වෙහට එළඹියාවූ එකොළොස් නහුතයක් බමුණුගැහැවියන් සහිතව බිම්සර රජු මුලපෙලෙහි පිහිටුවා රජු විසින් පවරණලද්දේ දෙවනදින රජගෙයි මහදන් පිළිගත්සේක. ඒ ප්‍රෙතයෝ එදින 'දැන් රජතෙමේ අපට දුනඟ උදෙසන්නේයයි හෙවත් දුනයෙහි පින් පමුණුවන්නේය'යි සිතා රජගෙය පිරිවරා සිටියාහුය. රජ්ජුරුවෝ දන්දී ශාස්තෘන්වහන්සේ කොතැන්හි වනාහි වැඩවාසය කෙරේදැයි ශාස්තෘන්වහන්සේට විහාරසථානයක්ම සිතමින් ඒ දුනය කිසිවෙක්හට නොමඋදෙසුයේය. ප්‍රෙතයෝ සුන්ආසාඇත්තෝවී රාත්‍රියෙහි රාජනිවෙසනයෙහි අතිශයින් භයානකවූ විකාරශබ්ද කළාහුය. රජ්ජුරුවෝ රැය පහන්වූ කල බුදුන්වෙත එළඹැ සවාමීනි! බුදුරජාණන් වහන්ස! මෙබදු ශබ්දයක් ඇසුයෙම් ඉන් කුමක් වන්නේදැ'යි විවාළේය. මහරජ! නොබව තට කිසි ඇවැඬක් නොවන්නේය"යි වදුරා ඒ කාරණය වදුළසේක. 'සවාමීනි! දැන් දුන්කල්හි ඔවුහු ලබත්ද? "එසේය මහරජ"යි වදුළසේක. රජ්ජුරුවෝ 'අද පිණිස ආරාධන කෙරෙමැ'යි ශාස්තෘන් වහන්සේ පවරා රජගෙට ගොස් දන් සදා කල් දැන්වූයේය. ශාස්තෘන්වහන්සේ භික්සඟන විසින් පිරිවරණලද්දේ රජගෙට වැඩ වැඩහුන්සේක. ඒ ප්‍රෙතයෝද 'අදවත් ලබන්නෙමු'යි සිතා පෙර නැගෙයක් බැවින් බිම්සරරජගෙදර සියගෙයය ඝන අදහසින් අවුත් ඉසිමසුරුපල අනුභවකරමින් ගෙපිටිකණුවල සිටගත්හ.

ඔවුනතුරෙන් සමහරෙක් දික්වූ හිසකේදළිරැවුලින් හා රලුවූ වක්වහැඹිරිගිය දතින්යුත් මුඛඇත්තාහු බුරුල්වූ සහි බඳින ඇතිබැවින් පැකිලෙන සුභාව ඇත්තාහු, වැහැරුනාවූ එරුඹවූ කළුවන් අඟපසඟ ඇත්තාහු ඒ ඒ තැන පිහිටි ලැව්ගින්නෙන් දැහැය තල් හිදි මඩු රැක් සමානදවූවාහුය. සමහරෙක් පිපාසයෙන් අලළනලද උදරයෙන් නැඟී මුවෙන් නික්මෙන්නාවූ හිනිදැලින් හාත්පසින් දවනලද ශරීරඇත්තෝ වූහ. සමහරෙක් මුදුනෙහි ඉතා කුඩා බොටුකුහර ඇතිබැවින් හා පළිතාකාර කුසඇතිබැවිනුත් ලැබුනාවූද පානභොජනයන් ඇතිනාක් අනුභවකරන්ට නොසමත් බැවින් සාපිපාසායෙන් අන්ධයක් නොවිඳින්නාහුය. සමහරෙක් ඔවුනොවුන්ගේ සඟ

අනික් සත්ත්වයන්ගේද පුපුරනලද ගඩපිළිකාමුඛ යන මෙතෙක් තැනින් ගලනලද ලේසැරවකොලසෙම්සොටුආදී යමක් ලැබ අමාවක් මෙන් රසවිදින්නෝ වූහ. යම්සේ ඒ සියල්ලෝම අතිශයින් නපුරු දුකුම්ඇති විකාර රූපඇති භයානක ශරීරඇත්තාහු රජුට පෙණෙද්ද ශාස්තෘන්වහන්සේ එසේම කළසේක. රජ්ජුරුවෝ දක්ෂිණෝදකය දෙන්නෝ 'මෙය අපගේ ඤාතීන්ට පැමිණේවා'සි උදෙසූහ. එකෙණෙහිම ඔවුන්ට පස්පියුමෙන් ගැව සීගත්තාවු පොකුණු පහළවූහ. ඔවුහු එහි සානාපාන කොට සංසිදුනු කායදරථ පිසාසා ඇත්තාහු රන්වන්ශරීර ඇත්තෝ වූහ. රජ්ජුරුවෝ කාදකැවිලිපෙවිලිබොජුන් ආදිය පිළිගන්වා උදෙසූහ එකෙණෙහිම ඔවුන්ට දිව්‍යමයවූ කාදකැවිලි පෙවිලිආදී බොජුන් පහළවූහ. ඔවුහු ඒ බොජුන් අනුභවකොට පිරීමෙන් පිණාගිය සිරුරුඇත්තෝවූහ. රජ්ජුරුවෝ වස්ත්‍ර සෙනාසන දී උදෙසූහ එකෙණෙහි ඔවුන්ට දිව්‍යමයවූ වස්ත්‍රයානා ප්‍රාසාදපසතුරුණුසයනාදී අලංකාරවිකෘතීනු පහළවූහ. ඔවුන්ගේ ඒ සියලුම සම්පත්තීහු යම්සේ ප්‍රකටවෙද්ද ශාස්තෘන්වහන්සේ එලෙස අධිෂ්ඨාන කළසේක. රජ්ජුරුවෝ ඒ දැක අතිශයින්ම සතුටුවූහ. ඉක්බිති ශාස්තෘන්වහන්සේ වළඳ අවසන්වූසේක් රජුහට අනුමොදනා කරනසේක් ප්‍රේතයන් අවුත් ඒ ඒ තන්හි සිටිනාබැව් දක්වමින් මේ පළමුවන ගය වදාළසේක,

"තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධිසිංඝාටකෙසු ච,
චාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං"ති.

එහි අදහස නම්:-සබකීය ඤාතිප්‍රේතයෝ පූජිඤාතීන්ගේ ගෘහයන්ටද තමන් විසින් සවාමිභාවයෙන් වාසස කරනලද ගෘහයන්ටද අපේ ගෙවල්ය යන අදහසින් අවුත් ගෘහපවුරුපිටිකණු ආදීන් සම්බන්ධිවූ පරභාගසථානයන්හිද හෙවත් පිටිපැත්තෙහිද සිවුමංසල තුන්මන්සල ගෘහසන්ධි භික්ඛතිසන්ධි ආලොකසන්ධි හෙවත් ගෙමුලු භික්ඛතිමුලු ජනෙල්මුලු යනාදී තන්හිද නගරවාර ගෘහවාරයන්සම්බන්ධිවූ දොරබා ඇසුරුකොටද හෙවත් තුවර දොරමුලු ගෙදොරමුලු යන මෙකිතැන් ආශ්‍රයකොටද සිටිනාහ යනුයි.

දැන් ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ, 'අපඋදෙසා අපගේ ඤාතීනු යම්කිසිවක් දෙන්නාහු නම් ඉතා මැනවැ'සි බලාපොරොත්තුවෙමින් හැසිරෙන්නාවූ ඤාතිප්‍රේතයන්ගේ ඤාතීන්ට බොහෝ ආහාරපානාදිය ඇතිකල්හිත් ඔවුන් විසින් කරනලද අතීතවූත්ත දුඃඛවිපාකඇති කම්මයාගේ හෙතුවෙන් ඒ ඤාතීන්ට

ඔවුන් සිහිවීම් පමණකුදු නොවනබැවි දක්වනසේක් දෙවන ගාථාව වදාළසේක,

"පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජෙජ උපට්ඨිතෙ,
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා".

එහි අදහසනම්:-අනුභවකටයුතුවූද පානයකටයුතුවූද කඩා කෑයුතුවූද ලෙව රසවිඳියයුතුවූද යන මේ ආදීවූ නානාවිධ ආහාරද්‍රව්‍යවිශෙෂයන් අනල්පවූවක් හෙවත් බෙහෙවක් පිළියෙල කොට ඇතිකල්හිත් ඒ ප්‍රෙතවිෂයෙහි උපන්නා වූ සත්වයන්ගේ මව හෝ පියා හෝ පුතෙකු හෝ ඔවුන් සිහිනොකරන්නේය. ඊට කාරණය කවරේද? තමන් විසින් කරතලද නොදීමය දෙන දන් වැළැක්වීමය යනාදී ප්‍රභෙදඇති මසුරුපාපකර්මය කාරණය වන්නේය. ඔවුන්ගේ ඒ පාපකර්මය වනාහි ඤාතීන්ට ඒ අවස්ථාවන්හි ඔවුන් සිහිකරන්නට අවකාශ නොදෙන්නේය. යනුයි.

දැන්, රජු විසින් ඤාතිප්‍රෙතයන් උදෙසා දෙනලද දානය පසස්නාසේක් තෙවනගාථාව වදාළසේක,

"එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා,
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජන"න්ති.

එහි අදහස නම්:-

මහරජ! තුඹවිසින් ඤාතිප්‍රෙතයන්ට දෙනලද්දේ යම්සේද එමෙන් ඤාතිප්‍රෙතයන් කෙරෙහි අනුකම්පා ඇත්තාවූ අනිකුදු මාතෘපිතෘපුත්‍රධීතෘ ආදීවූ යමෙක්තුමූ පිරිසිදුවූ මනොඥවූ ධාර්මිකවූ දානැමින් ලද්දාවූ උත්තමවූ ශ්‍රෙෂ්ඨවූ බොහෝවූ ආර්‍ය්‍ය යන්ට කැපසරුප්වූ දෙයධර්ම්මයතුන්, ඤාතිප්‍රෙතයන් සිවුමංසල තුන්මංසල ආදී තන්හි එළඹ සිටිකල්හි හෝ දක්ෂිණාර්හයන්ගේ පරිභොගයට යොදනලද කාලයෙහි හෝ මෙය අපගේ ඤාතීන්ට පැමිණේවායි පමුණුවා දෙන්නාහුය. ඒ ඉතා මැනව යනුයි.

දැන් භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ, යම් ආකාරයකින් දෙනලද්දේ ඔවුන්ට දෙනලද්දේ නම් වන්නේද ඒ ආකාරය දක්වනසේක් සිවුවන ගාථායෙහි පූර්ව්වාර්ධය වදාළසේක,

"ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො"

එහි අදහස නම්:-මේ දෙයධර්ම්මයතුව ප්‍රෙතවිෂයෙහි උපන් නාවූ අපගේ ඤාතිප්‍රෙතයන්ට පැමිණේවා ඤාතිප්‍රෙතයෝ මේ

සම්බන්ධඵලය අනුභවකරන්නාහු සුඛසුවපත්භාවයට පැමිණෙත්වා යන මේ ආකාරයෙන් දෙනලද්ද ඔවුන්ට දෙනලද් දේ නම් වන්නේය යනුයි.

දැන්, යම් හෙයකින් "ඉදං වො ඤාතීනං හොතු"යි කියනලද කල්හිදු අනිකෙකු විසින් කරනලද කර්මය අනිකෙක්හට ඵල දෙයි නොවේද එසේ පමුණුවා දෙනලද ඒ වස්තුව ඤාතිප්‍රේත යන්ගේ කුසලකර්මයට ප්‍රත්‍යය පමණක් වේද එසේ හෙයින් යම්සේ ඔවුන්ට එමවස්තුවෙහිම එකෙණෙහිම ඵලඋපදනාවූ කුස ලකර්මයක් වේද එය දක්වනසේක් සතරවන ගාථායෙහි පශ්චි මාඛ්‍ය හා පස්වන ගාථායෙහි පූර්‍වාඛ්‍යද වදාළසේක,

"තෙ ච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා.
පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ,

එහි අදහස නම්:—ඤාතීහු යම් තැනෙක්හි දන්දෙද්ද ඒ ඤාතිප්‍රේතයෝ "අපගේ මේ නැගෝ අපඋදෙසා දුනය පමුණු වන්නාහුය ඒ පිණිස අපි එක්ව ආවෝවමු"යි කියා හාත්පසින් රැස්ව ඒ බොහෝවූ දෙය ධර්මවස්තූන් උදෙසා දෙනුලබන කල් හි හෙවත් පමුණුවා දෙනුලබනකල්හි කර්මඵල අදහන්නාහු සිහිකිරීම තොරනොකරන්නාහු එකඟවූ සිත්ඇත්තාහු වී "අපගේ මේ දුනය අපට හිතසුවපිණිස වේවා"යි සතුටුවන් නාහුය ප්‍රීතිසොම්නස් ඇත්තෝ වන්නාහුය. එය එකෙණෙහි ඵලඋපදනා කුසලකර්මය වන්නේය යනුයි.

දැන් ඤාතීන් නිසා උපන් කුසලකර්මඵලය අනුභවකරන් නාවූ ඒ ඤාතිප්‍රේතයන්ගේ නැගෙන් ඇරැබෑ ප්‍රශංසා කරනාකාරය දක්වනසේක් පස්වන ගාථායෙහි පශ්චිමාඛ්‍ය හා සවන ගාථා යෙහි පූර්‍වාඛ්‍යද වදාළසේක,

චිරං ජීවතු නො ඤාතී යෙසං හෙතු ලභාමසෙ.
අම්හාකඤ්ච කතා පූජා දායකා ව අනිප්ඵලා,

එහි අදහස නම්:—යම් කෙනෙකුන් නිසා දැන් මෙකෙණෙ හිම අපි මෙබඳු සම්පත්තියක් ලද්දේ වමුද "ඉදං වො ඤාතීනං හොතු" කියා මෙසේ උදෙසන්නාවූ යම්බඳු දායකයන් විසින් අපටද පූජා කරනලද්දීද යම් චිත්තසන්තානයෙක්හි පරිත්‍යාග චෙතනාමයවූ යම්කිසි කුසලකර්මයකුත් උපන්නේද එය ඕහට එහිම ඵලදෙන හෙයින් ඒ දායකයෝත් නිෂ්ඵලවූවෝ වෙද්ද ර්ව කාරණාවූ අපගේ ඒ ඤාතීහු චිරජීවනය කෙරෙත්වා ඔවුන්ට ආයුබෝවේවා යනුයි.

දැන්, ප්‍රෙතවිෂයෙහි උපන්නවුන්ට එහි ගොවිකම් ගෙරිරැකීම් වෙණදැම් ආදීවූ සම්පත්පිළිලැබීමට කාරණාවූ වෙනයම් රැකිරක්ෂාආදියක් නැතිබවද මෙලොවින් පමුණුවනලද්දකින්ම එහි යැපෙනබවද දක්වනසේක් සවහගාථායෙහි පශ්චිමාර්ධය සමඟ සත්වනගාථාව වදාළසේක,

"න හි තත්‍ථ කසී අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති.
වණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤේන කයාක්කයං,
ඉතෝ දින්නෙන යාපෙන්ති පෙතාකාලඛතාතහි"නති.

එහි අදහස නම්:-මහරජ! ඒ ප්‍රෙතවිෂයෙහි ජීවිතයාපනය පිණිස සිසැම් ගොවිතැන්බත් කිරිමාදියකුත් නැත ගවයන් රැක පස්ගෝරස ගෙන විකුට ජීවත්වීම් සංඛ්‍යාත ගෙරිරැකීම කුත් ඇද්ද එබදු ගවරක්ෂාවකුත් මේ ප්‍රෙතවිෂයෙහි නොමඇත්තේය. යම් වෙණදැමක් නිසා මනුෂ්‍යයෝ සම්පත් පිළිලබන්නාහුද එබදුවූ වෙණදැමකුත් ඒ ප්‍රෙතවිෂයෙහි නොමඇත්තේය. යම් ගනුදෙනුවකින් සම්පත් පිළිලැබීමක් ඇද්ද එබදුවූ කඹ වණ්ඩ ගනුදෙනුවකුත් ඒ ප්‍රෙතවිෂයෙහි නොමඇත්තේය. ඒ ප්‍රෙතවිෂයෙහි ප්‍රෙතයෝ මෙයින් ඤාතිමිත්‍ර මනුෂ්‍යාදී යම් කිසිවෙකුන් විසින් පමුණුවන ලද්දකින්ම ආහාරභාවය පවත්නේය යනුයි.

දැන්, භාග්‍යවතුන්වහන්සේ පූර්ණෝකතාර්‍යයම ප්‍රකාශකරන සේක් මෙම ගාථාවය වදාළසේක,

"උන්නතෙ උදකං වුට්ඨං යථා නින්නං පවත්තති,
එවමෙව ඉතෝ දින්නං පෙතානං උපකප්පති.
යථා වාරිවහා පුරා පරිපූරෙන්ති සාගරං,
එවමෙව ඉතෝ දින්නං පෙතානං උපකප්පතී"ති.

එහි අදහස නම්:-උන්නතප්‍රදේශයෙහි හෙවත් උස්වූ භූමිභාගයෙහි වර්‍ෂාකරනලද ජලය ක්‍රමක්‍රමයෙන් පහත් භූමිභාගය කරා පැමිණෙද එපරිද්දෙන් මේ මනුෂ්‍යලොකයෙහි මවුපිය ඤාතිමිත්‍රපුත්‍රකලත්‍රාදීන් විසින් දෙනලද්ද මෙලොවින් ප්‍රෙතවිෂයට පැමිණි ඤාතිප්‍රෙතයන්ට ඵලෝතපත්තිය පිණිස යෙදෙන්නේය.

මහගඟාවෝතුමූ වර්‍ෂාව නිසා කඳුරැලිඇලදෙලකුඹාවළමඟවළ ආදින් කෙරෙන් ගලාබසින ජලයෙන් පිරුනාහු යම්සේ සාගරය පුරවද්ද එපරිද්දෙන් මේ මනුෂ්‍යලොකයෙහි ඤාතිමිත්‍රාදීන් විසින් දෙනලදදානය මෙලොවින් ප්‍රෙතවිෂයට පැමිණි ඤාතිප්‍රෙතියන්ගේ ඵලපූරණත්වය පිණිස යෙදෙන්නේය යනුයි.

යම්හේකින් ඒ ඤාතිප්‍රෙතයෝ මෙයින් යම්කිසිවක් ලබමු යයි ආසාවෙන් මඩනාලද්දහු ඤාතිගෘහයන්ට පැමිණත් මෙනම් දෙය අපට දෙවියයි ඉල්වන්නට නොහැක්කෝ වේද්ද එසේ හෙයින් ඔවුන්ට මේ අනුස්සරණවස්තූන් සිහිකරන්නාවූ කුල පුත්‍රතෙමේ දක්ෂිණාව දෙන්නේයයි දක්වනසේක් මේ දසවන ගාථාව වදාළසේක,

"අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණං දජ්ජා පුබ්බෙ කතමනුස්සරං"ති.

එහි අදහස නම්:—මෙනම් ධනයක් හෝ ධාන්‍යයක් හෝ දුන්නෙහියයිද මෙනම්වූ යම්කිසි උපකාරයක් කෙළේයයිද අසවලා මාගේ මවුපසින් හෝ පියපසින් හෝ සම්බන්ධබැවින් ඤාතිසෙනහවශයෙන් රැකගැන්මට සමර්ථ බැවින් මිත්‍රයයිද අසවලා වැලිකෙළිනාඝාලපවන් මාගේ ශඝලුවායයිද යන මේ සියලුම පෙරකරනලද දෙය සිහිකරන්නාවූ කුලපුත්‍රතෙමේ ප්‍රෙතයන්ට දන්දෙන්නේය හෙවත් දානඵලය ලැබියහැක්කෘත් කොට පමුණුවා දෙන්නේය යනුයි.

යම්බඳු සත්‍වයෝ වනාහි ඤාතීන්ගේ මරණයෙන් හැඬීම් ශොකකිරීම්ආදිය පිහිටකොට ඇත්තෝවී සිටින්නාහුය, ඔවුන් පිණිස බත්සැඳකුත් නොදෙන්නාහුය ඔවුන්ගේ ඒ ඇඬීම් ශොකකිරීම්ආදිය තමන්ගේ ශරීරකල්‍යාණභාවයට පමණක් කාරණාවත්මුත් එය ප්‍රෙතයින්ට කිසිම අර්ථසිද්ධියක් නොකරන්නේයයි දක්වා වදාරනසේක් එකොළොස්වන ගාථාව වදාළසේක.

"න හි රුණ්ණං ව සොකො වා යාවඤ්ඤ පරිදෙවනා,
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයොති"ති.

එහි අදහස නම්:—ඤාතීන්ගේ මරණය ඇතිකල හැඬීම හෙවත් කඳුළු වැගිරවීම හෝ ශොකයක් හෙවත් චිත්තසන්තාපයක් හෝ නොකටයුත්තේය මෙයින් අන්‍යවූ ඤාතිව්‍යසනයන් ගෙන් සපශීකාරනලද්දහුගේ විලාපයක් හෙවත් "අනේ මාගේ එකම පුතු කොයිදෝ හෝ"යි යනාදී වශයෙන් කියන විලාපයක් හෝ නොකටයුත්තේය, කුමක් හෙයින්දයත් යම්හේකින් ඒ හැඬීමාදි සියලුම කළුරියකළ තැනැත්තහුට කිසිම උපකාරයක් පිණිස නොවේද එහෙයින් ඒ ඇඬීමාදීහු නොකටයුත්තාහුමය. එසේදවුවත් අඥාන ඤාතීහු එසේ ඇඬීමාදිය පිහිට කොට ඇත්තෝම වී සිටින්නාහුය යනුයි.

මෙසේ ඇඹිමාදීන්ගේ නිරර්ථකභාවය දක්වා දැන්, රජු විසින් දෙනලද දක්ෂිණාවගේ සාර්ථකභාවය දක්වනසේක් දෙළොස්වන ගාථාව වදාළසේක,

"අයඤ්ච ඛො දක්ඛිණාදින්නා සඞ්ඝමහි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පතී"ති.

එහි අදහස නම්:—මහරජ! යම්හේකින් හැඹිම් සොවිම් ආදිය ප්‍රේතයන්ට කිසිම අර්ථසිද්ධියක් පිණිස නොවන්නේද මෙය එසේ නොවෙයි මහරජ! නුඹ විසින් අද නුඹගේ ඤාති ප්‍රේතසමූහයා උදෙසා දක්ෂිණාවක් දෙනලද්දීද ඒ මේ දක්ෂිණා තොමෝ, යම්හේකින් සංඝතෙමේ ලොකයාහට නිරුත්තර පින්සොතක් වීද එසේ හෙයින් ඒ ප්‍රේතයන්ට දීඝකාලයක් මුළුල්ලෙහි හිතසැප පිණිස මනාකොට පිහිටියාය, එකෙණෙහිම සම්පත්තිප්‍රතිලාභය පිණිස වීය බුබ්පිපාසිකපරදත්තූපජීවිනිජඣා මතණ්ඩිකාදී භෙදභින්නසථානයන්හි එකෙණෙහිම පැමිණෙන් නේය යනුයි.

දැන් ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ, මේතාක් විද්‍යමානවූ ගුණයන් කරණකොටගෙන රජුහට පසස්නාසේක් අවසාන ගාථාව වදාළසේක,

"සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතානං පූජා ච කතා උළාරා
බලඤ්ච භික්ඛූනමනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පක"න්ති.

එහි අදහස නම්:—"ඤාති ධම්ම නම් ඤාතීන් විසින් ඤාතීන්ට කටයුතුදෙය කිරීමයි තොපවිසිනුදු මෙසේම හෙවත් මාමෙන්ම ඤාතීන්ට ඤාතීන් විසින් කටයුතුදෙය කිරීම් වශයෙන් ඤාති ධම්ම පිරවියයුත්තේය නිරර්ථකවූ හැඹිම් සොවිම් ආදියෙන් ආත්මපරිතාපනය නොකටයුත්තේය" යන මෙය මහරජ! මෙසේ ඤාතීන්ට මේ දක්ෂිණාව දෙන්නාවූ නුඹ විසින් මේ දක්ෂිණාව දීමකරණකොටගෙන බොහෝජනයාට දක්වනලද්දේය ප්‍රකටකරනලද්දේය.

තවද ඔවුන් දිවසැපතට පමුණුවන්නාවූ නුඹ විසින් ඒ ප්‍රේතයන්ට පිරුනාවූ සම්‍යඤ්ඤවූ බොහෝවූ පූජාද කරනලද්දහ නොහොත් දිවසැපතට පැමිණවීම කරණකොටගෙන බොහෝ පූජාද කරනලද්දහ.

තවද බුදුපාමොක්සහන ආහාරපානාදියෙන් සන්තර්පණය කරන්නාවූ නුඹ විසින් භික්ෂූන්ට කායබලයද දෙනලද්දේය නොහොත් ආහාරපානාදියෙන් සන්තර්පණය කරවීම කරණ කොට ගෙන කායබලයද දෙනලද්දේය.

තවද අනුකම්පාදිගුණයන් පිරිවරකොට ඇති පරිත්‍යාගවෙතනාව උපදවන්නාවූ නුඹවිසින් අතලපවූ පුණ්‍යධර්මයක් රැස්කරනලද්දේය යනුයි.

මේ ගාථායෙන් මේ ධර්මදේශනාව නිමවා වදාළසේක. දේශනාවසානයෙහි ප්‍රේතවිෂයොත්පත්තියෙහි ආදීනවසන්දර්ශනයෙන් කලකිරුනාවූ යොනිසොමනසිකාරයෙන් ව්‍යායාම කරන්නාවූ අසූසාරදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමයවීය. දෙවනදින පටන් සත්වනදිනය වනතාක් දෙවිමිනිසුන්ට මෙම තිරෝකුඩ්ඩසූත්‍රය දේශනාකරවදාළසේක. ධර්මාභිසමයද එලෙසමවීය.

මෙසේ මේ තෙළෙස්ගාථාවෝ **ප්‍රේතවස්තුවෙහි තිරෝකුඩ්ඩප්‍රේතවස්තූනාමයෙන්ද බුදුඇසපාඨයෙහි තිරෝකුඩ්ඩසූත්‍ර** නාමයෙන්ද සංග්‍රහ කරනලද්දාහ.

තිරෝකුඩ්ඩසූත්‍රයයි.

මෙසේ මේ බුදුඇසපාඨයෙහිම **සිගාලසූත්‍රයෙහිද** කියනලද්දේය පින් කැමැත්තහු විසින් වනාහි නැගෝ හෝ වෙත්වා නොනැගෝ හෝ වෙත්වා යම් ඒ කවුරුන් නමුත් උදෙසා දන් දියයුත්තේ මය.

අනේපිඬුමහසිටුහුගේ ධීතෘවගේ දියනියක්වූ දාරිකාවක්හට කිරිමවුතොමෝ පිටිවහීයකින් ලමාරුවක් නෙවත් බෝනික්කෙක් හඬා මෙය ගෙන ක්‍රීඩාකරවයි කියා දුන්නීය. ඉක්බිති එක් දිනක් එය ගෙන කෙළනියඅතින් යම්කිසි ප්‍රමාදයකින් එය බිමවැටී බිඳින. ලැදරී තොමෝ මාගේ දුව මලායයි කියා හඬන්ට වන්නීය. එමගෙහි එදින එමවෙලාගෙහි ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ වැඩහුන්සේක්වීය. එකල සිටුතෙමේද ශාස්තෘන්වහන්සේ සමීපයෙහි හුන්නේය හඬන්නාවූ ලැදරිය සිටුවෙත ගෙනැවිත් එම කාරණය කීයේය. සිටුතෙමේද ඇය ඇතගෙහි හිඳුවා නුඹගේ දුව උදෙසා දනක් දෙමුයයි කියා පරක්කොට ඒ කාරණය ශාස්තෘන්වහන්සේට සැල

කොට සාමිනි භාග්‍යවතුන්වහන්ස! මාගේ මිනිපිරියගේ පිටත් නිතලිකාව හෙවත් පිටිබෝනික්කා උදෙසා දන්දෙනුකැමැත්තෙම් නුඹවහන්සේ පන්සියයක් භික්ෂූන්වහන්සේලා සමග සෙට අපගේ භික්ෂාව ඉවසා වදාළමැනවැ'යි ආරාධනා කෙළේය. ශාස්තෘන්වහන්සේ ඉවසාවදාරා දෙවනදින එහි වැඩමවා බත් කිස කොට අනුමෙවෙනි කරනසේක්,

"යං කිඤ්චාරම්මණං කත්වා දජ්ජා දානං අමච්ඡරී,
පුබ්බපෙතෙ ච ආරබ්භ අථවා වත්ථුදෙවතා.

චත්තාරෝ ච මහාරාජේ ලොකපාලෙ යසස්සිනෝ,
කුවෙරං ධතරට්ඨං ච විරූපක්ඛං විරුළ්හකං,
තෙවෙව පූජිතා හොන්ති දායකා ච අනිප්ඵලා.

නහිරුණ්ණං ව සොකෝ වා යාචඤ්ඤා පරිදෙවනා,
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයෝ.

අයඤ්ච ඛො දක්ඛිණා දින්නා සඞ්ඝම්හි සුපතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසෝ උපකප්පතී"ති.

යන මේ ගාථාවන් වදාළසේක,

එහි අදහසනම්:-තමන්ගේ සම්පත්තිය අනුන් හා සාධාරණ භාවය නොමඉවසීම ලක්ෂණකොටඇති මසුරුබව නැතිබැවින් අමච්ඡරීනම්වූ නොමසුරු පුද්ගලතෙමෙ එනම් පරිභොගසීලී පුද්ගල තෙමෙ මසුරුබවය ලොභාදිඅසි කියනලද චිත්තමලයන් දුරුකොට මඞ්ගලාදී කරුණු අතුරෙන් යම් කිසිවක් උදෙසා දන්දෙන්නේය එසේම මිය පරලොව ගියෙක් ඇරැබ හෝ ගෘහ වසතු ආදීන්හි අධිගෘහීතවූ දෙවියෙක් ඇරැබැ හෝ මෙසින් අනික් දිව්‍යමනුෂ්‍යාදීන් අතුරෙන් යම් කිසිවෙක් ඇරැබ හෝ දන් දෙන්නේය එනම් යසස් ඇත්තාවූ ලොකපාලක ධතරාෂ්ට්‍රාදී සතරවරම් දෙවිරජුන් අතුරෙන් යම්කිසි දෙවිකෙනෙක් ඇරැබැ හෝ දන් දෙන්නේය. ඒ දෙවියෝ පූජිප්‍රෙතවසතුදෙවතා උද්දිසන ක්‍රියාවෙන් බුහුමන්කරන ලද්දේ වෙත්. එසේ දන්දෙන්නාවූ ඒ දායකයෝ අනුන්උදෙසූ පමණින් නිෂ්ඵලනොවන්නාහ තමන්ගේ දානඵලයට සවාමීහුම වන්නාහ. "න හි රුණ්ණං ව" යනාදී ගාථාවයෙහි අදහස යටකී තිරොකුඩ්ඩසූත්‍රයෙහි කී නයින් දතයුත්තේය. මෙසේ ප්‍රෙතයන් උදෙසා දුන්කල්හි ප්‍රෙතයෝද අනුමොදන් වන්නාහුය. ඔවුහු එකෙණෙහි ඒ සම්බන්ධ ඵලයෙන් ඒ ප්‍රෙතාත්මභාවයෙන් මිදෙන්නාහුය, යනුයි.

මෙසේ ශාස්තෘන්වහන්සේ ධර්මදෙසනා කොට මහාජනයා ප්‍රේතයන් උදෙසා හෙවත් පරලොවැ ගියවුන් උදෙසා දන්දී මෙහි ඇලුනුයිත් ඇත්තවුන් කොට හුනස්නෙන් නැගිට වැඩි සේක.

දෙවනදිනෙහි සිටුභාර්‍යාව හා අවශෙෂ ඤාතීහුද සිටාණන් අනුව පවත්නාහු මසක් පමණ මහදන් පැවැත්වූවාහුය. ශාස්තෘන් වහන්සේ පසෙනදි කොසොල්රජු විසින් "සාමිනි භාග්‍යවතුන්වහන්ස! මාසයක් පමණ කලක් මාගේ ගෘහයට නොවැඩියේ ඇයිදැයි විචාරනලද්දේ එ කාරණය වදළසේක. එකල රජුද සිටුඅනුවපවත්වන්නාහු මාසයක් පමණ මහදන් දුන්හ. නුවරවැසියෝද ඔහුඅනුව පවත්වන්නාහු මාසයක් පමණ මහදන්දුන්නාහ. මෙසේ තෙමසක් පමණ පිටිබෝනික්කා මුල්කොට මහදන් පැවැත්වූවාහුය.

පිණ්ඩිනලිඛ ප්‍රේතවත්ථුවසි.

මෙසේ ප්‍රේතයන්ගේද අනුමොදනාවෙතනාතොමෝ එකෙණෙහි ඵලදෙන්නීමය මිනිසුන්ගේ වූකලි කියනුම කවරීද. එබැවින් කරුණෙහිලා මෙම කථාවස්තුහු නිදසුන් වන්නාහුය.

කස්සප්බුදුසෙමෙහි වනාහි එක්තරා සොවාන් පෙලපත් උවසුවෙක්තෙමෙ කරනැවැම් කෙළෙඹියෙක් සමඟ නැව්නැඟ යන්නේ සත්වනදිනෙහි මුහුදමැද නැව බුන්නේය. ඒ දෙදෙනම එකපුවරුකඩෙක්හි හොත්තේ එක්දිවසිනකට පැමිණියාහ. ඔවුනතුරෙන් කරනැවැම්තෙමෙ පක්ෂීන් මරා ගින්නේ පිසකන්නේ උපාසකයාහටද දෙසි උපාසකතෙමෙ මට කම්නැතැසි කියා නොකා මෙම සථානයෙහි මට තිසරණහැර අන්පිහිටක් නැත්තේයසි සිතුයේය. මෙසේ තුණුරුවන්ගුණ සිහිකරන්නාවූ ඔහුට එමළුපයෙහි උපන්නාවූ නාරජෙක්තෙමෙ තමන්ගේ ශරීරය සත්රුවනින්පිරූ මහානැවක්කොට මැවූයේය. සමුද්දදෙවතාවෝ නියාමකයෝ ඒ හෙවත් නැවපදවන්නෝ ඒ නැවෙහි සිට "දඹදිවයන්නෝ ඇද්ද දඹදිවයන්නෝ ඇද්ද?"සි ඝොෂාකරා හුය. උපාසකතෙමෙ අපි යන්නෙමුසි කියා එම නැව්ට නගුවසි කීකල්හි නැවිටනැගී කරනැවැම්යා කැඳවීය. එකල දෙවතා තොමෝ මෙහු ශීලගුණාවාරනැත්තෙක එහෙයින් මොහු මේ නැවට නගින්නට නුසුදුස්සෙක නොනගුවසි කීය. එකල

උපාසක තෙමේ "එසේ වේවා මම මවිසින් දෙනලද දන්යෙන්ද රක්නාලද සීලයෙන්ද වඩනලද භාවනාවෙන්ද මෝහට පින් දෙමි කරනැවැමිය! අනුමෝදන් වෙව"යි කීය. හෙතෙමේත් ඒ පින් අනුමෝදන් වෙමියි කීය. එකල දෙවතාතොමෝ සතුටුව ඔවුන් නැවෙහි පිහිටුවා ඒ නැව බරණැස කරා පමුණුවා ඔවුන් දෙදෙනාගේම ගෘහයන්හි බොහෝ වසතු පිහිටුවා සිය විමනට ගියාය.

පුණ්‍යානුමෝදනාතොමෝ මිනිසුන්ට පවා එකෙණෙහි ඵල දෙයි භාවය දැක්වීම පිණිස ගෙනහැරපානලද **දුකනිපානයෙහි සියුවනවගැ ශීලානිසංසජාතකවර්ණනායෙහි උපාසකවසනුව** මෙසේ සැකැවින් දක්වා නිමවන ලද්දේය.

අතීතයෙහි බරණැස්නුවර 'මොළිනී' නම් විය. එසඳ පුරන ලද බොධිසම්භාරඇති අපමහබෝසතාණන්වහන්සේ එම මෝළිනී නුවර 'සංඛ' නම් බ්‍රාහ්මණයෙක් වී වෙණදම් පිණිස නැව්නැඟ යනුකැමතිව යන්නේ අතරමගැ සැඩඅව්සුළඟෙහි ගිනිඅහුරු වැනිවූ එක් වාලුකාකාන්තාරයක් මැඩ එන්නාවූ පසේබුදුවරයන් වහන්සේ නමක් දැක මට පින්කෙතක් පැමිණෙනැලදැයි සතුටුසින් ඇත්තේ ස්වාමීනි! මේ වහන්නැඟ මේ සත ඉසලා වඩිනු මැනවැයි කියාඡත්‍රය ගා වහන්සඟළදී තොටගොස් නැව්නැඟ යන්නේ සත්වදින නැව බුන්නේය. මහබෝසතාණන් වහන්සේ එක් උපස්ථායිකා පුරුෂයෙකු සමඟ මුළුසිරුර තෙළින් මඟා ගිතෙල් සමඟ ඇතිතැක් සකුරු සුණුකා ඔහුටද කවා ඔහු සමඟ නැව්කුඹයවමුදුනට නැගීසිට ඉස්බක්පමණ තැන ඉදිරියට පැන මුහුද තරණය කරන්නට වන්නේය. ඔවුන් එසේ සත් දවසක් මුළුල්ලෙහි පිහිතනකලීහි මුහුද අරක්ගත් මිණිමෙවුල් නම් දෙවිදූ තොමෝ බෝසතාණන් ගොඩනඟනු කැමැත්නි සත් රුවනින් පුරවනලද රත්නමයවූ නැවක් මවා ඔහු නඟා නැවෙහි පිහිටුවා උපස්ථායිකයාදෙස නොබැලීය. මහබෝසතාණන් වහන්සේ තමන් විසින් කරනලද කුසලයෙන් ඔහට පින් අනුමෝදන් කරවූයේය. හෙතෙමේද අනුමෝදන්විය. එකල දෙවතාතොමෝ ඔහුද නැවෙහි පිහිටුවා ඒ නැව මෝළිනී නුවර දෙසට පමුණුවා බෝසතාණන්වහන්සේගේ ගෙයි බොහෝ වසතු පිහිටුවා සැකියවිමාණයට ගියාය. **මෙය දසනිපාතයෙහි සංඛබ්‍රාහ්මණ ජාතකවර්ණනායෙහි කියනලද්දේය.**

එසේහෙයින් ඒ පත්තිදානමය පුණ්‍යක්‍රියාව රැස්කරන්නා වූද අනුන්ගේ පත්තානුමොදනාමයවූ පුණ්‍යක්‍රියාව රැස්කරන්නාවූද කුලපුත්‍රයා විසින් පරලොව ගියවුන් උදෙසා දන් දිය යුත්තෝමය. තමන් යම්කිසි පුණ්‍යධර්මයක් කොට හෝ 'තිලොක විජයී'නම් සක්විතිරජු විසින් මෙන් සවභාවයෙන්ම අනුන්ට පින් දියයුත්තේමය...ඒ සක්විතිරජතෙමේ වනාහි තමා විසින් කරනලද පුණ්‍යසම්පත්තිය සමාදන්කරවන්නේ බුඩාපාදාන යෙහි මේ සතරගාථාවන් කීයේය,

"යං කිඤ්චි කුසලං කම්මං කත්තබ්බං කිරියං මම,
කායෙන වාචා මනසා තිදසෙසු ගතං කතං.
යෙ සත්තා සඤ්ඤිනෝ අත්ථි යෙ ච සත්තා අසඤ්ඤිනෝ,
කතං පුඤ්ඤඵලං මයහං සබ්බෙ භාගී භවන්තු තෙ.
යෙතං කතං සුවිදිතං දින්නං පුඤ්ඤඵලං මයා,
යෙ ච තත්ථ න ජානන්ති දෙවා ගන්ත්වා නිවෙදයුං.
සබ්බෙ ලොකම්හි යෙ සත්තා ජීවන්ත්‍යාහාරහෙතුනා,
මනුඤ්ඤං භොජනං සබ්බෙ ලභන්තු මම වෙතසා"ති.

එහි අදහස නම්:-තව්තිසාභවනයෙහි උපපත්තියට යොග්‍යවූ කුසලකර්මසංඛ්‍යාතවූ යම්කිසි ක්‍රියාවක් කායාදී වාරත්‍රයෙන් කටයුතුද ඒ සියලුලම මවිසින් කරනලද්දේය...හෙතෙමේ වනාහි තිලොකවිජය රාජාතම්භාවයෙන් චුතවැ තව්තිසාභවනයෙහි උපදින්නේය එසේහෙයින්ම මෙය කියනලද්දේය...

මිනිස්යයි කියා හෝ දෙවියයි කියා හෝ බ්‍රහ්මයයි කියා හෝ සඤ්ඤිසත්වයෝ හෙවත් නාමව්‍යවහාරඇති යම්බඳු සත්වයෝ වෙද්ද එසේම සඤ්ඤාවිරහිතවූ අසඤ්ඤසත්වවූ යම්බඳු සත්වයෝත් ඇද්ද ඒ සියලුම සත්වයෝ මවිසින් කරනලද පුණ්‍යඵලයට හිමිකාරයෝ වෙත්වා ඒ සියලුම පින්වත්හු ඒ පුණ්‍යධර්මය අනුභව කෙරෙත්වා...

යම්බඳු සත්වයන් විසින්, මවිසින් කරනලද කුසලය ප්‍රකටව දන්නාලද්දේවේද ඔවුන් විසින්ද මවිසින් දෙනලද ඒ පුණ්‍ය ඵලය හිමිවී අනුභව කෙරෙත්වා ඔවුනතුරෙන් යම්බඳු සත්වයෝ වනාහි මවිසින් කරනලද ඒ කුසලය නොමදද්ද එබදුවූ ඔවුන් වෙත අසවල්තැනැත්තෝ මෙනම් පිනක් කොට තොපට පින් දුන්නේය'යි දෙවියෝ පැමිණ ඔවුන්ට දන්වන්නාහුනම් ඔවුහුද ලොකයෙහි යම්බඳු සත්වයෝ ආහාරහෙතුවෙන් ජීවත්වෙත්නම්

ඒ සත්ත්වයෝද යන ඒ සිඟල්ලෝම මාගේ විසිතුරුවූ ප්‍රණ්‍යඃඍී යෙන් මනොඥවූ භොජනයන් ලබත්වා යනුයි.....

අපදානවණ්ණනානයයි.

මෙසේ සිඟාලසූත්‍රයෙහි කළුරියකාළාවූ මවුපියන් උදෙසා දක්ෂිණාඃඍියන්ට දියයුතු දානය කියනලද්දේය. ඔවුන්ට බලිකර්ම වශයෙන් දියයුතුදානය පිළිබඳව කිසිවක් නොකියනලද්දේය..... කළුරියකළවුන්ට වනාහි බලිකර්මද කරන්නට වටනේය. එසේ හෙයින් භාග්‍යවතුන් වහන්සේ අනේපිඬුමහසිටුහට අවවාද කරනසේක් **පංචඞ්ගුත්තරයෙහි ආදියසූත්‍රයෙහි** මෙසේ වදාළ සේක,

"හුත්වා භොගා හතා භවිත්වා විනිඞ්ගණා ආපදාසු මෙ,
උඞ්ගහා දක්ඛිණා දින්නා අථෝ පඤ්චබලී කතා.

උපඨිතා සීලවන්තෝ සඤ්ඤතා බ්‍රහ්මචාරයෝ,
යදාඣං භොගං ඉච්ඡේය්‍ය පණ්ඩිතෝ ඝරමාවසං,
සෝ අත්ථෝ මෙ අනුප්පත්තෝ කතං අනනුතාපියං.

එතං අනුස්සරං මච්චෝ අරියධම්මේ ඨිතෝ නරෝ,
ඉධවේව නං පසංසන්ති පෙච්චසඃඝා පමෝදතී"ති.

එහි අදහස නම් මව්සින් භොගසම්පත්තීහු පරිභොගකරන ලද්දාහ මාතෘපිතෘපුත්‍රකලත්‍රදාසිදාස්කම්කරුසංඛ්‍යාතවූද මිත්‍ර ඥාතිඅමාත්‍යසංඛ්‍යාතවූද භරණය කටයුතු පුද්ගලයෝ මව්සින් භරණය පොෂණය කරනලද්දාහ. ගිනිජලරජසොරසතුරු ආදීන් නෙරෙන් උපන්නාවූ උපද්‍රවයෝ ගිනිනිවීමාදිය පිණිස වසතු පරිත්‍යාගකරමින් භොගයන්කරණකොටගෙනම ඔවුන්ගේ මාගීයෝ ආවරණය කරනලද්දාහ. ෂට්විධකාමසවගීඃඛ්‍යාතවූ මනුමනුහුම්න්හි ඵලදානවශයෙන් ඌඞ්වගාමිවූ කර්මඵලඇති දක්ෂිණාවෝ මව්සින් භොගයන් කරණකොටගෙනම දෙන ලද්දාහ සතුබලිආදීවූ පස්වැදෑරුම්වූ බලීහුද මව්සින් භොගයන් කරණකොටගෙනම කරනලද්දාහ.....

එහෙයින් චතුක්කඞ්ගුත්තරයෙහි පත්තකම්මවගීයෙහි "ගෘහපතිය! නැවතද අනිකක් කියම් ආර්‍යශ්‍රාවකතෙමේ උළාන සංඛ්‍යාත වීර්‍යයෙන් ලබනලද්දාවූ බාහුබලයෙන් රැස්කරනලද්දාවූ හෙවත් වර්ධනය කරනලද්දාවූ ඔහුගේ ව්‍යායාම් යෙදීමෙන්

රැස්කරනලද්දුවූ ධර්මයෙන් යුක්තවූ දසකුසලකර්මය පුරා ලබන ලද්දුවූ භොගයන් කරණකොටගෙන බලිපසක් කරන්නේ වෙයි. ඒ පංචබලීහු කවරහුද? නැයින්ට කටයුතුවූ හෙයින් ඤාතිබලිය, ආගන්තුකයන්ට කටයුතුවූ හෙයින් ආගන්තුකබලිය, පරලොවගිය ඤාතීන්ට කටයුතු හෙයින් පුබ්බපෙතබලිය, රජුන්ට කටයුතු හෙයින් රාජබලිය, දෙවියන්ට කටයුතු හෙයින් දෙවතාබලිය යන මොහුයි. මේ සියල්ලෝම ඒ ඒ අයට සුදුසු පරිද්දෙන් දියයුතු දෑනයට නම් වන්නාහ යනු **එහි වණ්ණනායෙහි** කියනලද්දේය.

කායාදී සංයතඇත්තාවූ බඹසරඇත්තාවූ සිල්වත්හු මවිසින් භොගයන් කරණකොටගෙනම උපස්ථාන කරනලද්දාහ. ගෘහවාසීවූ පණ්ඩිතපුරුෂයෙක් තෙමේ, තෙමේ අනුභවකිරීමාදිවූ යම් ප්‍රයෝජනයක් සඳහා භොගසම්පත් කැමතිවන්නේද ඒ ප්‍රයොජනය මවිසින් ලබනලද්දේය. ඒ අර්ථය කිරීම හෙයින් අනුතාපරහිතවූ හෙවත් පසුතැවිලිනොවියයුතුවූ කර්මය මවිසින් කොට නිමවනලද්දේය.

"මවිසින් භොගසම්පත් පරිභොගකරනලද්දාහ" යනාදීවූ මේ අර්ථය සිහිකරන්නාවූ භවාන්තරගතවූවාහු නමුත් ආර්‍යශ්‍රාවකයෝ අත්නොහරනා පංචශීලය වනාහි ආර්‍යකන්තධර්මය බැවින් පංචශීලධර්මසංඛ්‍යාතවූ ආර්‍යධර්මයෙහි පිහිටියාවූ උපාසකපුද්ගලයෙක්වේද ඔහු "ගෘහපතිය! භොගයන් රැස්කරන්නාවූ තොපවැනි උපාසකයෙකු විසින් නම් 'මම මේ භොගයන්කරණකොටගෙන මාත් මාගේ මවුපියදූපුත්දරුදැසිදස්කම්කරුපුරුෂයනුත් සුවපත් කරන්නෙමැයිද ගිනිආදීන්කෙරෙන් විපත් උපන් කල්හි භොගයන් කරණකොටගෙනම ඔවුන්ගේ මාගීයන් වසා තමන්සවසථ කරන්නෙමැයිද ධාර්මිකමහණබමුණන් කෙරෙහි ඌර්ධ්වගාමී කර්මඵලඇති දක්ෂිණාව පිහිටුවන්නෙමැයිද මේ භොගයන් කරණකොටගෙන පංචබලිය කරන්නෙමැයිද යන මේ කරුණුපස කරණකොටගෙන භොගයෝ ලැබියයුත්තාහ මෙසේ නොලබනලද භොගඇත්තහු විසින් යමක් පිණිස භොගයෝ කැමතිවන ලද්දාහුද එසේ කැමතිවී භොගයන්ලැබ ඒ අර්ථය කරන්නාහුට විප්‍රතිසාරභාවය ලක්ෂණකොට ඇති අනුතාපය ප්‍රහීන වෙයි ප්‍රහීනකරනලද අනුතාප ඇත්තහුගේ සිතද කෙලෙසකාලුෂ්‍යාපගමයෙන් පිරිසිදුවෙයි" යන මේ අවවාදය මෙසේ පිළිපදින්නාවූ ඔහු මෙලොවිහිත් දෙවියෝ පවා ප්‍රශංසා කරන්නාහුය විපාකානුභවනවශයෙන් පරලොවැ සුගතියෙහි ප්‍රමුදිතවන්නේය යනුයි.

එසේ හෙයින් මේ සුගතොවාදය සිහිකරන්නාවූ ගෘහස්ථයා විසින් කළුරියකළ සැතීන්ට ප්‍රාණඝාතාදියෙන් තොරවැ බලි කම්මද කටයුත්තේමය.....

මෙසේ කියනලද්දේ හරණාදී උපස්ථානය වන්නේය..... පාපයෙන් වැළැක්මය, කල්‍යාණයෙහි යෙදවීමය හෙවත් පිහිටුවීමය, ශිල්පඉගැන්වීමය, සුදුසුලෙස දාරාපරිග්‍රහණය කරවීමය, දායාදදීමය, යන මොවුන්ගේ වශයෙන් පැවති මේ කරුණුපස ඉහතමහාවයෙහි හිත හෙතුහෙයින් මඞ්ගලනම් වන්නේය.....

එසේ හෙයින් ගෘහපතිපුත්‍රය! මේ කරුණුපසක් හරණ කොටගෙන වනාහි පුත්‍රයා විසින් පූජිදිසාවෝයයි කියනලද මවුපියෝ උපස්ථානකරනලද්දාහු කරුණුපසකින් පුත්‍රයාහට අනුකම්පා කරන්නාහුය. කවර කරුණුපසකින්ද? යත්? පාපයෙන් වළකත් කල්‍යාණයෙහි පිහිටුවත් ශිල්පඋගන්වත් අනුරූපවූ දාරාපරිග්‍රහණය කරවත් සුදුසු අවස්ථාවෙහි දායාදය භාරදෙත්. ගෘහපතිපුත්‍රය මවුපියන් විසින් කරනලද මේ කරුණුපස හෙතු කොටගෙන පුත්‍රයාවිසින් උපස්ථානකරනලද්දාවූ පූජිදිසා නැමැති මවුපියෝ මේ පූර්වොකතවූ කරුණුපසින් පුත්‍රයාහට අනුකම්පාකරන්නාහුය.....

එහි පාපයෙන් වැළැක්ම නම්: ප්‍රාණඝාතාදීන්ගේ දිෂ්ටධම්මසාම්පරායික ආදීනවයන් කියා දරුව මෙසේ නොකරවයි කියා පාපයෙන් වැළැක්වීමය, කළපාපය ගැණත් නිගුහකිරීමය යන මේයයි කියනලද්දේය.....කල්‍යාණයෙහි පිහිටුවීම නම්: අනේපිඩුමහසිටුමෙන්ද කසුප්බුදුසෙමෙහි මිතවින්දකයාගේ මවමෙන්ද අත්ලස්දී නමුත් සීලසමාදානාදියෙහි පිහිටුවීමය.....

හේ කෙසේද? යත්:-අනේපිඩුමහසිටුතෙමේ වනාහි බුදුදහමද ධම්ශ්‍රවණයද සංඝයාහට වතාවත් කිරීමද යන මේ නොකරන්නාවූ තමපුත්වූ 'කාල' නම් කුමරුවා එහි ගොදවන්නව නොහැකිවන්නේ 'පුතණඹ! නුඹ පෙහෙවත් සමාදන්වී විහාරයට ගොස් බණ අසා එව නුඹට කහවණු සියයක් දෙන්නෙමි'හි කීයේය. හේ තෙමේ ධනලොභයෙන් පෙහෙවස් සමාදන්වූවෙක් වී ධම්ශ්‍රවණයෙන් අපේක්ෂාරහිතවුවත් විහාරයට ගොස් පහසු නැනක නිදා පිබිද හිමදැරියෙන්ම ගෙට අවුත් කහවණු නොලැබ බත්නොකා නැවත ලබාම බත්කැයේය. නැවත එක්දවසක් සිටුතෙමේ 'දරුව ශාස්තෘන්වහන්සේගේ සමීපයෙන් එකධම්පදයක් ඉගෙන එව නුඹට කහවණුදහසක්

දෙන්නෙමි'යි කීයේය. හේ තෙමේ එකම ධම්මපදයක් ඉගෙන පලායන්ට බලාපොරොත්තුවිය. ශාස්තෘන්වහන්සේ ඔහට සිතේ නොරඳනාකාරයක් කළසේක. හෙතෙමේ ඒ පදය නොසලකා මතුපදය ඉගෙනගන්නෙමියි සිතා සිව අසන්නේම සොවාන්ඵලයට පැමිණ ආර්‍යශ්‍රාවකයෙක් වී දෙවතදින ශාස්තෘන්වහන්සේ සමඟම ගෙට අවුත් ශාස්තෘන්වහන්සේගේ ඉදිරියෙහි දෙනලද බැවින් ලජ්ජාවූයේ පියාවිසින් නමුත් දෙනලද ඒ කහවණුපොදිය ගන්නට නොකැමතිවිය. මෙය ධම්පියාසෙහි **ලොකවග්ගසෙහි** "පථව්‍යාඒකරජ්ජන" යනාදී **ගාථාවණ්ණනා**සෙහි එන ලද්දේය.

මවුපියෝ පුත්‍රයාහට කල්‍යාණයෙහි පිහිටුවාලීම් සංඛ්‍යාත දෙවන කරුණෙන් අනුකම්පාකරන බවට නිදසුන්වශයෙන් දක්වනලද

කාලකුමාරවත්ථුවයි.

මිත්තවින්දකයාගේ මවුපියෝ 'දරුව! නුඹවිසින් දුලීහවූ මිනිසත් බවක් ලබාලද්දේය දන්දෙව සිල්රකුව පෙහෙවස් වාසය වසබණ අස'යි කියා 'අම්ම! මට දානාදියෙන් වැඩක් නැත මට කිසිවක් නොකිය මම මාගේ කම්වූපරිද්දෙන් මිය පරලොව යන්නෙමි' කීකල්හි 'මපුතණඩ! අද පෙහෙවස් රැක විහාරයෙහි මුළුරැය බණ අසා එව නුඹට කහවණු දහසක් දෙන්නෙමි'යි කීය. මිත්තවින්දකතෙමේද ධනලොභයෙන් පෙහෙවස් සමාදන්වූවෙක් වී විහාරයෙහි දවස ගවා රාත්‍රියෙහි එක ධම්මපදයක්වත් කතට නොවදනාසේ එක දෙසෙකැ නිදා උදැසනම ගෙට ආයේය. මවුතොමෝ වනාහි 'අද මපුතනුවෝ වනාහි බණඅසා ධම්මකථිකතෙරුන් වැඩමවාගන එන්නේය'යි සිතා අවුලුකැඳබත් ආදිය පිළියෙළ කොට ඔහු එනමඟ බලබලා සිටියා හුදු ඔහුම එන්නා දැක 'දරුව! නුඹවිසින් ධම්මකථිකශාස්තෘන්වහන්සේ නමක් නොකැඳවනලද්දේදැ'යි විවාළීය. හෙතෙමේ මව ධම්මකථිකයෙකු ගෙන් වැඩක් නැතැයි කියා දහසින් බැඳි සියලු නොලබන්නේ බත්නොකා නැවත ලැබම බත්කැය. හෙතෙමේ ඉන් මෑත කාලෙක නැවින් වෙණදම් කරන්නට යන්නේ යට කියනලද නයින් මිනිසුන් විසින් මුහුදුපිට හැරදමනලද්දේ පසුරකින් යන්නේ එක්දිනක් කරනලද දිඝවධම්මවෙදනීයවූ උපෝෂථ කර්මයාගේ ආනිසංසයෙන් පිළිවෙළින් පළිහුවිමනෙහි සතර දෙනෙක ඛිදීවිමනෙහි අටදෙනෙක මණිවිමනෙහි සොළසෙක රන්වීමනෙහි දෙතිසෙකැයි යන විමාණප්‍රේතියන් දැක ඔවුන් සමඟ දිවසැප වින්දේය.

මෙය යටදැක්වූ කරුණටම නිදසුන්වූ **චතුවාරජාතක වණ්ණනායෙහි** එනලද **මිත්තඩිණ්ඩකවසතුවයි.**

මෙසේ පුත්‍රයාහට අනුකම්පාපිණිස ඒ මාතාපිතෘහු කල්‍යාණ යෙහි පිහිටුවන්නාහ.

ශිල්පය නම්:—තමන් ඔවාහි සිටිබැවි දැන පරම්පරාගතවූ මුද්‍රාගණනාදී ශිල්පය උගන්වන්නාහ. මුද්‍රාශිල්පය වනාහි අන් තැනෙක්හි කියනලද්දේය. ඒ එසේමැයි. මුද්‍රාශිල්පය නම්: ඇඟිලි පුරුක්හි සඳුතබා ගණිත හස්තමුද්‍රාවය ගණනාශිල්පය නම් අවජ්ඣගැණීමය, සංඛ්‍යානශිල්පය නම් පිණ්ඩගැණීමය, එනම් ගණනකින් කෙත බලා මෙහි මෙපමණ වී වන්නාහුය රුකබලා මෙහි මෙපමණ ඵලවන්නාහුය අහස බලා මේ අහසෙහි මේ පක්ෂීහු මෙපමණ වන්නාහුයයි දනිද්ද එබඳුවූයේ සංඛ්‍යාන ශිල්පයයි **මහාදුක්කඛන්ධසුත්‍රවණ්ණනායෙහි** කියනලද්දේය.

එහි "සඳුතබා" යනු මේ ඇඟිලිපුරුෂ ගත්කල සියයෙක මේ ඇඟිලිපුරුෂ ගත්කල දහසෙකැයි යනාදි ක්‍රමයෙන් හැඟීම කොට හෙවත් මතකතබා ගැණීමය. "අවජ්ඣගැණීමය" යනු එකදෙකආදි කොටඇති නවයඅන්ත කොට ඇති විධියෙන් නිරන්තරගැණීමය හෙවත් අතරනැතිවගැණීමය "පිණ්ඩගැණීමය" යනුසියල්ලෙන් උපදනා පිණ්ඩගණනය, එහෙයින් 'කෙත බලා' යනාදිය කියනලද් දේය. 'මුද්‍රා' යනු හස්තමුද්‍රාවය 'ගණනා' යනු අවජ්ඣකාදී ගණනයයි. **ඔමසවාදසික්ඛාපදවණ්ණනායෙහි** කියනලද්දේය. "හස්ත මුද්‍රාගැණීමය" යනු පාසිතම්ලකඛකාදීන්මෙන් ඇඟිලි හැකිල වීමෙන් ගැණීමයි. නවත්තනවශයෙන් ගැණීම අවජ්ඣගැණීමයි. අවජ්ඣකාදී ගැණීමය යන තන්හි ආදිශබ්දයෙන් සංකලනාදි වශයෙන් පැවති පිණ්ඩගණනාව ගන්නාලදී. ඒ පිණ්ඩගණනාව යමෙක්හට ප්‍රගුණවීද හෙතෙමේ රුකද බලා මෙහි මෙතෙක් පත්‍රඇතැයිද දැනගන්නේය යනු එහි **විඤ්ඤාණයයි.** "මුද්‍රා" යනු අවජ්ඣ ගැණීමය; "ගණනා" යනු පිණ්ඩගැණීමය; යනු **අභූතන්තර වණ්ණනානයවන්නේය.** "මුද්‍රා" යනු ඇඟිලිපුරුක්හි සඳුතබා හස්තමුද්‍රායෙන් ගැණීමය; "අවජ්ඣ ගැණීම" යනු එකදෙකතුන යනාදී වශයෙන් ගැණීමය; යි එහි **විඤ්ඤාණය** වන්නේය.

මෙසේ මවුපියෝ යථොක්තවූ නිරවද්‍යවූම ශිල්පයක් උගන් වන්නාහුය. "අනුරූපවූ දරාවක් සමඟ යොදවත්" යන තන්හි **අනුරූපභාවය නම්** කුලශීලරූපභොගපරිවාරාදීන්ගේ වශයෙන් සුදුසුබවය.

මෙසේ භරණාදි වශයෙන් ඔවුන් උපස්ථානකරන්නාහු පාපනිවාරණාදියෙන් එය ලබන්නේය. එසේ නොසින් ඔවුහු එසේම උපස්ථාන කටයුත්තාහුවය. මවුපියෝ වනාහි භරණාදි කාරණයන් බලමින් පුත්‍රයන් ප්‍රාර්ථනාකරන්නාහුය. එහෙත් භාග්‍යවතුන්වහන්සේ **පඤ්චඟුත්තරයෙහි පුත්තසූත්‍රයෙහි** භික්ෂූන්ට ධර්ම්මදේශනාකරනසේක්,

"පංච ඨානානි සම්පස්සං පුත්තං ඉච්ඡන්ති පණ්ඩිතා,
හතෝ වා නෝ හරිස්සති කිච්චං වා නෝ කරිස්සති.
කුලවංසෝ චිරං ඨස්සති දායජ්ජං පටිපජ්ජති,
අථ වා පන පෙතානං දක්ඛිණං අනුපදස්සති,
ඨානානෙතානි සම්පස්සං පුත්තමිච්ඡන්ති පණ්ඩිතා
තස්මා සත්තෝ සප්පුරිසා කතඤ්ඤූ කතවෙදිනෝ,
භරන්ති මාතාපිතරෝ පුබ්බ කතමනුස්සරං.
කරොන්ති නෙසං කිච්චානි යථා තං පුබ්බකාරිනං,
ඔවාදකාරී හතපොසී කුලවංසං අභාපයං,
සද්ධොසීලෙන සම්පන්නෝ පුත්තෝ හොති පසංසියෝ"නිසි

වදළසේක.

එහි අදහස නම්:—පණ්ඩිත මාතාපිතෘන්හු කරුණුපහක් බලමින් පුත්‍රයන් කැමතිවන්නාහුය. කවර කරුණුපහද? යත්:—අප විසින් කිරිපෙවීම් කිරිතෙල්මකා අත්පා වැඩීමාදියෙන් භරණය පොෂණය කරනලද අපගේ පුත්‍රයෝ අපමහලුකලැ පාදෙවීම් නැහැවීම් කෑදබත්දීම් ආදියෙන් අප භරණය පොෂණය කරන්නාහුයසිද, තමන්කටයුතු තබා පවා රාජකුලාදීන්හි අපට උපන් කටයුතු එහි ගොස් කරන්නාහුයසිද, අපසන්තක කෙත්වත් භරණ්‍යසඞ්ඛ්‍යාදිය නොනසා රක්නා පුත්‍රයන් ඇතිකල කුලවංශය බෝහෝ කලක් පවත්නේයසිද කුලවංශානුරූපවූ ප්‍රතිපත්තියෙන් තමදායාදයට යොග්‍යවූවෙක් කරන්නේ අපසන්තකවූ දායාදය පිළිලබන්නේයසිද නැවතද වනාහි අප පරලොවගිය කල්හි අපටපින්දීමක්කොට තුන්වන දින ආදියෙහි පවත් දන් දෙන්නේයසිද යන මේ කරණු බලමින් පණ්ඩිත මවුපියෝ පුත්‍රයන් කැමතිවන්නේය.

එසේ හෙයින් සාන්තවූ සත්පුරුෂවූ කාතඥයෝ තුමූ මවුපියන් විසින් පළමුකොටම කරනලද ගුණයන් සිහිකරමින් මවුපියන් පොෂණය කරන්නාහුය.

ඒ පුත්‍රයෝ තුම්හූ පූජිකාරීවූ මාතාපිතෘන්ගේ සියලුකටයුතු කරන්නේය. එසේම මවුපියන් විසින් දෙනලද අවවාදයන් කරන්නාවූ තමන්හරණය කළාවූ මවුපියන් පොෂණය කරන සුලුවූ කුලවංශය නොනසන්නාවූ ශ්‍රද්ධාවත්වූ සීලසම්පන්නවූ පුත්‍ර තෙමේ ඉහාතම්භාවයෙහිදීම පණ්ඩිත මහජනයා විසින් ප්‍රශංසා කටයුත්තේවන්නේය යනු **එතිවණ්ණනානය** වන්නේය.

ඉදිජනමනනන්දනවූ මාතාපිතෘ උපස්ථාන සංඛ්‍යාත එකොලොස්වන මඞ්ගලවණ්ණනාව මෙතෙකින් දක්වා නිමවනලද්දේය.

මාතාපිතෘඋපස්ථානකථනයට අනතුරුව පුත්‍රදාරසංග්‍රහ කථනය කියනුලැබේ.

පුත්‍රයෝ නම් තිදෙනෙක් වෙත්. එහෙයින් **ඉතිවුත්තඤ්ච යෙහි තයොපුත්තසුත්තය** වදාරනලද්දේය.

එහි අදහස නම්:-මහණෙනි! මේ ලොකයෙහි පුත්‍රයෝ තිදෙනෙක් විද්‍යමානවන්නාහ. ඒ තිදෙන කවරහුදයත් තමන්ගේ ගුණ කරණකොටගෙන මවුපියන් ඉක්මවා උපන්නාවූ හෙවත් මවුපියන්ගේ ගුණයන්ට අධිකගුණ ඇත්තාවූ අතිජාතපුත්‍රයාය, ගුණයෙන් මවුපියන්ට අනුරූපවී හෙවත් සමානවී උපන් අනුජාතපුත්‍රයාය, ගුණයෙන් මවුපියන්ට අධමවී හෙවත් හීනවී උපන් අවජාතපුත්‍රයාය, යන තිදෙනාය. මහණෙනි! පුත්‍රයා අතිජාත වන්නේ කෙසේදයත්, මහණෙනි! මේ ලොකයෙහි පුත්‍රයාගේ මවුපියෝ බුඩාදීතුනුරුවන් සරණයොගියාහු වෙද්ද ප්‍රාණඝාතාදීන් කෙරෙන් තොවැලැක්කාහු වෙද්ද දුස්සීලයෝ වෙද්ද ලාමකසභාව ඇත්තාහු වෙද්ද ඔවුන්ගේ පුත්‍රතෙමේ වනාහි බුඩාදී තුණුරුවන් සරණගියේ වේද ප්‍රාණඝාතාදීන් කෙරෙන් වෙන්වූයේ වේද සිල්වත්වේද කල්‍යාණසභාව ඇත්තේවේද මහණෙනි! මෙසේ වනාහි පුත්‍රතෙමේ අතිජාත නම් වන්නේය.

මහණෙනි! පුත්‍රතෙමේ කෙසේ නම් අනුජාතවන්නේද? මහණෙනි! මේලොකයෙහි පුත්‍රයක්හුගේ මවුපියෝ බුඩාදී තුනුරුවන් සරණගියාහුවෙද්ද ප්‍රාණඝාතාදීන් කෙරෙන් වැලැක්කාහු වෙද්ද සිල්වත්වූවාහු වෙද්ද කල්‍යාණධර්මඇත්තෝ වෙද්ද ඔවුන්ගේ පුත්‍රතෙමේත් බුඩාදී තුනුරුවන් සරණගියේ වේද ප්‍රාණඝාතාදීන් කෙරෙන් වැලැක්කේ වේද සිල්වත් වේද කල්‍යාණධර්ම ඇත්තේ වේද මහණෙනි! මෙසේ වනාහි පුත්‍රතෙමේ අනුජාත නම් වන්නේය.

මහණෙනි! පුත්‍රතෙමේ කෙසේ වනාහි අවජාත නම් වන්නේද? මහණෙනි! මේ ලොකයෙහි පුත්‍රයන්හුගේ මවුපියෝ බුඩාදී තුනුරුවන් සරණ ගියාහු වෙද්ද ප්‍රාණඝාතාදී පාපයන් කෙරෙන් වැලැක්කාහු වෙද්ද සිල්වත් වෙද්ද කල්‍යාණධර්ම ඇත්තෝ වෙද්ද එබඳු මවුපියන්ගේ පුත්‍රතෙමේ බුඩාදී තුනුරුවන් සරණ නොගියේ වේද ප්‍රාණඝාතාදී පාපයන් කෙරෙන් නොවැලැක්කේ වේද දුසීලවේද ලාමකසභාව ඇත්තේවේද මහණෙනි! මෙසේ වනාහි පුත්‍රතෙමේ අවජාත නම් වන්නේය.

යම් පුත්‍රයෙක් තෙමේ මවුපියන් අශ්‍රඬාවත්කල්හි දුස්සීල කල්හි තෙමේත් එමදුම වේද ඒ පුත්‍රතෙමේත් අවජාතයා නමැයි අට්ඨකථායෙහි දක්නාලද්දේය.

මහණෙනි! මේ පුත්‍රයෝ තිදෙන වනාහි මේ ලොකයෙහි විද්‍යමාන වන්නාහයි වදාරා හදනන්තරවැ මෙය වදළසේක.

"අතිජාතං අනුජාතං පුත්තමිච්ඡන්ති පණ්ඩිතා,
අවජාතං න ඉච්ඡන්ති සෝ හොති කුලගණ්ඨනෝ.

එතෙ ඛෝ පුත්තා ලොකසමිං යෙ භවන්ති උපාසකා,
සඩ්ඪාසීලෙන සම්පන්නා වදඤ්ඤූ වීතමච්ඡරා,
වන්තෙව අබ්භනා මුත්තෙනා පරිසාසු විරොචතී"ති

එහි අදහස නම්:-පණ්ඩිතවූ මාතාපිතෘහුතුමූ අතිජාතපුත්‍රයාද අනුජාතපුත්‍රයාද යන දෙදෙන කැමතිවන්නාහුය අවජාත පුත්‍රයා කැමති නොවන්නාහ. කුමක් හෙයින්ද? යත්:-හෙතෙමේ වනාහි කුලය සිඳින්නේය කුලය වනසන්නේය එසේ හෙයිනි. මේ ගාථායෙහි ගණ්ඨිශබ්දය "උපපලගණ්ඨිපවත්තිතා" යනාදී තන්හි මෙන් ඡේදනාර්ථයෙහි වීය.

මේ සත්ත්වලොකයෙහි මේ අතිජාතාදිපුත්‍රයෝ තිදෙන පමණක් වන්නාහුය මෙයින් විනිර්මුක්තවූ පුත්‍රයෙක් නම් නොම ඇත්තේය.

මේ පුත්‍රයන්අතුරෙන් යමෙක් වනාහි සරණාගමන සම්පත්තියෙන් උපාසකයෝවෙද්ද කම්මස්සකතාඥාණයෙන් කර්මයපිළිබඳ නිපුණත්වයෙන් යුක්තවෙද්ද ඒ ප්‍රාඥවත්වූ පණ්ඩිතයෝද පඤ්චසීල දසසීලයන්ගෙන් යුක්තවූ එයින් සම්පූර්ණවූවාහුද යාචකයන්ගේ වචනය දන්නාවූ ඔවුන්ගේ මුඛාකෘතිය දැකීමෙන්ම අර්ථය හෙවත් කාරණය දැනගන්නා හෙයින් හෝ ඔවුන්ගේ 'දෙව' යන වචනය අසා 'මොවුහු පෙර දන්නොදී

මෙසේ වූවාහුය මවිසින් වනාහි මෙබන්දන් නොවිය යුතුය'යි සිතා ඔවුන්ට පරිත්‍යාගකිරීමෙන් එම අර්‍ථය දැනගන්නා හෙයින් හෝ පණ්ඩිතයන්ගේ කම්මස්සකතා ආදිය දක්වන වචනය දැනගන්නා හෙයින් හෝ වදඤ්ඤූ නම්වූ නොහොත් පරිත්‍යාග ශීලී හෙයින් පදඤ්ඤූ නම් වූවාහුද පහකරනලද මසුරුමල ඇත්තාහුද ඒ පුත්‍රයෝ තුමූ ඝනමේඝපටලයෙන් මිදුනාවූ චන්ද්‍රයා මෙන් උපාසකාදී පිරිස්අතර හෝ ක්ෂත්‍රියාදී පිරිස්අතර හෝ බබලන්නාහ සොභමානවන්නාහ යනු **එහිවණ්ණනා** නයින් කියන ලද්දේය.

පුත්‍රයෝ වනාහි **නිදෙනෙක්වෙත්** අනික් සතරවැන්නෙක් **නම්** නොමඇත්තේය එනම් අන්තෙවාසීය දින්නකය අත්‍රජය යන මේ නිදෙනාය යනු **පඬරජාතකයෙහි** කියනලද්දේය. එහි අන්තෙවාසී පුත්‍රයා නම් ශිල්පඉගෙනගන්නාවූ හෝ ප්‍රශ්න අසන්නාවූ හෝ සමීපයෙහි පවත්නා පුත්‍රයාය; දින්නකපුත්‍රයා නම් මොහු නුඹට පුත්‍රයෙක් වේවායි කියා අනුන් විසින් දෙන ලද පුත්‍රයාය යනු එහි **වණ්ණනානය** වන්නේය. මේ පුත්‍රයා නම් අත්‍රජය ඛෙත්තජය අන්තෙවාසිකය දින්නකයයි කියා චතුර්විධවන්නේය. එහි තමහට දුව උපන්තැනැත්තේ අත්‍රජ නම්ය; යහන්මතුවෙහි හෝ පළඟෙහි හෝ ළෙහි හෝ යනාදී තන්හි උපන්තැනැත්තේ ඛෙත්තජනම්ය; සමීපයෙහි ශිල්ප ඉගෙනගන්නා තැනැත්තේ අන්තෙවාසික නම්ය; පොෂණය පිණිස දුන්තැනැත්තේ දින්නක නම් යයි **එකනිපාතයෙහි කණහාරිජාතකනයින්** දන්නේය. මෙහි වනාහි අතිජාතාදි භෙදයන්ගෙන් බිඳුනාවූ අත්‍රජයොම හෙවත් තමහට දුව උපන් තැනැත්තෝම ලැබෙන්නාහ. එහෙයින් අර්‍ථකථායෙහි තමහට දුව උපන් පුත්‍රයෝද දුහිතෘහුද පුත්‍රසංඛ්‍යාවට යන්නා හයි කියන ලද්දේය.

දුරාවෝ නම්: "මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්ම රක්ඛිතා සාරක්ඛා සපරිදණ්ඩා ඛත්තාකිතා ඡන්දවාසිනී භොග වාසිනී පටවාසිනී ඔදපත්තකිනී ඔභටචුම්බටා දාසීවභරියා කම්ම කාරීවභරියා ධජාහටා මුහුත්තිකා" යන 'විංශති සත්‍රීහුය'යි **සකුණ්ව ජිත්තවිභඟයෙහි** කියන ලද්දාහ.

එහි මාතුරක්ඛිතා නම්: පුරුෂයෙකු හා සමඟ සංවාසය නොකරන පරිද්දෙන් මව විසින් රක්ෂාකරණලද තැනැත්තීය.

එහෙයින් පදභාජනියෙහි "මාතා රක්ඛති ගොපෙති ඉස්සරියං කාරෙති වසං වත්තෙතීති" යනුවෙන් "කිසිතැනෙක්හි යන්ට නො දෙයි අන්‍යයන්ට නොපෙණෙන ලෙස ගුප්තස්ථානයෙහි තබයි ඇගේ සෙවල්‍යාවිහරණය හෙවත් සියකැමැත්තෙන් හැසිරීම වලකයි මැඩපවත්වයි මෙය කරව මෙය නොකරවයි කියා තමන්ගේ වසයෙහි පිහිටුවයි හෙවත් අණ ඇමතුවෙහි පවත් වයි"යි කියනලද්දේය. මේ නයින් පිතුරක්ඛිතාදීහුද දතයුත් තාහ. ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා යන මොහුනම්: "ගෞතම ගොත්‍රාදී ගොත්‍රය හෝ පඬරඟපරිව්‍රාජකාදීන්ගේ නැතහොත් ඒ ඒ කුලයන්ගේ ධර්ම්මය හෝ නොරක්නේය සමාන ගොත්‍ර ඇත්තාවූ හෙවත් එකවංශයෙක්හි උපන්නාවූ එසාශාස්තෘවරයක් හුගේ ශාසනයෙහි සමඟ හැසිරියයුතු ධර්ම්ම ඇත්තාවූ නොහොත් සමානකුලධර්ම්මඇත්තාවූ පඬරඟපරිව්‍රාජකාදී එක්ශාස්තෘවර යෙක් උදෙසා පැවිදිවූ මාලාකාරාදී එකගණයෙක්හි ඇතුළත් වූවන් විසින් රක්නාලද්දී ගොත්තරක්ඛිතානමුදු ධම්මරක්ඛිතා නමුදු කියනුලබන්නීය යනු **නවණ්ණනානය හා නටවිකා** නයෙහි කියනලද්දේය. සමාන ගොත්‍රයන්හි වූවන් විසින් රක්නාලද්දී ගොත්තරක්ඛිතා නම්ය. සමානධර්ම්ම ඇත්තවුන් විසින් රක්නාලද්දී ධම්මරක්ඛිතා නම්ය. සවාමීසහිතවූවා **සස්සා** මිකා නම්ය. ආරක්ෂාසහිතවූවා සාරක්ඛා නම්ය. යම් සත්‍රියක් වෙත එළඹීමෙහි රජු විසින් දඩ නියම කරනලදද ඕතොමෝ සපරිදණ්ඩා නම්යයි **සහිතිසූත්‍ර සම්මාදිට්ඨිසූත්‍ර** ටීකානයවන් නේය. අල්පවූ හෝ බොහෝවූ හෝ ධනයෙන් විකුණනලද්දී ධනක්ක්‍රීතා නම්ය. යම්හෙයකින් වනාහි ඕ තොමෝ ධනයෙන් විකිණීමාත්‍ර ඇත්තීම සංවාසය පිණිසම විකුණනලද බැවින් භාය්‍යාවීද එහෙයින් නිර්දෙශයෙහි "ධනෙන කිණිත්වා වාසෙති" යනුවෙන් "ධනයෙන් විකොට වාසය කරවාය"යි කියන ලද්දේය. ඡන්දයෙන් තමන්ගේ රුචියෙන් වාසය කෙරේත්‍රුසි= ඡන්දවාසිනී නම්ය. යම්හෙයකින් වනාහි ඕ තොමෝ පුරුෂයෙකු විසිනුත් පිළිගන්නාලද බැවින් සියකැමැත්තෙන් පමණකින් භාය්‍යා නොවන්නීද? එහෙයින් මේ වචනයට **නිදේශයෙහිද** "යෙ, 'පි යං වාසෙති" යනුවෙන් යම් සත්‍රියක් යම් පුරුෂයෙකුත් වාසය කරවාද ඒ සත්‍රී තොමෝ 'ඡන්දවාසිනී, නමැයිද කියනලද්දීය.

භොගයන් කරණකොටගෙන වාසය කරන්නී 'භොගවා සිනී' නම්. වනමොහොල්ආදී ගෘහොපකරණ ලාභ නඹු බවට ගන්නාවූ දනවැසි සත්‍රියට මෙය නමෙකි. වසනු කරණකොට

වාසය කරන්නීනුයි=පටවාසිනී නම්...ඟැදීම් පෙරවීම් පමණ වුවත් ලැබ භාර්‍යාභාවයට පැමිණෙන්නීවූ දිළිඳුස්ත්‍රියට මේ නමෙකි...

එකදියබදුනෙහි දෙදෙනාගේ අත්බහා "මේ ජලය මෙන් මුසුවුවාහු නොබිඳෙව්"යයි කියා පරිගෘහීතවූ තැනැත්තියට ඔද පතතකිනී, යන මෙය ව්‍යවහාර නාමයකි. නිදේශයෙහි මේ වචනයට "තාය සහ උදකපත්තං ආමසිත්වා තං වාසෙති" යනුවෙන් මේ අර්‍ථය දතයුත්තේය. බහනලද සුඹුළක් මෝහට ඇත්නීනුයි=ඔහවුමබවා නම් වේ. දරදිය ආදිය ගෙන එන්නියන් අතුරෙන් එක්තරා කෙනෙක...යම් ස්ත්‍රියකගේ හිසින් සුඹුළක් බහා ගෙයි වසවාද ඇයට මෙය නමෙකි. තමහට දැසිවූවාත් භාර්‍යාවූවාත් 'දැසිවහරියා' නම් වේ. යම්කිසිවෙක් තෙමේ තමබිරිඳුගෙන් කම්නැතිව ගෙයිබැලමෙහෙකරන්නිය සමඟ ගෘහවාසය කෙරේද ඒ බැලමෙහෙකරන්නී නොමෝ 'කම්ම කාරිවහරියා' නම් වේ. ධවජයෙන් ගෙනෙනලද්දී 'ධජාහටා'නම් වේ. ඔසවනලද ධ්වජඇති සෙනාවට ගොස් විදෙශය පැහැර ගෙනෙනලද්දීයයි කියනලද්දීය. ඇය කිසිවෙක් භාර්‍යාකෙරේද? මෝනොමෝ 'ධජාහටා' නම්වේ. යම් ස්ත්‍රියක්නොමෝ මොහොතක්හි සංවාසය පිණිස විසියයුත්තීද ඕ නොමෝ 'මුහුත්තිකා' නම්ය. එකෙණෙහි පමණක් භාර්‍යාබවට පැමිණි තැනැත්තී යන අර්‍ථයි. යන මේ විසතරය සඞ්ඛරිත්තවණ්ණානය වන්නේය...

ඒ සියලුම භාර්‍යාවෝ මෙහිදී දූරාවෝයයි කියනලදහ. එහෙයින් අර්‍ථකථායෙහි දූරා යනු විංසතිභාර්‍යාවන් අතුරෙන් යම්කිසි භාර්‍යාවකැයි කියනලද්දීය...පුත්තා ච දූරා ච=පුත්තදූරං තස්ස පුත්තදූරස්ස'හි වාර්‍ථසමාස එකත්තපුංසකනිද්දෙසයි. එහි පුත්‍රයන්ට සංග්‍රහය නම් පාපනිවාරණාදියෙන් උපකාරකිරීමයි. එය යට කියනලද්දේමය...දූරාසංග්‍රහය නම් සම්මානනාදියෙන් උපකාරකිරීමයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් "පඤ්ච හි ඛො ගහපතිපුත්ත! ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨාපෙතබ්බා සම්මානනාය අවිමානනාය අනතිචරියාය ඉස්සරිය වොස්සග්ගෙන අලංකාරානුප්පදානෙන, ඉමෙ හි ඛො ගහපතිපුත්ත! පඤ්ච හි ඨානෙහි...පෙ...පච්චුපට්ඨාපෙතබ්බා" යනුවෙන් ගෘහපති පුත්‍රය! පච්ඡිමාදිසා නම්වූ හෙවත් පිටිපසින් ලුහුබැඳීම් වශයෙන් පවත්නා හෙයින් පච්ඡිමාදිසා නම්වූ භාර්‍යා නොමෝ සවාමියා විසින් කරණු පසකින් උපස්ථාන කටයුත්තීය, කුවර නම් කරුණු පසකින්ද? යත්, අර්‍ථවය්‍යාව ලක්ඛණකොට

ඇත්තාවූද දැනය ලක්ෂණකොට ඇත්තාවූද "එඛා දෙවමාතාව එඛා තිස්සමාතාව"! යනාදී සමභාවිතවචන කථාකිරීමෙන් ප්‍රිය වචන ලක්ෂණකොට ඇත්තාවුන් සමභාවනාවෙන්ද, සවාමියා විසින් අවමන්කොට කථාකරනු ලබන භාර්‍යාව සියලුම පිරිවර ජනයාත් අවමන්කොට කථාකරන හෙයිනුත් දැසිදස්කම්කරු වන්ටමෙන් හෙළාතළා කථානොකොට බුහුමන් සහිතව කථා කිරීම් සංඛ්‍යාත අවිමානනායෙන්ද, සියබිරිඳ ඉක්මවා පිටත අනික් සත්‍රියක් සමඟ අනිවරණය තමගැහැණිය ඉක්මවාසිතා ගණන් නොගෙන පවත්නාවූවක් හෙයින් එසේ නොකිරීම් සංඛ්‍යාත අනතිවරියායෙන්ද, සත්‍රිහු වනාහි මහාලතාප්‍රසාදනය වැනි හෙවත් මේලපලඳනාව වැනිවූද අබරණ ලැබුවාහු නමුත් බත් බෙදන්නට නොලබන්නාහුහම් කිපෙත්මය සැඳ අත නබා 'තමුසේට කැමතිපරිද්දක් කරන්නැ'යි කියා භක්තාග්‍රය ඇසට පවරා දුන්කල්හි සියලු ඉසුරු පවරා භාරදුන්නේ නම් වෙයි. ගෙහිම සිට සොයාබලා පරීක්ෂාකොට විධානාකටයුතුවූද සීසැම් වෙණදම් ආදී කම්මයන් කුලස්ත්‍රියකට භාරනොවේමය. එය සවාමියාහටම භාරය එසේ හෙයින් ගෙදරට ගෙනෙන ලද්දාවූම වසඳුව වනාහි ඇය විසින් මොනොවට ගොපනය කරනලද්දක් කොට තැබිය යුත්තේවෙයි එහෙයින් ගිහිණියට ඉසුරු පවරා භාරදීම සුදුසුය. එලෙස ඓශ්වර්‍යය පවරා දීමෙන්ද, සත්‍රිහුනම් පුත්‍රලාභයෙන් මෙන් අගනාවූ බොහෝ ආභරණ ලැබීමෙන්ද සන්තෝස වන්නාහුය ඔවුන් තුටු පහටු කරන දෙයනම් ආබරණමැයි එහෙයින් "අත්තනෝ විභවානුරූපෙන අලඞ්කාරදානෙන" යනුවෙන් තමන්ගේ සම්පත්තියට අනුරූපවූ අලඞ්කාරදීම ශ්‍රුතුවන්නේයයිද කීයේය.

ඉදිනුදු මාතෘකායෙහි "පච්ඡිමා දිසා පුත්තදාරා වෙදිතබ්බා"යි කියනලදද පුත්‍රසංග්‍රහය වනාහි "පාපානිවාරෙනති" යනාදියෙන් දක්වනලදද එහෙයින් පුත්‍රවශයෙන් නිර්දේශය නොකොට දාරුසංඛ්‍යාත භාර්‍යාවශයෙන් කරනලදැයි දතයුත්තේය.

එහෙයින්ම සිගාලසූත්‍රවර්ණනායෙහි මෙසේ භාග්‍යවතුන් වහන්සේ පශ්චිමදිශාව පුත්තදාරාවෝයයි වදාරාත් දාරාවන්ගේ වශයෙන්ම පශ්චිමදිශාව විසඳුවේක පුත්‍රවශයෙන් නොවිසඳුවේක. කුමක් හෙයින්ද පුත්‍රයෝ වනාහි ළදරුකාලයෙහි තමන්ගේ මව විසින් අනුග්‍රහකරනලද්දාහු නොවෙත් අනුකම්පා කරනලද්දාහුද නොවෙත් නුවණැත්බවට පැමිණිකල්හි වනාහි

ඔවුහු පියා විසින් යම්විධියකින් අනුග්‍රහකටයුත්තාහුද ඒ මේ විධිය "පාපානිවාරෙන්ති" යනාදී ප්‍රථමදිශාවාරයෙහි දක්වනලද්දේමය. එසේ ඇතිකල නැවත විසදීමෙන් කුමන වැඩෙක්ද යනු කියනලද්දේය. මෙහි අට්ඨකථායෙහි වනාහි "පච්ඡිමා දිසා පුත්තදාරා වෙදිතබ්බා" නී 'එත්ථ උද්දිට්ඨං පුත්තදාරං භරියාසද්දෙන සඞ්ගණ්හිත්වා'සි ලියනලද්දේය. මෙහි පුත්තශබ්දය ප්‍රමාදලිපියකි "දාරං භරියාසද්දෙන'සි යෙදිය යුතුය. පුත්‍රදාරාවෝ වනාහි පිටි පසින් ලුහුබැඳීම් වශයෙන් පශ්චිමදිශාවයයි දතයුත්තාහ. මෙසේ කියනලද්දේ සවාමියා විසින් සම්මානනාදියෙන් භාර්‍යාව හට කටයුතු සංග්‍රහය වන්නේය.

භාර්‍යාව විසින් සවාමියාහට කටයුතුවූ සුසංවිහිත කම්මන්තාදිය මෙලොව හිතසුවට හෙතුවන හෙයින් මඞ්ගල නම් වන්නේය. එහෙයින් "ඉමෙහි ඛො ගහපතිපුත්ත! පචහි ඨානෙහි පෙ අනුකම්පතිති" යනු වදාළසේක.

එහි අදහස නම්:—ගෘහපතිපුත්‍රය! මේ කරුණුපසකින් වනාහි සමණන් විසින් පශ්චිමදිශානම්වූ භාර්‍යා තොමෝ උපස්ථාන කරනලද්දී කරුණුපසකින් සමණන්හට අනුකම්පාකරන්නීය. කවර කරුණු පසකින්දයත්? කුලස්ත්‍රීය විසින් සවාමියා හට කෑදබත් පිසන බෙදන කාලය නොඉක්මවා මනාකොට කරනලද දෙය සුසංවිහිත කම්මන්ත නම්. එබඳු කම්මන්ත ඇත්නීත් වීද, ගෙහි සවාමිනිය විසින් සවාමියාගේ හා තමන්ගේත් ඤාතිජනයාවූ පරිජනතෙමේ සුදුසුවූ ප්‍රියවචනයෙන්ද භොජනාදියෙන්ද අනිෂ්ඨක්‍රු කෙරෙන් එහි ලැබුනාවූ තුටුපඬුරින්ද ධනාදීන් අතුරෙන් යැවියයුතුවූ ප්‍රියභාණ්ඩයෙන්ද සංග්‍රහ කටයුත්තේය. එලෙස සංග්‍රහ කරනලද පරිජනයා ඇත්නීත්වීද, සවාමියා හැර අනිකෙක් සිතින්වත් නොපතන්නීත් වීද, ගොවිකම් වෙණදම් ආදිය කොට පිටතින් ගෙදරට පමුණුවනලද ධනය මනාකොට ආරක්ෂාකරන්නීත් වීද, ගැහැණිය විසින් නම් පළමු කොට ආහාරසම්පාදනයෙහි දක්ෂබව කැමතිවිය යුතුය එහි යෙදුනී ඊට අනතුරුව සවාමියාහට සත්‍රීජනයාගෙන් ප්‍රයොජනවූ කුදුමහත් කටයුත්තෙහිද ඊට අනතුරුව ප්‍රත්‍රයන්ට හා පරිජනයාහට කටයුතු කෘත්‍යයන්හිද දක්ෂබව කැමතිවිය යුත්තේය. අනික් සත්‍රිහු හුන් තැන හුන්නී සිටිතැන සිටිනීද එසේ නොව දක්ෂබැව් හා අතලස බැව් ඇතිව විපිළිසරනුවූ සිතින් සියලු කට යුතු නිපදවන්නීත් වීද, ගෘහපතිපුත්‍රය! කරුණුපසකින් සවාමියා විසින් උපස්ථාන කරනලද පශ්චිමදිසානම් වූ භාර්‍යා තොමෝ මේකරුණුසින් සවාමියාහට අනුකම්පා කරන්නීය යනුයි.

අනික්කමයක් නම්: ධම්මිකවූ දානය පියවචනය අත්‍ථචරියා යන මෙයින් සංග්‍රහ කිරීම සංග්‍රහ නම්වේ. එනම් උපෝසථ දිනයන්හි වියදම දීමය නකත්තෙළිදිනයන්හි නකත්තෙළි දැක් වීමය මඞ්ගලදිනයන්හි මඞ්ගලකිරීමය දිට්ඨධම්මිකසාම්පරායික අත්‍ථවිෂයෙහි අවවාද අනුශාසනා කිරීමය යන මෙයින් සංග්‍රහ කිරීමය. එය පෙරනයින්ම දිට්ඨධම්මිකහිතහෙතුබැවින්ද ධම්මික බැවින් හා සාම්පරායිකහිතහෙතුබැවින්ද දෙවියන් විසින් පවා නමස්කාර කටයුතුභාවයට හෙතුබැවින්ද **මඞ්ගල**නමැයි දත යුත්තේය.

ඒ එසේමැයි: දෙදෙවිලොවට අධිපතිවූ සක්දෙව්රජතෙමේ උයන්කෙළියට යනුකැමැත්තේ වෛජයන්තප්‍රාසාදයට නගිමින් ඇදිලිකොට දසදිගුන් වඳනේය ඒ දැක මාතලීනම් රියැදුරු තෙමේ දෙවයන්වහන්ස! නුඹවහන්සේ කවරක්හට නමස්කාර කරන්නෙහිදැයි විවාළේය. ඒ සක්දෙව් රජතෙමේ ඕහට කියන්නේ **සක්කසංයුත්තාඛ්‍යානයෙහි දෙවතාවගීයෙහි ප්‍රථමසූත්‍ර යෙහි**

> යෙ ගහට්ඨා පුඤ්ඤකාරා සීලවන්තෝ උපාසකා,
> ධම්මෙන දාරං පොසෙන්ති තෙ නමස්සාමි මාතලි!

යන මේ ගාථාව කීයේය.

එහි අදහස නම්:-එඹා මාතලිය! යම්බදු ගෘහස්ථයෝ තුමූ සියුපසය දීම් දැසමන්සිනිද්දැදී මල්මාලා පිදීම් දහස් ගණන් ප්‍රදීපපූජා කිරීම් යනමේ ආදී පින්කම් කරන්නාහුවෙද්ද උපා සකබැවිහි පිහිටා පන්සිල් දසසිල් පුරද්ද උමංබිඳීම්ආදිය නොකොට දැහැම්වූ සීසැම් ගෙරිරැකීම් වෙණදම්කිරීම් යනාදි යෙන් සැපයූ ධනයෙන් අඹුදරුවන් පොෂණය කෙරෙද්ද එබ දුවූ ඔවුන්ට මම නමස්කාර කෙරෙමැයි යනුයි.

ඒ අසා මාතලීතෙමේද ඔවුන් නමස්කාර කරමින්

> "සෙට්ඨා හි කිර ලොකසම්ං යෙ ත්වං සක්ක! නමස්සසි?
> අහමපි තෙ නමස්සාමි යෙ නමස්සන්ති වාසවා"ති.

යන මේ ගාථාවෙන්

පින්වත ශක්‍රදෙවේන්ද්‍රය! නුඹවහන්සේ මේලොකයෙහි යම් කෙනෙකුන් නමස්කාරකරන්නෙහිද ඔහුතුමූ මේ ලොකයෙහි ශ්‍රෙෂ්ඨයොමැය. වාසවනම්වූ ශක්‍රදෙවෙන්ද්‍රයෝ යම්කෙනෙකුන්

නමස්කාරකරන්නාහුද මමත් ඒ උත්තමයන් නමස්කාරකර මැයි කියේය.

මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය වනාහි සූත්‍රයෙහි බැලිය යුත්තේය. මෙසේ පුත්‍රදාරසඞ්ග්‍රහය දෙවියන් විසින් නමස්කාර කටයුතුවට හෙතුවන බැවින්ද මඞ්ගලනම් වන්නේය.

එහි පුත්‍රයෝතුමූ මවුපියන්ට ගහපතඟනිනම් වන්නාහ. මවු පියෝ වනාහි පුත්‍රයන්ට ආහුනෙය්‍යඟනිනම් වන්නාහ. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ උඟතසරීර නම් බ්‍රාහ්මණයාහට ධම්මදෙ ශනා කරනසේක් සනතඟුත්තරයෙහි දුන්‍යඟනිසූත්‍රයෙහි

"කතමෝ ච බ්‍රාහ්මණ! ආහුනෙය්‍යඟනි? ඉධ බ්‍රාහ්මණ! යස්ස තෙ හොනති මාතාති වා පෙ සම්මා සුඛං පරිහාතබ්බා. කතා මෝ ච බ්‍රාහ්මණ! ගහපතිඟනි? ඉධ බ්‍රාහ්මණ! යස්ස තෙ හොනති පුත්තාති වා පෙ පරිහාතබ්බාති"යි වදුළසේක.

එහි සංක්ෂේපඅදහස නම්:-බ්‍රාහ්මණය! ආහුනෙය්‍යනම්වූ ඟින්න කවරේද? බමුණ! මේලොකයෙහි ඝම්බදුවූ තාගේ මව යයි කියා හෝ පියාගයි කියා හෝ යමෙක් වේද්ද ඔහුකෙරෙහි වරදවා පිළිපදනාවූ පුත්‍රයෝ නිරයාදියෙහි උපදින්නාහ මවු පියෝ එහි කිසිසේත් අනුදහනය හෙවත් දැවීම නොකරන්නා හුය මෙසේ මෝතොමෝ හෝ මෙතෙමේ අනුදහනාදීයෙන් ආහුනෙය්‍යඟනි නමැයි කියනු ලැබේ ඒට හෙතු කවරෙද? මේ ආහුනෙය්‍යසංඛ්‍යාතවූ ඟින්න මවුපියන්කෙරෙන්ම ආයේද ඔවුන් කෙරෙන්ම උපන්නේත්වේද එහෙයිනි. බමුණ! එහෙයින් මේ ආහුනෙය්‍යසංඛ්‍යාතවූ ඟින්න සත්කාරකොට ගරුකාරකොට බුහුමන්කොට පූජාද කොට මනාසේ සැපවූපරිද්දෙන් පරිහරණය කටයුත්තේය.

බ්‍රාහ්මණය! ගහපතඟනිනම් කවරේද? බ්‍රාහ්මණය! මේ ලොකයෙහි ඝම්බදුවූ තාගේ පුත්‍රයෝයයි කියා හෝ දුරාවෝයයි කියා හෝ දාසයෝයයි කියා හෝ කම්කරුවෝයයි කියා හෝ යමෙක් වේද්ද බ්‍රාහ්මණය! මේ පුත්‍රදාරාදි ගණය ගෙහිම්යාමෙන්වී හැසිරෙන බැවින් ගහපතඟනි නමැයි කියනු ලැබේ. බ්‍රාහ්මණය! එසේහෙයින් මේ ගහපතඟනිනම්වූ ඟින්න සත්කාර කොට ගරුකාරකොට බුහුමන්කොට පූජාදකොට මනාසේ සැපවූ පරිද්දෙන් පරිහරණය කටයුත්තේය යනුයි.

මහණෙනි! මේ සප්තාඟනි කෙනෙක් වන්නාහ එනම් රාඟ ඟින්නය මෙෂඟින්නය මොහඟින්නය ආහුනෙය්‍යඟින්නය ගෘහ පතිඟින්නය දක්ඛිණාහීඟින්නය කාමෝඟින්නය යන මේ සත වන් නාහ. මේහේ නොබෙදා වදරනු ලද්දේය.

ප්‍රථමාගනිසූත්‍රවණ්ණනායෙහි වනාහි ගහපති නම් ගෘහස්වාමියායයි කියනලද්දේය යමෙක් තෙමේ මාගමට සයනවස්ත්‍ර අලංකාරාදිය දීමෙන් බොහෝ උපකාරඇත්තේද ඒ සවාමියා ඉක්මවා හැසිරෙන්නාවූ මාගම නිරයාදීන්හි උපදනීය. එහෙයින් ඒ සවාමිතෙමේද පෙරකී නයින්ම අනුදහනාදීයෙන් ගහපතගහි නමැයි කියන ලද්දේයයි කියනලදී. **සඟිතිසූත්‍රවණ්ණනායෙහිද** එසේම කියා නැවත මෙය කියනලදී.

කාශ්‍යපබුදුරජාණන් වහන්සේගේ කාලයෙහි **එක්තරා** සෝවාන්වූ උපාසකයක්හුගේ භාර්‍යාතොමෝ සවාමිපුරුෂයා ඉක්මවා හැසිරෙන්නීය. ඒ උපාසකතෙමේ ප්‍රත්‍යක්ෂවශයෙන් ඒ දැක කුමට මෙසේ කරන්නීදැයි විචාළේය. ඕතොමෝ කියන්නී මම එසේ නොකළෙමි ඉදින් මම එසේකළා සැබවනම් මේ සුනඛතෙමේ ඒකාන්තයෙන් වටකරමින් මා කාවයි කීය. එසේ කියා පසුකලෙක කළුරියකොට කණුණමුණ්ඩනම් විලෙහි විමානප්‍රේතියක්වී උපන්නා දහවල් සම්පත් අනුභවකරන්නී රාත්‍රියෙහි දුක් අනුභවකරන්නීය. එකල බරණැස්රජතෙමේ මුවදඩෙහි යන්නේ වනයට පිවිස පිළිවෙළින් කණුණමුණ්ඩවිල සමීපයට පැමිණියේ ඇය සමඟ කාමසම්පත් අනුභව කෙළේය. ඕතොමෝ රජු රවටා රාත්‍රියෙහි දුක් අනුභව කරන්නීය. රජතෙමේ ඒ දැන කොහි වනාහි මැයන්නීදැයි පසුපස්සේ ගොස් නුදුරුව සිටියේ කණුණමුණ්ඩවිලින් නික්ම අවුත් පටපට යන අනුකරණයෙන් ඇය කන්නාවූ එක් සුනඛයෙක් දැක මොහු මැයගේ සතුරෙකැයි සිතා කඩුවෙන් දෙපලුකොට සින්දේය. එවිට දෙදෙනෙක්වූහ නැවතද සින්ද කල්හි සතරදෙනෙක්වූහ. නැවතද සින්දකල්හි සොළසක්වූහ. සවාමීනි! කුමක් කරනෙහි දැයි ඕතොමෝ රජුඅතින් විචාළීය. එවිට රජතෙමේ මේ කිමදැයි විචාළේය. ඕතොමෝ කියන්නී දේවයන්වහන්ස! මෙසේ නොකොට බිම කෙලගසා පයින් පිසදමවයි කීය. රජතෙමේ එසේ කෙළේය. එවිට සුනඛයෝ අතුරුදන්වූහ. එදින ඇයගේ පාපකර්මය ක්ෂයවීය. එකල රජතෙමේ විපිළිසරවී යන්නට වන්නේය. ඕතොමෝ සවාමීනි! මාගේ පාපකර්මය ක්ෂයවීය නොයනු මැනවැයි කීය. රජතෙම් එය නොසලකාම ගියේය. යන මෙය

සඟීතිසූත්‍රවණ්ණනායෙහි ආවාවූ අතිවාරිණීයගේ
කථාවසානවයි.

මෙය **පඤ්චගහිසුත්තවිභාගෙහිද සඝනිසුත්තවණ්ණනා සඝනි සුත්තටීකා** යන මොවුන් සම්පිණ්ඩනය කිරීම් වශයෙන්ද ආයේය. **ප්‍රෙතවත්ථුවෙහි කණ්ණමුණ්ඩ ප්‍රෙතවත්ථු වණ්ණනායෙහි** වනාහි විස්තරවශයෙන් ආයේ මදවෙනසක් ඇත්තේය. එහි වනාහී රජතෙමේ මොහු මැයගේ සතුරෙක් වන්නේයයි විෂ පෙවූ හීයකින් විද සුනඛයා ජීවිතක්ෂයට පැමිණවූයේය යනු ආයේය. එහෙයින් **සඝනිසූත්‍ර පඤ්චගහිසූත්‍ර** යන මොවුන්ගේ වණ්ණනා නයින් අඹුදරුවෝ ගෘහස්වාමියාහට ගහපතයනි නමැයි නිශ්චයට යාහුත්තේය.

භූදිජනමනනඳනවූ සූත්‍රදරසඞ්ග්‍රහනම් මඞ්ගලවණ්ණනාව මෙතෙකින් නිමවන ලද්දේය.

පුත්‍රදරසංග්‍රහ මඞ්ගලවණ්ණනාවට අනතුරුව අනාකුල කම්මන්ත සංඛ්‍යාත මඞ්ගලවණ්ණනාව කියනු ලැබේ.

කම්මන්තයෝ නම්:—සීඝැම් කැමිය ඡංඝවණිජ්ජා සඟට වණිජ්ජාආදී වණික්මාගීය තමාගේ හෝ අනුන්ගේ ගවයන් රැක පස්ගෝරස විකිණීමෙන් ජීවත්වන කැමිය යන මේයයි **මූලපණ්ණාසකයෙහි මහා දුක්ඛක්ඛන්ධසූත්‍රවණ්ණනායෙහි** කියනලද්දේය. **මජ්ඣිමපණ්ණාසකයෙහි වාසෙට්ඨ සූත්‍රයෙහි** වනාහි කසිකැමියන්ගේ ස්ථානයෙහි "ගොරක්ඛා" යන්න ආවිය. එහි කියන ලද්දේමැයි

"යො හි කොචි මනුස්සෙසු ගොරක්ඛං උපජීවති,
එවං වාසෙට්ඨ! ජානාහි කස්සකො න බ්‍රාහ්මණෝ"ති.

එහි "ගොරක්ඛං" යනු ක්ෂෙත්‍ර රක්ෂාවයි. කසිකැමියයි කියන ලද්දේ වෙයි. 'ගෝ' යනු පෘථිවියට නාමයක් බැවින් මෙසේ කීයේයයි එහි වණ්ණනායෙහි කියනලද්දේය. මෙය සාමාන්‍ය වොදනාවක් හා විශෙෂ ප්‍රවෘත්තියක් ඇත්තක්නුයි "ගොරක්ඛ" නනි, ඛෙත්ත රක්ඛං; යනුවෙන් 'ගොරක්ඛං' යන සාමාන්‍ය වොදනාවට එහිම අන්තර්ගතව තුබුන ක්ෂෙත්‍රරක්ෂාවය යන විශෙෂ නිවෙශාර්ථය කියනලද්දේය. එය කියනලදහෙයින්ම එයම ස්ථූල කිරීමට 'ගෝ' යනු පෘථිවියට නමක් බැව් දක්වන "ගොති හි පඨවියා නාමං" යනු එහි ටීකායෙහි දැක්වීය.

එහෙයින් යම්තැනෙක කසි-ගොරක්ඛා' යන පදවයම එකතුව ආවා නම් එහිදී 'කසි' ශබ්දය කෙරෙන් අනික හෙවත්

ගොරකඛා යන්න ගෙරිරැකීමම වන්නීය. යම් තැනෙක ගොරකඛා යන්න පමණක් ආවානම් ඕ තොමෝ ප්‍රකරණ වශ යෙන් දතයුත්තීය.

කාලාතික්‍රමණාදිය වනාහි ඒ කම්මයන්ගේ ආකුලභාවය නම් වෙයි. එහෙයින් අඨකථායෙහි "කාලඤ්ඤුතාය පටිරූප කාරිතාය අනලසතාය උඨානවීරියසම්පදාය අබ්‍යසනීයතාය ච කාලාතික්කමණඅපපටිරූපකරණ අකරණ සිථිලීකරණාදි ආකුල භාවවිරහිතා"යී යමක් ලද්දේය. එහි යමෙක්තෙමේ කටයුතු කාලය ගත නොකොට හෙවත් නොනසා කම්මානන්තරේද හෙතෙමේ කල්දන්නේ නම් වන්නේය. ලැබියයුතු ඵලයට සුදුසු දෙය කරණතැනැත්තේ වනාහි පටිරූපකාරී නම් වන්නේය. මෙබඳු තැනැත්තේ වනාහි ඵලය ලබන්නේය. එහෙයින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඤාණසංයුත්තයෙහි අලවි යකුහට ධර්මදෙශනා කරනසේක් "පටිරූපකාරී ධුරවා උඨාතා වින්දතෙ ධනං"යනුවෙන් කාලාදිය නොනසා ලෞකිකවූ හෝ ලොකොත්තරවූ හෝ ඵලයට සුදුසුවූ අධිගමූපාය කරන හෙයින් හෙවත් යම් දෙශයෙක්හි යම් කාලයෙක්හි සභාගවයසභයන් නිසා සවකීය කටයුතු නිරණය කටහැක්කේද එබඳු දෙශකාලා දීන් නොමඉක්මවා තමාගේ අභිවෘඞ්ය කැමතිවන්නහු විසින් මෙයනම් දෙශයයිද, මම දැන් යම්තැනෙක්හි වෙසෙම්ද මෙය නම් කාලයයිද, මොවුහු මිත්‍රයෝය මේමාගේ ආදෘශම සහ විය දමය ජාතිකුලවයස්බලභොගපිරිවරආදීන් සාරණකොට ගෙන මමද මෙබන්දෙක්මි දැන් සවකීය කටයුතු පටන්ගත යුතුය දැන් පටන් නොගතයුතුයයි යන මේ සිඝල්ල පරීක්ෂාකොට පිළිපැදිය යුත්තේය. මෙසේ පිළිපදනා තැනැත්තේ වනාහි ලෞකිකඵලයටද ශීලවිශොධනාදී වශයෙන් ලොකොත්තරඵල යටද සුදුසුවූ අධිගමූපාය කරන හෙයින් පටිරූපකාරී නම්වූ චෛතසිකවීරියවශයෙන් බහානොතබනලද ධුරඇත්තාවූ හෙවත් ඉසිලියයුතු බැවින් ධුරයක් වැනිවූ භාරය එනම් ධුර සම්ප්‍රග්‍රාහයෙන් එය උඩරණය කිරීමෙන් ධුරතම් වීරියය බහුල කොට ඇතිබැවින් ධුරවානම්වූ, "යො න සීතඤ්ච උණ්හඤ්ච තිණඤ්ච න මඤ්ඤති" යනාදී නයින් කායික වීරියය වශයෙන් උඨානවීරියය හා අනලස බැවින් අසිථිලපරාක්‍රමයද ඇතිහෙයින් උඨානානම්වූ පුද්ගලතෙමේ සාරමසක් තුළදීම තුවිටුවෙක කහවණුඅටෙක කහවණුසොළසෙක කහවණු සූවිස්සෙක කහ වණු දහසෙක යන ක්‍රමයෙන් දෙලක්ෂයෙක, චූලකසිට්ඨහුගේ ධීතෘ ලාභවශයෙන් දෙලක්ෂයෙකැයි මෙසේ සාරලක්ෂයක් ධනය

එකමීයාගේ මිලයෙන් චූලනෙතවාසිකයා ලැබුවාක් මෙන් ලෞකිකලොකොත්තරධනයට අනුරූපවූ අධිගමූපාය කරන්නාවූ බහාතොතබනලද චෛතසික වීර්‍යය ඇත්තාවූ කායික වීර්‍යය වශයෙන් උඛානවීර්‍ය ඇත්තාවූ අනික් තැනැත්තෝද මෙසේ ධනය ලබන්නාහුයයි වදළසේක.

යන මේ විස්තරය යථොක්තවූ "පටිරූපකාරිධුරවා" යනාදිය සම්බන්ධ වණ්ණනාවෙහි එනලද්දේය. ඊට නිදසුන් වශයෙන් මේ කථාවස්තුහු දක්වනලද්දාහ.

යටගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරනලද බොධිසම්භාර ඇති අපමහබෝසතාණෝ සිටුකුලෙකැ ඉපිද වැඩිවියපැමිණ සිටුතන්හි තුරු ලැබ චූලසිවාණෝය යන නමින් පතළවී වසනකල ඒ සිටාණෝ තුවණැත්තෝය ව්‍යක්තයෝය සියලු නිමිති දනිති එක්දවසක් ඒ සිවාණෝ රාජසේවයට යන තැනැත්තෝ වීථි මධ්‍යයෙහි මළමියෙකු දැක නක්ෂත්‍රයොගය පරීක්ෂාකොට මෙසේ කිවිය. තුවණැති කුලපුත්‍රයක්හු විසින් මේ මියා ඇරගන පුත්‍ර දාරාවන් පොෂ්‍යකරන්නටවත් වෙළඳම් කරන්නටවත් හැකිවන්නේ වෙදැයි කිවිය. එක්තරා දුගීපුරුෂයෙක් ඒ අසා සිටාණෝ නොදැන නොකියතිසි සිතා මියා ඇරගන එක් සල්පිලකැ බළලකු නිසා දී දෙවියට සමාරක් රත්රන් ලද්දේය. ඒකාකාණික මාත්‍රාවෙන් උක්සකුරුගෙන කළයකින් පැන්ගන්නේය. එතෙමේ වලින් මල්කඩාගන එන්නාවූ මාලාකාරීන් දැක උක්සකුරු සුහක්දී පැන් වත්කෙළේය. ඒ මාලාකාරීන් එකී එකී මල්මිට දුන්නාහ. එතෙමේ මල් විකොට ඒ මල්මිලයෙන් දෙවෙනිදවස් උක්සකුරු හා පැන්කළයක් ගෙන මල්වත්තට ගියේය. එදවස් ඕහට මාලාකාරිහු මල්භාගයක් කඩාගෙන මල්ගස් දී ගියාහ. හේ තෙමේ නොබෝදවසකින් මේ උපායෙන් අමකහවණුවක් ලද්දේය. නැවත එක් වැසිසුළංදවසෙක රාජෝද්‍යානයෙහි බොහෝ වියලිදඬු හා අතුපත් සුලඟින් වැගුරුනාහ. උයන්ගොවුවාද බැහැරලන්ට උපාය නොදකින්නේය එකල්හි ඒ පුරුෂයා එතනට ගොස් ඉදින් තොපි මේ දඬු හා අතුපත් මට දෙවිනම් මම සියලු දඬුපත් උයනින් බැහැර කරවා පියන්නෙම් වේදැයි උයන්පල්ලාහට කීය. උයන්පල්ලා ඇතපත යහලුව ඇරගනුවහි හිඳිස්සේය. චූලනන්දෝවාසි තෙමේ කුඩාකොල්ලන්ගේ කෙළිමඩුල්ලට ගොස් උක්සකුරු දී මද ඇඹිල්ලකින් ඒ සියලු දඬුපත් කුඩාකොල්ලන්ලවා උයනින් අද්දවා පිටකරවා උයන්දොරකඩ කැටිකරවූයේය. එකල්හි රජ්ජුගට

වලංතලන කුඹලා රජගෙට වලංපලහනු සඳහා දර සොයා ඇවිදිනේ උයන්දෙරඩඩ තුබූ ඒ දරගොඩ දැක ඔහුඅතින් සොළොස්කහවණුවක් හා සැලිආදී වලංපන්සියයකුත් ඕහට දී ඒ දරආදිය ගත්තේය. මෙසේ එදවස ඒ චුල්ලනෙතෙවාසික යාහට සුවිසි කහවණුවක් උපන්නාහ. හෙතෙමේ වෙළඳුමෙන් කහවණු සුවිස්සක් වූකල්හි මට මේ උපාය ඇතැයි නුවරදෙරට නුදුරු තැනෙහැ එක්පැන්හලක් තබාගත පන්සියයක් තණ අදිනා පුරුෂයන්ට පැන්වත්කෙළේය. ඔවුහු මෙසේ කිව්ය 'යහළුව! නොපි අපට බොහෝ උපකාර ඇත්තෙහිය තොපට අපි කුමක් කරමෝදැ'යි කිවිය. එකල්හි චුල්ලනෙතෙවාසිකයා කියන්නේ මාගේ භාරියක් පැමිණිකල්හි කියන්නෙම් වේදැයි කියා ඔබමොබ ඇවිදිනේ දියගොඩදෙක්හි වෙළඳුම් කරන්න වුන් සමඟ මිත්‍රසන්ථවය කෙළේය. එකල්හි ගොඩමාර්ගයෙහි වෙළඳුම් කරන්නාවූ වෙළෙන්දෙක් තෙමේ සෙට අස්වෙළඳෙක් තෙමේ පන්සියයක් අසුන් ගෙන එන්නේයයි කීයේය. හෙතෙමේ ඒ අසා තණඅදින්නවුන්ට මෙසේ කිය අදමට එක එක තණකලාපය බැගින් දෙව් මා තණවිකුණන්ට පෙරාතුව තමන්ගේ තණ නොවිකුණව්යයි කිය. එකල ඔහු ඇමදෙන යහපතැයි ගිවිස පන්සියයක් තණමිටි ගෙනවුත් ඔහුගේ ගෙදොර ලූහ. අස්වෙළෙන්දේ නුවර මුළුල්ල ඇවිද අසුන්ට තණ නොලැබ ඒ චුල්ලනෙතෙවාසිකයාහට කහවණුදහසක්දී තණ ඇරගත්තෝය. ඉක්බිත්තෙන් කීපදවසක් ගියකලට සමුද්‍රයාත්‍රාවෙන් වෙළඳුම් කරන්නාවූ යහළුවා ඕහට කියන්නේ පටුනට මහනැවක් ආවියයි කිය. එකල්හි චුල්ලනෙතෙවාසික පුරුෂයා මට මේ උපායෙන් ප්‍රයෝජන ඇතැයි සිතා කහවණු අටක්දී සියලුපිරිවරින් යුක්තව පිරුණුරථයක් ගෙන මහත්වූ සහපිරිවරින් බට තොටට ගොස් පේරුස් මුද්දක් නැවට අධිකාරම්කොටදී නුදුරුතැනෙක වටකොට තිරයක් බඳවා සමීපවූ චරපුරුෂයන්ට මෙසේ විධාන කෙළේය. "ඉවතින් වෙළෙන්දේ අවුතම් රුකවල් තුණකින් මෙහෙවර කියා මා සමීපයට කාඳවාගෙන එව"යි කිවිය. එකල්හි පටුනුගමට නැව් බටයි අසා බරණැස්නුවරින් වෙළඳහු සියයක් බඩුභාණ්ඩහයි ආවාහුය නැවැ බඩුවෙළඳුම් කරන්නාවූ මනුෂ්‍යයෝ කියන්නාහු අපගෙන් තොපට බඩුනොලැබෙයි අසවල් තැන හිඳිනා මහ වෙළඳුන්න් විසින් අධිකාරම් දෙනලදැයි කිවුය. එබස් අසා බරණැස් නුවර වෙළෙන්දේ ඒ චුල්ලනෙතෙවාසිකයා සමීපයට ආවාහුය. ඔහුගේ අතවැසි පුරුෂයෝ පළමුකොටලූ විධාන

නියාවට රැකවල් තුනකින් තුන්විටක් ඔබමොබ මෙහෙවර කියා අවුත් ඒ වෙලදුන් ආබව කියා යැවූහ. වෙලෙන්දේ චුල්ලනෙත වාසිකයන්ට එකෙණා දහසබැගින් දී චුල්ලනෙතවාසිකයා සමග නැව්බඩු ගනුම්හයි පත්තුව ගෙන නැවත එකිඑකි දහසක්දී නැවබඩුඅරවාගන බඩු තමන් සන්තක කළාහුය. චුල්ලනෙතවාසික තෙමේ දෙලක්ෂයක් වසතුගැරගෙන මවිසින් කෘතඥයෙක් විය යුතුයයි එක්ලක්ෂයක් ගෙන්වාගන චුල්ලසිටුහට දී ඒ සියලු ප්‍රවෘත්තිය කීයේය. සිටුතෙමේ දැන් මෙබදු දරුවෙකු පෙසන කාරයෙක් කරවන්ට හෙවත් අනුන්ට හැරපියන්ට නොවටනේ යයි සිතා ඔහට තමන්ගේ ධිතෘව දුන්නේය. හෙතෙමේ සිටුහුගේ ඇවෑමෙන් සිටුතනතුර ලැබීය. මෙසේ වියයීය කරන තැනැත්තේ ධනය ලබන්නේය.....

එකනිපාතයෙහි ප්‍රථමවග්ගයෙහි චූළකසෙට්ඨිජාතකවණ්ණනා
යෙහිද එකනිපාතඛුත්තරවණ්ණනායෙහිද
චූළනෙතවාසි වසතුවසි.....

මිලකඛමහාතිස්සසඵවිරයන් වහන්සේ වනාහි තුන්ඉරියව් වෙන් වාසය කරන්නෙමියි සිතක් උපදවා පීතම්බය පැමිණෙන වේලෙහි පිදුරුවෙණියක් තෙමා හිසැ තබා ගෙලපමණ දියෙහි බැස පීතම්බය ප්‍රතිබාහනය කරමින් දෙලොස් හවුරුද්දකින් සකලකෙලාශයන් තසා අහිඛියට පැමිණියේය.....යන මේ කථා වසතුව ආලවකසූත්‍රවණ්ණනායෙහිආයේය.....

යමෙක් වනාහි දහවල්මුළුල්ල නිදා කම්මානත නොකෙරේද රාත්‍රියෙහිත් ඒ කරන්නට නොවැටහේද නිතරසුරාමද යෙන් මත්වූයේ සත්‍රීආදීන් කෙරෙහි ලොල්වූයෙත් වේද හෙතෙ මේ තමන්ගේ අලසභාවය හෙතුකොටගෙන කම්මානතයන් අවුල් කෙරෙයි. කම්මානතයන්ගේ නොකිරීම වනාහි ඔවුන්ගේ අකුලභාවය නම්වේ. එබදුවූ තැනැත්තේ නම් ගෘහසඵවාසය පිහිටුවන්ට නොහැක්කේ වන්නේමය.....එසේ හෙයින් භාග්‍ය වතුන් වහන්සේ සිඟාලසූත්‍රයෙහි

"න දිවා සොපපහාසීලෙන රත්තිකුඨානිදසසිනා,
නිබ්බුං මිත්තෙහන සොණ්ඩන සක්කා ආවසිතුං ඝරං."

යන මේ ගාථාව වදුළසේක. එහි අදහස නම්:-දහවල්භාලය මුළුල්ලම නිදනසුලුවූ අළුයම නැගිට වුඩ්ඨානවියර්‍යය නොකරන සුලුවූ හෙවත් හිර උදාවනතුරුත් කම්මාන්ත නොකරන සුලුවූ නිතරසුරාමදයෙන් මත්වූ "ඉත්ථිසොණ්ඩා හත්ථසොණ්ඩා පූව සොණ්ඩා මූලසොණ්ඩා" යනු අට්ඨකථාචාරීන් විසින් කියනලද හෙයින් ථිකායෙහි දක්වනලෙස සත්‍රීසමෝහගය නිමිතිකොට තැනින්තැන තැවිතැවී වියලිවියලී ඇවිදිනා සත්‍රීසොණ්ඩවූ බත් නිමිතිකොට තැවිතැවී හිඳිනා බැවින් හත්ථසොණ්ඩවූ කැවුම් ආදී පූවවිකෘතීන් නිමිතිකොට තැවිතැවී හිඳිනා හෙයින් පූව සොණ්ඩවූ මිලමුදල් නිමිතිකොට ඔවුනොවුන්ගේ ගෙදොරවල තැවිතැවී හිඳිනාහෙයින් මූලසොණ්ඩවූ මතුමතුත් බොන ආසාව වැඩුනු සුරාපිපාසාව ඇතිබැවින් සුරාසොණ්ඩවූ පුරුෂයා විසින් ගෘහස්ථවාසය හෙවත් අඹුදරුපොෂණය නොකටහැක්කේය යනු අට්ඨවාටිකානයින් දක්නා ලද අදහසවන්නේය.

එසේ හෙයින් ගෘහස්ථයා විසින් නිද්‍රාරාමතායෙන් යුක්ත යෙක්ද සත්‍රීලොලතායෙන් යුක්තවූවෙක්ද නොවියයුත්තේමය. එබන්දෙක්වූකලී දුකට පැමිණෙන්නේමය.

ඒ කරුණෙහිලා මේ කථාවසතුන් කියනලද්දහ,

ඔටගිය දවස ගන්ධාරරට තක්සලානුවර පුරණලද සමන්ත්‍රිංශත් පාරමීධම්මයන්ඇති අපමහබෝසතාණෝ දිශාපාමොක් ආචාරිවපන්සියයක් මානවකයන්ට ශිල්පඋගන්වන්නාහ. ඉක්බිත්තෙන් එක්දවසක් මානවකයෝ දරපිණිස වලට ගොස් දර කඩන්නාහුය. ඔවුනතුරෙහි ගිය එක්තරා කුසීතමානවකයෙක් මහත්වූ ලුණුවරණගසක්දැක එය මලගැසකැයි යන සඤ්ඤාවෙන් මදඇසිල්ලක් වැදහෙව පසුව ගසට නැගී දරකඩාලා ඇරගනිම්සිනා උතුරුසළුව අතුට වැදහෙව ගොරහඬ දෙමින් කැසකැස නිදන්නේය. සෙසු මානවකයෝ දරම්විබැඳ ඇරගන යන්නාහු එසේ නිදන්නාවූ කුසීතමානවකයාහට පිටිපල්ලෙන් ගසා පොබයා ගියාහ. ඒ කුසීතයා නැගිට ඇසනිදිගැව පියපියා නිදිපලා නොගොස්දීම ලුණුවරණගසට නැගී අත්තක් අල්වාගන තමා දෙසට ඇද බිඳිනේ බිඳීනැගි අතුකෙළවරින් තමාගේ ඇස සිල්කොටු ගෙන එක් අතකින් ඇසවසා අනික්අතින් නොමිලදර

කඩා හසින් බැස දරම්විසක්බැඳ ඔසවාගත වහවහා ගොස් අනික් මානවකයන් විසින් එලනලද දරම්විම්තේ ලූදුය.

එකනිපාතයෙහි අටවනවගැ වරණජාතකවණ්ණනායෙහි කුසිතමානවඛා වසතුවයි.

තවද යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරු නෙතෙකුන් රාජ්‍යය කරන සමයෙහි පන්සිල්රක්නාවූ බ්‍රාහ්මණ කුලයක්හුගේ එක්තරා බ්‍රාහ්මණමාහවඛායෙක් සමානවයස්ඇති තරුණබ්‍රහ්මයන් සමඟ හැසිරෙන සඛභාවය ඇත්තෙක්වූයේය. එසේද වුවත් ඔවුන් රහබොනකල්හි තෙමේ නොබොන්යේ• බ්‍රහ්මයෝ තුමූ "මෙකුමරතෙමේ රහනොබොන හොත් අපට රහමිල නොදෙසි එබැවින් උපායෙන් මෝහට රහ පොවන් නෙමු"සි සිතා සැණකෙළිදවසෙහි උයනෙහි පියුම්පතෙක්හි තියුණුවූ සුරා මුලුබැඳ බොනකල්හි මානවකයාහට කිරිදෙවා පොකුරුමී ගෙනෙවිසයි පුරුෂයන් ලවා ගෙන්වා පියුම්පත්මුල යවින් සිදුරුකොට මුවෙහි තැබුවාහුය. මානවකතෙමේ එය පොකුරුමීසයි සිතා කැමතිසේ පානයකොට මස්ද ඛා මත් වූයේය. මෙය පොකුරුමී නොවෙයි මෝ සුරාසයි කීහ. සුරා මෙප මණ මධුරරසබැව් මම මේතාක් නොදනිමි පින්වත! සුරා ගෙනෙවිසයි කියකියා නැවතනැවතත් ගෙන්වාගත බීවේය. එයින් පිපාසය අධිකවීය. ඉක්බිති යලියලින් රහඉල්වන්නාවූ ඔහට රහනැතැයි කීවාහුය. එකල ඒ කුමරතෙමේ පේරැස්මුදුව දී ඔවුන්ලවා සුරාගෙන්වාගත ඔවුන්සමඟ බී මත්වී ගෙටගොස් හොත්තේය. ඔහුගේ පියතෙමේ ඔහු එයින් වලඛාලන්ට උත් ඛාහකෙළේය. එසේද වුවත් ඔහුවලකාලන්නට නොහැකිවූයේ මය. පියතෙමේ නැවතනැවතත් අනේකාකාරයෙන් වලඛා ලන්නව උත්ඛාහ කරන්නේනමුදු නොහැකිවූයේ පුත්‍රභාවයෙන් පහකවයුතුය දුඛාදය නොදියයුතුය යන තීන්දුවට පැමිණ අපුත්‍රඛා කොට ගෙදරින් බැහැරකෙළේය. මෙසේ ඇතිකල්හිත් තෙතෙමේ සුරාපානයෙන් නොවැලැක්කේම කමීනත නොසොඵට ඉන් මැනකලෙක්හි කබලක් ගත් අත්ඇතිව සිඛා කා ඇවිද කියි සම් අයකුගේ ගෙපිළිකණෙකැ වැදහෙව මලේය.....

මහාසුතසොම ජාතකවණ්ණනායෙහි සුරාසොඬවසතුවයි.

යමෙක් තෙමේ වනාහී අතිශීතාදිය කියා කම්මාන්තයන් නොකෙරේද ඒ කෙසේද යත් මිනිසුන් විසින් අලුයම නැගිට 'පින්වත! එව වැඩට යමුයැ'යි කියනලද්දේ 'මේ උදය ඇටබිඳෙන විවරට ශීතලය තෙපි යව් මම පසුව කලපනාකොට බලන්නෙමැ'යි කියා ගිනි තපිමින් හිඳිනේ කම්මාන්ත කරන්නට නොයෙයි දහවල් අඩගැසූකල්හි 'දැන් ඇටලේ හුණුවන අව්වෙහි කුමන වැඩෙක්ද මම පසුව වඩමන්සෙවන ඇතිකල්හි එන්නෙමි තෙපි යව්ය'යි කියා ඔවුන් යවා වැඩට නොයෙයි හෙතෙමේ තමන්ගේ අලසභාවය නිසා කම්මාන්තයන් ආකුලකරන්නේ නම් වන්නේය. එබදුවූ තැනැත්තේ වනාහි භොගසම්පත්තියෙන් පිරිහෙන්නේය එහෙයින් භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ 'අතිසීතං' යනාදියෙන් දැන් ඉතා ශීතලයයිද දැන් ඉතා උෂ්ණයයිද දැන් ඉතා සවසයයිද දැන් ඉතා බඩගිනියයිද කියා කම්මාන්ත නොකෙරේද මෙසේ කටයුතු වැලකීම බහුලකොට ඇතිව වාසය කරන්නා හට නුපන් භොගසම්පත්තීහුත් නුපදින්මය උපන්නාවූත් භොගසම්පත්තීහු විනාශයට පැමිණෙන්නාහුයයි වදාළසේක්ඵලඛතෝ තුම්හ එබදුවූවන් ඉක්මයන්නාහුමය එසේ හෙයින්,

"අතිසීතං අතිඋණ්හං අතිසායමිදං අහු,
ඉති විස්සට්ඨකම්මන්තා අත්ථා අච්චෙන්ති මානවෙ"ති.

යනමේ ගාථාව වදාළසේක්ඵලඛි යථොක්ත අදහසම වන්නේය.

යම්බදු මිනිසෙක් තෙමේ වනාහි අතිශීතාදිය ගණන් නොගෙන තමන්ගේ අනලසභාවයෙන් කම්මාන්තයන් ආකුල නොකෙරේද එබදු මිනිස් තෙමේ මහත්වූ ඛනඋපදවා අපමණ සැප විඳිනේය. අඩසමාසකරාජාදීහු ඊට නිදසුන් වන්නාහ.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙ කුන් රාජ්‍යය කරන සමයෙහි පුරනලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ රජ්ජුහට පුත්ව ඉපිද වැඩිවිය පැමිණ උදය කුමාරයෝයයි ප්‍රසිඛව පියරජ්ජුගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ. එකල එනුවර උතුරුදිග දෙරටුපාලවූ එක් බැලමෙහෙකරුවෙක් ඇත්තේය. හේතෙමේ දියබැලමෙහෙකොට හෙවත් කුලියට දියඇද රත්‍රන් සතරවියවෙක් ලැබ වාසල්පවුරේ වළක් කැණ ගඩොල්අතර එය නිධාන් කොට තෙමේ බැලමෙහෙ

කරන්නේ දකුණුදිග දෙරටුවටද පැමිණ එහිදු දියබැලමෙහෙ කොට ජීවත්වන්නාවූ දිළිඳු ගැහැණියක් සමඟ වාසය කෙළේය. ඇය විසිනුදු රත්‍රන් සතරවියටක් පමණම ලබනලද්දේය. ඉක්බිති එක්තරා සැණකෙළි දවසෙක ඕ තොමෝ ඔහට කථාකොට කියන්නී සවාමීනි! නුවරෙහි සැණකෙළි පවතී ඉදින් යමකිසි ධනයක් ඇතහොත් අපිදු සැණකෙළි කෙළිමුයි කීය. හෙතෙමේ කියනුයේ මාගේ අඞමස්සක් ඇත හෙද උතුරුදිග වාසල්පවිර කැණ ගඩොල්අතර තබන ලද්දේය මාගේ ඒ නිධානයද මෙයින් දෙලොස් යොදුනක් ගියතැනය. නුඹඅත වනාහි කිසිවක් ඇද්දැයි විචාළේය. ඕතොමෝ කියන්නී සවාමීනි! මාගේද අඞමස්සක් හෙවත් රත්‍රන් සතරවියටෙක් ඇත එසේකල නුඹගේ අඞමස්සද මාගේ අඞමස්සද එක්ව මස්සක් සම්පූර්ණ වෙයි. ඉන් කොටසකින් මල්ද කොටසකින් සුවඳද කොටසකින් සුරාද ගෙන කෙළිමු යව නුඹගේ අඞමස්ස ගෙනෙවයි කීය. හෙතෙමේ තුටුපහටුව ගායනා කරමින්ම ගියේය. හෙතෙමේද ශක්තිබල ඇත්තේ වෙයි සයොදුනක් ඉක්මවා මහදවල් ගිනිඅහුරු අතුලාක් වැනිවූ කකියන වැලිමතිමින් අවුත් රජමිදුලට පැමිණියේය. එකල උදයනම් බරණැස් රජ්ජුරුවෝ සීමැදුරුකවුළුවෙන් බලා සිටියේ එසේ එන්නාවූ ඔහු දැක මෙතෙමේ කුමක් හෙයින් මෙයාකාරවූ අව්ව ගණන් නොගෙන තුටුපහටුව ගායනා කරමින් යන්නේද ඔහුඅතින් එය විචාරන්නෙමියි සිතා ඔහු කැන්දා විචාළේය. ඒ පුරුෂතෙමේ සියලු එපුවත් කියා දෙවයන් වහන්ස! භාග්‍යවතීන්ගේ කථාව සිහිකරන්නාවූ මා කාමයන් සම්බන්ධවූ ආතපය තවන්නේය. සුඛීයොසම්බන්ධිවූ ආතපය නොතවන්නේයයි කියේය. කුමන කාරණයකින් අව්ව ගණන් නොගෙන තුටුපහටුවූයේ ගායනා කරන්නෙහිද? දෙවයන් වහන්ස! ඒ නිධානය ගෙනවුත් ඇය සමඟ අභිරමණය කරන්නෙමියි කියන මේ කාරණයෙන් සතුටුව ගායනා කරන්නෙමියි කීයේය. කිමෙක තාගේ නිධානය ලක්ෂයක් පමණ වන්නේද? දෙවයන් වහන්ස! එපමණ නොවන්නේය. එක්බිසි රජ්ජුරුවෝ පිළිවෙළින් අඩුකොට එකමස්සක් පමණ වේදැයි විචාළාහ. දෙවයන්වහන්ස! එපමණද නැත එහෙතම් අඞමස්සක් පමණ වේද?

එසේය දෙවඟන් වහන්සැයි කීයේය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එම්බල පුරුෂය! රත්‍රන් සතරවියටෙක් නිසා දැන් සඟවිවක් ආයෙහිද ඉදිරියෙහි සඟවිවක් ගියමනාවේද මම තව ඒ සතරවියට රත්‍රන් දෙමි මෙසේවූ තදඅවිවෙහි රත්වූපොළොවෙහි කකියාගිය වැල්ලෙහි නොයවයි කිහ. දෙවඟන් වහන්ස! බුඹවහන්සේ විසින් දෙනලද රත්‍රන් සතරවියටත් ගනිමි මාගේ රත්‍රන් සතර වියටත් ගනිමියි කීය. එවිට රජ්ජුරුවෝ පිළිවෙළින් වඩා එඹල පුරුෂය! එහි නොයව මම තට රත්‍රන් අටවියටක් සොළොස් වියටක්.....පෙ.....රත්‍රන් වියට සීයක්කොළක් දෙමි අප්‍රමාණ ධනය දෙන්නෙමැයිද කියා ඔහු එසේම කියනකල සිටුතනතුරු ආදියෙන් පොළඹවාත් නැවතද ඔහු එසේම කියනකල අඩක් රාජ්‍යය තට දෙමැයි කියා ඔහු එසේ පිළිගත්කල 'යව් මාගේ යහලුවාගේ හිසකේ දැළිරැවුලු පහකරවා නහවා අබරණ පළඳවා ගෙනෙව්ය'යි ඇමතියන් ඇණවූහ. ඇමතියෝද එසේ කොට ගෙනාවාහුය. රජ්ජුරුවෝ රාජ්‍යය දෙකට බෙදා ඔහට අඩක් රාජ්‍යය දුන්හ. ඒ රජතෙමේ අඞ්ඝමාඝක රජතමැයි ප්‍රකටවීය.....

මෙකියනලද්දේ අඤ්ඤිපානයෙහි ගඟමාලජාතකවණ්ණනායෙහි අඞ්ඝමාඝකරාජවඝතුවයි.

තවද අනික් කථාවඝතුවක් "ඛත්තී" යන පදයෙහි මතුපහළවන්නේය.....

"යො ච සීතඤ්ච උණ්හඤ්ච තිණ්හීයො න මඤ්ඤති,
කරං පුරිසකිච්චානි සො සුඛා න විහායති"

යන මෙය කියනලද්දේය.....

මේ ලොකයෙහි යම්කිසි පුද්ගලයෙක් තෙමේ ශීතොෂ්ණයන් තෘණපමණවත් ගණන් නොගෙන අනාලස්‍යව උත්සාහ වීර්‍යයෙන් යුක්තව පුරුෂකෘත්‍යයන් කෙරේද ඒ පුරුෂතෙමේ සැපයෙන් යුක්තවූ පුද්ගලයෙක් වන්නේය යනු සිඟාලසූත්‍රවණ්ණනා ආලොකසූත්‍රටීකාවෙහිත් කියනලද අදහසවන්නේය.....

එසේ හෙයින් ඉහිඥෙයි වඝන්නහු විසින් ශීතොෂ්ණාදිය භණන් නොගෙන පිළිවෙළින් භොගය රැස්කටයුත්තේය. එසේ

කරන්නාහට වනාහි හොගයෝ බොහෝ වන්නාහ. එසේ හෙයින්,

"හොගෙ සංහරමානස්ස හමරසෙසව ඉරියතො,
හොගා සන්නිවයං යනති වම්මිකොවූපමියනි."යි

වදුළුසේකා. යම්සේ භෘඞ්ගයෙක් තෙමේ පුෂ්පඵලයන් සම්බන්ධ වූ වණ්ණගන්ධයන් නොවෙහෙසා තුඞ්ගේ හා පියාපත්වලින් රෙහෙණු ගෙන ගොස් අනුක්‍රමයෙන් රථසභාක් පමණ වූ මධුපටලයක් කරන්නේ වේද එපරිද්දෙන්ම තමනුත් නොපෙළා දුහැමින් සෙමෙන් මනාකොට යොදනලද ත්‍යාගයෙන් යුක්තව පිළිවෙළින් හොගයන් රැස්කරන්නාහට වේයන් විසින් පිළිවෙළින් වඩනලද තුඞ්ගක්මෙන් ධනධාන්‍යාදී හොගයෝ රාශිබවට පැමිණෙන්නාහුය යනු එහි වණ්ණනා හා එහි ටීකානයින් කියන ලද අදහස වන්නේය.

එහි කසිකමීය මනාකොට යොදනලද්දේ උභයලොක හිත සුව ඵලවන්නේය. ඒ කරුණ විෂයෙහි ලා මේ කථාවසතුව නිදසුන් වන්නේය,

යවහිගදවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි එක්තරා සිටාණොතෙක් රාජොපස්ථානයට යන්නේ පුරෝහිතයා දැක නකත් විචාරා මෙසින් තුන්හවුරුද්දක්හුගේ ඇවැමෙන් මුළුදඹදිවැ සැබියක් වන්නේ යයි අසා බොහෝ හොවිතැන් බත් කරවා එක්දහසක් දෙසිය පණසක් කොටුගුල් කරවා ඒ කොටුගුල්ද මහසැලිආදියද විපුරවා තවත් ඉතිරිවූ විය පතස් කැණ බහා ඉතුත් ශෙෂය මැටි සමඟ අනා භිකතියෙහි ආලෙප කරවා සැබිය පැමිණි කල්හි කොටුසැළිආදීන්හි තබනලද ධාන්‍යය ක්ෂයවූ කල්හි 'දරවෙනි! යව් හැකිපරිද්දෙකින් ජීවත් වව්ය"යි මිනිසුන්හට කීයේය. මනුෂ්‍යයෝත් කැමති කැමති ලෙස බැහැර ගියාහුය. ගෙහි වනාහි සිටා ණෝද සිටුබිරිඳද පුතුද සෙහෙලිනියද පුණ්ණනම් දාසයාද යන පස්දෙනා ඉතිරිවූහ. ඔවුහු පතස්හි ධාන්‍යය ක්ෂයවූකල්හි භිකතියෙහි මැටි තෙමතෙමා ඉන් ලද ධාන්‍යයෙන් ඇටුනාහ. සිටුභාර්‍යාතොමෝ වනාහි භිකතිප්‍රදෙශයන්හි ඉතිරි මැටි තෙමා මී ලාසක් ලැබ එකාවා එක්සහල්නැළියක් ලැබ සොරබිඳහන්

එය කළසෙක්හි බහා බිම කැණ තබා එක්දවසක් රාජොපසථාන යට ගොස් ආවාවූ සිටු විසින් සොදුර! බඞසැඇත්තෙමි යම්කිසි අහරක් ඇද්දැයි වීවාළ කල්හි එය නහා ගත බත් පිස පස්තැකොටසක් කොට එක්කොටසක් සිටුහට ඵලවීය. එතෙණෙහි ප්‍රත්‍යෙකබුදුවරයන් වහන්සේනමක් නිරොධසමා පත්තියෙන් නැගිට දිවසින් ලොව බලනසේක් "මුළුදඹදිව් තෙලෙහි සැබියක් උපන සිටුගෙදරද පස්දෙනෙක්හට එකම සහල්නැළියක බත් පිසිනාලද්දේය. ඒ පස්දෙනම මට ශ්‍රඩ්ධායෙන් සංග්‍රහ කරන්නාහ"සි දැන ගඞ්ගාදනපථිතයෙන් වැඩ ඔවුන්හට තමන් දැක්වූසේක. ඒ සියල්ලෝම තමතමන්ගේ බත්කොටස් පුදා "සවාමීනි! මෙතැන් පටන් මෙබදුවූ සැදුකක් නොදකිමුවා"සි කියා එකිනෙකා අභිප්‍රායවූ ලෙස ප්‍රාර්ථනා කළාහුය. ඔවුනතුරෙන් සිටුතෙමේ "මෙතැන්පටන් මුළුදඹදිව්වැසියන්ට බීජ ධාන්‍යය දෙන්නට හෙවත් බිත්තරවී දෙන්නට සමර්ථවෙම්වා සියතින් කම්මාන්ත නොකොට ජීවත් වෙම්වා එක්දහස්දෙසිය පණසක් කොටුගුල් සුඛකරවා සනානය කොට ගෙදොරසමීප යෙහි භිඳ උඞබැලූකෙණෙහිම රත්හැල්ධාරාවෝ වැටී සියලු කොටු පිරෙන්වා උපනුපන්තන්හි මේ භාග්‍යවම මේ පුත්‍රයාම මේ යෙහෙලිනියම මේ දැසයාම ලැබේවා"සි ප්‍රාර්ථනා කෙළේය. භාග්‍යවතොමෝද "අඩලාස්සක් හැල්සහලේ බත් මා පෙරමුනේ තබා මුළුදඹදිව්වැසියන්ට දෙනකල්හිද මා නොතැතිවිතාතාක් බත් ගත් තැන් පිරේවා හෙවත් නොපෙණේවා උපනුපන්තැන මේ සවාමියාම මේපුත්‍රයාම මේ යෙහෙලිනියම මේ දැසයාම ලැබේවා"සි ප්‍රාර්ථනාකළාය. පුත්‍රතෙමේද "දහසින් බැඳි පියල්ලක් ගෙන මුළුදඹදිව්වැසියන්ට කහවණු දෙනකල්හිද පසුම්බිය පිරුනක්ම වේවා මේ මවුපිය භාග්‍යවදැසයන මොවුහුම උපනුපන්තැන ලැබෙක්වා"සි ප්‍රාර්ථනා කෙළේය. යෙහෙලිතොමෝද එක්ධාන්‍ය පැසක්ගෙන මාඉදිරියෙහි තබා සියලු ජම්බුදීපවාසීන්ට දෙනකල්හිත් ක්ෂයබවක් නොපෙණේවා මේ මවුපියසවාමිදැස යන මොහුම උපනුපන්තැන එසේමවී ලැබෙත්වා"සි ප්‍රාර්ථනා කළාය. දැස තෙමේද "මා සානකල්හි මේ අතින් තුනෙක මේ අතින් තුනෙක මැදින් එකෙකැයි මෙසේ දැවඹරූපමණ හිවිටි යෙත්වා මේ සවාමීන්ගෙම මට සවාමීහු වෙත්වා"සි ප්‍රාර්ථනා කෙළේය. ඒසාන්නකයෙන් මෙතෙමේ එදවසම සෙතෙවිතනතුර ප්‍රාර්ථනා කොට ලබන්ට හැක්කේමය එසේදවුවත් සවාමීන්කෙරෙහි සෙනහයෙන්ම මොහු මෙසේ ප්‍රාර්ථනා කෙළේය. පසේබුදුරජාණන්වහන්සේ සියල්ලන්ගේම ප්‍රාර්ථනා අවසානයෙහි එසේ

වේවාසි වදුරා වෙනවෙනම ගාථාවලින් අනුමොදනා කොට "මොච්හු මා දකින්වා"සි ඉටා අහසින් වැඩ ඒ බත තමන්වහන්සේගේ ආනුභාවයෙන් පන්සිඟයක් පසේබුදුවරයන්වහන්සේලාට පොහොනක් කොට බෙදූහ. ඒ සිටුආදී පස්දෙනාද එය බලමින් සිටියාහුය.

ඉක්බිති සිටුභාර්‍යාතොමෝ බත් අවසන්වීයසි කියා සැළිය සොඩා වසා තැබීය. සිටාණෝද සසින් පෙළුනේ නිදු පිබිද සොදුර! මම අතිශයින්ම සෑඅත්තේ වෙමි. බත්පිසූ සැළෙහි දමුකුඩුවත් ඇද්දේහෝයි විවාළේය. සිටුභාර්‍යාතොමෝ හුන්තැනින් නැගිට ගොස් සැළෙහි පියන ඉවත්කොට බැලීය. එකෙණෙහිම සැළිය සමන්සාකුළුවන් බතින් පිරිගියේය. ඕතොමෝ ඒ දැක සවාමීනි! නැගිනුමැනව අනුභවකරවසි කියා පියපුතු දෙදෙනා හට බත් දී ඔවුන් අනුභව කොට නැඟී සිටිකල්හි යෙහෙලිය සමඟ බත් අනුභව කොට පුණ්‍යඥසයාහට බත් දුන්නීය. සැළියෙන් බත්ගත්තැන් අඩුනුවූයේය. සැන්දෙන් වරක්ගත්තැනක් පමණක්පෙණෙසි එදවසම කොටුආදියද පෙර පිරී තිබුනු නියාවටම පිරුණාහුය. එකල්හි සිටාණෝ සියලු දඹදිව්වැසියන්ට බිජධාන්‍යය දුන්නාහ. හෙවත් බිත්තරවී දුන්නාහ. සිටාණෝ ඉන්සැව දෙව්ලොවැ ඉපිද සුගතිභවයෙහි සැරිසරමින් අවුත් දැන් මෙකල භද්දියනුවර මෙණ්ඩකසිටුවී උපන්හ. ඔහුගේ භාර්‍යාව වනාහි මහාභොගසම්පත්ඇති කුලයෙක්හි උපන්නීය. ඇයගේ වම්අත්පාතලයන්හි පදමලක්ෂණයද දකුණුඅත්පාතලයන්හි චන්ද්‍රලක්ෂණයද උපන එසේහෙයින් ඇයට 'චන්ද්‍රපදමාය'සි නම් තැබීය. ඕතොමෝ වැඩිවිය පැමිණියා මෙණ්ඩකසිටුහුගේ ගෘහයට ගියාය. පුත්‍රයෙහෙලිදුසයෝද ඔවුන්ගේ පුත්‍රයෙහෙලිදුසයෝම වූහ. ඔහුගේ පුත්‍රතෙමේ විශාඛාමහ උපාසිකාවගේ පියවූ 'ධනඤය' සිටු වීය. යෙහෙලි තොමෝ විශාඛාඋපාසිකාවගේ මවු වූ සුමනාදෙවී නම් වීය. ඒ සියල්ලෝම තමතමන්ගේ කුසලය වීමංශනය කෙරෙත් ඒ සියල්ලම ප්‍රාර්‍ථනාකල පරිද්දෙන්ම සම්පත්වීය.

මේ කථාවස්තුව ධම්පියාගෙහි මලවර්ගයෙහි "සුදස්සං වජ්ජං අඤ්ඤදසං" යනාදී ගාථාවර්ණනාගෙහි විස්තරයෙන් කියන ලද්දේය.

මෙණ්ඩක සිටුතුමාගේ කථාවස්තුවයි.

මෙසේ මනාකොට යොදනලද කායිකකර්ම උභයලෝක හිතසුව ඵලවන්නේවෙයි. මනාකොට යොදනලද මෙයින් අන්‍යවූවෙණෙහි ආදී නිරවද්‍යකර්මාන්තයෝද හිතසුව ඵලවන් නොවෙය. මේ සියලුම නිරවද්‍යකර්මයෝ උභයලෝකහිතසුව ඵලවන හෙයින් මඟලනාම් වන්නේය. අපි කථායෙහි වනාහි තමන්ගේ හෝ අඹුදරුවන්ගේ හෝ දැසිදස්කම්කරුවන්ගේ හෝ ව්‍යක්තභාවයෙන් මොවුහු මෙසේ යොදනලද්දහ මේ ලෙව්හි ධනධාන්‍යවැඩීමට හා පිළිලැබීමටත් හෙතුවන බැවින් මඟලයයි කියනලදහ. යන මෙපමණක්ම කියනලද්දේය. පරලෙව්හි හිතකර දෙය පිළිලැබීමට හෙතු බැව් ඒ කර්මයන්ගේ ඇත්තේමය. මෙසේ මේ ගාථාවෙන් මාතෘපිතෘ උපස්ථානය, පුත්‍රදාරසංග්‍රහය, අනාකුලකර්මාන්තය, යන මඟලත්‍රයක් කියන ලද්දේය.

ක්ෂුද්‍රජනමනානන්දනවූ මඟුල්සූත්‍රය නිමුවන ලදී.

වැණුම් නිමි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු